**261 වන කාණ්ඩය - 10 වන කලාපය**
தொகுதி 261 - இல. 10
**Volume 261 - No. 10**

**2018 ජුලි 05වන බ්‍රහස්පතින්දා**
2018 யூலை 05, வியாழக்கிழமை
**Thursday, 05th July, 2018**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන**

වරප්‍රසාද: 2018 ජූනි 21වන දින 'ලංකාදීප' වාර්තාව

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**'ද නිව්යෝක් ටයිම්ස්' පුවත් පත් වාර්තාව:** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**වරප්‍රසාද යෝජනා:**

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කඩ කිරීම

**ජාතික විගණන පනත් කෙටුම්පත:**

දෙ වන වර සහ තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**කල් තැබීමේ යෝජනාව:**

මත්තල ගුවන් තොටුපොළ කළමනාකරණය සඳහා විධිමත් යාන්ත්‍රණයක්

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

சிறப்புரிமை: 2018 யூன் 21ம் திகதிய" லங்காதீப" அறிக்கை

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**"நியூயோர்க் டைம்ஸ்" பத்திரிகை அறிக்கை :**

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரின் கூற்று

**சிறப்புரிமைப் பிரேரணைகள்:** பாராளுமன்ற உறுப்பினர்களுக்கான நடத்தைக் கோவையை மீறுதல்

**தேசிய கணக்காய்வு சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**

மத்தள சர்வதேச விமான நிலையத்தை நடாத்துவதற்கான ஒழுங்கான வேலைத்திட்டம்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Privilege : "Lankadeepa" Report of 21st June, 2018

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

"THE NEW YORK TIMES" REPORT:

Statement by Prime Minister, Minister of National Policies and Economic Affairs

PRIVILEGE MOTIONS:

Breach of Code of Conduct for Members of Parliament

NATIONAL AUDIT BILL:

Read a Second and the Third time, and passed as amended

ADJOURNMENT MOTION:

Proper Mechanism for Management of Mattala International Airport

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2018 ජුලි 05වන බ්‍රහස්පතින්දා***

*2018 யூலை 05, வியாழக்கிழமை*

*Thursday, 05th July, 2018*

**පූ.භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**

**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.

சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.

The Parliament met at 10.00 a.m.,

MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### I

### වරප්‍රසාද : 2018 ජුනි 21වැනි දින "ලංකාදීප" වාර්තාව
### சிறப்புரிமை: 2018 யூன் 21ம் திகதிய "லங்காதீப" அறிக்கை
### PRIVILEGE: "LANKADEEPA" REPORT OF 21ST JUNE, 2018

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසින් 2018 ජුනි 22 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

### II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2018 ජුලි මස 05වන බ්‍රහස්පතින්දා, එනම් අද දින මධ්‍යාහ්න 12.00ට මාගේ නිල කාමරයේ දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලුදෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.



## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ජල සම්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන්, අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) තැපැල් කාර්යාල ආඥා පනතේ 7 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාව;

(ii) 2015 සහ 2016 වර්ෂ සඳහා තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තා; සහ

(iii) 2015 සහ 2016 වර්ෂ සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු දුමින්ද දිසානායක මහතා (වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க - நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Duminda Dissanayake - Minister of Irrigation and Water resources and Disaster Management)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) උපුල්දෙණිය, කනදරා රත්මලේ යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්. ධර්මදාස මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) නොච්චියාගම, පහළවැටියාව යන ලිපිනයෙහි පදිංචි එම්.කේ.බී. කාශ්‍යප බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) තඹුත්තේගම, මලියදේවපුර, අංක 404/05/151 යන ලිපිනයෙහි පදංචි පී.ඩබ්ලිව්.ජී.එස්. ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු බුද්ධික පතිරණ මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு புத்திக பதிரண - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Buddhika Pathirana - Deputy Minister of Industry and Commerce)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) බත්තරමුල්ල, තලංගම උතුර, අංක 487/16 දරන ස්ථානයෙහි පදිංචි අජිත් දේවප්‍රිය මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) හලාවත, සිංහපුර පාර, අංක 24 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඩබ්ලිව්.සී.යූ. සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) බූස්ස, අඩප්පගොඩවත්ත යන ලිපිනයෙහි පදිංචි ටී.ඩබ්ලිව්. ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සාලින්ද දිසානායක මහතා**
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)

ගරු කථානායකතුමනි, බත්තරමුල්ල, තලංගම දකුණ, පැලවත්ත, පෙරේරා මාවත අංක 47/47 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්.පී.එන්. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මොරවක, කළුබෝවිටියන, දංගල යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්, එල්. ප්‍රේමාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කුණ්ඩසාලේ, පල්ලේකැලේ, ජය ශ්‍රී උයන, අංක 368/බී දරන ස්ථානයෙහි පදිංචි ජී.එම්.එස්.කේ. අබේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) නිල්ලඹ, වාරියගල එස්ටේට්, අංක 1/16 දරන ස්ථානයෙහි පදිංචි බී.ඩී. ගුණසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி - கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) බරවකුඹුක, වැටිය, උලහිටියාව ගෙදර යන ලිපිනයෙහි පදිංචි ලියනාරච්චිගේ කරෝලිස් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ලුණුගම්වෙහෙර, පඩව්ගම, දියවරගම, අංක 113 දරන ස්ථානයෙහි පදිංචි එස්.අබේනායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) අම්බලන්තොට, වාඳුරුප්ප, "ජයන්ත" යන ලිපිනයෙහි පදිංචි යූ.ජී. ප්‍රදීප් ශ්‍රී කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### අලි - මිනිස් ගැටුම : ඉලක්කගත විසඳුම
### யானை - மனித மோதல்: இலக்குகளுடனான தீர்வு
### HUMAN-ELEPHANT CONFLICT: TARGET SOLUTION

45/'18

**1.** **ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2016 අයවැය යෝජනා අංක 175ට අනුව, අලි - මිනිස් ගැටුමට ඉලක්කගත විසඳුමක් ලබාදීම සඳහා වර්ෂ 3ක් තුළ ප්‍රයෝජනයට ගැනීමට වෙන් කරන ලද රුපියල් මිලියන 4000ක ප්‍රතිපාදනයෙන් 2016 වර්ෂය තුළ උපයෝජනය කරන ලද මුදල් ප්‍රමාණය සහ එසේ වැය කළ මුදලෙහි ඵලදායීත්වය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) උක්ත අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන අමාත්‍යාංශය හෝ ආයතන කවරේද;

(ii) 1977 සිට මේ දක්වා අලි - මිනිස් ගැටුමෙන් වාර්තා වූ මරණ සංඛ්‍යාව හා දේපළ හානිය එක් එක් වර්ෂය අනුව කවරේද;

(iii) ඉහත එක් එක් වර්ෂයේදී අලි - මිනිස් ගැටුමෙන් මියගිය පාර්ශවයන් වෙනුවෙන් රජය මඟින් වන්දි මුදල් ගෙවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම වන්දි මුදල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව කවරේද;

(v) උක්ත අයවැය යෝජනාවෙහි සඳහන් අලි - මිනිස් ගැටුම සඳහා ලබා දීමට අපේක්ෂිත ඉලක්කගත විසඳුම පැහැදිලි කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுவாதார அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் பிரதேச அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2016ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்தின் 175ஆம் இலக்க முன்மொழிவின் படி, யானை - மனித மோதலுக்கு இலக்குகளுடனான ஒரு தீர்வை வழங்குவதற்காக 3 வருடங்களில் பயன்படுத்தப்படுவதற்காக ஒதுக்கப்பட்ட ரூபா 4000 மில்லியன் நிதி ஏற்பாட்டில் 2016 ஆம் ஆண்டினுள் பயன்படுத்தப்பட்ட நிதித் தொகை மற்றும் அவ்வாறு செலவு செய்யப்பட்ட நிதியின் விளைதிறன் யாது என்பதை இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) குறிப்பிட்ட வரவு செலவுத்திட்ட முன்மொழிவை செயற்படுத்தும் பொறுப்பை ஏற்றுள்ள அமைச்சு அல்லது நிறுவனம் யாது;

(ii) 1977 தொடக்கம் இன்று வரை யானை - மனித மோதல் காரணமாக அறிக்கையிடப்பட்டுள்ள மரணங்களின் எண்ணிக்கை மற்றும் சொத்துச் சேதங்கள் ஒவ்வொரு வருடத்தின்படி யாவை;

(iii) மேற்படி ஒவ்வொரு வருடத்திலும் யானை - மனித மோதல் காரணமாக மரணமடைந்த தரப்பினருக்கு அரசாங்கத்தினால் இழப்பீட்டுத் தொகை வழங்கப்பட்டதா;

(iv) ஆமெனில், அவ்விழப்பீட்டுத் தொகை ஒவ்வொரு வருடத்தின்படி யாது;

(v) குறிப்பிட்ட வரவு செலவுத்திட்ட முன்மொழிவில் குறிப்பிடப்பட்டுள்ள யானை-மனித மோதலுக்கு வழங்குவதற்கு உத்தேசிக்கப்பட்டுள்ள இலக்குகளுடனான தீர்வைப் பற்றி விளக்கமளிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Sustainable Development, Wildlife and Regional Development:

(a) Will he inform this House the amount of money utilized in 2016 out of the allocation of Rs. 4000 million allocated to be used within three years for devising a target solution for the human-elephant conflict as per Proposal No. 175 of the Budget 2016 and its progress?

(b) Will he also inform this House-;

(i) the Ministries and institutions responsible for implementing the above Budget Proposal;

(ii) the number of deaths and damages to property owing to human-elephant conflict reported from 1977 up to now in relation to each year;

(iii) whether compensation was paid by the Government to the parties of persons who died of the human-elephant conflict in each of the above years;

(iv) if so, the amount of compensation in relation to each year; and

(v) whether he explains the expected target solution for human-elephant conflict mentioned in the above Budget Proposal?

(c) If not, why?

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා (තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித தெவரப்பெரும - வலுவாதார அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் பிரதேச அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Palitha Tewarapperuma - Deputy Minister of Sustainable Development, Wildlife and Regional Development)
ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධන, වනජීවී සහ

[ගරු පාලිත තෙවරප්පෙරුම මහතා]

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) 2016 අය වැය යෝජනා අංක 175ට අනුව අලි - මිනිස් ගැටුමට ඉලක්කගත විසඳුමක් ලබාදීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 647.575ක් ලබා දී ඇත. මෙම මුදලින් 2016 වර්ෂයේදී රුපියල් මිලියන 329.230ක් අලි - මිනිස් ගැටුම අවම කිරීම සඳහා උපයෝජනය කරගෙන ඇත. එම උපයෝජනය කරන ලද මුදලින් පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

1. විදුලි වැට කිලෝමීටර් 800ක් ඉදි කිරීම සඳහා අවශ්‍ය විදුලි වැට උපකරණ මිලදී ගැනීම. 2017 වර්ෂය අවසන් වන විට එයින් කිලෝමීටර් 488ක් ඉදිකර අවසන් කර ඇත. අදාළ ලේඛනය ඇමුණුම 01 ලෙස **සභාගත*** කරමි.

2. විදුලි වැට ඉදි කිරීම සඳහා අවශ්‍ය දැව කණු 13,730ක් ගැනීම.

3. විදුලි වැට නඩත්තු කිරීම සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට ආහාර දීමනාව වශයෙන් රුපියල් මිලියන 71.6ක් ලබා දීම.

4. අලි ඇල්ලීම සඳහා වට අහල් 06 මැනිලා කඹ රෝල් 08ක් මිලදී ගැනීම.

5. විල්පත්තු ජාතික උද්‍යානයේ වැව් ප්‍රතිසංස්කරණය හා උඩවලව ජාතික උද්‍යානයේ ආක්‍රමණික ශාක ඉවත් කිරීම.

6. අලි නිර්වින්දන උපකරණ මිලදී ගැනීම.

7. වනජීවී පාලන ඒකක 05ක් පිහිටුවීම.

I කුරුණෑගල කලාපය - 1. ගල්ගමුව වනජීවී පාලන ඒකක

2. නිකවැරටිය වනජීවී පාලන ඒකක

II පුත්තලම කලාපය

3. පුත්තලම වනජීවී පාලන ඒකක

III දකුණු කලාපය

4. හම්බන්තොට වනජීවී පාලන ඒකක

IV ඌව කලාපය

5. වැල්ලවාය වනජීවී පාලන ඒකක

8. දුම්රිය රියැදුරන් දැනුවත් කිරීම සඳහා දුම්රිය මාර්ග දෙපස නාම පුවරු 100ක් සවි කිරීම.

(ආ) (i) තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නයේ ඉතිරි කොටස්වලට දීර්ඝ පිළිතුරු තිබෙන්නේ. එම නිසා පිළිතුරේ ඉතිරි කොටස මම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
*Rest of the speech tabled:*

(ii)

1992 වර්ෂයට පෙර වනඅලි මරණ හා දේපළ හානි පිළිබඳ වාර්තා දෙපාර්තමේන්තුව සතුව නොමැති අත 1992 වර්ෂයේ සිට මෙ දක්වා සිදුවූ වනඅලි මරණ හා මිනිස් මරණ හා දේපළ හානි වාර්තා පහත සඳහ පරිදි වේ.

| වර්ෂය | මිනිස් මරණ | අලි මරණ | දේපළ හානි සංඛ්‍යාව |
|---|---|---|---|
| 1992 | 22 | 90 | දත්ත නොමැත |
| 1993 | 60 | 103 | 105 |
| 1994 | 55 | 113 | 448 |
| 1995 | 57 | 94 | 619 |
| 1996 | 47 | 130 | 399 |
| 1997 | 54 | 164 | 467 |
| 1998 | 53 | 148 | 656 |
| 1999 | 81 | 107 | 658 |
| 2000 | 63 | 150 | 645 |
| 2001 | 44 | 162 | 467 |
| 2002 | 34 | 118 | 551 |
| 2003 | 59 | 108 | 216 |
| 2004 | 49 | 171 | 561 |
| 2005 | 77 | 123 | 851 |
| 2006 | 79 | 163 | 992 |
| 2007 | 72 | 189 | 978 |
| 2008 | 71 | 224 | 771 |
| 2009 | 50 | 228 | 914 |
| 2010 | 81 | 227 | 872 |
| 2011 | 60 | 255 | 1086 |
| 2012 | 73 | 250 | 1309 |
| 2013 | 70 | 206 | 1096 |
| 2014 | 67 | 231 | 1279 |
| 2015 | 63 | 205 | 1120 |
| 2016 | 88 | 279 | 1470 |
| 2017 | 87 | 256 | 835 (වාර්තා වී ඇති ප්‍රමාණය) |

(iii)

1992 සිට 2004 වර්ෂය දක්වා අලි මිනිස් ගැටුමෙන් මියගිය පාර්ශවයන්ගේ යැපෙන්නන් සඳහා වන්දි ගෙවනු ලැබුයේ ජාතික රක්ෂණ සංස්ථාව මඟිනි. 25/2004 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව වන්දි ගෙවීමේ වගකීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති අතර 2004 වසරේ සිට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් වන්දි ගෙවීම ආරම්භ කරන ලදී. (ඇමුණුම 02)**

ඒ අනුව මිනිස් මරණයක් සඳහා රු. 100,000.00 ක වන්දි මුදලක් ගෙවන ලද අතර අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 23/2016 අනුව මරණ සඳහා ගෙවනු ලබන වන්දි මුදල 2016.09.17 දින සිට රු. 200,000.00 දක්වා ඉහළ නංවන ලදී. (ඇමුණුම 03)**

එම වන්දි මුදල 05/2017 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් තවදුරටත් සංශෝධනය කරන ලද අතර එමඟින් ගෙවනු ලබන වන්දි මුදල 2017.02.21 දින සිට රු. 500,000.00 දක්වා ඉහළ නංවා ඇත. (ඇමුණුම 04)**

(iv)

| වර්ෂය | ගෙවනු ලැබූ වන්දි මුදල් ප්‍රමාණය (රුපියල් මිලියන) |
|---|---|
| 1996 | 1.3 |
| 1997 | 1.6 |
| 1998 | 5.5 |
| 1999 | 2.7 |
| 2000 | 1.3 |
| 2001 | 1.4 |
| 2002 | 1.8 |
| 2003 | 1.8 |
| 2004 | 3.6 |
| 2005 | 4.6 |
| 2006 | 6.09 |
| 2007 | 5.00 |
| 2008 | 5.68 |
| 2009 | 6.58 |
| 2010 | 11.99 |
| 2011 | 5.6 |
| 2012 | 7.4 |
| 2013 | 7.7 |
| 2014 | 5.8 |
| 2015 | 6.53 |
| 2016 | 8.15 |
| 2017 | 14.71 |

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

** **පුස්තකාලයේ තබා ඇත.**
** *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** *Placed in the Library.*

(v)

ඔව්.

- දැනට ඉදිකර ඇති විදුලි වැට කි.මී. 4349.1 ප්‍රමාණයක් නඩත්තු කර පවත්වාගෙන යාම.
- 2018 වර්ෂයේ විදුලි වැට කි.මී. 377 ඉදිකිරීමට සැලසුම් කර ඇත.
- 2017 වර්ෂයේ කි.මී. 800 ක විදුලි වැට ඉදිකිරීම සඳහා අවශ්‍ය උපකරණ ලබාදී ගැනීම.
- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබාගෙන විදුලිවැට නඩත්තුව ඉහළ මට්ටමක පවත්වාගෙන යාම තුළින් වනඅලි ගම්වැදීම අවම කිරීමට පියවර ගැනීම.
- පශු වෛද්‍ය ඒකකය සඳහා පහසුකම් වැඩි කිරීම මගින් නිර්වින්දන උපකරණ ලබා ගැනීම හා පීඩාකාරී වනඅලි අත්‍යවශ්‍ය අවස්ථාවලදී අල්ලා ඉවත් කිරීමට අදාල ඒකකයන් ශක්තිමත් කිරීම.
- ප්‍රාදේශීය මට්ටමින් වනඅලි පාලන ඒකක පිහිටුවීම තුළින් ගම්වදින වනඅලින් කඩිනමින් පළවා හැරීමට කටයුතු කිරීම හා ඒ අනුව වනඅලීන්ගේ හා මිනිසුන්ගේ ජීවිතය ආරක්ෂා කිරීමට පියවර ගැනීම.
- වනඅලි පාලන ඒකක සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම තුළින් මෙම කාර්යය වඩාත් කාර්යක්ෂමව කිරීම මේ තුළින් සිදු වේ.
- වනඅලි සංක්‍රමණික මාර්ග ජනාවාසකරණයෙන් වෙන් කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ වනඅලි මිනිස් ගැටුම අවම කිරීම.

(ඈ)

ඉහතින් ඉලක්කගත විසඳුම් ලබා දී ඇත.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

රටේ ඉතා විශාල ජාතික ප්‍රශ්නයක් වන අලි-මිනිස් ගැටුමට විසඳුම් ලබාදීම සඳහා තුන් අවුරුදු කාල පරිච්ඡේදයකට 2016 අය වැය ලේඛනයෙන් වෙන් කර තිබෙන මුදල රුපියල් මිලියන 4,000යි. ඒකෙන් අදහස් කරන්නේ, එක් වර්ෂයක් තුළදී වියදම් කරන්න ඕනෑ මුදල සාමාන්‍යයෙන් රුපියල් බිලියන එකයි දශම තුනක්, තුනහමාරක් විතර ප්‍රමාණයක් බවයි. ඒ කියන්නේ, රුපියල් මිලියන 1,300ක පමණ මුදලක්.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර අනුව, මෙවැනි ප්‍රධාන ජාතික ප්‍රශ්නයකට එක් වර්ෂයක් තුළදී වියදම් කර තිබෙන්නේ රුපියල් මිලියන තුන්සිය ගණනක් පමණයි. එතකොට රුපියල් බිලියන එකක් විතර ඉතිරි වෙලා තිබෙනවා. අය වැය ලේඛනයෙන් සැලසුම්සහගතව, තුන්අවුරුද්දකට කියා වැය ශීර්ෂයක් වෙන් කළාම, එම මුදල නිශ්චිත ආකාරයට කඩාගෙන එක් එක් වර්ෂයේ අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා ළඟා වුණේ නැත්නම් ඒ අය වැය ලේඛනය විහිළුවක් බවට පත් වන අතර, ජනතාවගේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙන්නෙත් නැහැ. ව්‍යාජයක් විතරයි වෙන්නේ. මේ වෙන් කර තිබෙන රුපියල් මිලියන 4,000න් මේ වර්ෂයට ඉතාම කුඩා මුදලක් වැය කරලා අලි-මිනිස් ගැටුම දිගටම පවතින්න හැර තිබෙන බවයි මෙයින් පැහැදිලි වන්නේ. ඒ නිසා, අලුතින් මෙම අමාත්‍යාංශය භාර ගත් ඇමතිතුමාගේ නියෝජ්‍ය ඇමතිතුමා ලෙස ඔබතුමා අලි-මිනිස් ගැටුම වළක්වන්න වෙන් කළ මුදල අර arrears එකත් එක්කම අරගෙන, මේ වර්ෂයේ වියදම් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් යොදන්න අදාළ නිලධාරින් සමඟ හා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කරනවාද කියා මා දැන ගන්න කැමැතියි.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
ගරු මන්ත්‍රීතුමනි, 2016 අය වැය යටතේ වෙන් වූ මුදල්වලින් රුපියල් මිලියන 647ක් අපට ලැබී තිබෙනවා. ඒකෙන් රුපියල් මිලියන 329ක් වියදම් කරලා තිබෙනවා. ඉතිරි රුපියල් මිලියන 318ක් සඳහා භාණ්ඩ ඇණවුම් කරලා තිබෙනවා. ඒ භාණ්ඩ අපට නොලැබුණු නිසා ඒ මුදල් ගෙවා තිබුණේ නැහැ. නමුත්, 2017 වර්ෂයේදී අදාළ භාණ්ඩ සැපයීම කරන ලද හෙයින්, 2017 වර්ෂයේදී ඒ ගෙවීම් කරන ලදී. එම මුදල් ගෙවන ලද්දේ ඒකාබද්ධ අරමුදලෙනි. ඒ මුදල් අපි ගෙවා තිබෙනවා; නැවත ඒ භාණ්ඩ ලැබිලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, විමල් වීරවංශ මන්ත්‍රීතුමා දෙවෙනි අතුරු ප්‍රශ්නය අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අපි මුලින්ම ජනාධිපතිවරයාට ස්තුතිවන්ත වනවා, විද්‍යාත්මකව කල්පනා කර බලා ඔබතුමාටයි, ඔබතුමාගේ අමාත්‍යතුමාටයි මේ විෂයය භාර දීම ගැන. ගරු කථානායකතුමනි, දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සිංහරාජයේ සිටි අලි දෙදෙනෙක් වෙන කොහේටද අරගෙන යන්න ඔබතුමාත්, ඔබතුමාගේ ඇමතිතුමාත් විශාල උත්සාහයක යෙදුණා. ජනාධිපතිවරයාගේ මැදිහත් වීම හේතුකොටගෙන අන්තිමේදී ඔබතුමන්ලාට ඒක ක්‍රියාත්මක කරන්න බැරි වුණා. දැන් ඒ අලි දෙදෙනාට සිංහරාජය තුළම ඉන්න දෙනවාද, එහෙම නැත්නම් ඒ අලි දෙදෙනාව වෙනත් කොහේට හෝ ගෙන යෑමේ සැලසුමක් තිබෙනවාද?

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
ගරු මන්ත්‍රීතුමනි, ඒ අලි දෙදෙනා ඉවත් කළොත් ලෝක උරුමයෙන් සිංහරාජය ඉවත් වන කථාවක් තිබුණා. ඒ පිරිමි සතුන් දෙදෙනෙක්. මේ දෙදෙනාට ජීවත් වන්න ආයු කාලය තිබෙන්නේ තව අවුරුදු 10ක්, 15ක් පමණයි. මේ අලි දෙදෙනා මුලින්ම අරගෙන යන්න හදනකොට මුළු ගමම ඒකට විරුද්ධ වුණා. හැබැයි, දැන් මුළු ගමම එක හඬින් කියා සිටිනවා, මේ අලි දෙදෙනා අරගෙන යන්න කියලා. ඒ ගමේ අයට මේ අලි දෙදෙනා සම්බන්ධයෙන් ලොකු පීඩනයක් තිබෙනවා. ඒ ගමේ අයගේ කීමට ඇහුම්කන් දීලා අපි මේ අලි දෙදෙනා හොරොව්පතානේ අලි සුරැකුම් මධ්‍යස්ථානයට යවන්න හැදුවා. ඒක බොහොම භාරදූර කාර්යයක්. මොකද, අලි කියන්නේ බොහොම සංවේදී සතුන්. පොඩි පීඩනයක් හෝ වැදුණොත් එහෙම අලි මිය යනවා. ඒක තමයි බොහෝ අවස්ථාවලදී සිදුවෙලා තිබෙන්නේ.

අපේ හිටපු පශු වෛද්‍යවරයෙක් මේ ගැන කිව්වා. අලි අල්ලන්න ගිහිල්ලා අලි 100ක් ඇල්ලුවා නම් අලි 50ක් විතර මැරිලා තිබෙනවා. ඔබතුමන්ලාත් අපත් දකිනවාට වඩා මෙහි මහත් අනතුරුදායක පැත්තක් තිබෙනවා. අප වෙඩි වැදුණු අලියකු නිර්වින්දනය කරලා වැට්ටුවොත් ඒ අලියා ගොඩ ගන්න බැහැ, ඒ අලියාට නැඟිටින්න බැහැ. නිර්වින්දන injection එක ගැහුවාට පසුව ඒ අලියා කැලෑ වැදුණොත්, සවස සොයා ගන්න බැරි වුණොත්, කරුවළ වැටුණොත් ඒ අලියා අනිවාර්යයෙන්ම මැරෙනවා. මොකද, නිර්වින්දන injection එක ගැහුවාම තවත් injection එකක් ගහන්න ඕනෑ ඒ අලියාට සිහිය එන්න; ඒ අලියා නැවත ප්‍රකෘති තත්ත්වයට පත් වන්න. එය ගහගන්න බැරි වුණොත් අලියා මැරෙනවා. අප දකිනවාට වඩා මහත් භයානක පැත්තක්, අනතුරු දායක පැත්තක් මෙහි තිබෙනවා. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, අලි-මිනිස් ප්‍රශ්නය ගැන කියමින් ඔබතුමා කිව්වා, විද්‍යාත්මක ක්‍රමයට මේ අමාත්‍යාංශය දී තිබෙනවා කියා. මා හිතන්නේ ඔය කතාවේ තිබෙන්නේ පොඩි අපහාසාත්මක පැත්තක් කියායි. හිටපු ජනාධිපතිතුමාත් කිව්වා, "ජාන විද්‍යාව අනුවයි එහෙම කර තිබෙන්නේ." කියා. හැබැයි, ජාන විද්‍යාව

[ගරු පාලිත තෙවරප්පෙරුම මහතා]

අනුව සතුන්ට දෙන්න ඕනෑ අමාත්‍යාංශයක් නොවෙයි මෙය. මේ ප්‍රශ්නය රටේ ජාතික ප්‍රශ්නයක්. මෙය රටේ ජාතික ගැටලුවක් වෙලා තිබෙනවා. මා කියන්නේ මේ දිහා ඔය පැත්තෙන් බලන්න එපා කියායි. අද වනකොට අපේ රටේ එක දවසකට එක අලියකු බැගින් මැරෙනවා. 2010 වර්ෂයේ ඉඳලා 2017 වර්ෂය වනතුරු අපි හඳුනා ගත් අලි, අපි දැකපු අලි, ගමට වැදුණු අලි 1,992ක් මැරිලා තිබෙනවා. මිනිස්සු 500ක් විතර මැරිලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
ගරු මන්ත්‍රීතුමා, මේකයි කතන්දරය. ඒ අලි දෙදෙනා ගමට එන්නේ කැලේ සීතල වනකොටයි. ගම සීතල වනකොට ඒ අලි ආයෙත් කැලයට යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කාරණය හොඳින් පැහැදිලි කළා.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
ඒ අලි දෙදෙනා ගමට ඇවිත් ගමේ වැඩිපුරම සිටින ප්‍රදේශයක් අපි තෝරා ගත්තා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අලි බලා ගන්න. බොහොම ස්තුතියි.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
ඒ අලි වැඩියෙන්ම කන්න කැමැති ගෝතමාලා කියන ශාකයයි. ඒ ශාකය තිබෙන, අලි දෙදෙනා වැඩියෙන්ම සිටින ප්‍රදේශය අපි දැන් වෙන් කර තිබෙනවා. එතැන කොටු කරලා, එතැන ආරක්ෂා කරලා ඒ අලින්ට අවශ්‍ය කරන කෑමත් ගිහින් දෙන්න අපි සැලසුම් කර තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එච්චරද?

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
ඔව්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට ප්‍රශ්න අංක 2 -135/'18- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.- ***[සභා ගර්භය තුළ නැත.]***

## නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලැබුණු FCID විමර්ශන වාර්තා: නඩු පැවරීම

## சட்டத்துறைத் தலைமையதிபதி திணைக்களத்திற்கு கிடைக்கப்பெற்ற FCID அறிக்கைகள்: தொடரப்பட்ட வழக்குகள்

## FCID INVESTIGATION REPORTS RECEIVED BY ATTORNEY GENERAL'S DEPARTMENT: CASES FILED

162/'18

**3. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2018.05.01 වැනි දින වනවිට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය -FCID- මඟින් විමර්ශන අවසන් කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද එක් එක් විමර්ශන වාර්තා නීතිපති දෙපාර්තමේන්තුවට ලැබුණු දින වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඒ අතරින් මේ වනවිට නඩු ගොනු කර ඇති පැමිණිලි සංඛ්‍යාව කවරේද;

(iii) ඒ එක් එක් නඩුව ගොනු කළ දිනය හා නඩුව විභාග වන අධිකරණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2018.05.01ஆம் திகதியளவில் நிதியியல் குற்றப் புலனாய்வுப் பிரிவினால் (FCID) புலனாய்வுகள் முடிவுறுத்தப்பட்டு சட்டத்துறைத் தலைமையதிபதி திணைக்களத்திற்கு ஆற்றுப்படுத்தப்பட்ட ஒவ்வொரு புலனாய்வு அறிக்கையும் சட்டத்துறைத் தலைமையதிபதி திணைக்களத்திற்கு கிடைக்கப்பெற்ற திகதி தனித்தனியே யாதென்பதையும்;

(ii) இவற்றில் தற்சமயம் வழக்குத் தொடரப்பட்டுள்ள முறைப்பாடுகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு வழக்கும் தொடரப்பட்ட திகதி மற்றும் வழக்கு விசாரிக்கப்படும் நீதிமன்றம் தனித்தனியே யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and Prison Reforms:

(a) Will she inform this House -

(i) separately, the date on which the Attorney General's Department received investigation reports which were sent by the Financial Crimes Investigation Division (FCID), having concluded the investigations by 01.05.2018;

(ii) the number of complaints upon which the cases have been filed by now; and

(iii) separately, the date on which the aforesaid each case was filed and the court before which the case is heard?

(b) If not, why?

**ගරු තලතා අතුකෝරල මහත්මිය (අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය)**

(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)

(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Justice and Prison Reforms)

ගරු කථානායකතුමනි, දීර්ඝ පිළිතුරක් නිසා මම එය **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i)

| Report No. වාර්තාවේ අංකය | Date on which received by the Department නීතිපති දෙපාර්තමේන්තුවට ලැබුණු දිනය | Progress - ප්‍රගතිය | | |
|---|---|---|---|---|
| | | Concluded- Filling Indictment (FI) /Advise Sent (AS)/Discharge Papers Sent(DPS)/Request made to Magistrate Court (RMC) නිගමනයකට එළඹීම - අධි චෝදනා ගොනු කිරීම (FI) / උපදෙස් ලබා දීම (AS)/සැකකරුවන් මුදාහැරීමට අදාළ ලේඛන යවන ලද දිනයන්(DPS)/මහෙස්ත්‍රාත් අධිකරණයට කරන ලද ඉල්ලීම.(RMC) | Further Investigations ordered (FIO) වැඩිදුර විමර්ශනය නියම කිරීම - (FIO) | Receiving attention (RA) අවධානයට යොමු කිරීම (RA) |
| 1. | 2015.03.26 | - | FIO | - |
| 2. | 2015.03.26 | AS | - | - |
| 3. | 2015.04.10 | FI | - | - |
| 4. | 2015.04.10 | FI | - | - |
| 5. | 2015.04.23 | FI | - | - |
| 6. | 2015.04.23 | FI | - | - |
| 7. | 2015.05.22 | FI | - | - |
| 8. | 2015.05.22 | - | - | RA |
| 9. | 2015.05.22 | FI | - | - |
| 10. | 2015.05.26 | - | FIO | - |
| 11. | 2015.06.05 | - | FIO | - |
| 12. | 2015.06.05 | - | - | RA |
| 13. | 2015.06.22 | AS | - | - |
| 14. | 2015.06.25 | - | FIO | - |
| 15. | 2015.06.26 | - | - | RA |
| 16. | 2015.07.03 | AS | - | - |
| 17. | 2015.07.03 | AS | - | - |
| 18. | 2015.07.03 | AS | - | |
| 19. | 2015.07.03 | AS | - | - |
| 20. | 2015.07.03 | AS | - | - |
| 21. | 2015.07.03 | AS | - | - |
| 22. | 2015.07.06 | - | - | RA |
| 23. | 2015.08.28 | FI | - | - |
| 24. | 2015.09.01 | AS | - | - |
| 25. | 2015.09.18 | - | - | RA |
| 26. | 2015.09.21 | FI | - | - |
| 27. | 2015.09.23 | AS | - | - |
| 28. | 2015.10.05 | AS | - | - |
| 29. | 2015.10.12 | AS | - | - |
| 30. | 2015.10.20 | - | FIO | - |
| 31. | 2015.10.20 | - | - | RA |
| 32. | 2015.10.28 | - | - | RA |
| 33. | 2015.10.30 | - | - | RA |
| 34. | 2015.11.06 | - | FIO | - |
| 35. | 2015.11.09 | - | FIO | - |
| 36. | 2015.11.11 | - | - | RA |
| 37. | 2015.11.11 | - | - | RA |
| 38. | 2015.11.19 | FI | - | - |
| 39. | 2015.12.02 | - | - | RA |
| 40. | 2015.12.18 | - | - | RA |
| 41. | 2015.12.23 | FI | - | - |
| 42. | 2015.12.23 | AS | - | - |
| 43. | 2015.12.23 | - | - | RA |
| 44. | 2016.02.03 | - | FIO | - |
| 45. | 2016.02.19 | AS | - | - |
| 46. | 2016.03.04 | - | FIO | - |
| 47. | 2016.03.28 | - | - | RA |
| 48. | 2016.03.31 | AS | - | - |
| 49. | 2016.04.19 | AS | - | - |
| 50. | 2016.04.29 | - | FIO | - |
| 51. | 2016.05.06 | FI | - | - |
| 52. | 2016.05.26 | - | - | RA |
| 53. | 2016.06.21 | - | - | RA |
| 54. | 2016.06.21 | - | - | RA |
| 55. | 2016.06.21 | FI | - | - |
| 56. | 2016.06.21 | - | - | RA |
| 57. | 2016.06.21 | FI | - | - |
| 58. | 2016.07.07 | - | FIO | - |
| 59. | 2016.07.07 | - | - | RA |
| 60. | 2016.07.12 | AS | - | - |
| 61. | 2016.07.15 | - | FIO | - |
| 62. | 2016.08.08 | - | FIO | - |
| 63. | 2016.08.19 | - | - | RA |
| 64. | 2016.08.24 | - | FIO | - |
| 65. | 2016.09.23 | - | - | RA |
| 66. | 2016.09.28 | - | FIO | - |
| 67. | 2016.10.06 | - | FIO | - |
| 68. | 2016.10.10 | AS | - | - |
| 69. | 2016.10.19 | - | - | RA |
| 70. | 2016.10.21 | AS | - | - |
| 71. | 2016.10.24 | - | - | RA |
| 72. | 2016.11.02 | - | - | RA |
| 73. | 2016.11.02 | - | FIO | - |
| 74. | 2016.11.09 | - | - | RA |
| 75. | 2016.11.09 | - | FIO | - |
| 76. | 2016.11.18 | - | - | RA |
| 77. | 2016.11.19 | AS | - | - |
| 78. | 2016.11.24 | - | - | RA |
| 79. | 2016.12.06 | - | - | RA |
| 80. | 2016.12.15 | - | - | RA |
| 81. | 2017.01.04 | - | - | RA |
| 82. | 2017.01.16 | - | - | RA |
| 83. | 2017.01.16 | - | - | RA |
| 84. | 2017.01.17 | AS | - | - |
| 85. | 2017.01.17 | - | FIO | - |
| 86. | 2017.01.17 | AS | - | - |
| 87. | 2017.01.17 | AS | - | - |
| 88. | 2017.01.23 | - | FIO | - |
| 89. | 2017.02.21 | - | - | RA |
| 90. | 2017.03.16 | - | - | RA |
| 91. | 2017.03.17 | - | - | RA |
| 92. | 2017.03.31 | - | - | RA |
| 93. | 2017.04.06 | - | FIO | - |
| 94. | 2017.04.19 | - | - | RA |
| 95. | 2017.05.17 | - | - | RA |
| 96. | 2017.05.18 | - | - | RA |
| 97. | 2017.05.24 | - | FIO | - |
| 98. | 2017.05.30 | - | FIO | - |

| | | | | |
|---|---|---|---|---|
| 99. | 2017.06.28 | - | - | RA |
| 100. | 2017.06.29 | - | - | RA |
| 101. | 2017.07.04 | - | - | RA |
| 102. | 2017.07.10 | - | - | RA |
| 103. | 2017.07.18 | - | - | RA |
| 104. | 2017.07.25 | - | - | RA |
| 105. | 2017.07.25 | - | - | RA |
| 106. | 2017.08.11 | - | - | RA |
| 107. | 2017.08.11 | - | - | RA |
| 108. | 2017.08.23 | - | - | RA |
| 109. | 2017.08.23 | - | - | RA |
| 110. | 2017.09.18 | - | - | RA |
| 111. | 2017.10.13 | RMC | - | - |
| 112. | 2017.11.17 | - | - | RA |
| 113. | 2017.12.14 | DPS | - | - |
| 114. | 2017.12.21 | - | - | RA |
| 115. | 2017.12.21 | - | - | RA |
| 116. | 2017.12.22 | - | - | RA |
| 117. | 2018.01.10 | - | - | RA |
| 118. | 2018.02.02 | - | - | RA |
| 119. | 2018.03.28 | - | - | RA |
| 120. | 2018.04.04 | - | - | RA |
| 121. | 2018.04.04 | - | - | RA |
| 122. | 2018.04.18 | - | - | RA |
| Total | | 38 | 23 | 61 |
| Total Reports received | | 122 | | |

(ii) ඉහත සඳහන් නඩුවලින්, නඩු 13ක් සඳහා පැමිණිලි ගොනු කර ඇත.

(iii)

| Report No. වාර්තාවේ අංකය | Date of Filing නඩු ගොනු කළ දිනය | Court අධිකරණය | Status වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| Report 06 | 2015.08.28 | High Court Colombo | Concluded |
| Report 04 | 2015.08.28 | High Court Colombo | Fixed for hearing |
| Report 05 | 2015.12.09 | High Court Colombo | Fixed for hearing |
| Report 23 | 2015.12.14 | High Court Colombo | Fixed for hearing |
| Report 07 | 2016.02.08 | High Court Kurunegala | Fixed for hearing |
| Report 26 | 2016.04.20 | High Court Polonnaruwa | Concluded |
| Report 03 | 2016.05.04 | High Court Colombo | Fixed for hearing |
| Report 38 | 2016.05.25 | High Court Colombo | Fixed for hearing |
| Report 41 | 2016.06.29 | High Court Nuwara Eliya | Concluded |
| Report 55 | 2016.11.21 | High Court Colombo | Fixed for hearing |
| Report 57 | 2017.03.08 | High Court Gampaha | Fixed for hearing |
| Report 51 | 2017.04.07 | High Court Colombo | Fixed for hearing |
| Report 09 | 2018.01.18 | High Court Colombo | Fixed for hearing |

(ආ) පැන නොනඟී.

ප්‍රශ්නයේ (අ) (i) කොටසේ පිළිතුර අනුව එයට අදාළ කරුණු 122ක් තිබෙනවා. අධිචෝදනා ගොනු කිරීම, උපදෙස් ලබා දීම, සැක කරුවන් මුදා හැරීමට අදාළ ලේඛන යවන ලද දිනය, මහේස්ත්‍රාත් අධිකරණයට කරන ලද ඉල්ලීම් යටතේ නඩු 38ක් තිබෙනවා. ඒ වාගේම වැඩිදුර විමර්ශන නියම කිරීම සඳහා ආපසු යැවූ නඩු ගොනු 23ක් තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු වෙමින් තිබෙන නඩු 61ක් තිබෙනවා. සමස්තයක් හැටියට නඩු 122ක් තිබෙනවා. එය දීර්ඝ විස්තරයක්.

***[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This Answer is also placed in the Library.]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

පැමිණිලි ගොනු කර තිබෙන නඩු 13 කියන්න කෝ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

නඩු හැටියට කියන්නේ මෙහෙමයි. මට පැමිණිලි කර තිබෙන නඩුවල දිනය ඔබතුමාට කියන්න පුළුවන්. ඒක (අ) (iii) ප්‍රශ්නයට උත්තරය හැටියට තිබෙනවා. පැමිණිලි 13ක් ගොනු කර තිබෙනවා. වාර්තාවේ හැටියට තමයි මට කියන්න පුළුවන්.

ඒ කියන්නේ, පුද්ගලයන්ගේ නාමලේඛනය මේ සභාවේ කියන්න පුළුවන්කමක් නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමියනි, නඩු අංකයත් එක්ක කියන්න පුළුවන්ද?

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

නඩු අංක හැටියට නොවෙයි, වාර්තාවක් හැටියටයි එවා තිබෙන්නේ. මේ වන විට නඩු 13ක් ගොනු කර තිබෙන නිසා මේ වෙලාවේ නඩු අංක ලබා දීම අපහසුයි. ඔබතුමා අසා තිබෙන්නේ, නඩු ගොනු කළ දින සහ නඩු විභාග වන අධිකරණ පමණයි. ඒ නඩු දහතුනට අදාළව, නඩු ගොනු කළ දින සහ අධිකරණ ලබා දෙන්න පුළුවන්.

* 2015.08.28 - කොළඹ මහාධිකරණයේ ගොනු කළ නඩුව අවසන් කර තිබෙනවා.
* 2015.08.28 - කොළඹ මහාධිකරණයේ ගොනු කළ නඩුව ඇසීමට මේ වන විට දින නියම කර තිබෙනවා.
* 2015.12.09 - කොළඹ මහාධිකරණයේ ගොනු කළ නඩුව ඇසීමට දින නියම කර තිබෙනවා.
* 2015.12.14 - කොළඹ මහාධිකරණයේ ගොනු කළ නඩුව ඇසීමට දින නියම කර තිබෙනවා.
* 2016.02.08 - කුරුණෑගල මහාධිකරණයේ ගොනු කළ නඩුව ඇසීමට දින නියම කර තිබෙනවා.
* 2016.04.20 - පොළොන්නරුව මහාධිකරණයේ ගොනු කළ නඩුව අවසන් කර තිබෙනවා.
* 2016.05.04 - කොළඹ මහාධිකරණයේ ගොනු කළ නඩුව දැන් ඇසෙමින් පවතිනවා.
* 2016.05.25 - කොළඹ මහාධිකරණයේ දින නියම කළ නඩුව දැන් ඇහෙමින් පවතිනවා.
* 2016.06.29 - නුවරඑළිය මහාධිකරණයේ ගොනු කළ නඩුව දඬ ගෙවා අවසන් කර තිබෙනවා.
* 2016.11.21 - කොළඹ මහාධිකරණයේ පවරපු නඩුව දැන් ඇහෙනවා.
* 2017.03.08 - ගම්පහ මහාධිකරණයේ ගොනු කළ නඩුව දැන් ඇහෙනවා.
* 2017.04.07 කොළඹ මහාධිකරණයේ පවරපු නඩුව දැන් ඇහෙනවා.
* 2018.01.18 කොළඹ මහාධිකරණයේ ගොනු කළ නඩුව දැන් ඇහෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමියනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මීට අවුරුදු තුනකට කලින් ඔබතුමියන්ලා ආණ්ඩු බලය ගන්නකොට බොහොම සද්දෙට කියපු දේ තමයි වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් කරනවා කියන එක. ඒක ප්‍රමාද වනකොට ඒකට විවිධාකාර හේතු ඉදිරිපත් කළා. නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රශ්න ගැන කිව්වා; නඩු ගොඩ ගැහිලා තිබෙනවාය කිව්වා. ඒවාට අපි විකල්ප ඉදිරිපත් කළ වෙලාවේ මොකුත් කළේත් නැහැ. හැබැයි මෑතකදී

කැබිනට් මණ්ඩලයෙන්ම තීන්දුවක් ගත්තා, ඒ සඳහා මහාධිකරණ තුනක් වෙන් කරගෙන නඩු ඇසීමේ කටයුතු ඉක්මන් කරන්න. එතකොට ජනතාව බලාපොරොත්තු වුණා, හරි, දැන් නම් නඩු ටික ඇහෙනවා කියලා. නමුත් සද්දෙ විතරයි; වැඩක් කෙරෙන බවක් පෙනෙන්න නැහැ. මහාධිකරණ තුනක් වෙන් කර ගන්නවා, ඒවාට විනිශ්චයකාරවරු පත් කරනවා, නඩු ඇසීම ඉක්මන් කරනවා කියලා කියපු කතන්දරයට දැන් මොකද වෙලා තිබෙන්නේ?

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

වෛද්‍ය විද්‍යාව හදාරපු මන්ත්‍රීවරයෙක් වන මගේ උගත් මිත්‍ර මන්ත්‍රීතුමාට නීතිඥවරියක් හැටියට මම උත්තරයක් දෙන්නම්. අපේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් නොයෙකුත් තත්ත්වයන් තිබෙනවා. අද අපි එක උසාවියක් පටන් ගන්න අවශ්‍ය සියලුම කටයුතු කරලායි තිබෙන්නේ. මගේ උගත් මිත්‍ර මන්ත්‍රීතුමා මේ කාරණය හොඳට අවබෝධ කර ගනියි කියලා මා විශ්වාස කරනවා. අධිකරණ අමාත්‍යාංශය තිබෙන්නේ නීති සම්පාදනය කරලා, ඒවාට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන අවශ්‍ය පහසුකම් ලබා දෙන්න විතරයි.

නඩු පැවරීම නීතිපති දෙපාර්තමේන්තුව මඟින් සිදු කළ යුතුයි. අධිකරණ සංවිධාන පනතට සිදු කළ සංශෝධනයට අනුව ත්‍රිපුද්ගල මහාධිකරණයක් පිහිටුවනකොට එහි ඉතිරි කාර්ය භාරය සිදු කළ යුත්තේ අපි නොවෙයි. ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ පෙත්සම් කිහිපයක් විභාග කර ගරු අග්‍ර විනිශ්චයකාරතුමා ලබා දුන් තීන්දුවේ හැටියට, මොන නඩුද පවරන්නේ කියන අවසාන අනුමැතිය ලබා දීමේ අයිතිය තිබෙන්නේ ගරු අග්‍ර විනිශ්චයකාරතුමාටයි. දැන් ඔබතුමා කිව්වා, තිබෙන ගැටලු සියල්ල හඳුනා ගෙන, හොඳට අවබෝධ කරගෙන තිබෙනවා කියලා. නීතිපති දෙපාර්තමේන්තුවේ විශාල නිලධාරි හිඟයක් තිබුණා. ඒ අය බඳවා ගැනීමට අපට අවසරය ලැබුණා. ඒ අනුව අපි සියදෙනෙක් බඳවා ගත්තත්, ඒ අයට ඉන්න තැනක් නැති ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා.

දෙවැනි කාරණය, උසාවි තුනක් ආරම්භ කිරීමට කිසිම ගැටලුවක් නැහැ. නමුත් පළමුවැනි මහාධිකරණය පිහිටුවීමට ගොඩනැඟිල්ල ලබා ගත්තේ කොළඹ Traffic Court එක වෙන තැනක පිහිටුවලයි. ගරු අග්‍රවිනිශ්චයකාරතුමා එම මහාධිකරණය විවෘත කිරීමට ඊයේ -2018.07.04- දිනය තමයි ලබා දීලා තිබුණේ. නමුත් මේ ගොඩනැඟිල්ල අලුත්වැඩියා කරගෙන යැමේදී එහි වහලයේ ප්‍රශ්නයක් ඇති වුණා. අපි හිතුවේ ගොඩනැඟිල්ල තිබෙන විධියටම ගෙන ඒ කටයුතු කරගෙන යන්න පුළුවන් වෙයි කියලායි. නමුත් නීතිපති දෙපාර්තමේන්තුවේ නියමය පරිදි අපට ඒක මුල සිට සකස් කිරීමට සිදු වුණා. නාවික හමුදාව එම කටයුතු කරගෙන යනවා. දැනට සති දෙකකට කලින් නාවික හමුදාව කිව්වා, "වහලයේ ප්‍රශ්නයක් තිබෙනවා. වහලය හදලා මිස භාර දෙන්න බැහැ" කියලා.

ඒ ගොල්ලෝ තව සති දෙකක් ඇතුළත -ලබන 10වැනි දා හෝ 15වැනි දා වනකොට- එම ගොඩනැඟිල්ල අපට භාර දෙන්න පොරොන්දු වෙලා තිබෙනවා. ගොඩනැඟිල්ල භාර දුන්නායින් පස්සේ තමයි එතැනට යන්න පුළුවන් වෙන්නේ. ඒ කෙසේ වෙතත් විවෘත කිරීමට 04වැනි දා දින නියම කරපු නිසා කොළඹ මහාධිකරණ අංක එක තුළ මේ අධිකරණය ස්ථාපිත කරන ලෙස දැනුවත් කර තිබෙනවා. ගරු අග්‍ර විනිශ්චයකාරතුමා අධිකරණ තුනටම විනිශ්චයකාරතුමන්ලා පත් කරලා නැහැ. එක අධිකරණයකට විනිශ්චයකාරතුමන්ලා තුන්දෙනෙක් නම් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, නීතිපති දෙපාර්තමේන්තුවේ මේ වනකොට ඉන්න නීතිඥ මහත්වරු 45ක් - 50ක් අතර සීමිත ප්‍රමාණයක් තමයි කොළඹ වැඩකටයුතු කරන්නේ. මේ කියන නඩු ඇතුළු සියලුම නඩුවලට නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටින්නේ ඒ අයයි. අධි චෝදනා පත්‍ර නිකුත් කරන්න අවශ්‍ය ලිපි ලේඛන ගරු අග්‍ර විනිශ්චයකාරතුමාට මේ සතිය ඇතුළත -අද හෝ හෙට- ලබා දෙන බවටත්, ඒ ලබා දීමෙන් අනතුරුව අග්‍ර විනිශ්චයකාරතුමාගේ අනුමැතිය ලැබුණායින් පසුව නව අධිකරණය විවෘත කිරීම කෙසේ වෙතත් අංක එක මහාධිකරණ ශාලාවේ විනිශ්චයකාරතුමන්ලා එම කටයුත්ත පටන් ගන්නවා කියන එක මේ වෙලාවේ මා වග කීමක් ඇතිව කියනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

හිටපු අධිකරණ ඇමතිතුමාත් මොනවාද කියන්න හදනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

අපේ ගරු අමාත්‍යතුමිය කියපු කාරණයට එකතු කිරීමක් කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ඇත්තටම අලුත්කඩේ දිසා අධිකරණ, මහාධිකරණ පිහිටා තිබෙන ගොඩනැඟිලි අවුරුදු සියයකට වැඩිය පැරණියි. ඒවා කීප වතාවක් අලුත්වැඩියා කර තිබෙනවා. මීට අවුරුදු 7 - 8කට කලින් මහාධිකරණ ගොඩනැඟිල්ලේ වහල වර්ෂාවක් පැවැති වෙලාවක කඩාගෙන බිමට වැටුණා. එය දහවලක වුණා නම්, නීතිඥවරු, විනිශ්චයකාරවරු විශාල ගණනකගේ ජීවිත විනාශ වෙන්නත් ඉඩ තිබුණා.

ඒක නිසාම අපි සෑහෙන කාලයක් තිස්සේ අමාරුවෙන් උත්සාහ කරලා ගරු අග්‍රාමාත්‍යතුමාට කියලා, එතුමාගේ ආශිර්වාදය ඇතුව BCC ඉඩම -අක්කර හයක්- මේ වෙනකොට අධිකරණ අමාත්‍යාංශයට ලබා ගෙන තිබෙනවා. එම ඉඩමේ -ඒ අක්කර හය ඇතුළත- අධිකරණ ශාලා 40ක් එක්ක උසාවි සංකීර්ණයක් හදන්න දැනට සැලසුම් කරලා තිබෙනවා. මම හිතන විධියට අපි කවුරුත් ගරු ඇමතිතුමියට උදවු කරන්න ඕනෑ, එම කටයුත්ත ඉක්මන් කර ගැනීම සඳහා.

ගරු කථානායකතුමනි, අලුත්කඩේ දැනට තිබෙන මහාධිකරණ ශාලාවල, දිසා අධිකරණ ශාලාවල කෑලි ගැලවී-

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

ගැලවී මහ දවාලේත් වැටෙනවා. ඒ නිසා ජීවිත සිය දහස් ගණනක අවදානම් තත්ත්වයක් දැන් අලුත්කඩේ උසාවි සංකීර්ණය තුළ තිබෙනවා. ඒක නිසා අපේ ගරු ඇමතිතුමියට අපි උදවු කරන්න ඕනෑ, එම ඉදිකිරීමේ කටයුත්ත ඉක්මනට ඉවර කර ගන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. නොකෙරෙන වෙදකමට කෝඳුරු තෙල් හත් පට්ටයයි -ඒත් මදි-තව වුට්ටක් ඕනෑ කියලා කියමනක් තිබෙනවා. [බාධා කිරීමක්] නොකෙරෙන වෙදකමට කෝඳුරු තෙල් හත් පට්ටයකුත්, තව වුට්ටකුත් ඕනෑ. ඒත් වැඩේ කෙරෙන්නේ නැහැ. ඒ නිසා -[බාධා කිරීමක්] දන්නේ නැත්නම් ලියා ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මගේ අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමියනි, විශේෂයෙන් රටේ ජනතාවත් ඉල්ලීමක් කරලා, ඊට පසුව මේ ආණ්ඩු පක්ෂයේ පසුපෙළ මන්ත්‍රීවරුත් සෑහෙන උද්ඝෝෂණයක් කරලා ඒවායේ ප්‍රතිඵලයක් හැටියට තමයි ඔබතුමියට මේ අධිකරණ ඇමතිකමත් හම්බ වුණේ. කලින් ඇමතිතුමාට යන්න සිද්ධ වුණා. දැන් ඔබතුමියගේ නීති දැනුම පාවිච්චි කරලා -[බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඔබතුමියගේ නීති දැනුම පාවිච්චි කරලා මේ පාර්ලිමේන්තුවට කියපු එක හොඳයි, නඩු අහන්න බැරි වෙලා තිබෙන්නේ වහලය හදන බාස්ලාගේ ප්‍රශ්නයක් නිසාය කියලා. ඇත්තටම අපි ඒක දැන ගත්ත එක හොඳයි. ඔබතුමියගේ දැවැන්ත නීති දැනුම පාවිච්චි කරලා ඔබතුමිය කිව්වා, මේ බාස්ලාගේ ප්‍රශ්නයක් නිසා තමයි මෙච්චර ප්‍රමාණයක නඩු අහන්න බැරි වෙලා තිබෙන්නේ කියලා.

දැන් අලුතින් ඉඩම වෙන් කරගෙන, උසාවි සංකීර්ණය හදලා, නීතිපති දෙපාර්තමේන්තුවට නිලධාරින් බඳවාගෙන, අලුතින් මහෙස්ත්‍රාත්වරුන් පත් කරගෙන නඩු අහනකොට කොපමණ කල් ගතවෙයිද කියලා අපට හිතා ගන්න පුළුවන්. මේ නඩු අහලා දූෂිතයන්ට දඬුවම් කරන්න තමුන්නාන්සේලාට කිසිම අධිෂ්ඨානයක් නැහැ. මේ කියන තාලයෙන් තේරෙන්නේ, උසාවි සංකීර්ණයේ වහලේ ප්‍රශ්නයක් නිසා තමයි මේ නඩු ඇසීම ප්‍රමාද වන්නේ කියන එකයි. රත්නපුරයේ බාස්ලා නැත්නම් මේ මන්ත්‍රීවරුන් බාස්ලා ඕනෑ තරම් දෙයි. හැබැයි තමුන්නාන්සේලා කාටවත් මේ අධිකරණ පද්ධතිය ගොඩ නහන්න වුවමනාවක් නැහැ. ඒක තමයි, මේ පෙන්නුම් කරන්නේ; එවැනි සරල උත්තර දෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ආංශික අධීක්ෂණ කාරක සභා සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය ගන්න පුළුවන්. කෘෂිකර්ම අමාත්‍යාංශයට රුපියල් ලක්ෂ 250 ගණනේ දෙන්න පුළුවන්. ඔබතුමියන්ලාට මේ සඳහා ගොඩනැඟිල්ලක් ලබාගෙන නඩු අහන්න බැහැ. ඔබතුමියන්ලාගේ අධිෂ්ඨානය හොරු ආරක්ෂා කරන්නයි; හොරුන්ට දඬුවම් කරන්න නොවෙයි. ඔබතුමිය ඔය ඇමති ධුරය දමලා යන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ගරු ඇමතිතුමිය පිළිතුරු දෙන්න.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු කථානායකතුමනි, දැන් මට සෑහෙන දිග කථාවක් කරන්න වෙනවා, මගේ උගත් මන්ත්‍රීතුමා -මගේ යාළුවා- කරපු චෝදනාව සම්බන්ධයෙන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද අපට සාකච්ඡා කරන්න ඉතා වැදගත් පනත් කෙටුම්පතක් තිබෙනවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

මා එතුමාට එක කාරණයක් මතක් කරන්න ඕනෑ. විශේෂ අධිකරණ පිහිටුවීම සඳහා අධිකරණ සංවිධාන පනතට සංශෝධන ගෙනෙනකොට එයට ඡන්දය නොදී විරුද්ධ වීම ගැන ප්‍රථමයෙන්ම එතුමාගේ කණ්ඩායමට මගේ කනගාටුව පළ කරන්න ඕනෑ. හැබැයි අපි ඒ පනත් කෙටුම්පත සම්මත කළා. පසු පෙළ මන්ත්‍රීවරුන්ගේ හෝ වෙන කොහේ හෝ තිබෙන ප්‍රශ්නයක් නිසා හෝ අපට ප්‍රාතිහාර්යය පාන්න පුළුවන්කමක් නැහැ. මේ ගොඩනැඟිල්ලේ රත්නපුරේ බාස්ලා වැඩ කරන්නේත් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ උත්තරීතර සභාව නොමඟ යවන කරුණු කියන්න එපා. මා ඔබතුමාට බොහොම පැහැදිලිව කිව්වා, අලුතින් ගොඩනැඟිල්ලක් හැදුවේ නැහැ, තිබෙන ගොඩනැඟිල්ලක් තමයි අලුත්වැඩියා කරන්නේ කියලා. අලුත්කඩේ උසාවි සංකීර්ණයේ තිබෙන තත්ත්වය ගැන හිටපු අධිකරණ ඇමතිතුමා බොහොම පැහැදිලිව කිව්වා.

මා එක කාරණයක් කියන්න ඕනෑ. ශ්‍රී ලංකා නාවික හමුදාවේ අයගේ සම්පූර්ණ මහන්සිය යොදවා මේ ගොඩනැඟිල්ල සකස් කරනකොට ඒ අයට බාස්ලා කියා කියනවාටත් මගේ සම්පූර්ණ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

ඔබතුමන්ලා මේ පනතට කැමැත්තක් -ඡන්දය- දුන්නේත් නැහැ. කොච්චර හදිස්සියක් තිබුණත්, අපි අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරලා, අධිකරණයේ ගරු ගාම්භීරත්වය ඇතිව තමයි ඒ වැඩ කටයුතු කරන්නේ. ගරු අග්‍රවිනිශ්චයකාරතුමා, - [බාධා කිරීමක්] අධිකරණ ශාලා ගිනි තිබ්බලු. මා ඒ ගැන මොකුත් කියන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, බොහොම පැහැදිලිව මා මේ කාරණය කියනවා. පසු පෙළ මන්ත්‍රීවරු හෝ ඉදිරි පෙළ මන්ත්‍රීවරු හෝ ඒ ඕනෑ කෙනෙක් අපට චෝදනා කරපුදෙන්. හැබැයි, මා මේ අමාත්‍යාංශය බාර අරගෙන මාස දහයක් ඇතුළත අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරින්ගේ උපරිම මහන්සියත් ප්‍රයෝජනයට අරගෙන අපේ හිටපු ගරු ඇමතිතුමා කරපු ඒ වැඩ කොටස ඉදිරියට ගෙනිහිල්ලා තිබෙනවා. අපි මේ අධිකරණ ඉක්මනින්ම විවෘත කරනවා. ඔබතුමාට ප්‍රශ්නයක් තිබෙනවා නම් මට කියන්න, ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4-199/'18-(1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

## කෑගල්ල දිස්ත්‍රික්කයේ ජාතික පාසල්: විස්තර
### கேகாலை மாவட்டத் தேசிய பாடசாலைகள்: விபரம்
### NATIONAL SCHOOLS IN KEGALLE DISTRICT: DETAILS

244/'18

**5. ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ එක් එක් මැතිවරණ බලප්‍රදේශයේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) කෑගල්ල දිස්ත්‍රික්කයේ ජාතික පාසල් සංඛ්‍යාව වැඩි කිරීමට සහ දැනට ඇති ජාතික පාසල් තවදුරටත් දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கேகாலை மாவட்டத்தில் ஒவ்வொரு தேர்தல் ஆளுகைப் பிரதேசத்திலும் உள்ள தேசிய பாடசாலைகளின் எண்ணிக்கை தனித்தனியாக எத்தனையென்பதையும்;

(ii) அவற்றின் பெயர்கள் யாவையென்பதையும்;

(iii) கேகாலை மாவட்டத்தில் தேசிய பாடசாலை களின் எண்ணிக்கையை அதிகரிப்பதற்கும் தற்போதுள்ள தேசிய பாடசாலைகளை முன்னேற்றுவதற்கும் அமைச்சினால் மேற் கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the number of national schools in each electorate in Kegalle District separately;

(ii) the names of the aforesaid schools; and

(iii) the steps taken by the Ministry to increase the number of national schools in Kegalle District and to develop the existing schools in that district further?

(b) If not, why?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| අනු අංකය | කෑගල්ල දිස්ත්‍රික්කයේ මැතිවරණ බලප්‍රදේශ | ජාතික පාසල් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අරණායක | 1 |
| 2 | දැදිගම | 1 |
| 3 | දැරණියගල | 1 |
| 4 | ගලිගමුව | 1 |
| 5 | කෑගල්ල | 4 |
| 6 | මාවනැල්ල | 2 |
| 7 | රුවන්වැල්ල | 2 |
| 8 | රඹුක්කන | 1 |
| 9 | යටියන්තොට | 1 |
| එකතුව | | 14 |

(ii)

| අනු අංකය | කෑගල්ල දිස්ත්‍රික්කයේ මැතිවරණ බලප්‍රදේශ | ජාතික පාසලේ නම |
|---|---|---|
| 1 | අරණායක | මාවතගොඩ රිව්සඳ ම.ම.වි. |
| 2 | දැදිගම | ඩඩ්ලි සේනානායක ම.ම.වි. |
| 3 | දැරණියගල | සිරිසමන් ජාතික පාසල |
| 4 | ගලිගමුව | පින්දෙණිය ම.ම.වි. |
| 5 | කෑගල්ල | කෑගලු බාලිකා ම.වි./ කෑගලු ම.වි. ශාන්ත ජෝශප් බාලිකා ම.වි./ ශාන්ත මරියා ම.වි. |
| 6 | මාවනැල්ල | මයූරපාද ම.වි./ සහිරා විද්‍යාලය |
| 7 | රුවන්වැල්ල | දෙහිඕවිට ජාතික පාසල/ රාජසිංහ ම.ම.වි. |
| 8 | රඹුක්කන | පින්නවල ම.ම.වි. |
| 9 | යටියන්තොට | ආචාර්ය එන්.එම්. පෙරේරා ම.ම.වි. |

(iii) ඔව්.

අමාත්‍ය මණ්ඩලයේ නිර්ණායක මත සකසා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කරන ලද ජාතික පාසල් වැඩි කිරීම හා සංවර්ධනය කිරීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය නැවත සංශෝධනය කර ඉදිරිපත් කරන මෙන් අමප/18/0757/742/013 හා 2018.05.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් දන්වා ඇත. දැනට ඒ පිළිබඳ කටයුතු කරගෙන යනු ලැබේ. එම ප්‍රතිපත්තිය අනුමත වූ පසු, ඒ අනුව ජාතික පාසල් සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කිරීමට නියමිතය.

(ආ) අදාළ නොවේ.

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, ඉතා පැහැදිලි උත්තරයක් ලබා දීම ගැන ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වනවා.

[ගරු හේෂාන් විතානගේ මහතා]

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, මා කෑගල්ල දිස්ත්‍රික්කය පිළිබඳව මෙම ප්‍රශ්නය අහන්න හේතුව මේකයි. රත්නපුර, කෑගල්ල කියන දිස්ත්‍රික්ක දෙක අයිති සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල විශාල ලෙස ගුරු හිඟයක් නැහැ. නමුත්, මා දන්නා තරමින් කෑගල්ල දිස්ත්‍රික්කයේ ගුරු අතිරික්තයක් තිබෙනවා; රත්නපුර දිස්ත්‍රික්කයේ ගුරු හිඟයක් තිබෙනවා. මේ තත්ත්වය වෙනස් කරන්න පළාත් සභාවට කවදාවත් හැකි වන්නේ නැහැ. මොකද, ඒ පළාත් සභාවේ මහ ඇමතිවරයා හිටපු කාලයේ මොන තරම් ගුරු විභාග පැවැත්වූවත්, මොන ආකාරයේ බඳවා ගැනීම් සිදු කළත්, පළාත් පාසල් අඩු ගණනක් තිබෙන කෑගල්ල දිස්ත්‍රික්කයේ හැම දාම ගුරු අතිරික්තයක් තිබුණ නිසා. උදාහරණයක් විධියට දෙහිඕවිට අධ්‍යාපන කලාපය ගත්තාම එහි විශාල ලෙස ගුරු අතිරික්තයක් තිබෙනවා.

රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රශ්නය විසඳන්න කවදාවත් හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඔබතුමා, "ළඟම පාසල-හොඳම පාසල" වැඩසටහන යටතේ පළාත් පාසල්, ජාතික පාසල් කියන භේදයකින් තොරව ඒ හැම පාසලකටම අවශ්‍ය පහසුකම් ලබා දුන්නා වාගේම, ඔබතුමාට තිබෙන බලය පාවිච්චි කරලා මේ පළාත් සභාවේ අත්තනෝමතික ක්‍රියාවලිය නිසා ඇති වී තිබෙන තත්ත්වය හරි තැනකට ගෙනෙන්න, ගුරු ප්‍රශ්නය සමපාත කරන්න යම් පියවරක් ගන්න පුළුවන් වෙයිද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අපට මැදිහත් වෙන්න තිබෙන අවස්ථා සීමිතයි. එසේ වුවත්, පළාත් ලේකම්වරු සහ ආණ්ඩුකාරවරු කැඳවලා මේ සම්බන්ධයෙන් අපි පැහැදිලි කළා. විශේෂයෙන්ම අතිරික්තයක් තිබෙන තැන්වලින් පුරප්පාඩු තිබෙන තැන්වලට දමන්නත් සාකච්ඡා කළා. ඒ වාගේම අපි වැටුප් ගෙවලා ජාතික පාසල්වල අතිරික්ත ගුරුවරුන් පළාත් සභා පාසල්වලට ලබා දෙන්නත් අපි එකඟ වුණා. මේවා හරියාකාරව නොවෙන නිසා තමයි අපේ ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය අහන්නේ.

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු කථානායකතුමනි, අපි මොන තරම් සංවර්ධනයක් කළත්, පාරවල් කාපට් කරලා, ඒ මොන දේ කළත් වැඩක් නැහැ. ඔය හදන කාපට් පාරවල යන්න පුළුවන් ඔළුගෙඩි ටිකක් තිබෙන මිනිස්සු ටිකක් හදන එක තමයි අපේ වග කීම වෙන්නේ. ගරු ඇමතිතුමනි, එහෙම වග කීමක් දරන පාසල් පද්ධතිය විවිධ වූ දේශපාලනික ඕනෑ-එපාකම් වෙනුවෙන් කඩාකප්පල් කරන්න, අඩපණ කරන්න කටයුතු කරන පිරිසක් ඉන්නවා. ඒක ලොකු අභාග්‍යයක්. විශේෂයෙන්ම අපි ඒක ඊයේ දිනයේ දැක්කා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා; ඒ වාගේම මා යෝජනාවක් කරනවා. දේශපාලන පළිගැනීම් කියන එක මේ රටේ නැති වෙන්න ඕනෑ එකක්. ආණ්ඩු වෙනස් වෙන කොට ගුරුවරු පළිගැනීමට ලක් වෙන පහත් තත්ත්වයක් නම් තිබෙන්නේ, එම පාසල් පද්ධතිය ඉහළ තැනකට පත් කරන්න කුමන අමාත්‍යවරයෙකුටවත් බැහැ. ඔබතුමා මේක නිවැරදි කරන්න කටයුතු කරලා තිබෙනවා.මේ අහිංසක දරුවන්ට දේශපාලන භේදයකින් තොරව අධ්‍යාපනය ලබා දීමේ වග කීම දරන ගුරුවරු, තමන්ගේ දේශපාලනික අවශ්‍යතා වෙනුවෙන්, තමන්ගේ කඩා වැටී තිබෙන දේශපාලන ප්‍රතිරූපය ගොඩනගා ගැනීම සඳහා මේ අහිංසක දරුවන් බිල්ලට ගෙන කටයුතු කිරීම වැරැදියි. උද්ඝෝෂණය කිරීමේ අයිතිය තිබෙනවා. නමුත් මෙය මහා දැවැන්ත කඩාකප්පල්කාරී පියවරක් විධියට ඉස්සරහට ගෙනයාම අපි පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා. මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේක ජාතික අවශ්‍යතාවක් ලෙස සලකා කැබිනට් මණ්ඩලය, ගරු අග්‍රාමාත්‍යතුමා, අතිගරු ජනාධිපතිතුමා එක්ක එකතු වෙලා මෙහි ප්‍රතිපත්තිමය වෙනසක් ඇති කරන්න කියලා. අපි දන්නවා යුද හමුදාව, පොලීසිය වාගේ ආයතනවල හොඳ විනයක් තිබෙන බව. ඒ නිසා තමයි එහි කටයුතු නිසි ආකාරයෙන් පවත්වාගෙන යන්නේ. මේ පාසල් ගුරුවරුන්ගෙන් සියයක් ගත්තොත් එයින් වැඩි ප්‍රමාණයක් මේ විනය ආරක්ෂා කරන්න කටයුතු කළත්, සුළු පිරිසක් දේශපාලනික ඕනෑ-එපාකම් සඳහා දරුවන් පලිහක් විධියට තියාගෙන කටයුතු කිරීම වෙනුවෙන් අමාත්‍යාංශය විධියට ඉදිරියට ගන්නා වූ පියවර කුමක්ද? ඒ වාගේම අධ්‍යාපනය වෙනුවෙන් ජාතික වැඩසටහනක්, ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍යයැයි කියලාත් මම විශ්වාස කරනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, ඉතාමත් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරලා තමයි මෙම දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන් සඳහා අපි සහන ලබා දුන්නේ. විශේෂයෙන්ම එම සියලුම අභියාචනා රජයේ ඉහළ නිලධාරින්ගෙන් සැදුම්ලත් කමිටුවකින් පරීක්ෂා කරනු ලැබුවා. 12,000කට වැඩි අභියාචනා ප්‍රමාණයක් ඇවිල්ලා තිබුණා. රාජ්‍ය සේවා කොමිෂන් සභාවත් ඒවා පරීක්ෂාවට ලක් කළා. එහෙම පරීක්ෂාවට ලක් කරලා, 1,018දෙනෙකු සඳහා පමණයි උසස්වීම්, එහෙම නැත්නම් අදාළ ශ්‍රේණි ලබා දුන්නේ. ඔවුන්ට වැටුප සහ ශ්‍රේණිය පමණයි ලැබෙන්නේ. තනතුරු ලැබෙන්නේ නැහැ. ඒක ඉතාම විධිමත්වයි කරනු ලැබුවේ. කවුරු හෝ කියනවා නම්, නුසුදුසු කෙනෙකුට හෝ වැරැදි කෙනෙකුට දීලා තිබෙනවා කියලා, එය රාජ්‍ය සේවා කොමිෂන් සභාවත් අභියෝගයකට ලක් කිරීමක් විතරක් නොවෙයි, අවශ්‍ය නම් ඔවුන්ට අධිකරණයටත් යන්න පුළුවන්. අධිකරණයට ගිහිල්ලා ඒ වෙනුවෙන් පෙනී සිටින්න පුළුවන්. එහෙම නැතුව පසු ගිය කාලයේ රාජ්‍ය සේවා කොමිසම අක්‍රිය කරලා, තොග පිටින් කැබිනට් පත්‍රිකා දාලා, දේශපාලන පළිගැනීමට ලක් වුණා කියලා තොග පිටින් පත්වීම් ලබා දෙමින් මේ පද්ධතිය විනාශ කරපු අය අය ඇවිල්ලා අද මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් කරන්න යනවා නම් අපට ඒකට ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ. අපි ඉතා පැහැදිලිව, විනිවිද පෙනෙන විධියට වැඩ කරලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ දරුවන්ගේ අනාගතය අඳුරේ දමන්නේ නැතුව, වෙන වෙන න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කරන්නේ නැතුව ඉදිරියේ දී කටයුතු කරන්න කියලා මම ගරු භවතුන්ගෙනුත්, ඒ වාගේම විදුහල්පතිවරුන්ගෙනුත් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. ප්‍රශ්න අංක 6 -395/'18- (1), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීමා සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -416/'18- (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 -442/'18- (1), ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 -453/'18- (1), ගරු බිමල් රත්නායක මහතා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමා මේ සභාවේ සිටින වෙලාවේ මට එතුමාගෙන් පොඩි කරුණු පැහැදිලි කර ගැනීමකට ඉඩක් දෙන්න පුළුවන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අගමැතිතුමාගේ කැමැත්ත තිබෙනවා නම් පුළුවන්. නැත්නම් මට අමාරුයි. අගමැතිතුමා එයට එකඟ නම් මට අවසර දෙන්න පුළුවන්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

කමක් නැහැ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු අගමැතිතුමනි, මම අහපු ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට ගරු රාජ්‍ය අමාත්‍යතුමා මාස තුනක් කල් ඉල්ලුවා. ඒ සඳහා අපි මාස තුනකින් පිළිතුරු බලාපොරොත්තු වෙනවා. ඔබතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා මෙම කාරණය මා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට අලුතින් තේරී පත් වුණු මහජන නියෝජිතයන්ට සහභාගි වීම තහනම් කරලා චක්‍රලේඛයක් යවලා තිබෙනවා. එම නව ක්‍රමය යටතේ එක් පළාත් පාලන කොට්ඨාසයකට එක් මන්ත්‍රීවරයකු පමණයි පත් කරලා තිබෙන්නේ. සභාපතිවරයා පමණක් සහභාගි වීම ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ නිසා එම කොට්ඨාස ප්‍රශ්නය පිළිබඳව විමසීමක් කරන්න. මන්ත්‍රීවරුන්ට එම කමිටුවලට සහභාගි වීම තහනම් කරලා නිකුත් කර ඇති චක්‍රලේඛය අවලංගු කරලා සියලුම මන්ත්‍රීවරුන්ට ඒවාට සහභාගි වීමට ඉඩ කඩ ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}

ඇත්ත වශයෙන්ම ඒ කොමිටියට සහභාගි වෙන්නේ සභාපතිතුමා, එතුමාගේ නියෝජිතයා, විපක්ෂ නායකතුමා සහ කණ්ඩායමේ නියෝජිතයන්. මා දන්නා හැටියට, මේ පිරිස පාලනය කරගන්න පුළුවන් විධියට තමයි වැඩකටයුතු කරගෙන යන්නේ. සභාපතිට එක් අයෙකු නම් කරන්න පුළුවන්. විපක්ෂ නායකට තව එක්කෙනෙක් නම් කරන්න පුළුවන්. විපක්ෂ නායක සාමාන්‍යයෙන් නම් කරන්න ඕනෑ ඊළඟ පක්ෂයේ ඉන්න පුද්ගලයෙක්.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

සමහර වෙලාවට වෙන කොට්ඨාසයක ප්‍රශ්නයක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා දන්නේ නැහැ. එතුමා දන්නේ එතුමාගේ කොට්ඨාසය ගැන. ඒ නිසා කොට්ඨාසයේ එක්කෙනෙකුට සහභාගිවීමට අවස්ථාව නොදීම තුළ ප්‍රශ්නයක් මතු වනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

සභාපති දන්නේ නැත්නම් වැඩක් නැහැ නේ. අපේ අය දන්නවා නේ, තමන්ට අයත් මන්ත්‍රී කොට්ඨාසය ගැන.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

සභාපති වෙලා සිටීම නොවෙයි, කොට්ඨාසයේ ක්ෂණිකව ඇතිවන ප්‍රශ්නයක් සම්බන්ධයෙන් මම කියන්නේ. මේ කාරණය එක පක්ෂයකට නොවෙයි, හැම පක්ෂයකටම බලපාන දෙයක්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

සභාවේ සාකච්ඡා කරලා, සභාව නියෝජනය කරනවා. අපි දැන් මහඇමතිවරු මුණගැහෙනකොට මුළු පළාත් සභාවම අරගෙන එන්න කියලා එතුමන්ලාට කියන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට මෙතෙක් එම ප්‍රාදේශීය සභාවේ සිටින මන්ත්‍රීවරුන් සහභාගි වුණා. ඒක අලුත් දෙයක් නොවෙයි. ඔබතුමන්ලා දැන් නිසි චක්‍රලේඛයකින් දැනුම් දීලා තිබෙනවා, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ සහභාගිවීම වළක්වන්න කියලා. හැබැයි, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු තමයි ඒ ප්‍රාදේශීය සභාවේ සිද්ධ වන කාර්යයන්, එහි සිදුවී තිබෙන අතපසුවීම් ගැන දන්නේ. ඒ වාගේම කොට්ඨාස ක්‍රමයක් තිබෙන්නේ. ඔවුන් ඔවුන්ගේ කොට්ඨාස නියෝජනය කරමින් එන්නේ. කොට්ඨාසයේ ප්‍රශ්න සාකච්ඡා කිරීම සඳහා නිල වශයෙන් තිබෙන තැන. ඒ නිසා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, එවැනි ඉවත් කිරීමක් කරන්න කටයුතු කරන්නේ ඇයි කියලා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඇමතිතුමා ඉන්නවා, ඇමතිතුමා පිළිතුරු දෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා.

**ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
The Hon. Wajira Abeywardana - (Minister of Home Affairs)
ගරු කථානායකතුමනි, දිසාපතිවරු තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කරලා, මේ ගැන අපි වාර්තාවක් ඉල්ලුවා. එම වාර්තාවේ සඳහන් වෙන ප්‍රධාන කාරණයක් තමයි දැනට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු 8,000ක් ලංකාවේ ඉන්නවා; මේ 8,000කගේ අදහස් ලබා ගැනීමත් සම්බන්ධීකරණ කමිටු පවත්වාගෙන යෑමත් සිදු කරන්නේ කොහොමද කියන එක. ඒ අනුව ප්‍රාදේශීය සභාවේ හෝ නගර සභාවේ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක වුණාට පසුව, එම න්‍යාය පත්‍රය සභාපතිතුමා හෝ ලේකම්තුමා අපේ අදාළ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ලේකම්තුමාට, ඒ කියන්නේ ප්‍රාදේශීය ලේකම්තුමාට එව්වාම ඒක අනිවාර්යයෙන්ම න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට කටයුතු කරන්න කියලා දැනට යෝජනා වෙලා තිබෙනවා. ඒ අතර සභාපතිතුමා, නියෝජ්‍ය සභාපතිතුමා, විපක්ෂයේ සංවිධායක, ඒ වාගේම විපක්ෂයේ වෙනත් කණ්ඩායම් නායකයෙක් ඉන්නවා නම් ඒ අයට සහභාගිවීමට අවසර දෙන්න කියලා යෝජනා වෙලා තිබෙනවා.

එතකොට මේ නිලධාරීන්ටත්, අනෙක් අයටත් එම වැඩ කටයුතු කරදරයකින් තොරව කරගෙන යාමට පුළුවන් වෙනවා. ලංකාවටම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 8,000ක් පත් වෙලා ඉන්න වෙලාවක මේ 8,000ම සහභාගිත්වය ගන්න ගියොත් එතැන බරපතළ ප්‍රශ්නයක් මතු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි මේ ගැන විවාදයක් කරන්නට අවශ්‍ය නැහැ. දෙපාර්ශ්වය එකතුවෙලා Sectoral Oversight Committee එකේදී සාකච්ඡා කරන්න. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, පැහැදිලි කිරීමක් පමණක් කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, දිසාපතිවරුන් තුන්දෙනෙකු එකතුවෙලා සාකච්ඡා කරලා තමයි මේ තීරණය ගත්තේ කියලා කියනවා. හැබැයි ප්‍රාදේශීය සංවර්ධන කමිටු පිළිබඳව තීරණ ගත යුතු වන්නේ ජනතා නියෝජිතයන්. ජනතා නියෝජිතයන්ගෙන් තෝරා පත් කර ගන්නා ලද කමිටුවකින් තමයි මේ තීරණය ආ යුතු වන්නේ. ඒ වාගේම ගරු ඇමතිතුමා කිව්වා, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 8,000ක් ඉන්නවා කියලා. ගරු කථානායකතුමනි, පෙන්නුම් කරන්නට හදන්නේ මේ හැම ආයතනයටම ගිහින් 8,000ක් වාඩි වෙනවා කියලා. ලංකාව පුරා ආයතන 341ක් තිබෙනවා. මේ ආයතන 341 තමයි මන්ත්‍රීවරුන් 8,000ක් නියෝජනය කරන්නේ.

ගරු කථානායකතුමනි, ඊළඟට මේ ප්‍රාදේශීය සංවර්ධන කමිටුවල සභාපති බවට පත් වෙලා තිබෙනවා, මන්ත්‍රීවරයකුවත් නොවන අය.නිකම්ම ආසන සංවිධායකවරු. තමුන්නාන්සේලාගේ සිරිකොතෙන් පත්වීමක් දෙනවා, ආසන සංවිධායක කියලා. එතකොට එයා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපති කරලා තිබෙනවා. හැබැයි එම පළාතේ ජනතාව විසින් තෝරා පත් කර ගන්නා නියෝජිතයා එම කමිටුවේ සාමාජිකයෙක් බවට පත් වන්නේ නැහැ. සභාපති වන්නේ ජනතාවත් දන්නේ නැති පක්ෂයේ නියෝජිතයෙක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙම කරුණ Sectoral Oversight Committee එකේදී කථා කරන්න පුළුවන්. අද ඉතාමත්ම වැදගත් විවාදයක් පැවැත්වීමට නියමිත නිසා, තවත් වේලාව දෙන්න විධියක් නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவன்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එක මොකක්ද? Point of Order එකෙන් පිට කථා කරන්නට එපා, එහෙම වුණොත් මම අවස්ථාව දෙන්නේ නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவன்ச)
(The Hon. Wimal Weerawansa)
Point of Order පිට ගිහිල්ලා කියලා වැඩක් නැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, කියන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ඔබතුමා අනෙකුත් මන්ත්‍රීවරුන්ට ලබාදුන් සාධාරණ අවස්ථාව මටත් ලබා දෙයි කියලා මම හිතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා සාධාරණ විධියට කටයුතු කරනවා නම්, අවස්ථාව දෙන්න පුළුවන්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි,ගරු වජිර අබේවර්ධන ඇමතිතුමාගෙන් මම අහනවා, මේ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් ප්‍රාදේශීය සංවර්ධනයට අත්‍යවශ්‍ය නැද්ද කියා. නගරාධිපති සහ විපක්ෂ නායක පමණක් සිටියාම ප්‍රමාණවත්ද? පළාත් පාලන ආයතන මන්ත්‍රීවරයෙකුට තිබෙන අයිතියක් තමයි, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට සහභාගී වීම. ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ- [බාධා කිරීමක්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, අද ජාතික විගණන පනත් කෙටුම්පත විවාදයට ගැනීමට තිබෙනවා. එම නිසා දෙකෙන් එකක් තීරණය කරන්න. මේ කාරණය ගැන වාද කරන්නට ඕනෑ නම් වෙනත් දවසක පනත් කෙටුම්පත විවාද කරමු. අදාළ නැති ප්‍රශ්න ඇදගෙන මේක කල් දමන්නට ඉඩ දෙන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ කාරණය Sectoral Oversight Committee එකට යොමු කරමු. [බාධා කිරීමක්] ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා, 9 වන ප්‍රශ්නය අහන්න. [බාධා කිරීමක්]

## සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය : නිල වාහන
### சமூக நலன்புரி மற்றும் ஆரம்பக் கைத்தொழில் அமைச்சரின் பிரத்தியேக பதவியணி: உத்தியோகபூர்வ வாகனங்கள்
### PERSONAL STAFF OF MINISTER OF SOCIAL WELFARE AND PRIMARY INDUSTRIES: OFFICIAL VEHICLES

453/'18

**9. ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சமூக நலன்புரி மற்றும் ஆரம்பக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) சமூக நலன்புரி மற்றும் ஆரம்பக் கைத்தொழில் அமைச்சரின் பிரத்தியேக பதவியணிக்கு இணைக்கப்பட்டுள்ள உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப்பட்டுள்ள ஒவ்வோர் உத்தியோத்தரதும் பெயர், பதவி, ஒதுக்கப்பட்டுள்ள வாகனத்தின் வகை, பதிவிலக்கம் மற்றும் அவ்விதம் ஒதுக்குவதற்கு அங்கீகாரம் வழங்கியது யார் என்பதை வெவ்வேறாக அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Social Welfare and Primary Industries :

(a) Will he inform this House separately the name and designation of each officer who is attached to the private staff of the Minister of Social Welfare and Primary Industries and has been allocated a vehicle, along with details on the type of vehicles allocated to them, registration number and the name of the officer who authorized such allocation of a vehicle?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබාදෙනවා.

(අ)

| නිලධාරියාගේ නම | තනතුර | වෙන් කර ඇති වාහනයේ වර්ගය | ලියා පදිංචි අංකය | අනුමැතිය ලැබී ඇති ආකාරය |
|---|---|---|---|---|
| ප්‍රියාමණී හේමචන්ද්‍ර මිය | පෞද්ගලික ලේකම් | කාර් (ටොයොටා) | CAX 5836 | ජනාධිපති ලේකම්ගේ අංක CA/1/17/1 හා 2010.05.14 දිනැති ලිපියේ 3:4 වගන්තිය මඟින් අනුමැතිය ලබා දී ඇත. |
| තිලක් කුමාර රත්නායක මහතා | මාධ්‍ය ලේකම් | ඩබල් කැබ් (මිට්සුබිෂි) | PG 1874 | |
| ස්වර්ණා තිලකරත්න මිය | සම්බන්ධීකරණ ලේකම් | ඩබල් කැබ් (නිසාන්) | PF 6572 | |
| සසිත් සූරියාරච්චි මහතා | සම්බන්ධීකරණ ලේකම් | කාර් (නිසාන්) | CAQ 1760 | |
| සුරේෂ් ද සිල්වා මහතා | මහජන සම්බන්ධතා නිලධාරි | ඩබල් කැබ් (මිට්සුබිෂි) | PG 1901 | |

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

මේක නව අමාත්‍යාංශයක් නිසා, අමාත්‍යතුමාට මිලදී ගැනීමට අනුමත වූ වාහන දෙකක් තිබෙනවා. නමුත් එතුමා ඒවා මිලදී ගත්තේ නැහැ. එතුමා තවමත් තමන්ගේ පෞද්ගලික වාහනය තමයි රාජකාරි කටයුතු සඳහා යොදාගෙන තිබෙන්නේ.

(ආ) අදාළ නොවේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම අහන මේ කාරණය අතුරු ප්‍රශ්නයක් නොවෙයි, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, ඒ නිලධාරින්ට වෙන් කර ඇති සියලුම වාහන සංඛ්‍යාව කොපමණද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එක් නිලධාරියකුට එක වාහනය ගණනේ වාහන 5ක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒ සඳහා අනුමැතිය ලබාදී තිබෙන්නේ කවුද, ගරු ඇමතිතුමනි?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ජනාධිපති ලේකම්ගේ අංක CA/1/17/1 හා 2010.05.14 දිනැති ලිපියේ 3:4 වගන්තිය මඟින් අනුමැතිය ලබාදී තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම අහන්නේ ඒක නොවෙයි, ගරු ඇමතිතුමනි. අමාත්‍යාංශයෙන් මේ වාහන අනුමත කර තිබෙන්නේ කවුද කියායි මම අහන්නේ. චක්‍රලේඛය මා ළඟ තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අනුමත කර තිබෙන්නේ අමාත්‍යාංශ ලේකම්වරයායි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අදාළ ඇමතිවරු කවුරුවත් දැන් මේ ගරු සභාවේ නැහැ. නමුත් මෙම අමාත්‍යාංශයට අදාළව යොමු කරන්න අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, මම අසන මේ ප්‍රශ්නයට ඔබතුමා මට පිළිතුරු එවන්න. අදාළ ප්‍රශ්න ඇමතිවරුන්ට යොමු කර පිළිතුරු ලබාදෙනවාය කියා ඔබතුමා පොරොන්දුවක් දීලා තිබෙනවා. මට නම් තවම එහෙම පිළිතුරක් ලැබිලා නැහැ. නමුත් මම මේ ප්‍රශ්නය අහන්නම්. ගරු ඇමතිතුමනි, අවුරුදු 70 ඉක්ම වූ වැඩිහිටි අයගේ සුබසාධනය වෙනුවෙන් කටයුතු කරන අරමුදල තිබෙන්නේ මෙම අමාත්‍යාංශය යටතේයි. පසුගිය අමාත්‍යවරයා මේ අමාත්‍යාංශය දරන කාලයේ, COPE එකේ නිර්දේශ කඩ කරමින්, හැම වැඩිහිටියෙකුටම දෙන වැඩිහිටි දීමනාවෙන් රුපියල් සියය ගණනේ කපා ගත්තා. ගරු කථානායකතුමනි, එතුමා මාසයකට වැඩිහිටියන්ට හිමි විය යුතු රුපියල් ලක්ෂ 384ක මුදලක් වෙනම කපාගෙන රජයට වග කියන්නේ නැති වෙනම අරමුදලක දැම්මා. COPE එක මෙය රාජ්‍ය මුල්‍ය අවභාවිතාවක් ලෙස නිර්දේශ කළා; එය නතර කරන්න කියා නියෝග කළා. හැබැයි, ඒක කළේ නැහැ. දැන් අලුත් ඇමතිවරයෙක් මෙම අමාත්‍යාංශයට පත් වෙලා ඉන්න නිසා, වැඩිහිටියන්ට ලැබිය යුතු මේ මුදල් නීති විරෝධීව කපා ගැනීම නතර කරනවාද කියා ගරු ඇමතිතුමාගෙන් දැනගන්න මා කැමැතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒක කලින් හිටපු ඇමතිවරයාගේ කාලයේ සිද්ධ වුණු දෙයක්. දැන් සිටින අලුත් ඇමතිතුමා ඒ ගැන අවධානය යොමු කරාවි. ඒ සම්බන්ධව ඔබතුමාට අනිවාර්යයෙන්ම පිළිතුරක් ලබා දෙන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේ ප්‍රශ්නයටම සම්බන්ධ කරමින් මම අහන්නේ. ගරු ඇමතිතුමනි, ඉහත ප්‍රශ්නයට ඔබතුමා ලිඛිත පිළිතුරක් ලබාදෙයි කියා මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මේක ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්නයක් නිසා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා වුණත් පිළිතුරු දුන්නාට කමක් නැහැ. ඔබතුමා දන්නවා, රටේ විශාල තැපැල් වර්ජනයක් තිබුණු බව. ඒක සති ගණනක් ගිහින් නතර වුණා. නමුත්, ඒ වර්ජනයේ නියැලුණු තැපැල් සේවකයන් සම්මුතියකින් ඒ වර්ජනය නතර කළාට පස්සේ, ඔවුන්ගේ වැටුප් කපන්න හදනවාය කියන එකයි තැපැල් නිලධාරින්, ඒ කාර්ය මණ්ඩලවලින්, වෘත්තීය සමිතිවලින් දැන් අපට කියන්නේ. ඔවුන්ගේ වැටුප් කැපුවොත් නැවත වතාවක් වැඩ වර්ජනයක් එන්න පුළුවන්. ඒ නිසා, මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද කියා ආණ්ඩු පක්ෂයෙන් මම දැන ගන්න කැමැතියි. වෘත්තීය සමිතිවලටත් අයිතියක් තිබෙනවා, වැඩ වර්ජන කරන්න. ඒ හේතුවෙන් ඒ අයගේ වැටුප් කපන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, කාලය පිළිබඳව නැවතත් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා. අපට අද ඉතා වැදගත් පනත් කෙටුම්පතක් සාකච්ඡාවට ගන්න තිබෙනවා. ඒ නිසා අදාළ කරුණුවලට අමතර කරුණු ඉදිරිපත් කිරීමේදී කාල වේලාව ගැනත් සලකන්න.

**ගරු අබ්දුල් හලීම් මහතා ( තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு அப்துல் ஹலீம் - தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Abdul Haleem - Minister of Post, Postal Services and Muslim Affairs)
ගරු කථානායකතුමනි, සති දෙකක පමණ කාලයක් එම තැපැල් වර්ජනය තිබුණු බව අපි කවුරුත් දන්නවා. පසුගිය 19වන දා වන විට ඒ අයගේ ඉල්ලීම්වලට රජයේ පාර්ශ්වය විසින් ඉතා සාර්ථක පිළිතුරක් ලබා දුන්නා. ඊට පස්සේ, සේවයට වාර්තා කරන ලෙස අපි ඒ සේවකයන්ට දැනුම් දුන්නා. සේවයට වාර්තා නොකළහොත් සේවය අත්හැර ගියා සේ සලකන බවත් අපි දැනුම්

දුන්නා. එසේ දැනුම් දීමෙන් පසු කාලයට අදාළ වැටුප් ගෙවීම අපට ගැටලුවක් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව මම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙනවා. කැබිනට් අනුමැතිය ලැබුණාට පසුව ඒ අයට වැටුප් ලබාදෙනවා. ඊට පෙර කාලයට අදාළ වැටුප් අද හෙට ගෙවීමට කටයුතු කරගෙන යනවා.

## කසළ කළමනාකරණය: පළාත් පාලන ආයතනවලට ලබාදුන් ප්‍රතිපාදන
## கழிவு முகாமைத்துவம்: உள்ளூராட்சி நிறுவனங்களுக்கான நிதி ஏற்பாடுகள்
## GARBAGE MANAGEMENT: PROVISIONS MADE TO LOCAL GOVERNMENT INSTITUTIONS

469/'18

**10.** ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කැළි කසළ ප්‍රශ්නය විශාල ගැටලුවක් වී තිබෙන බව පිළිගන්නේද;

(ii) මෙම කැළි කසළ ගැටලුව විසඳීමට පළාත් පාලන ආයතන වෙත අමාත්‍යාංශය ලබාදෙන සහන හා ආධාර කවරේද;

(iii) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන මත ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන පළාත් පාලන ආයතන කවරේද;

(iv) කැළි කසළ ප්‍රශ්නය විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத் துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குப்பைகூளப் பிரச்சினை பாரியதொரு பிரச்சினையாக மாறியுள்ளதென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) மேற்படி குப்பைகூளப் பிரச்சினையைத் தீர்ப்பதற்காக அமைச்சு உள்ளூராட்சி நிறுவனங்களுக்கு வழங்கும் நிவாரணங்கள் மற்றும் உதவிகள் யாவை என்பதையும்;

(iii) மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் நிதி ஏற்பாட்டில் கருத்திட்டங்களை நடைமுறைப்படுத்திவரும் உள்ளூராட்சி நிறுவனங்கள் யாவை என்பதையும்;

(iv) குப்பைகூளப் பிரச்சினையைத் தீர்ப்பதற்காக அமைச்சு எடுக்கும் நடவடிக்கைககள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House -

(i) whether he admits that the garbage problem has become serious issue;

(ii) the subsidies and assistance provided to the Local Government institutions by the Ministry to solve this garbage problem;

(iii) the Local Government institutions that implement projects with the financial provisions of the Ministry of Provincial Councils and Local Government and Sports; and

(iv) the steps taken by the Ministry to solve the garbage problem?

(b) If not why?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils, Local Government and Sports)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) එක් එක් වර්ෂයන් සඳහා මෙම අමාත්‍යාංශය වෙත ලබාදෙන ප්‍රතිපාදනවලින් කසළ කළමනාකරණය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන අනුව, ප්‍රමුඛතාව මත තෝරාගත් පළාත් පාලන ආයතන වෙත කසළ කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම, කසළ කළමනාකරණය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ ලබාදීම හා අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික දැනුම ලබාදීම.

(iii) පළාත්වල ප්‍රධාන ලේකම්වරුන් හා පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ නිර්දේශය මත ක්‍රියාත්මක කළ ව්‍යාපෘති ඇතුළත් පළාත් පාලන ආයතන.

**බස්නාහිර පළාත**

කටුනායක සීදුව නගර සභාව, පානදුර නගර සභාව, කැස්බෑව නගර සභාව, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව, කළුතර ප්‍රාදේශීය සභාව, හොරණ ප්‍රාදේශීය සභාව, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

**ඌව පළාත**

හපුතලේ නගර සභාව, කතරගම ප්‍රාදේශීය සභාව, බණ්ඩාරවෙල මහ නගර සභාව.

**මධ්‍යම පළාත**

කඩුගන්නාව නගර සභාව, තලවාකැලේ ලිඳුල නගර සභාව, මාතලේ මහ නගර සභාව, ගම්පොළ නගර සභාව, මහනුවර මහ නගර සභාව, උඩපළාත ප්‍රාදේශීය සභාව, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව.

**දකුණු පළාත**

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව, හක්මන ප්‍රාදේශීය සභාව, මුලටියන ප්‍රාදේශීය සභාව.

**සබරගමුව පළාත**

රත්නපුර මහ නගර සභාව, බලංගොඩ නගර සභාව.

**වයඹ පළාත**

වාරියපොළ ප්‍රාදේශීය සභාව, මාවතගම ප්‍රාදේශීය සභාව, කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව, පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව.

[ගරු ෆයිසර් මුස්තාපා මහතා]

**උතුරුමැද පළාත**

පදවිය ප්‍රාදේශීය සභාව, මැදවච්චිය ප්‍රාදේශීය සභාව, තිරප්පනේ ප්‍රාදේශීය සභාව, කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව, තලාව ප්‍රාදේශීය සභාව, නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

**උතුරු පළාත**

වවුනියාව නගර සභාව, කරච්චි ප්‍රාදේශීය සභාව, මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව, වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව

**නැගෙනහිර පළාත**

කාත්තන්කුඩිය නගර සභාව, කින්නියා ප්‍රාදේශීය සභාව, දමන ප්‍රාදේශීය සභාව, නාමල්ඔය ප්‍රාදේශීය සභාව.

(iv) මෙම අමාත්‍යාංශය යටතේ ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය පිහිටුවා ඇති අතර, කැළි කසළ ප්‍රශ්නය විසඳීම සඳහා එමඟින් කසළ ප්‍රවාහන යන්ත්‍ර ලබාදීම හා මේ වසරේ සිට පළාත් 09 ආවරණය වන පරිදි යාන්ත්‍රිකව දිරා යන කසළ කොම්පෝස්ට් කිරීමේ ක්‍රමවේදයට අනුව කවෂිමා යන්ත්‍ර 09ක් ස්ථාපනය කර, මෙමඟින් දිනකට ටොන් 50ක කසළ ප්‍රමාණයක් දින 45කදී කොම්පෝස්ට් සැකසීම සිදු වේ.

ඒ අනුව ඉදිරි මාස කිහිපය තුළ පහත සඳහන් පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල මෙම කොම්පෝස්ට් යන්ත්‍ර ස්ථාපිත කරන අතර, එමඟින් පළාත් පාලන ආයතන 55ක පමණ ප්‍රමාණයක කසළ කොම්පෝස්ට්කරණය සඳහා යෙදවීමට බලාපොරොත්තු වන අතර, එමඟින් විවෘත කසළ අංගන විශාල ප්‍රමාණයක් ඉවත් කිරීමටද හැකිවේ.

1. සබරගමුව පළාත - කෑගල්ල නගර සභාව
2. උතුරු මැද පළාත - ලංකාපුර ප්‍රාදේශීය සභාව
3. ඌව පළාත - බදුල්ල ප්‍රාදේශීය සභාව
4. නැගෙනහිර පළාත - අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය සභාව
5. මධ්‍යම පළාත - දඹුල්ල මහ නගර සභාව
6. වයඹ පළාත - කුරුණෑගල ප්‍රාදේශීය සභාව
7. දකුණු පළාත - හම්බන්තොට මහ නගර සභාව
8. උතුරු පළාත - වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව
9. බස්නාහිර පළාත - බේරුවල ප්‍රාදේශීය සභාව

තවද, කසළ ප්‍රවාහනය සඳහා යන්ත්‍ර ලබාදීම යටතේ කොරියානු සහන ණය ආධාර ක්‍රමය යටතේ කම්පැක්ටර් යන්ත්‍ර 190ක් පළාත් පාලන ආයතනවලට බෙදා හැරීමටද නියමිතය.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, අද දිනයේ පාර්ලිමේන්තුවට පැමිණ මේ පිළිතුර ලබාදීම පිළිබඳව ඔබතුමාට මා ස්තුතිවන්ත වනවා.

රටක් හැටියට අපට තිබෙන විශාල ගැටලුවක් තමයි, මේ කැළි කසළ ප්‍රශ්නය. පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමා හැටියට ඔබතුමා මේ සම්බන්ධයෙන් විශාල කැප කිරීමක් කරනවා. ඔබතුමාගේ ඒ කැප කිරීම ගහට කපන ඉණී හා සමානයි, ගරු ඇමතිතුමනි. අපේ රටේ විශාල ධනස්කන්ධයක් අප තමුන්නාන්සේලා මේ සඳහා යෙදවූවාට කිසිම පළාත් පාලන ආයතනයක් හෝ පළාත් සභාවක් මේ පිළිබඳව ක්‍රියාත්මක නොවනවාය කියන කාරණය ඔබතුමාටත් පිළිගන්න සිද්ධ වෙනවා. ඒ සඳහා මම පොඩි උදාහරණයක් කියන්නම්. මා නියෝජනය කරන පළාතේ තිබෙන සියලුම පළාත් පාලන ආයතන ගත්තාමත් අද කැළි කසළ බැහැර කිරීම පිළිබඳව යම් නීතියක් ක්‍රියාත්මක කිරීමක් හෝ අමාත්‍යාංශය යෝජනා කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමක් හෝ ඒවාට කිසිම ඇහුම්කන් දීමක් සහ ඒ ක්‍රමවේදයකට හැඩ ගැසීමක් හෝ සිදුවන්නේ නැහැය කියා තමයි මා හිතන්නේ. හැබැයි, මේ කටයුත්ත සඳහා ඔබතුමන්ලා දිගින් දිගටම ප්‍රතිපාදන සහ මුල්‍යා වෙන් කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා අනුමත කර තිබෙන, රටේ නීතිය අනුව ක්‍රියාත්මක විය යුතු වැඩ පිළිවෙළ පළාත් පාලන ආයතන ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව ඔවුන්ට යම්කිසි ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරනවා නම්, එම ආයතන මේ කටයුත්තට උනන්දු වෙයි කියා මා හිතනවා. මේ සඳහා මුදල් ලබාදීම පිළිබඳව කටයුතු කරන්න අපට පුළුවන්ය කියා මා හිතනවා. මොකද, හැම අවුරුද්දකම ඔබතුමන්ලා එකම කටයුත්තකට මුදල් වෙන් කරනවා නේ. හැබැයි, මේ ක්‍රමවේදය සඳහා නිශ්චිත විසඳුමක් ගෙන එන්න පුළුවන් නම්, ඒක නැවැත්විය හැකියි. එම නිසා, අදාළ පළාත් පාලන ආයතන ප්‍රධානීන් සඳහා මේ වෙනුවෙන් විශේෂ නීති පද්ධතියක් -මේ ආකාරයට වැඩ නොකළොත් ඒ සඳහා කටයුතු කරනවාය කියා- හඳන්න පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට යම් වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළේ හොඳ අදහසක්. පළාත් පාලන ආයතන මේ වගකීම පැහැර හැරියා නම්, ඒ සඳහා වූ නෛතික රාමුව තව තවත් තද කළ යුතුය කියන මතයට මා එකඟ වනවා, ගරු කථානායකතුමනි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් පසුගිය කාලයේ කම්පැක්ටර් රථ ලබාදී තිබුණා. ඒ වාගේ කම්පැක්ටර් රථ කීපයක් මා නියෝජනය කරන ඌව පළාතේ පළාත් පාලන ආයතන කීපයකටත් ලැබුණා. ඒකට උදාහරණයක් තමයි, බණ්ඩාරවෙල මහ නගර සභාව. මේ මහ නගර සභාවට ලැබුණු කම්පැක්ටර් රථය service එකට ගෙන ගොස්, මේ වනකොට ඒ අදාළ ආයතනය ඒ යන්ත්‍රය එම ස්ථානයේ රඳවා තබාගෙන ඉන්නවා. ඒකට හේතුව තමයි, අදාළ අමාත්‍යාංශය හෝ පළාත් පාලන ආයතනය මේ සඳහා මුදල් නොගෙවීම. එම නිසා මේ ප්‍රදේශය තුළ කැළි කසළ ඒක රාශි කිරීම සම්බන්ධයෙන් දැන් විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ රථ ලබාදීමේදී ආදායම සම්බන්ධයෙන් සහ මේ සඳහා යන වියදම් ගෙවාගන්න පුළුවන්ද කියන කාරණය සලකා බලා හෝ නොබලා

අමාත්‍යාංශය මේ රථ ලබාදී තිබෙනවා. කෙසේ වෙතත්, පළාත් පාලන ආයතනවලට මේ රථ අවශ්‍යයි. Service එකකටවත් යවන්නේ නැතිව මෙවැනි රථ තබාගෙන සිටින තවත් පළාත් පාලන ආයතන තිබෙනවා. මොකද, එහෙම යැව්වොත් ආපහු මේ රථ ලබා දෙන්නේ නැහැ. සාමාන්‍යයෙන් මේ රථ service එක සඳහා යැවිය යුතු අවුරුද්දක් හෝ වග කිව යුතු නිශ්චිත කාලයක් තිබෙනවා. ඒ කාලය තුළ අදාළ කොම්පැනියට මේ රථ යවන්න ඕනෑ. නමුත්, දැන් එහෙම අදාළ කොම්පැනිවලට මේ රථ යවන්නේ නැහැ. ඒකට හේතුව මේකයි. අමාත්‍යාංශය විසින් මේ සඳහා යම්කිසි මුදල් ප්‍රමාණයක් ගෙවා තිබෙනවා. ඉතිරි මුදල් ප්‍රමාණය අදාළ පළාත් පාලන ආයතනය විසින් දැරිය යුතුයි.

නමුත් එය දරන්න පුළුවන්ද බැරිද කියන කාරණය ගැන බලන්නේ නැතිව මේ සඳහා නියෝජනය වුණේ කවුද, නියෝජනය කරන්නේ කවුද කියන දේශපාලන මැදිහත් වීම් මත තමයි මේ තීන්දු තීරණ පළාත තුළ ගත්තේ. පළාත් ප්‍රධාන ඇමතිවරයා ඉන්නවා. ඒ ප්‍රධාන ඇමතිවරයාගේ නියෝජිතයා පත් කර ගන්නා අවශ්‍යතාව මත තමයි ඒවා බෙදා හැරියේ. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය වරදක් කළා නොවෙයි. ඔබතුමාගේ අමාත්‍යාංශය නීත්‍යානුකූලව එය කළා. නමුත් ඌව පළාත් සභාව ඒ මුදල ගෙවන්න පුළුවන් ද කියන කාරණය නොසලකා හැර ඒ ආයතනවලට ඒවා ලබා දී තිබෙනවා. දැන් මොකක්ද ඇති වෙලා තිබෙන ප්‍රශ්නය? එක් පැත්තකින්, ඒ ආයතනවලට දැන් එය දරා ගන්න බැහැ. නමුත් අවශ්‍යතාව තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඒ මුදල් ටික ගෙවා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදා දීලා ඒ ආයතන ටික ඒ වැදගත් කාර්යය සඳහා යොදවන්න අවස්ථාවක් සලසා දෙන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මා ඔබතුමාගෙන් ගෞරවයෙන්, කාරුණිකව අහනවා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු මන්ත්‍රීතුමා, කම්පැක්ටර් රථයක් නඩත්තු කරන්න පළාත් පාලන ආයතනයකට බැරි නම් ඒ පළාත් පාලන ආයතනයෙන් වැඩක් නැහැ. මා හිතන්නේ සම්පත් අතින් ගැටලුවක් නැහැ කියායි. අපි ප්‍රාදේශීය සභාවලටත් අලුත් කම්පැක්ටර් රථ ලබා දී තිබෙනවා. ඒ නිසා නඩත්තුවට විශාල මුදලක් යන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. හැබැයි, මා විශ්වාස කරන්නේ පළාත් සභාවට සහ පළාත් පාලන ආයතනවලට දෙන සම්පත් පරිහරණයේදී මීට වඩා වගකීමකින් කටයුතු කළ යුතුය කියායි. අප සාමාන්‍යයෙන් සම්පත් දෙන්නේ සම්පත් ඌනතාව තිබෙන පළාත් පාලන ආයතනවලටයි. හැබැයි, බණ්ඩාරවෙල නගර සභාව වාගේ ආයතනයකට කම්පැක්ටර් රථයක් maintain කරන්න බැරි නම් ඊට හේතුව ලෙස මා දකින්නේ වත්කම් හරියාකාරව පාවිච්චි කිරීමේ අඩුවක් තිබෙනවා කියන එකයි. ඒ වාගේම, අප පළාත් සභාවලට, පළාත් පාලන ආයතනවලට සම්පත් දුන්නාට පසුව-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

නඩත්තු කිරීම නොවෙයි, සියයට 80ක් තමයි අමාත්‍යාංශය දෙන්නේ. ඉතිරි සියයට 20 මුදල තම ආයතනය වෙනුවෙන් දරන්න ඕනෑ, අදාළ පළාත් පාලන ආයතනයි.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු මන්ත්‍රීතුමනි, සමහර ආයතන ණයක් ඉල්ලා අපෙන් ඉල්ලීමක් කරනවා කියා සිතමු. එවිට අපි දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ණයක් දෙනවා. ඒ ණය මුදල දෙනකොට අපි සියයට 80ක් දෙනවා, ඒ පළාත් පාලන ආයතනය සියයට 20ක් දරන්න ඕනෑ. හැබැයි මෙහිදී ගෙවීම් ප්‍රශ්නයක් තිබෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. මා ඒ ගැන සොයා බලන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

සොයා බලන්න ඕනෑ, ඔවුන්ට ආදායමක් තිබෙනවාද කියා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ඒ සිද්ධිය බණ්ඩාරවෙල නගර සභාවේ සිද්ධියක් නේද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමා, ඒ ගැන සොයා බලන්න. [බාධා කිරීමක්] එය එතුමා සොයා බලාවි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ප්‍රශ්න අංක 11 -519/'18- (1), ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා.- ***[සභා ගර්භය තුළ නැත.]***

## රුපියල අවප්‍රමාණ වීම : විදේශ විනිමය අලාභය
### ரூபாய் மதிப்பிறக்கம்: செலாவணி இழப்பு
### DEPRECIATION OF RUPEE: LOSS OF FOREIGN EXCHANGE

529/'18

**12. ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා පොලී අනුපාත වැඩි වීම, රුපියල අවප්‍රමාණ වීම සහ විදේශ විනිමය පාලනය ලිහිල් කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවෙන් බැහැර වූ ඩොලර් ප්‍රමාණයේ වටිනාකම කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2015 ஆம் ஆண்டிலிருந்து இற்றைவரை வட்டி வீதம் அதிகரித்தல், ரூபாவின் மதிப்பிறக்கம் மற்றும் வெளிநாட்டுச் செலாவணி கட்டுப்பாட்டை தளர்த்தல் ஆகியன காரணமாக இலங்கையிலிருந்து வெளியே சென்றுள்ள டொலர்களின் பெறுமதி எவ்வளவென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media:

(a) Will he inform this House of the values of the amount of dollars that went out of Sri Lanka owing to the increase of interest rates, depreciation of the rupee and the relaxation of foreign exchange control from 2015 up to date?

(b) If not, why?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, ගරු මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාවේ පොලී අනුපාතික ඉහළ දැමීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය සුරැකුම්පත් පොලී අනුපාත සහ සංවර්ධිත රටවල රාජ්‍ය සුරැකුම්පත් පොලී අනුපාත

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

අතර වෙනස ඉහළ යෑම සඳහා හේතු වේ. මෙය ශ්‍රී ලංකාවේ රාජ්‍ය සුරැකුම්පත්හි ආයෝජනය කිරීම සඳහා විදේශ ආයෝජකයන් දිරිමත් කරනු ඇත. එබැවින් ඉහළ දේශීය පොලී අනුපාතික ඉහළ යෑම විදේශ විනිමය ලැබීම් ඉහළ යෑමට හේතු වනු ඇත.

රුපියල අවප්‍රමාණය වීම සිදු වන්නේ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට ලැබෙන විදේශ විනිමය ප්‍රමාණයට වඩා විදේශ විනිමය ගෙවීම් ප්‍රමාණය වැඩිවීම හේතුවෙනි. එම නිසා, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම විදේශ විනිමය ගෙවීම් ප්‍රමාණය වැඩිවීමෙහි ප්‍රතිඵලයක් මිස විදේශ විනිමය ගෙවීම සඳහා හේතුවක් නොවේ.

විදේශ විනිමය පාලනයන් ලිහිල් කිරීම ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීමට විදේශ ආයෝජකයින් දිරිමත් කරන අතර, එමඟින් විදේශ විනිමය රට තුළට ලැබීම ඉහළ යයි. බාධාවකින් තොරව විවිධ හේතු සඳහා විදේශ ආයෝජකයින්ට විදේශ විනිමය රැගෙන ඒමට සහ ඔවුන්ගේ ආයෝජනයන්හි ලාභ, ලාභාංශ සහ පොලී සමඟ රැගෙන යෑමට ද හැකි වනු ඇත. එවැනි ලැබීම් සහ ගෙවීම් සම්බන්ධව හේතු ප්‍රකාශ කිරීම ආයෝජකයින් හට පැවරී ඇති අත්‍යවශ්‍ය වගකීමක් නොවේ. එබැවින් ඉල්ලා සිටින තොරතුරු මහ බැංකුව සතුව නොමැත.

(ආ) පැන නොනඟී.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. ගරු රාජ්‍ය ඇමතිතුමනි, හේතු තමයි තමුන්නාන්සේ කිව්වේ. මේක කරන්නේ මෙන්න මේ නිසාය, දිරිමත් කරන්න ඕනෑ නිසාය, මෙහාට අද්දා ගන්න ඕනෑ නිසාය ආදී වශයෙන් හේතු කිව්වා. තමුන්නාන්සේගෙන් මම අහලා තිබෙන්නේ පොලී අනුපාතය වැඩි කිරීම නිසා, අපි ගත් ණය සඳහා ගෙවන්නට සිදු වන ආපසු ගෙවීම්වල වැඩිවීම කොපමණද කියන එකයි. ඊළඟට මම අහනවා, රුපියල අවප්‍රමාණය වීම -සිදු වන හැටි මම දන්නවා. ඒ යන්ත්‍රණය දන්නවා. - කරණ කොට ගෙන අපගේ ණය පැටව් ගැසූ ප්‍රමාණය -ණය බර- කොපමණද කියලා. මම මෙන්න මේවා තමයි අහන්නේ. තමුන්නාන්සේ කියනවා, "ඉල්ලා සිටින තොරතුරු මහ බැංකුව සතුව නැත." කියලා. මොකක්ද, මේකේ තේරුම?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ඔබතුමා අහන ප්‍රශ්නයට, එහෙම පිළිතුරක් නැහැ. මහ බැංකුවේ ඒ වාගේ දත්ත නැහැ. විදේශ-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මහ බැංකුවේ මොනවාද තිබෙන්නේ?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

නැහැ, ඒක මම-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

රුපියල අවප්‍රමාණය වීම උඩ, ඒ වාගේම පොලී අනුපාතය වැඩි කිරීම නිසා අපි ගත්ත විදේශ ණයවලට වැඩිපුර ගෙවන්න සිදු වුණු මුදල් ප්‍රමාණය කොපමණද කියලා කියන්න මහ බැංකුවට පුළුවන්කමක් නැත්නම්, ඇත්ත වශයෙන්ම මහ බැංකුවේ ගිණුම් පිළිබඳව කවුරුවත් විශ්වාසය තියන්නේ නැහැ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

නැහැ, මහ බැංකුවේ ගිණුම් පිළිබඳව විශ්වාසය තිබෙනවා. මනින්න පුළුවන් දේවල් තිබෙනවා. මහ බැංකුවෙන් ඒවා මනිනවා. අදට නොවෙයි, අවුරුදු 50කටම ඒවා මැනලායි තිබෙන්නේ. ඒ කියන්නේ අපනයනය කීයද, ආනයනය කීයද, ඒකේ ඉතිරිය මොකක්ද, විදේශ විනිමය ශේෂය කීයද කියන එකයි. මේ වසරේ පළමුවැනි කාර්තුව අවසන් වන විට ඉතිහාසයේ වැඩිම විදේශ විනිමය ශේෂය තිබුණේ 2018 අප්‍රේල් මාසයේයි. ඒවායින් තමයි මනින්නේ. ගරු මන්ත්‍රීතුමනි, "මේ ප්‍රමාණය දශමයකින් ඉහළ ගියා. දශමයකින් පහළ ආවා." කියා ඔබතුමා කිව්වත්, කොපමණ එළියට ගියාද, කොපමණ ඇතුළට ආවාද කියන එක මහ බැංකුවට මනින්න විධියක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. දෙවන අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මට එක කරුණක් පැහැදිලි කර ගැනීමට අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමනි. පළමුවන අතුරු ප්‍රශ්නයට එතුමා ඊට වැඩිය පිළිතුරක් දෙන්නේ නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, "ඩේලි මිරර්" පත්‍රයේ තිබෙනවා, පසුගිය දොළොස් මාසය තුළ අපේ විදේශ ණය බිලියන 31.6ක් බව. පසුගිය දොළොස් මාසය ගත්තාම ඒක සියයට 23ක වැඩිවීමක්. මේ බිලියන 31.6 තුළ, ඔබතුමා කියන සාධක මත අපේ ණය බරට එකතු වූ මුදල් ප්‍රමාණය කොපමණ ද කියා ගණන් හදන්න බැරි තරමට ඉලක්කම් නොදන්නා මිනිස්සුද මහ බැංකුවේ ඉන්නේ?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු මන්ත්‍රීතුමනි, ණය බර ඉහළ යන්න එක එක හේතු තිබෙනවා. එක කාරණයක් තමයි, පසුගිය කාලයේ විදේශ ණය ලබා ගන්නා අවස්ථාවල ඒක රුපියල්වලින් මනින විට එය රුපියලේ අනුපාතය අනුව තමයි මනින්නේ. රුපියල අවුරුදු දහයකට කෘත්‍රිමව තබා ගෙන ගියාම, එක ඉලක්කමක් ලැබෙනවා. ඊට පසුව රුපියල වෙළඳ පොළ අගයට දැම්මාම, ඒ ඩොලර් ප්‍රමාණයටම වැඩි රුපියල් ගණනක් ලැබෙනවා. එයින් වැඩි ප්‍රමාණයකට පිළිතුර තමයි, ඔබතුමා කියන කාරණය.

අනෙක් කාරණය, පසුගිය කාලයේ ණය ගෙවන්නත් ණය ගන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා අපට එපමණ ණය ගන්න සිදු වුණා. [බාධා කිරීමක්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Devaluation results in extra payments.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
I do not agree with that, Hon. Member, because devaluation does two things. One is, when you measure it in rupees, yes you are right that the rupee amount of debt increases. But the devaluation does something else. It makes the exports competitive and the exports increase. I might make one more point about devaluation.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
You are avoiding the question.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
No, I am not avoiding it. I have no reason to avoid it.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You both have two different views. I think we have to proceed to the next Question.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
You have not answered my question.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
No, no. We never avoid questions. We will not do so.

## වයඹ පළාතේ සිදුවන ළමා අපයෝජන : වැළැක්වීම
## வடமேல் மாகாணத்தில் இடம்பெறும் சிறுவர் துஷ்பிரயோகங்கள்: தடுத்தல்
## CHILD ABUSE INCIDENTS IN NORTH-WESTERN PROVINCE: PREVENTION

553/'18

**13.ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2010 වර්ෂයේ සිට වයඹ පළාතේ, පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්කවලින් වාර්තා වූ ළමා අපයෝජන සිද්ධීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිදුවීම් වාර්තා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නම් කවරේද;

(iii) එම සිදුවීම් සම්බන්ධව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ගෙන ඇති පියවර කවරේද;

(iv) ඉදිරියේදී වයඹ පළාත තුළ සිදුවන ළමා අපයෝජන අවම කිරීම සඳහා අමාත්‍යාංශය ගැනීමට බලාපොරොත්තු වන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டு தொடக்கம் வடமேல் மாகாணத்தில் புத்தளம் மற்றும் குருணாகல் மாவட்டங்களில் பதிவாகியுள்ள சிறுவர் துஷ்பிரயோக சம்பவங்களின் எண்ணிக்கை எவ்வளவு;

(ii) அந்த சம்பவங்கள் பதிவாகியுள்ள பிரதேச செயலாளர் பிரிவுகளின் பெயர்கள் யாவை;

(iii) மேற்படி சம்பவங்கள் தொடர்பாக தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை எடுத்துள்ள நடவடிக்கைகள் யாவை;

(iv) எதிர்வரும் காலத்தில் வடமேல் மகாணத்தில் இடம்பெறும் சிறுவர் துஷ்பிரயோகங்களை குறைப்பதற்கு அமைச்சு மேற்கொள்வதற்கு எதிர்பார்க்கும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச் சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன் ?

asked the Minister of Women and Child Affairs:

(a) Will she inform this House-

(i) the number of child abuse incidents reported from Puttalam and Kurunegala Districts in the North-Western Province from the year 2010;

(ii) the names of the Divisional Secretaries' Divisions from which the aforesaid incidents were reported;

(iii) the steps taken by the National Child Protection Authority in regard to the aforesaid incidents; and

(iv) the steps expected to be taken by the Ministry in the future to minimize the incidents of child abuse that would occur in the North-Western Province?

(b) If not, why?

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය (කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Chandrani Bandara - Minister of Women and Child Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පරිගණක දත්ත පද්ධතිය 2011 වර්ෂයේ සිට ආරම්භ කර ඇති බැවින් 2010 වර්ෂයට අදාළ තොරතුරු ලබාගත නොහැකි අතර, 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා තොරතුරු පහත පරිදි වේ.

[ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය]

| වර්ෂය | පුත්තලම | කුරුණෑගල |
|---|---|---|
| 2011 | 295 | 442 |
| 2012 | 344 | 636 |
| 2013 | 491 | 785 |
| 2014 | 452 | 756 |
| 2015 | 540 | 827 |
| 2016 | 463 | 722 |
| 2017 | 403 | 681 |

(ii) වයඹ පළාතේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අදාළව පැමිණිලි ලැබී ඇති අතර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තොරතුරු ඇතුළත් කර නොමැත.

(iii)

| වර්ෂය | පුත්තලම | | කුරුණෑගල | |
|---|---|---|---|---|
| | වාර්තා වූ ළමා අපයෝජන සිද්ධි සංඛ්‍යාව | පියවර ගෙන අවසන් වූ පැමිණිලි සංඛ්‍යාව | වාර්තා වූ ළමා අපයෝජන සිද්ධි සංඛ්‍යාව | පියවර ගෙන අවසන් වූ පැමිණිලි සංඛ්‍යාව |
| 2011 | 295 | 147 | 442 | 201 |
| 2012 | 344 | 203 | 636 | 402 |
| 2013 | 491 | 217 | 785 | 413 |
| 2014 | 452 | 234 | 756 | 364 |
| 2015 | 540 | 273 | 827 | 418 |
| 2016 | 463 | 161 | 722 | 286 |
| 2017 | 403 | 99 | 681 | 176 |

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත යොමු වන පැමිණිල්ලේ ස්වභාවය අනුව විශේෂ පොලිස් විමර්ශන අංශය, නීති අංශය, මනෝ සමාජ අංශය, විමර්ශන අංශය හා අන්තර්ජාල ආවේක්ෂණ අංශය මඟින් විමර්ශන කටයුතු සිදු කෙරේ. ලැබී ඇති සියලු පැමිණිලිවලට අදාළව මූලික පියවර ගෙන ඇති අතර, දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරි, දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරි හා ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි වෙත යොමු කර ඇති පැමිණිලිවලින් සියයට 40ක් පමණ පසු විපරම් කටයුතු සිදු කරමින් පවතී. නීතිමය ක්‍රියාමාර්ගවලට යොමු කර ඇති පැමිණිලි එම නීති කටයුතු අවසන් කිරීමෙන් පසු අවසන් කිරීමට හැකි වේ.

(iv) ගරු කථානායකතුමනි, (අ) (iv) ප්‍රශ්නයට අදාළ පිළිතුර දීර්ඝ නිසා මම **සභාගත*** කරනවා.

(ආ) අදාළ නොවේ.

**** සභාමේසය මත තබන ලද පිළිතුරෙහි ඉතිරි කොටස:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி :*

** Rest of the Answer tabled:*

(iv) දිවයිනේ සියලුම දරුවන්ට එරෙහිව සිදුවන අපයෝජනයන් වැළැක්වීමටත්, දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කර, ඔවුනට හිතකාමී හා ඔවුන්ගේ පූර්ණ සංවර්ධනය ඇති කරමින් සමාජයද දරුවන් පිළිබඳව සංවේදී කිරීමේ අරමුණින් "ළමා අපයෝජන අවම කිරීම සඳහා ජාතික ඒකාබද්ධතා ප්‍රාදේශීය ළමා ආරක්ෂක ක්‍රියාකාරි සැලැස්ම (2018-2020)" ක්‍රියාත්මක කරන අතර එම සැලැස්ම යටතේ වයඹ පළාත ආවරණය කෙරේ.

යහපත් දෙමාපියභාවය හා දරුවන් ඇති දැඩි කිරීමේදී දෙමාපිය කාර්ය භාරය, වෙනස් වන පරිසරය තුළ ළමුන්ට මුහුණ දීමට සිදුවන අභියෝග හා එම අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට ළමුන් සවිබල ගැන්වීම හා තොරතුරු තාක්ෂණ මෙවලම් ඵලදායි යහ භාවිතය යන මාතෘකා ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා කටයුතු කිරීම, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩසටහන් 80ක් පැවැත්වීම සඳහා රුපියල් 320,000ක්, පුත්තලම දිස්ත්‍රික්කයේ වැඩසටහන් 32ක් පැවැත්වීම සඳහා රුපියල් 128,000ක් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මඟින් වෙන් කිරීම.

විවිධ හේතු සාධක නිසා අපයෝජනයට පත් වීමේ ඉඩකඩ ඇති ළමුන් හඳුනා ගැනීම, එම ළමුන්ගේ අවදානම් තත්ත්වය වළක්වාලීම සඳහා ඔවුන්ගේ පවුල් ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් ආරක්ෂා සැලසුම් (care plans) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ සැකසීම. මේ යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආරක්ෂා සැලසුම් 400ක් පුත්තලම දිස්ත්‍රික්කයේ ආරක්ෂා සැලසුම් 160ක් සකස් කිරීමට නියමිතය. ඒ සඳහා රුපියල් 22,400,000ක ප්‍රතිපාදන මුදලක් ලබා දීමට අපේක්ෂිතය.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය යටතේ පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම හා ඒවා ශක්තිමත් කිරීම කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කෙරේ.

ළමා මිතුරු ගම්මාන වැඩසටහන යටතේ මත්ද්‍රව්‍යවලින් දරුවන් ආරක්ෂා කිරීමේ වැඩසටහන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කෙරේ.

කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික් ද ඇතුළත්ව සියලුම පළාත්වල ක්‍රියාකාරි සිවිල් හා ස්වේච්ඡා සංවිධාන, මරණාධාර සමිති, පාසල් සිසුන් ඇතුළු සියලුම දරුවන් ළමා අපයෝජන නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මඟින් ක්‍රියාත්මක කෙරේ.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමිය මගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම පිළිබඳව බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. "හොඳම දේ දරුවන්ටයි" කියලා කියමනක් තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමියට මෙම අමාත්‍යාංශය ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. හැබැයි, මේ සංඛ්‍යාලේඛන දත්ත දිහා බැලුවාම වර්ෂයෙන් වර්ෂය පුංචි දරුවන් අපයෝජනයට ලක්වීමේ ප්‍රමාණය වැඩි වී තිබෙන බව පෙනී යනවා. මේ සඳහා ඇමතිතුමියට කරන්න දෙයක් නැහැ. මේවා ඇමතිතුමිය අමාත්‍යාංශය භාර ගැනීමට කලින් සිදු වුණු දේවල්. විමර්ශන කටයුතුවලදීත් යම් කිසි පසුබෑමක්, එහෙම නැත්නම් මන්දගාමී තත්ත්වයක් තිබෙන බව අපට පෙනී යනවා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ලංකාවේම දරුවන්ට සිදු වන ළමා අපයෝජන වළක්වා ගැනීමට ඔබතුමිය යම් කිසි නිර්මාණශීලී වැඩ පිළිවෙළක් සකස් කරනවාද, ඒ වෙනුවෙන් අවශ්‍ය කරන නීති පද්ධතිය සපුරා ගැනීමට ඔබතුමියට අවශ්‍ය කරන ශක්තිය තිබෙනවාද, එහෙම නැත්නම් මේ පාර්ලිමේන්තුවේ ශක්තිය, බලය අරගෙන යහ පාලන රජය යටතේ එම කාර්ය ඉදිරියට සිදු කිරීමට බලාපොරොත්තු වෙනවාද කියලා මවක් විධියට ගරු ඇමතිතුමියගෙන් දැන ගන්න කැමතියි.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார)
(The Hon. (Mrs.) Chandrani Bandara)

දරුවන්ට සිදු වන හානිකර සිදුවීම් අවම කර ගැනීමට මේ වන විටත් කටයුතු රාශියක් ආරම්භ කර තිබෙනවා. මේ වන විට නීතිය පැත්තෙන් නඩු විශාල සංඛ්‍යාවක් ගොනු වෙලා තිබෙනවා. ඒවා ඉක්මනින් අවසන් කර ගැනීමට අපි විශේෂ අධිකරණ පද්ධතියක්

ඉල්ලා තිබෙනවා. ඒ සඳහා අපේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ඇමතිතුමිය අවස්ථාව ලබා දෙනවාය කියලා සඳහන් කරලා තිබෙනවා. අඩු ගානේ සතියකට වතාවක්වත් දිස්ත්‍රික්ක මට්ටමින් එක් උසාවියක් නිදහස් කර එම කටයුතු අවසන් කර ගැනීමට බලාපොරොත්තු වෙනවා. අපි නිරන්තරයෙන් උත්සාහ ගන්නේ අපේ දරුවන්ට සිදුවන අයහපත් සිදුවීම් අවම කර ගැනීමටයි. දරුවන්ට අවශ්‍ය වටපිටාව, නිදහස ලබා දීමට තමයි අමාත්‍යාංශයක් හැටියට, අමාත්‍යවරිය හැටියට හැම තත්පරයක් පාසාම අපි කටයුතු කරගෙන යන්නේ.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමියනි, පුංචි දරුවන්ට වද හිංසා සහ අපයෝජන සිදුවන ක්‍රමවේද ගණනාවක් තිබෙනවා. එක පැත්තකින් ලිංගික වශයෙන් හිංසන සිදු වනවා. තවත් පැත්තකින් මානසික වශයෙන් හිංසන සිදු වනවා. ඒ වාගේම පීඩාවන්ට ලක් වනවා. ඔබතුමිය ප්‍රශ්නවලට උත්තර දෙන්න පැමිණි නිසා මා කියන්න කැමැතියි, "මේ රටට නැවත හිට්ලර් පාලනයක් ඕනෑ" කියලා පසුගිය දවස්වල ගරුතර ස්වාමීන් වහන්සේ නමක් කරපු ප්‍රකාශයත් එක්ක මේ පුංචි දරුවෝ භීතිකාවට පත් වෙලා සිටිනවා. එදා කුඩා දරුවන්ට කවා ගන්න ඕනෑ වුණාම කිව්වේ, "බිල්ලෝ එනවා" කියලා. එදා කෑම කවා ගත්තේ "බිල්ලෝ එනවා" කියලා. දැන් හිට්ලර් පාලනයක් මේ රටට ගෙන එනවා කියද්දී, ළමා සොල්දාදුවෝ විධියට ආයෙත් බඳවා ගනීවි කියලා අම්මලා භය වෙලා; දරුවෝ භය වෙලා. මම ඔබතුමියට යෝජනා කරනවා, ඒ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් රට තුළ ක්‍රියාත්මක කරන්න කියලා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
විජයකලා මහේස්වරන් රාජ්‍ය අමාත්‍යවරිය තමයි.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார)
(The Hon. (Mrs.) Chandrani Bandara)
හිටපු ඇමතිතුමනි, ඔබතුමා භය වෙන්න එපා. ගරු මන්ත්‍රීතුමා භය වෙන්නත් එපා. ජනතාව මේ වත්මන් ආණ්ඩුව පත් කර ගත්තේ ඒ භීතිකාව නිසා තමයි. අපේ අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් මේ රට පාලනය කරන තුරු හිට්ලර් පාලනයක් නැවත මේ රටට එන්නේ නැහැ. අපේ ළමයින් අපි ආරක්ෂා කරනවා.

## කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් ලබා දුන් වන්දි : කුරුණෑගල දිස්ත්‍රික්කය

### கமத்தொழில் மற்றும் கமநலச் சேவை காப்புறுதிச் சபையினால் வழங்கப்பட்ட இழப்பீடு: குருநாகல் மாவட்டம்

### COMPENSATION PAID BY AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD: KURUNEGALA DISTRICT

572/'18

**14.ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) පවතින නියඟය හේතුවෙන් කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් වන්දි ලබා දුන් ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ එලෙස වන්දි ලබා දුන් ගොවි මහතුන්ගේ නාම ලේඛනය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව ඉදිරිපත් කරන්නේද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක් එක් ගොවි මහතාට ලබා දුන් වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම වන්දි ලබා දීමේදී සලකා බලන ලද නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நிலவுகின்ற வரட்சி காரணமாக கமத்தொழில் மற்றும் கமநல சேவை காப்புறுதிச் சபையினால் இழப்பீடு வழங்கப்பட்ட விவசாயிகளின் எண்ணிக்கை யாது;

(ii) குருநாகல் மாவட்டத்தில் இவ்வாறு இழப்பீடு வழங்கப்பட்ட விவசாயிகளின் பெயர்ப் பட்டியலை ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவின்படி வெவ்வேறாக சமர்ப்பிப்பாரா;

(iii) குருநாகல் மாவட்டத்தில் ஒவ்வொரு விவசாயிக்கும் வழங்கப்பட்ட இழப்பீட்டுத் தொகை வெவ்வேறாக எவ்வளவு;

(iv) மேற்படி இழப்பீடு வழங்கப்படுகையில் கவனத்திற் கொள்ளப்பட்ட அளவுகோல்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House -

(i) the number of farmers that received compensation from the Agricultural and Agrarian Insurance Board due to the prevalent drought;

(ii) whether the list of farmers in Kurunegala District who received compensation in the above manner will be submitted separately on the basis of each Divisional Secretary's Division;

(iii) separately, the amount of money paid as compensation to each farmer in the Kurunegala District; and

(iv) the criteria taken into consideration when granting the aforementioned compensation?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2017 යල කන්නය සඳහා වන්දි ගෙවීම් කළ ගොවීන් සංඛ්‍යාව 18,852කි. (දහඅට දහස් අටසිය පනස් දෙකකි.)

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වන්දි ලබා දීම් සිදු කර නොමැති අතර ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් වන්දි ලබා දීම් සිදු කර ඇත. එයට අදාළ CD තැටි මේ සමඟ යා කර ඇති අතර එහි තොරතුරු නිරීක්ෂණය කරන ආකාරය ඇමුණුම (I) මඟින් දක්වා ඇත. (ඇමුණුම **සභාගත*** කරමි.)

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක් එක් ගොවි මහතාට ලබා දුන් වන්දි මුදල පිළිබඳ විස්තර ඉහත (ii) ප්‍රශ්නයට අදාළ CD තැටි මඟින් ඇමුණුම (I) හි සඳහන් පරිදි නිරීක්ෂණය කරගත හැක.

(iv) මෙම වන්දි ලබා දීමේදී මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක DFD/Circular/2014-03 හා 2014.12.10 දිනැති චක්‍රලේඛයේ සඳහන් නිර්ණායක පරිදි කටයුතු කර ඇත. විස්තර ඇමුණුම (II) මඟින් දක්වා ඇත. (ඇමුණුම **සභාගත*** කරමි.)

(ආ) අදාළ නැත.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න අහන්න ඕනෑ. අපේ ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාගෙන් අතුරු ප්‍රශ්න අහලා වැඩක් නැහැ.

හැබැයි, ගරු කථානායකතුමනි, මට කියන්න තිබෙන්නේ මේකයි. මේ වන්දි ලබා දීමේදී එක එක විෂමතා සිදුවන ආකාරය අපි දැක්කා. යම් යම් අසාධාරණ තත්ත්වයන් අපි දැක්කා. ගරු අමාත්‍යතුමාම මේ අවස්ථාවේදී ගරු සභා ගැබේ සිටියා නම්, අපට ඒක පැහැදිලි කර ගන්න තිබුණා.

ඒ එක්කම කියන්න ඕනෑ, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ගැන. මේ අවස්ථාවේදී මම සියලුදෙනාගේම අවධානය මේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ගැන යොමු කරවන්න කැමැතියි. අවුරුදු ගණනාවක ඉඳලා, -මම මේ පාර්ලිමේන්තුවට එන්න කලින් පවා, පැවැති රජය තිබුණු වකවානුවේත්, මේ රජය පැවැති වකවානුවේත්- මොනවා හෝ කාරණයක් විමසා මෙම රක්ෂණ මණ්ඩලයට අඩුම තරමේ දුරකථන ඇමතුමක්වත් ගන්න බැහැ. සමහර වේලාවට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට ඇමතුමක් ගැනීම සඳහා පැය දෙක-තුනක් මහන්සි වෙන්න වෙනවා. සමහර වේලාවට ඇමතුමක් ගත්තත්, අපි විමසන නිලධාරියාගේ නම කිව්වාම, කවුරුන් හෝ "මම කියන්නම්" කියලා phone එක cut කරනවා.

මම පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට සිටි කාලයේ මම පෞද්ගලිකව එම ආයතනයට ගිය අවස්ථා අනන්තයි; අප්‍රමාණයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අපි ඉදිරියේදී Consultative Committees ආරම්භ කරනවා. අද ඇමතිතුමාත් මෙතැන නැති නිසා, මේ කරුණු එතැනදී ගන්න පුළුවන්. අපි එහෙම කරමු.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ගැන මීට වඩා සියලුදෙනාගේ අවධානය යොමු වෙන්න ඕනෑය කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. දෙවන වටය.

## දිගම්පතන රක්ෂිත වනාන්තරයට කුණු බැහැර කිරීම : වැළැක්වීම
## திகம்பத்தன பிரதேசத்தில் குப்பைகள் குவித்தல்: தடுத்தல்
## GARBAGE DUMPING IN DIGAMPATHAN FOREST RESERVE: PREVENTION

135/'18

**2. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன சார்பாக)
(The Hon. Dinesh Gunawardena on behalf of The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දඹුල්ල, දිගම්පතන ප්‍රදේශයේ රක්ෂිත වනාන්තරයක් පිහිටා තිබෙන බවත්;

(ii) ප්‍රදේශයේ පළාත් පාලන ආයතන විසින් එම ස්ථානයට කුණු බැහැර කරන බවත්;

(iii) කුණු බැහැර කිරීම හේතුවෙන් ප්‍රදේශයේ වන අලින් මෙම ස්ථානයේ නිතර ගැවසෙන බවත්;

(iv) එහි ආහාර නොමැති අවස්ථාවල එම අලින් අවට ගම්මානවලට කඩා වදින බවත්;

එතුමා දන්නේද?

(ආ) මිනිසුන්ගේ හා අලින්ගේ ආරක්ෂාව සඳහා මෙම ස්ථානයට කුණු බැහැර කිරීම නැවැත්වීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத் துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தம்புள்ள, திகம்பத்தன பிரதேசத்தில் பாதுகாப்பு வனமொன்று அமைந்துள்ளது என்பதையும்;

(ii) பிரதேசத்திலுள்ள உள்ளூராட்சி நிறுவனத்தி னால் இந்த இடத்தில் குப்பைகள் குவிக்கப் படுகின்றன என்பதையும்;

(iii) குப்பைகள் குவிக்கப்படுவதன் காரணமாக பிரதேசத்திலுள்ள காட்டு யானைகள் இவ் விடத்தில் அடிக்கடி நடமாடுகின்றன என்ப தையும்;

(iv) இங்கு உணவு இல்லாதபோது இந்த யானைகள் சுற்றுப்புறக் கிராமங்களுக்குள் பிரவேசிக்கின்றன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், மனிதர்களினதும் யானைகளினதும் பாதுகாப்புக் கருதி இவ்விடத்தில் குப்பைகள் குவிக்கப் படுவதை நிறுத்த அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Is he aware that-

 (i) whether a forest reserve is located in Digampathana, Dambulla;

 (ii) the local government institutions of the area dump garbage in aforesaid place;

 (iii) the wild elephants of the area constantly roam in aforesaid locale by reason of garbage dumping; and

 (iv) aforesaid elephants storm into neighbouring villages when no food is found in aforementioned site?

(b) Will he inform this House, as to what measures would be taken by the Ministry to prevent dumping of garbage in aforesaid site in support of the safety of both the humans and the elephants ?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

 (ii) ඔව්.

 (iii) ඔව්.

 (iv) ඔව්.

(ආ) කසළ බැහැර කිරීම විධිමත් කිරීම සඳහා දැනටමත් මෙම අමාත්‍යාංශය මඟින් යාන්ත්‍රිකව කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම පිණිස ජපානයේ නිෂ්පාදිත කවෂිමා කොම්පෝස්ට් යන්ත්‍රයක් දඹුල්ල දිගම්පතන ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට කටයුතු යොදා ඇති අතර, ඒ සඳහා ගොඩනැඟිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවද ප්‍රදානය කර ඇති අතර, ඉදිරි මාස 03ක කාලය තුළ ඉදිකිරීම් අවසන් කිරීමට නියමිතය. මෙමඟින් දිනකට මෙට්‍රික් ටොන් 50ක් කොම්පෝස්ට් සැකසීම සඳහා යොදා ගත හැකි අතර ඉදිරි මාස කිහිපය තුළ කොම්පෝස්ට් නිෂ්පාදනය ආරම්භ කිරීමටද බලාපොරොත්තු වේ. ඊට සමගාමීව වනජීවී අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් අලිවැටක් ඉදිකිරීම දැනටමත් අවසන් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

## සමස්ත කොටස් මිල දර්ශකය : වෙනස්වීමේ ප්‍රතිශතය
## மொத்தப் பங்கு விலைச் சுட்டெண்: மாற்ற மடைந்த சதவீதம்
## ALL SHARE PRICE INDEX: PERCENTAGE OF CHANGE

199/'18

**4. ගරු විමල් වීරවංශ මහතා (ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවට)**
(மாண்புமிகு விமல் வீரவங்ச - மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில சார்பாக)
(The Hon. Wimal Weerawansa on behalf of the Hon. Udaya Prabhath Gammanpila)
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016.12.31 දිනට සමස්ත කොටස් මිල දර්ශකයේ අගය කවරේද;

 (ii) 2014.12.31 සහ 2015.12.31 දිනට සාපේක්ෂව, 2016.12.31 දිනට සමස්ත කොටස් මිල දර්ශකයේ අගය කොපමණ ප්‍රතිශතයකින් වෙනස් වී තිබේද;

 (iii) 2016 වර්ෂය තුළදී ශුද්ධ විදේශීය මිලදී ගැනීම්වල අගය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016.12.31 ஆம் திகதியிலுள்ளவாறு மொத்த பங்கு விலைச் சுட்டெண்ணின் பெறுமதி யாதென்பதையும்;

 (ii) 2014.12.31 மற்றும் 2015.12.31 ஆம் திகதிக்கு ஒப்பீட்டளவில், 2016.12.31 ஆம் திகதிக்கு மொத்த பங்கு விலைச் சுட்டெண்ணின் பெறுமதி எத்தனை சதவீதத்தினால் மாற்றமடைந்துள்ள தென்பதையும்;

 (iii) 2016 ஆம் ஆண்டில் தேறிய வெளிநாட்டு கொள்வனவுகளின் பெறுமதி எவ்வளவென்ப தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media:

(a) Will he inform this House -

 (i) the value of All Share Price Index by 31.12.2016;

 (ii) from which percentage the All Share Price Index has changed by 31.12.2016 in comparison to 31.12.2014 and 31.12.2015; and

 (iii) the value of net foreign purchases within the year 2016?

(b) If not, why?

[ගරු විමල් වීරවංශ මහතා]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled:*

(අ) (i) 2016.12.31 දිනට සමස්ත මිල දර්ශකයේ අගය ඒකක 6,228.2කි.

(ii) 2015 සහ 2016 වර්ෂ ආරම්භයේදී 2016.12.31 දිනට සාපේක්ෂව සමස්ත කොටස් මිල දර්ශකය වෙනස් වීමේ ප්‍රතිශතයන් පහත පරිදි වේ.

| වසර | ඉහළ/පහළ යෑම |
|---|---|
| 2014.12.31ට සාපේක්ෂව 2016.12.31ට වෙනස | (14.7)% |
| 2015.12.31ට සාපේක්ෂව 2016.12.31ට වෙනස | (9.7)% |

(iii) වසර 2016 තුළ වාර්තා වූ ශුද්ධ විදේශ මිලදී ගැනුම් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 24කි.

(ආ) පැන නොනඟී.

## වාරිමාර්ග ප්‍රතිසංස්කරණය: කිලිනොච්චිය දිස්ත්‍රික්කය
## நீர்ப்பாசனத் திட்டங்களின் புனரமைப்பு: கிளிநொச்சி மாவட்டம்
RESTORATION OF IRRIGATION SYSTEMS: KILINOCHCHI DISTRICT

416/'18

**7. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,
(i) වාරිමාර්ග සංඛ්‍යාව;
(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;
(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;
කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේ යුද්ධමය තත්ත්වය නිම වනතෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;
(ii) යුද්ධමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத் துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) 1983 ஆண்டளவில் கிளிநொச்சி மாவட்டத்தினுள் காணப்பட்ட,
(i) நீர்ப்பாசனங்களின் எண்ணிக்கை;
(ii) சிறு குளங்கள், அணைக்கட்டுகள், கால்வாய் களின் எண்ணிக்கை;
(iii) அவற்றின் மூலம் பயிர்செய்கை மேற்கொள்ளப் பட்ட விவசாய நிலங்களின் அளவு;
எவ்வளவென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 1983 முதல் 2009 ஆம் ஆண்டில் யுத்தம் முடிவடையும் வரை நீர்ப்பாசனங்கள், குளங்கள், அணைக்கட்டுகள், கால்வாய்களை புனரமைப் பதற்காக ஒதுக்கப்பட்ட பணத்தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;
(ii) யுத்த நிலவரம் முடிவடைந்த பின்னர் 2015 ஆம் ஆண்டு வரை ஒட்டுமொத்த நீர்ப்பாசனங்கள், குளங்கள், அணைக்கட்டுகள், கால்வாய்களின் புனரமைப்புக்காக அரசாங்கத்தினால் ஒதுக்கப் பட்ட பணத்தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;
அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

இ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House in relation to the Kilinochchi District by the year 1983 -
(i) the number of irrigation systems that had existed;
(ii) the number of small-scale tanks, anicuts and canals that had existed; and
(iii) the extent of lands that had been brought under cultivation?

(b) Will he also inform this House, separately, on per year basis -
(i) from year 1983 until the war situation had ended in 2009, the amount of money that had been allocated for restoration of irrigation systems, tanks, anicuts and canals; and
(ii) from the time the war situation ended until year 2015, the total amount of money the Government had allocated for the restoration of irrigations systems, tanks, anicuts and canals?

(c) If not, why?

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අහන ගමන්ම, මට ඔබතුමාගෙන් අහන්න කාරණයක් තිබෙනවා. මේක, මම ඊයේ නඟපු ප්‍රශ්නයට සමාන වූ ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අද සියලු වැඩ කටයුතු ප්‍රමාද වෙලායි තිබෙන්නේ.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න මේ ගැන අහන්න. ඔබතුමාට වගකීමක් තිබෙනවා, මේ මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා නම් ඇවිල්ලා කථා කරන්න.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට මේ ප්‍රශ්නය අසා තිබෙන්නේ මධ්‍යම රජයේ වාරිමාර්ග අමාත්‍යවරයාගෙන්. නමුත් මට -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ වෙලාවේ ඒ ගැන අහන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා මේ ගැන මට උදේ කියන්න තිබුණා නේ.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

මට මේක විසඳලා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැනටමත් සභාවේ කටයුතු ප්‍රමාද වෙලා තිබෙන්නේ. අද වැදගත් පනත් කෙටුම්පතක් විවාදයට තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමනි, ඔබතුමා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත කරනවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර සභාගත කරනවා. ගරු කථානායකතුමනි, පළමුවැනි වටයේදී මෙම ප්‍රශ්නය අහනකොට, මෙතුමා සිටියේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා සිටියේ නැහැනේ, ප්‍රශ්නය අහනකොට.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ඒක හරි. නමුත් මේ අහන ප්‍රශ්නයට උත්තරයක් නැහැනේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් අහන්න බැහැනේ. ඔබතුමා ඔහොම අසාධාරණ වෙන්න එපා.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

මම ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමාගෙන් නොවෙයි, මේ ප්‍රශ්නය අහන්නේ. මම මේක අහන්නේ ගරු ඇමතිතුමාගෙන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේක ගරු සභාවක්. මෙහි ස්ථාවර නියෝග තිබෙනවා; ක්‍රමවේදයක් තිබෙනවා. ඔබතුමා බුද්ධිමත් පුද්ගලයෙක්. ඒක නිසා මේ ගැන තේරුම් ගන්න. දැන් ඒ ප්‍රශ්නය අහන්න බැහැ. දැන් ප්‍රශ්නවල දෙවන වටය.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

මම අහන්නේ ඔබතුමාගෙන්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඇමුණුම් අංක 01** මඟින් දක්වා ඇත.

(ii) උතුරු පළාත් ප්‍රධාන ලේකම් එවා ඇති තොරතුරුවලට අනුව මෙම ප්‍රශ්නයට අදාළ පිළිතුරු මධ්‍යම රජයේ කෘෂිකර්ම අමාත්‍යාංශ යටතේ පාලනය වන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතු බව දන්වා ඇත.

(iii) 2009 වසරෙන් පසු වූ වගා කටයුතු පිළිබඳ තොරතුරු ඇමුණුම් අංක 02** මඟින් දක්වා ඇත.

(ආ) (i) 2008-2009 වර්ෂවල ඇති වූ යුද වාතාවරණය හේතුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ලේඛන විශාල ප්‍රමාණයක් විනාශයට පත් විය. තවද, එම ලියකියවිලි නැවත ලබා ගත හැකි මාර්ග ද දක්නට නොතිබුණි. එබැවින් 1983 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා පැවති යුදමය තත්ත්වය නිම වනතෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල් පිළිබඳ තොරතුරු ද ලබාගත නොහැක.

(ii) ඇමුණුම් අංක 03** මඟින් දක්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 -442/'18- (1), ගරු ජයන්ත සමරවීර මහතා.

---

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ජාතික හා පළාත් පාසල් සඳහා බඳවාගත් ගුරුවරුන්: විස්තර

## தேசிய மற்றும் மாகாணப் பாடசாலைகளுக்கு ஆட்சேர்க்கப்பட்ட ஆசிரியர்கள்: விபரம்

## TEACHERS RECRUITED TO NATIONAL AND PROVINCIAL SCHOOLS: DETAILS

519/'18

**11. ගරු විමල් වීරවංශ මහතා (ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා වෙනුවට)**
(மாண்புமிகு விமல் வீரவங்ச - மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் சார்பாக)
(The Hon. Wimal Weerawansa on behalf of the Hon. Indika Anuruddha Herath)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දිවයිනේ ඇති මුළු රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;
(ii) දිවයිනේ ඇති මුළු ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව කොපමණද;
(iii) 2015, 2016 සහ 2017 වර්ෂවලදී දිවයිනේ ජාතික පාසල් සඳහා බඳවාගත් ගුරුවරුන් සංඛ්‍යාව වර්ෂය අනුව කොපමණද;
(iv) 2015, 2016 සහ 2017 වර්ෂවලදී දිවයිනේ ඇති පළාත් පාසල් සඳහා බඳවාගත් ගුරුවරුන් සංඛ්‍යාව වර්ෂය අනුව කොපමණද;
(v) 2016 වර්ෂයේ පළමු භාගය තුළ බාහිර හා අභ්‍යන්තර ඇගයීම් පද්ධති මඟින් ඇගයීමට ලක් කළ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;
(vi) 2016 අයවැයෙන් ග්‍රාමීය හා ප්‍රාදේශීය පාසල්වල ගුරු නිල නිවාස/ විවේකාගාර ස්ථාපිත කිරීම වෙනුවෙන් වෙන් කළ මුදල කොපමණද;
(vii) එම ව්‍යාපෘතයේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டிலுள்ள மொத்த அரசாங்க பாடசாலை களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;
(ii) நாட்டிலுள்ள மொத்த சர்வதேச பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;
(iii) 2015, 2016 மற்றும் 2017 ஆம் ஆண்டுகளில் நாட்டிலுள்ள தேசிய பாடசாலைகளுக்கு ஆட்சேர்க்கப்பட்ட ஆசிரியர்களின் எண்ணிக்கை ஆண்டு அடிப்படையில் எவ்வளவென்பதையும்;
(iv) 2015, 2016 மற்றும் 2017 ஆம் ஆண்டுகளில் நாட்டிலுள்ள மாகாண பாடசாலைகளுக்கு ஆட்சேர்க்கப்பட்ட ஆசிரியர்களின் எண்ணிக்கை ஆண்டு அடிப்படையில் எவ்வளவென்பதையும்;
(v) 2016 ஆம் ஆண்டின் முதல் பகுதியினுள் வெளிவாரி மற்றும் உள்வாரி மதிப்பீட்டு முறைமையின் ஊடாக மதிப்பீட்டுக்கு உட்படுத் தப்பட்ட ஆசிரியர்களின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;
(vi) 2016 ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தின் மூலம் கிராமிய மற்றும் பிராந்திய பாடசாலைகளில் ஆசிரியர் பணிமனைகள்/ ஓய்வறைகளை நிறுவுவதற்காக ஒதுக்கப்பட்ட நிதி எவ்வளவென்பதையும்;
(vii) மேற்படி கருத்திட்டத்தின் தற்போதைய முன்னேற்றம் யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-
(i) the total number of government schools in the island;
(ii) the total number of international schools in the island;
(iii) the number of teachers recruited for national schools in the years of 2015, 2016 and 2017, according to each year;
(iv) the number of teachers recruited for provincial schools in the years of 2015, 2016 and 2017, according to each year;
(v) the number of teachers appraised from the external and internal appraisal systems in the first half of year 2016;
(vi) the amount of money allocated to establish teachers' quarters / rest rooms in rural and regional schools from the 2016 Budget; and
(vii) the present progress of the project?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 10,194කි.

(ii) 265කි.

(iii)

| වර්ෂය | බඳවාගත් ගුරුවරුන් සංඛ්‍යාව |
|---|---|
| 2015 | 1,151 |
| 2016 | 2,421 |
| 2017 | 2,606 |
| එකතුව | 6,178 |

(iv)

| වර්ෂය | බඳවාගත් ගුරුවරුන් සංඛ්‍යාව |
|---|---|
| 2015 | 5,145 |
| 2016 | 9,671 |
| 2017 | 11,031 |
| එකතුව | 25,847 |

(v) ගුරුවරුන් සංඛ්‍යාව 132,984කි. (එක්ලක්ෂ තිස්දෙදහස් නවසිය අසූහතරකි)

(vi) රුපියල් මිලියන 2,289.052

(vii) ඔව්.

"ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ කාර්යයන් 224ක් ආරම්භ කර ඉන් 131ක් 2018.03.31 දින වනවිට අවසන් කර ඇත. මේ දක්වා මෙම කාර්යයන් සඳහා මිලියන 169ක් වියදම් දරා ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඊළඟට ස්ථාවර නියෝග අංක 27 (2) යටතේ ප්‍රශ්නය, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා. එතුමා එකඟ වුණා, අද දින වේලාව ඉතිරි කර ගැනීම සඳහා එය හෙට දිනයේ ඉදිරිපත් කරන්න.

ඊළඟට අමාත්‍යාංශ නිවේදන, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා.

## "ද නිව්යෝර්ක් ටයිම්ස්" පුවත් පත් වාර්තාව : අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## " நியூயோர்க் டைம்ஸ்" பத்திரிகை அறிக்கை : பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரின் கூற்று

## "THE NEW YORK TIMES" REPORT: STATEMENT BY PRIME MINISTER, MINISTER OF NATIONAL POLICIES AND ECONOMIC AFFAIRS

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}

ගරු කථානායකතුමනි, හම්බන්තොට වරාය පිළිබඳව පසුගිය දින "ද නිව්යෝර්ක් ටයිම්ස්" පුවත් පතේ පළ වූ වාර්තාවක් සම්බන්ධයෙන් ජනතාව අතරත්, මාධ්‍ය අතරත් විශාල කථා බහක් ඇති වුණා. මේ සම්බන්ධව මෙම ගරු සභාව ඉදිරියේ කරුණු කිහිපයක් පැහැදිලි කිරීම සුදුසු යැයි මා කල්පනා කළා.

හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා මහින්ද රාජපක්ෂ ආණ්ඩුව විසින් ඩොලර් මිලියන 1,320ක ණය මුදලක් චීනයෙන් ගත්තා. නමුත් වරායට නැව් ගෙන්වා ගන්න ශක්තියක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවට තිබුණේ නැහැ.

2015 ජනාධිපතිවරණ අවස්ථාව වන විට මෙය විශාල ප්‍රශ්නයක්ව තිබුණා. නැව් එන්නේ නැති වරායක් හදන්න ලබාගත් මේ ණය කන්දරාව ගෙවන්න රජයට ආදායමක් තිබුණේ නැහැ. මෙම ණය ගෙවීම විශාල ප්‍රශ්නයක්ව තිබුණා. වරායෙන් කිසිම ආදායමක් ලැබුණේ නැහැ. සිදු වුණේ තව තවත් පාඩු වුණු එකයි. මේ බර කොළඹ වරායට කර ගහන්න සිදු වුණා. 2011 සිට මේ දක්වා හම්බන්තොට වරායේ පාඩුව රුපියල් බිලියන 47යි. රටට ඉතා අහිතකර මෙම වරාය ප්‍රශ්නයට විසඳුමක් සෙවීම යහ පාලන රජයේ මැතිවරණ පොරොන්දුවක් ද වුණා.

අපට තිබුණේ තෝරා ගැනීම් දෙකයි. එකක්, මේ ණය ගිවිසුම නීති විරෝධී බවට තීරණය කරලා ඉදිරි කටයුතු කරන එකයි. අනෙක් විකල්පය වුණේ චීන රජය සමඟ සාකච්ඡා කිරීමයි. අපි ප්‍රමුඛත්වය දුන්නේ චීන රජය සමඟ සාකච්ඡා කරලා විසඳුමක් ලබා ගැනීමටයි.

ගරු කථානායකතුමනි, අප රජය බලයට පත් වූ වහාම මෙම ප්‍රශ්නය විසඳීම පිළිබඳ සාකච්ඡා ආරම්භ කළා. සුදු අලියෙක්ව තිබූ වරායෙන් ප්‍රයෝජනයක් ගත හැකි ආකාරයත්, මහා ණය කන්දෙන් නිදහස් විය හැකි ආකාරයත් අපි සාකච්ඡා කළා. ජනාධිපතිතුමාත් පළමුව චීන රජය සමඟ සාකච්ඡා කළා. ඊට පසුව මමත්, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාත්, මලික් සමරවික්‍රම ඇමතිතුමාත් ඇතුළු ඇමති කණ්ඩායම චීන රජය සමඟ මේ පිළිබඳව බීජිං නුවරදී සාකච්ඡා කළා. මේ සම්බන්ධයෙන් චීනයේ අගමැතිතුමාත්, චීනයේ ජනාධිපතිතුමාත් මුණ ගැසුණා.

අප රජයේ මතය වූයේ, වරායේ මෙහෙයුම් රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව සමාගමකට පැවරීම තුළින් ණය බරින් නිදහස් වීමත්, හම්බන්තොට වරාය ලාභ ලබන, නැව් ගෙන්වා ගත හැකි වරායක් බවට පත් කිරීමත්ය. අප රජය මෙම ස්ථාවරයේ දිගටම රැඳී සිටියා. මෙම ස්ථාවරය සඳහා චීන රජයෙන් කිසිදු පීඩනයක් එල්ල නොවූ බව මා වග කීමෙන් ප්‍රකාශ කර සිටිනවා. There, we had no pressure. We had many options and we could have followed whatever we wanted.

චීන රජයෙන් කළ ඉල්ලීම වූයේ වරාය මෙහෙයුම් කටයුතු සඳහා පළමුවෙන් චීන සමාගම්වලින් යෝජනා කැඳවන ලෙසයි. ඒ අනුව චීන සමාගම්වලින් විවෘත යෝජනා කැඳවනු ලැබුවා. අප වෙත ලැබුණු යෝජනා අතරින් වඩාත්ම වාසිදායක යෝජනාව වූයේ චයිනා මර්චන්ට් පෝර්ට් හෝල්ඩිංග්ස් සමාගම විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවයි. එතැනදී යෝජනා කළේ මේ ප්‍රදේශයේ කර්මාන්තකරණයක් ඇති කරලා, නැව් කැඳවා ගෙන මේ වරාය ලාභදායක ලෙස දශකයෙන් පසුව ගෙනි යන්නයි. ඒ ශක්තිය මේ සමාගමට තිබුණා. ඩොලර් මිලියන එක්දහස් අසූවක ආයෝජනයකට ඔවුන් එකඟ වුණා. චීන ජනාධිපතිතුමාත්, චීන රජයත් මේ සම්බන්ධව පූර්ණ එකඟතාව පළ කළා. ඒ අනුව චයිනා මර්චන්ට් පෝර්ට් හෝල්ඩිංග්ස් සමාගම හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය එක්ව පිහිටුවනු ලබන සමාගමක් යටතේ හම්බන්තොට වරායේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2016 දෙසැම්බර් 08වන දින ගිවිසුමකට ඇතුළත් වුණා. ඒ අනුව චයිනා මර්චන්ට් පෝර්ට් හෝල්ඩිංග්ස් සමාගමෙන්

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

2017 දෙසැම්බර් 22 දින ඩොලර් මිලියන 293කුත්, 2018 ජනවාරි 28 දින ඩොලර් මිලියන 97කුත් ශ්‍රී ලංකා රජයට ගෙවනු ලැබුවා. ඉතිරි ඩොලර් මිලියන 584 මේ වනවිට ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවා තිබෙනවා. මීට අමතරව හම්බන්තොට ප්‍රදේශයේ කර්මාන්ත සඳහා යටිතල පහසුකම් සකස් කිරීමේ සැලැස්ම ඉදිරිපත් කරලා තිබෙනවා. දැනට LNG විදුලි බලාගාරයක් අනුමත කරලා තිබෙනවා. අනිකුත් ආයෝජනත් දැන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ඉල්ලීම් ඉදිරිපත් කරලා තිබෙනවා. මෙය අප රජය මෙන්ම මේ රටේ ජනතාව ලැබූ විශාල ජයග්‍රහණයක් බව මා කියන්න කැමතියි.

මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් ඩොලර් මිලියන ගණනින් ණයවෙලා නැව් නැති වරායක් හැදුවා. ණයෙනුත් නිදහස් වෙලා හම්බන්තොට වරාය නැව් එන වරායක් බවට පත් කරන්නත් අපට හැකි වුණා. වරාය විකිණීමක් මෙතැන කිසිසේත්ම සිදු වෙලා නැහැ. වරායේ මෙහෙයුම් රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව සමාගමකින් සිදු කිරීම පමණයි සිදු වන්නේ. මේ කටයුත්ත චීනයට බාර දීලා නැහැ. හම්බන්තොට වරාය ඉදිරියේදී දියුණු වරායක් බවට පත් වේවි. එසේම මෙම වරාය කිසිදු යුදමය අරමුණක් සඳහා යොදා ගන්නේ නැහැ. අපේ වරායන්, අපේ භූමිය වෙනත් රටවල යුද කටයුතුවලට අපි යොදවන්නේ නැහැ. ඒ බව පැහැදිලිව වයිනා මර්චන්ට් ගිවිසුමේ සඳහන් වෙනවා. චීන ජනාධිපතිතුමා සමඟ පැවති සාකච්ඡාවේදීත් අපගේ ස්ථාවරය ඉතා පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා. එතුමා ඒ ස්ථාවරය පිළිගත්තා.

ගරු කථානායකතුමනි, නැව් නැති වරාය වාගේම අහස් යානා එන්නේ නැති ගුවන් තොටුපොළකුත් මත්තල තිබෙනවා. ඒකත් මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ ණයක්. මත්තල ගුවන් තොටුපොළ පිළිබඳවත් අප පළමුව චීන සමාගමක් සමඟ සාකච්ඡා කළා. නමුත් එතැනින් යහපත් ප්‍රතිචාරයක් ලැබුණේ නැහැ. ඒ නිසා අප ඉන්දියාව සමඟ ඒ ගැන සාකච්ඡා කරමින් සිටිනවා.

ඉදිරියේදී මත්තල ගුවන් තොටුපළේ ණයෙනුත් නිදහස් වී ගුවන් යානා පැමිණෙන ගුවන් තොටුපොළක් බවට මත්තල ගුවන් තොටුපොළ පත්වෙන බව මට විශ්වාසයි.

ඇත්තවශයෙන්ම චීනය අපට බල කළා නම්, මේ වරායත් ගුවන් තොටුපොළත් චීනයට දෙන්න -[බාධා කිරීමක්] අපි චීනය එක්කත්, ඉන්දියාව එක්කත් ගනුදෙනු කරන්නේ ස්වාධීන රාජ්‍යයක් හැටියට කියලා මම කියන්න කැමතියි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ගැන විවාදයක් කරන්න නම් අමාරුයි. අගමැතිතුමා කැමති නම් පැහැදිලි කිරීමක් කරන්න පමණක් අවස්ථාව දෙන්නම්. ඔබතුමා point of Order එකක් අරගෙන දිගටම කථා කරනවා. අගමැතිතුමා සූදානම්ද? [බාධා කිරීමක්] Yes, Hon. Prime Minister?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මම ප්‍රශ්නය අහනවා. [බාධා කිරීමක්] කථානායකතුමා අහන්න කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. නැහැ. මට කියන්න බැහැ. ගරු අගමැතිතුමා කැමති නම් මම අවස්ථාව දෙන්නම්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
හොඳයි. අහන්න කියන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කෙටියෙන් ප්‍රශ්නය අහන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
හැබැයි, පිළිතුරෙන් පසුව වාඩි වෙන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආයෙත් ඒ ගැන argument එකක් නැහැ. [බාධා කිරීම්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අහන්න දෙන්නකෝ. [බාධා කිරීම්] අහන්න දෙන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉතින්, අහන්නකෝ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ මේ අවස්ථාව මට ලබා දීම පිළිබඳ ස්තුතිවන්ත වෙනවා. මා දන්නා විධියට දැනටත් හම්බන්තොට වරාය සඳහා ගනු ලැබූ ණය මුදල් වරාය අධිකාරියෙන් ගෙවනවා. ඒ ණය මුදල් පියෙව්වාට පසුව වරාය අධිකාරිය එදා සිට මේ දක්වා ලාභයි. ඒ වාගේම හම්බන්තොට, මත්තල ගුවන් තොටුපොළ සඳහා ලබා ගත් ණය ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමෙන් -Airport and Aviation Services (Sri Lanka) Limited එකෙන් - ගෙවනවා. ඒ ණය වාරික ගෙවලාත් එම ආයතනය ලාභදායී ආයතනයක්. එතකොට මේ ආයතන දෙකේම ණය බර මහා භාණ්ඩාගාරයට බලපාලා නැහැ. එක ණයක් වරාය අධිකාරියෙන් ගෙවා ගෙන යනවා; තවමත් ගෙවනවා. ඔබතුමන්ලා විකුණලා සල්ලි ටික ගත්තත් තවමත් ගෙවනවා. මත්තල ගුවන් තොටුපොළ සඳහා ලබා ගත් ණයෙහි ණය වාරික ඒ ගුවන් සේවා ආයතනය ගෙවනවා. ඒ ගුවන් සේවා ආයතනය ලාභදායී ආයතනයක්. ඒ නිසා ඔබතුමා කියන තර්කය වැරදියි. ණයෙන් නිදහස්වීමක් නැහැ. ඒ අදාළ ආයතන ණය වාරික තවමත් ගෙවනවා; ලාභදායීව පවත්වාගෙන යනවා. ඒ නිසා මේ රටේ සම්පත් විකුණාගෙන කන එක ආඩම්බරයට කාරණයක් කියා ඔබතුමා -[බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු අගමැතිතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මේ මුදල් ටික අපේ සංචිතයේ

යොදවලා තිබෙන්නේ. වරාය අධිකාරියෙන් ගෙවුවත්, කවුරු ගෙවුවත් මේ මුදල් අපි එක්ක තිබෙන්නේ. ඒ නිසා අපේ ණය බර අඩුවෙලා තිබෙනවා. අපේ සංචිතය වැඩි වෙලා තිබෙනවා. "The New York Times"හි කථාවේ කොටස් දෙකක් තිබුණා. මට බලපෑවේ එක කොටසක් විතරයි. මම ඒ කාරණය ගැන ප්‍රකාශයක් කළා. මම හිතුවා මගේ මිත්‍ර මන්ත්‍රීතුමා අනෙක් කොටස ගැන ප්‍රකාශයක් කරන්න යනවා කියලා. ඒ ගැන සම්පූර්ණයෙන්ම නිශ්ශබ්ද වෙලා ඉන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. බොහොම ස්තුතියි. මීළඟට, අමාත්‍යාංශ නිවේදන. වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍ය, ගරු දුමින්ද දිසානායක මහතා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ගරු කථානායකතුමනි, වරාය සම්බන්ධ අනෙක් කොටස අහනවාද කියලා අහන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමා අහනවාද? [බාධා කිරීමක්] නැහැ. නැහැ. ඔබතුමා ඉල්ලුවොත් විතරයි. එහෙම නැතිව මට බලෙන් දෙන්න ඕනෑ නැහැ. ඔබතුමා ඉල්ලනවා නම් අගමැතිතුමාගේ එකඟත්වයක් තිබෙනවා නම් මට අවස්ථාව දෙන්න පුළුවන්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

මම අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වේලාව ගතවෙලා තිබෙන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ඉල්ලනවාද කියා ඔබතුමා අහනවා; ඉල්ලන කොට තව එකක් කියනවා.

ගරු කථානායකතුමනි,-

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, වරාය ගැන දැන් වාද කළා ඇති. තව වාදයක් වුවමනා නැහැ. එහි අනෙක් කොටස ගැන ඕනෑ නම් වාදයක් කරමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද ඉතා වැදගත් පනත් කෙටුම්පතක් ගැන සාකච්ඡා කරන්නත් තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ඔබතුමා නේ මට වෙලාව දෙන්නම් කියලා කිව්වේ. පස්සේ බය වුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දුමින්ද දිසානායක මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

# වරප්‍රසාද යෝජනා
# சிறப்புரிமைப் பிரேரணைகள்
# PRIVILEGE MOTIONS

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කඩ කිරීම
## உறுப்பினர்களுக்கான நடத்தைக் கோவையை மீறுதல்
## BREACH OF CODE OF CONDUCT FOR MEMBERS OF PARLIAMENT

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

Sir, I move,

"That the question of privilege arising out of the matter raised by the Hon. Ajith P. Perera, M.P. on 04th July, 2018 in Parliament to the effect that privileges of the Members of Parliament have been infringed, be referred to the Committee on Ethics and Privileges under Standing Order No. 118 of the Parliament."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ජාතික විගණන පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීම.

අද දින විවාද කිරීමට නියමිත, න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ලෙස සඳහන් ජාතික විගණන පනත් කෙටුම්පත 2018 අප්‍රේල් මස 3වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව, 2018 ජූලි මස 3වැනි දින රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී සලකා බලා, එකී කාරක සභාවේ වාර්තාව 2018 ජූලි මස 4වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති බව දැනුම් දීමට කැමැත්තෙමි.

ගරු අගමැතිතුමා.

# ජාතික විගණන පනත් කෙටුම්පත
# தேசிய கணக்காய்வு சட்டமூலம்
# NATIONAL AUDIT BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[11.28a.m.]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}

Hon. Speaker, I move,

"That the Bill be now read a Second time"

Hon. Speaker, a lot of time has been taken, so I will be very brief because there are a large number of Members

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

who want to express their views on this important piece of legislation. The House has been waiting for this piece of legislation for long and the Government and I have been criticized for the delay.

Firstly, I would like to remind this House that the National Audit Bill and the Right to Information Bill were things proposed by the Government in 2003 of which you and I were Members. Unfortunately, before these Bills could see the light of day, the Government changed. The succeeding governments promised to carry on, but no one ever produced this Bill again. So, while we are going to get criticized that we did not want to bring in this Bill and we have delayed it, I just want to remind everyone that everyone here had a chance of bringing in the Bill. But they did not do that. Then, we decided when we backed the present President Maithripala Sirisena that we will again produce the Right to Information Bill and the National Audit Bill before this House.

There were two Committees appointed. When the Right to Information Bill was produced before this House, it differed slightly from the older draft and therefore it went through the House without too much of discussion outside this House. But, when the National Audit Bill came, it was different from the original one and the whole power structure of the Constitution came into play. Because, you had the Executive power which was wielded by the President, the Prime Minister and the Ministers; then you had the Judicial power and we also had Parliament's Legislative power. It was under the power of Parliament that the Auditor-General operated. This is an important power of Parliament.

The Parliament's powers came around as a result of a conflict with the Executive or the King of England as to who had the right to control finance - the King or Parliament. It was a matter not resolved in the court, it was resolved by a war in which the Parliament won and the King was executed. That is how the Parliament's supremacy on financial matters has been established.

Firstly, it was a question that taxation could not take place without the consent of Parliament and secondly, that the annual spending of the government must be approved by Parliament. Firstly, it was a three-year budget. Then, it came down to a one-year budget. Then, Parliament also set up what was called a "Ways and Means Committee" to look at ways and means of raising money required to run the government. That was the first part.

Once that was established, then Parliament started looking at controlling the expenditure and they realized that to control expenditure the accounts had to be audited. Therefore, the audit also became a very important part of the Parliament and there came around the office of the Auditor-General. So, our office of the Auditor-General is fairly old. Some of the countries have a Controller General. Then, the importance of an audit and the independence to ensure efficient functioning of government and to ensure that proper data was available before Parliament became an important issue. At the 66th General Assembly of the United Nations it was decided that a supreme audit body should be strengthened for the promotion and efficiency, responsibility, effectiveness, transparency and accountability of public administration and it indicates that the legality of the audit body should be enshrined in the Constitution of a State or in any other law. So, this is what we accepted.

In 2003, we only envisaged legislation, but we brought in the Audit Service Commission by an Amendment to the Constitution. It was enshrined in the Nineteenth Amendment.

This law seeks to give the details for exercising the powers of the Commission so that it becomes an independent Commission operating under Parliament. We have some bodies which operate with the Judiciary. There are other bodies which operate with the Executive. But, this is a body that operates under the sovereignty of Parliament. So, this is the main purpose of the National Audit Bill.

Now, the issues we have had been about the imposition of surcharges. I thought I will underline it. Who has the power? Because, surcharges were imposed by the Secretary to the Ministry or the Chief Accounting Officer. Can it go to the Audit Service Commission? Can the Audit Service Commission exercise any power which is judicial of nature or is the Secretary's power executive in nature? So, we had actually different number of committees. There is a subcommittee of Ministers, there is a committee of Secretaries, there is a committee of other government officials. Then, there were discussions with the Auditor-General, discussions here, and finally with the Public Service Commission. All of them came and they have made their representations to ensure that their powers are not infringed. Of course, there have been changes.

One of the big areas of concern was the power of audit. The second has been the duties of the Secretary as the Chief Accounting Officer and of the Accounting Officers. They are held responsible. How are the directions to be given? Actually, it was only when the Audit Service Commission Bill came in and these disputes were taking place I realized, having been in government, how detailed the working out of the Government expenditure and the audit was; that it cuts through all the three different branches of the government.

So, these were issues that had been sorted out. Even after we tabled the Bill in April, there were still amendments coming in from some of the public bodies. But all have been accommodated now. I hope this is a satisfactory Bill and when it becomes a law, we must give a chance for this law to be executed and thereafter, Parliament can, from time to time, exercise the oversight powers to ensure what amendments are required.

Auditing of the government itself is a big issue. Firstly, audit must be timely. It is useless us having Audit Reports of four years hence. This Parliament is, at the moment, looking at Audit Reports of the last Parliament

and Parliament before that. Current Audit Reports must be available. Secondly, on the principles of auditing, some of the Auditor-Generals, some of the Audit Commissions have come under criticism in those countries about the auditing techniques used. But it is not only confined to the State sector, it happens even with the private auditors. Private Auditors are coming under audit firms in South Africa. Recently, the regulator in the UK has pulled up the four leading audit firms for not having audited properly and being responsible for the collapse of some of the largest companies in the United Kingdom. So, auditing itself is now coming under scrutiny and Parliament must now exercise its powers to ensure that proper auditing principles are taken.

Some of the issues would arise. For instance, some public servants would say, "No, we cannot take this decision because we will come under audit query." Now we have to sort this out. The Government must also function. Auditing must also take place. So, these are issues that are going to arise and this House will have to go into the matters.

Then, there is also other powers of Parliament. I think this will be completed when we pass the law on the Parliamentary Budget Office. Then, the Parliamentary Budget Office will be the final authority looking at the estimates given by the Executive and the reports given by the National Audit Commission. I think the specialist knowledge that is required will have to be carried in the Parliamentary Budget Office. National Audit Commission will have to be in the auditing side and where specialist knowledge is concerned, we will have to meet up or we have to find some system. So, I think the Parliamentary Budget Office will have to carry specialization, separate from the specialization, a specialist available to the Government.

So, I do not want to take any more of your time on this, but would like to say that we can be happy that since 2015, after the election of Maithripala Sirisena as President, after the election of this Parliament, a total democratic structure has come into place and you can enjoy the freedoms today. You have all the Independent Commissions - the Judicial Service Commission, the Election Commission, the Public Service Commission, the National Police Commission and the Constitutional Council; independence of the Supreme Court and the other courts. Then, we will be having the Audit Service Commission and the Right to Information law as well.

These are all legislations brought in by this Government which has put a democratic structure in place. There will be shortcomings - the Police Commission and all have shortcomings. We can correct those. But the fact is we have put a structure in place where the Executive or the Administration can function and the Judiciary can function without coming under undue political pressure in the work that they have to do. So, we have to look at the National Audit Commission in the background of democracy and how democracy has been established.

Now, for the first time, the Prime Minister comes to Parliament and answers to questions in Parliament. So, this Parliament is becoming more and more powerful. As we go along and take over the new offices and get the J. R. Jayewardene Centre legislation amended by the end of this year, we will have a Parliament which we can be proud of and would be on par or even have more functions available than the Lok Sabha in India.

Thank you.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කරන්න කැමැතියි. අද කාලය හුඟක් ඉක්ම ගොස් තිබෙන නිසා ගරු සභාවේ එකඟත්වයක් තිබෙනවා නම් අපට දිවා භෝජනය සඳහා කාලය ගන්නේ නැතුව විවාදය කරන්න පුළුවන්. ඒකට ඔබතුමන්ලාගේ එකඟත්වය ලැබෙනවාද? Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා.

[පූ.භා. 11.39]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ ඉතාම වැදගත්, ඓතිහාසික වශයෙන් වටිනා, ජාතික වැදගත්කමක් සහිත පනත් කෙටුම්පතක් හැටියට තමයි මේ ජාතික විගණන පනත් කෙටුම්පත අද දිනයේ දී සලකා බලන්නේ; සාකච්ඡා කරන්නේ. ඒ නිසාම ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ විවාද කරන මේ මොහොත දක්වා ආපු ගමන පිළිබඳවත්, අද දිනයේ දී අපි මේ ඉදිරිපත් කරන පනත් කෙටුම්පතේ ඇත්තටම ජාතික විගණන ක්‍රියාවලියක් සඳහා බලාපොරොත්තුවන අපේක්ෂාවන් සාක්ෂාත් කර ගන්න අන්තර්ගතය ශක්තිමත් කරලා තිබෙනවාද, එහෙම නැත්නම් ඒ අන්තර්ගතය අඩපණ කරලා, දුර්වල කරලා තිබෙනවාද කියන එක ගැනත් මුලින්ම අපි තේරුම් ගන්න ඕනෑය කියලා අපි විශ්වාස කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේ දී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය සඳහා පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පත මේ මොහොත දක්වා ආපු ගමන පිළිබඳව බලන විට, අපේ රටේ විගණකාධිපති ගාමිණී විජේසිංහ මැතිතුමාත්, ඒ වාගේම හිටපු විගණකාධිපතිවරුනුත් ඒ වෙනුවෙන් දක්වපු විශාල දායකත්වයක් තිබෙනවා. විශේෂයෙන්ම 1983 දී විගණකාධිපතිවරයෙක් වෙලා හිටපු ගාමිණී යාපා මැතිතුමා තමයි මුලින්ම විගණන පනත් කෙටුම්පතක් සකස් කළේ. එතුමාගේ ඉඳලා 2002 විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ධාරිතා වර්ධන ව්‍යාපෘතියක් මඟින් විගණන පනතක් පිළිබඳව සාකච්ඡා කළා. මම මේ කාරණයත් කියන්න කැමැතියි. 2003දී පළමුවරට කැබිනට් මණ්ඩලයේ මෙවැනි පනත් කෙටුම්පතක් අනුමත කළා. 2003 ඉඳලා 2015 දින 100 වැඩසටහන දක්වා වරින් වර අමාත්‍ය මණ්ඩලයට ඒ කෙටුම්පත ඉදිරිපත් වුණත් අවසාන වශයෙන් සම්මත වුණේ නැහැ.

අවසානයේ දී, 2015 ජනවාරි 8වැනි දා පත් වුණු පාලනය විසින් තමයි ජාතික විගණන කෙටුම්පතක් සකස් කිරීම පිළිබඳ කාරණාව නැවත සාකච්ඡාවට ගත්තේ. හැබැයි, 2015 පෙබරවාරි 19වැනි දා විගණන කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය සම්මත කරන්නත්, 2015 මාර්තු 19වැනිදා විගණන කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කරන්නත් තමයි දින නියම කරගෙන තිබුණේ.

2015 මාර්තු 19 ඉඳලා අවුරුදු තුනකුත් මාස තුනක් ගතවුණාට පසුව තමයි අද මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. හැබැයි, අපි ඒ ගැන සතුටු වෙනවා. මම කලින් කිව්වා වාගේම ඒ විධියට හරි මෙම පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න දායක වුණේ වර්තමාන විගණකාධිපති ගාමිණී විජේසිංහ මැතිතුමාත්, හිටපු විගණකාධිපතිවරුනුත්, විශේෂයෙන්ම මායාදුන්නේ මැතිතුමා වැනි අය සහ විගණන දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරින්, සියලුම වෘත්තීය සමිති මේ වෙනුවෙන් අතිමහත් කැප කිරීමක් කරපු නිසා සහ අතිමහත් වෙහෙසක් දරපු නිසයි. වර්තමාන විගණකාධිපතිතුමාටත්, එම සියලුම නිලධාරින්ටත් මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. මොකද, ඔවුන් මෙම විගණන පනත් කෙටුම්පතේ අඩංගු ඇත්ත හරය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අතිමහත් වෙහෙසක් දැරුවා; මහන්සියක් ගත්තා. දැන් මේ පාර්ලිමේන්තුව හමුවේ මෙම පනත් කෙටුම්පත තිබෙනවා. මෙම පනත් කෙටුම්පතට ඇත්ත ජීවයක් දීලා, ඇට, ලේ, මස්, නහර එකතු කරලා ජනතාව ඉදිරියට ගෙන යනවාද, එහෙම නැත්නම් මෙම පනත් කෙටුම්පතට විගණකාධිපතිතුමා, විගණකවරුන්, දෙපාර්තමේන්තුවේ නිලධාරින් බලාපොරොත්තු වුණු ඇට, ලේ, මස්, නහර ගලවලා හිස් පඹයෙක් කරලා, "ජාතික විගණන පනත" කියලා නමක් දාලා සමාජගත කරනවාද කියන එක තමයි අපට දැන් තිබෙන ප්‍රශ්නය. මොකද, මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ නැතිව කල් අරිද්දී; මහ හරිද්දී; කැබිනට් මණ්ඩලය තුළ වරින් වර, වරින් වර එහාට මෙහාට වීසි කරද්දී, ඒ වාගේම පරිපාලන සේවා සංගම් නිලධාරින්, අමාත්‍යාංශවල ලේකම්වරු මට්ටමින් මෙම පනත් කෙටුම්පත වීසි කරලා, අධි භාරය නිසා තමන්ට චෝදනා ඉදිරිපත් වෙයි, තමන්ට දඩ කන්න වෙයි, ඒ නිසා තමන්ට දඩ ගෙවන්න සිද්ධ වෙයි කියලා හැල්ලු කරද්දී, මේක යටපත් කරන්න හදපු වැයමේදී තමයි එක් අවස්ථාවක ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු කණ්ඩායම හැටියට අපි තීරණය කරන්නේ, පෞද්ගලික මන්ත්‍රී යෝජනා පනත් කෙටුම්පතක් හැටියට හෝ මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගේනවා කියලා. දැන් මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. මෙම පනත් කෙටුම්පත රජය විසින් ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, රජය විසින් ඉදිරිපත් කර තිබෙන මෙම පනත් කෙටුම්පත ඇත්තටම ඇට, ලේ, මස්, නහර සහිතව, රුධිරය සහිතව, හෘදය වස්තුවක් සහිතව, ජීවයක් සහිතව ගලන ක්‍රියාවලියක් සහිත, ජාතික විගණනය ශක්තිමත් කරන්න පුළුවන් පනත් කෙටුම්පතක් හැටියටද තිබෙන්නේ, එහෙම නැත්නම් හිස් පඹයෙකුට "ජාතික විගණන පනත" කියලා නමක් දාලාද තිබෙන්නේ කියන එක ගැන මේ ගරු පාර්ලිමේන්තුවේ සියලු දෙනා විතරක් නොවෙයි, රටේ ජනතාවත් අවධානයට ගන්න ඕනෑ.

අපට මතකයි ජාතික ඖෂධ ප්‍රතිපත්තිය හැටියට "සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය" නම් කළාට, ඒකේ පිටකවරයේ තමයි සේනක බිබිලේ මහත්මයා සිටියේ. ඒක ඇතුළේ සේනක බිබිලේ මහත්මයාට ඒ ක්‍රියාවලිය කරගෙන යන්න ඉඩක් තිබුණේ නැහැ. ඒක අවුරුදු ගණනක් තිස්සේ ඇදිලා, ඇදිලා, වාද විවාද කරලා, අද වන විටත් සේනක බිබිලේ ප්‍රතිපත්තිය, ජාතික ඖෂධ ප්‍රතිපත්තිය හැටියට හරි මට්ටමින් ක්‍රියාත්මක වෙනවාද කියලා සැක සහිතයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ වාගේම අද දිනයේදී මෙම පනත් කෙටුම්පතට සාධාරණය ඉෂ්ට කරන්න පුළුවන්, යුක්ති සහගත කරන්න පුළුවන්, පණ දෙන්න පුළුවන් යෝජනා 16ක් සංශෝධන හැටියට අපි ඉදිරිපත් කරනවා. එම සංශෝධන පිළිගන්න කියලා මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. අපි එම සංශෝධන ඉදිරිපත් කරන්නේ ඉතා පැහැදිලිව මේ පනත් කෙටුම්පත ඉතාමත්ම ජීවය සහිත පනතක් හැටියට පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගැනීමේ අවශ්‍යතාව වෙනුවෙන්මයි. මෙම පනත් කෙටුම්පත සංශෝධනය වෙලා, ජාතික විගණන ක්‍රියාවලියෙන් මෙහාට ඇවිල්ලා, අද වන විට මෙම පනත් කෙටුම්පත ඇවිල්ලා තිබෙන්නේ කොතැනටද කියලා මම මගේ කථාවේදී කියන්නම්. ඒ වෙනුවෙන් මම කරුණු දක්වන්නම්. හැබැයි, මම මේ දේ අවධාරණය කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ තිබෙන ආකාරයට නම් මෙම පනත් කෙටුම්පත සම්මත වෙන්නේ, හොරුන්, වංචාකාරයින්, රාජ්‍ය මුල්‍ය දූෂිතයින්, අපරාධකාරයින්, මහ බැංකු බැඳුම්කර වංචාකාරයෝ වාගේ අය මෙම පනත් කෙටුම්පතට භය වෙන්න ඕනෑ නැහැ. මොකද, ඒ අයට මොකුත් වෙන්නේ නැහැ. රාජ්‍ය අංශයේ - රාජ්‍ය ආයතන, මණ්ඩල, දෙපාර්තමේන්තු, අධිකාරිවල - කවුරු හෝ මං කොල්ල කන්න බලාගෙන සිටින නිලධාරින් ඉන්නවා නම්, මේ තිබෙන විධියට නම් මෙම පනත් කෙටුම්පත අද සම්මත වෙන්නේ, ඒ අය තමන්ට දඩ වදිනවා කියලා හිතාගෙන ඉන්නවා නම් භය වෙන්න එපා, ඒ අයට මොකුත් වෙන්නේ නැහැ. වෙන එකක් තියා, දැන් ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතේ තිබෙනවා, දණ්ඩනයක් සඳහා ගෙවිය යුතු උපරිම දඩය රුපියල් ලක්ෂයක් කරන්න කියලා. ඔබතුමන්ලා ඒ සඳහා අද සංශෝධනයක් ඉදිරිපත් කරනවා. එම සංශෝධනයේ තිබෙනවා, එම රුපියල් ලක්ෂයේ දඩය රුපියල් 5,000ට අඩු කරන්න කියලා. ඒ කියන්නේ, මෙම පනත් කෙටුම්පත ක්‍රියාත්මක වුණොත් අනිවාර්යයෙන්ම සිද්ධ වෙන්නේ, උපරිම දඩය - surcharge-, අධිභාර පනවන දඩය විධියට වදින්නේ රුපියල් 5,000යි.

කෝටි ගණනක් මං කොල්ල කෑවත්; මහ බැංකුව මං කොල්ල කෑවත්; මහ බැංකුව මං කොල්ල කන්න උදව් කළ නිලධාරින්ටත්; අමාත්‍යාංශ ලේකම්වරයකුටත්; විදුලිබල මණ්ඩලය මං කොල්ල කෑවත්; ඒක විකුණන්න උදව් කළත් -ඒ ඕනෑම දෙයකට- ජාතික විගණන පනත අනුව නම් උපරිම දඩය රුපියල් 5,000යි; රාජ්‍ය මුල්‍ය අවභාවිතාවක් සම්බන්ධයෙන් දඩය රුපියල් 5,000යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවම දඩය රුපියල් 5,000 කරන්න ඕනෑය කියා අපි සංශෝධනයක් ගෙනෙනවා. රුපියල් 5,000න් තමයි එය පටන් ගන්න ඕනෑ. "රුපියල් ලක්ෂයක්" කියා

පනත් කෙටුම්පතේත් සඳහන් වෙලා තිබෙනවා, හැබැයි, පසුගිය දවසක මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පළමුවන වර ඉදිරිපත් කළාට පසුව, ඒ ගැන ආංශික අධීක්ෂණ කාරක සභාවේත්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේත් සාකච්ඡා කළාට පසුව, කැබිනට් මණ්ඩලය නැවත රැස්වෙලා, ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කරන ඇමතිතුමා වන රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ අත්සනින් යුතුව කැබිනට් පත්‍රිකාවක් නිකුත් කළා. එම කැබිනට් පත්‍රිකාව මා ළඟ දැන් තිබෙනවා. මම එය **සභාගත*** කරනවා.

රුපියල් ලක්ෂය, රුපියල් 5,000ට අඩු කරන්න කියා එම කැබිනට් පත්‍රිකාවෙන් යෝජනා කරනවා. දැන් අපිට හිතාගන්න පුළුවන්, මේ පනතට කර තිබෙන්නේ මොකක්ද කියා.

ඊළඟට, විගණකාධිපතිතුමාගේ බලතල දිහා බලන්න. අපේ රටේ විගණකාධිපති දෙපාර්තමේන්තුවක් තිබෙනවා; එහි විගණකාධිපතිවරයෙක් ඉන්නවා; විගණකාධිපතිතුමාගේ මණ්ඩලයක් තිබෙනවා. මේ පනත ගේන්නේ විගණකාධිපතිගේ බලතල අඩු කරන්න නොවෙයි; කප්පාදු කරන්න නොවෙයි. මේ පනතේ අරමුණ වුණේ, එතුමාගේ බලතල වැඩි කිරීම, ශක්තිමත් කිරීම සහ එතුමාට වැඩිපුර වගකීම පවරා දීමයි. හැබැයි දැන් කර තිබෙන්නේ මොකද්ද? ජාතික විගණන පනත් කෙටුම්පතේ Iවන කොටසේම ඇතුළත් වන, "විගණකාධිපතිවරයා විසින් සිදු කරන විගණනවල විෂය පථය" කියන මාතෘකාව යටතේ, "ඒකාබද්ධ අරමුදලෙන් වන සියලු වියදම් විගණනය කරනු ලැබිය යුතු ය;" කියන තැනට එය සීමා කර තිබෙනවා. වියදම් විතරක් නොවෙයි, ආදායමත් ඇතුළත් කරන්න ඕනෑය කියා පසුව අපි ආංශික අධීක්ෂණ කාරක සභාවේදී කිව්වා. මම පෞද්ගලිකව සතුටු වෙනවා, ඒ සංශෝධනය ගෙනෙන්න පුළුවන් වීම ගැන. ඒ කාරණයත් එකතු කරනවාය කියා ඔබතුමන්ලා දැන් සංශෝධන ඉදිරිපත් කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. එතකොට, "ඒකාබද්ධ අරමුදලෙන් කරන වියදම් විතරක් විගණනය කිරීමද විගණකාධිපතිතුමාගේ විෂය පථය?" කියා අහන්න ඇස් පෙනෙන, කන් ඇසෙන කවුරු හෝ හිටියේ නැද්ද? ඒකාබද්ධ අරමුදලෙන් කරන වියදම් විතරද, එතුමාගේ විෂය පථය වන්නේ? ඒකාබද්ධ අරමුදලට එන ආදායම එතුමාගේ විෂය පථය නොවෙයිද? "ඒකාබද්ධ අරමුදලට පිටින් ආදායම් එක එක ආයතනවලට අරගෙන තිබෙනවා; රට ණය කරලා තිබෙන්නේ භාණ්ඩාගාරයෙන් විතරක් නොවෙයි, භාණ්ඩාගාරයට සෘජුව නොවන චක්‍රව එන ව්‍යාපෘතිවලින් එක එක ආයතන වෙන වෙනම ගිණුම් හදලා විවිධ රටවලින් ණය අරගෙන තිබෙනවා, ඒවාත් විගණනය වෙලා නැහැ" කියා විගණකාධිපති ගාමිණී විජේසිංහ මහත්මයා පසුගිය දවස්වල වාර්තා ඉදිරිපත් කළා. ඒවාත් එකතු වෙන්න ඕනෑය කියා එතුමා සඳහන් කළා. මහ නැඟුම, ගම නැඟුම, අර නැඟුම, මේ නැඟුම කියා ඕනෑ තරම් ව්‍යාපෘති තිබෙනවා. ඒවාට පිටින් ණය ගත්තා. ඒවා විගණනය වෙන්න ඕනෑය කියනවා. [බාධා කිරීමක්] හැබැයි, ඒක පිළිගත්ත ඔබතුමන්ලා දැන් මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරනවා, "ඒකාබද්ධ අරමුදලෙන් වන සියලු වියදම් විගණනය කරනු ලැබිය යුතුය" කියා. හැබැයි අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154වන ව්‍යවස්ථාවේ සඳහන් වන, "විගණකාධිපතිවරයාගේ කාර්ය හා කර්තව්‍ය" යටතේම එතුමාට රාජ්‍ය මූල්‍ය පාලන බලය තිබෙනවා. විගණකාධිපතිවරයාට රාජ්‍ය මූල්‍ය පාලන බලය තිබෙනවා නම්, ඒ වාක්‍යය මේ විෂය පථයට ඇතුළත් කරන්න බැරි ඇයි? ඒ නිසා මෙතැනදී ඉතා පැහැදිලිව අපට තේරෙනවා, විගණකාධිපතිතුමාගේ බලතල, එතුමාගේ විෂය පථය කොයිතරම් දුරට කප්පාදු වෙලා තිබෙනවාද කියා.

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම උදාහරණයක් කියන්නම්. 2015 දෙසැම්බර් 24වැනි දා කෙන්යාවේ මේ වාගේම විගණන පනතක් සම්මත කළා. කෙන්යාව ගැසට් නිවේදනයකින් ඒ විගණන පනත ඉදිරිපත් කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහි විගණකාධිපතිවරයාගේ බලතල සඳහන් වන 64. (1) උපවගන්තියේ මෙසේ සඳහන් වී තිබෙනවා:

> "Where the Auditor-General establishes that any person, supplier or company has been involved in fraud or corrupt practice, the Auditor -General shall report to the police."

යම් පුද්ගලයකු හෝ ආයතනයක් කුමන හෝ වංචාවකට හෝ දූෂණයකට සම්බන්ධයි කියා විගණකාධිපතිවරයා හඳුනා ගන්නවා නම්, ඒ පනත අනුව ඒ ගැන සෘජුව පොලීසියට පැමිණිලි කරන්න එතුමාට පුළුවන්. වටේ යන්නේ නැතුව පැමිණිලි කරන්න එතුමාට පුළුවන්. එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "Ethics and Anti-Corruption Commission or the Public Procurement Oversight Authority for their action."

විගණකාධිපතිවරයාට පොලීසියට වාර්තා කරන්න පුළුවන්; දූෂණ විරෝධී කොමසාරිස්වරයාට වාර්තා කරන්න පුළුවන්; Public Procurement Oversight Authority එකට වාර්තා කරන්න පුළුවන්. මෙන්න, එතුමාගේ බලතල. කෙන්යාව කියන්නේ, දේශපාලනමය වශයෙන්, සංස්කෘතිකමය වශයෙන්, මූල්‍ය පාලනය පැත්තෙන් අපට වඩා ශක්තිමත් රටක්ය කියා මම නම් හිතන්නේ නැහැ. අප්‍රිකානු රාජ්‍ය පද්ධතියේ තිබෙන කෙන්යාව අපට වඩා ශක්තිමත් රටක් නොවෙයි. නමුත් ඔවුන් ඔවුන්ගේ බලතල විගණකාධිපතිවරයාට දීලා තිබෙන්නේ ඒ විධියටයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේදී එම විගණන පනත මම **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ බලතල සම්බන්ධ ප්‍රශ්නය මොකක්ද? යම්කිසි විගණනයක් සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමක් සඳහා විගණකාධිපතිවරයා යම්කිසි පුද්ගලයකු කැඳවනු ලබන අවස්ථාවක ඒ පුද්ගලයාට එන්න බැරි නම්, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය ගැන මෙම පනත් කෙටුම්පතේ 7. (4)උප වගන්තියේ සඳහන් වී තිබෙනවා.

".......එකී තැනැත්තාට නොවැළැක්විය හැකි තත්ත්වයක් හේතුවෙන් පෞද්ගලිකව පෙනී සිටීමට නොහැකි අවස්ථාවක දී, ඔහු විසින් ඒ වෙනුවෙන් විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු ඉදිරියේ පෙනී සිටීම සඳහා එම විෂයය පිළිබඳ මනා දැනුමක් ඇති වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය." කියා එම උපවගන්තියේ සඳහන් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ උදාහරණයක් කියන්නේ. විගණකාධිපතිතුමා කියනවා, අර්ජුන මහේන්ද්‍රන්ට එන්න කියා. එහෙම නැත්නම් විගණනයට අදාළ කරන පුද්ගලයකුට එන්න කියනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)

ඔබතුමාගේ අකමැත්තක් නැත්නම් මම ඒ කාරණය පැහැදිලි කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි. මේ ජාතික විගණන පනත

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

කියන්නේ, කිසි බලතලයක් නැති, මහා පරිමාණ හොරු අල්ලන්න නොහැකි, කිසිම ප්‍රතිඵලයක් නැති එකක් කියා තමයි ඔබතුමා කරුණු ඉදිරිපත් කරන විධියට තේරුම් යන්නේ. ගරු මන්ත්‍රීතුමනි, විගණන කාර්යයේදී යම් දෝෂයක්, වරදක්, දූෂණයක් සිද්ධ වෙලා තිබෙනවා නම්, ඒ පිළිබඳව ගත යුතු විනය ක්‍රියාමාර්ග සහ නීතිමය ක්‍රියාමාර්ග තමයි මේ ජාතික විගණන පනත මඟින් ඉදිරිපත් කර තිබෙන්නේ. මේ පනත් කෙටුම්පත සම්මත වුණාම දණ්ඩ නීති සංග්‍රහය අහෝසි වෙන්නේ නැහැ, ඒ වාගේම අනිකුත් අපරාධ නීති එකක්වත් අහෝසි වෙන්නෙත් නැහැ. ඔබතුමා උදාහරණයක් විධියට මහ බැංකු බැඳුම්කරය ගැන සඳහන් කළා. ඒකේ වංචාවක් වෙලා තිබෙනවා නම්, මේ නීතිය අනුගමනය කරලා ඒක සුළු කාරණයක් හැටියට ලඝු කරලා මෙතැනින් අවසන් කරනවා කියා කථාවක් නැහැ. රටේ අපරාධ නීති ඒ විධියටම තිබෙනවා. ඔබතුමා මේ පනත ඒ තරම් ලඝු කරන්න එපා. මේක රටේ පවතින සියලුම නීතිවලට අමතරව එන නීතියක් මිස, අනික් නීති යටපත් කරගෙන, ඒවා හැල්ලු කරගෙන එන නීතියක් නොවෙයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒක හරි, ගරු ඇමතිතුමනි. ඇත්තටම මම කියන්නේ, මේ තිබෙන යථාර්ථය යටතේ; තිබෙන තත්ත්වයට අදාළව; "උන්නු හැටියට මළා මදැයි" කියනවා වාගේ, මේක හොඳයි කියන එකයි. ඒක මම පිළිගන්නවා, ඒ වාගේම මම ඔබතුමා කියන කාරණයත් පිළිගන්නවා. අනිකුත් නීති රීතිත් තිබෙනවා. ඒකත් ඇත්තයි. හැබැයි, ඒ යටතේදී අපට මේ වෙනුවෙන් තව අර්ථ නිරූපණයක් දෙන්න පුළුවන් නම්; තව එකතු කරන්න පුළුවන් නම්; මේ පනත තව ශක්තිමත් කරන්න පුළුවන් නම් හොඳයි. අන්න ඒ පැත්තෙන් අදහස් දැක්වීමක් පමණයි මම මේ කරන්නේ. යථාර්ථයක් හැටියට මේක මේ මට්ටමින් හෝ; නමක් හැටියට හෝ; "පතෝල" මට්ටමෙන් හෝ - ඇති වුණු තත්ත්වය යටතේ, ඇති වුණු බලපෑම් යටතේ - සම්මත කිරීමට කටයුතු කිරීම අප අගය කරනවා. මෙම පනත් කෙටුම්පත සම්මත වෙන්න ඕනෑ. හැබැයි, මේ පනතේ දුර්වල වුණු තැන් ගැන කියන්න ඒ යටතේ අපට අයිතිය දෙන්න. ඒක තමයි මම මේ කරන්නේ. ඔබතුමා කියන දේ ඇත්තයි. රටේ අනිකුත් නීති රීති ටික සියල්ලම නවත්වලා මේ නීතිය පමණක් රටේ මූලික නීතිය වෙන්නේ නැහැ. ඒක මම පිළිගන්නවා. ඒ වාගේම තමයි, මේක මේ විධියට හදද්දී, තිබුණු තැන ඉඳන් ගොඩාක් පසුපසට ගිහින් තිබෙනවා. ඒ ගැන මම දැන් කියන්නම්.

තමන් වෙනුවෙන් වෙනත් පුද්ගලයකුට විගණකාධිපතිවරයා ඉදිරියේ පෞද්ගලිකව පෙනී සිටීමට පුළුවන්ය කියන කාරණය අපි උදාහරණයකට ගනිමු. "නොවැළැක්විය හැකි හේතුවක් මත" කියා ඒ විධියට පුද්ගලයෙක් එනවා නම්, අඩු තරමින් ඒ නම් කරන තැනැත්තා විගණකාධිපතිවරයාගේ අනුමැතිය මත එන්න ඕනෑය කියා අපි සංශෝධනයක් ගේනවා. ඒක හොඳ නැද්ද? මේ පනත අනුව චූදිතයා වෙනුවට ඕනෑම කෙනෙකු ඉදිරිපත් කරනවා වෙනුවට විගණකාධිපතිවරයාගේ අනුමැතිය මත පුද්ගලයකු ඉදිරිපත් කිරීම හොඳ නැද්ද? මම අහවල් පුද්ගලයා කැඳවනවා නම්; අර්ජුන මහේන්ද්‍රන් කැඳවනවා නම්, අර්ජුන මහේන්ද්‍රන් වෙනුවට එන පුද්ගලයාගෙන් අර්ජුන මහේන්ද්‍රන්ගෙන් දැන ගන්න තිබෙන කාරණා ටික දැන ගන්න පුළුවන් කියා විගණකාධිපතිවරයා සෑහීමකට පත් වෙන්න ඕනෑ. එහෙම නැතිව, විගණකාධිපතිවරයා ඉස්සරහට ඕනෑම කෙනෙකුට එන්න බැහැ නේ. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, විගණකාධිපතිවරයා යම් තැනැත්තෙක් කැඳවනවා නම්, ඒ පුද්ගලයා වෙනුවට ඕනෑම කෙනෙකු ආවාට හරියන්නේ නැහැ නේ. ඒ වෙනුවට විගණකාධිපතිවරයා සෑහීමකට පත්වන පුද්ගලයකු; විගණකාධිපතිවරයා පිළිගන්නා පුද්ගලයකු; "ඒ" වෙනුවට "බී" කියන තැනැත්තා හොඳයි කියා විගණකාධිපතිවරයාට සෑහීමකට පත් වෙන්න පුළුවන් නම් එවැනි පුද්ගලයකු එවන්න කියා තමයි අපි කියන්නේ. ඒකෙන් මේ පනත ශක්තිමත් වෙනවා.

අද ඉදිරිපත් කරන මේ යෝජනා, සංශෝධන ඉතාම සාධනීය ලෙස තේරුම් ගන්න කියාත් මම ඉල්ලා සිටිනවා. අපි විගණන පනතක් හැදුවා. හැබැයි මේ පනත් කෙටුම්පත සම්මත කරන්නේ මේ විධියට නම්, ඔබතුමන්ලා බලාපොරොත්තු වන දේවත් මේ පනත තුළින් කරන්න බැහැ. මේ පනතේ අවුල් වියවුල් තිබෙනවා. මේ පනත් කෙටුම්පත වරින් වර කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වෙලා ඇවිත් තිබෙන්නේ. මෙහි සඳහන් යම් යම් කාරණා සංශෝධනය කරද්දී, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගැන නීතිපතිතුමා දීලා තිබෙන නිර්දේශය මොකක්ද කියා මම කියන්නම්. "රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිරීක්ෂණයක්; නිගමනයක් කැබිනට් මණ්ඩලයට එවා තිබෙනවා, ඒ නිරීක්ෂණය එවා තිබෙන්නේ මේ පනත් කෙටුම්පත ගැන නොවෙයි, මෙයට පිටින්, වෙනත් පනත් කෙටුම්පතක් ගැනයි" කියා එක වෙලාවකදී නීතිපතිවරයා කියා තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ තමයි මේ පනත් කෙටුම්පත සම්පාදනය වෙලා තිබෙන්නේ. එම නිසා, මේ පනත් කෙටුම්පත මේ විධියට සම්මත කර ගත්තොත් ඔබතුමන්ලා බලාපොරොත්තු වන දේවත් මේ පනත තුළින් ඉෂ්ට කර ගන්න ලැබෙන්නේ නැහැ. ඒකයි අපි කියන්නේ. මේ පනත් කෙටුම්පත සම්මත කරන්න. හැබැයි මේ සාධනීය යෝජනා ගැන හිතන්න. විගණකාධිපතිවරයා කවුරුන් හෝ කෙනෙකු කැඳෙව්වොත්, නොවැළැක්විය හැකි හේතුවක් මත ඔහු වෙනුවට වෙනත් කෙනෙකු එවනවා. හැබැයි, ඒ එවන එක්කෙනා මෙලෝ දෙයක් දන්නේ නැති කෙනෙක්, ඒ ගැන තේරුමක් නැති කෙනෙක් වෙන්න පුළුවන්.

එහෙම නැත්නම් විගණකාධිපතිතුමාගේ පරීක්ෂණය අඩාළ කරන්න, දුර්වල කරන්න ඉදිරිපත් කරන කෙනෙක් වෙන්න පුළුවන්. එහෙම වෙන්න බැරි ද? එහෙම කරන්න පුළුවන්. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට එන්න ඕනෑ කෙනා වෙනුවට වෙන කෙනෙක් එව්වොත් මොකද වෙන්නේ? ඔහු ඇවිල්ලා කියනවා, "මම දන්නේ නැහැ. මට එන්න කිව්වා. මම ආවා." කියලා. එහෙම වෙනකොට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව පවත්වාගෙන යන්න බැහැ නේ. විගණන පරීක්ෂණයක් සඳහා කොමිෂන් සභාවට විගණකාධිපතිවරයා කවුරු හෝ කෙනෙක් කැඳෙව්වොත්, එතුමා වෙනුවට ඉදිරිපත් වෙන කෙනා පිළිබඳව අඩු තරමේ විගණකාධිපතිවරයා සෑහීමකට පත් වෙන්න ඕනෑ, "ආදේශකයා පිළිගත හැකි කෙනෙක්." කියලා. අපේ තර්කය එච්චරයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අදාළව අපි දන්නවා, විගණකාධිපතිවරයා පාර්ලිමේන්තුවටයි වාර්තා කරන්නේ කියලා. ඒක හරි. පාර්ලිමේන්තුවට වාර්තා කළාට පස්සේ පාර්ලිමේන්තුවෙන් තමයි ඒක publish කරන්නේ. ඒවාත් ඇත්ත. දැන් අගමැතිතුමා අපේ රටේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ගැන කිව්වා. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5.(1) උප වගන්තියෙනුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14අ. (2) ව්‍යවස්ථාවෙනුත් තොරතුරු සීමා කිරීම කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු වෙනත් නීති-රීති සීමා කරලා තිබෙනවා. හැබැයි, ඒ අතරේ ජාතික විගණන පනත් කෙටුම්පතේ 9. (ආ) උප වගන්තියත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ -RTI Act එකේ- 36 වැනි වගන්තියත් උල්ලංඝනය වෙනවා, ඒකේ කාරණා අඩාළ කෙරෙනවා.

ජාතික විගණන පනත් කෙටුම්පතේ 13 වැනි වගන්තිය මම ගරු ඇමතිතුමාට පෙන්වන්නම්. 13 වැනි වගන්තියේ මෙන්න මෙහෙම කාරණයක් සඳහන් වෙනවා:

"...තව ද යම් වාර්තාවක්, තොරතුරක්, ලේඛනයක්, පොතක්, ගොනුවක් හෝ පරිගණක ආශ්‍රයෙන් ලබාගත් පිටපතක් ඔහු විසින් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත ලබා දෙනු ලැබ ඇත්නම් හෝ එසේ ලබා දීමට අදහස් කරනු ලබන්නේ නම් එම වාර්තාව ප්‍රකාශයට පත් නොකළ යුතු ය."

මම හිතන්නේ නැහැ, මේක ගාමිණී විජේසිංහ විගණකාධිපතිතුමාගේ අදහසක් කියලා. ඒ කියන්නේ, යම් තොරතුරක් හෝ වාර්තා කරන දෙයක් විගණකාධිපතිවරයා හිතාගෙන ඉන්නවා නම් අධිකරණයට ගෙනියන්න හෝ නීති කටයුත්තකට යොමු කරන්න, "ඒක ප්‍රකාශයට පත් නොකළ යුතුයි." කියලයි මේ කියන්නේ. එතකොට හොරෙක් ආරක්ෂා කරන්න හිතාගෙනම යම් විගණකාධිපතිවරයෙක් ඇවිත් කියනවා, "මේක දෙන්න බැහැ. දෙන්න බැරි, මම හිතාගෙන ඉන්නවා ලබන අවුරුද්දේ නඩු දමන්න." කියලා. නැත්නම්, ආණ්ඩුවේ කවුරු හෝ කෙනෙක් කියනවා, "මේ සම්බන්ධයෙන් අපි අධිකරණ ක්‍රියා මාර්ග ගන්න බලාපොරොත්තු වෙනවා. බලාපොරොත්තු වෙන නිසා මේක ඉදිරිපත් කරන්න එපා." කියලා. බලන්නකෝ, විශේෂ වාර්තා පිළිබඳව තිබෙන්නේ එහෙම කාරණායි. කලින් කාරණා අපට තේරෙනවා. විගණනය පිළිබඳව විගණකාධිපතිවරයා පාර්ලිමේන්තුවට වාර්තා කරන්න ඕනෑ. ඒ වාර්තා විගණන කාර්යාලයේ වෙබ් අඩවියේ දමන්න ඕනෑ. පාර්ලිමේන්තුවට වාර්තා කළාට පස්සේ මහජනතාවට ඒක ගන්න පුළුවන්. නීතිය හමුවට තොරතුරක් දෙන්න අදහස් කරන්නේ නම්, -නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත ලබා දෙනු ඇත්නම් නොවෙයි.- නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවලට ලබා දෙන්න හිතාගෙන ඉන්නවා නම්, CID එකට දෙන්න හිතාගෙන ඉන්නවා නම්, -හිතාගෙන ඉන්නවා කියන එක අනන්ත කාලයක්. ඒක අනන්ත දෙයක් වෙන්න පුළුවන්.- එතකොට යම් කෙනෙකුට අභිලාෂයෙන්ම,- [බාධා කිරීමක්] අනේ! ගරු ඇමතිතුමනි, මේ මගේ වෙලාව නේ. ඔබතුමා ඔබතුමාගේ වෙලාවේදී පැහැදිලි කරන්න. එතකොට යම් කෙනෙකුට අභිලාෂයෙන්ම ඕනෑ නම් තොරතුරු වසන් කිරීමක් සිද්ධ කරන්න පුළුවන්. ඒක බරපතළ කාරණාවක් හැටියටයි මම දකින්නේ. ඒ නිසා මම කියනවා, ඒ ගැන සැලකිලිමත් වෙන්න කියලා. විගණන වාර්තාවේ ක්‍රියාවලිය මම ඔබතුමාට කියන්නම්. විගණකාධිපතිවරයාගේ දෙපාර්තමේන්තුව ආයතනයක විගණන පරීක්ෂණයක් කරනවා. පරීක්ෂණයක් කරලා ඉවර වෙලා ඒක බාර දුන්නාට පස්සේ විගණන කොමිසම විසින් තීරණය කරනවා, "මේ පරීක්ෂණයට අදාළව දණ්ඩනයක් පනවන්න තිබෙනවා, අධිභාරයක් පනවන්න තිබෙනවා; මූල්‍ය වංචාවක් සිද්ධ කරලා තිබෙනවා, මේක අපි අය කරගන්න ඕනෑ." කියලා. එහෙම අය කරගැනීමේ ක්‍රියාවලිය තමයි ඊට පස්සේ මේකේදී මූලික වශයෙන් සිද්ධ වෙන්නේ. එතකොට අය කරගැනීමේ ක්‍රියාවලිය දැන් බාරදීලා තිබෙන්නේ කාට ද? එම ක්‍රියාවලිය බාරදීලා තිබෙන්නේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා හැටියට අමාත්‍යාංශ ලේකම්වරුන්ටයි. විගණන කොමිසමේ තීරණයක් අනුව අධිභාර පැනවීමක් හෝ අයකර ගැනීමක් බාර දෙන්නේ අමාත්‍යාංශ ලේකම්වරුන්ටයි. අමාත්‍යාංශ ලේකම්වරුන්ට භාර දුන්නාට පස්සේ අධිභාර පැනවීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන පුද්ගලයා අමාත්‍යාංශ ලේකම්වරයා වෙනවා.

ගරු ඇමතිතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පතේ 19. (2) උප වගන්තිය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එහි මෙහෙම සඳහන් වනවා:

"විනය බලධාරියා විසින් ගනු ලබන විධිමත් විනය ක්‍රියාමාර්ගයකින් හෝ අධිකරණ ක්‍රියාවලියකින් අනතුරුව, විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින්, යම් ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු යම් තැනැත්තකුගෙන් එක්ව හෝ වෙන් වෙන් ව, (1) වන උපවගන්තිය යටතේ වූ අධිභාරයක් අය කර ගනු ලැබිය යුතු ය."

මේකට විනය ක්‍රියා මාර්ගයක් පටලැවෙනවා. එතකොට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට ඕනෑ නම් පුළුවන් විගණන කොමිසමෙන් අධිභාරයක් පැනෙවුවාට පස්සේ ඒ අධිභාරය ගැන විනය කමිටුවක් පත් කරන්න, ඒකට විනය බලධාරියෙක් පත් කරන්න. ඊට පස්සේ විනය බලධාරියාගේ report එක අනුව විනය බලධාරියා එක්කෝ කියනවා, "මේ අධිභාරය සුදුසු නැහැ." කියලා.

එතැනින්ම කථාව ඉවරයි. මොකද, අධි භාරය නැවත ආපස්සට හැරවීමක් පිළිබඳ බලය තිබෙන්නේ විගණන කොමිසමට නොවෙයි, ගණන් දීමේ නිලධාරියා වන ලේකම්තුමාටයි. එතකොට ලේකම්තුමා තමයි තීරණය කරන්නේ විනය ක්‍රියාමාර්ගයට අනුව අධි භාරය ආපස්සට යවනවාද, නැද්ද කියලා. එතකොට ප්‍රශ්නය එන්නේ කොහොමද? ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වාගේ ඕනෑම ආයතනයක විනය ක්‍රියාමාර්ග තිබෙනවා, අධිකරණ ක්‍රියාමාර්ග තිබෙනවා. කිසිම රජයේ ආයතනයක අධිකරණයට ඉදිරිපත් වුණු කාරණයකට අධිකරණ ක්‍රියා මාර්ගයක් තිබෙනවා කියලා ආයතනය විනය ක්‍රියාමාර්ග ගැනීම අත් හරින්නේ නැහැනේ. ආයතනය විනය ක්‍රියාමාර්ග ගන්නවා. අධිකරණයේ තීරණයත් එනවා. අධිකරණ තීරණය නිසා විනය ක්‍රියාමාර්ගය නතර වෙන්නේ නැහැ. හැබැයි, මේකෙන් මොකද කරන්නේ? අධි භාර පැනවීමේ ක්‍රියාවලිය ඕනෑ නම් අදාළ පුද්ගලයා pension යනතුරු කල් දමන්න පුළුවන්. මොකද, මේකේ කොතැනකවත් කියලා නැහැ, විනය ක්‍රියාමාර්ගය ඉවර කරන්න ඕනෑ කවදා ද කියලා. අධිකරණ ක්‍රියාමාර්ගය කවදා ඉවර වෙනවාද කියලාත් අපි දන්නේ නැහැ. එතකොට මොකද වෙන්නේ? ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා හැටියට ලේකම්තුමාට පුළුවන්, ලේකම්තුමාගේ යහළුවෙකු නම් මේ අධි භාරයෙන් පරිස්සම් කර ගන්න තිබෙන්නේ-

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මන්ත්‍රීතුමනි, ආයතන සංග්‍රහය අනුව, මාස 12ක් ඇතුළත විනය ක්‍රියාමාර්ගය ඉවර වෙන්න ඕනෑ. ඒක මේකට එන්න ඕනෑ. රජයේ නිලධාරීන්ට විනය ක්‍රියාමාර්ග තිබෙනවා. ඒ නිසා ඒක විකෘති කරලා ඉදිරිපත් කරන්න එපා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

එහෙම නම් ඒක මෙතැනට අදාළ කළේ ඇයි? මම අහන්නේ ඒකයි. අධි භාරය අය කරන්න ඕනෑ ගණන් දීමේ නිලධාරියා මඟින් නම්, -මේක නිකම් විගණකාධිපතිතුමාගේ ඔළුවේ අමාරුවට දාපු අධිභාරයක් නොවෙයිනේ.- විගණන විමසුමක් යවලා, විගණන පරීක්ෂණයක් කරලා, ඒ අනුව විගණන කණ්ඩායමක් ඒ තීරණය අරගෙන, ඒ ගොල්ලන්ට නැවත එය ඉදිරිපත් කරන්න ඉඩ දීලා දමන දණ්ඩනයක්, අය කිරීමක් මේක.

අධිභාර අභියාචනා කමිටුවකුත් තිබෙනවා. යම් පුද්ගලයකුට අධිභාරය පිළිබඳව අගතියක් ඇති වනවා නම්, ඔහුට විනය ක්‍රියාමාර්ගය පටලවා ගන්න ඕනෑ නැහැ. ඔහුට අධිභාර අභියාචනා කමිටුවට යන්න පුළුවන්. ගිහිල්ලා "මට පැනවූ අධිභාරය අසාධාරණයි. මම මේකට අදාළ නැහැ." කියලා කියන්න පුළුවන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවම පත් කරන අධිභාර අභියාචනා

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

කමිටුවක් මේකේ තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවම පත් කරන අධිහාර අභියාචනා කමිටුවකුත් තිබෙනවා. එහෙම නම් අධිහාරය final decision එක නොවෙයි. ඒක විගණකාධිපතිතුමා නිසා හෝ විගණන කොමිසම නිසා ගන්නා අවසාන තීරණය නොවෙයි. ඔහුට අධිහාර අභියාචනා කමිටුවක් තිබියදී, විනය බලධාරියකු ඇඳා ගත්තේ ඇයි? ඒකෙන් කෙරෙන්නේ මොකක්ද? මේක අවුල් කරන එකයි. මේකේ ඉතාම පැහැදිලිව තිබෙන්නේ ඒකයි. ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මේ තීරණය ගන්නේ, දණ්ඩනය පිළිබඳ තීරණය ගන්නේ විනය ක්‍රියාමාර්ගය සහ අධිකරණ ක්‍රියාමාර්ගයෙන් පසුවයි. මම කියන්නේ, දැනට තිබෙන විගණන කටයුත්ත ඊට වඩා හොඳයි කියන එකයි.

ගරු විජේදාස රාජපක්ෂ මැතිතුමනි, ඔබතුමා COPE එකේ සභාපතිතුමා හැටියට "මාසයක් ඇතුළත, අවුරුද්දක් ඇතුළත තීරණයක් දෙන්න." කියලා කිව්ව අවස්ථා ඕනෑ තරම් තිබෙනවා. එතකොට මේක ඇතුළත් කළාට පස්සේ මොකද වෙන්නේ? මේකෙන් ගණන් දීමේ නිලධාරින්ට - ලේකම්තුමන්ලාට- ආවරණයක් දමනවා, විනය ක්‍රියාමාර්ගයකටත් ගිහිල්ලා අධිකරණ ක්‍රියාමාර්ගයකටත් ගිහිල්ලා ඊට පස්සේ දණ්ඩනය නියම කරන්න. ඊට පස්සේ අධිහාර අභියාචනා කමිටුවක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සම්පූර්ණයෙන්ම වැරදියි එතුමා කියන කාරණය.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හරි, කමක් නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මුළු රටම නොමඟ යවන ප්‍රකාශයක් මේක.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා පැහැදිලි කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණය පැහැදිලි කරන්න ඕනෑ. විනාඩි දෙක තුනක් ඕනෑ නම් අපෙන් අඩු කර ගන්න. ඒකට කමක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවැනි පනතක් මඟින් සිද්ධ කරන්නේ, රජයේ නිලධාරින් කටයුතු කිරීමේදී වන අක්‍රමිකතා, මූල්‍ය දූෂණ යනාදිය සම්බන්ධව පියවර ගැනීමයි. ඒකට එක පැත්තකින් විනය ක්‍රියාමාර්ගය ගැනීමේ ක්‍රියාමාර්ගය දැනටත් ආයතන සංග්‍රහයේ තිබෙනවා. ඒකේ තිබෙන ක්‍රියා පිළිවෙත අනුගමනය කළ යුතුමයි. දෙවනුව, අපරාධ නීතිය යටතේ වරදක් වෙලා තිබෙනවා නම්, දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදක් වෙලා තිබෙනවා නම් ඒවා අධිකරණ ක්‍රියාකලාපයේ වෙනම යනවා. හැබැයි, මේ නිලධාරින් අතින් යම්කිසි මූල්‍ය දූෂණයක්, අක්‍රමිකතාවක් සිදු වනවායි කියලා ජාතික විගණන පනත යටතේ ගෙනෙන වරදකදී අනුගමනය කරන්න ඕනෑ ක්‍රියා පිළිවෙත විතරයි මෙතැන තිබෙන්නේ. සමහර විට රජයේ නිලධාරියකු වරදක් කළායි කියලා ලේකම් හෝ නිලධාරියකු වැරදි තීන්දුවක් දෙනවා නම් ඒ උදවියට අභියාචනයක් කරලා ඒ පිළිබඳව සත්‍ය කරුණු ගවේෂණය කර ගන්න අයිතිය දෙන එකේ තිබෙන වරද මොකක්ද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක හොඳයි. කිසි වරදක් නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එහෙම නම් ඔබතුමා ඇයි ඒක වැරදියි කියලා කිව්වේ?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ කාරණය පටලවා ගත්ත හැටි බලන්න. මම කිව්වේ ඒක නොවෙයි. මම කියන්නේ, - [බාධා කිරීමක්] මට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඔබතුමාම කිව්වා, මම COPE එකේ ඉඳගෙන කිව්වා කියලා, - ඔබතුමාත් එහෙම කරනවා ඇති.- යම් යම් වාර්තා නිරීක්ෂණය කරලා මාසයක් ඇතුළත ඉදිරිපත් කරන්න කියලා. හැබැයි, අපේ Standing Orders වල කිසිම තැනක කියලා නැහැ, එහෙම නියෝග දෙන්න අපට බලයක් තිබෙනවා කියලා.

ඒක ඕනෑම inquiry officer කෙනෙකුගේ; විනිශ්චයකාරවරයෙකුගේ තිබෙන අභිමතය. එතකොට අදාළ විනය පරීක්ෂණයට අමාත්‍යාංශයේ ලේකම්ට එන්න බැරි නම්, අතිරේක ලේකම් හෝ වෙනත් කෙනෙක්ව ඔහු එවනවා. හැබැයි, විනය පරීක්ෂණය කරන නිලධාරියා එම නිලධාරියා සම්බන්ධයෙන් සෑහීමකට පත්වන්නේ නැත්නම් මොකක්ද කරන්නේ? "නැහැ, ඔබට මේ ගැන කථා කරන්න තේරෙන්නේ නැහැ"යි කියලා විනය පරීක්ෂණය කරන නිලධාරියා අදාළ ලේකම්වරයාට එන්න කියලා වෙනත් දිනයක් ලබා දෙනවා. ඒක තමයි මෙහිදී සිදුවන ක්‍රියාවලිය. එහෙම නැතිව මේක අමුතු දෙයක් නොවෙයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පැහැදිලියි. මම කියන්නේ මේකයි. අධිහාර සම්බන්ධව විගණන සේවා කොමිෂන් සභාව පැනවිය යුතු ක්‍රියාවලිය මේක තමයි කියන එක මට පැහැදිලියි; ඒක මම දන්නවා; ඒක මට හොඳටම තේරෙනවා. ඒකට තවත් ආයතන පද්ධතියක් තිබෙන බවත් ඇත්ත.

නමුත්, මෙම පනත් කෙටුම්පතේ 19. (2) උප වගන්තියෙහි ඉතා පැහැදිලිව මෙසේ සඳහන් වනවා:

> "විනය බලධරයා විසින් ගනු ලබන විධිමත් විනය ක්‍රියාමාර්ගයකින් හෝ අධිකරණ ක්‍රියාවලියකින් අනතුරුව, විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින්, යම් ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු යම් තැනැත්තකුගෙන් එක්ව හෝ වෙන් වෙන් ව, (1) වන උපවගන්තිය යටතේ වූ අධිහාරයක් අය කර ගනු ලැබිය යුතු ය."

මෙහි ඇති 'අනතුරුව' කියන වචනය මම නැවතත් අවධාරණය කරනවා. මම කියන්නේ මේකයි. අධිභාර අය කර ගන්න අභියාචන ඉදිරිපත් කරන්න වෙනම අභියාචන ක්‍රියාවලියකුත් තියෙද්දි; වෙනම අභියාචන කමිටුවකුත් තියෙද්දි; මේ 'අනතුරුව' කියන එක ගත්තාට පස්සේ මේ සඳහා ගතවන කාලය නිසා මේ කටයුත්ත දුර්වල වනවා. ඒක එකක්. අනික, 'විනය බලධාරියා' කියන පුද්ගලයා මේ නිසා විගණන කොමිසමත් එක්ක සමාන මට්ටමකට හැදෙනවා. මේක නිකම් කවුරුවත් ගත් තීරණයක් නොවෙයි. මේක ජාතික විගණන කොමිසම ගත් තීරණයක්. ජාතික විගණන කොමිසමයි, විනය බලධාරියායි සමාන වන්නේ කොහොමද? එහෙම වුණොත්, විනය බලධාරියා විසින් ජාතික විගණන කොමිසමට අභියෝග කරනවා නේ? මේ දණ්ඩනය සාධාරණ නැහැයි කියලා විනය බලධාරියා කිව්වොත් එහෙම මොකක්ද වෙන්නේ? ඔබතුමන්ලාට ඕනෑ නම්, මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න. හැබැයි, මේ තුළින් ගැටුමක් ඇතිවනවා. එම නිසා විනය බලධාරියාගේ තීරණය සහ ජාතික විගණන කොමිසමේ තීරණය පටලැවිල්ලක් බවට පත්වනවා. මේකෙන් අගතියට පත්වන පුද්ගලයාට අභියාචන කමිටුවට යන්න කලින්ම ජාතික විගණන කොමිසමට අභියෝග කරන්න පුළුවන්, "විනය බලධාරියා මෙහෙම කියලා තිබෙනවා, ඔය ගොල්ලන් කොහොමද, මට දණ්ඩනයක් පනවන්නේ?" කියලා. මේ තුළින් ඒ ගැටුම එන එක විතරයි මම කියන්නේ. මේ පනත් කෙටුම්පත සම්මත කර ගත්තාට අපට කමක් නැහැ. තිබෙන අවුල වෙනුවට මේ තුළින් තව අවුලක් හදනවා නම්, ඒකට ඉතින් අපට කියන්න තිබෙන්නේ "සොරි" කියලා තමයි.

ඊළඟට, තිබෙන ප්‍රශ්නය මෙයයි. දැන් අධිභාර අභියාචන කමිටුවක් තිබෙනවා. අධිභාර අභියාචන කමිටුව පත් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මඟින්. මට තිබෙන ප්‍රශ්නය තමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඒක කරන්න පුළුවන්ද, බැරිද කියන එක. නමුත්, අද මේ පනත් කෙටුම්පත සම්මත කරනවා නම්, ඒක කරන්න පුළුවන්. ඒකට කමක් නැහැ.

මෙම පනත් කෙටුම්පතේ 21. (1) උප වගන්තියෙහි මෙසේ සඳහන් වනවා:

> "... ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත්කරනු ලැබූ විගණනය, නීතිය හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය සහ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි පළපුරුද්දක් සහිත තැනැත්තන් අතරින් සාමාජිකයන් පස්දෙනෙකුට අඩු නොවන සංඛ්‍යාවකින් කමිටුව සමන්විත විය යුතු ය."

ඒක හරි පැහැදිලියි. ඒකේ විගණනය තිබෙනවා. එතකොට අභියාචන කමිටුව, විගණන කොමිසමෙන් ස්වාධීන වනවා. ඒක හොඳයි; checks and balances තිබෙනවා. අභියාචන කමිටුව ගෙන ඒම ස්වාධීනත්වය වෙනුවෙන් කරන හොඳ දෙයක්. ඒ විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් ඒ කමිටුව පත් කරන එකත් හොඳයි. හැබැයි, විගණනය පිළිබඳව විශේෂ පුද්ගලයෙකු මේ කමිටුවේ ඉන්න ඕනෑය කියලා ඒකේ සඳහන්ව තිබෙනවා. ඒක හරි නේ? මේකේ ප්‍රධාන දේ විගණනය නේ?

මෙම පනත් කෙටුම්පතේ 21. (2) උප වගන්තියෙහි මෙසේ සඳහන් වනවා:

> "ජාතික විගණන කාර්යාලයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ කිසිදු සාමාජිකයකු කමිටුවේ සාමාජිකයකු නොවිය යුතු ය. විගණකාධිපතිවරයා කමිටුවේ සාමාජිකයකු නොවිය යුතු ය. කමිටුව, විගණකාධිපතිවරයාගෙන් ස්වාධීනව කටයුතු කළ යුතු ය."

ඒ සියල්ලම හරි. එතකොට රාජ්‍ය විගණන සේවයේ කිසිදු පුද්ගලයෙකුට මේ කමිටුවට එන්න බැහැ. විගණනය පිළිබඳ ප්‍රවීණත්වයක් තිබෙන කෙනෙකුට තමයි මේ කමිටුවට එන්න වෙන්නේ. ඒ සඳහා විගණනය පිළිබඳ ප්‍රවීණත්වයක් තිබෙන පුද්ගලයෙකු කොහෙන්ද හොයා ගන්නේ? එතකොට මේ සඳහා අනිවාර්යයෙන් පෞද්ගලික විගණකයෙකු තමයි හොයන්න වෙන්නේ. ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට විගණකයෙකු හොයන්න වනවා. එම විගණකයා රාජ්‍ය විගණන ක්‍රියාවලිය ගැන විගණන අභියාචන කමිටුවට එනවා. රාජ්‍ය විගණනයෙන් තමයි එම නිලධාරියා අභියාචන කමිටුවේ ඉන්නේ. හැබැයි, එම නිලධාරියා රාජ්‍ය විගණන සේවයේ කෙනෙකු වෙන්න බැහැ. මේක මොකක්ද කියලා මම දන්නේ නැහැ, නමුත් මේකේ පටලැවිල්ලක් තිබෙනවාය කියලා විතරක් මට තේරෙනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

විශ්‍රාමික විගණන සේවකයෙකු තමයි දැන් ඔය කමිටුවට පත්වන්නේ. අනික් කොමිෂන් සභාවලටත් එම නිලධාරින් ආවේ ඒ විධියටයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

හොඳයි. ඒක ඔබතුමන්ලා බේරා ගත යුතු දෙයක් විධියටයි මම මතු කරන්නේ. මේක මහා දෙයක් නොවෙයි. නමුත් මට තේරෙන විධියට මේ සඳහා රාජ්‍ය විගණනය ගැන විශේෂ දැනුමක් තිබෙන කෙනෙකු පත් වෙන්න ඕනෑ. ඒකයි විය යුත්තේ කියන එක තමයි මම අවධාරණය කරන්නේ.

ඊ ළඟට, තිබෙන ප්‍රශ්නය මෙයයි.

විගණන සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන මේ කටයුත්තේදී ප්‍රධාන ගණන් දීමේ නිලධාරින්ගෙන් යට නිලධාරින්ට -අමාත්‍යාංශ ලේකම්වරුන් නොවන අනෙක් නිලධාරින්ට- මේ දණ්ඩනය පැනවීමේ, එය සුදුසුද නැද්ද කියා තීරණය කිරීමේ බලය පවරන්නේ ලේකම්වරුන්ටයි. හැබැයි මේ පනත් කෙටුම්පත අනුව ලේකම්වරයකුට දණ්ඩනය දීම පවරන්නේ ජනාධිපතිතුමාටයි. ජනාධිපතිවරයා තමයි ඒ තීරණය ගන්නේ. ජනාධිපතිවරයා තමයි ලේකම්වරයකුට දණ්ඩනයක් තිබෙනවාද නැද්ද කියා තීරණය කරන්නේ. හැබැයි මේ පනත් කෙටුම්පතෙන් ලේකම්වරයාට සාධාරණයක් ඉෂ්ට කරලා නැහැ. ලේකම්වරයාට අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන් ක්‍රමවේදය මොකක්ද කියා මෙහි සඳහන් කරලා නැහැ. අධිභාර අභියාචනා කමිටුවක් තිබෙනවා. ලේකම්ගෙන් දණ්ඩනයක් පැනවෙන කෙනකුට ඒ සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි ලේකම්වරයකුට එහෙම කරන්න පුළුවන්ද? මම ලේකම්වරුන් වෙනුවෙනුත් පෙනී සිටිනවා. ලේකම්වරයාට දණ්ඩනය දෙන්නේ කවුද? ජනාධිපතියි. ලේකම්වරුන් පත් කරන්නේත් ජනාධිපතියි. ජනාධිපතිතුමා ම දණ්ඩනයක් දෙන්න තීරණය කරන කොට මොකද වෙන්නේ? එය විගණන සේවා කොමිෂන් සභාවෙන් තමයි යවන්නේ. මම එය දන්නවා. හැබැයි ජනාධිපතිවරයා විසින් පනවනු ලබන දණ්ඩනයට ලේකම්වරයකුට අභියාචනයක් ඉදිරිපත් කරන්න ඉඩ තිබෙන බව සඳහන් තැන මේ පනත් කෙටුම්පතේ තිබෙන්නේ කොහේද? එහෙම නැති වුණොත්, එය ලේකම්වරයකුට අගතියක් කිරීමක් වනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

කියන්න, ගරු අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මේ අභියාචනා ක්‍රියා දාමයෙන් අනතුරුව තමයි දණ්ඩනය තීරණය වන්නේ. ඒ දණ්ඩනය පැනවීම සාමාන්‍යයෙන් මේ ක්‍රියා පිළිවෙත අනුව සිද්ධ වනවා. ලේකම්වරයා පිළිබඳව දණ්ඩනය පැනවීම තීරණය වන්නේත් අභියාචනයෙන් පසුවයි. ලේකම්වරයා සම්බන්ධයෙන් එය ක්‍රියාත්මක කරන්නේත් ජනාධිපතිවරයායි. මොකද, ඒ, පත් කිරීමේ බලධාරියා ජනාධිපතිවරයා වන නිසා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වේ මෙයයි. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා වාක්‍ය හැටියට කිව්වාට, ලේකම්වරයාට ඒ අයිතිය තිබෙන ප්‍රතිපාදනයක් මෙහි කොතැනකවත් නැහැ. ලේකම්වරයකුට අභියාචනා ඉදිරිපත් කරන්න ප්‍රතිපාදනයක් නැහැ. අපි ඒ සම්බන්ධව සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙනවා. අපේ විජයදාස රාජපක්ෂ උගත් නීතිඥ අමාත්‍යතුමා පිළිගන්නවා නම් ලේකම්වරයකුට එවැනි අවස්ථාවක් තිබෙන්න ඕනෑ කියා, එවැන්නක් මේ පනත් කෙටුම්පතේ සඳහන්ව නැති නිසා අප ඉදිරිපත් කර තිබෙන සංශෝධනය පිළිගන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔබතුමා ඒ ගැන කියනවා නම් හොඳයි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඒ ක්‍රියා දාමයේ හැම එකක්ම අභියාචනයෙන් පසුවයි තීරණය වන්නේ. ඒ නිසා ලේකම්වරුන්ටත් ඒ අයිතිය තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

නමුත් ලේකම්වරුන්ට එය අදාළ කර නැහැ. ඒ හින්දා මා සංශෝධනයක් -වගන්තියක්- ඉදිරිපත් කර තිබෙනවා. එවැන්නක් තිබෙන්න ඕනෑ කියා ඔබතුමන්ලා පිළිගන්නවා නම්, මගේ සංශෝධනය පිළිගන්න. එච්චරයි. මොකද, මෙහි තිබෙන විධියට නම් එවැන්නක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මතු වන ප්‍රශ්නය මෙයයි. ජාතික විගණන පනත් කෙටුම්පතේ 20. (1) වන උප වගන්තිය යටතේ මෙසේ සඳහන් වනවා:

> "19 වන වගන්තිය යටතේ විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් කරන ලද තීරණයකින් අගතියට පත් යම් තැනැත්තකු විසින් අධිභාර සහතිකය ලැබුණු දින සිට එක් මාසයක් ඇතුළත එම තීරණයට එරෙහිව 21 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ අධිභාර අභියාචනා කමිටුව වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය."

හැබැයි "යම් තැනැත්තා" කියන එක සම්බන්ධයෙන් definition එකක් දීලා නැහැ. යම් තැනැත්තෙකු අභියාචනා කමිටුවට අධිභාරයක් සම්බන්ධ තීන්දුවක් දුන්නාට පසුව එය නැවත සලකා අභියාචනය වෙනස් කරනවාද, එයින් ගණන් හිලව් තීරණය කරන්නේ කොහොමද, තීරණය සංශෝධනය කරනවාද නැද්ද කියන එක තීරණය කිරීමේ බලය සම්පූර්ණයෙන්ම දෙන්නේ ගණන් දීමේ නිලධාරියාටයි.

හැබැයි ගණන් දීමේ නිලධාරියා -ලේකම්තුමා- ඒක කර නැවත වාර්තා කිරීමක් ගැන සඳහන් වන්නේ නැහැ. ඒ පිළිබඳව කාට හෝ වාර්තා කිරීමක් කෙරෙන්න ඕනෑ. එයට හේතුව මොකක්ද? විගණකාධිපතිවරයා තීරණය කරන දණ්ඩනයක් ගණන් දීමේ නිලධාරියා වෙනස් කළොත් පළමුවෙන් අගතියට පත් වන පුද්ගලයා කවුද? ඒ, විගණකාධිපතිතුමායි. විගණකාධිපතිතුමාටත් ඉඩක් තිබෙන්න ඕනෑ ඇවිත් කියන්න, "මගේ තීරණය අභියෝගයට ලක් කර තිබෙනවා. මමත් අගතියට පත් වෙලා තිබෙනවා" කියා. ඒ නිසා අපි සංශෝධනයක් ඉදිරිපත් කරනවා, අඩු තරමින් විගණන සේවා කොමිෂන් සභාවට එය වාර්තා කරන්න විගණකාධිපතිතුමාට ඉඩ දෙන්න කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තවත් දෙයක් කියන්න ඕනෑ. මා ළඟ තිබෙනවා, චක්‍ර ලේඛයක්. මම එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා සභාගත කරන්න බලාපොරොත්තු වනවා. දැන් ඔබතුමන්ලා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හැටියට ලේකම්තුමන්ලාට නේ මේ බලය -අධිභාර ක්‍රියාත්මක කිරීමේ බලය- පවරා තිබෙන්නේ. අද නොවෙයි, 1993.07.21 පාස්කරලිංගම් මහතා භාණ්ඩාගාර ලේකම් හැටියට චක්‍ර ලේඛයක් -භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපි අංක මුදල් 320- නිකුත් කර තිබෙනවා, "රාජ්‍ය නිලධාරීන් මත අධිභාර පැනවීම" කියන ශීර්ෂය යටතේ. ලේකම්වරුන්ට තමයි බලය පවරා තිබෙන්නේ. 1993 ඉඳලා අද වන කල් ලේකම්වරුන් අධිභාරයක් පනවා තිබෙන්නේ කාටද? ඒ සඳහා ලේකම්වරුන්ට බලය දී තිබෙනවා, 1993 වර්ෂයේ ඉඳලා. ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය අමාත්‍යතුමනි, නමුත් කවුරුවත් අධිභාරයක් පනවා නැහැ. මෙන්න චක්‍ර ලේඛය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මෙම ලේඛනය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

එහෙම නම්, මෙය ක්‍රියාත්මක කරන්නම හිතාගෙන කරපු දෙයක් නොවෙයි. ලේකම්වරුන්ට ඒ බලය -අධිභාර පැනවීමේ බලය- දුන්නා කිව්වත්, ඒ බලය 1993 වර්ෂයේ ඉඳලා ලේකම්වරුන්ට තිබුණා.

නමුත් ක්‍රියාත්මකවෙලා නැහැ. මේ කරන්නේ මොකක්ද? මේක ලේකම්වරයාට පටවනවා. හැබැයි, නැවත විගණන කොමිසමට වාර්තා කරන්නවත් ක්‍රියාවලියක් හදලා නැහැ. හරි නම්, ලේකම්තුමා මේක ක්‍රියාත්මක කරනකොට අධිභාර, අභියාචනා කමිටුවෙන් ප්‍රතික්ෂේප වෙනවා නම්, දණ්ඩනය වෙනස් වෙනවා නම් ලේකම්තුමා ඒක වාර්තාගත කරන්න ඕනෑ. ලේකම්තුමා විගණන කොමිසමට දැනුම් දෙන්න ඕනෑ, "ඔයගොල්ලෝ ගත්ත තීරණය වැරැදියි, නැත්නම් ඒක අභියාචනා කමිටුවෙන් වෙනස් වුණා, මෙන්න අලුත් තීරණය" කියලා. ඒක එතැනින්ම ඉවර කරනවා. 1993 ඉඳන් ලේකම්තුමන්ලා මේක ක්‍රියාත්මක කර නැත්නම් අලුතින් ක්‍රියාත්මක කරාවිය කියලා පෙනෙන්නේ නැහැ.

අනෙක් කාරණාව මේකයි. විගණන කොමිසම මේ පරීක්ෂණය කරනවාය කියලා විගණකාධිපතිතුමාත්, ඒ කමිටුවත් අතර conflict of interest එකක් ඇති වන්නේ නැහැ. ලේකම්වරු

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සම්බන්ධයෙන් ඕනෑ නම්; ලේකම්වරුන්ට අධිහාරයක් පැනවීම සම්බන්ධයෙන් ඕනෑ නම් විගණන කොමිසමෙන් වෙනත් නිලධාරින් පත් කරන්න පුළුවන්. මේ විගණන කොමිසමේ විනිශ්චයකාරතුමෙක් -මහෙස්ත්‍රාත්වරයෙක්- ඉන්නවා. ඒ විනිශ්චයකාරතුමාගෙන් වෙනම කමිටුවක් පත් කරන්න පුළුවන්. ඒ නිසා ලේකම්වරු සම්බන්ධ අධිහාරයක කාරණාවක් ආවොත් ජනාධිපතිවරයා අතට යවන්න එපා. ඒක විගණන කොමිසමේ කමිටුවකට යොමු කරන්න. ඒ කොමිසමේ මහෙස්ත්‍රාත්වරයෙක් ඉන්නවා. අධිකරණ ක්‍රියාවලියකට තරම් වටිනා කෙනෙක්. ඔහුගෙන් පත් කරන්න. එතැනින් විගණකාධිපතිතුමා අයින් කරන්න. කමක් නැහැ. ඇයි, විගණකාධිපතිතුමාගේ විගණනයකින් වරදකරුවෙක් වන කෙනකුට විගණකාධිපතිතුමාම ඉන්න කමිටුවකින් දණ්ඩනයක් පනවන එක සාධාරණ නැහැ. ඒ නිසා අපි ළඟැදියාවකින් එතැන ගැටුම ඉවත් කරමු. ඒ සඳහා අපි යෝජනාවක් කරනවා, ලේකම්වරයෙක් සම්බන්ධයෙන් අධිහාරයකදී විගණකාධිපතිතුමා ඉවත් කළ කමිටුවකින් ඒක කරන්න කියලා. එහෙම කළොත් මේ විගණන පනතට පණ එනවා; ශක්තිය එනවා. ඒකට කමක් නැහැ. මේ තිබෙන්නේ විගණන කොමිසමක්. මෙකෙන් කර තිබෙන්නේ "අපි ජාතික විගණන පනතක් හැදුවා; මෙන්න පනත තිබෙනවා; අපි ඒකත් කළා"ය කියලා පෙන්වන්න හදන එක නම්, සේනක බිබිලේ ප්‍රතිපත්තියට වුණ දේම තමයි, මේ ජාතික විගණන පනතටත් වෙන්නේ. ඒක නම් සහසුද්දෙන්ම ඇත්ත.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවත් කාරණා ගණනාවක් කියන්න තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. සංශෝධන 16ක් මේකට ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම ඔබතුමන්ලා බොහොම වැරැදි වැඩක් කර තිබෙනවා. මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනාවාට පස්සේ, ඒක ආංශික අධීක්ෂණ කාරක සභාවටත් ගියාට පස්සේ, කැබිනට් මණ්ඩලය නැවත රැස්වෙලා විගණකාධිපතිවරයාගේ බලය නැවත ශුද්ධ කර තිබෙනවා. ඒ මොකක්ද? අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් විගණකාධිපතිතුමාට නිර්දේශ, විධානයන් දෙන්න පුළුවන් බලය ඔබතුමන්ලා අද මේ සංශෝධනවලින් ඉවත් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලා විගණන කමිටු තියෙන්න ඕනෑ නැහැයි කියලා සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙනවා. මම දන්නේ නැහැ, මෙවා කොහොම කරනවාද කියලා. කළමනාකරණ හා විගණන කමිටුව හැම ආයතනයකම තියෙන්න ඕනෑ කියලා අපි කෝප් කමිටුවේදී ගොඩක් කථා කරනවා. ඒ ගැන ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමා දන්නවා. හැබැයි, ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? නීතියකින් රජයට පවරා ගත් ආයතනවල කළමනාකරණ හා විගණන කමිටුව තියෙන්න ඕනෑ නැහැයි කියලා සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙනවා.

ඊළඟට මේ පනත් කෙටුම්පතේ කියා තිබෙනවා, අභ්‍යන්තර විගණකවරුන්ගේ වාර්තා විගණකාධිපතිතුමාට ඉදිරිපත් කරන්න කියලා. ඒක හොඳ දෙයක්. අභ්‍යන්තර විගණනය සම්බන්ධ වාර්තා විගණකාධිපති දෙපාර්තමේන්තුවට එවන්න ඕනෑ කියලා තිබුණා. ඔබතුමන්ලා ඒක අයින් කරලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට දැම්මාට පසුවත්, අලුතින් කැබිනට් සංශෝධන එනවා . අද උදේ කියනවා, ලක්ෂයේ දඩය 5000ට අඩු කරන්න, අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිවරයාට එවන එක නතර කරන්න, විගණකවරුන්ට නිර්දේශ, විධානයන් නිකුත් කරන එක විගණකාධිපතිවරයාගෙන් අයින් කරන්න.

ඊළඟට, රජයට පවරා ගත් ආයතන ගැන කියනවා. දැන් ඒවා රජයේ ආයතන. හිඟුරාන සීනි සමාගම රජයට පවරා ගත්තාට පස්සේ, ඒක රජයේ නොවෙයි නම් වෙන කාගේද? රජයට පවරා ගත් ආයතනවලට විගණන කළමනාකරණ කමිටු ඕනෑ නැහැයි කියනවා. ඇයි, මෙහෙම කරන්නේ? තියෙන එකත් නැති කරනවා නේ. එහෙම කියලා බෝඩ් එක දමනවා, "ඔන්න ජාතික විගණන පනත ගෙනාවා, ඒක ක්‍රියාත්මක කරනවා"ය කියලා. මේ ගෙනැල්ලා තිබෙන්නේ ජාතික විගණන පනත් කෙටුම්පත නොවෙයි, ලේකම්වරුන්ගේ පනත් කෙටුම්පත. ලේකම්වරුන්ගේ පනත් කෙටුම්පත ගෙනැල්ලා ජාතික විගණන පනත් කෙටුම්පත ගෙනාවා කියනවා. ඒ නිසා ඔබතුමන්ලා සාධාරණ වෙන්න. ඔබතුමන්ලා ඉතිහාසයට තවත් දෙයක් එකතු කරන්න එපා. මෙය විසින් ඉතිහාසයට ලොකු කළු පැල්ලමක් ඇති කරනවා. ඒ නිසා කරුණාකරලා, අපි සාධාරණව, යුක්ති සහගත ලෙස ඉදිරිපත් කරන සංශෝධනවලින් මේ පනතට ලේ දෙන්න; ධෛර්යය දෙන්න; පණ දෙන්න. පණ දීලා මේ පනත් කෙටුම්පත සම්මත කරන්න කියලා මේ ගරු සභාවේ සිටින සියලුම මහජන නියෝජිතයින්ගෙන් බොහොම බැගෑපත්ව, කාරුණිකව ඉල්ලා සිටිමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.12.21]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කර තිබෙන ජාතික විගණන පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට සහභාගි වීමට මටත් අවස්ථාව ලබා දීම ගැන සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා.

මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මුදල් පාලනය පාර්ලිමේන්තුවට භාර දීලා තිබෙනවා. රටේ ජනතාව නියෝජනය කරන මහ ජන නියෝජිතයින්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවට ඒ බලතල භාර දී තිබෙන්නේ, තමන් ගෙවන බදු මුදල්, ඒ වාගේම මේ රටට එන ආදායම් වියදම් වෙන්නේ කොහොමද, ඒවා ජනතා සේවයට කැප කරන්නේ කොහොමද කියා දැනගැනීමේ අයිතිය ජනතාවට තහවුරු කිරීමටයි. මේ රටේ විශාල මුදලක් රාජ්‍ය සේවය හරහා පරිහරණය වෙනවා. සංවර්ධන වැඩ කටයුතු, මහ ජන සේවාවන් ඇතුළු සේවාවන් රාශියක් මේ රාජ්‍ය සේවාව තුළින්, රජය තුළින් සිද්ධ වන නිසා වංචාව හා දූෂණය, ඒ වාගේම මුදල් නාස්තිය වැනි දේවල් අපේ රටේ ඉතිහාසය පුරාම අපට අහන්න සිද්ධ වෙලා තිබෙනවා. කාර්යක්ෂම රාජ්‍ය සේවයක් හරහා ජනතාවට සේවය කිරීම, ඒ වාගේම අපේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යෑම වැනි ඉතාම භාරදූර කාර්යයන් කරන අවස්ථාවේදී, ජාතික විගණන පනත් කෙටුම්පත මඟින් මුදල් නාස්තියකින් තොරව, මුදල් වංචාවකින් තොරව ඒවා නිසියාකාරයෙන් සිදු කිරීම සඳහා අපි ප්‍රවේශයක් අරගෙන තිබෙනවා.

අද මෙම විවාදයේදී අපට අහන්නට ලැබුණා, ජාතික විගණන පනත් කෙටුම්පත යෝජනා කර තිබුණේ 2003 වසරේ බවට. එදා සිට අද වන තුරු කොපමණ කාලයක් ගිහිල්ලාද මේ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ? ඒ කාල සීමාවෙන්ම අපට බලාගන්න පුළුවන්, ඇත්තටම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට ක්‍රියා කර තිබෙන්නේ කවුද කියලා.

මේ පනත් කෙටුම්පතේ යම් යම් අඩු පාඩු ගැන මට පෙර කථා කළ ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. අපි ජනතා විමුක්ති පෙරමුණට කියා සිටිනවා, 2020දී මේ රටට එන්න

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

ඉන්නේ කවුද කියලා හොඳට හිතන්න කියලා. එක පැත්තකින්, මේ රටට එන්න ඉන්නේ හිට්ලර් කෙනෙක්. මේ රටට හිට්ලර් ආවාම, ජාතික විගණන පනතෙන් හිට්ලර්ට වැඩක් තිබෙනවාද? මේ රටේ මූල්‍ය පාලනය කරන්න හිට්ලර් ජාතික විගණන පනත පාවිච්චි කරයිද? මේ පාර්ලිමේන්තුව කියන ආකාරයට හිට්ලර් තමන්ගේ වැඩ කටයුතු කරයිද කියලා අපි ජනතා විමුක්ති පෙරමුණෙන් අහනවා. [බාධා කිරීමක්] නැහැ, මම දන්නවා. ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමනි, අපි, ඔබතුමන්ලා ඒක ගෙනාවේ නැහැ. නමුත් ඒ අවදානම තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ අවදානම ගන්න එපා.

එදා හිට්ලර් ජර්මනිය දියුණු කළාය කියා සමහර අන්තවාදී කල්ලි අද හිතාගෙන ඉන්නවා. නමුත් හිට්ලර් කළේ මුළුමනින්ම ජර්මනියේ තිබුණු ආර්ථිකය, ජර්මනියේ තිබුණු සමාජය විනාශ කරලා, විශේෂයෙන්ම තරුණ ජීවිත බිල්ලට දීලා අවසානයේ දිවි නසාගැනීමයි. සමහර ඇමෙරිකන් යුද හමුදා කඳවුරු අද වන විටත් ජර්මනියේ තිබෙනවා. බොහෝ කාලයක් යන කල් රුසියාවේ කඳවුරු ජර්මනියේ තිබුණා. ජර්මනිය මුළුමනින්ම ස්වාධීන රාජ්‍යයක් හැටියට දශක ගණනාවක් ක්‍රියාත්මක කරන්න බැරි තැනට තල්ලු කර තමයි එදා හිට්ලර් දිවි නසාගත්තේ. මේ රටටත් 2020දී හිට්ලර්ලා ඕනෑය කියන අයට අපි කියනවා, ඒ තැනට අපව තල්ලු කරන්න ආවොත්, මරා ගෙන මැරෙන සටනක් තමයි 2020දී අපි කරන්නේ කියා. මේ රටට 1948දී සුද්දාගෙන් ගත්ත නිදහස නැවත කාටවත් පූජා කරන්නට අපි ලැහැස්ති නැහැ කියා මේ අවස්ථාවේදී මතක් කරනවා.

කවුරු මොනවා කිව්වත්, දූෂණ මර්දන ක්‍රියාවලිය අද අපි ආරම්භ කර තිබෙන බව විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ. අද දූෂණ හඳුනා ගෙන තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් පරීක්ෂණ කරගෙන යනවා. අද වන විට අපේ අධිකරණවල තිබෙන ප්‍රමාද දෝෂයන් නිවැරදි කරගන්නට අවශ්‍ය පනත් සම්මත කරගෙන, ඒවා කඩිනම් කරලා, ඒ කරුණු-කාරණා ඉදිරියට කරගෙන යන කොට හොරකම් කරපු සමහර අයම අහනවා, "අද මොනවාද වෙලා තිබෙන්නේ?" කියලා. එදා මේ රටේ හම්බන්තොට වරාය වැනි දේවල් හැදුවා. හම්බන්තොට වරාය හදලා, මේ රටට විශාල ණයක් ඉතුරු කරලා, හම්බන්තොට වරායට නැව් එන්නේ නැති තත්ත්වයට පත් කරන්න එදා ක්‍රියා කළ නායකයා ඇතුළු රජයට එදා තිබුණු විගණනයෙන් මොනවාද වුණේ කියලා අපට අහන්න සිදු වෙනවා. එදා අපට විගණන දෙපාර්තමේන්තුවත් තිබුණා. දැන් "The New York Times" පුවත්පත වාර්තා කරලා තිබෙනවා, China Harbour සමාගම එදා හිටපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ඡන්ද ව්‍යාපාරයට ඩොලර් මිලියන කෝටි ගණනක් දීලා කියලා. කොහොමද ඒ වැඩ කටයුතු කළේ? පරිසර අධ්‍යයනයකින් තොරව, එතැනට නැව් එන්න පුළුවන්ද කියලා බලන්නේ නැතුව විශාල මුදල් කන්දරාවක් චීනයට ණය වෙලා තමයි ඒ වැඩ කටයුතු කළේ. ඒ එක්කම මත්තල ගුවන් තොටුපොළ හැදුවා. එක ගුවන් සමාගමයි එතැනට ආවේ. ඒ තමයි flydubai ගුවන් සමාගම. නමුත් ඒ අයත් කිව්වා, ජනතාව එන්නේ නැහැ, සංචාරකයන් එන්නේ නැහැ, හැම වෙලාවේම කුරුල්ලෝ planeවල හැප්පෙනවා, ඒ නිසා අපිත් මත්තල ගුවන් තොටුපොළට එන්නේ නැහැ කියලා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ඔව්. ඒවා කියනකොට ටිකක්-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉන්දියාව ඒක ගත්තාම කුරුල්ලෝ හැප්පෙන එක නතර වෙනවාද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
It is not a point of Order.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
එතුමා දැන් ඉන්දියාව ගැන කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මත්තල ගුවන් තොටුපොළ එතැන හදන්න එපා කියද්දී, ජනතාවගේ විශාල විරෝධය මැද එදා හිට්ලර් කෙනෙක් වාගේ කාටවත් ඇහුම්කන් දෙන්නේ නැතුව ජනතාව මුළා කරලා, ඒ ජනතා හඬ යටපත් කරලා, ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා අද වන විට ජනතාවට ඒ ණය බර දීලා තිබෙනවා. එදා අපි කිව්වා, නොරොච්චෝලේ බලාගාරය හදන්න එපා, පාරිසරික ප්‍රශ්න ඇති වෙනවා කියලා. එදා ජනතාව මර්දනය කරලා නොරොච්චෝලේ බලාගාරය හැදුවා. අද වන විට එතැන අළු කන්දක් ඇති කරලා තිබෙනවා. ඒ ව්‍යාපෘති තුළින් අදටත් ජනතාව පීඩා විඳිනවා; ජනතාවට අදටත් ඒ ණය ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. නමුත් මෙතුමා දැන් මෙතැනට ඇවිල්ලා ඉන්දියාව ගැන කථා කරනවා. එතුමා මෙතැනට ඇවිල්ලා කථා කරන්න ඕනෑ පාස්පෝට් එක ගැන; ඒ පාස්පෝට් එක ගත්තේ කොහොමද කියලා. නමුත් ඒ ගැන කථා නොකර ඉන්දියාව ගැන කථා කරලා මේ රටේ ජනතාව නොමඟ යවන්න හදනවා.

2020 වසරේදී මේ රටට හිට්ලර් කෙනෙක් ඕනෑ නැහැ කියලා අපි කියනවා. මේ රටේ යම් කිසි ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙනවා නම් ඒක ශක්තිමත් කිරීම තමයි 2020 වසරේදී කරන්න ඕනෑ. හිට්ලර් කෙනෙක්, නැත්නම් ප්‍රභාකරන් කෙනෙක් නැවතත් මේ රට භාර ගෙන මේ රට සුරපුරයක් කරයි කියලා කවුරු හරි හිතනවා නම් ඒ ගොල්ලන් ඉතාම වැරදි සහගත මතයක තමයි ඉන්නේ.

ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අපි මේ රටේ වංචාව හා දූෂණය පිටු දැකීම සඳහා තවත් පියවරක් අරගෙන තිබෙනවා. මේ නීතිය ගෙනාවාය කියලා මේ රටේ අනෙකුත් නීති අහෝසි වෙන්නේ නැහැ, මේ තුළින් ඒවා තවත් ශක්තිමත් වෙනවා මිස. විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ශක්තිමත් කරලා, මූල්‍ය පාලනය, මූල්‍ය වගවීම ස්ථාපිත කරන්න ඕනෑ. ඒ වාගේම රාජ්‍ය දේපළවලට පාඩු සිදු කරන පුද්ගලයන්ට පුද්ගලිකව ඒ වගකීම පැවරීම මේ පනත තුළින් සිද්ධ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
අපි 2015 ජනවාරි 08 වන දා දුන් පොරොන්දු ඉෂ්ට කරලා ක්‍රියාත්මක කළ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ

පනත, ස්වාධීන කොමිෂන් සභා වැනි දේවල්වලට මෙම ජාතික විගණන පනතත් එකතු කරලා, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරගෙන ඉදිරියට ගෙන යන බව ප්‍රකාශ කරමින් මාගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 12.31]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ තරම් ප්‍රමාද වී නමුත් ජාතික විගණන පනත් කෙටුම්පත සම්මත කර ගන්න අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සතුටට කරුණක්.

මෙම ප්‍රමාදයට හේතුව වශයෙන් විචාරකයන් සඳහන් කරන්නේ, කොන්ත්‍රාත්කරුවන්, දේශපාලනඥයන් සහ රජයේ නිලධාරින් මෙය ප්‍රමාද කිරීමට හේතු වන ලෙස කරුණු ඉදිරිපත් කළාය කියන එකයි. එය ජනමාධ්‍යවලත් වාර්තා කර තිබුණා. අධිභාරය පැනවීමේ ප්‍රශ්නය තමයි මෙහි ප්‍රධානම කේන්ද්‍රීය ප්‍රශ්නය වුණේ. මේ ආරවුලට, මේ පනත් කෙටුම්පත ප්‍රමාද වීමට, මේ පනත් කෙටුම්පත කල් දැමීමට හේතු වීමේ කාරණාව වුණේ අධිභාරයයි. මේ අධිභාරය පනවන්නේ යම් වරදකට වගකිව යුතු නිලධාරියාටයි. වරදට හසු වන මේ නිලධාරින් -හැම නිලධාරියාම නොවෙයි- බොහෝ විට කොන්ත්‍රාත්කරුවන් සමඟ එකතු වෙලා, දේශපාලනඥයන් සමඟ එකතු වෙලා රජයේ සම්පත් සාවද්‍ය පරිහරණය, රජයේ සම්පත් අවභාවිත කරනවා. එහෙම කළාම, එයට වගකිව යුත්තාට, ඒ පාඩුව සිදු කළ තැනැත්තාට අධිභාරයක් පැනවීමේ අයිතිය, වගකීම, ඒ පිළිබඳ බලය යන මේ කාරණා ගැන, ඒ නිලධාරින්ගේ පැත්තෙන්, ඒ නිලධාරින් සමඟ එක් වුණු කොන්ත්‍රාත්කරුවන්ගේ පැත්තෙන්, ඔවුන්ට අනුබල දෙන දේශපාලනඥයන්ගේ පැත්තෙන් දිගටම බලපෑමක් ආපු බව අපි දන්නවා. අන්තිමට, මේ අධිභාරය පැනවීම පිළිබඳ කාරණය ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට තීන්දු වෙලා තිබෙනවා. ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ඒ කටයුත්ත කළාට පස්සේ, ඒකට ලොකු කාර්ය ක්‍රමයක් තිබෙනවා.

මේ අධිභාර අය කර ගැනීමට කොමිසමකට දමලා, ඒ කොමිසම උසාවියට ගිහින්, උසාවියේ තීරණයකින් පසුව ඇපෑලකට ගිහින්, ඒ ඇපෑලෙන් පසුව තමයි මේ අධිභාරය පිළිබඳ කාරණය තීන්දු වෙන්නේ. මේක දිග ක්‍රියාවලියක්. ඇත්තටම රජයේ සම්පත් අවභාවිත කරන, රජයේ සම්පත් ගසා කන මේ නිලධාරින් යම් ආකාරයකට මේ නීතියට යටත් කර ගන්න නම්, මේ නිලධාරින්ගේ සාවද්‍ය පරිහරණය ගැන, අවභාවිතය ගැන තීන්දු තීරණ අරගෙන පොදු දේපළ පනත යටතේ ක්‍රියා කිරීමට හා මහෙස්ත්‍රාත් උසාවියේ ලඝු නඩු විභාගයකින් මේ කටයුතු ඉවර කරන්න පුළුවන් වෙන්න ඕනෑ. මේ අධිභාරය තිබෙන්න ඕනෑ. කාර්ය දෝෂ උඩ වැරදි ගෙවීමක් කරලා තිබෙන්න පුළුවන්. අන්න ඒක අධිභාරයට අයිති වැඩක්. ගෙවීමක් නොකළ යුතු තැනක වැරදි ගෙවීමක් කරලා තිබෙනවා නම්, විශේෂ උපකාරයක් වශයෙන් යම් ගෙවීමක්, වියදමක් කරලා තිබෙනවා නම්, යම් ආදායමක් එකතු කිරීම ප්‍රමාද කරලා තිබෙනවා නම් ඒවාට අධිභාරය දමන්න පුළුවන්. නමුත් ඉතා පැහැදිලිව සාවද්‍ය පරිහරණයක්, මහජන දේපළ ගසා කෑමක්, එහෙම නැත්නම් වංචනික ක්‍රියාවක් කරපු බවක් අපට තහවුරු වෙනවා නම්, අධිභාර දම දමා ඉන්න එකේ තේරුම කුමක්ද කියලා මම අහන්න කැමතියි. එහෙම නම් මේ කරුණු වෙන්ව දැක්වීමක් තිබෙන්න ඕනෑ. අධිභාර දමන්න ඕනෑ මෙන්න මේ වාගේ ඒවාටයි. සාවද්‍ය පරිහරණය, පොදු දේපළ ගසා කෑම යන දේවල් සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් උසාවියේ ලඝු නඩු විභාගයකින් තීන්දුවක් දීලා ඉවර වෙන්න ඕනෑ. අය කර ගැනීමේ පැත්තේ කථාව තමයි මේ පනත් කෙටුම්පතේ වැඩිය තිබෙන්නේ. අය කර ගැනීමේ කථාවට අනුව අන්තිමට කරන්න තිබෙන්නේ, ඒ කොමිසම උසාවියට ගිහින්, "මේ මිනිහා ගෙවන්නේ නැහැ. අපට ඒ මුදල අය කරලා දෙන්න" කියලා ඉල්ලන එකයි. එතකොට උසාවිය ඒ මුදල දඩයක් හැටියට අය කරලා දෙනවා. ඒ ක්‍රියාදාමය අධිභාරය සම්බන්ධයෙන් එහෙම වුණාවේ. නමුත් සාවද්‍ය පරිහරණය හා වංචාව පිළිබඳව වෙනත් කාර්ය ක්‍රමයක් තිබීම අවශ්‍යයි. නමුත් එහෙම ක්‍රමයක් මේ පනතේ නැහැ. අපේ විගණකාධිපතිවරයා හෝ ඔහුගේ නිලධාරින් කරගෙන යන පරීක්ෂණවලදී නීතිය උල්ලංඝනය වීමක් සිදු වෙලා තිබෙනවා, අපරාධයක් සිදු කරලා තිබෙනවා, වංචාවක් කරලා තිබෙනවා, පොදු දේපළ පැහැර ගැනීමක් සිදු වෙලා තිබෙනවා කියලා පෙනී යනවා නම්, එබඳු වංචනික අවස්ථාවක් දුටු සැණින් -විගණනය අවසන් වන තෙක් ඉන්න ඕනෑ නැහැ- එය නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශවලට යොමු කිරීමේ වගකීමක් ඔවුන්ට පැවරෙන්න ඕනෑ.

අපරාධයක් නම්, එය පොලීසියට යොමු කරන්න. විගණනය කරගෙන යන විට තමයි ඒ බව පෙනී යන්නේ. එතකොට පොලීසියට පුළුවන් ඒ ගැන සොයා බලලා, එහි ඇත්ත නැත්ත හොයලා, අපරාධයක් සිදු වෙලා තිබෙනවා නම් ඒ අපරාධය සම්බන්ධයෙන් නීතිය අනුව ක්‍රියා කරන්න. එහෙම නැතුව, විගණනය අවසන් වන තෙක් ඉන්න ඕනෑ නැහැ. එය මේ රටේ සාමාන්‍ය මිනිහෙකුටත් තිබෙන වග කීමක්. අපරාධයක් සිදු වනවා දැක්කා නම්, අපරාධයක් සිදු වන බවට තමන්ට තොරතුරක් තිබෙනවා නම්, එය නීතිය ක්‍රියාත්මක කරන අංශවලට දැන්වීමේ වග කීමක් හැම පුරවැසියෙකුටම තිබෙනවා. විගණනය කරගෙන යන අතරතුර විගණකාධිපතිවරයාට හා ඔහුගේ නිලධාරින්ට එබඳු දෙයක් දැක ගන්නට පුළුවන් වුණොත්, ඒ කාරණය වහාම නීතිය ක්‍රියාත්මක කරන අංශවලට යොමු කරන්නට ඔවුන්ට වග කීමක් හා බැඳීමක් තිබෙන හැටියට මෙහි නීතිය හැදිය යුතුයි කියන එකයි අපි කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බැඳුම්කර මගඩිය හෙළිදරවු කර ගැනීමට අපේ මේ විගණකාධිපතිවරයාගෙන් ලැබුණා වූ දායකත්වය අපි මේ අවස්ථාවේ දී අගය කළ යුතුයි. බොහොම ඍජු ගුණයෙන් යුක්ත, අපක්ෂපාතීව ක්‍රියා කරන, භයගැන්වීම්වලට යටත් නොවන පුද්ගලයකු හැටියට එතුමාට මා ප්‍රශංසා කරන්න කැමැතියි. එතුමා COPE එකට ඇවිල්ලා සාක්ෂි ඉදිරිපත් කළා. එතුමාගේ විගණනයෙන් ඔප්පු වෙලා තිබෙනවා, රජයේ මුදල් වන මහජන මුදලින් රුපියල් බිලියන 26කට ක්ෂණිකව හානි සිදුවෙලා තිබෙනවා කියලා. COPE එකේ සිටිය UNP එකේ මන්ත්‍රීවරු බොහොම උත්සාහ කළා, කිසිම අලාභයක් නොවුණු බව පෙන්වන්න. ඒ වෙනුවෙන් පොත් ලිව්වා. දැන් පොත් පුච්චන්න වෙලා තිබෙන්නේ. එය ක්ෂණික අලාභයක්. තව අවුරුදු 30ක් යනකොට ඒක බිලියන 140ක අලාභයක් වෙන්නත් පුළුවන් බව පෙනී යමින් තිබෙනවා.

ඊයේ අගමැතිතුමා තමන්ගේ සහයන්ගේ වැරැදි වහන්නත්, වැරැදිවලට සුදු හුනු ගාන්නත් පොඩි උත්සාහයක් ගත්තා. පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම විසින් කරපු ඒ ගනුදෙනුව නිසා සේවක අර්ථසාධක අරමුදල්වලට, UGC අරමුදල්වලට හා මහපොළ අරමුදල්වලට ලොකු අලාභයක් සිදුවෙලා තිබෙනවා. ඒකට ඉතින් UGC එකේ අයත් අල්ලා ගන්න ඕනෑ. ඒ වාගේම අල්ල ගන්න ඕනෑ, සේවක අර්ථසාධක අරමුදලේ අයත්. ඔවුන්ගේත් අනුමැතිය ඇතිව තමයි ඒ ගනුදෙනුව කෙරුණේ. ඒ ගනුදෙනුවෙන් පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම ලොකු ලාභයක් ලබා ගත්තා. ඒ ගොල්ලෝ ඒක කළේ, හරක් වාගේ නොවෙයි. හොඳ මොළකාරයන් හැටියට තමයි පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම එක්ක එකතු වෙලා එම ගනුදෙනුවෙන් ලොකු ලාභයක් එම සමාගමට දුන්නේ. එතකොට අපේ අගමැතිතුමා කියනවා, "ඒකෙන්

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

අලාභයක් වෙලා නැහැ, අයුතු ලාභයක් ලබාගෙන තිබෙනවා" කියලා. ඒ තමයි කියන කථාව. අයුතු ලාභයක් ලබාගෙන තිබෙනවා කියන කථාව කිව්වේ, විජයදාස රාජපක්ෂ ඇමතිතුමා. එතුමා, අගමැතිතුමාගේ කථාව අතරතුර නැඟිටලා කිව්වා, "අයුතු ලාභයක් ලබාගෙන තිබෙනවා. අපට අයුතු අලාභයක් සිදුවෙලා තිබෙනවා. අපි ඒ ගැන නඩු පවරාගෙන යනවා" කියලා. ඒ කියන්නේ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. ඒත් අගමැතිතුමා කියනවා, "නැහැ, එහෙම අලාභයක් සිදුවෙලා නැහැ. අයුතු ලාභයක් ගැනීමක් විතරයි සිදුවෙලා තිබෙන්නේ" කියලා.

අර්ජුන මහේන්ද්‍රන් පිළිබඳව අගමැතිතුමා මේ ගරු සභාවේ බොහෝ දේවල් කිව්වා. අර්ජුන මහේන්ද්‍රන් කියන්නේ අද අපේ රටේ උසාවිය මඟ හැර සිටින වරෙන්තුකාරයෙක්. මේ වරෙන්තුකාරයා වෙනුවෙන් අගමැතිතුමා කොච්චර සහතික දීලා තිබෙනවාද? අගමැතිතුමා පසුගිය හැන්සාඩ් වාර්තා අරගෙන බැලුවොත්, තමන්ගේ අගමැති ධුරයෙන් ඉල්ලා අස් වෙලා යන්න ඒකම ඇති.

අර්ජුන මහේන්ද්‍රන් -මේ වරෙන්තුකාරයා- මේ රටට ගෙන්වා ගැනීම සම්බන්ධව සිංගප්පූරු රජයට මේ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරලා තිබෙනවාද? "මේ පුද්ගලයා අපරාධකාරයෙක්; තමුන්නාන්සේලාගේ පුරවැසියෙක්. ඔහු අපේ රටේ උසාවිය මග හැර ඉන්නවා. ඔහුට වරෙන්තු නිකුත් කරලා තිබෙනවා. ඔහුව මෙහේ එවන්න" කියලා සිංගප්පූරු රජයෙන් ඉල්ලීමක් කළාද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳමයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එහෙම ඉල්ලීමක් කරලා නැහැ. අද වෙනකම් එහෙම ඉල්ලීමක් කරලා නැහැ. ඇයි, එහෙම කළේ නැත්තේ? එහෙම කළේ නැත්තේ මේ හාදයාට වසංවෙලා සිංගප්පූරුවේ සිටීමට අනුබල දීම මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන නිසායි; අගමැතිගේ වුවමනාව වෙලා තිබෙන නිසායි. ජනාධිපතිතුමා ඒකට අනුකූලත්වය දක්වනවාද, නැද්ද කියලා මම දන්නේ නැහැ. ජනාධිපතිතුමාට පුළුවන්, මේ පිළිබඳව රාජ්‍ය තාන්ත්‍රික පියවරක් ගන්න. රටේ මහජන මුදල් ගසා කාපු මේ සිද්ධිය, ලංකාවේ මේ තාක් කාලයකට නොවූ විරූ විශාලතම මහජන මුදල් ගසා කෑම හැටියට වාර්තා වෙලා තිබෙනවා.

මේ විගණකාධිපතිතුමා කෝප් එකට ආපු වෙලාවේ, හරියට අපරාධකාරයෙකුගෙන් හරස් ප්‍රශ්න අහනවා වාගේ තමයි යූඇන්පී මන්ත්‍රීවරුන් එදා හරස් ප්‍රශ්න ඇසුවේ. ඊට අමතරව අගමැතිතුමා ඇතුළු රාජ්‍ය නායකයන් විගණකාධිපතිතුමාව කැඳවා එක්තරා විධියකට බලපෑම් කළා. හරි විධියට බලනවා නම්, විගණකාධිපතිතුමාගේ රාජකාරිවලට අයුතු හෝ කිසියම්ම වූ හෝ බලපෑමක් යම් කෙනෙක් කළා නම්, ඒ බලපෑම් කරපු උදවියට විරුද්ධව නීතිය අනුව කටයුතු කළ හැකියි; ඒ අයට විරුද්ධව අපරාධ උසාවියේ නඩු දැමිය හැකියි.

අගමැතිතුමා ගැනයි මා කථා කරගෙන යන්නේ. අගමැතිතුමා ශ්‍රී ලංකා මහ බැංකු මගඩියේ සැකකරුවකු හා වින්තිකරුවකු හැටියට අපි දැනටම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි කර තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම මේ ගැන කරපු කෙහුරක් නැහැ. "මේ හේතු නිසා මේ ගැන පියවරක් ගන්නේ නැහැ"යි කියලාවත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම අපට දන්වා නැහැ. මේ පනත් කෙටුම්පතේ හැම තැනම තිබෙනවා, යම් යම් තීරණවලට එළඹුණේ ඇයි කියලා ගණන් දීමේ නිලධාරි හේතු දක්වන්න ඕනෑය කියලා. ඊළඟට ගණන් දීමේ නිලධාරියාගේ අභියාචනා -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මා අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අධිභාර අභියාචනා කමිටුව ගැන මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙනවා. ඊට පසු අධිකරණය මඟින් මුදල් අය කර ගැනීම පිළිබඳව මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙනවා. මේ ක්‍රියාදාමයට අතිරේකව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මේ සියලුම වාර්තා විමර්ශනය කරන බව මා නැවතත් කියනවා. මෙතැන සාවද්‍ය පරිහරණයක් තිබෙනවාය කියලා එවැනි අවස්ථාවලදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නිර්දේශ කරනවා නම්, COPE එක නිර්දේශ කරනවා නම්, ඒ ගැන විගණකාධිපතිතුමාත් එකඟත්වය පෙන්වනවා නම්, නීතිය ක්‍රියාත්මක කරන අදාළ අංශවලට, නීතිපතිතුමාට ඒ අනුව ක්‍රියා කරන්නය කියලා මේ පාර්ලිමේන්තුව නියමයක් කළ යුතුයි. ඒ ගැන නැවත ඒ අය පාර්ලිමේන්තුවට පිළිතුරු වාර්තා කළ යුතුයි කියලා යම් ආකාරයක නියමයක් අවශ්‍ය බව කියමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 12.45]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාතිතුමනි. අද දිනයේ ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම මා හිතන විධියට බොහොම වැදගත් කාර්ය භාරයක්. අපේ රජය 2015 දී ඉදිරිපත් කළ "පංච විධ ක්‍රියාවලිය" ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ තිබුණු එක කරුණක් තමයි ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම. දැනටම සඳහන් කර තිබෙන පරිදි ජාතික විගණන පනත් කෙටුම්පත ගෙනෙන්න ප්‍රමාදයක් ඇතිවෙලා තිබෙනවා. ඇත්තටම මේ ජාතික විගණන පනත් කෙටුම්පතින් කරන්න හදන්නේ විගණකාධිපති හා විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමක්.

අපේ රටේ විශේෂයෙන්ම මුදල් වැනි සම්පත්වල විශාල අවභාවිතයක් තිබෙන බව අපි දන්නවා. මෙය සෑහෙන දීර්ඝ කාලයකට පවතින අවභාවිතයක්. මේ අවභාවිතය අවම කර

ගැනීමට පාර්ලිමේන්තුවේ අධීක්ෂණය තිබෙනවා. පාර්ලිමේන්තුවේ අධීක්ෂණයට උපකාරී වෙන්නේ ප්‍රධාන වශයෙන්ම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලියයි. විශේෂයෙන්ම ඒ රපෝර්තු තමයි අපට උපකාරී වෙන්නේ. ඒ නිසා අනිවාර්යයෙන්ම එම ක්‍රියාදාමය ශක්තිමත් කළ යුතුයි. මේ පනත් කෙටුම්පතේ අරමුණ වෙන්නේ ඒකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තව ගැටලුවක් තිබෙනවා. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථා කරනකොට මේ යෝජිත පනත් කෙටුම්පත තුළ තිබෙන නොයෙකුත් අඩුපාඩු පෙන්වා දුන්නා. මා හිතන හැටියට මෙහි තිබෙන තවත් ගැටලුවක් තමයි, පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනකොට විගණන බලයයි, අධිකරණ බලයයි සමතුලිත කර ගන්නේ කොහොමද කියන කාරණය. මොකද, විගණනය කියන්නේ එකක්. කවුරුන් හෝ වරදක් කර තිබෙනවා නම්, දූෂණයක් කර තිබෙනවා නම් ඒ අය එයට වග කියන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, ඒ අයට දඬුවමක් දෙන්නත් ඕනෑ. ඒ දඬුවම කොතැනින්ද දෙන්න ඕනෑ, කවුද දෙන්න ඕනෑ කියන ගැටලුව තිබෙනවා. විගණන බලතලයි, අධිකරණ බලතලයි පිළිබඳව ගැටලුවක් තිබෙනවා. මා හිතන විධියට මේ එකක් අනෙක් එකෙන් වෙන් වෙන්න ඕනෑ. සමතුලිතභාවයක් තිබෙන්නට ඕනෑ. ඒ වාගේම විගණකාධිපතිගේ බලය ශක්තිමත් කරන්න ඕනෑ, එතුමාට යම් පියවරයන් ගන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථා කරනකොට, කෙන්යාවේ අලුත් විගණන පනත ගැන සඳහන් කළා. කෙන්යාවේ අලුත් විගණන පනතට අනුව, විගණනය කරන අවස්ථාවේදී දූෂණයක්, වංචාවක් දැක්කොත් විගණකාධිපතිතුමාට කෙළින්ම ඒ බව පොලිසියට දන්වන්න පුළුවන් කියා ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා. ඒ වාගේ බලතල ඇත්තටම අපිට එතුමාට දෙන්න පුළුවන්ද කියා මා හිතනවා. මොකද, ඒක අධිකරණ බලයක් නොවෙයි. කෙළින්ම ක්‍රියාවලියට යොමු කිරීමක්; පටන් ගැන්මක්. එවැනි දෙයක් තිබෙනවා නම් හුඟක් හොඳයි කියා මමත් හිතනවා.

2015 ජනවාරි 08වන දා අපේ රජය බලයට පත් වුණාට පසුව අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අපි කොමිෂන් සභා කීපයක්ම පත් කළා. විගණන සේවා කොමිෂන් සභාව ගැනත් එහි සඳහන් කර තිබෙනවා. මෙම පනත් කෙටුම්පත ගෙන එන්න ප්‍රමාද වුණාය කියා සමහර අය කිව්වා. ඔව්, ප්‍රමාදයක් ඇතිවෙලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත ඉතා සුපරීක්ෂාකාරීව සකස් කිරීමට රජය උපරිම සැලකිල්ලක් දක්වා තිබෙනවා. නිලධාරින්ගෙන් හා වෙනත් ස්ථානවලින් ලැබුණු අදහස්, නිරීක්ෂණ සියල්ලක්ම සැලකිල්ලට අරගෙන තමයි අපි මේ ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය මූල්‍ය සම්බන්ධව විගණකාධිපතිවරයාට දෙන බලතලවලට අමතරව, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 41ආ. අනුව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභාවත් මේ යටතේ අපි පිහිටුවා තිබෙනවා.

විගණකාධිපතිවරයා විගණන ආයතනවල ස්වාධීනත්වය රකින්න ඕනෑ; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනම පනතක් ගෙනැත් හෝ එතුමා එය රකින්න ඕනෑය කියා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 66වන සැසි වාරය පවත්වන අවස්ථාවේ සඳහන් කළා. මේ පනත් කෙටුම්පත සම්මත කරගැනීමෙන් අපි අද ඒ දෙය සිදු කරනවා.

බොහොම කෙටියෙන් මම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. අද ගරු සභාව තුළ ඇති වුණු විවාදයේදී යෝජනා කීපයක්ම ඉදිරිපත් වුණා. විශේෂයෙන්ම වරදක් වෙලා තිබෙනකොට, අභියාචනයක් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයේ අඩුපාඩු තිබෙනවා කියා එක් අවස්ථාවකදී කිව්වා. නමුත් මා මේ කාරණය කියන්න ඕනෑ. මට කලින් කථා කළ සමහර මන්ත්‍රීවරුත් මේ කාරණය සඳහන් කළා. හොරකමක් වෙලා තිබෙනවා නම් -ක්‍රමවේදයේ ප්‍රශ්නයක් තිබෙනවා නම්- අධිහාරයක් පනවන්න පුළුවන්. ඒකට අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. සමහර වෙලාවට, ලබාදෙන දඬුවමේ ප්‍රමාණය අඩුද, වැඩිද කියා අපිට හිතෙන්න පුළුවන්. නමුත් අලාභයක් ඇති වුණා නම්, ඒ මුළු අලාභයම මේ පනත හරහාම පියවන්න බැරි බව මමත් පිළිගන්නවා. දූෂණය, වංචාව වාගේ දෙයක් සඳහා නම් දැනට තිබෙන ක්‍රමවේදය වන දණ්ඩ නීති සංග්‍රහය හරහා කටයුතු කරන්න පුළුවන්. නමුත් අපිට තිබෙන ගැටලුව මෙකයි. අපේ රටේ නීතිය ක්‍රියාත්මක වීමේ ප්‍රමාදය මූලික ප්‍රශ්නයක්. ඒ නිසා මෙවැනි දේවල් තුළින් ඒ ප්‍රශ්නත් විසඳන්න පුළුවන්ද බලන්න සමහර වෙලාවට වෑයමක් තිබෙන්න පුළුවන්. ඇත්තටම මේ වාගේ නීති පැනවීමෙන් ඒ මූලික ප්‍රශ්නය විසඳන්න අපහසුයි. මොකද, ඒක මූලික ප්‍රශ්නයක්. වංචාව, දූෂණය සම්බන්ධයෙන් කටයුතු කරන්න උසස් අධිකරණ හදන්න පනත් කෙටුම්පතක් ගෙනැත් ළඟදී අපි එය සම්මත කර ගත්තා. ඒ ක්‍රියාවලිය දැන් ඉදිරියට යනවා. අධිකරණය හරහා ඒ දේ ඉෂ්ට කරන්න නම් එවැනි ක්‍රියාවලි අපිට හොයන්න වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පතේ 7. (4) උපවගන්තියේ මෙසේ සඳහන් වනවා:

> "....එකී තැනැත්තාට නොවැළැක්විය හැකි තත්ත්වයක් හේතුවෙන් පෞද්ගලිකව පෙනී සිටීමට නොහැකි අවස්ථාවක දී, ඔහු විසින් ඒ වෙනුවෙන් විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු ඉදිරියේ පෙනී සිටීම සඳහා එම, විෂයය පිළිබඳ මනා දැනුමක් ඇති වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය."

ලොකු වගකීම් තිබෙන නිලධාරින්ට -ලේකම්වරු වාගේ අයට - සමහර වෙලාවට හැම අවස්ථාවකදීම පෙනී සිටින්න බැරි වෙන්න පුළුවන්; ඒ අයට නොයෙකුත් හේතු තිබෙන්න පුළුවන්, එතකොට ඒ පිළිබඳ දැනුම තිබෙන වෙනත් කෙනෙක් ඒ වෙනුවට යන්න ඕනෑය කියන එකයි මා හිතන විධියට එයින් අදහස් කළේ. නමුත් ඊළඟ වගන්තියෙන් කියන්නේ මොකක්ද බලන්න.

ජාතික විගණන පනත් කෙටුම්පතේ 7. (5) උපවගන්තියේ මෙසේ සඳහන් වනවා:

> "ස්වකීය කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයෙකු, වෙනත් යම් තැනැත්තකුගේ හෝ අධිකාරියක මැදිහත්වීමකට හෝ බලපෑම් කිරීමකට යටත් නොවිය යුතු ය."

මම මේ කාරණය විතරක් අදාළ කර ගන්නේ නැහැ. නමුත්, සාමාන්‍යයෙන් ඒ පෙනී සිටින තැනැත්තා විගණකාධිපතිවරයාට පිළිගත හැකි තැනැත්තෙක් විය යුතුයි. මම හිතන්නේ අපට ඒකෙන් පිටට යන්න බැහැ. වරදක් වෙලා තිබෙනවා නම්, වංචාවක් වෙලා තිබෙනවා නම් වෙනත් කවුරු හෝ එවලා එය වසන් කරන්න අපට බැහැ. ඒ එවන තැනැත්තා විගණකාධිපතිවරයාට පිළිගත හැකි පුද්ගලයෙක් වෙන්න ඕනෑ. එතකොට විගණකාධිපතිවරයාට කියන්න පුළුවන්, අද එන්න බැරි නම් අනාගතයේදී ඒ පුද්ගලයාට එන්න පුළුවන් කියා. වෙනත් දිනයක කථා කරන්නත් පුළුවන්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මම ඔබතුමාගේ අදහසට එකඟ වනවා. මම කියන්නෙත් ඒකමයි. නමුත්, "විගණකාධිපතිවරයා විසින් අනුමත කරන; විගණකාධිපතිවරයා විසින් පිළිගන්නා තැනැත්තෙක්" කියන කොටස මේ වාක්‍යය තුළට ඇතුළත් වෙන්න ඕනෑ. ඒ කොටස ආවා නම් ඔබතුමා කියන දෙය සම්පූර්ණ වෙනවා. වාක්‍යයේ අවසාන කොටසින් ඒ කරුණ මතු වන්නේ නැහැ. අවසාන කොටසින් කියන්නේ, "විගණකාධිපතිවරයා හෝ ඔහුගේ බලය පවරපු තැනැත්තෙකුට බලපෑම් කරන්න බැහැ" කියා විතරයි. නම් කරන තැනැත්තා විගණකාධිපතිවරයාට ප්‍රතික්ෂේප කරන්න පුළුවන් කියා ඒකෙන් කියන්නේ නැහැ. සුදුසුකම් නැති පුද්ගලයෙක් නම්. "මනා දැනුම ඇති පුද්ගලයා" කියා තීරණය කරන්නේ විගණකාධිපති නොවෙයි නේ. නම් කරන තැනැත්තා නේ. ඒ නිසා, "විගණකාධිපතිවරයා ඒකට සෑහීමකට පත් විය යුතුයි" කියන කොටස එකතු වෙන්න ඕනෑ. එහෙම වුණා නම් හොඳටම හොඳයි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ඒකේ අපැහැදිලිතාවක් වෙන්න පුළුවන්. නමුත්, මූලධර්මය වන්නේ අනිවාර්යෙන්ම විගණකාධිපතිවරයා පිළිගත යුතු තැනැත්තෙක් වෙන්නම ඕනෑය කියන එකයි. වෙන තැනැත්තකුට ඇවිත් ඉදිරිපත් වෙන්න බැහැ. පිළිගත හැකි තැනැත්තෙක් විය යුතුයි. නැත්නම් අපට මේ ගැන සම්බන්ධයක් නැති පුද්ගලයෙක් එතැනට එවන්න පුළුවන්. මම හිතුවේ ඒ මූලධර්මය මෙතැන අඩංගුයි කියායි. එහි අපැහැදිලිතාවක් තිබෙනවා නම්, ඒක අපි නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම තව එක කරුණක් කියන්න කැමතියි. තව කාරණයක් කිව්වා, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත මෙයින් සීමා වෙන බවක් පෙනෙනවාය කියා. ජාතික විගණන පනත් කෙටුම්පතේ 9වන වගන්තියේ එය සඳහන් වෙනවා. ඒ වාගේම "...පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන තුරු..." කියාත් සඳහන් වෙනවා. ඇත්තටම වෙන වෙන පනත් ගෙනැත්, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත සීමා කරන්න අපේ කිසිම අදහසක් නැහැ. මොකද, එම පනත ගෙනාවේත් අපේ රජයයි. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ගැන මේ සභාව තුළ අවුරුදු ගණනාවක් සාකච්ඡා වෙලා තිබෙනවා. සමහර රටවල් අවුරුදු 200කට කලින් තමයි පුරවැසියාට මේ අයිතිවාසිකම දුන්නේ. ආසියාවේ හැම රටකම වාගේ මේ අයිතිය තිබෙනවා. ලංකාවේ පුරවැසියාට මේ අයිතිය ලැබුණේ 2015 අප්‍රේල් මාසයෙන් පසුවයි. ඒක සීමා කරන්න රජයට කිසිම අදහසක් නැහැ. ජාතික විගණන පනත් කෙටුම්පත අනුව ඒ ගැන අපැහැදිලිතාවක් තිබෙනවා නම් අපි එය නිරවුල් කර ගනිමු. ඒක සීමා කරන්න අපේ අදහසක් නැහැ. නමුත්, criminal investigation එකක් වැනි දෙයක් ගැන නම් විගණකාධිපතිවරයාට ප්‍රශ්නයක් තිබෙන්න පුළුවන්. ඒ වාගේ දූෂිත දෙයක් සොයා ගෙන යනකොට සමහර වෙලාවට ඒ කරුණු ප්‍රසිද්ධ කරන්න බැහැ. නැත්නම් ඒ කරන සොයා ගැනීමටත්, පසුව ඉදිරිපත් කරන්න යන අධිකරණ ක්‍රියාවලියටත් ඒක ගැටලුවක් වෙන්න පුළුවන්. ඒ නිසා මෙතැන අපැහැදිලිතාවක් තිබෙනවා නම් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට කිසිම පටලැවිල්ලක් නොවන ආකාරයට ඒ ආරක්ෂාව විගණකාධිපතිතුමාට ලබා දිය යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ ගනුදෙනුව නිසා අර්ථසාධක අරමුදල්වලට සිදු වුණු අක්‍රමිකතා සඟවන්න රජය මේ වාගේ ක්‍රියාවලියක යෙදෙනවාය කියා මට ප්‍රථමයෙන් කථා කළ මන්ත්‍රීතුමා යම් ඇඟවීමක් කළා.

එහෙම කිසිම දෙයක් නැහැ. විශේෂයෙන් සඳහන් කළා, අර්ථ සාධක අරමුදල-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

විශේෂයෙන්ම අර්ථ සාධක අරමුදල ගැන සඳහන් කළා. අපි අනිවාර්යයෙන්ම අර්ථ සාධක අරමුදල ආරක්ෂා කරන්න ඕනෑ. මගේ ජීවිත කාලයේම මමත් මුදල් දැම්මේ අර්ථ සාධක අරමුදලට තමයි. ඒ මුදලෙන් තමයි විශ්‍රාම ජීවිතය ගත කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඒක අපි අනිවාර්යයෙන්ම ආරක්ෂා කරන්න ඕනෑ. නමුත් අර්ථ සාධක අරමුදලේ මුදල් අවභාවිතයක් වෙලා තිබෙනවා. ඒක වෙලා තිබෙන්නේ, ඊයේ-පෙරේදා විතරක් නොවෙයි. සෑහෙන කාලයක ඉඳන් මේ අවභාවිතය වෙලා තිබෙනවා. ඒක නිසා මහ බැංකුව දැන් ක්‍රියාත්මක කරගෙන යනවා, Forensic Audit එකක් කරන්න. ඒවා පත්තරවල ප්‍රකාශ කරලා තිබෙනවා, විදේශ විගණන සමාගම්වලට ආරාධනා කරලා තිබෙනවා. 2018 ජූලි මාසය අවසන් වෙන්නට ප්‍රථමයෙන් ඒ අයට ඉල්ලන්නට පුළුවන් ඒ Forensic Audit එකට සහභාගී වෙලා අර්ථ සාධක අරමුදලේ- 2015 වසරේ ඒවා විතරක් නොවෙයි. 2015ට ඉස්සර කාලයටත් ගිහිල්ලා ඒ ගැන හොයලා බලලා ඒක අපි ප්‍රසිද්ධ කරලා හොරකම් කරපු අයට දඬුවම් දෙනවා දෙනවාමයි කියන එක මේ ගරු සභාවේදී සඳහන් කරන්න අවශ්‍යයි. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is Hon. Anura Priyadharshana Yapa. Before that, will an Hon. Member propose Hon. Heshan Withanage to the Chair?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

I propose that the Hon. Heshan Withanage do now take the Chair.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හේෂාන් විතානගේ මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசான் விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. HESHAN WITHANAGE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 1.00]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න, මහජන පරමාධිපත්‍ය රැක ගන්න, රජයේ මුදල් අවභාවිත වීම වළක්වන්න ඕනෑම රටක් ක්‍රියා කිරීම ඉතාම අත්‍යවශ්‍ය කාරණාවක්. ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී රටක මේ මූලධර්ම අඩංගු වුණොත්, ඒ පිළිබඳ නීතියේ පැහැදිලිතාවන් තිබෙනවා නම් ඒ රටවල් බොහොම වේගයෙන් ඉදිරියට ගොස් තිබෙනවා. විශේෂයෙන්ම ලංකාවේ විගණනය පිළිබඳ සැහෙන ඉතිහාසයක් තිබෙනවා. බ්‍රිතාන්‍ය යුගයේ තමයි මේ විගණන ක්‍රමය පටන් ගත්තේ. අඩු පාඩු සහිතව වුණත් ලොකු වැඩ කොටසක් විගණන දෙපාර්තමේන්තුව හරහා සිදු වුණා කියන එක විතරක් මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. පාර්ලිමේන්තුවට පැමිණි දා පටන් මටත් අවස්ථාවක් ලැබුණා, ප්‍රධාන කමිටු දෙකේම -කෝප් එකේත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේත්- ක්‍රියා කරන්න. මට වසර කිහිපයක් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියටත් වැඩ කරන්න පුළුවන් වුණා. අපි දන්නවා, කොයි තරම් දුරට වැදගත්ද කියලා රාජ්‍යයක වියදම් පිළිබඳ නිවැරැදි ගිණුම් පවත්වා ගැනීම.

විගණකාධිපති දෙපාර්තමේන්තුවට මොන පනතක් ගෙනාවත් රාජ්‍යයේ සියලුම ගිණුම් එලෙසම විගණනය කරන්න හරි අමාරුයි. ඔවුන්ටත් පුළුවන් වන්නේ යම් නියැදියක් මත පරීක්ෂණයක් කරන්න. විශේෂයෙන්ම අපේ ව්‍යවස්ථාවෙනුත් විගණකාධිපතිවරයාව විශේෂ පුද්ගලයෙක් බවට පත් කරලා තිබුණා. නමුත් දිගින් දිගටම තිබුණු ප්‍රශ්නය තමයි, රාජ්‍ය අංශයේ සිදු වුණු යම් යම් දේවල් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා ක්‍රියා කිරීමේදී හෝ විගණකාධිපතිවරයාගේ දෙපාර්තමේන්තුවේ නිලධාරින් ක්‍රියා කිරීමේදී සෘජු තීන්දු ගැනීමට අවශ්‍ය කරන නීති පද්ධතියක් අපේ රටේ නැතිකම. ඒ වෙනුවට තිබුණේ, අපේ තිබෙන ටෙන්ඩර් පටිපාටිය, අපේ තිබෙන මුදල් රෙගුලාසි. මේ මත තමයි බොහෝ විට ඒ අවශ්‍ය කටයුතු කෙරුණේ. අද මම ස්තුතිවන්ත වෙනවා, ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. පසු ගිය කාලය පුරාම විශේෂයෙන්ම හිටපු විගණකාධිපති මායාදුන්නේ මැතිතුමා සහ වර්තමාන විගණකාධිපතිතුමා දක්වා වන මා දන්නා කාලය ඇතුළත ඒ විගණකාධිපතිවරුන් විශාල ස්වාධීනතාවකින් තමන්ගේ අදහස් ප්‍රකාශ කරලා ජාතික විගණන පනතක් ගෙනෙන්න උත්සාහ කෙරුවා.

මට මෙතැන කථාවේදී තේරුණු දෙයක් තමයි, ජාතික විගණන පනත් කෙටුම්පතෙන් ක්‍රියාත්මක වෙන්න උත්සාහ කරන්නේ අධිභාරයක් පැනවීම කියලා. ඒක විතරක් ජාතික විගණන පනත් කෙටුම්පතේ අත්‍යවශ්‍ය දෙයක් හැටියට මම හඳුන්වන්නේ නැහැ. ප්‍රධාන කාරණා හතරක් සිදු නොවුණොත් තමයි අධිභාරයක් පනවන්නේ. යම් නිලධාරියෙක් සිදු කළ වංචාවක්, නොසැලකිල්ලක්, සාවද්‍ය පරිහරණයක් හෝ දූෂණයක් හේතුකොටගෙන කරන විගණන පරීක්ෂණයකදී අන්න ඒ නිලධාරියාට හෝ තැනැත්තන්ට එරෙහිව කටයුතු කරන්න පුළුවන්. අපි පිළිගන්න ඕනෑ, මේ වැඩ පිළිවෙළේදී එක පැත්තකින් සමහර අංශවල ඌනතා තිබෙන බව. බොහෝ රාජ්‍ය නිලධාරින් - අපි ඒ පැත්තත් කියන්න ඕනෑ.- ඉතාම අවංක සේවාවකුත් ඉටු කරනවා. මේක, මේ දෙපාර්ශ්වය අතර තිබෙන ප්‍රශ්නයක්.

නමුත්, සමහරුන්ගේ තිබෙන වැරදි ක්‍රියාමාර්ග නිසා රටට ඇතිවෙලා තිබෙන පාඩුව කුඩා+ පාඩු හැටියට ගණන් ගන්න බැහැ; මහා පාඩු හැටියට තමයි ගණන් ගන්න වෙන්නේ. මට කලින් කථා කළ ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කිව්වා වගේ, අපේ රටේ මහ බැංකු බැඳුම්කර වංචාව මඟින් සිදුවෙලා තිබෙන පාඩුව ඇත්ත වශයෙන්ම විගණකාධිපතිතුමාටත් හරියාකාරව කියාගන්න බැරි තරමටම වැඩියි. වංචාවන් නොසැලකිල්ල කියන්නේ ඒකයි. අපේ රටේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ඒ වාගේම ආයතන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ලෝකයේ දියුණු රටවල්වල එවැනි දැවැන්ත ප්‍රමාණයක් නැහැ. පෞද්ගලික අංශය විසින් පාලනය කරනු ලබන අංශ තමයි ඒ රටවල තිබෙන්නේ. නමුත්, අපේ රටේ එවැනි රජයේ ආයතන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒ විශාල සංඛ්‍යාව අපි මේ පාර්ලිමේන්තුවෙන් අනුමත කරලා ඉදිරියට දමන මුදල්, අය වැයකින් යොදවන මුදල් පාවිච්චි කරනවා. එසේ පාවිච්චි කිරීමේදී සිදුවන තත්ත්වයන් පිළිබඳව පාර්ලිමේන්තුවටත්, ඒ වාගේම රටටත් ප්‍රශ්නයක් තිබෙනවා. එම නිසා විගණන පනතක් හරහා එය යම් ආකාරයක ක්‍රමවේදයකට යටත් කිරීම ඉතාමත්ම අවශ්‍යයි කියා මම හිතනවා.

ඇත්ත වශයෙන්ම මෙම පනත ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් වන අංශ දෙකක් මම ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරවන්න කැමැතියි. එකක් තමයි පුහුණුව ලබාදීම. මොකද, අද අපි ඉන්නේ වාණිජ සමාජයක් ඇතුළේ. රජය වාණිජ ක්‍රියාකාරකම් විශාල ප්‍රමාණයක් කරනවා. එම වාණිජ ක්‍රියාකාරකම් කරන සමහර අවස්ථාවලදී රාජ්‍ය නිලධාරින්ට විවිධාකාර තීන්දු ගන්න වෙනවා. ඒ තීන්දුවක් ප්‍රශ්නගත තීන්දුවක් බවට පත් වෙන්නත් පුළුවන්. නමුත්, තමන් සද්භාවයෙන් ක්‍රියා කළා කියලා ඔප්පු කරන්න පුළුවන්කමක් ඇති වුණොත්, ඒ සම්බන්ධයෙන් විගණනයන් සාධාරණ ලෙස බලාවි කියා මම විශ්වාස කරනවා. එහෙම නැතුව, විගණනය පොලිස්කාරයෙක් බවටත්, රාජ්‍ය නිලධාරියා හැම විටම සැකයට භාජන වන පුද්ගලයෙක් හැටියටත් තිබුණොත් එය කිසිම ආණ්ඩුවකට යහපත් ප්‍රතිඵලයක් ඇති කරන්නේ නැහැ. එම නිසා මෙම විගණන පනත් කෙටුම්පතත් එක්ක එන්න ඕනෑ වැදගත් දෙයක් තමයි දෙපාර්ශ්වයටම පුහුණුව ලබා දීම. හැම වෙලාවේම විගණනය කරන නිලධාරිනුත්, විගණනයට ලක්වන නිලධාරිනුත් තමන් කරන කාර්ය පිළිබඳව මනා පරිචයකින් වැඩ කරන්න ඕනෑ කියලා පිළිගන්න ඕනෑ.

මම දන්නවා, අපේ ලංකාවේ, විශේෂයෙන්ම භාණ්ඩ මිලදී ගැනීම වැනි කටයුතුවලදී බොහෝ වෙලාවට ටෙන්ඩර් කැඳවලා අවම මිලට තමයි ටෙන්ඩර් ලබා දෙන්න ඕනෑ බව. හැබැයි, ලංකාවට විවිධ තැන්වලින් ගෙනෙන කිසිම ප්‍රමිතියක් නැති භාණ්ඩ හරහා ලංකාවේ ආණ්ඩුවට විශාල පාඩුවක් සිද්ධ වන බව අපි නිරන්තරයෙන්ම දැකලා තිබෙනවා. රජයේ සමහර කාර්යාලවලට තත්ත්වයෙන් ඉතා බාල භාණ්ඩ ලබා ගැනීමට සිදුවීම නිසා ඇති වන තත්ත්වයන් අපි දැක තිබෙනවා. ඒ වෙනුවට හොඳ භාණ්ඩයක් ගන්න ගියොත්, ඊට ඉහළ මිලකට අනුමැති දුන්නොත්, අනිවාර්යයෙන්ම ඒක මේ ක්‍රමය යටතේ විතරක් නොවෙයි, සාමාන්‍ය ක්‍රමය යටතේත් වැරැදියි. ඒ නිසා, මේකේ අරමුණ මොකක්ද කියලා අපි සියලුදෙනාම තේරුම් ගන්න ඕනෑ. මේකේ අරමුණ තව පොලිස්කාරයෙක් හදන එක නොවෙයි. රටේ තිබෙන වියදම් කරන ආයතන, පුද්ගලයන් සහ නිලධාරින් එම වියදම සාධාරණීකරණය කිරීමට සහ වඩා හොඳ විධියට ක්‍රියා කරන්න දිරි ගැන්වීමක් සිදු වන හැටියටයි අපි ක්‍රියා කරන්නට ඕනෑ. එහෙම නැතුව හැම පනතකින්ම සිදු කරන්නේ යම් යම් අය තුළ භීතියක් ඇති කිරීම නම්, ඒක සාධාරණ සමාජයකට හොඳ අදහසක් නොවෙයි.

විගණකාධිපති දෙපාර්තමේන්තුවට විශාල වැඩ කොටසක් තිබෙන බව මම දන්නවා. ඒ වැඩ කොටස ඉටු කිරීම සඳහා එම

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

නිලධාරින් විශාල ප්‍රයත්නයක් දරනවා. එසේ ප්‍රයත්න දරන කොට ඒ හා සමඟ එන විගණනයකදී, විශේෂයෙන්ම යම් පුද්ගලයෙක් විගණනය සඳහා කැඳවනවා නම් හෝ ඔහු වෙනුවෙන් සහභාගි වෙනවා නම්, ඒ පුද්ගලයා විගණකාධිපතිවරයාගේ පිළිගැනීමට ලක් වෙන්නට ඕනෑය කියන කාරණයට මමත් එකඟ වෙනවා. එහෙම නැත්නම් ඒක සාධාරණ වෙන්නේ නැහැ. එම නිසා මෙම පනත් කෙටුම්පත ඇතුළේ රාජ්‍ය නිලධාරියෙකුටත් පුළුවන් තරම් සාධාරණයක් ඉටු කරලා තිබෙනවා.

ඒ අභියාචනා කමිටු පත් කිරීමෙන්, ඒ වාගේම අධිකරණයට යාමට තිබෙන ඉඩකඩ වැඩි කිරීමෙන්, අධිභාරයන් පිළිබඳ විවිධ කරුණු ඉදිරිපත් කිරීමෙන් සාධාරණය ඉටු කර තිබෙනවා. මූලික අධිභාරයෙන් පසු ඒ අභියාචනා කමිටු ඇති කිරීමේදී පුළුවන්තරම් දුරට සාධාරණය ඉටු කිරීමට මේ පනත් කෙටුම්පතෙන් ඉඩ ලැබිලා තිබෙනවා. අපේ රටේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි රාජ්‍ය මුදල් වියපැහැදම් කිරීමේදී ඒ රාජ්‍ය මුදල් වියපැහැදම් කරන ආකාරය සහ ඉන් ලැබෙන ප්‍රතිලාභය පිළිබඳ ගණනයක් බොහෝවිට සිදු නොවීම. ඒ කියන්නේ forensic audit එකක් සිදු වෙන්නේ නැහැ. අපි රුපියලක් වියදම් කරනවා නම්, අපට ඒ රුපියලම ප්‍රතිලාභයක් හැටියට ලැබෙනවාද කියලා අපි කොහේවත් තැනක ගණන් හදන්නේ නැහැ. මේක විශාල අඩුපාඩුවක් හැටියටයි මම දකින්නේ. ඇමතිවරයෙක් හැටියට මම බොහෝ කාලයක් වැඩ කරලා තිබෙනවා. රාජ්‍ය ආයතනවල කරුණු පිළිබඳව අත්දැකීම් රාශියක් මට තිබෙනවා. අපි වියදම් කරන හැම මුදලකටම ඒ ප්‍රතිලාභය ලැබෙන්න ඕනෑ කියන එකත් විගණනයේ ඉතා වැදගත් කාරණාවක්. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වර්තමාන සභාපති ගරු ලසන්ත අලගියවන්න මැතිතුමාත් මෙම අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. මට මතකයි, ඉස්සර අපි ගිණුම් කාරක සභාවට, කෝප් කමිටුවට යනකොට අපට දකින්න ලැබුණේ අවුරුදු පහකට, හයකට එහා අවුරුදුවල විගණන වාර්තා. හැබැයි, ඒ කාලය වෙනකොට ඒ නිලධාරියා විශ්‍රාම ගිහිල්ලා; ඒ ගනුදෙනු සිද්ධ වුණු විධිය අපි දන්නේ නැහැ. ඒ නිසා ඇත්තටම ඒකෙන් සාධාරණයක් වුණේ නැහැ. මේ ආණ්ඩුව කොච්චර පම්පෝරි ගැහුවත් කලින් රජය තිබෙන කාලයේ මේ තත්ත්වය අපි නිරවුල් කෙරුවා. නිරවුල් කරලා නියමිත වසරවලට ඒක ගෙනාවා. මම මුලින් කිව්වා වාගේ ලෝකයේ ඕනෑම රටක ප්‍රජාතන්ත්‍රවාදය කියන වචනයේ මූලික ලක්ෂණය තමයි ආණ්ඩුවේ වැඩ කටයුතුවලින් රටේ මහජනයාට ප්‍රතිලාභයක් ඇති විය යුතු වීම. ඒ වාගේම රටේ වැඩ කටයුතු කිරීම සඳහා කාර්යාලවලට යන පුද්ගලයන් අතින් ඒවා අනලස්ව සිදු කෙරෙනවාද කියලා බලන එකත් මේ විගණන කාර්යයේම කොටසක් කියලා මම හිතනවා. බොහෝ වෙලාවට වැඩක් කර ගන්න රජයේ කාර්යාලයකට ගියාම දවස් ගණනාවක් රස්තියාදු වෙන්න ඕනෑ, හේතු විරහිතව. සමහර වෙලාවට තමන් පුරවාගෙන ආ පෝරමයක අන්තර්ගත ලේඛන පිළිබඳව විවිධ අවස්ථාවල, විවිධ දැනුම් දීම් කරලා ඒ අය රස්තියාදු කරවනවා. ඒ නිසා ලංකාවේ සාමාන්‍ය ජනයා රජයේ කාර්යාලයකට යනවා කියන්නේ මහමඟ රස්තියාදු වෙනවා කියන එකයි. සමහර වෙලාවට ඒ අය පැය ගණන් අදාළ නිලධාරියා ඉදිරිපිට වාඩිවෙලා ඉන්නවා. සාධාරණ හේතුවක් නිසාවත් ඒ නිලධාරියා ඒ ෆයිල් එක දෙස බලන්නේ නැහැ. ඒ නිසා රජයේ කාර්යාල ඇතුළේ අතපසු වුණු ලිපි ගොනු, වැඩ කරන්නේ නැති ලිපිගොනු රාශියක් තිබෙනවා. විගණනයේදී ඒවාත් බලන්න ඕනෑ. එවැනි ලිපිගොනු කොච්චර තිබෙනවාද කියලා බලන්න ඕනෑ. ඒ නිසා එකිනෙකා එකිනෙකාව විමර්ශනය කර ගැනීමේ ක්‍රමයක් ඇති කිරීමෙන් පමණයි විගණන පනතක් සාර්ථක කර ගන්න පුළුවන් වෙන්නේ. විගණන පනත හදලා, විගණකාධිපතිතුමාට භාරදීලා, වැඩේ වුණේ නැති වුණාම මේක කෙරෙන්නේ නැහැ කියලා ඒ පැත්තට ඇඟිල්ල දිගු කරනවාට වඩා සැම දෙනාම එකතුවෙන ක්‍රමවේදයක් රාජ්‍ය සේවයේ ඇති කරන්න ඕනෑ. රාජ්‍ය සේවය ඇතුළේ හැම කෙනෙකුටම වගකීමක් තිබෙන්න ඕනෑ. ඒ වගකීම මත තමයි සාමාන්‍ය ජනතාවට සේවයක් ඇති කරන්න අපට පුළුවන් වෙන්නේ. මේ පනත්වල පරමාර්ථය මොකක්ද? පරමාර්ථය හොරු අල්ලන එක විතරක් නොවෙයි නේ. ඒකත් කෙරෙන්න ඕනෑ. එහි අනිත් ප්‍රතිඵලය තමයි මහජනතාවට අනලස්ව වැඩ කරන එක. ඒ නිසා විගණන පනත් කෙටුම්පතේ යම් යම් සංශෝධන සිදුවිය යුතුයි. ඒවා සිදුවෙන්න ඕනෑ, මේ විගණන පනත අපි ක්‍රියාත්මක කළාට පසුව. ඒ නිසා මම හිතනවා, සැම කෙනෙකුම මතක තබාගත යුතු ප්‍රධාන කරුණ තමයි විගණනය මඟින් කොහේවත් පොලිසියක් හදන්නේ නැහැ කියන කාරණය; පොලිසියක් හැදෙන්නේ නැහැ කියන කාරණය. ඒ වාගේම රාජ්‍ය සේවය ඉදිරියට ගෙන යැමට, කාර්යක්ෂම කිරීමට මෙය හේතුවක් වේ යැයි මම විශ්වාස කරනවා. බොහෝ වෙලාවට අපි කථා කරන්නේ හොරකමක් ගැන විතරයි. පාර්ලිමේන්තුවේ කවුරු හෝ කට ඇරියොත් කියන්නේ හොරකමක් ගැන. හැබැයි, කථා කරන මනුෂ්‍යයාගෙත් මොකක් හෝ තිබෙනවා. ඒක ප්‍රජාතන්ත්‍රවාදයට සරිලන වැඩක් නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ රටක පාලනය ගෙන යාම සඳහා සියලුදෙනාම එක්ව ක්‍රියාකිරීම සහ ඒ සඳහා වන නීති රීති, අණ පනත් ඇති කිරීම.

ඇත්ත වශයෙන්ම වර්තමාන ලෝකයේ බොහෝ කරුණු සම්බන්ධයෙන් නව නීතිරීති ගොඩාක් පැනවිලා තිබෙනවා. මානව අයිතිවාසිකම් රැකීම, පුවත් පත් නිදහස, මාධ්‍ය නිදහස, ඡන්ද අයිතිය වැනි බොහෝ කාරණා ඇති කිරීමට නීතිරීති ඇති කරලා තිබෙනවා. මට මතකයි අපි ආණ්ඩු කරන කාලයේ තමයි ලංකාවේ මැතිවරණයකදී ඡන්දය පාවිච්චි කිරීමට අනිවාර්යයෙන්ම ජාතික හැඳුනුම්පත අවශ්‍යයි කියලා නීතියක් ගෙනාවේ. ඒ අනුව, ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීම සඳහා පසු ගිය රජයෙනුත් විශාල කාර්යයක් ඉටු වුණා. කවුරුන් හෝ කියනවා නම් එසේ නොවුණා කියලා, ඒක වැරදියි. අපි හැමෝම මහන්සි වෙන්නට ඕනෑ, මහ ජනතාවට හිතවත් රාජ්‍ය සේවයක් නිර්මාණය කරන්නටත්, ඒ රාජ්‍ය සේවය නිසි ලෙස කළමනාකරණය කරන්නටත්. එතැනදී රාජ්‍ය නිලධාරියා තුළත් භියක් ඇති වෙන්නට නරකයි අපිට උඩින් තොණ්ඩුවක් එල්ලලා තිබෙනවා නේද කියලා. එහෙම වුණොත් ඒ අය වැඩ කිරීම අත හරිනවා. ඒ වැඩ කිරීම අත හැරියොත් අපි හිතන පතන කාර්යයන් සම්පූර්ණයෙන් ඉටු වෙන්නේ නැහැ. මේ විගණන පනත් කෙටුම්පත සම්මත කරගෙන ඒ හරහා හොරු අල්ලන්න යන එක නොවෙයි කරන්නට ඕනෑ. වඩා කාර්යක්ෂම පාලනයක් ඇති කිරීමට අන්‍යෝන්‍ය සහාය ලබා දීමයි කරන්නට ඕනෑ. මේ තත්ත්වය ඇති කරන්න පුළුවන් වුණොත් විතරයි මේ විගණන පනත් කෙටුම්පත වඩාත් සාර්ථක වෙන්නේ. මේ විගණන පනත් කෙටුම්පත ගෙනාවේ හොරුන් අල්ලන්නයි කියන මූලික තර්කය ඉස්සරහාට ගෙනාවොත් කවදාවත් මේක සාර්ථක වෙන්නේ නැහැ. රාජ්‍ය පාලනයේ නොයෙකුත් කාරණාවලදී රාජ්‍ය නිලධාරින් තමන්ගේම තීන්දු ගත යුතුයි.

සමෘද්ධි දීමනාව අලුතෙන් ලබා දීමේදී ඒ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ඉවත් කරලා විශේෂ චක්‍රලේඛයක් නිකුත් වෙලා තිබෙනවා කියලා අද මට දැන ගන්නට ලැබුණා. ඒ කියන්නේ සමෘද්ධි දීමනාව ලබා දීමේදී අවසන් තීන්දුව ගැනීමේ වගකීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ඉවත් කරලා. ඒ වගකීම දෙන්න හදන්නේ කාටද දන්නේ නැහැ. නමුත් ඒ වගකීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ඉවත් කරලා තිබෙනවා. අද මේ ජාතික විගණන පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව මේ චක්‍රලේඛනය නීත්‍යානුකූල චක්‍රලේඛනයක්ද, නිකුත් කළ නිලධාරියා නොසැලකිල්ලක් කරලා තිබෙනවාද, ඒ හරහා දූෂණයක් ඇති වෙනවාද කියන කාරණය ගැනත් සොයලා බලන්නට ඕනෑ. අන්තිමට සමෘද්ධිය ලබා දෙන්නට යන්නේ දේශපාලන වශයෙන්

නම් ඒක ඒ තරම් හොඳ දෙයක් හැටියට පේන්නේ නැහැ. එම නිසා මතක තියා ගන්න, යම් නිලධාරියකු වුණත් වැරදි තීන්දුවක් ලබා දුන්නොත් මේ පනත මඟින් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ හැකියි. එම නිසා අද පටන් නිලධාරින් එවැනි වැරදි සිදු කිරීමෙන් වැළකී සිටීම තමයි වඩාත් ඥාණවන්ත වන්නේ. එහෙම තමයි මට හිතෙන්නේ. මේ ජාතික විගණන පනත් කෙටුම්පත ඉතාම හොඳ දෙයක්. අපි මේ ගැන වාර ගණනාවක් සාකච්ඡා කරලා තිබෙනවා. මේ රට දියුණු රටක් බවට පත් කිරීමේ මූලික කාරණාවලදී අපි කොයි පැත්තේ හිටියත් සහාය දෙන බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.17]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - Deputy Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ ආපු ගමන් මඟ කණපිට හරවන්නට පුළුවන් පනත් කෙටුම්පතක් පිළිබඳව විවාද වන අවස්ථාවේදී ඒ ගැන අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම අපි දන්නවා දේශපාලනඥයාව ගමේ, ප්‍රදේශයේ, රටේ සලකන්නේ හොරෙක් විධියටයි කියලා. මොකද, මේ ක්ෂේත්‍රය තුළ ඒ තරමට දූෂණ සිදු වෙනවා. ඒ වාගේම පසුගිය දවස්වල මේ රටේ ප්‍රධාන රාජ්‍ය නිලධාරින් දේශපාලනඥයින් වාගේම වංචා සහ දූෂණ කළ බව හෙළි දරවු වෙන්නට පටන් ගත්තා. ඒ අවකාශය නැති කරන්නට, රාජ්‍ය මුදල් අව භාවිතය නවත්වන්නට අවශ්‍ය නීතියක් රටට හඳුන්වා දෙන මේ අවස්ථාව, ඇත්ත වශයෙන්ම ස්වර්ණමය දවසක් ලෙසට ඉතිහාසයට එක් වේවි.

අපි ඉතිහාසය ගැන බැලුවොත් 1799දී, - බ්‍රිතාන්‍යය ශ්‍රී ලංකාව යටත් කර ගන්නටත් අවුරුදු 16කට කලින්- මේ රටේ රාජ්‍ය මූල්‍ය පනතක් තුළින් විගණනය වුණා කියලා සඳහන් වෙලා තිබෙනවා. ඒ වාගේම සිංහල රජ කාලය ගැන බැලුවොත්, පස්වෙනි මිහිඳු රජ්ජුරුවන්ගේ සෙල් ලිපිවල සඳහන් වෙනවා ස්වාමීන් වහන්සේලා මඟින් රාජ්‍ය මූල්‍ය විගණනය කරලා -audit කරලා- තිබෙනවා කියන එක.

විගණනය කරලා ඒ ලියකියවිලි මංජුසාවක තැන්පත් කළායි කියන එක මිහින්තලාවේ තිබෙන ඒ සෙල්ලිපිවල සඳහන් වෙනවා. ඒකෙන් පෙනී යනවා, මේ "විගණනය" කියන එකට අපේ රටේ දීර්ඝ ඉතිහාසයක් තිබෙන බව. හැබැයි, ප්‍රශ්නය වුණේ කාලය යන්න, යන්න මේ "විගණනය" පිළිබඳ අවධානය යොමු කිරීම රාජ්‍යය නොසලකා හැර එය එදා තිබුණු තත්ත්වයටම පවත්වාගෙන යෑම නිසා සංකීර්ණ වූ මේ සමාජය තුළ නොයෙකුත් රාජ්‍ය මුදල් වංචා ශීඝ්‍රයෙන් වැඩි වෙන්න පටන් ගැනීමයි. පස්වැනි මිහිඳු රජ්ජුරුවන්ගේ කාලයේ මේවා විගණනය කරන්න, පරීක්ෂා කරන්න රජ්ජුරුවන්ට හිතෛෂී කණ්ඩායමක් පත් කරන්න අවස්ථාව තිබුණා. නමුත්, ගෞරවනීය සංඝයා වහන්සේලාට භාර දීලා තිබුණා රාජ්‍ය ආදායම, වියදම පරීක්ෂා - check - කර ඒවා පිළිබඳ වාර්තාවක් දෙන්න. ඒ වාර්තාවේ පිටපතක් මංජුසාවක තැන්පත් කරන්න ඕනෑ. ඒ කියන්නේ, කොයි කාලයේ හෝ අවශ්‍ය වුණොත් බලන්න. ඒ කාලයේ හැටියට හොඳ ස්වාධීන විගණනයක් රටේ සිද්ධ වෙලා තිබෙනවා.

නමුත්, මේ රටේ අධිකරණ පද්ධතිය තිබුණා වාගේම "විගණනය" කියන එකත් වෙනස් වෙන්නේ නැතිව පැවතුණා, රට කොපමණ සංකීර්ණ භාවයකට පත් වුණත්. ණය ගැනීම්, වෙනත් විවිධ හේතූන්වලින් රටේ මූල්‍ය පරිපාලනය, මූල්‍ය භාවිතය, මූල්‍ය ලබා ගැනීමේ ක්‍රමවේදය වෙනස් වෙද්දී, පුද්ගලයන්ගේ ජීවන රටාව, අදහස්, ගති පැවතුම් වෙනස් වෙද්දී, ඒ අනුව සංශෝධනය නොවන විගණන ක්‍රමවේදයකුයි මේ රටේ පැවතුණේ. කවුරුත් ඒ ගැන ඇඟිලි ගහන්න, හොයන්න බලන්න ගියේ නැහැ. හොරා රිසි සේ රාජ්‍ය මුදල් සොරකම් කළා. "හොරා" කිව්වාම, දේශපාලනඥයකු වෙන්න පුළුවන්; රාජ්‍ය නිලධාරියකු වෙන්න පුළුවන්. ඒ අයට රිසි සේ හොරකම් කරන්න අවස්ථාව, ඉඩ කඩ තිබුණා. කොහොම වුණත්, 1978වන කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153, 154 ව්‍යවස්ථාවලින් මේකට එකතු වුණා "විගණන පනත" කියන එක. ඒ අනුව, මේ රටේ රාජ්‍ය මූල්‍ය පාලනය විගණනය කළ යුතුයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවේ තිබෙනවා, "රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන්නේ ය" කියලා. මේ ගැන සැලකිල්ලට අරගෙන තිබෙනවා, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළත්. හැබැයි, ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් නිර්මාණය වුණේ නැහැ. නමුත්, සැකිල්ලක් තිබුණා, විගණනය කරන්න ඕනෑ; රාජ්‍ය මුදල් පිළිබඳව පාර්ලිමේන්තුවට ගණන් දෙන්න ඕනෑ කියා. ඒකෙන් කියන්නේ, රටේ ජනතාවට රාජ්‍ය මූල්‍ය භාවිත කරන්නේ කොහොමද, ණය ගත්තා නම් කොපමණ ගත්තාද, ඒවායින් කළ දේවල් මොනවාද, කියන එක පිළිබඳව ගණන් දෙන්න ඕනෑය කියන එකයි. නමුත්, එහෙම කරන්න ඕනෑ කියලා තිබුණාට, ඒ සඳහා වැඩ පිළිවෙළක්, යාන්ත්‍රණයක් මේ රටේ නිර්මාණය කර තිබුණේ නැහැ.

1977දී බර්නාඩ් සොයිසා වැනි වාමාංශික නායකයන් මේ ගැන කථා කළා. හැබැයි, හීනෙකින්වත් හිතන්න නැතිව ඇති, එක්සත් ජාතික පක්ෂය කියන දක්ෂිණාංශික පක්ෂයකින් මේ රාජ්‍ය මුදල් අවභාවිතය නැති කරන්න, ජනතාවගේ මුදල් මංකොල්ලකෑම නැති කරන්න මෙවැනි පනතක් රටට හඳුන්වා දේවි; ඉදිරිපත් කරාවි; ශක්තිමත් කරාවි කියන එක. ඒ වෙනස කරන්නට අපට හැකි වීම ගැන ඉතාම සතුටුයි. ඒ අනුව, අද දවස ස්වර්ණමය දවසක් ලෙස ඉතිහාසයට එක් වෙනවා. මෙය විශේෂයෙන්ම රාජ්‍ය, මහජන මුදල් වංචා, දූෂණවලට තිත තියන්න ගත්ත ප්‍රබලම අවියක් විධියට සඳහන් කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත මඟින් audit කරන්නේ, විමර්ශනය කරන්නේ මොනවාද? රාජ්‍ය මුදල් හොරකම, හොරා කෑම ගැන විතරක් නොවෙයි මේ තුළින් පරීක්ෂා කර බලන්නේ. රාජ්‍ය මුදල් සකසුරුවම් සහිතව වියදම් කරනවාද, කාර්යක්ෂමභාවයක් ඇතිව වියදම් කරනවාද, ඵලදායී ආකාරයට යොදවනවාද කියන එක ගැනත් විශේෂයෙන්ම අවධානය යොමු කරනවා. රටේ ජනතාවගේ මුදල් නිසියාකාරව පාලනය කරන්න අවුරුදු හතරක, පහක කෙටි කාලයකට අපට භාර දෙනවා. එහිදී අයිතිකාරත්වයක් නොවෙයි, භාරකාරත්වයකුයි දෙන්නේ. මේ භාරකාරත්වය තුළ තමන්ට ඕනෑ ඕනෑ විධියට වැඩ කරලා බලය හදා ගන්න, දේශපාලන ගමන් මඟ යන්න, දරුවන්ට වත්කම් හදන්න ජනතා මුදල් අවභාවිත කරනවාද කියන එක ගැනයි මේ තුළින් පරීක්ෂා කර බලන්නේ. ඒකයි කිව්වේ, ජනතා මුදල් වියදම් කිරීමේදී සකසුරුවමින් එය සිදු කරනවාද, යම් කාර්යක්ෂමභාවයක් ඇතිව සිදු කරනවාද, මේවායින් මීට වඩා හොඳ දෙයක් කරන්න බැරිද, එහෙම නැත්නම් ඒ කරන දෙය රටට කොපමණ ඵලදායී, වැඩදායී දෙයක්ද කියන එක මේ තුළින් පරීක්ෂා කර බලනවා කියා.

හම්බන්තොට වරාය හැදුවාට, ඒක හදන්න ණය ගත්තාට ඒක රටට කොච්චර ප්‍රතිඵලදායකද? නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය හැදුවාට ඒක රටට කොච්චර වැඩදායකද? මේ තාප විදුලි බලාගාරය හදන්න මුදල් වියදම් කළ විධිය වැඩදායකද? එහෙම වැඩදායි නම්, ඒ ඉන්න ඉංජිනේරුවෝ කියන්නේ නැහැ, "අපි ඉල්ලපු මැෂින් එක නොවෙයි ආවේ, වෙන මැෂින් එකක්" කියලා. ඉංජිනේරුවෝ එහෙම කියනකොට මේ පනත තිබුණා නම්, අපට ඒ ගැන ස්වාධීනව පරීක්ෂා කරන්න තිබුණා. මේ විගණන කොමිෂන් සභාව ජනාධිපතිතුමාගේ අතකොළුවක්

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

නොවෙයි, අගමැතිතුමාගේ අතකොළුවක් නොවෙයි, ඇමතිතුමාගේ අතකොළුවක් නොවෙයි. මේ පනත තිබුණා නම්, පාර්ලිමේන්තුවට වග කියන විධියට මේ කොමිෂන් සභාව මඟින් මේ කටයුතු පිළිබඳව ස්වාධීනව කටයුතු කරන්න තිබුණා. අද අධිකරණයෙන් නඩු තීන්දු දෙන්නේ අගමැතිතුමාට, ජනාධිපතිතුමාට ඕනෑ විධියටද? අද කොච්චර ස්වාධීනව රජයට විරුද්ධව නඩු තීන්දු දෙනවාද? ඒ වාගේ ස්වාධීන ආයතනයක් නිර්මාණය කරලා රාජ්‍ය මූල්‍ය පාලනය කරන්න ගත්ත පියවර දේශපාලන වශයෙන් අපට අවාසියක් වන්න පුළුවන්. නමුත්, වංචාවෙන්, දූෂණයෙන් තොර රටක් නිර්මාණය කරමින් යන ඉදිරි ගමන මේ තුළින් ඉතාම ශක්තිමත් වනවා; සාර්ථක වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මම විශේෂයෙන් මේ කරුණත් කියනවා. මේ සිදුවන අක්‍රමිකතා පාලනය කරද්දී රාජ්‍ය ණය, රාජ්‍ය සම්පත් ගැනත් බලන්න වනවා. රාජ්‍ය සතු දේපළ, ණය, රාජ්‍ය ආදායම, රාජ්‍ය වියදම් ආදී මේ හැම දේම රාජ්‍ය සම්පත්වලට අයිතිවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා එදා 2001-2004 ආණ්ඩුව පැවැති කාලයේදී මේ පනත් කෙටුම්පත ගේන්න උත්සාහ කළා. අපේ ඒ ආණ්ඩුව කාලයේ මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළා. සිවිල් සංවිධාන සමඟ, අමාත්‍යාංශ සමඟ, ඒ වාගේම, පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරලා මේ පනත් කෙටුම්පත එදා අපි ගෙනාවා. නමුත්, අපට ආණ්ඩුවේ කාලය කෙටි වීම නිසා අපට මේ පනත සම්මත කර ගන්න බැරි වුණා. නමුත්, ඊ ළඟට බලයට පැමිණි ආණ්ඩුව මේ පනත් කෙටුම්පත ගෙනාවේ නැහැ. විශේෂයෙන්ම ඒ අවස්ථාවේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා කිව්වා, මේ පනත් කෙටුම්පතට තව අදහස් හොයන්න ඕනෑ කියලා. එදා ආණ්ඩුව කිව්වා, මේ සම්බන්ධයෙන් තවත් සාකච්ඡා කරන්න ඕනෑ, තවත් මේ කරුණු බැරෑරුම් කරන්න ඕනෑ කියලා. එහෙම කියලා එදා මේ පනත් කෙටුම්පත හමස් පෙට්ටියට දැම්මා. එහෙම කරලා එදා මේ පනත් කෙටුම්පත ගෙනාවේ නැහැ. එදා හමස් පෙට්ටියට දමපු මේ පනත් කෙටුම්පත ආයෙත් කරළියට ගේන්න එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක්, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ - රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ ආණ්ඩුවක් එන තෙක් බලා සිටින්න අපට සිද්ධ වුණා. ඊට පස්සේ දින සියයේ වැඩ පිළිවෙළ යටතේ අපි පොරොන්දුවක් වුණා, මේ ජාතික විගණන පනත ගෙනෙනවා කියලා. මේ රටේ යහ පාලනයක් නිර්මාණය කරන්න කියලායි ජනතාව අපට බලය දුන්නේ. රාජ්‍යයේ ඉහළ නිලධාරින්, දේශපාලනඥයන් රටේ සල්ලි හොරකම් කරද්දි, ණයක් ගන්න කොට ඒ ණයේ කොටසක් හොරකම් කරද්දි යහ පාලනයක් නිර්මාණය කරන්නේ කොහොමද?

දැන් "The New York Times" සඟරාව කියනවා, මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුවට සල්ලි දීපු විධිය. චීනයෙන් සල්ලි ගෙනැල්ලා හම්බන්තොට වරාය හැදුවාට, ඒ වරායට කොච්චර වියදම් කළාද, සාක්කුවට කොච්චර ගියාද කියන එක ඒ සඟරාව කියනවා. දේශපාලන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා, ඊ ළඟට බලය ලබා ගැනීම සඳහා හම්බන්තොට වරායට ගත් ණයෙන් කොච්චර වියදම් කළාද කියලා "The New York Times" සඟරාව කියනවා. නමුත් අද අපේ අය කියනවා, මේක කැලෑ පත්තරයක් කියලා. එහෙම නැත්නම්, ලංකාවේ ලසන්ත වික්‍රමතුංගලාට වාගේ, එක්නැළිගොඩලාට වාගේ, උපාලි මැතිතුමාට වාගේ ඒ මාධ්‍යවේදින්ටත් තර්ජනය කරනවා, "ලංකාවට ආවොත් උඹ මරණවා" කියලා. ආණ්ඩුව අපේ වුණත්, යහ පාලන ආණ්ඩුව තිබුණත් පසුගිය ආණ්ඩුවේ හොල්මන් අවතාර තවමත් තිබෙනවා. අපට ඒවාත් විසඳන්න තිබෙනවා. ජාතික විගණන පනත ගෙන ඒම අපේ දින සියයේ වැඩ පිළිවෙළේ දීපු පොරොන්දුවක්. ඒක ජනතාවගේ මුදල් ආරක්ෂා කර ගන්න දීපු පොරොන්දුවක්. ඒ වාගේම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත අපි ගෙනාවා, ස්වාධීන කොමිෂන් සභා පිහිටෙව්වා. ඒ වාගේම, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය අද අපි ලබා දීලා තිබෙනවා. ඒ අනුව ජනතාව අද උද්ඝෝෂණ පවත්වනවා. ආණ්ඩුවට විරුද්ධව වැඩ කරන්න, ජනතාවට නැඟී සිටින්න අයිතිය දුන්නා. එදා වාගේ අද වෙඩි තියලා ජනතාව මරන්නේ නැහැ. ඒ නිසා ආයෙත් මේ රටට ණයක් ගන්න කොට හුඹසක් පෙන්නුවාම ඒකට ජනතාව රැවටෙන්න ඕනෑ නැහැ. ඒ ණය පාවිච්චි කළේ මොනවාටද, ඒ සල්ලි ඔක්කෝම ලංකාවට ආවාද, නැත්නම් මේ සල්ලි ගියේ සීෂෙල්ස්වල, ඩුබායිවල තිබුණු ගිණුම්වලටද කියලා දැන් දැනගන්න පුළුවන්. ඒවා සම්බන්ධයෙන් ස්වාධීනව පරීක්ෂණයක් කරන්න ආයතනයක් නිර්මාණය කරන්න ගෙනාපු පනතක් විධියට මා මෙම පනත් කෙටුම්පත සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අදහස් දක්වන්න මා හට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬවනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මී ළඟට, ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.28]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් විවාදයට ගන්නා මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් කරුණු කීපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා ඉතා සතුටුවනවා.

අද ගෙන එනු ලබන මේ පනත් කෙටුම්පත මඟින් විශේෂයෙන්ම සිද්ධ වන්නේ, විගණන සේවා කොමිෂන් සභාවත්, විගණන සේවයත්, ඒ හා ආනුෂංගිකව තිබෙන කටයුතුත් නීතිමය රාමුවකට ගෙන ඒමයි. සමහර විට ඇතැම් අය මේ පිළිබඳව වැරැදි අර්ථකථන නිරූපණය කරමින්, මෙය මේ රටේ සංවර්ධන ක්‍රියාවලිය තවදුරටත් ඇණ හිටුවීම සඳහා ගෙන එන පනත් කෙටුම්පතක් ලෙසටත් කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. සමහරුන් එසේ කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් ඒක වැරැදි මතයක්. සමහර අය කියනවා මට ඇහෙනවා, "දැනටමත් අපේ රටේ නීති රීති තිබෙනවා. චක්‍රලේඛ තිබෙනවා. මේ පනත නිසා රාජ්‍ය නිලධාරින් බිය වේවි. රාජ්‍ය නිලධාරින්ට වැඩ කරන්න

පුළුවන්කමක් නැති වේවි. එම නිසා මෙය රටේ සංවර්ධන ක්‍රියාවලියට බාධාවක්" කියලා. සමහර අය මාධ්‍යවලටත් එසේ කියනවා මට ඇහිලා තිබෙනවා. මේක වැරැදි මතයක්. අපේ රටේ පරිපාලන සේවයේ සහ නිලධාරින්ගේ කටයුතු මා දකින්නේ සුබවාදිවයි. නිදහසින් පසු මේ දක්වා අපේ රට යම් දියුණුවක් අත් පත් කරගෙන තිබෙනවා. සමාජ ආර්ථිකමය කරුණු පැත්තෙන්, අධ්‍යාපනය, සෞඛ්‍ය පැත්තෙන් ලෝකයේ දියුණු රටවල් මට්ටමටම අපේ රටත් දියුණු වෙලා තිබෙනවා. මේ දියුණුව ලබා ගත්තේ හුදෙක්ම දේශපාලනඥයන් නිසා පමණක් නොවෙයි. රාජ්‍ය නිලධාරින් කැප වෙලා කටයුතු කිරීම තමයි මේ දියුණුව ලබා ගැනීමට එක් හේතුවක් වුණේ. ඒ වාගේම, අපේ රටේ ග්‍රාමීය සෞඛ්‍ය ගත්තොත්, ප්‍රාථමික සෞඛ්‍ය ක්‍රියාවලිය ගත්තොත්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය රාජ්‍ය නිලධාරිනිය විධියට ගෙයින් ගෙට ගිහින් දැනුවත්භාවය ලබා දීලා තමයි ඒ ප්‍රගතිය ලබාගෙන තිබෙන්නේ. නිදහස් අධ්‍යාපනයෙන් ප්‍රතිඵල ගත් අතිබහුතර රාජ්‍ය නිලධාරින් පිරිසක් රට වෙනුවෙන් කැප වෙලා කටයුතු කරන අතර, දේශපාලනඥයන් වාගේම රාජ්‍ය නිලධාරින් සුළු පිරිසකගේ වැරැදි ක්‍රියා මාර්ග නිසා මේ රටේ සංවර්ධනය, දියුණුව අඩාළ වෙලා තිබෙනවා කියන එකත් අප පිළිගත යුතුයි; තේරුම් ගත යුතුයි. මේ රටේ සමස්ත රාජ්‍ය නිලධාරින්ගෙන් අතිබහුතරයක් නියෝජනය කරන අවංක හොඳ රාජ්‍ය නිලධාරින් මේ ජාතික විගණන පනතට බය විය යුතු වන්නේ නැහැ. මේක තමයි යථාර්ථය. සුළුතරයකගේ වුවමනාවට අපි බය විය යුතු වන්නේත් නැහැ. මේක තමයි අපි තේරුම් ගන්න ඕනෑ. වර්තමානයේ රටේ සිදු වන දේවල් දිහා බැලුවාම, මේ ජාතික විගණන පනත් කෙටුම්පත ගෙන ඒම තුළින් දේශපාලනඥයන්ගේත්, රාජ්‍ය නිලධාරින්ගේත් ආරක්ෂාව ශක්තිමත් කර ගන්න පුළුවන්කමක් ලැබෙනවා කියන එකයි මා පෞද්ගලිකව දකින්නේ. ඒ වාගේම, මේ මඟින් ජනතාවගේ මුදල්වලින් උපරිම ප්‍රයෝජනයක් රටට ලබා ගන්න පුළුවන්කමක් ලැබෙනවා කියන එකයි මගේ විශ්වාසය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප දකින සමහර සිද්ධි ගත්තොත් ඒවා අපි දකින්න අකැමැති ඒවායි. දේශපාලනඥයන් විවිධ වැරැදිවලට හසු වෙලා විවිධ දඬුවම් ලබනවා. අපි ඒවා දකින්න කැමැති නැහැ. නිලධාරින් විවිධ වැරැදිවලට හසු වෙලා දඬුවම් ලබනවා. ඒ නිලධාරින්ගේ විශ්‍රාම වැටුප අහිමි වෙනවා. නිලධාරින්ගේ පෞද්ගලික දේපළ විකුණා නීතිඥයන්ට සල්ලි ගෙවන්න අද සිද්ධ වෙලා තිබෙනවා. ඔවුන්ට බන්ධනාගාරගත වෙන්න අද සිද්ධ වෙනවා.

මේවා සිද්ධ වෙන්නේ විශේෂයෙන්ම ඒ නිලධාරින් විධියට කටයුතු කිරීමේදී සිදු වුණු අඩු පාඩුකම් නිසයි. සමහර විට නොදැනුවත්ව වෙන්න පුළුවන්. සමහර විට වංචාසහගත චේතනාවෙන් වෙන්න පුළුවන්. මම හිතන විධියට මේ දෙකම නීතිය ඉදිරියේ එක සමානයි. එම නිසා මෙවැනි පනතක් ගෙන ඒම තුළින් අපේ රටේ රාජ්‍ය ආයතනවල මූල්‍ය කටයුතු විධිමත් කිරීමට අවස්ථාව උදා වෙලා ඉදිරි අනාගතයේ දී දේශපාලනඥයන්ගෙන් වෙන්න පුළුවන්, නිලධාරින්ගෙන් වෙන්න පුළුවන්, අද අපට දකින්න ලැබෙන අමිහිරි සිද්ධීන් ඉදිරියේ දී දකින්න සිදු නොවෙයි කියන විශ්වාසයක් තමයි මා තුළ තිබෙන්නේ. එම නිසා මේ ඉදිරිපත් කර තිබෙන ජාතික විගණන පනත් කෙටුම්පත රටේ සංවර්ධනයට බාධාවක් වෙන්නේ නැහැ. අවංකව කටයුතු කරන නිලධාරින් මොනම ආකාරයකටවත් මේ පනත් කෙටුම්පතට බිය විය යුතු වන්නේ නැහැ. මේක තමයි ඇත්ත යථාර්ථය. විශේෂයෙන්ම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියටත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අද දක්වා අවුරුදු 14ක් තිස්සේ සිටින සාමාජිකයකු විධියටත්, මේ රාජ්‍ය ආයතනවල සිදුවන කටයුතු පිළිබඳව මට අත් දැකීම් තිබෙනවා. රාජ්‍ය ආයතනවල මොනවාද සිද්ධ වෙන්නේ, රාජ්‍ය නිලධාරින් කොහොමද කටයුතු කරන්නේ කියන එක පිළිබඳව. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියට ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මේ සංශෝධන ඉදිරිපත් කළේ අපි මුහුණ දීපු අත් දැකීම්වලිනුයි. මේක තමයි ඇත්ත යථාර්ථය. ඒ වාගේම, විගණකාධිපතිවරයා ශක්තිමත් කිරීම; විගණන කොමිෂන් සභාව ශක්තිමත් කිරීම; විගණකාධිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම නොවෙයි මෙයින් සිද්ධ වෙන්නේ. මේක වැරැදි විධියට අර්ථ දක්වන්න හොඳ නැහැ.

වර්තමාන විගණකාධිපති ගාමිණී විජේසිංහ මහත්මයා ශක්තිමත් කිරීමක් නොවෙයි මෙයින් සිද්ධ වෙන්නේ. විගණන කොමිෂන් සභාව ශක්තිමත් කිරීමක් නොවෙයි. මේ ශක්තිමත් කිරීම පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමක් විධියටයි අපි දැකිය යුතු වන්නේ. ඇයි එහෙම කියන්නේ? අපි පාර්ලිමේන්තුවෙන් හැම අවුරුද්දකම අය වැය මඟින් මුදල් වෙන් කරනවා. පාර්ලිමේන්තුවෙන් වෙන් කරපු එම මුදල් රාජ්‍ය ආයතන, අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් ඉදිරිපත් කරපු චක්‍රලේඛවලට අනුව, පාර්ලිමේන්තුවම සකස් කරපු නීති-රීතිවලට අනුව වියදම් කළාද කියා සොයා බලා සෑම අවුරුද්දකම විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වෙනවා. පාර්ලිමේන්තුව වාර්ෂිකව අය වැය මඟින් අදාළ ආයතනවලට වෙන් කරන මුදල් නිසි පරිදි ඒ ආයතන වියදම් කළාද කියලා සොයා බලන්නේත් මේ පාර්ලිමේන්තුවමයි. පාර්ලිමේන්තුවට තනියම මේ කාර්ය භාරය කරන්න පුළුවන්කමක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ අපි එකතු වෙලා අය වැය සම්මත කරනවා. අය වැය සම්මත කිරීම අපි මේ පාර්ලිමේන්තුව තුළ කළත්, අපි අනුමත කරන මුදල් රාජ්‍ය ආයතන හරි හැටි වියදම් කළාද කියලා අපි බලන්නේ විගණකාධිපතිවරයාගේ වාර්තාව අනුවයි. විගණකාධිපතිවරයාගේ වාර්තාව අපි සියයට සියයක්ම පිළිගත යුතුයි කියලා සම්ප්‍රදායක් නැහැ; නීතියක් නැහැ. ඒ අදාළ කරුණු සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා ඉදිරිපත් කරන වාර්තාව පිළිබඳව අදාළ නිලධාරිනුත් කැඳවලා අවසාන තීන්දුව, තීරණය ගන්නේ මහජන නියෝජිතයන් විධියට අපියි. මේක තමයි ඇත්ත; යථාර්ථය.

විගණකාධිපතිවරයා කරන කටයුතු අවසානයේ වාර්තා කරන්නේ කොහේටද? එතුමා වාර්තා කරන්නේ පාර්ලිමේන්තුවට. විගණකාධිපතිවරයා අවුරුද්දක් තුළ කරන කටයුතු ඊළඟ අවුරුද්දේ මාස 10ක් ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයි. ඒ නිසා මේ නව පනත් කෙටුම්පත තුළ යම් හෙයකින් විගණකාධිපතිවරයා වැරැදි විධියට අධිභාරයක් කර තිබෙනවා නම් ඒ පිළිබඳව බලන්න, විගණකාධිපතිවරයාගේ වාර්තාවේ කාර්ය සාධනය බලන්න මේ පාර්ලිමේන්තුවට අවස්ථාව තිබෙනවා. එම නිසා ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ සංශෝධන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපතිවරයා විධියට මමත් අනුමත කරනවා. මේවා විය යුතු සංශෝධන. අපි ජාතික විගණන පනත් කෙටුම්පත ගේනවා කියලා නමට ජාතික විගණන පනත් කෙටුම්පතක් ගෙන එම තුළින් බලාපොරොත්තු වන අරමුණු ඉටු කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. හැබැයි, මෙහෙම හෝ පනතක් නොමැති අවස්ථාවක, මෙහෙම හෝ පනත් කෙටුම්පතක් ගෙන ඒම පිළිබඳව අපි සතුටු විය යුතුයි.

එතකොට කලින් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පනත සංශෝධනය කරන්න බලපාන කරුණු අපි රටට කියන්න ඕනෑ. උදාහරණයක් විධියට ගත්තොත් රාජ්‍ය මූල්‍ය අවභාවිතාවක් සම්බන්ධයෙන් ගෙවිය යුතු දඩය ලක්ෂයක් හැටියට තිබුණු මුදල රුපියල් 5,000ට අඩු කරනවා නම් අඩු කරන්නේ ඇයි කියන එක රටේ ජනතාව දැන ගන්න ඕනෑ. මේ රුපියල් ලක්ෂයක දඩය, රුපියල් 5,000ට අඩු කිරීම පිළිබඳව අදහස් ඉදිරිපත් කරන අය ඒක රටට කියන්න ඕනෑ. ඒ අනුව අපි දකින පැත්ත වැරැදි නම්,

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

නිවැරදි කර ගන්න අපි සූදානම්. ඒකයි ඇත්ත කථාව. අපි කියන දේ හරියි කියලා අපි කියන්නේ නැහැ. අපි කියන දේම කියන්න ඕනෑය කියන තැන අපි නැහැ.

එම නිසා අපි මේ විගණන පනත් කෙටුම්පත යථාර්ථයක් බවට පත් කර ගන්න නම්, විගණකාධිපතිවරයා සහ විගණන කොමිෂන් සභාව ශක්තිමත් කිරීම අනිවාර්යයෙන්ම කළ යුතුයි. එසේ ශක්තිමත් කළොත් පමණයි, මෙහි සැබෑ පරමාර්ථය හා අරමුණු අපට ඉටු කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ. මෙහිදී විගණකාධිපතිවරයා හා විගණකාධිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම එම දෙපාර්තමේන්තුව සහ කොමිෂන් සභාව ශක්තිමත් කිරීමක් නොවෙයි, පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමක් කියන එක අපි අවබෝධ කර ගත යුතුව තිබෙනවා. මේක තමයි යථාර්ථය. මේ පනත් කෙටුම්පත 2015 කැබිනට් එක අනුමත කළා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. ඊට පස්සේ මේ පිළිබඳව විවිධ සංවාද ඇති වුණා. නමුත් විවිධ හේතූන් නිසා මෙය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වුණා. අතිගරු ජනාධිපතිතුමාත් මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කළා. ප්‍රමාද වෙලා හෝ මේ පනත් කෙටුම්පත මේ ආකාරයෙන් ගෙන ඒමට අවස්ථාව ලැබීම පිළිබඳව අපි සතුටු වෙන්න ඕනෑ. ප්‍රමාදවෙලා හරි මේ ආකාරයෙන් මේ පනත් කෙටුම්පත ගෙන ඒමට කටයුතු කිරීම පිළිබඳව ජනාධිපතිතුමාටත්, අග්‍රාමාත්‍යතුමාටත් අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. හැබැයි, මේ සංශෝධන ඉදිරිපත් කරනවාය කියලා මේක කල් දමන්න පුළුවන්කමකුත් නැහැ. මේක කල් දැමිය යුතු වන්නේත් නැහැ. නමුත් මේ ඉදිරිපත් කළ සංශෝධන අපට අනවශ්‍යයි කියලා අහක දමන්න පුළුවන්කමකුත් නැහැ. අහක දැමිය යුතු වන්නේත් නැහැ. අනිවාර්යයෙන්ම අපි මේ පිළිබඳව තීරණයක් ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව සතු බලතල නිසා අපේ කාරක සභාවලට නිලධාරින් සහභාගි වන බව අපි දන්නවා. නමුත් විවිධ අය සහභාගි වන්නේ නැහැ. අපි කියපු පළියට සියයට 100ක්ම සහභාගි වෙනවා කියලා අපි කියන්නේ නැහැ. සමහර අය අපේ කාරක සභාවලට කැඳෙව්වාට පස්සේ විදේශ රටවලට යනවා. සියයට 100ක්ම නොවෙයි, සියයට 10ක් විතර. සියයට 90ක්ම නිලධාරින් අපේ කාරක සභාවලට පැමිණෙනවා.

නමුත්, අපේ කාරක සභාවලට සමහර නිලධාරින් කැඳෙව්වාම රෝහල්ගත වෙනවා. රෝහල්ගතවී වෛද්‍ය වාර්තා එවනවා. එවැනි අවස්ථා අනන්තවත් අපේ කාරක සභාවල දකින්න තිබෙනවා. නිලධාරින් අදාළ කාරක සභාවට ආවේ නැති වුණාම පැමිණෙන නිලධාරියා කියන්නේ මොකක්ද? "අහවල් නිලධාරියාගෙන් අහලා මේක වාර්තා කරන්නම්" කියලා කියනවා. එතකොට මේ ක්‍රියාවලිය සාර්ථක වෙන්නේ නැහැ. එම නිසා, විගණකාධිපතිවරයාට අවශ්‍ය කරන නිලධාරින් කැඳවීමේ බලය අනිවාර්යයෙන් විගණකාධිපතිවරයාට ලබා දිය යුතුයි. මෙහිදී නිලධාරින්ට බේරීමේ අවශ්‍යතාවක් ඇති වන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ පිළිබඳව විශේෂයෙන්ම අභ්‍යන්තර විගණනය, විගණන කමිටුවල අපට අනන්තවත් උදාහරණ තිබෙනවා. මේ විගණන කමිටු කැඳවුවාම, ආයතනයක සිදුවන අඩු පාඩුකම් නිවැරැදි වනවා. ඒ නිසා අපි මේවා තවත් ධෛර්යමත් කරන්න ඕනෑ; මේවා ශක්තිමත් කරන්න ඕනෑ. මෙවැනි ආකාරයට විගණන කමිටුවක් කැඳවීම නිලධාරින්ට කරන හිරිහැරයක් නොවෙයි; ඒ ආයතනයට කරන හිරිහැරයක් නොවෙයි; සංවර්ධන ක්‍රියාවලියට කරන බාධාවක් නොවෙයි. ආයතනයක් විසින් අවුරුද්දකට කැඳවිය යුතු විගණන කමිටු ගණන හතරයි. මේ විගණන කමිටු කැඳවීම තවත් ශක්තිමත් කළ යුතුයි; අනිවාර්ය කළ යුතුයි. ඒ වාගේම අභ්‍යන්තර විගණනය තවත් ශක්තිමත් කළ යුතුයි; අනිවාර්ය කළ යුතුයි. මෙවැනි දේවල් ශක්තිමත් කිරීම තුළින් නිලධාරින්ට ගැටලුවකින් තොරව කටයුතු කිරීම සඳහා අවස්ථාව ලැබෙනවා මිස, වෙනත් කරදරයක් සිද්ධ වෙන්නේ නැහැ කියන කාරණය අවබෝධ කරගන්න ඕනෑ.

එම නිසා සැමවිටම අපි උත්සාහ කරන්නේ, අපි දකින්නේ, මෙවැනි දේවල් සඳහා නීතිරීති ගෙනෙන්නේ ඇයි කියන කාරණයයි. අපට තිබෙන අත් දැකීම් අනුව අපි දන්නවා, රාජ්‍ය මුදල් විවිධ ආකාරයෙන් අවභාවිත වුණාට පසු, වංචාවන්, දූෂණයන් සිද්ධ වුණාට පසු කොපමණ පශ්චාත් පරීක්ෂණ කළත්, කොපමණ වාර්තා ඉදිරිපත් කළත්, ඒ නැති වුණු මුදල්වල නිසි ඵලදායිකත්වයක් රටේ ජනතාවට ලැබෙන්නේ නැහැ; රටට ලැබෙන්නේ නැහැ කියන කාරණය. ඒ නිසා, අඩු පාඩුකම් නොවන පරිදි මේ කටයුතු සිද්ධ කරගන්න පුළුවන් නම්, ඒක තමයි හොඳම දේ.

මෙවැනි විගණන පනත් කෙටුම්පතක් ගෙන ඒම හරහා අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම තුළින්; විශේෂයෙන්ම විගණන කමිටු ශක්තිමත් කිරීම තුළින්, මේ ආයතනවල සිදුවන අඩු පාඩුකම් අඩු වෙනවා. එහෙම අඩු වුණාට පසුව ඒ මුදල්වලින් උපරිම ප්‍රයෝජනයක් රටට ලැබෙනවා. එවිට නිලධාරින්ට ගැටලුවක් ඇති වන්නේ නැහැ. එම නිසා මේ පිළිබඳව අප අවංකව සිතා බලා කටයුතු කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නැවත නැවතත් සඳහන් කරන්නේ, මේ විගණන පනත් කෙටුම්පත ගෙන ඒම තුළින් "පාර්ලිමේන්තුව තමයි අපි ශක්තිමත් කරන්නේ" කියන කාරණය අපි අවබෝධ කරගත යුතු බවයි. එය තවදුරටත් ශක්තිමත් කරගැනීම සඳහා පක්ෂ භේදයෙන් තොරව අප සියලුදෙනාගේම සහයෝගය; දායකත්වය දෙමුය කියන ඉල්ලීම කරමින්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාගේ සංශෝධනවලට අපගේ සහයෝගයත් ලබා දෙන බව සඳහන් කරමින් මම නිහඬ වනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

මීළඟට, ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි විස්සක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.09]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
சபைக்குத் தலைமைதாங்குகின்ற கௌரவ உறுப்பினர் அவர்களே, இன்றைய விவாதப் பொருளாகத் தேசியக் கணக்காய்வுச் சட்டமூலம் பற்றிய விடயம் சபையில்

கருத்தாடப்படுகின்றது. தேசியக் கணக்காய்வு என்பதைவிட, "சகல நிறுவனங்களிலும் கணக்காய்வு" என்பது மிக முக்கியமான, தேவையான ஒரு விடயமாக அமைந்திருக்கின்றது. எமது மிக முக்கியமான வளங்களின் வரிசையில் நிதி வளம் என்பது பிரதானமானதாகக் காணப்படுகின்றது. இந்த நிதியினைக் கையாளுதலின்போது, கையாளல், கையாடல் என்ற இரு விடயங்கள் இடம்பெறுகின்றன; கையாளல் நடைபெறுகின்றபோது, கையாடல்களும் நடைபெற்றுக் கொண்டிருக்கின்றன. அந்த அடிப்படையில் இந்த நிதியினை எவ்வாறு கையாள வேண்டும்? எவ்வாறு கையாளக்கூடாது? என்ற விடயங்கள் தொடர்பாக நாங்கள் கவனம் செலுத்த வேண்டியவர்களாக இருக்கின்றோம்.

எமது நாட்டின் நிதி வளம் எந்தளவிற்குத் துஷ்பிரயோகம் செய்யப்பட்டிருக்கின்றது என்கின்ற விடயம் பாராளுமன்றத்தில் காரசாரமான விவாதங்களுக்குட்பட்டு வருகின்றது. இந்த நாடு தொடர்ந்தும் அபிவிருத்தியடைந்து வரும் நாடு என்று சொல்லப்பட்டு வருவதற்கு ஒரு காரணமாக அமைந்திருப்பது இந்த நிதிக் கையாள்கையில் காணப்படுகின்ற கையாடல்கள்தான். “விரலுக்குத் தக்க வீக்கம் - ஆளுக்குத் தக்க ஊழல்” என்று சொல்வார்கள். அதுபோன்று இந்த நிதிக் கையாடல் விடயங்களை எடுத்துக்கொண்டால், சிறியவர்கள் இந்த நிதிக் கையாடல்களைச் செய்கின்றபோது, அவை சிறியளவாக இருக்கின்ற அதேவேளையில், பெரியவர்கள் செய்கின்ற கையாடலின் அளவு உயர்ந்துகொண்டு போவதையே காணமுடிகின்றது. எனவே, இந்தக் கையாடல்கள் கட்டாயம் தவிர்க்கப்படல் வேண்டும். நிதித்துறையில் கையாடல்கள் இருக்குமாக இருந்தால், இந்த நாட்டின் அபிவிருத்தியென்பது ஓர் எதிர்மறையான நிலையில் காணப்படக்கூடிய வாய்ப்பிருக்கின்றது. எனவே, நிதியினைக் கணக்காய்வு செய்யவேண்டியது அவசியம். அதற்கான சட்டமூலம் நிறைவேற்றப்படுவதும் முக்கியமான ஒன்றாகும்.

குறிப்பாக, இந்த நிதிக் கையாள்கை என்ற விடயத்தை எடுத்துக்கொண்டால், இந்த விடயத்தில் வெளிப்படைத் தன்மை இருக்கின்றதா? நம்பகத் தன்மை இருக்கின்றதா? பொறுப்புக்கூறுகின்ற தன்மை இருக்கின்றதா? தகவலறியும் உரிமைச் சட்டத்திற்கேற்ப இதனைச் சகலரும் அறிந்து கொள்ளக்கூடிய இலகு வழிகள் இருக்கின்றனவா? என்கின்ற விடயங்களை நாங்கள் புரட்டிப் பார்க்க வேண்டியிருக்கின்றது. எமது நாட்டில் அபிவிருத்திக்காகப் பயன்படுத்தப்படுகின்ற நிதியில் 30 வீதத்திலிருந்து 40 வீதம் வரை அபகரிக்கப்படுவதாக அல்லது சுரண்டப்படுவதாக அல்லது தனிப்பட்ட தரகுப் பணங்களாக அல்லது ‘கொமிஷன்’களாகக் கொண்டு செல்லப்படுவதாகக் கூறப்படுகின்றது. இந்த விடயம் சம்பந்தமாக கௌரவ பிரதம மந்திரி அவர்களும் பிரஸ்தாபித்திருந்தார். நிதியைக் கையாள்கின்ற விடயத்தில் காணப்படுகின்ற வழுக்கள் அல்லது வேண்டுமென்று செய்யப்படுகின்ற அபகரிப்புக்கள் அல்லது சம்பந்தப்பட்டவர்கள் தனிப்பட்ட முறையில் தங்களின் பணப் பைகளை நிரப்பிக்கொள்கின்ற செயற்பாடுகள் மூலமாக நிதி வீண் விரயம் செய்யப்படுகின்றது; அதாவது, மோசடி செய்யப்படுகின்றது. எனவே, இந்த ஊழல், மோசடி, இலஞ்சம் போன்றவை இந்த நாட்டில் கட்டுப்படுத்தப்பட வேண்டும் அல்லது அகற்றப்பட வேண்டும். இவை அகற்றப்படாமல் இருக்கின்ற வரைக்கும், குறிப்பிட்ட ஓர் அதிகார வர்க்கம் அல்லது முதலாளித்துவ வர்க்கம் மேலும் மேலும் அபிவிருத்தியடைந்து கொண்டு செல்ல, வறுமைக் கோட்டின்கீழ் வாழ்கின்ற சாதாரண தொழிலாளர் வர்க்கம் தொடர்ந்தும் வறுமை நிலைக்குள் வாழக்கூடிய நிலைமை காணப்படும்.

இந்த நாட்டில் அபிவிருத்திக்காகப் பல துறைகளில் செலவுகள் செய்யப்படுகின்றன. தேசிய கணக்காய்வு சட்டமூலத்தின் அடிப்படையில் இவ்வாறு செலவு செய்யப்படுகின்ற நிதிகள் வினைத்திறன் மிக்கதாகச் செலவு செய்யப்படுகின்றனவா? அதன் விளைதிறன்கள் எவ்வாறு இருக்கின்றது? நாங்கள் உற்பத்திக்காகச் செய்கின்ற உள்ளீடுகளில் எங்களுக்குக் கிடைக்கின்ற வெளியீடுகள் எவ்வாறு இருக்கின்றன? உற்பத்தித்திறன் எவ்வாறு இருக்கின்றது? என்ற விடயங்கள் பற்றிக் கவனமாகப் பரிசீலிக்கப்பட வேண்டியிருக்கின்றது. இந்தப் பரிசீலனைகள் மூலமாக இந்த நிதி எந்தளவுக்கு வினைத்திறன்மிக்கதாகப் பயன்படுத்தப்பட்டிருக்கின்றது? அல்லது அந்த நிதி எவ்வளவு வீண் விரயம் செய்யப்பட்டிருக்கின்றது? என்கின்ற விடயம் பற்றி ஆராய வேண்டியிருக்கின்றது.

இன்று அரசு சார்ந்த பல நிறுவனங்கள் நட்டத்தில் இயங்குகின்ற ஒரு நிலைமை காணப்படுகின்றதென்றால், அந்த நிறுவனங்களின் நிதிக் கையாளுகை மோசமாக இருக்கின்றது என்றுதான் கூறவேண்டும். குறிப்பாக விமானச் சேவையோடு சம்பந்தப்பட்ட விடயங்கள் கடந்த காலத்தில் எவ்வாறு இருந்தன என்பது பற்றிக் கூறப்பட்டது. அது நட்டத்தில் இயங்குவது பற்றியும் கூறப்பட்டிருந்தது. எனவே, அரச நிறுவனங்கள் நட்டத்தில் இயங்குகின்றன, அரச துறைகள் வினைத்திறன் அற்ற நிலையில் செயலிழந்து போகின்றன என்கின்ற விடயங்கள் எல்லாம் பேசப்பட்டுக் கொண்டு வந்தாலும்கூட, அந்த நிலைமையில் இருந்து மீண்டு, இலாபகரமான முறையில் முன்னேறிச் செல்வதற்கு ஏற்ற விதத்தில் என்ன நடவடிக்கை மேற்கொள்ளப்பட்டிருக்கின்றது என்ற விடயத்திலும் கவனம் செலுத்தப்படல் வேண்டும்.

யுத்த காலத்தின்போது அதிகளவான தங்கம் அந்தப் பிரதேசங்களில் இருந்து பெறப்பட்டதாகக் கூறப்படுகின்றது. தொலைக்காட்சியில் நான் ஒரு விடயத்தைப் பார்க்கக் கூடியதாக இருந்தது. அதாவது சாதாரண பெண் ஒருவர் “அந்தக் காலத்தில் பொருளாதாரத் தேவைக்காக 22 பவுண்களை நான் அடைமானம் வைத்திருந்தேன். ஜனாதிபதித் தேர்தலின்போது அதில் ¼ பவுண் மாத்திரம்தான் எனக்குத் தரப்பட்டது” என்று சொல்லி அந்தத் தொலைக்காட்சி நிகழ்ச்சியில் கண்ணீர் வடிக்கின்றார். ஆகவே, இந்த நிதி மற்றும் பெறுமதியான திரவியங்கள் விடயத்தில் நாங்கள் எந்தளவுக்கு வெளிப்படைத் தன்மையாக அல்லது நம்பகத் தன்மையாக, பொறுப்புக்கூறக்கூடிய அல்லது வகைகூறக் கூடிய விதத்தில் நடந்திருக்கிறோம் என்பதைப் பற்றி நாமே எம்மை ஆய்வு செய்ய வேண்டிய ஒரு நிலையில் நாங்கள் இருக்கின்றோம். எனவே, தேசிய கணக்காய்வு சட்டத்தின் மூலமாக பல்வேறு விடயங்கள் ஆய்வுக்குட்படுத்தப்பட வேண்டும். குறித்த விடயங்கள் ஆய்வுகள் செய்யப்பட்டு அறிக்கைகளாகக் குவிக்கப்பட்டிருந்தால் மாத்திரம் போதாது. அந்த அறிக்கைகள்மூலம் யார் யார் மோசடிகள் செய்திருக்கிறார்கள், யார் யார் ஊழல்கள் செய்திருக்கிறார்கள், யார் யார் அரச நிதியினை ஏப்பம் விட்டிருக்கிறார்கள் என்கின்ற விடயங்கள் வெளிக்கொணரப்பட வேண்டும். அவ்வாறு வெளிக்கொணரப்படுகின்றபோது மோசடிகள், ஊழல்கள், இலஞ்சங்களைக் களைவதற்குரிய வாய்ப்புகள் அதிகமாக இருக்கும்.

இன்று தனியார்துறைகளை எடுத்துக்கொண்டால், அவை இலாபமீட்டும் துறைகளாக மிகவும் கம்பீரமாக நடைபோட்டுக் கொண்டிருக்கின்றன. அரச துறைகளை எடுத்துக் கொண்டால், அவை மிகவும் நட்டமடைந்த துறைகளாக அல்லது மூடப்படக்கூடிய துறைகளாக மாறிக் கொண்டிருக்கின்றன.

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

இதற்கான காரணம் என்ன? அரசினால் இயக்கப்பட்டு வந்த பல தொழிற்சாலைகள் இன்று மூடப்பட்டுக் கிடக்கின்றன. அதாவது, அரசினால் செயற்படுத்தப்பட்டு வந்த பொருளாதார முக்கியத்துவம்வாய்ந்த தொழிற்சாலைகள் இன்று செயற்பட முடியாத நிலையில் காணப்படுகின்றன. அப்படியென்றால் அரச துறைகளினால் இலாபத்தை ஈட்டக்கூடிய விதத்தில் எதனையும் செய்யமுடியாத நிலை எழுந்துள்ளது. இதனால் எமது மக்கள் அதிகமானோர் வறுமைக்கோட்டின்கீழ் வாழக்கூடிய நிலைமை காணப்படுகின்றது.

'அபிவிருத்தி' என்கின்ற சொல் வார்த்தையளவில் இருந்தால் போதாது; வாசகங்களாக இருந்தால் போதாது; கோட்பாடுகளாக இருந்தால் போதாது. செயற்பாடுகளை அடையவேண்டும். செயற்பாடுகள் இல்லாத கோட்பாடுகள் எமது நாட்டுக்கு உதவாத கருத்துக்களாகத்தான் இருக்க முடியும். எனவே, தேசிய கணக்காய்வுச் சட்டத்தின்மூலம் ஒவ்வொரு துறையும் முறையாகக் கணக்காய்வு செய்யப்பட வேண்டும். இந்தக் கணக்காய்வுகள்மூலமாக வெளிப்படைத் தன்மையுடன் விடயங்கள் வெளிக்கொணரப்பட்டு, குறித்த நிதியினைக் கையாடல் செய்கின்றவர்கள் யார்? என்பது வெளிப்படுத்தப்படுவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டாக வேண்டும். எனவே, ஒவ்வோர் அரச துறையிலும் கணக்காய்வுக்குப் பொறுப்பாக இருக்கின்றவர்கள் இந்த விடயத்தில் மிகக் கவனமாகச் செயல்படவேண்டும். யார் தவறுகளை இழைத்திருந்தாலும் அந்தத் தவறுகளை வெளிக் கொணரக்கூடிய விதத்தில் சம்பந்தப்பட்டவர்கள் செயற்பட வேண்டிய தேவை இருக்கின்றது.

அரச நிறுவனங்கள் சரியான முறையில் கொண்டு செல்லப்படுவதற்குரிய விதப்புரைகளும் கணக்காய்வுகளும் வெளிப்படுத்தப்பட்டு, குற்றமிழைத்தவர்கள்மீது நடவடிக்கை எடுப்பதற்கான தேவை இன்று உணரப்படுகின்றது. இந்த நாடு சுதந்திரம் அடைந்ததன் பின்னர் 70 ஆண்டுகள் ஆட்சி நடாத்தப்பட்டிருக்கின்றது அல்லது காலம் கடந்திருக்கின்றது. இந்த 70 ஆண்டுக் காலத்தில் என்ன விடயம் சாதிக்கப் பட்டிருக்கின்றது? அரச துறைகள் எந்தளவுக்கு வளர்க்கப் பட்டிருக்கின்றன? அரச துறைகளில் நிதி மோசடிகள் செய்யப்படுவது அல்லது கபளீகரம் செய்யப்படுவது எந்தளவுக்குத் தடுக்கப்பட்டிருக்கின்றது? என்கின்ற கேள்வி களுக்கான விடை தொக்குநிற்கின்றது. எனவே, அரச கணக்காய்வுத் துறையானது இந்த விடயத்தில் கூடிய கவனம் செலுத்தவேண்டும். அதேநேரம் ஆளுமைமிக்க தலைவர்கள் மூலமாக அரச கணக்காய்வுத் துறையானது நிருவகிக்கப்படல் வேண்டும்.

இன்று இலஞ்சம் என்பது பஞ்சமில்லாத அளவுக்கு எங்கும் இடம்பெற்றுக்கொண்டிருக்கிறது. அதேநேரத்தில் இலஞ்சத்தில் 'பாலியல் இலஞ்சம்' என்ற விடயம் ஒரு புதுவடிவமாகத் தோற்றம் பெற்றிருப்பதையும் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. பாடசாலைகளுக்கு மாணவர்களை அனுமதிக் கின்ற விடயத்தில்கூட இலஞ்சம் பெறுகின்ற கலாசாரம் உருவாகியிருக்கின்றது. மாணவர்களுக்குச் சமத்துவமான கல்வி வழங்கப்படுகின்ற நிலையங்களான பாடசாலைகளில் கூட பணம் இலஞ்சமாகப் பெறப்படுகின்றது. ஆனால், இது சம்பந்தமாக விசாரணை செய்து, தயாரிக்கப்படுகின்ற அறிக்கைகள் சிலவேளைகளில் அப்படியே கிடப்பில் போடப்படுகின்றன. அதேநேரம் குற்றமிழைத்தவர்களைத் தப்பிக்க வைக்கக்கூடிய செயல்பாடுகளும் இடம்பெற்றுக் கொண்டிருக்கின்றன. எனவே, பாடசாலை போன்ற அரச நிறுவனங்களில் மாணவர்கள் அனுமதியின்போது, பாடசாலையின் அபிவிருத்தியென்று முலாம் பூசிக்கொண்டு ஏதோ ஒரு வடிவத்தில் இலஞ்சம் வாங்கப்படுகின்ற நிலைப்பாடுகளைக் கண்டறிந்து, அவ்வாறு செயற்பாடுகளில் ஈடுபடுகின்றவர்கள்மீது முறையான நடவடிக்கைகள் எடுக்கப்படவேண்டும். இதில் காலதாமதங்கள் இருக்கக் கூடாது.

சரியாக இயங்குகின்ற நிறுவனத் தலைவர்களை நாங்கள் பாராட்டுகின்ற அதேவேளையில், இலஞ்சங்களைப் பெற்று, மோசடிகள் செய்கின்றவர்களுக்கு உரிய தண்டனைகளைக் காலதாமதம் இல்லாமல் வழங்கவேண்டும் என்று கேட்டுக் கொள்கின்றோம். சில உயர்தரப் பாடசாலைகளிலும் இவ்வாறான இலஞ்சம் மற்றும் மோசடிகள் இடம்பெறுகின்ற நிலைமை காணப்படுகின்றது. இவை சம்பந்தமாக விசாரணை செய்யப்பட்டு, அறிக்கைகள் தயாரிக்கப்பட்டிருக்கின்றன. எனினும், அதற்குரிய நடவடிக்கைகள் இன்னும் எடுக்கப்படாத நிலைமை காணப்படுகின்றது. எனவே, இலஞ்சம், மோசடி களில் ஈடுபடுகின்றவர்கள் யாராக இருந்தாலும் அவர்கள்மீது நடவடிக்கை எடுக்கும்போது தயவு தாட்சணியம் காட்டாமல் நல்லாட்சியின் தர்மத்தை அதன்மீது செலுத்தவேண்டுமென்று இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். அதேவேளை, நட்டமடையக்கூடிய துறைகளாகத் தொடர்ந்தும் அரச துறைகள் இல்லாமல், இலாபத்தை ஈட்டக்கூடிய துறைகளாக அவற்றை மாற்றுவதற்குரிய வழிமுறைகளையும் செயல்பாடு களையும் கொண்டுசெல்ல வேண்டியவர்களாக நாங்கள் இருக்கின்றோம்.

வடக்கு, கிழக்குப் பிரதேசங்களைப் பொறுத்தமட்டில், இந்த அரசு பதவிக்கு வந்து மூன்று ஆண்டுகள் கடந்த நிலையிலும் அங்கு அபிவிருத்தி என்கின்ற விடயம் மந்தமான போக்கில்தான் காணப்படுகின்றது. அபிவிருத்தி விடயத்தில் கணிசமான அளவு உத்வேகமான தன்மை காணப்படவில்லை. ஆனால், இந்த அரசாங்கத்தின் பதவிக் காலத்தில் இன்னும் ஒன்றரை ஆண்டுகள் மீதமாக இருக்கின்றன. இந்த நிலையில் யுத்தத்தால் பாதிக்கப்பட்ட பிரதேசங்கள் இந்த ஒன்றரை ஆண்டுகளில் எவ்வாறு அபிவிருத்தி செய்யப்படப் போகின்றன? எவ்வாறு மேற்பார்வை செய்யப்படப் போகின்றன? அங்கு மக்களின் வறுமைநிலை நீங்கி, அவர்களுடைய வாழ்க்கை நிலை எவ்வாறு மேலோங்கச் செய்யப்படப்போகின்றது? என்ற பல கேள்விகள் இன்று எழுந்திருக்கின்றன.

இன்றைய நிலையில், இன்னுமொரு விடயத்தையும் சுட்டிக்காகட்டவேண்டிய ஒரு நிலைப்பாட்டில் நான் இருக்கின்றேன். அதாவது, வடக்கு, கிழக்கு மாகாணங்களை எடுத்துப்பார்க்கின்றபோது, குறிப்பாக வடபுலத்தை எடுத்துக் கொண்டால், அங்கு பல்வேறுபட்ட எதிர்மறையான கலாசாரங்கள் வளர்ந்துகொண்டு வருவதைக் காணலாம். குறிப்பாகப் போதைப்பொருட் பாவனை அதிகரித்துக்கொண்டு செல்கின்றது; மதுக் கலாசாரம் அதிகரித்துச் செல்கின்றது; வாள் வெட்டுக் கலாசாரம் உயர்ந்து கொண்டு செல்கின்றது. அதேபோன்று, வயது வேறுபாடுகளில்லாமல் பாலியல் துஷ்பிரயோகங்களும் அதிகரித்துக்கொண்டு செல்கின்றன. குழந்தையென்று பார்ப்பதில்லை, சிறுமியென்று பார்ப்ப தில்லை, தாய்மார்களென்று பார்ப்பதில்லை. பாட்டிகள் தொட்டு பூட்டிகள் வரைக்கும் பாலியல் கொடுமைகளுக்கு உட்படுத்தப்படுகின்ற நிலைமை வட புலத்தில் காணப் படுவதை எங்களால் அவதானிக்க முடிகின்றது. இன்று சட்டபூர்வமான படையினர் அங்கிருக்கின்றார்கள், சட்ட

பூர்வமான பொலிஸார் அங்கிருக்கின்றார்கள். இவ்வாறு இருக்கத்தக்கதாக அண்மையில் அங்கு ஆறு வயதுச் சிறுமி காம வெறியர்களால் கடத்திச் செல்லப்பட்டு, பாலியல் வல்லுறவுக்குட்படுத்தப்பட்டுக் கொல்லப்பட்டிருக்கின்றார். இப்படியான சூழ்நிலை எவ்வாறு உருவாகின்றது? யுத்த காலத்திலும் யுத்தத்திற்கு முற்பட்ட காலத்திலும்கூட இவ்வாறான பாலியல் துஷ்பிரயோகங்கள் காணப்படாத ஒரு பிரதேசத்தில் அத்தகைய செயற்பாடுகளை இன்று யார் மறைமுகமாக இருந்து ஊக்குவிக்கின்றார்கள்? கேரளக் கஞ்சா போன்ற போதை வஸ்துக்கள் தாராளமாக அந்த மண்ணுக்குக் கொண்டு செல்லப்படுவதற்கு யார் காரணமாக இருக்கின் றார்கள்?

ஒரு காலத்தில் 'கிரீஸ் மனிதர்'களைத் தயார் செய்து தமிழ்ப் பெண்களின் பண்பாட்டின்மீது பாய்ச்சல் செய்கின்ற ஒரு செயற்பாடு காணப்பட்டது. இப்போது 'ஆவா குழு' என்று சொல்லப்படுகின்றவர்கள்மூலம் அங்கு வாள்வெட்டுக் கலாசாரம் அதிகரித்துக்கொண்டு செல்கின்றது. பாலியல் துஷ்பிரயோகங்கள் அதிகரித்துக்கொண்டு செல்வதால் அங்கிருக்கின்ற பெண்கள் மிகவும் வேதனைப்படுகின்ற ஒரு சூழ்நிலை காணப்படுகின்றது' இந்த நிலையில், இராஜாங்க அமைச்சர் ஒருவர் கூறிய கருத்துத் தொடர்பாகக் கடந்த 3ஆம் திகதிய பாராளுமன்ற அமர்வின்போது அமளி துமளி ஏற்பட்டிருந்தது. குறித்த விடயம் பற்றிச் சிலவற்றை உண்மையில் நாங்கள் ஏற்றுக்கொண்டுதான் ஆக வேண்டும். ஏனென்றால், இன்று சட்டம், ஒழுங்கு பேணப்படாத ஒரு சூழ்நிலையை வைத்துக்கொண்டு, பாலியல் துஷ்பிரயோகத் திற்கு உட்படுத்தப்பட்டுச் சிறுமிகள் கொல்லப்படுகின்றார்கள். போர்க்காலத்திலும்கூட இந்தப் பண்பாடுகள்மீது கைவைக்கப் படாத ஒரு நிலையில், இப்போது அந்த நிலைமை ஏற்பட்டிருப்பது தொடர்பாகவே இராஜாங்க அமைச்சர் அவர்கள் குறிப்பிட்டிருந்தார். இருந்தாலும் சில விடயங்களை மேலதிகமாகக் குறிப்பிட்டிருந்தது நோக்கத்தக்க விடயமாகும்.

எமது நாட்டுக்கென்று ஒரு பண்பாடு காணப்படுகின்றது. மேலைத்தேய கலாசாரத்திலிருந்து விடுபட்டு கீழைத்தேயக் கலாசாரம், பண்பாடுகள், நாகரிகம் போன்றவற்றுக்கு முக்கியத்துவம் கொடுக்கின்ற ஒரு நாடாக இது இருக்கின்றது. அந்த வகையில், எமது பண்பாடுகளை, நாகரிகங்களை, விழுமியங்களைப் பேணிப் பாதுகாக்க வேண்டியவர்களாக நாங்கள் இருக்கின்றோம். எனவே, போதைவஸ்துக் கலாசாரம் தவிர்க்கப்பட வேண்டும்; மதுக் கலாசாரம் தவிர்க்கப்பட வேண்டும்; வாள்வெட்டுக் காலாசாரம் தவிர்க்கப்பட வேண்டும். அதேபோன்று, பாலியல் துஷ்பிரயோகம் போன்ற கலாசாரங்கள் தவிர்க்கப்பட வேண்டும். இதன்மூலம் எமது நாட்டின் உயர்ந்த விழுமியச் செயற்பாட்டினை முன்கொண்டு செல்வதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ள முடியும். நாங்கள் மதத்தால் வேறுபடலாம், இனத்தால் வேறுபடலாம், குலத்தால் வேறுபடலாம், மொழியால் வேறுபடலாம். ஆனால், எமது நாட்டுக்கென்று ஓர் உயர்ந்த விழுமியக் கலாசாரம் இருக்கிறது. இந்த விழுமியக் கலாசாரம் சிலவேளைகளில் போதை வஸ்துக்காரர்களாலும் அல்லது திட்டமிட்ட அரசியல் நோக்கம் கொண்டவர்களாலும் மோசமான நிலைக்குள் தள்ளப்பட்டுக் கொண்டிருக்கின்றது. எனவே, இந்த விடயத்தில் நாங்கள் கூடிய கவனம் செலுத்த வேண்டும். குறிப்பாக, நல்லாட்சி அரசாங்கம் என்று சொல்லப்படுகின்ற ஆளும் அரசாங்கம் இந்த விடயத்தில் கவனம் செலுத்துவதன் மூலமாக வடபுலத்தில் ஏற்பட்டிருக்கின்ற துர்ப்பாக்கிய நிலையினைக் கட்டுப்படுத்தலாம்.

இன்று அளவுக்கதிகமாக வடக்கு, கிழக்கு மாகாணங்களில் மதுக்கடைகள் அல்லது மதுச்சாலைகள் திறக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. அதேநேரம் அங்கு சட்ட விரோதமாகக் கஞ்சா கடத்தப்படுவதும் அவை பிடிபடுவதும் மீண்டும் கடத்தப்படுவதுமான நிலை காணப்படுகின்றது. அதேநேரம் போதைக்குட்படுத்தப்பட்ட அல்லது போதையால் விழுங்கப் பட்ட காமுகர்கள் படுமோசமான முறையில் சில கைங்கரியங்களைச் செய்து கொண்டிருக்கின்றார்கள். எனவே, இந்த விடயங்கள்மீது கூடிய கவனம் செலுத்தி இவற்றை எதிர்காலத்தில் தடுக்கக்கூடிய விதத்தில் நடவடிக்கையெடுக்க வேண்டுமென்று இந்த உயரிய சபையில் கேட்டுக் கொள்கின்றேன்.

அபிவிருத்தியென்கின்ற ஒரு விடயம் ஒரு பக்கம் சென்று கொண்டிருக்கின்றபோது, பொருளாதார அபிவிருத்தியை மட்டும் அபிவிருத்தி என்று கருதக்கூடாது. இதில் சமூக அபிவிருத்தி, கலாசார அபிவிருத்தி, பண்பாட்டு அபிவிருத்தி, விழுமிய அபிவிருத்தி என்றெல்லாம் காணப்படுகின்றது. இந்த விழுமிய அபிவிருத்தி அல்லது சமூக அபிவிருத்தி இல்லாத நிலையில் எதனையும் சாதித்துவிட முடியாது. எனவே, இதற்குரிய நடவடிக்கைகளை எதிர்காலத்தில் துரிதமாகச் செய்யவேண்டிய கடப்பாட்டில் இப்போதைய அரசாங்கம் இருக்கின்றது. இந்த அரசாங்கம் ஆட்சிக்குவந்து 3 ஆண்டுகளுக்கு மேல் கடந்து செல்கின்றது. இன்னும் இருக்கின்ற காலம் மிகக் குறைந்த காலமாக இருக்கின்றது. இந்தக் குறைந்த காலத்தில் செய்யவேண்டிய செயற்பாடுகளை மிகவும் திட்டமிட்டுச் செய்து, மக்களுக்கு விமோசனம் கிடைக்கக்கூடிய செயற்பாடுகளை முன்னெடுக்க வேண்டும். வெறுமனே வார்த்தைகளால் பேசிவிட்டுச் செல்வதைவிட, யுத்தத்தால் பாதிக்கப்பட்ட எமது பிரதேசங்களைச் செயற் பாடுகள் மூலமாக அபிவிருத்தி செய்வதற்குரிய நடவடிக்கைகளை ஆக்கபூர்வமாக எடுக்கவேண்டும் என்று இந்த இடத்தில் கேட்டுக்கொள்வதோடு, மீண்டும் இன்றைய தலைப்புக்குள் வருகின்றேன்.

தேசியக் கணக்காய்வுச் சட்டமூலம் மூலமாக நிச்சயமாக எமது நாட்டில் இப்பொழுது காணப்படக்கூடிய, எதிர் காலத்தில் விழையக்கூடிய ஊழல்கள், மோசடிகள், இலஞ்சங்கள் போன்ற எதிர்மறையான விளைவுகளை ஏற்படுத்தக்கூடிய போக்குகளை, நோக்குகளைக் கட்டுப்படுத் துவதன் மூலமாக இந்த நாட்டை உண்மையான ஓர் அபிவிருத்திப் பாதைக்குக் கொண்டு செல்லக்கூடிய விதத்தில் நாங்கள் செயற்பட முனைய வேண்டும் என்கின்ற விடயத்தை இந்த இடத்தில் சொல்லிக் கொள்ள விரும்புகின்றேன். இந்த நாட்டில் பல்வேறு தலைமைத்துவங்கள் ஆட்சி செய்திருக் கின்றன.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
Okay.

பல தலைமைத்துவங்கள் ஆட்சி செய்திருந்தாலும் இந்தத் தலைமைத்துவங்களுக்கப்பால் இனத்துவேசம், மதத்துவேசம் என்பனவும் இந்த நாட்டை ஆண்டு கொண்டிருக்கின்றன. எனவே, இந்தத் துவேசங்களிலிருந்து விடுபடாத வரைக்கும் எமது நாட்டில் ஒரு நல்லிணக்கமான சூழலை ஏற்படுத்த முடியாது. ஆனால், அந்த நல்லிணக்கத்தை நாங்கள் ஏற்படுத்தியே ஆகவேண்டும் என்று கூறி, எனது உரையினை நிறைவுசெய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා. ඔබතුමාට විනාඩි 14ක් තිබෙනවා.

[අ.භා. 2.08]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේ අපේ රටේ විගණකාධිපති දෙපාර්තමේන්තුව අඛණ්ඩව ඉටු කර තිබෙන වැදගත් කර්තව්‍ය අපි ඉතා ඕනෑකමින් සඳහන් කරන්න ඕනෑ. එකක් තමයි විගණනයට ඇති අයිතිවාසිකම. ඒ බව ගරු අගමැතිවරයාත් සඳහන් කළා; මම කලින් දවසක ගරු කථානායකතුමාට සුබ පතන අවස්ථාවේදීත් සඳහන් කළා. මහජනයා හා රජතුමා අතර ඇති වුණු අරගළයක ප්‍රතිඵලය ලෙස තමයි පාර්ලිමේන්තු බලය වැඩි වුණේ. මහජනයා ගෙවන බදුවලට අයිතියක් කියන්න ඉල්ලා සිටි සටන තමයි කිරුළ හා ජනතා නියෝජිතයන් අතර ඇති වුණේ. මෙය තමයි පාර්ලිමේන්තු ඉතිහාසයේ විකාශනය. මේ විකාශනයේදී මහජනතාව බදු ගෙවනකොට මහජන නියෝජිතයන් එයට වගකිව යුතු බවත්, මහජන නියෝජිතයන්ගේ වගකීම හරියාකාරව ඉෂ්ට වෙන බවට, රාජ්‍ය මුදල් පරිහරණය, ආයෝජනය, වියදම් කිරීම ආදිය පිළිබඳ පරීක්ෂා කර විගණන කටයුතු කිරීමට ලෝකයේ සෑම රටකම විගණන දෙපාර්තමේන්තු පවතිනවා. ඒවායේ ස්වභාවය වෙනස්. එක පොදු මූල ධර්මයක සිටියද, විගණන අධිකාරිය, විගණන කොමිෂන් සභා, විගණන දෙපාර්තමේන්තු හා විගණන අධිකරණ - Courts of Audit - ආදී වශයෙන් පවතිනවා. හිටපු විගණකාධිපති ගාමිණී ඇපා මහතාගේ කාල පරිච්ඡේදයේ, 1990 යුගයේදී, අපත් - පාර්ලිමේන්තුව- සමඟ සාකච්ඡා කරලා Court of Audit එකක් ඇති කිරීමට එකඟ වුණා මට මතකයි. කොමිෂන් සභා මාර්ගය එක මාර්ගයක්. අවශ්‍ය කර්තව්‍ය ඊටත් වඩා ඉෂ්ට කිරීමට මේ Court of Audit එකට පුළුවන් වෙනවා. එහි අරමුණ දඬුවම් කිරීම නොවෙයි. අරමුණ දඬුවම් කිරීම කියලා අපි හිතන්න හොඳ නැහැ. එහි අරමුණ විගණනයකින් ඇති වන තොරතුරු සම්භාරය, එය උල්ලංඝනය කර තිබෙන අවස්ථා පිළිබඳව, වගකිව යුතු නිලධාරින්, වගකිව යුතු තීරණ ගන්නන් පිළිබඳ කටයුතු කිරීමේ යම් යම් සීමාවන් ඇති කර දීමයි. එම සීමාවන් තුළ අපි අතිරේක ගෙවීම් විගණකාධිපතිවරයාට නියම කරනවා. ඒ තුළින් බලාපොරොත්තු වන්නේ යළිත් වරක් එය ඇති නොවන ආකාරයට අදාළ තීරණ ගන්නා නිලධාරින් හෝ අනෙක් අය හැසිරෙයි කියන දේයි. ඒ තුළින් පොදු මහජන මුදලට, පොදුවේ ජාතියේ අයිතිකරුවන්ට වැරදි නොකරන ලෙසයි බලාපොරොත්තු වන්නේ. මේ නිසා ජාතික විගණන පනත් කෙටුම්පත ගැන අද යුගය අනුව දීර්ඝ සාකච්ඡා සිදු වෙනවා කියලා මම හිතනවා. In relation to imposition of surcharge, there have been a lot of arguments. I remember raising this issue when the Vote of His Excellency the President was being taken up. So many months have gone. The President got up and gave me an answer. He said, "I will introduce the Bill within three months." Now, three months have gone. That is okay as long as we have the Bill today. But, the Bill is inadequate. That is the issue. බලාපොරොත්තු සියල්ල මේ පනත් කෙටුම්පත මඟින් ඉෂ්ට නොවන නිසා මහා මතභේදයක් සහ අර්බුදයක් පවතිනවා. පළමුවැනි එක මම ඉතාම ඕනෑකමින් කියන්නට ඕනෑ. Transparency International Sri Lanka ආයතනය මේ පිළිබඳව අධ්‍යයනයක් කරලා වාර්තාවක් ඉදිරිපත් කළා. එම වාර්තාව මහජන මන්ත්‍රීවරුන්ට භාර දීලා තිබෙනවා. අඩු පාඩුකම් රාශියක් එහි ඉතා ඕනෑකමින් සඳහන් වෙනවා. ඒ අඩු පාඩුකම් සියල්ල ඉදිරිපත් කරන්න පුළුවන් අවස්ථාවක් බවට මේ අවස්ථාව පත් වී නැති වීම ගැන අපි කනගාටු වෙනවා.

එය අන්තර්ගත කර ගැනීමේ ක්‍රියා මාර්ගය ඉදිරි කාලයේදී ඇති කරගත යුතුයි. මම එක අතකින් විගණකාධිපති දෙපාර්තමේන්තුවට ස්තුතිවන්ත වනවා. විගණන සේවා කොමිෂන් සභාව පිහිටුවීම වාගේම, ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ඒ සඳහා ගෙන තිබෙන මූලික ක්‍රියා මාර්ගයක්. මෙම පනත් කෙටුම්පත ගෙන ඒම වළක්වන්න කොපමණ උත්සාහ දැරුවද එය අද පාර්ලිමේන්තුවේ සම්මත කරගනු ඇතැයි අපි බලාපොරොත්තු වනවා. Transparency International Sri Lanka ආයතනය විසින් ඉදිරිපත් කරන ලද කෙටුම්පතේ 5වන පිටුවේ සිට 11වන පිටුව දක්වා සිංහල හා ඉංග්‍රීසි පිටපත් මම **සභාගත*** කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහි ඇතුළත් කරුණු ගැන කියන්න වෙලාව නැති නිසා එම කෙටුම්පත මගේ කථාවට අන්තර්ගත කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

මෙය ප්‍රසිද්ධ ලියවිල්ලක්. අනාගත ක්‍රියා මාර්ගයන් සඳහා එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වීම ඉතාම වැදගත්. මා එම ඉල්ලීම කරන්නේ, අධිභාරය පිළිබඳ සංකල්පය දැරීම, ප්‍රවර්ධනය වූ අභියාචනා කාර්ය පටිපාටිය, පුද්ගලික ගිණුම් පරීක්ෂා කිරීමේදී ආරක්ෂා කරනු ලබන පුද්ගලිකත්වය පිළිබඳ අයිතිවාසිකම්, අද්විතීය අය වැය යන්ත්‍රණයක් රඳවා ගැනීම ආදී මූලික කරුණුවල සිට නිර්දේශ ගණනාවක් දීර්ඝ වශයෙන් ඉදිරිපත් වී තිබෙන නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය මූල්‍ය අවභාවිතාවක් සම්බන්ධයෙන් ජාතික විගණන පනත් කෙටුම්පත අනුව නම් උපරිම දඩය රුපියල් 5,000යි. ගරු සභාවේදී මීට පෙර සඳහන් වුණා, අවම දඩ මුදල හැටියට රුපියල් 5,000ක් නියම කරන්න යෝජනා කළ බව. නිශ්චිතව යම් මුදලක් ප්‍රමාණවත් කියලා මම යෝජනා කරන්නේ නැහැ. නමුත්, මේ මුදල් ප්‍රමාණය විගණකාධිපතිවරයාට වෙනස් කරන්න වනවා. මොකද, "රුපියල් 5,000 මොකක්ද?" කියලා සමහර විට කල්පනා කරනවා. විගණනයට හසු වන එක වාක්‍යයක තිබෙන ඉන්ධන වියදම බැලුවොත් රුපියල් 5,000ට වැඩියි. මේ නීති හදන්නේ වෙනස් වන කාල පරිච්ඡේදයට අවශ්‍ය වන පරිදි හා අනාගතය සඳහායි; අතීතය සඳහා නොවෙයි. අපේ රටේ වර්තමානය සහ අනාගතය සඳහායි මේ පනත් සැකසෙන්නේ. එලෙස කල්පනා කරන්න බැරි වීම ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ඊළඟට, පෞද්ගලික අංශයේ ආයෝජනය කරන ලද රාජ්‍ය ආයෝජන පිළිබඳ විගණනය කිරීමේ ඇති සීමාවන් පිළිබඳව තිබෙන විශේෂතා ගැනත් මම කිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව සාකච්ඡා කරන විට මට මතක් වෙනවා, අපි ජර්මනියට ගිය අවස්ථාව. එහි ලුෆ්තන්සා ජර්මන් ගුවන් සේවාව is a public investment. Government has invested but they did not have the majority shares. They had a very small number of shares, but it was also subject to audit control by their central audit commission.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අපේ රජයෙන් දැන් මෙවැනි ආයතන රාශියකට ආයෝජන අවස්ථා ලබා දීලා තිබෙනවා. ඒ නිසා, ඒවා ගැන සොයා බැලීමේ අයිතියක් තිබීම වැදගත් වනවා. විවෘත ආර්ථික ක්‍රමය කරා අපි ගමන් කරපු වෙලාවේ සිට සිද්ධ වුණේ පාර්ලිමේන්තුවට මුදල් පිළිබඳව තිබුණු බලය සෙදී යාමට පටන් ගැනීමයි. මේක තමයි යථාර්ථය. දැන් අපි උත්සාහ දරනවා, කෙසේ හෝ යළිත් විගණන කළමනාකරණයකට භාජන කරන්න පුළුවන් වෙයි කියලා. එසේ භාජන කිරීමේදී රජය ආයෝජනය කර තිබෙන සියලු අංශවල මුදල් පිළිබඳ වගකීමක් පාර්ලිමේන්තුවට අය වැයකින් ආවාට පස්සේ ඒ වත්කම් පිළිබඳව හා වියදම් පිළිබඳව විගණනය කිරීමේ බලයක් තිබිය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. පළාත් පාලනය ආයතන හා පළාත් සභාවලටත් මෙය ඒ වාගේම වැදගත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය යටතේ පත් කළ ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබුණු මුදල් අනු කමිටුවේ වාර්තාව - Report of the Subcommittee on Finance - මම කියවන්නම්. එම කමිටුව සර්ව පාක්ෂික එකඟතාවකට ඇවිත් තිබෙනවා, සුදුසුකම් ලත් වෘත්තිකයෙක් විගණකාධිපතිවරයා වශයෙන් පත් විය යුතුය; ඔහුගේ ධුර කාලය සීමා විය යුතුය; විගණකාධිපතිවරයා හා කොමිසම අදාළ විශේෂඥයන්ගෙන් සමන්විත වීම ඉතාම වැදගත් කියලා.

සමුපකාර දෙපාර්තමේන්තුව කියන්නේ, මුළු රට පුරාම පැතිර තිබෙන දෙපාර්තමේන්තුවක්. මෙය විගණනය කිරීම මම හිතන හැටියට ප්‍රාදේශීය මට්ටමටයි පවරා තිබෙන්නේ. එහි වත්කම් පිළිබඳව අවධානයක් යොමු කරනවා නම් හොඳයි. පෞද්ගලික අංශවල ආයෝජනය කර තිබෙන සියලු වත්කම් විගණනය කිරීමට විගණකාධිපතිවරයාට සම්බන්ධ වෙන්න පුළුවන් ක්‍රියා මාර්ගය ඉතා වැදගත්.

විගණන කොමිසමට එසේ කටයුතු කරන්න පුළුවන් වුණොත් තමයි මේ මහා නාස්තිය, වැරදි වියදම් කිරීම් රටේ යහපත පිණිස යළිත් වරක් සිදු නොවන තත්ත්වයට පරිවර්තනය කර ගන්න පුළුවන් කාල පරිච්ඡේදයක් එන්නේ. එක අතකින් අපි ස්තුතිවන්ත වෙනවා, පසුගිය කාලයේ විගණකාධිපතිවරයා මහජන මන්ත්‍රීවරුන්ගේ හඬට සවන් දීම ගැන. වැදගත්ම කාරණය, මහ බැංකු වංචාව, හොරකම -සිංහල අපේ කථාවෙන් කියනවා නම් මහ බැංකු වංචාව සහ හොරකම- පිළිබඳව විගණන දෙපාර්තමේන්තුවේ මූලික වාර්තාව පාර්ලිමේන්තුව ලබා ගැනීමෙන් තමයි මා හිතන විධියට මේ දොරටුව විවෘත කරනු ලැබුවේ. අද වෙනකල් ආණ්ඩුවට මොකක් කර ගන්නට සිද්ධ වෙනවාද කියලා දන්නේ නැති මට්ටමට අපේ ඉතිහාසයේ ලොකුම මහ බැංකු වංචාව සිදු වුණු අවස්ථාවයි පසු කරලා තිබෙන්නේ. ඒ මූලික කටයුතුවලදී විගණන දෙපාර්තමේන්තුවට විවිධ තර්ජන, ගර්ජන තිබුණා. අපි දැක්කා, පසුගිය කාල පරිච්ඡේදයේදී මහනුවර වැනි ඈත පළාතක විගණන සේවයේ යෙදී හිටපු විගණන නිලධාරියෙකුට ඇසිඩ් ගසා තිබුණා. ඇයි? පෞද්ගලික තරහකටද? නැහැ. විගණන කටයුතු කරලා වැරැද්දක් සොයා ගෙන ඒ පිළිබඳ කටයුතු කළ නිසා. ඒ අනුව බලන විට කොයි තරම් තර්ජන මැද විගණන නිලධාරින් කටයුතු කරන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිංහල කථාවක් තිබෙනවා, -ඔබතුමාත්, මමත් කිට්ටු ගම්වල අය නිසා කියන්න පුළුවන්- රැවුලයි, කැඳයි දෙකම බේරා ගෙන තමයි වැඩ කරන්න වෙලා තිබෙන්නේ කියලා. රාජ්‍ය සේවය පවත්වාගෙන යන්න රාජ්‍ය නිලධාරින් අවශ්‍යයි. රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවත් අවශ්‍යයි; රාජ්‍ය සේවයේ ඵලදායිතාවත් අවශ්‍යයි. රාජ්‍ය දෙපාර්තමේන්තු යම් කිසි ඉලක්ක සපුරන දෙපාර්තමේන්තු බවට පරිවර්තනය කර ගන්න නම්, විගණනය අත්‍යවශ්‍යයි. ඒ විගණනය ප්‍රමාද වී ලැබෙන විගණනයක් විය නොහැකියි. ඒ නිසා විගණනය වෙනුවෙන් ඇති කරන ක්‍රියාමාර්ග ඉතාම වැදගත්.

අනෙක් කාරණය මේකයි. විගණකාධිපතිවරයාත් මේ පාර්ලිමේන්තුවේ රජයේ නිලධාරින්ගේ කුටියේ ඉන්න අවස්ථාවේදී ඒ කාරණයට එතුමාත් සවන් දෙයි. ඒ කාරණය මම මේ සභාවටත් කියන්න ඕනෑ. අපට විගණන වර්ග දෙකක් තිබෙනවා. සාමාන්‍යයෙන් පවත්වාගෙන යන විගණන හා ඵලදායි විගණන - progress audit - ගැන සොයා බැලීම. උදාහරණයක් වශයෙන් අරගෙන බලන්න, මහවැලිය. අපි කෝටි ගණන් මහවැලියට ආයෝජනය කරලා තිබෙනවා. නමුත් මහවැලියේ ධාරිතාව අපි ප්‍රයෝජනයට ගන්නේ නැහැ. That comes under progress audit. It has to be done so that the engineers and the other professionals, after so many years, can go into that; those angles have to be studied. එතකොට තමයි වඩාත් ප්‍රයෝජනවත් තත්ත්වයට පරිවර්තනය වෙන්නේ. මට සතුටුයි, මේ අවස්ථාවේදී මගේ මිත්‍ර ගාමිණී දිසානායක හිටපු ඇමතිතුමාගේ ආදරණීය පුතා -ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා- මේ පාර්ලිමේන්තු සභා ගර්භයේ සිටීම ගැන. ඒ කාලයේ තරුණ මන්ත්‍රීවරු හැටියට අපි ගාමිණී දිසානායක හිටපු ඇමතිතුමාගේ කථාවලට සවන් දුන්නා. මට මතකයි, එතුමා මේ progress audit එක ගැන ඉතාම බරපතළ ලෙස පාර්ලිමේන්තු කථාවලදී, අය වැය විවාදවලදී කිව්වා. එතැනින් තමයි අප විසින් කරන ලද ආයෝජනයේ ඵලදායිතාව පිළිබඳව දැන ගන්න පුළුවන් වන්නේ. වැරදි දෙයට මුදල් භාවිතා කරලා හෝ මුදල් වැඩියෙන් භාවිතා කරලා, නැත්නම් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගෙන්, committee එකෙන් ගත්ත නිර්දේශය ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා කියනවාටත් වඩා එය වැදගත්. අපේ විදුලි බලය, අපේ ජලය, මේවා නිසා තමයි අද අපේ රට ඉදිරියට යන්නේ. ගොවියාට වතුර නැත්නම් අපේ රට හාමතේ. Auditor-General's Department එකට පුළුවන්ද මේ ගැන සොයා බලා කියන්න, මොකද වුණේ කියලා? වැරදි වෙලාවට වතුර යැව්වාද, වතුර තියා ගන්න තිබෙන තැන හරි ධාරිතාව තියා ගත්තේ නැද්ද කියලා කියන්න පුළුවන්ද? These things do not come under audit. මම බොහොම කනගාටුවෙන් කියනවා, විදුලිබල දෙපාර්තමේන්තුව-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම කථාව අවසන් කරනවා. මම මේ කිව්වේ, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අලුතෙන් හිතන්න ඕනෑ කියලායි. මේවා අලුත් දේවල් නොවෙයි. පවතින දේවල් ප්‍රයෝජනයට ගැනීමේ අවශ්‍යතාවයි තිබෙන්නේ.

මම මගේ කථාව අවසන් කිරීමට ප්‍රථම කාරණා දෙකක් කියනවා. අපේ රටේ බැංකු පද්ධතිය මත තමයි මූල්‍ය ක්ෂේත්‍රය පවතින්නේ. විශාල ලෙස අවධානය යොමු කළ යුතු බරපතළ ප්‍රශ්නයක් මහජන බැංකුවේ පවතිනවා. ලංකා බැංකුවේත් ඒ හා සමාන ප්‍රශ්නයක් පවතිනවා.

මේ බැංකු දෙකෙහි පැවැත්ම ශක්තිමත් නොකර, විගණකාධිපතිවරුන් අපේ දේශපාලනඥයන්ට ඕනෑ ආකාරයට කටයුතු කරන්න දීමෙන් මේ බැංකු දෙක කඩා වැටුණොත්, මුළුමහත් මූල්‍ය ක්ෂේත්‍රයට හා ආර්ථිකයට එය බලපානවා. ඒ නිසා ඒ සම්බන්ධව දැඩි අවධානය යොමු කරන්න.

අද මහජන බැංකුව digital banking ක්‍රමය යටතේ විවිධ තීරණ අරගෙන, ඉතාම බරපතළ ලෙස ඇති කරගෙන යන භයානක තත්ත්වය පිළිබඳව බැංකු සේවක සංගමය ඉදිරිපත් කරපු

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

කිසිම කරුණක් අවධානයට අරගෙන නැහැ; ලංකා බැංකු සේවක සංගමය විසින් ඉදිරිපත් කරන ලද කරුණු අවධානයට ගෙන නැහැ. සිද්ධියක් සිද්ධ වුණාට පසුව බලා වැඩක් නැහැ. ඒ සඳහා තමයි මේ ජාතික විගණන කොමිසම පත් වෙන්නේ.

පසුගිය කාලය තුළ වැදගත් පනත් සම්මත කර ගත්තා කියලා අද අගමැතිතුමා සඳහන් කළා. But, there are areas in this Bill which are being subject to control or which are not in the domain of the Auditor General because of the RTI Act. එහෙම නම් මේ RTI Act එකේ තේරුම මොකක්ද? Auditor General, ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සුපිරි බලවතෙක්. හැම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකටම අනුව ඒක එහෙමයි. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුකාරවරු වාගේම Auditor General බලවතා. නමුත් යම් යම් තොරතුරු නිකුත් කිරීමේදී Auditor Generalට නිලධාරින්ගේ කටයුතු සම්බන්ධයෙන් මේ පනත් කෙටුම්පත යටතේ පාලනයක් ඇති කරලා තිබෙනවා. එවැනි පාලනයක් තුළ කොහොමද, විගණන දෙපාර්තමේන්තුවක, විගණන කොමිසමක වලදායීත්වය ඇති වෙන්නේ?

මේ පනත් කෙටුම්පත ආරම්භයක් හැටියට ඉතාම වැදගත්. අපි හිතනවා, ඉදිරි කාලයේදී මේ අඩුපාඩුකම් යළිත් සැලකිල්ලට ගෙන සංශෝධන ඉදිරිපත් කිරීමෙන් විගණන දෙපාර්තමේන්තුවටත්, විගණන නිලධාරින්ටත් කටයුතු කරන්න පුළුවන් වෙයි කියලා. ඒ වාගේම රාජ්‍ය සේවය හරහා වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙන නිසා රාජ්‍ය දෙපාර්තමේන්තුවලටත් ඒ විශාල වගකීම ඉහළ සිට පහළට පැවරෙනවා. අපේ රටේ මූල්‍ය අර්බුද පිළිබඳව වාගේම, අය වැය ලේඛන ආදියේ වලදායීත්වය කුමන ප්‍රමාණයකින්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියන එක පාර්ලිමේන්තුවට හා රටට දැන ගන්න වෙනදාට වැඩිය අවස්ථාවක් ජාතික විගණන කොමිසමෙන් ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු රවි කරුණානායක මැතිතුමා.

**[අ.භා. 2.26]**

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩප්‍රස්තාව ලබා දීම මා ඉතා අගය කොට සලකනවා. ඊට වැඩියෙන් මම සතුටු වෙනවා, දිනේෂ් ගුණවර්ධන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මේ ගැන කරුණු එකතු කරන්නට මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව.

ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න පරක්කු වුණත්, යම් කාලයකට පසුව හෝ එය සිදු කිරීමට හැකි වීම අප ලබා ගත් අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලෙස මා සලකනවා. 1994 සිට අඛණ්ඩව පාර්ලිමේන්තුවේ සිටි මන්ත්‍රීවරයෙක් වශයෙන් මූල්‍ය ගණනය කිරීම, විගණනය කිරීම, එහි තිබෙන දුර්වලතා, මූල්‍ය විනය පාලනය සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්න යනාදිය මට පෙනී ගියා. මම 1994 ඉඳලා ඒ සම්බන්ධව මේ පාර්ලිමේන්තුවේ හඬ අවදි කරපු පුද්ගලයෙක්.

මට මතකයි, 1996දී "ගුප්තා" කියන ලෝක බැංකු නියෝජිතයා ලංකාවට පැමිණියා. ඔහු ඉන්දියානු ජාතික පුද්ගලයෙක්. ඔහු අතිවිශිෂ්ට කාරණා හෙළිදරව් කළා. එවකට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සිටි මායාදුන්නේ මැතිතුමාත් සමඟ එසේ අදහස් හෙළිදරව් කිරීම නිසා, අද මෙවැනි තත්ත්වයකින් එළිදැක්වීමක් කරන්න අපට පුළුවන් වුණා. ඒ අවස්ථාවේදී තිබුණු දුර්වලතා නොදන්නවා නොවෙයි. ඒ තිබුණු තොරතුරු සම්පිණ්ඩනය කරලා, නීති පද්ධතියක් ඇති කිරීම තමයි තිබුණු ප්‍රශ්නය. ඒ නිසා අද මේ සාර්ථකත්වය ගැන අපි සතුටු වෙනවා.

දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ මේ සභාවේ සිටින නිසා මම යමක් මතක් කරන්න කැමැතියි. ගරු මන්ත්‍රීතුමනි, right to information ගැන ඔබතුමා මේ මොහොතේ ඇසුව නිසා, ඔබතුමා මේ ගරු සභාවෙන් එළියට යන්න ඉස්සෙල්ලා ඒ ගැන සඳහන් කළ යුතුයි. ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට right to information කියන එක අපේ මේ ආණ්ඩුව බලයට ආවාට පසුව ඉතාම අමාරුවෙන් ලබා ගත් ජයග්‍රහණයක්.

ඒ තුළින් අද යම් යම් දේවල් හෙළිදරවු වීම විපක්ෂයට ලොකු උදව්වක් වෙලා තිබෙනවා. ඒත් අපට අවශ්‍ය වුණේ සැබෑ තත්ත්වය ඇති කිරීමයි. මට මතකයි, එවකට තිබුණු ආණ්ඩුවෙන් ප්‍රශ්නයක් ඇහුවාම, ඒ ප්‍රශ්නයකට පිළිතුරු නොදී සිටියා. ඒ නිසා තමයි Right to Information Act එක ගෙනාවේ. ඔබතුමා පිළිගන්නවා ඇති, මා හිතන හැටියට ඒ ජයග්‍රහණය අනිවාර්යයෙන්ම රටට ඔබින මට්ටමට ගෙනැවිත් තිබෙන බව. ඒ තුළින් සමහර තොරතුරු දෙන්න පුළුවන්ද, බැරිද කියන ප්‍රශ්නය මතුවෙලා තිබෙනවා. ඒ ගැන අපි නැවත විශ්ලේෂණය කරලා බලන්න ඕනෑ. අපි ඒ සම්බන්ධයෙන් කථානායකතුමා එක්කත් සාකච්ඡා කළා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉතාම ඕනෑකමින් ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා. එහි නිවැරැදි කිරීමක් කළ යුතුව තිබෙනවා. නමුත් මා මතක් කළේ, එදා කිසිම තොරතුරක් ලැබුණේ නැති වුණත්, අද අඩු ගණනේ සියයට 90ක්වත් තොරතුරු ලැබෙන බව කියන්නයි. එය ජයග්‍රහණයක් ලෙස සලකන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. ජාතික විගණන පනත් කෙටුම්පත තුළින් අපි ක්‍රමවේදයක් ඇති කරනවා, මේ තුළින් නිල මට්ටමින් දෙයක් කරන්නේ කොහොමද කියලා. විගණකාධිපති වශයෙන් දැන් අලුත් පුද්ගලයෙක් ඉන්නවා. යම් දෙයක් වුවමනාවෙන් කරන්න ඕනෑය කියන මතයක් ඇති වී තිබෙන එක ගැනත් සතුටුයි. ඒ සඳහා කාර්ය මණ්ඩලයේ ඕනෑකම තිබුණත්, ඒ දේවල්වල material value එක අනුව විගණනය කරන්න අවශ්‍යයි. සමහර විට රුපියල් 100ක් වටිනා දෙයක් සම්බන්ධයෙන් විගණනය කරන්න රුපියල් ලක්ෂයක් පමණ වියදම් කරනවා. එවැනි දේවල් කරන්නේ නැතුව ජාතික විගණන පනත ඉදිරියට ගෙන යන්න අවශ්‍යයි. අද විගණනය විහිළුවට ලක්වෙලා තිබෙනවා. සමහර විට ඔපදූප අනුව විගණනය කරනවා. සමහර තැනක් ගැන නිර්නාමික දේවල් ලියපු හැටියේම ඒ ගැන විගණනයක් කරනවා. ඒ සමහර ඒවා කිසිම වටිනාකමක් නැති - non material - ඒවා. ඒවා ගැන විගණනයක් කරගෙන යනවා. තවත් සමහර විට පළිගැනීමේ ස්වරූපයේ විගණනයන් කරගෙන යනවා. අමාත්‍යාංශ ගණනාවක කටයුතු කරලා මා ලැබූ අත්දැකීම් තුළින් තමයි මා මේ කරුණු ප්‍රකාශ කරන්නේ.

මුළු ලෝකයේම විගණනය ඉතාම වැදගත් ක්‍රියාවක්; අත්‍යවශ්‍ය ක්‍රියාවක්. හැම රටකම Auditor General කෙනෙක් සිටිනවා. ඒ වාගේම විගණන කටයුතු කරන පෞද්ගලික අංශයේ කොම්පැනි ගණනාවක් තිබෙනවා. ලෝක ප්‍රසිද්ධ KPMG, Ernst & Young, PricewaterhouseCoopers වැනි විගණන කොම්පැනි

ගණනාවක් තිබෙනවා. මේ සියලු පෞද්ගලික විගණන කොම්පැනි අප රටේත් තිබෙනවා. දැන් අපට තිබෙන්නේ, විගණකාධිපති සමඟ ඒ පෞද්ගලික අංශ ඒකාබද්ධවෙලා කටයුතු කරන්නේ කොහොමද කියන ප්‍රශ්නයයි. 2015 අය වැය වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාවේදී, මුදල් ඇමති වශයෙන් මට අවශ්‍ය වුණේ ජාතික මට්ටමින් විගණකාධිපතිතුමාට සම්පූර්ණ පාලන බලය දෙන්නයි. පළාත් සභා සහ ප්‍රාදේශීය සභා මට්ටමින් හෝ ආසන මට්ටමින් පෞද්ගලික අංශයෙන් විගණකාධිපතිවරයාට උදවු කරන්න පුළුවන් ස්වරූපයේ වැඩ කටයුත්තක් කරන්න ඕනෑ.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා balance sheet items සහ off balance sheet items ගැන කිව්වා. උදාහරණයක් වශයෙන් කිව්වොත්, කෘෂිකර්ම ක්ෂේත්‍රයට අවශ්‍ය කරන ජලය නියමිත වේලාවට පිට කළේ නැත්නම් ඒ තුළින් රටට සිදුවන පාඩුව off balance sheet කරුණක්. එය විගණනය කරන්නේ කොහොමද? ඒ හැම කරුණක්ම විගණනය කරන්න විගණකාධිපති දෙපාර්තමේන්තුවට දුන්නා නම් ලක්ෂ ගණනක සේවක පිරිසක් අවශ්‍ය වෙනවා. ඒ නිසා ඒ ප්‍රදේශයේ තිබෙන පෞද්ගලික අංශයේ audit companies හෝ එහි නිලධාරින් මඟින් අපට ඒ දත්ත ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. මා අගය කරනවා, off balance sheet items සම්බන්ධයෙන් මතක් කිරීම ගැන. අද හැම දෙයක්ම රුපියල් ශතවලට සීමාවෙලා තිබෙනවා මිස, ශේෂ පත්‍රයෙන් පිටස්තර, ගණනය කරන්න බැරි ගිණුම් විගණනය ගැන කවුරුත් කථා කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විගණන කටයුතු කොටස් 4කට හෝ 5කට බෙදන්න පුළුවන්. පළමුවන එක තමයි, statutory audit කියන එක. ඒ කියන්නේ, අවුරුද්දකට වරක් නීත්‍යනුකූලව කළ යුතු audit එක. දෙවන එක තමයි, management audit එක. තුන්වන එක තමයි, balance sheet audit එක. හතරවන එක තමයි systems audit එක. අද රටේ වැඩියෙන්ම තිබෙන්නේ නීත්‍යනුකූලව අවශ්‍ය statutory requirement විගණනය කිරීම විතරයි, මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි. මේ තුළින් රටට ලොකු හානියක්, පාඩුවක් ඇති වෙනවා. මේ කටයුතු මීට වඩා විධිමත් කරන්න පුළුවන් නම්, මා හිතන විධියට මේ රටේ තිබෙන මුදල් අපතේ යෑම අපට වළක්වන්න හෝ අඩු කරන්න පුළුවන් වෙනවා. ඉංග්‍රීසියෙන් කියනවා, "Auditor is a watchdog, not a bloodhound" කියලා. අපට අවශ්‍ය වන්නේ බුරන බල්ලෙක් මිස හපා කන බල්ලෙක් නොවෙයි.

මේ දෙක අතර වෙනස අපි හඳුනා ගත යුතුයි. සමහර වෙලාවට යම් දේශපාලන පක්ෂ මේ තුළින් දේශපාලන අරමුණු ඉෂ්ට කරන්න ගිහිල්ලා ප්‍රශ්න ඇති වන අවස්ථා තිබෙනවා. මා හිතන විධියට මේ ජාතික විගණන පනත් කෙටුම්පත තුළින් යම් වගකීමක් එනවා වාගේම, ඒ අයිතිවාසිකම් රැකීමත් අවශ්‍යයි.

අපේ රටේ තිබෙන්නේ Island Audit එකක්. නව විගණකාධිපතිතුමා ඒ කාරණය ලස්සනට පෙන්වලා දුන්නා. රටේ සමස්ත ආදායම එකතු කරලා විගණනය කරනකොට ඒක Island Audit එකක් හෝ National Audit එකක් වෙනවා. නමුත් අපේ රටේ මෙතෙක් කල් තිබිලා තිබෙන්නේ ආණ්ඩුවේ එක කොටසකට පමණක් සීමා වූ audit එකක්. පළාත් සභාව ඒ කටයුතුවලින් වෙන් කරලා තිබෙනවා. ඒ දෙකම එකතු කරන වැඩ පිළිවෙළක් අපි ඇති කරන්න අවශ්‍යයි. ඒ වාගේම, අපි මේ ගෙනයන්නේ cash audit එකක්. ඒ කියන්නේ, සල්ලි වියදම් කරන ආකාරය සහ ආදායම් උපයන ආකාරය අනුව කරන විගණනයක් මිස, accrual based audit එකක් නොවෙයි. මෙන්න මෙච්චර ප්‍රමාණයක් ගිය අවුරුද්දේ ලැබෙන්න ඕනෑය කියන කාරණය අපි මේ විගණනය යටතට ගෙනැල්ලා නැහැ. ඒක 2015 අය වැයේදී එකතු කරන්න තිබුණා. නමුත් අපේ මන්ත්‍රීවරු වුණත් නූතන ලෝකයට හැඩ ගස්සන්න අමාරුවෙලා තිබුණු නිසා ප්‍රශ්නයක් ඇති වුණා. හැබැයි, 2019, 2020 වනකොට මේ කටයුත්ත අනිවාර්යයෙන්ම කළ යුතු කාර්යභාරයක් ලෙස මා සලකනවා. මේ ජාතික විගණන පනත් කෙටුම්පතට අනුව අපට අවශ්‍ය වන්නේ Audit Commission එකක්. ඒ විගණන කොමිසම අත්‍යවශ්‍යයි. විගණන කොමිසම පත් කරලා තිබෙන එක හොඳයි. අමාත්‍යාංශයේ ලේකම් තමයි ප්‍රධාන ගිණුම් නිලධාරියා - Chief Accounting Officer. අමාත්‍යාංශයේ වැඩ සම්බන්ධයෙන් එතුමා තමයි සම්පූර්ණයෙන් වග කියන්නේ. මෙතෙක් කල් මේ ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න පරක්කු වුණේ ප්‍රධාන ගිණුම් නිලධාරි තනතුර සහ විගණන කොමිසමේ බලතල අතර සටිටනයක් තිබුණු නිසායි. දේශපාලනඥයන් මැදට පැනලා, ජාතික විගණන පනත් කෙටුම්පත ගෙනෙනවාට ඔවුන් තුළ අකැමැත්තක් තිබුණා කියලා තමයි හුඟ දෙනෙක් හිතුවේ. නමුත් කිසිසේත්ම එහෙම දෙයක් සිදු වුණේ නැහැ. Dr. Sarath Amunugama මැතිතුමාත්, අනුර ප්‍රියදර්ශන යාපා හිටපු ඇමතිතුමාත්, මාත් Subcommittee එකක වාර්තාවකින් ඒ කාරණය පෙන්වලා දුන්නා මට මතකයි. මේ තනතුරු අතර ස්වාධීනත්වයක් ඇති කිරීමේ අවශ්‍යතාවක් තිබුණා. නමුත් එක පැත්තකට අනවශ්‍ය ලෙස බරක් පැටවීම නිසා ප්‍රශ්නයක් ඇති වුණා. අධිභාරය සම්බන්ධයෙන් තිබුණු ප්‍රශ්නය නිසා සම්පූර්ණයෙන්ම මේ කටයුතු විගණන කොමිසමට දෙන්න රජයේ නිලධාරින්ගේ අකැමැත්තක් තිබුණා. මේ කරුණු දෙක අතර සමබරතාවක් ඇති කරන්න කටයුතු කළ නිසා තමයි මා හිතන විධියට මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන එන්න කාලයක් ගත වුණේ. නමුත් සියලුදෙනාම කථා කරලා, ඒ සමබරතාව ඇති කිරීම නිසා අපට අද එහි සාර්ථකත්වයක් පෙනෙන්න තිබෙනවා. මේ පනත් කෙටුම්පතේ දුර්වලතා නැතිවා නොවෙයි. නමුත් මේ පනත් කෙටුම්පත, අනිවාර්යයෙන්ම ලොකු වෙනසක්; ඉදිරියට යන්න පුළුවන් පිම්මක්. ඒ නිසා තමයි අපි මේ කරුණු වැඩිදියුණු කරලා කටයුතු කරන්න අවශ්‍ය වන්නේ. මෙහි තිබෙන දුර්වලතා අවම කිරීම තමයි අපට අවශ්‍ය වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Transparency International ආයතනය ඉතාම විශිෂ්ට ගණයේ වැඩ පිළිවෙළක් ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම පිළිබඳව මා සන්තෝෂ වනවා. මේ වැඩ පිළිවෙළ තුළින් මොනවාද කරන්න අවශ්‍ය කියලා ඔවුන් අප සියලුදෙනාම දැනුවත් කරලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් අපි මොනවාද කරන්න ඕනෑ කියන කාරණය මා මෙතැනදී හෙළිදරව් කරනවා.

ජාතික විගණන පනත් කෙටුම්පතේ 19.(1) (අ) සහ 19. (2) වගන්ති යටතේ තිබෙන අධිභාරයක් පැනවීමේ කාරණය සම්බන්ධයෙන් යම් ප්‍රශ්න ටිකක් තිබෙනවා. යම් කරුණක් විගණනයට ලක්වෙලා ප්‍රශ්නයක් ඇති වෙලා, ඒ සඳහා අධිභාරයක් පනවන්න අවශ්‍ය නම්, ඒ අයට ඒ වගකීම දෙන්න ඕනෑය කියන කාරණයට විගණන කොමිසමේ සභාපති ඇතුළු සියලුදෙනාගේම කැමැත්තක් තිබෙනවා. ඒ වගකීම විගණන කොමිසමට දෙන්නේ නැතිව ස්වාධීන කමිටුවක් තුළින් විසඳන්න කියන එකයි මගේ මතය. Transparency International ආයතනයේ සහ විද්වතුන් ගණනාවකගේ මතය වන්නේත් ඒකයි. ස්වාධීන කොමිටියක් තුළින් ඒ කටයුත්ත කරනවා නම් මේ ආයතන දෙක අතර සමබරතාවක් ඇති වනවා. විගණන කොමිසම යම් කාරණයක් ගැන හොයා බලලා ප්‍රධාන ගිණුම් නිලධාරියාට දුන්නාම, ඔහු ඒ කටයුතු ඉදිරියට ගෙනයන්නේ කොහොමද කියන එකයි විගණන කොමිසම අහන්නේ. එතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ස්වාධීන කමිටු ඇති කිරීම ඉතාම විශිෂ්ට ගණයේ යෝජනාවක් ලෙස අපි සලකනවා.

[ගරු රවි කරුණානායක මහතා]

අනෙක් කාරණය තමයි, Audit Service Commission එක දෙන තීන්දුවකට appeal කරන එක. "අපි මේක කරන්නේ නැහැ" කියලා ප්‍රධාන ගිණුම් නිලධාරියා කිව්වොත්, ඔවුන් එහෙම කරන්නේ නැත්තේ ඇයි කියන හේතුව විගණන කොමිසම විසින් දැනගන්න අවශ්‍යයි. කෙනකු උසාවියට ගෙන ගියා නම් කොයි ආකාරයෙන්ද කටයුතු කරන්නේ කියන කාරණය දැනගැනීම අත්‍යවශ්‍යයි. ස්වාධීන කොමිටියක් තුළින් ඒ කටයුත්ත කරන්න පුළුවන් නම් ඒක වටිනවාය කියා මා හිතනවා. නමුත් ඒ විගණනය විය යුත්තේ රුපියල් 50කට, රුපියල් 100කට, රුපියල් 1,000කට නොවෙයි. ඒක මිලියන 10ක් හෝ යම් වටිනාකමක් -material value- තිබෙන එකක් විය යුතුයි. ඒක තමයි වටිනාම දේ. මොකද, විගණනය කියන්නේ රුපියල ශත වශයෙන් හැම කොටසක්ම ගැන හොයන එක නොවෙයි. ක්‍රමවේදය සහ එහි වටිනාකම සෙවීම තමයි අවශ්‍ය වන්නේ.

අද සීමිත සම්පත් තිබෙන නිසාත්, වෙලාව සීමිතව පැවතීම නිසාත් වඩාත්ම අවශ්‍ය වන්නේ එහි වටිනාකම හොයා ගැනීමයි. ඒ වාගේම ජාතික විගණන පනතේ Section 7 (4) යටතේ සඳහන් වනවා, විගණන කොමිසම ඉදිරියට යම් පුද්ගලයන් ගෙන්වීමේ දී , එන්නේ නැතිව සිටීමේ හැකියාව තිබෙනවා කියලා. මම කියන්නේ එන්න අවශ්‍යයි කියන එකයි. මොකද, යම් විධියකින් පුද්ගලයෙකුට එන්නේ නැතිව ඉන්න හැකියාවක් තිබෙනවා නම්, ඒ පුද්ගලයා එන්නේ නැතිව ඉන්න ඕනෑ හේතුවක් තිබිය යුතුයි. නමුත් විශ්වාසය මත එතැනට පැමිණීම තමයි වටින්නේ. ඒකයි වටිනාකම. ඒ සම්බන්ධයෙන් වෙනත් පුද්ගලයෙක් එවන එක එතරම්ම යෝග්‍ය නැහැ. එය නිවැරදි කළ යුතුයි කියන යෝජනාව තමයි මම මේ අවස්ථාවේ දී එකතු කරන්නේ.

ඊළඟට, තොරතුරු හෙළිදරව් කිරීම. විගණකාධිපති සහ එහි කාර්ය මණ්ඩලයේ කාර්ය භාරය තමයි තමන් පත් කරන පුද්ගලයාට තොරතුරු ලබා දීම. ඊට වැඩියෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාවක් නැහැ. පාර්ලිමේන්තුවට එම වාර්තාව ඉදිරිපත් කළාට පසුව අවශ්‍ය නම් එය ප්‍රසිද්ධ කරන්න පුළුවන්. නමුත් ඒ සම්බන්ධයෙන් කථා කිරීමේ අවශ්‍යතාවක් නැහැ. මම හිතන විධියට අපට කරන්න පුළුවන් ලොකුම වෙනස මේකයි. මෙම විගණන කොමිසම මීට වැඩිය වැදගත් සහ අර්ථවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතු වනවා. විගණකාධිපති දෙපාර්තමේන්තුව සමඟ එකතු වී ඒ හා බැඳුණු සියලු කාර්ය භාරය ඒ ආකාරයෙන්ම නීත්‍යානුකූලව කරන්න පුළුවන්කම තිබුණා නම් මේ තිබෙන ප්‍රශ්න ගණනාවක් ගැන එදා හොයා බලන්න තිබුණා. මහ බැංකුවේ අද තිබෙන කතන්දරයත් ඒකයි. මීට පෙර දීලා තිබෙන තොරතුරු ගැනවත් තවම හෙළිදරව් වෙලා නැහැ. හිටපු මුදල් ඇමති වශයෙන් මම ප්‍රශ්නයක් ඇහුවා, "2008-2014 වෙනකන් සිදු වූ සියලුම අලාභ කොයි ආකාරයෙන් ද සිදු වුණේ? යම් දෙයක් ගණනය කරලා තිබෙනවා නම්, ඒ ආකාරයෙන්ම 2008-2014 වර්ෂයන් සම්බන්ධයෙනුත් අලාභය කීයද?" කියලා. ඒ සම්බන්ධයෙන් වාර්තාවක් තවම නිශ්චිත වශයෙන් දෙන්න පුළුවන්කම නැහැ. මහ බැංකුවෙන් දෙන්න බැහැ කියලා තිබෙනවා. මහ බැංකුවේ පණ්ඩිතයෝ ටිකක් ඉන්නවා. මේ වකවානුවේ දෙන්න පුළුවන් වාර්තා තිබෙනවා, නමුත් ඒ කාලයේ දෙන්න බැරි වාර්තා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කිව්වේ, off balance sheet items. ඒ සම්බන්ධව ප්‍රශ්නයක් ඇහුවාම ඒකට උත්තර දෙන්නේ කොහොමද? අනිවාර්යෙන්ම මේක නීතිගත කරන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වේලාව බාධාවක් වෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව මිනිත්තු දෙක, තුනකින් මම අවසන් කරන්නම්. අපට අවශ්‍ය වන්නේ මෙවැනි දේවල් නීතිගත කරන්න පුළුවන් විධියේ මාර්ගයක් ඇති කිරීම සහ ඒ සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමයි. ඇමතිවරයෙක් සම්බන්ධයෙන් කටයුතු කරන අවස්ථාවේ දී, අමාත්‍යාංශයේ තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි සමහර වෙලාවට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරින් වෙනත් අමාත්‍යාංශයකට යන එක. ඒ අමාත්‍යාංශයට යම් කොටසක් ගත්තේ දේශපාලන අරමුණකින් නම්, ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති කරනවා. මට මතකයි එදා චන්ද්‍රිකා බණ්ඩාරනායකගේ ආණ්ඩුව කාලයේ අපේ වෙළෙඳ අමාත්‍යාංශය යටතේ පාන් රුපියල් 3.50ට විකුණන්න ගිහිල්ලා, සතොස ආයතනය රුපියල් බිලියන 14ක -රුපියල් කෝටි 1400ක- අලාභයක් ලැබුවා. මේ අලාභය දිගින් දිගටම පැවතුණා. 2002 වර්ෂයේ දී ආණ්ඩුව වෙනස් වෙනකොට අලාභය කියන එක සුද්ධ කරලා අලුත් ශේෂ පත්‍රයකින් ඉදිරියට ගෙනයන්න පුළුවන් විධියේ හැකියාවක් තිබුණා. නමුත්, එතැනදී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් වෙළෙඳ අමාත්‍යාංශයේ තොරතුරු විකෘති කර වැරදි විධියට දීලා සම්පූර්ණයෙන්ම අවුලක් ඇති කළා. ඒ සම්බන්ධයෙන් මාධ්‍ය ලබා ගත්තේ වැරදි තොරතුරු. අවසානයේ දී රටට සහ ඒ ආයතනයට ප්‍රශ්නයක් ඇති වෙලා, ඉදිරියට යාමට නොහැකි අවස්ථාවක් ඇති වුණා. එම නිසා මේ සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම, ප්‍රසිද්ධ කිරීම වරදක් ලෙස සලකා කටයුතු කරන්න ඕනෑය කියන එක නීතියට එකතු කිරීමට අවශ්‍යයි කියා මා මේ අවස්ථාවේදී සඳහන් කරනවා. මෙම ජාතික විගණන පනත් කෙටුම්පතේ එවැනි දේවල් සඳහන්ව තිබෙනවා මට පෙනුණේ නැහැ. ඒ අයිතිය තිබෙනවා. නමුත් එමඟින් යම් විධියකට තහවුරු වෙන වගකීම නීතිගත කරන්නත් අවශ්‍යයි කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. මොකද, එක පැත්තකට ගමන් කිරීමක් නොවෙයි, දෙපැත්තකට යන්න පුළුවන් විධියට කටයුතු කරන්න අවශ්‍යයි කියන එක මම මේ අවස්ථාවේ දී මතක් කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වේලාව බාධාවක් වෙලා තිබෙන බව මට පෙනෙනවා. මෙවැනි වැදගත් විගණන පනත් කෙටුම්පතක් නීතිගත කිරීම පිළිබඳව පැවැත්වෙන මෙම විවාදයේ දී මටත් කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් සතුටු වනවා. 1994 ඉඳලා කියනවා මෙවැනි පනත් කෙටුම්පතක් ගෙනෙන්න ඕනෑ, එහි ස්වාධීනත්වයක් තිබිය යුතුයි කියලා.

ස්වාධීනත්වය වාගේම එහි නිර්දේශපාලනීකරණයත් තිබිය යුතුයි කියලා මතයකුත් තිබෙනවා. රටේ ආයතන 350ක් විතර තිබෙනවා. මේ හැම එකකම යම් විධියක අලාභයක් තිබෙනවා. නමුත් අපට පෙනුණේ නැහැ, විගණකාධිපති දෙපාර්තමේන්තුවට මේ වාගේ අතිදූෂිත දේවල් හෙළිදරව් කර ගැනීමේ හැකියාවක් තිබුණා කියලා. ලංකා විදුලිබල මණ්ඩලයේ බිලියන ගණන් අලාභ තිබෙනවා. ගිය අවුරුද්දේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලාභය බිලියන 350යි. නමුත් විගණකාධිපති දෙපාර්තමේන්තුවට කිසිසේත්ම කියන්න බැරි වුණා, going concern concept එකක් අනුව මේ ප්‍රශ්නය ඇති වෙනවා කියලා. පටු මට්ටමින් බලනවා මිසක්, මේක ලෝක මට්ටමින් බලලා වාර්තා කිරීමේ හැකියාව, දක්ෂතාව ඒ ගොල්ලන්ට නැහැ. ඒ දක්ෂතාව නැත්නම් ඒක outsource කරන්න පුළුවන් හැකියාවත් අපි මේකට එකතු කරන්න ඕනෑ කියන එක මතක් කරමින්, මට කථා කිරීමට ඉඩප්‍රස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින්, මීට වඩා ස්වාධීනත්වයෙන් වැඩ කරන්න පුළුවන් විගණන පනතක් ඉදිරියේ දී ක්‍රියාත්මක වේවිය කියන බලාපොරොත්තුවෙන් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.44]

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට මේ පාර්ලිමේන්තු වාරයේ සාකච්ඡා කරනු ලබන ඉතාම වැදගත්ම පනත් කෙටුම්පතක් ගැන තමයි අද මේ උත්තරීතර සභාවේ සාකච්ඡා කරනු ලබන්නේ. මේ පිළිබඳව විවාදයේ දී මටත් අදහස් කිහිපයක් එකතු කරන්නට අවස්ථාව ලැබීම ගැන මා ඉතාම සතුටට පත් වෙනවා. අපි විශ්වාස කරන විධියට ලාංකීය ප්‍රබුද්ධ සමාජය දැකපු සිහිනයක් තමයි එක පැත්තකින් අද මේ යථාර්ථයක් බවට පත් වෙන්නේ. ලාංකීය සමාජය මේ විගණන පනත නැමැති දරුවා උපදවා ගන්න -බිහි කර ගන්න- කාලාන්තරයක් තිස්සේ විලිරුදාවෙන් පෙළුණා. හැබැයි, ඒ විලිරුදාවෙන් පෙළිලා-පෙළිලා අද අපි බිහි කර ගනු ලබන්නේ අඩු බර ඇති දරුවෙක් කියන එකයි අපේ විශ්වාසය. කොහොම වුණත් අපේ රටට විගණන පනත් කෙටුම්පතක් නිර්මාණය කරලා, රාජ්‍ය සම්පත්, බදු ගෙවන ජනතාවගේ මුදල්, වඩා විධිමත් විගණනයකට ලක් කිරීමට ගත් මේ ප්‍රයත්නයට අපි හිස නමා ආචාර කරනවා.

විශේෂයෙන්ම ඒ වෙනුවෙන් කැප වුණු විගණකාධිපති දෙපාර්තමේන්තුවේ හිටපු විගණකාධිපතිවරුන්ටත්, ඒ වාගේම වර්තමාන විගණකාධිපති ගාමිණී විජේසිංහ මැතිතුමාටත්, ඒ වෙනුවෙන් මේ සටනේ නියැළී සිටි විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිතිවලට, බහුජන ව්‍යාපාරවලට, විගණන පනත් කෙටුම්පත වහා ගෙන ඒමේ වුවමනාව පෙරදැරිව පාර්ලිමේන්තුවේත්, ඉන් පිටතත් කටයුතු කරපු සියලුම දේශපාලන ව්‍යාපාරවලටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට විතරක් නොවෙයි, බදු ගෙවන පුරවැසියකු හැටියට අපේ ආචාරය හිමි විය යුතුයි කියලා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ, මට ලැබී තිබෙන කෙටි වෙලාවේදී කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කරන්න මම කැමැතියි. පළමුවෙන්ම මම මේ කාරණය කියන්න කැමැතියි. මෙම ජාතික විගණන පනත අඩු පාඩු සහිත, අඩු බරැති දරුවකු වුවත්, මෙයින් අපට අත්වන වැදගත් වාසියක් තිබෙනවා. ඒ අන් කවරක්වත් නොවෙයි, ස්වාධීන විගණන සේවා කොමිසමක් ස්ථාපිත වීමයි. මේක අප ලැබූ මහා ජයග්‍රහණයක්. විගණන සේවා කොමිසමක් ස්ථාපිත වීම ජාතියක් හැටියට, රටක් හැටියට, සමාජයක් හැටියට අප ලැබූ මහා ජයග්‍රහණයක් ලෙස මා සලකනවා. එසේ බිහි වන මේ අඩු බරැති දරුවාගේ කකුල් ඇඳවෙලා තිබෙනවා පුළුවන්; අත් ඇඳවෙලා තිබෙනවා පුළුවන්; ඇස් පෙනීම දුර්වල වෙන්න පුළුවන්; නහය මුක්කම් වෙලා තිබෙන්න පුළුවන්; කන් ඇකිළිලා තිබෙන්න පුළුවන්. ඒවා කෙළින් කරලා, හදලා වඩලා, මස් පුරවලා ගන්න එක තමයි මේ උත්තරීතර සභාවේ කාර්යය විය යුත්තේ. මෙහි මස් පුරවන්න ඕනෑ තැන් තිබෙනවා. බලන්න, තමුන්නාන්සේලා මෙම විගණන පනතට ගෙනැත් තිබෙන සංශෝධනවලින් -ඒවා මොනවාට ගෙනාවාද කියා අපි දන්නේ නැහැ.- ව්‍යවස්ථාපිත ආයතනවල, සංස්ථාපිත ආයතනවල තිබෙන විගණන කළමනාකරණ කමිටු - Audit and Management Committees - ගලවා තිබෙනවා. ඒවා තිබිය යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Audit and Management Committee එකේ වාර්තාව විගණකාධිපතිවරයාට ලබා දිය යුතුයි කියා මේ පනතින් යෝජනා කර තිබෙනවා. හැබැයි සංශෝධනවලදී එම කමිටු ගලවා තිබෙනවා; එය අවශ්‍ය නැහැය කියනවා. කවුද ඒක කළේ? ඇයි ඒක කළේ? අපි දන්නවා සංස්ථාපිත ආයතනවල audit and management කටයුතු කෙරෙන්නේ, අභ්‍යන්තර විගණකවරු කටයුතු කරන්නේ එම ආයතනවල සභාපතිවරුන්ගේ වුවමනා අනුව බව. ඔහුට විගණන හා කළමනාකරණ කමිටුව අක්‍රිය කරන්නත් පුළුවන්, සක්‍රිය කරන්නත් පුළුවන්; එන්නේ නැතුව ඉන්නත් පුළුවන්, එන්නත් පුළුවන්. හැබැයි, අභ්‍යන්තර විගණන වාර්තාව විගණකාධිපතිවරයාට ලබාදීමට මෙම පනතේ තිබෙන ප්‍රතිපාදන සංශෝධනවලින් ගලවන්නේ නැතුව තබා ගන්නවා නම් ඒක වළකිනවා. අන්න එතකොට ආයතනවල තිබෙන විගණන හා කළමනාකරණ කමිටුව - Audit and Management Committee එක- ක්‍රියාත්මක වෙනවා වාගේම, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ අනුදැනුම, උපදෙස්, මඟ පෙන්වීම සහ බලපෑම යටතේ ආයතනය විගණනය හා කළමනාකරණය කරන්න අභ්‍යන්තර විගණකවරු බැඳී ඉන්නවා. නමුත්, මෙම පනතින් එය සිද්ධ වෙන්නේ නැහැ, සංශෝධනය මඟින් ඒ කොටස ගලවා තිබෙනවා. එය ගැලෙව්වේ කවුද කියා අපි දන්නේ නැහැ. පනත් කෙටුම්පතේ එය තිබෙනවා, නමුත් තමුන්නාන්සේලා ඉදිරිපත් කර තිබෙන සංශෝධනවලින් එම කොටස ගලවා තිබෙනවා.

ඇතැම් ආයතනවලට -විශේෂයෙන්ම රජයට පවරාගත් ආයතනවලටත් සහ නීති මත ස්ථාපිත කළ ආයතනවලටත්- විගණන හා කළමනාකරණ කමිටුවක් - Audit and Management Committee එකක් - අනවශ්‍යයි කියා මෙහි සඳහන් වෙනවා. ඒක කළේ කවුද දන්නේ නැහැ. ඒ පේළි අයින් කර තිබෙන්නේ ඇයි කියා අපි දන්නේ නැහැ. කාගේ වුවමනාවටද ඒක කළේ? ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. රජයට පවරාගත් ආයතනවල, නීති මඟින් ස්ථාපිත කළ ආයතනවල Audit and Management Committee එක පවත්වන්න පුළුවන් නම් ඉඩ දෙන්න කියා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, මම පොඩි පැහැදිලි කිරීමක් කරන්නද?

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මට පොඩි වෙලාවයි තිබෙන්නේ, ගරු ඇමතිතුමනි. කියන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳව මේ සභාවේ ඉදිරිපත් වුණු කරුණු අපි සලකා බැලුවා. ඔබතුමා කියන්නේ, 8 සහ 9 පේළි ගැන නේද?

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ඔව්, 8 සහ 9 පේළි ගැනයි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
අපි එය නිවැරැදි කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කොටස ඊට ඇතුළත් කරනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ඔබතුමා මේ පිළිබඳව සොයා බලනවා කියා මම දන්නවා. ඒ වාගේම, අභ්‍යන්තර විගණකගේ වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු කියන කාරණයත් අයින් තිබෙනවා. පනත් කෙටුම්පතේ එය තිබෙනවා, නමුත් සංශෝධනවලදී එය අයින් කර තිබෙනවා. අභ්‍යන්තර විගණකගේ වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කිරීම සංශෝධනවලින් නවත්වා තිබෙනවා. එය තිබෙන්නේ 40වන වගන්තියේයි. පුළුවන් නම්, ඒ කාරණයත් තිබෙන්න හරින්න. ඒක ඉතාම වැදගත්. එතකොට මේ පනතේ මස් ටික හොඳට පිරෙනවා ගරු අමාත්‍යතුමනි.

මෙන්න මේ කාරණය කෙරෙහිත් මම විශේෂ අවධානයක් යොමු කරන්න කැමැතියි.ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමනි, ඔබතුමා උගත් කෙනෙක්; රජයේ නීතිඥවරයෙක්. මේ පනතින්වත් ආවරණය නොවුණු අපේ රටේ ස්ථානයක් පිළිබඳව දැන් මගේ අවධානය යොමු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කවුරුත් දන්නවා, රාජගිරියේ ජයසිංහ ගොඩනැඟිල්ල කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා බද්දට ගත් බව. එය බද්දට ගැනීමේ ක්‍රියාවලියේදී, ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා සහ අමාත්‍යාංශ ලේකම්වරයා අමතලා විගණකාධිපතිවරයා ඉතා පැහැදිලිව කියනවා, මේ ගනුදෙනුව විචක්ෂණශීලී නැහැය කියා. "ඔබට රජමල්වත්ත ප්‍රදේශයේ අක්කරයක පමණ -මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මතකයේ හැටියට එම ඉඩමේ විශාලත්වය අක්කරයක් පමණ වෙනවා.- ඉඩමක් තිබෙනවා, එම ඉඩමේ ඔබට ගොඩනැඟිල්ලක් තැනිය හැකියි, එසේ තැනීමට පුළුවන්කමක් තිබියදී අධික මිල ගණනකට ජයසිංහ ගොඩනැඟිල්ල ගන්න එපා, එය විචක්ෂණශීලී ගනුදෙනුවක් නොවේ" කියා විගණකාධිපතිවරයා කියනවා. මොකද වෙන්නේ? විගණකාධිපතිවරයාට ඇහුම්කන් දීලා, ඒ ගනුදෙනුව නවත්වනවාද? එය නවත්වන්නේ නැහැ. එය නැවැත්තුවේ නැති වුණාම විගණකාධිපති දෙපාර්තමේන්තුව ඊට විරුද්ධව නඩු යනවාද? නඩු යන්නත් බැහැ. ඒ ගොඩනැඟිල්ලට මාසයකට රුපියල් දෙකෝටි විසි ලක්ෂයක් ගෙවමින් ඉන්නවා; තවමත් ගෙවමින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විගණන පනතිනුත් මේකට උත්තරයක් නැහැ. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, යෝජනාවක් කරන්න. අශ්වයා ගියාට පස්සේ ඌ ගිය විධිය හොයන්න තමයි වෙලා තිබෙන්නේ. එහෙම වෙන්න කලින්; මේ ගනුදෙනුව විචක්ෂණශීලී නැති බව කියා තිබියදීත්, අඩු ගණනේ ගනුදෙනුව නවත්වා ගන්න බැරි වුණා. මේ, ජනතාවගේ බදු මුදල්. කෘෂිකර්ම අමාත්‍යාංශය කෝටි ගණනින් නාස්ති කළා. හරි නම් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මේවාට වගකියන්න ඕනෑ; ඔහුට අධිභාර පනවන්න ඕනෑ. මේ ගනුදෙනුව විචක්ෂණශීලී ගනුදෙනුවක් නොවෙයි කියලා කියා තිබියදීත් එය සිදු කළා. "මේ ගොඩනැඟිල්ල ගන්න එපා, මෙහි වර්ග අඩියකට ගෙවන මුදල වැඩියි, තමන්ට ඉඩමක් තිබෙනවා, ඒ ඉඩමේ ගොඩනැඟිල්ලක් හදන්න පුළුවන්, ඒ නිසා මේ විධියට රුපියල් බිලියන ගණනින් විනාශ කරන්න එපා" කියා විගණකාධිපතිවරයා කියා තියෙද්දිත්, ගොඩනැඟිල්ලක් ගන්නවා. එහෙම අරගෙන, බදු ගෙවන ජනතාවගේ අරමුදල්වලට සහගහන අපරාධයක් කරනවා. තවම ඒකට උත්තරයක් නැහැ. ඒ නිසා, මේ විගණන පනත් කෙටුම්පත අද සම්මත වුණාට පස්සේ පළමුවැනි අධිභාරය ගෙවන්න ඕනෑ පුද්ගලයා ඒ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියායි කියා මා හිතනවා. ජනාධිපතිතුමා තමයි ඒ ලේකම්තුමා පත් කර තිබෙන්නේ. ජනාධිපතිතුමාට තමයි ප්‍රධාන ගණන් දීමේ නිලධාරින්ට අධිභාර පැනවීමේ වගකීම පැවරී තිබෙන්නේ. ජනාධිපතිවරයා ඔහුට මේ අධිභාරය පනවයිද කියා අපට ප්‍රශ්නයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය පැනවිය යුතුයි. මොකද, මේවා බදු ගෙවන ජනතාවගේ මුදල්. තුන්වේල කන්න විධියක් නැතුව මිනිසුන් හිඟමනට පත්වෙලා ඉන්නවා; බෙහෙත් නැතිව දරුවෝ ඉස්පිරිතාලවල ඇඳන් උඩ වෙවුල වෙවුලා ඉන්නවා; අහිංසක දරුවන් පොත පත, පෑන පැන්සල ගන්න විධියක් නැතිව ඉන්නවා. මේ වැසිකිළියක් නැති ඉස්කෝල තිබෙන රටක්; පාසල් යා යුතු වයසේ දරුවන් 458,000ක් සිටියත්, ඒ සියලු දරුවන් පාසල් නොයන රටක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

හොඳයි.

එහෙව් රටේ තමයි මේ මහජන මුදල් කාබාසිනියා කරන්නේ. එම නිසා මේ ජාතික විගණන පනතින් ඔබතුමන්ලා ආදර්ශයක් දෙන්න. මහජන අරමුදල්වලට වගකිව යුතු කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට අධිභාර පනවා තමුන්නාන්සේලා මේකේ සමාරම්භක පියවර තියන්න කියා අපි මේ වෙලාවේ යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. "රුපියල් ලක්ෂයක්" කියා මෙම පනතින් දඩයක් පනවනවා නේ. මේ ගැන මන්ත්‍රීවරු කිහිප දෙනෙක් කථා කරන්න ඇති. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, රුපියල් ලක්ෂයේ මේ දඩය රුපියල් පන්දහසට අඩු කර තිබෙනවා. දඩය රුපියල් පන්දහසට අඩු කිරීමට ඔබතුමා එකඟයිද? අනේ! මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවරන්නම - දඩයක් ගැසීම දක්වා වූ නඩු ක්‍රියාවලියටම- රාජ්‍ය මුදල් රුපියල් ලක්ෂ තුන හතරක් වියදම් වෙනවා. ඒ බදු ගෙවන ජනතාවගේ මුදල්. හැබැයි, ගහන්නේ රුපියල් 5,000ක දඩයක්. එහි යුක්තිසහගතභාවය මොකක්ද? ඒකද අපට ඕනෑ කරන නූතන විගණනය? ඒක නොවෙයි, ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමනි. ඔබතුමා මේ කාරණය පිළිබඳව බැරෑරුම් ලෙස කල්පනා කරයි කියා මා හිතනවා. නමුත් ඔබතුමාට කරන්න දෙයක් නැතුව ඇති. කාගේ වුවමනාවටද, කොයි තක්කඩියාද මේක වැළැක්වූයේ? මේ, "රුපියල් ලක්ෂයක්" කියන වචන පනතින් ගැලෙව්වේ කොයි තක්කඩියාද කියා අපි අහනවා.

අපි පිළිගන්නවා මේ පනත් කෙටුම්පත ප්‍රගතිශීලී පියවරක් කියලා. මේක ප්‍රගතිශීලී පියවරක් වෙන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි, විගණන සේවා කොමිසමක් පිහිටු වීම නිසයි. ලාංකීය සමාජය විලි රුදාවෙන් පෙළිලා පෙළිලා බිහි කරන ජාතික විගණන පනත් කෙටුම්පත කියන දරුවා අඩු බරැති දරුවෙක්. ඒ අඩු බරැති දරුවාගේ පාද දෙක හරියට කෙළින් කරලා, අත් පා හදලා, නහයේ මුක්කම ඇරලා, කන් පෙති කෙළින් කරලා ගැනීම මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ හෙට දවසේ වගකීමක් වෙනවා. ඒ වගකීම අපි හැමෝම ඉෂ්ට කරමු. ඒ වගකීම ඉෂ්ට කරලා මේ රටේ බදු ගෙවන ජනතාවගේ අරමුදල් අරපිරිමැස්මෙන් පවත්වාගෙන යාමටත්, නාස්තියෙන් දූෂණයෙන් වංචාවෙන් තොරව පවත්වාගෙන යාමටත් රටට වග කියන ජනතාවට වග කියන ජනතාවගේ සම්පත් ආරක්ෂා කරන අප හැම කටයුතු කරමු. ඒ සම්පත් කාබාසිනියා කරන කවුරු වුණත් තරාතිරම

නොබලා ඒවාට විරුද්ධව නිසි නීති ක්‍රියාමාර්ග ගන්නට පුළුවන් ශක්තිමත් විගණනකරණයක් මේ රටට හඳුන්වා දීමේ කාර්යයට පාර්ලිමේන්තුව දායක වෙමු, නායකත්වය දෙමු. ඒ වෙනුවෙන් මේ පනත් කෙටුම්පත ගෙන ඒමට කැප වුණු සියලු දෙනාට අපේ ආචාරය හිස නමා පුද කරමින්, මා නවතිනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.58]

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ජාතික විගණන පනතට රජයේ නිලධාරීන් වාගේම දූෂණයට සහ වංචාවට කැමැති දේශපාලනඥයෝ මුලින්ම විරුද්ධ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මතක් කරන්නට කැමැතියි 1994දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙනුත් මේ පනත් කෙටුම්පත ගෙන එන්නට උත්සාහ කළා. ඒ වාගේම අපේ නායක, වර්තමාන අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා 2002දී මේ වාගේ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී සම්මත කර ගැනීමට උත්සාහ කළා. නමුත්, 2002 - 2004 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් පසුව කිසිම රාජ්‍ය නායකයෙක්, නායිකාවක් හෝ අගමැතිවරයෙක් මේ වාගේ පනත් කෙටුම්පතක් සම්මත කර ගැනීමට උත්සාහ දැරුවේ නැහැ. යහ පාලන ආණ්ඩුව බලයට ඇවිල්ලා අවුරුදු තුනක කාලයක් ගත වෙලා තිබුණත්, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අද මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. අපි මේ පනත් කෙටුම්පත ගැන කාරක සභාවලදී සාකච්ඡා කරලා තිබෙනවා. එහිදී අපි විශේෂයෙන්ම විගණකාධිපතිවරයාගෙන් අහපු ප්‍රශ්නයක් තමයි, මේ පනත හරහා එතුමා බලාපොරොත්තු වෙන දේවල් ක්‍රියාත්මක වෙනවාද, නැද්ද කියන එක. එවිට එතුමා අපට පැවසුවේ, "ආරම්භයක් හැටියට මේ පනත හොඳයි. පාර්ලිමේන්තුවේ සියලුම දේශපාලන පක්ෂ නායකයන් එකතුවෙලා මේ පනත් කෙටුම්පත සම්මත කරන්නට ඕනෑ. ඒ විධියට භේදයකින් තොරව මේ පනත් කෙටුම්පත සම්මත කර ගත්තාම මේ හරහා ජනතාවටත්, ආණ්ඩුවටත්, රටේ අනාගතයටත් විශේෂ වටිනාකමක් ලැබෙනවා." කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී මතක් කළ යුතු කාරණා කිහිපයක්ම තිබෙනවා. 2015දී අපේ ආණ්ඩුව බලයට පැමිණි පසුව 19වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළා. ඒ වාගේම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත සම්මත කළා, ආංශික අධීක්ෂණ කාරක සභා හඳුන්වා දුන්නා. ඒ ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය අද මේ පාර්ලිමේන්තුව තුළ සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වෙනවා. අපි ඒ කාරක සභාවල සභාපති ධුර විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලබා දීලා තිබෙනවා. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගැන අනාගතයේදී කථා කරන විට, එතුමාගේ legacy ගැන කථා කරන විට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත මේ පාර්ලිමේන්තුවේදී සම්මත කර ගැනීමට කටයුතු කිරීම ගැන අපේ මිනිස්සු, මේ රටේ ජනතාව එතුමාට ස්තුතිවන්ත වෙයි. ඒ වාගේම මම මේ සභාව දැනුවත් කරන්නට අවශ්‍යයි, 2018 සැප්තැම්බර් මාසයේ 17වෙනි දා ඉඳන් අපි "EvalColombo" කියලා විශේෂ සම්මන්ත්‍රණයක් පවත්වන බව. ඒ සම්මන්ත්‍රණයට රටවල් 100ක පමණ මන්ත්‍රීවරුන් ලංකාවට එනවා. කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා ඒ සම්මන්ත්‍රණයට සති දෙකකට පමණ පෙර හැම අමාත්‍යාංශයකම evaluation පිළිබඳව යම්කිසි නිලධාරියකු පත් කරලා, ඒ වැඩ කටයුතු කරන්නට අවශ්‍යයි කියලා. ඒකත් මම මේ සභාවට මම මතක් කරලා දෙනවා.

තිරසර සංවර්ධන ව්‍යාපෘති පිළිබඳවත් මම මේ සභාවට ඉතා කෙටියෙන් දැනුම් දෙන්න කැමැතියි. මොකද, ඒකත් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වයෙන් තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි හැමෝම දේශපාලන පක්ෂවල සාමාජිකයන් හැටියට යම්කිසි කාලයක් ආණ්ඩු බලයේ ඉන්න බව දන්නවා. අනෙක් කාලවලදී අපි විපක්ෂයේ ඉන්නවා. හැබැයි, රටේ අනාගතය වෙනුවෙන් ඉතිරි වෙන්නේ මේ අවුරුදු තුනහමාර තුළ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ මේ ආණ්ඩුවෙන් පාර්ලිමේන්තුව තුළදී සම්මත කර ගන්නා පනත් පමණයි කියන එක මේ ගරු සභාවට මතක් කරමින් මට කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ සම්පූර්ණ කථාවේ ඉතිරි කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
*Rest of the speech tabled:*

බලයට පත් වන ආණ්ඩුවේ මැති ඇමතිවරු, රාජ්‍ය නිලධාරින් විසින් කරන රාජ්‍ය වියදම් පිළිබඳ ගිණුම් පරීක්ෂාකොට නිවැරැදි තොරතුරු රටට හෙළිකිරීම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ හා විගණකාධින්ගේ කාර්යයයි. ජනතාවගේ මුදල් මූල්‍ය විනයක් ඇතිව වියදම් කළ යුතුය. වාර්ෂිකව අය වැය හිඟය -පරතරය- වැඩි වන රටක දුප්පත්කම දරිද්‍රතාව වැඩි ශ්‍රී ලංකාවේ බදු ආදායම් හා විදේශවලින් ලැබෙන මුදල් වියදම් කිරීම සිදුවී ඇත්තේ මූල්‍ය විනයක් නොමැතිවයි. බොර දියේ මාළු බාන්නා වාගේ මෙම මුදල් ජාත්‍යන්තරය පිළිගත් මූල්‍ය විනයක් නොමැතිව වියදම් කිරීම නිසා වැඩි වන දුප්පත්කමේ දර්ශක මකා දැමීමේ ප්‍රධාන ක්‍රමෝපායකට වත්මන් රජය පියවර ගෙන තිබීම ප්‍රශංසා කළ යුතුය. විගණන පනතක් නොමැති ශ්‍රී ලංකාවේ ඉවක් බවක් නොමැතිව සිදු වන මූල්‍ය වංචාවන් වළකාලීම මෙම පනතේ අපේක්ෂාවයි. විගණකාධිපතිගේ කාර්ය සාර්ථක වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඔහුගේ ස්වාධීනත්වය ආරක්ෂාකොට ඇති ආකාරයටයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 194.(1) අනු ව්‍යවස්ථාවෙන් ආණ්ඩුවේ සියලු ආයතනවල ගිණුම් කටයුතු විගණකාධිපතිවරයා විසින් සිදු කළ යුතුය යනුවෙන් සඳහන් වුවත්, අංක 194.(2) අනු ව්‍යවස්ථාවෙන් අදාළ රාජ්‍ය සංස්ථා, වෙළඳ ව්‍යාපාර, වෙනත් ව්‍යාපාර අමාත්‍යාංශය භාර ඇමතිවරයාගේ මූල්‍ය පාලනයට යටත්කොට තිබීම පරස්පර හා වංචා දූෂණවලට ඉඩ සලසා තිබෙනවා. මේ නිසා මූල්‍ය වංචාවන් සිදු වෙනවා. සොරුන් බිහි කරන, සොරුන් රකින චෞර දේශපාලනඥයන් රජ කරන චෞර දේශපාලන සංස්කෘතියක් ශ්‍රී ලංකාව තුළ මුල් බැස ගෙන ඇත්තේ බෙලහීන විගණකාධිපති ධුර සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නිසාය. 1948 ශ්‍රී ලංකාව එංගලන්තයෙන් නිදහස් වන විට රට දෙවැනි වූයේ ආසියාවේ ජපානයට පමණි. සිංගප්පූරු රාජ්‍ය නායකයා ප්‍රකාශ කළේ සිංගප්පූරුව ලංකාවක් කරන බවය. එයට හේතු වී තිබුණේ විගණකාධිපතිගේ බලයේ ප්‍රමාණයයි. එහෙත් අද ශ්‍රී ලංකාව දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණදී සිටිනවා.

පසුගිය රාජ්‍ය අවධියේ මූල්‍ය පාලන නොතිබුණු නිසා මූල්‍ය වංචා දූෂණ රාශියක් සිදුවී තිබෙනවා. එමෙන්ම, ඒවා ගැන නිසි පියවරක් ගැනීම අසීරු වී තිබෙනවා. පැවැති නීතිවල දුර්වලතා නිසා බයක්, ලජ්ජාවක් නැතිව මූල්‍ය වංචාවන් සිදු කර තිබෙනවා. එයට හේතු වූයේ විගණන කාර්යයේ පැවැති දුර්වලතාවයි. ඒ නිසා රට ඉදිරියට ගෙන යන්න මේ විගණන පනත වහා සම්මත කළ යුතුයි.

හම්බන්තොට වරාය විගණනයට යටත් මූල්‍ය පාලනයක් තිබුණේ නැත. ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියට සිය තනතුරෙන් ඉවත්වීමට සිදු වුණේ දිවිනැඟුම පනතේ මූල්‍ය පාලනය සුරක්ෂිත කිරීමට පියවර ගැනීම නිසාය. විදේශ ණය ගෙවීම වාගේම අද රටට ඉසිලිය නොහැකි බරක් වී තිබෙන්නේ රාජ්‍ය ආයතන හා සංස්ථා අධික ලෙස පාඩු ලැබීමත්, එම ආයතන නඩත්තු කිරීමට භාණ්ඩාගාරයෙන් මුදල් යෙදවීමට සිදුවීමත් නිසාය. රාජ්‍ය නිලධාරින්ගේ අවධිමත් මූල්‍ය ක්‍රියාකාරකම් සිදුවීම. රාජ්‍ය නායකයින් හිරිකිතයක් නැතිව රජයේ මුදල් තමාට සම්බන්ධ ගිණුම්වලට ලබා ගැනීම.

[ගරු මයන්ත දිසානායක මහතා]

සිරිලිය සවිය, යොවුන් බලකාය, හෙල්පින් හම්බන්තොට ගිණුම, එල්ටීටීඊ එකෙන් ලබා ගත් මුදල් හා රන් භාණ්ඩ. මේවා රටේ ජනතාවගේ දුප්පත්කම තුරන් කිරීමට යෙදිය යුතුව තිබුණා. මෙම චෞර පාලනය නිසා රට බංකොලොත් වුණා. "වැටත්, නියරත් ගොයම් කා නම් කාට පවසම් ද" යන ප්‍රකාශය වාගේ මුල්‍ය සුරක්ෂණ ප්‍රතිපත්තියක් හා බලයක් නොමැතිකම මෙම මුදල් වංචාවලට හේතු වුණා. මෙම පනත එම දූෂණ වංචාවලට වැට බැඳීමක් වෙනවා.

රාජ්‍ය ආයතනවල, දෙපාර්තමේන්තුවල අයථා පාලනය රටේ මුදල් හිඟයට බලපානවා. නිමක් නොමැතිව සිදු වන වැඩ වර්ජන නිසා සිදු වන ආදායම් අහිමිවී යාම කොපමණ ද? මේ නිසා රටත්, ජනතාවත් අන්ත අගාධයකට ඇද වැටෙනවා. එහෙත් මේ පිළිබඳ සොයන විගණන ක්‍රමවේදයක් නැහැ. මෙම විගණන පනතින් රාජ්‍ය පාලනයත්, මුල්‍ය පාලනයත්, රටේ සංවර්ධනයත් සුරක්ෂිත විය යුතුයි. තරුණ මන්ත්‍රීවරයෙක් වශයෙන් රටේ අනාගත පරපුර ගැන හිතන දේශපාලනඥයෙක් වශයෙන් අපේ වගකීම මේ රට දියුණු කරන්නට ප්‍රධාන ආරක්ෂණ පියවරක් වශයෙන් මේ විගණන පනත් කෙටුම්පත සම්මත කිරීමයි. විගණන පනතක අවශ්‍යතාව ඇති වූයේ 2004 වසරේදී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ මුල්‍ය හා පරිපාලනයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට විගණනයේදී හෙළි වන අප්‍රමාණ වංචා, දූෂණ, අක්‍රමිකතා සඳහා පිළියම් යෙදීමටය. එහෙත්, මේ වනතෙක් එම අවශ්‍යතාව ඉටු කර ගැනීමට හැකි වුණේ නැහැ.

පසුගිය පාලන සමයේ මුල්‍ය පාලන සුරක්ෂිතතාව ආරක්ෂා කරනවා තියා යන්තම් හෝ මුල්‍ය පාලනය සඳහා රැකවරණය ලබා දුන් රාජ්‍ය සේවා සහ අධිකරණ සේවා කොමිෂන් සභා පවා විසුරුවා හැරියා. මුල්‍ය පාලනයට තිබූ ආරක්ෂිත බැමි බිඳ හෙළුවා. අත්තනෝමතික ලෙස මුල්‍ය සංස්කෘතියක් නිර්මාණය කර ගත්තා. මේ නිසා විදේශ ණයවලින් නිසි සංවර්ධනයක් වුණේ නැහැ. 2007 පැවැති එක්සත් ජාතීන්ගේ උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේදී "මෙක්සිකෝ ප්‍රකාශනය" තුළින් විගණන ආයතනවල ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට විධිවිධාන සැකසුවා. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ආධාර හා රට තුළ ක්‍රියාත්මක කළ යුතු මුල්‍ය ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක නොකළ නිසා විදේශ රටවල් හා මුල්‍ය ආයතන අප රට ගැන තිබූ විශ්වාසය කඩ වුණා. ඒ නිසා අවාසි බොහොමයක් සිදු වුණා. විදේශ ණය මත රැඳෙන රටක් වශයෙන්, දියුණු විය හැකි භෞතික සම්පත් සුලභ රටක් වශයෙන්, කුසලතා පූර්ණ ජනතාවක් සිටින රටක් වශයෙන් ශ්‍රී ලංකාව වැටී තිබෙන ආර්ථික අගාධයෙන් ගොඩ ගැනීම සඳහා මෙම විගණන පනත ඉවහල් කර ගැනීම, යහ පාලනයේ තිරසර සංකල්පය මල්පල ගැන්වීමටත් මෙම පනත ප්‍රයෝජනවත් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 3.03]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පත පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාත් මේ ගරු සභාවේ සිටින නිසා මා පනත් කෙටුම්පතේ සංශෝධන පිළිබඳවත් කියන්න ඕනෑ. මොකද, මෙහි යම් යම් සංශෝධන Committee Stage එකේ සංශෝධනය කරන්න බැරි නිසා ඔබතුමාගේ අවධානය ඒ කෙරෙහි යොමු කරවන්න පුළුවන් වුණොත් හොඳයි කියලා හිතුණා. ජාතික විගණන පනත් කෙටුම්පත අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව ප්‍රථමයෙන්ම අපි රටක් හැටියට සන්තෝෂ වෙන්න ඕනෑ. මොකද, මීට අවුරුදු එකහමාරකට විතර කලින් විගණකාධිපතිතුමා මාධ්‍ය සාකච්ඡාවක් තියලා කිව්වා, "දැන් අවස්ථා 22කදී මේ සංශෝධන කළා. තවම මේක ආවේ නැහැ. නියෝජ්‍ය විගණකාධිපතිවරු 15 දෙනෙක් පත් කරන්න ඕනෑ. නමුත්, එක්කෙනයි ඉන්නේ. බොහොම අමාරුවෙන් තමයි මේ කර්තව්‍ය කරන්නේ." කියලා. මොකද, ස්වාධීන කොමිසමක් හැදුනාට පසු මෙම පනත නැතිව ක්‍රියාත්මක කරන්න යම් යම් බාධාවන් තිබුණා. එම නිසා ප්‍රමාද වී හෝ හොඳ වැඩක් රටට කිරීම ගැන අපි හැමෝම සන්තෝෂ වෙන්න ඕනෑ. නමුත්, මෙය සම්පූර්ණ වෙච්ච ජාතික විගණන පනත් කෙටුම්පතක් කියලා අපට දැනට එකඟ වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ කෙසේ වෙතත්, Transparency International ආයතනය විසින් විග්‍රහයක් කරලා තිබෙන නිසාත්, ඒ වාර්තාවේ තිබෙන යම් යම් යෝජනා ඔබතුමාට ලැබිලා ඇති. ඒවා සියල්ල වාගේ සංශෝධනය වෙනවා නම් හොඳයි. නමුත්, එහි කරුණු කිහිපයක් කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ජාතික විගණන පනත් කෙටුම්පතේ 7. (4) (1) වන උපවගන්තියේ මෙහෙම සඳහන් වෙනවා:

"... විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු ඉදිරියේ පෙනී සිටීම සඳහා එම, විෂයය පිළිබඳ මනා දැනුමක් ඇති වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය."

නමුත් මම හිතනවා, ඒක ඔහුගේ අනුදැනුම ඇතිව තමයි වෙනස් වෙන්න ඕනෑ කියලා. මගේ කථාවට වෙලාව මදි නිසා පුළුවන් නම් අද හැන්දෑවට ඉස්සෙල්ලා මේ යෝජනා නැවත ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමනි, අවස්ථාවක් තිබුණොත් ඒ වෙනස්කම් කරන්න.

ඒ වාගේම, ජාතික විගණන පනත් කෙටුම්පතේ 23. (10) උප වගන්තියේ මෙහෙම සඳහන් වෙනවා:

"මේ පනතේ IV වන කොටසේ කාර්ය සඳහා, විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරයා විසින් වෙනත් යම් ලිඛිත නීතියකට පටහැනිව සිදුකරන ලද ගනුදෙනුවක දී වංචාව, නොසැලකිලිමත්කම, සාවද්‍ය පරිහරණය හෝ දූෂණය හේතුවෙන් යම් ඌනතාවක් හෝ පාඩුවක් ඇති කිරීමට හේතු වී ඇත්නම් හෝ ඒ සඳහා සම්බන්ධ වී ඇති බව විගණන සේවා කොමිෂන් සභාව විසින් හඳුනාගත් අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින්, 19 වන වගන්තියේ (3) (ඉ) (ii) උපවගන්තියේ දක්වා ඇති මුදල, එම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයාගෙන් අය කර ගනු ලැබිය යුතු ය."

ඒකෙත් සංශෝධනයක් බලාපොරොත්තු වෙනවා. විගණකාධිපතිතුමාට එතැනදී කටයුතු කිරීමේ හැකියාවක් නැති වෙන නිසා එතුමා නැතිව එය සහභාගී කරගත යුතුයි කියන එකයි කියන්නේ. ඒ වාගේම, ජාතික විගණන පනත් කෙටුම්පතේ 23. (10) උප වගන්තියට පහත සඳහන් කොටස එකතු කරන්න කියලාත් ඉල්ලා සිටිනවා. "20 වගන්තිය යටතේ ඌනතාවයට හෝ පාඩුවට වග කිවයුතු තැනැත්තෙකුට භාවිත කළ හැකි අභියාචනා ක්‍රමවේදය 23. (10) (i) වගන්තිය යටතේ අධිභාර පැනවීමකට ලක්වන ප්‍රධාන ගණන්දීමේ නිලධරයෙකුට ද අදාළ වේ" යන සංශෝධනය එකතු වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මේ සංශෝධනයත් මම ඔබතුමාට ඉදිරිපත් කරනවා. 26. (1) උප වගන්තියටත් ඇතුළත් විය යුතුයි, "23. (10) (ii) වගන්තිය යටතේ කාර්යයට සහභාගී නොවී නිදහස් වූ විට, පැමිණ සිටින සාමාජිකයන් අතරින් තෝරාගනු ලබන සාමාජිකයකු විසින් රැස්වීමේ මුලසුන දැරිය යුතු ය." කියන එක.

කාරක සභා අවස්ථාවක් නැති නිසා මම මේ අවස්ථාවේදී මේ සංශෝධන ඉදිරිපත් කරනවා.

මෙම පනත් කෙටුම්පතේ 42. (1) (ආ) හි මෙසේ සඳහන් වනවා:

"විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තකු ඉදිරියේ පෙනී සිටින ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට එසේ පෙනී සිටීම ප්‍රතික්ෂේප කරන හෝ එම විෂය පිළිබඳ මනා අවබෝධයක් ඇති තැනැත්තකු නම් කිරීමට අපොහොසත් වන;"

ඒ සංශෝධනය සම්බන්ධයෙන් අපි මෙසේ කියනවා. සාමාන්‍යයෙන් කෙනෙකුට එන්න බැරි නම්, වෙනත් කෙනෙකු ඉදිරිපත් කිරීමේ අයිතියක් තිබෙන්න ඕනෑ. එහිදී "අපොහොසත් වන" කියන කොටස තිබෙනවා. නමුත්, ඔහු එන්න බැහැයි කියලා ප්‍රතික්ෂේප කළොත්, එතකොට ඒ පරීක්ෂණය පැවැත්වීමේ අපහසුතාවක් තිබෙනවා. එම කරුණ එකතු වන්න ඕනෑ. ඒ වාගේම මෙහිදී යම් කිසි කෙනෙකුට නීති උපදෙස් ලබා ගන්න නීතිඥයෙකු ගන්න බැරි නම්, ඔහු නියෝජනය කරන්න legal aid ලබා ගැනීමට  හෝ වෙනත් කුමන හෝ අවස්ථාවක් තිබෙන්න ඕනෑ.

මෙවැනි කරුණු කීපයක් තමයි මම ඉදිරිපත් කරන සංශෝධනවලින් බලාපොරොත්තු වන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ පැය කීපය තුළ අවශ්‍ය සංශෝධනවලට අවධානය යොමු කරයි කියලා මම හිතනවා.

කෙසේ වෙතත් විගණකාධිපතිතුමාගේ පැත්තෙන් බැලුවොත් මෙම කටයුතු ප්‍රමාද වීමෙන් අපට පෙනෙන දෙයක් තිබෙනවා.

The Secretary to the Ministry is the Chief Accounting Officer. He is responsible and his responsibility lies not only on the action taken on the directives but also on the viability of the project - financial input of the project and the sustainability of the project - and he has to make sure that the money spent is properly investigated into. We can see that by bringing in this Bill, the powers of the Auditor -General is made much stronger. The Auditor-General is an officer who is answerable to Parliament. Therefore, by bringing in this Bill, what we are doing is, we are simply strengthening Parliament and that is something that we have to applaud. The fact is that we are bringing in these changes through a Commission. At the end of the day, the Auditor-General is doing a post-audit. So, what is lacking here is that the audit should be done during or before the approval is given and that is why we need an Audit Office in Parliament.

අපට පාර්ලිමේන්තුවේ අය වැය කාර්යාලයක් -Audit Office එකක්- නැහැ. අය වැය පාර්ලිමේන්තුවෙන් අනුමත කළාට පස්සේ තමයි, අදාළ අමාත්‍යාංශවලින් මුදල් වැය කරන්නේ. එලෙස අමාත්‍යාංශ මුදල් වැය කරපු විධියේ අඩු පාඩුකම් ඇතුළු සියලු දේ අධීක්ෂණය කිරීමේ හැකියාව විගණකාධිපතිතුමා ප්‍රමුඛ විගණකාධිපති දෙපාර්තමේන්තුවට තිබෙනවා. නමුත්, අපට දැනට පාර්ලිමේන්තුවේ අය වැය කාර්යාලයක් නැහැ. මෙවර අය වැය සම්මත කරන්න කලින් ඔබතුමන්ලා හැකි ඉක්මනට පාර්ලිමේන්තුවේ අය වැය කාර්යාලයක් ස්ථාපිත කරන්න. එය අනිවාර්යයෙන් තිබිය යුතුයි. ඒ වාගේම එම ආයතනය ස්වාධීන විය යුතුයි. අය වැයක් සම්මත කරන්න කලින් ඒ අදාළ අමාත්‍යාංශයට වෙන් කරන ලද මුදල් මොන ව්‍යාපෘතිය සඳහාද, මොන කරුණු සඳහාද වෙන් කරන්නේ කියලා අපේ මන්ත්‍රීවරු සියලුදෙනාට දැනගැනීමේ අයිතියක්; දැනගැනීමේ හැකියාවක් තිබිය යුතුයි. ඒ සඳහා අපේ පාර්ලිමේන්තුවේ ස්ථිර Budget Office එකක් ස්ථාපිත කළ යුතුයි. ලෝකයේ දියුණු වූ බොහෝ රටවල් මේ වනකොට Budget Office එක හදා අවසන්. සමහර රටවල Upper House එකයි, Lower House එකයි තිබෙන නිසා ඒ අයට Budget Office එක හරහා එම කටයුතු ඉතාම සාර්ථකව හා ස්වාධීනව කර ගෙන යන්න පුළුවන් වෙලා තිබෙනවා. අය වැයෙන් කරන මුදල් වෙන් කිරීම් සම්බන්ධයෙන් Budget Office එකෙන් වාර්තාව ලැබුණාට පස්සේ තමයි අය වැය අනුමත කරන්නේ. එහෙම දෙයක් නොකර මේ මුදල් වෙන් කළේ මොන හේතුව මතද කියලා  සංසන්දනාත්මකව බලන්න අපට අමාරුයි. එහෙම නැති වුණොත් අපට මේ දේවල් සංසන්දනාත්මකව බලන්න වෙන්නේ අදාළ දෙපාර්තමේන්තුවෙන් හෝ අමාත්‍යාංශයෙන් දෙන වාර්තා මතයි.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට බාධා කරනවා නොවෙයි. පාර්ලිමේන්තුවේ Budget Office එක පිහිටුවීම සඳහා වූ පනත් කෙටුම්පතත් අපි ඉක්මනටම ඉදිරිපත් කරනවා. ඒක වෙන්නේ ගරු අගමැතිතුමාගේ සම්පූර්ණ සහයෝගය ඇතිවයි. කාරක සභා රැස්වීම්වලදීත්, ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ රැස්වීම්වලදීත් ඒ ගැන අපි කථා කළා.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු අගමැතිතුමා වෙනුවෙන් ඔබතුමා අදහස් ඉදිරිපත් කිරීම ගැන මම බොහොම සන්තෝෂ වනවා, ගරු මයන්ත දිසානායක මැතිතුමනි.

කෙසේ වෙතත්, අපි මෙය සාර්ථක කරගන්න නම්, මෙහි මූල ධර්මය මොකක්ද කියලා බලන්න ඕනෑ. දැන් අපි අමාත්‍යාංශවලට මුදල් වෙන් කරනවා; වෙන් කරලා අපි අනුමත කරනවා. පසුව ඒක විගණනය කරනවා. අපේ Budget Office  එක ඉක්මනින් ස්ථාපනය කළාම, එය විගණකාධිපතිතුමාට ශක්තියක් වෙනවා.

ඒ Budget Office එකට නිලධාරින් ගැනීමේදී ඒ අය අනිවාර්යයෙන්ම ස්වාධීන විය යුතුයි. ඒ අය කිසිසේත්ම අග්‍රාමාත්‍යතුමාට හෝ ජනාධිපතිතුමාට හෝ ඇමතිවරුන්ට සෘජුව වග කියන කණ්ඩායමක් නොවිය යුතුයි.

පෞද්ගලික අංශයේ හොඳ Accountant කෙනෙක් රුපියල් ලක්ෂ දෙකක, තුනක වැටුපක් ගෙවන්නේ නැතිව ගන්න බැහැ. ප්‍රධාන ගණකාධිකාරී, එහෙම නැත්නම් CFO -Chief Finance Officer-  වැනි කෙනෙක් ගන්න කොට වැටුප වශයෙන් රුපියල් ලක්ෂ හයක්,  හතක් පෞද්ගලික අංශයේ ගෙවනවා. මෙවැනි අත් දැකීම් බහුල ආයතනවලින් හොඳට විශ්ලේෂණයක් කරලා අපේ ව්‍යාපෘතියක් - project එකක්- ගත්තොත් බිලියන ගණන් මුදල් වැය කරනවා. ඒක විශ්ලේෂණය කළ හැකි හොඳ විගණන කණ්ඩායමක් අවශ්‍ය නම්, ඒ අය වෙනුවෙන් වෙනම මුදලක් වෙන් කරලා අවංකව ඒ අය ශක්තිමත් කරන්න ඕනෑ. එතකොට මන්ත්‍රීවරුන් හැමෝටම වාර්තාවක් ලැබෙනවා, මෙච්චර මුදලක් මේ ව්‍යාපෘතියට වැය කරනවා; මේ මුදලින් මෙච්චර ප්‍රමාණයක් වැය කරන්නේ මේ හේතුව මතයි. මෙච්චර මුදලක් අපි කෙටි කාලීන ණය ගන්නවා; මෙච්චර මුදලක් දීර්ඝ කාලීනව ගන්නවා, ඒ සඳහා මෙච්චර පොලියක් වෙන් වෙනවා කියලා. ඒ ගැන ස්වාධීන විශ්ලේෂණයක් ආවාම, ඒ ස්වාධීන වාර්තාව සංසන්දනය කිරීමේ හැකියාව තිබෙනවා. එය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලයේදී විගණකාධිපතිතුමාගේ කාර්යයක් වනවා. අන්න එතැනදී රජයේ සේවය කරන ප්‍රධාන නිලධාරින් ක්‍රියාත්මක වුණු විධිය බලන්නට පුළුවන්.

අපි හැමෝම දන්නවා, සාමාන්‍යයෙන් දේශපාලනඥයා බැණුම් අහනවා; නොයෙකුත් චෝදනා ලබනවා කියා. නමුත්, ස්ථිර සේවාවේ සිටින රජයේ සේවයේ අයගෙන් සිදු වන අඩු

[ගරු තිලංග සුමතිපාල මහතා]

පාඩුකම් නිසා සමහර වෙලාවට වන හානිය සහ පාඩුව ඊටත් වැඩියි. මේ පනත් කෙටුම්පතෙන් ඒක අඩු කර ගන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා. එහිදී සමගාමීව සංසන්දනාත්මක වාර්තාවක් හැදීමේ හැකියාවක් මෙහි නැහැ. ඒ කෙරෙහි අපේ අවධානය යොමු කරන්න ඕනෑය කියා මම හිතනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමනි, Budget Office එක ඉක්මනින් ස්ථාපිත කළ යුතු යැයි ඔබතුමා සඳහන් කළ කාරණය ඉතාම වැදගත් වනවා.

විගණනය පිළිබඳ කාරණයේදී ගණකාධිකාරිවරුන්ට පමණක් මේ විගණන කටයුතු කිරීමේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සඳහා විෂයය මූලික විශේෂඥයන් සිටින්නට ඕනෑ. ඇමෙරිකා එක්සත් ජනපදයේ ඉංජිනේරුවන්, ඒ වාගේම ආර්ථික විශේෂඥයන් වැනි අය ඒ කටයුතුවල ඉන්නවා. මොකද, ගණකාධිකරණය එකක්; ආර්ථික විද්‍යාව තවත් එකක්. ඒ වාගේමයි විද්‍යාත්මක විෂයයන් හා සම්බන්ධවවත්. අපේ energy අංශය ගත්තත්, එහෙම නැත්නම් transport අංශය ගත්තත්, එහෙම නැත්නම් විද්‍යාත්මක කරුණු ගත්තත් ගරු මන්ත්‍රීතුමනි, මෙතැන ස්වාධීනත්වය පමණක් ප්‍රමාණවත් නැහැ. ඒ සඳහා විෂයානුබද්ධ විශේෂඥතාව අවශ්‍යයි. මේ කාරණය සම්බන්ධව අපි හැමෝම අවධානය යොමු කරන්න ඕනෑ.

ඒ Budget Office එකට බඳවා ගැනීමේදී ගණකාධිකාරිවරුන්ට අමතරව,-

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ වෙලාව ගත වනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
විශේෂඥයන්ගේ සේවාව ලබා ගන්න ඕනෑ කියා මම යෝජනා කරන්න කැමැතියි. ඔබතුමාත් ඒ මතයේ සිටින බව අපි දන්නවා. මෙවැනි ප්‍රශ්නයක් මතු කිරීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ඔබතුමාගේ අදහස් නිවැරදියි. නමුත්, Budget Office එකක් කියන එකේදී, විගණනය කරන්න කලින් අදාළ අමාත්‍යාංශයේ ආංශික අධීක්ෂණ කාරක සභා -Sectoral Oversight Committee- තිබෙනවා නේ. සෙසු තැන්වලින් තාක්ෂණ නිලධාරින් එන්නේ ආංශික අධීක්ෂණ කාරක සභාවටයි. එහෙම නැතිව, බස් ගැන, කාර් ගැන, ලොරි ගැන, highways ගැන, එහෙම නැත්නම් කුඹුරු ගැන, පොහොර ගැන, මෙවැනි අමාත්‍යාංශ හතළිහක පමණ සියලු දේ ගැන විශේෂඥ දැනුම තිබෙන අය විගණනය සඳහා Budget Office එකට ගන්න විගණකාධිපතිතුමාට පුළුවන්කමක් නැහැ. දැනටමත් ආංශික අධීක්ෂණ කාරක සභා 17ක් තිබෙනවා. ඒ ආංශික අධීක්ෂණ කාරක සභාවලට අදාළ ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුම තිබෙන අය කැඳවලා, එහි feasibility එක බලලා, ඒ වාර්තාවන් සාර්ථක කර ගෙන, සෙසු ආයතනවල වග කීමක් තිබෙන නිලධාරින්ගෙන් ගන්න පුළුවන්. එවැනි රජයේ ආයතන තිබෙනවා. තාක්ෂණ දැනුම තිබෙන ආයතන රජයේ තිබෙනවා. ඒවායින් දෙන වාර්තා කෙරෙහි අපට විශ්වාසය තබන්න වනවා.

We have to rely on those professional institutes. We will make a small Budget Office without having a huge overhead. Then you can always outsource. Hon. Ajith P. Perera, your point is taken. I am not saying "no" to it. But whether we can afford to have 50 to 60 people in a Budget Office or should we have a department confined to the purpose of audit which will know our inflation, all the required financial indicators and our yardsticks is what is lacking now.

ඒ ගැන කථා කරන්න මම මීට වඩා වෙලාව ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. කෙසේ වෙතත් මෙය ප්‍රමාද වීමෙන් යම් යම් පුද්ගලයින් ප්‍රයෝජන ගන්නා බව පෙනෙනවා. ඊයේත් රේගු ආඥා පනත යටතේ යම් යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. ඒක හොඳයි. මොකද, රේගුවේ සිටින විශේෂ හැකියාවන් තිබෙන අයට, මහන්සි වන අයට මුදල් බෙදිලා ගිහින් තිබුණේ නැහැ. ඒ වාගේම ගරු ඇමතිතුමනි, මෙයට සමගාමීව Auditor-General මහත්මයාට ලබා දෙන ශක්තිය සහ සහයෝගයත් එක්ක සියලුම රාජ්‍ය ආයතනවලට අදාළව තිබෙන circularsවලත්, එහෙම නැත්නම් දී තිබෙන උපදෙස් මාලාවන්වලත් යම් කිසි සංශෝධනයක් කරන්න ඔබතුමාට සිද්ධවෙයි කියලා මම හිතනවා. මොකද, ඒක ක්‍රියාත්මක වෙන්න නම් වැඩමුළු පවත්වලා, දැනුවත් කරලා, මේකට අවශ්‍ය awareness ඇති කරලා, මේක කරන්නේ ඇයි කියලා ඒ අයට තේරුම් කර දෙන්න ඕනෑ. මොකද, අඩුපාඩුකම් තිබෙන, වංචාවලට සම්බන්ධ වන නිලධාරින් කිහිප දෙනෙක් ඇති. නමුත් අති බහුතරයක් රාජ්‍ය සේවකයින් හරිම අවංකයි. නමුත් ක්‍රියා පටිපාටියේදී ඒ අය අනුගමනය කරන ගතානුගතික ක්‍රමවේදයන් නිසා විගණකාධිපතිතුමා බලන මූලික කරුණු මොනවාද, දත්ත මොනවාද කියලා විග්‍රහ කර ගන්න ඒ අයට පුළුවන්කමක් ඇතිවෙන එකක් නැහැ. ඒ වාගේම ඒ ඒ අමාත්‍යාංශවලට තිබෙන වගකීම් අනුව වෙන් වෙන් වශයෙන් තමන්ට තිබෙන දැනුම, තාක්ෂණ අවශ්‍යතාව වෙනස් වෙනවා. ඒ නිසා මේ සියලු දේවල් පිළිබඳවම අංග සම්පූර්ණ දැනුමක් ඇතිව විග්‍රහයක් කරන්න විගණනයට පුළුවන්කමක් නැහැ. විගණකාධිපතිතුමා හැටියට එතුමන්ලාගේ දෙපාර්තමේන්තුවට මේ විගණන කොමිසමෙන් විශාල වාසියක් සිදුවන බව ඇත්ත. එය රටට හොඳ ආරම්භයක් බව කියන්න පුළුවන්. මේ අපේ මුල් අදියර. රටේ ප්‍රධාන අංශවලට මුදල් වෙන් කිරීමේදී පාර්ලිමේන්තුව වග කියන නිසා, පාර්ලිමේන්තුව තුළින් තමයි අපි වියදම් කරන හැම දෙයක්ම ගණන් බලන්නේ; වෙච්ච දේවල් සොයලා බලන්නේ,

පාර්ලිමේන්තුව තමයි මේ රටේ රජයේ ආදායම් පිළිබඳව හැම ශතයක්ම සොයලා බලන්නේ. වියදම් කළේ කොහොමද කියලා සොයලා බලන්න අපි බොහොම කැමැතියි. අය වැයට කලින් මේ පාර්ලිමේන්තුවේ මීට වඩා විශාල වැඩ කොටසක් අපට කරන්න තිබෙනවා. නමුත් මේ සියලු දේවල් ක්‍රියාත්මක වන්නේ අපේ අය වැය ලේඛනය ඉදිරිපත් කළායින් පස්සේ. අය වැය විවාදයේදී අපි සංවාදශීලී වෙනවා; විවාද කරනවා. අපි විවාද කරන්නේ අදාළ රේඛීය අමාත්‍යාංශයෙන් කරන ලද යෝජනා මතයි. ඒවායේ අවුරුදු තුනක, අවුරුදු පහක සැලැස්මක් මත, අදියර එක මෙහෙම වෙනවා, අදියර දෙක මෙහෙම වෙනවා යනාදී වශයෙන් පැහැදිලි වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේ නැහැ.

මම මීට වඩා වෙලාව ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපට මෙහි සංශෝධනවලට අවස්ථාවක් නැහැ. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා මේ ගැන විශේෂ අවබෝධයක්, දැනුමක් තිබෙන නීතිය පිළිබඳව දන්නා කෙනෙක් නිසා, එතුමාගේ විශේෂ අවධානය යොමු කරලා අපි යෝජනා කරන සංශෝධන ඇතුළත් කරන්නය කියා ඉල්ලා සිටිමින්, විශේෂයෙන්ම Transparency International ආයතනයට මගේ විශේෂ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාගේ කථාවේදී පමණක් නොවෙයි, ඊට පෙර අදහස් දක්වන අවස්ථාවේදී බොහෝ ගරු මැති ඇමතිවරුන්ගෙන් ආපු අදහසක් තමයි මේ විගණන කොමිෂන් සභාව හරහා රජයේ මූල්‍ය ගනුදෙනු පද්ධතීන් සියල්ල අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් අවශ්‍යයි කියන එක. ඒ වාගේ හැඟීමක් තමයි දුන්නේ. අපේ පාර්ලිමේන්තු ක්‍රමය සකස්වෙලා තිබෙන්නේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳව අධීක්ෂණය කිරීම අදියර තුනකින් සිදු කිරීමටයි. පළමුවැනි අදියර තමයි මුදල් වෙන් කරන කොට අය වැය විවාදයේදී ඒ මුදල් වෙන් කිරීම පිළිබඳව පාරදෘශ්‍යභාවයකින් යුතුව පාර්ලිමේන්තුවේ වාද විවාද කරලා තීන්දු තීරණ ගැනීම. ඊළඟ එක, ඒ වෙන් කරන ලද මුදල් කාල පරිච්ඡේදය තුළ වියදම් කිරීම කෙසේ වෙනවාද කියලා සොයලා බලන ක්‍රමවේදය. ඒ සඳහා ඉස්සර තිබුණේ අමාත්‍යාංශ උපදේශක කාරක සභා. දැන් ඒ වෙනුවට ආංශික අධීක්ෂණ කාරක සභා තිබෙනවා. තුන්වැනි අදියර තමයි, මුදල් වියදම් කරලා ඉවර වුණාට පස්සේ ඒවා නිසි පරිදි යොදවා තිබෙනවාද කියන එක පිළිබඳවත්, ඒවායේ කාර්යක්ෂමතාව පිළිබඳවත් සොයලා බලන එක. ඒ සඳහා තමයි මේ විගණන ක්‍රියාවලිය තිබෙන්නේ.

ඒ විගණන ක්‍රියාවලිය පාර්ලිමේන්තුවේ පාලන බලයට යටත් කරන්න තමයි 1860 ගණන්වල මහා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට හඳුන්වා දීපු කාරක සභා ක්‍රමය -රාජ්‍ය ගිණුම් කාරක සභා ක්‍රමය- අපේ මේ පාර්ලිමේන්තු ක්‍රමයට හඳුන්වා දී තිබෙන්නේ. ඒ අනුව තමයි COPE එක සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව කියන දෙක ක්‍රියාත්මක වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනතේ අවශ්‍යතාව අද ඊයේ එකක් නොවෙයි. මාත් නීති කොමිෂන් සභාවේ සාමාජිකයකු විධියට සිටි කාලයේ 2004 වර්ෂයේදී තමයි අප මේ පනත් කෙටුම්පත සකස් කළේ. නමුත් 2004 වර්ෂයේ ඉඳලා 2015 වර්ෂය වන කල් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ නැහැ. මෙය 2015 ඉඳලා අවුරුදු 3ක් ප්‍රමාද කළා කියා ආණ්ඩුවට චෝදනාවක් තිබෙන බව අපි දන්නවා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනික වුවමනාවකට හෝ ආණ්ඩුවේ වුවමනාවකට හෝ මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම අපි එක දවසකටවත් කල් දැම්මේ නැහැ. මොකද, මෙය ගැට ගැසී තිබෙන්නේ රාජ්‍ය නිලධාරින් එක්කයි. ඒ රාජ්‍ය තන්ත්‍රයත් එක්ක සාකච්ඡා කරලා ඒ අය ඉදිරිපත් කරපු මේ කරුණු කාරණා සලකා බලා කටයුතු කරගෙන ගිය නිසා තමයි මේ වාගේ ප්‍රමාදයක් ඇති වුණේ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

Sir, I rise to a point of Order.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

පොඩ්ඩක් ඉන්න, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තුන්වන කාරණය මේකයි. ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා යෝජනා කළා, අය වැය කාර්යාලයක් - Budget Office - එකක් ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ යෝජනාව අප පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ 2007 වර්ෂයේදීයි. COPE එකේ මතු වූ කාරණාත් එක්ක අපි pre-budgetary debate එකක් ඉල්ලුවා. ඒ කියන්නේ අය වැය යෝජනා ගැන නොවෙයි. අය වැය යෝජනා ගෙනෙන්න කලින් මුදල් වෙන් කරලා පූර්ව අය වැය විවාදයක් ගන්නත්, ඒ වාගේම අය වැය කාර්යාලයක් - Budget Office එකක්- හදලා එහි data bank එකක් හදන්නත් තමයි අප සැලසුම් කළේ. මේ සඳහා ජාත්‍යන්තර මූල්‍ය ආයතනයකින් රුපියල් මිලියන 100ක් පාර්ලිමේන්තුවට ලැබුණා. ඒ රුපියල් මිලියන 100 පාර්ලිමේන්තුවට නොදී භාණ්ඩාගාරය ප්‍රයෝජනයට ගත්තා. ඒ විධියට තමයි 2007 වර්ෂයේදී ඒ සැලැස්ම නතර වුණේ. ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. මීළඟට ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට point of Order එක නඟන්න අවස්ථාව දුන්නේත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මයන්ත දිසානායක මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු හේෂාන් විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு ஹேசான் விதானகே அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. HESHAN WITHANAGE left the Chair, and THE HON. MAYANTHA DISSANAYAKE took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. මා point of Order එකක් මතු කරන්න අවස්ථාව ඉල්ලුවා. ඒ අවස්ථාව ලැබුණේත් නැහැ. මම ඉස්සර වෙලාම ගරු අමාත්‍යතුමාගෙන් ඒ ප්‍රශ්නය අසා මගේ කතාව පටන් ගන්නම්. ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා සඳහන් කළා එතුමා 2004 වර්ෂයේ මේ පනත් කෙටුම්පත ගෙනෙන්න යද්දී ඒකට ඉඩ දුන්නේ නැහැ කියා. මා දැනගන්න කැමැතියි, 2004 වර්ෂයේදී මේ පනත් කෙටුම්පත ගෙනෙන්න යද්දී ඒකට ඉඩ දුන්නේ නැති පාර්ශ්වය කවුද කියා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2004දී අප නීති කොමිෂන් සභාවේ සාමාජිකයන් විධියට සිටි වකවානුවේ තමයි ඒ පනත කෙටුම්පත් කළේ. ඊට පසුව අපි 2005 වර්ෂය වාගේ වන කොට ඒ කටයුත්ත අවසන් කරලා එම කෙටුම්පත ලබා දී තිබුණා. අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඒ ප්‍රශ්නය අහන්න ඕනෑ, 2005 වර්ෂයේ ඉඳලා බලයේ සිටි ආණ්ඩුවෙන්.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
කවුද බලයේ සිටියේ?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඔබතුමා දන්නවා නේ, 2005 වර්ෂයේ ඉඳලා 2015 වර්ෂය වන කල් බලයේ සිටියේ කවුද කියා.

[අ.භා. 3.24]

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පත ගැන කතා කරද්දී මගේ අදහසුත් සම්බන්ධ කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. ඇත්තෙන්ම, ජාතික විගණන පනත යනු, අපේ යහ පාලන ආණ්ඩුවේ ඡන්ද පොරොන්දුවක්. ඒ වාගේම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතත් අපේ යහ පාලන ආණ්ඩුවේ ඡන්ද පොරොන්දුවක්. මේ පනත් පසු ගිය යුගයේ හමස් පෙට්ටියේ දාලා හංගලායි තිබුණේ. එවැනි කාලයක් තිබුණා. මේ පනත් හොරුන්ට, වංචාකාරයන්ට, දූෂකයන්ට බෙහෙවින් බිය ගෙන දෙනසුලු පනත් වශයෙන් තමයි ඉතිහාසගත වෙලා තිබුණේ. ඔවුන්ට හිතුමතේ සොරකම් කරන්න, හිතුමතේ මුදල් pass කරගන්න, ඒ මුදල් ඉතා අප්‍රසන්න විධියට, වැරදි විධියට පාවිච්චි කරන්න මෙවැනි පනත් ලොකු බාධකයක් වෙලා තිබුණා.

ඒ නිසා තමයි මම අහද්දී විෂය භාර අමාත්‍යවරයාත් කිව්වේ, 2004 වසරේ ඉඳලා එතුමන්ලා මේ පනත් කෙටුම්පත ගෙනෙන්න උත්සාහ කළා, නමුත් පුළුවන්කමක් ලැබුණේ නැහැ කියලා. ගරු මන්ත්‍රීවරයෙක් ඇහුවා, මේ පනත් කෙටුම්පත ගෙනාවේ නැති තක්කඩි කවුද කියලා. ඒ තක්කඩි කවුද කියන ප්‍රශ්නයටත් අමාත්‍යතුමා පෙරළා මගෙන් ප්‍රශ්න කළා මිස, ඒ නම් කිව්වේ නැහැ. ඒක හොඳ නැති වැඩක්. මොකද, ඇත්තෙන්ම විෂයය භාර ඇමතිවරයා හැටියට මේ පනත් කෙටුම්පත නැවැත්වූ තක්කඩින් කවුද කියලා නමින් කියන්න එතුමා බොහොම වගකීමෙන් බැඳී ඉන්නවාය කියලා මා හිතනවා. ඒ නිසා, මේ විවාදය අවසන් වෙන්න ඉස්සර වෙලා එතුමා ඒ නම් ටික හරියට කියයි කියලා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න පමා වූ නිසා, විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරින් කරන දේවල් අද කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ යම් යම් මාධ්‍යවලට. මාධ්‍යවේදීන්, මාධ්‍ය ආයතන තමයි ඒ කටයුතු කරන්නේ. ලංකාවේ මාධ්‍ය ආයතනවලට මා හිස නමා ආචාර කරනවා, ගරු කරනවා, මෙවැනි දේවල්, විගණන පනතෙන්, විගණන දෙපාර්තමේන්තුවෙන් විය යුතු දේවල් ඔවුන් කරනවාට. මේ ළඟදී එවැනි දෙයක් ජාත්‍යන්තර මාධ්‍ය හරහාත් වුණා. ඒ මොකක්ද? “The New York Times” කියන පුවත් පත හරහාත් මේ රටේ මුදල් අවභාවිත කළ හැටි, චීන ආක්‍රමණිකයන් විසින් අපේ පොදු දේපළ, අපේ රාජ්‍ය දේපළ අවභාවිත කරන්න උදවු කළ හැටි, ඒ හරහා ලැබුණු මහා කොමිස් කන්දරාව ගැන මේ ළඟදී හෙළි වුණා. පසුගිය කාලයේ කිව්වේ, "මහ දවල් සිදු වුණු මහ බැංකු මංකොල්ලය" කියලා. නමුත් “The New York Times” පුවත් පත හෙළි කළ මහ දවල් සිදු කළ මහ ජාවාරම් ගැන තමයි දැන් කියැවෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදය තුළ මා දැකපු ඉතා වටිනාම අදහස ඉදිරිපත් කළේ, ජනතා විමුක්ති පෙරමුණේ අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා. එතුමා බොහොම පැහැදිලිව කිව්වා, මේ පනත හරහා සිදු වන්නේ, මේ පනතේ අරමුණ වන්නේ විගණකාධිපති සහ විගණනය ශක්තිමත් කිරීමයි කියලා. විගණන බලයත්, අධිකරණ බලයත් එකට යා යුතුයි කියලා ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමා සඳහන් කළා. ඒ වාගේම, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීමා කිව්වා, කෙළින්ම පොලීසියට කථා කිරීමේ බලයක් කෙන්යාවේ විගණකාධිපතිට තිබෙනවා කියලා. කෙන්යාවේ තිබෙන ඒ facility එක, ඒ බලය ලංකාවේ විගණකාධිපතිටත් ලබා දුන්නා නම්, මේ රාජ්‍ය මුදල්, රාජ්‍ය දේපළ කැත විධියට අවභාවිත කරන හොරු නීතිය ඉදිරියට ගෙනෙන්න අපට පුළුවන් තත්ත්වයක් ඇතිවන බව මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

දැන් අපි කථා කරද්දී බලන්න ඕනෑ, මේ විගණන පනතේ තිබුණු දුර්වලකම් මොනවාද කියලා. උදාහරණයක් විධියට ගත්තොත්, පාලමක් තැනීමේදී අනුමත වන සල්ලි ගැන කථා කරනවා. ඒ අනුමත වූ මුදල වියදම් කළ ආකාරය ගැන කථා වෙනවා. නමුත් පසුගිය කාලයේ කවදාවත් ඒ පාලමේ ප්‍රමිතිය - quality - ගැන තාක්ෂණික විගණනයක් සිදු වුණේ නැහැ. හැම දාම සිද්ධ වුණේ ඒ ගැන පශ්චාත් මරණ පරීක්ෂණයක් - postmortem - පමණයි. ඒ පාලමේ මේ දේවල් අඩුයි, මේ දේවල් අඩුයි කියලා පසුව කිව්වාට, ඒවා ගැන කලින් දැන ගන්න පුළුවන් ක්‍රමයක් තිබුණේ නැහැ. ඒ නිසා විගණන පනතට තාක්ෂණික විගණනයක් අවශ්‍ය වෙලා තිබෙනවාය කියලා මම කියන්න ඕනෑ. ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා කිව්වා වාගේ පසුගිය කාලයේ මෙවැනි පනත් සම්මත වෙලා තිබුණා නම්, ලංකාවට වූ විශාල අගතියෙන්, විශාල අලාභවලින් ලංකාව බේරා ගන්න තිබුණා.

ඒකට හොඳම උදාහරණයක් තමයි, හම්බන්තොට වරායේ විගණනය. හම්බන්තොට වරාය හදන්න ගිය වියදම ඩොලර් මිලියන 1,320ක් කියලා විගණනය කරලා තිබුණා. අන්තිමට ඒකට ආපු ලංසුව මොකක්ද? චීන ආණ්ඩුවෙන්- චීන ආණ්ඩුවෙන්ම කියන්නත් බැහැ- ඒ කුප්‍රකට සමාගම දීපු ලංසුව ඩොලර් මිලියන 720යි. එතකොට, ඒ ඉතුරු මුදල කොහේටද ගියේ, කාගේ සාක්කුවලටද ගියේ කියන එක විගණනය කරන්න අද විගණන දෙපාර්තමේන්තුවට භාර දෙන්න වෙනවා. එහෙම දුන්නා නම් හරි වටිනවා.

දැන් "The New York Times" පුවත් පත හරහා නොයෙකුත් ආරංචි ලැබෙනවා. "The New York Times" පුවත් පතේ අන්තර් ජාතික editor මේ මුදල් ගිය ආකාරය සඳහන් කර තිබෙනවා. මරියා අබි හබීබ් කියන මාධ්‍යවේදිනිය ඒ ගැන ලියලා තිබෙනවා. එතුමිය කියලා තිබෙනවා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට ඩොලර් මිලියන 7.6කුත්, ඇල්ලේ ගුණවංශ ස්වාමීන් වහන්සේට ඩොලර් 38,000කුත් චීන සමාගම් ලබා දීලා තිබෙනවා කියලා. ඒ වාගේම, අද මාධ්‍ය හරහා ආරංචි වෙලා තිබෙනවා, බැසිල් රාජපක්ෂ හිටපු ඇමතිතුමාගේ ආදරණීය බිරිඳ වන පුෂ්පා රාජපක්ෂ මහත්මියගේ පුෂ්පා රාජපක්ෂ පදනමට රුපියල් එක්කෝටි අසූලක්ෂයක් -රුපියල් මිලියන 18ක් වාගේ- මුදලක් චීන සමාගම් දමලා තිබෙනවා කියලා. පුෂ්පා රාජපක්ෂ මහත්මියගේ ගිණුමට චීන්නු සල්ලි දමන එකේ තේරුම මොකක්ද කියලා මම දන්නේ නැහැ. ඒකේ තේරුම හොයන්න අපි audit කරන්න ඕනෑ.

අද මම ගාමිණී විජේසිංහ විගණකාධිපතිතුමා සමඟ කථා කළා. ඒ අවස්ථාවේ එතුමා පැවසුවේ පාර්ලිමේන්තුවෙන් බලය දෙනවා නම්, නීති හදන මේ උත්තරීතර සභාවෙන් බලය දෙනවා නම් ඕනෑම දෙයක් audit කරන්න ඒ අය බැඳී සිටින බවයි. අපේ ආණ්ඩුවට දොස් කියන, අපේ ආණ්ඩුව විවේචනය කරන අයට ඕනෑ තරම් කාලය තිබුණා මෙවැනි පනතක් ගෙනෙන්න. තොරතුරු දැන ගැනීමේ පනත, ජාතික විගණන පනත් කෙටුම්පත ගෙනෙන්න කාලය තිබුණත්, එසේ නොකර දැන් මේවා විවේචනය කර කර ඉන්නවා. මේ පනත් ඒ කාලයේ ගෙනාවා නම් මේ රටේ විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට අවස්ථාව තිබුණාය කියලා මම හිතනවා. මහ දවල් -එහෙම නේ දැන් මංකොල්ල ගැන කියන්නේ- සිද්ධ වුණු කොල්ලයක් ගැන දැන් එක දිගට මාධ්‍ය හරහා කථා වෙනවා. මෙවැනි දේවල් වෙන්නේ ඇයි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ අවස්ථාවේ අපේ විගණකාධිපතිතුමාටත්, පාර්ලිමේන්තුවටත් යෝජනාවක් ඉදිරිපත් කරනවා. මා ගෙනෙන්න හදන මේ යෝජනාවට බොහෝ දෙනෙක් අකමැති වෙන්න පුළුවන්. මේ යෝජනාව විවේචනයට තුඩු දෙන දෙයක් වෙන්නත් පුළුවන්. නමුත් මම බොහොම ආදරයෙන්, අවංකව මේ යෝජනාව ඉදිරිපත් කරනවා. දේශපාලන පක්ෂවල අරමුදල් ගැන විගණනයක් නැත්තේ ඇයි? පක්ෂ අරමුදල්වල තමයි ලෝකයේ තිබෙන ලොකුම වංචා සිද්ධ වෙන්නේ. මම මේ කථාව කියන්නේ හැම පක්ෂයකටම අදාළවයි. පක්ෂවලට අරමුදල් ලැබෙන්නේ කාගෙන්ද, ඒවා කොහොමද වියදම් වෙන්නේ කියන දේවල් ගැන කිසිම audit එකක් නැහැ. නමුත් යුරෝපා රටවල, ඇමෙරිකා එක්සත් ජනපදයේ එවැනි තත්ත්වයක් නැහැ. ඩොනල්ඩ් ට්‍රම්ප් මැතිතුමාගේ election campaign එක බැලුවොත්, බැරක් ඔබාමා මැතිතුමාගේ election campaign එක බැලුවොත්, ඔවුන්ට ලැබුණු හැම ඩොලර් එකක්ම විගණනයට ලක් කරනවා. ඒ විගණන වාර්තාව ඡන්දදායකයන්ට ලබා දෙනවා. ඒ තොරතුරු රටවැසියාට දැන ගැනීමට ඔවුන්ගේ websitesවලින්, facebook එකෙන් හෙළිදරව් කරනවා. නමුත් මා දන්නා විධියට ලංකාවේ කිසිදු දේශපාලන පක්ෂයක් තමන්ගේ මැතිවරණවලට මුදල්, පක්ෂයට අරමුදල් කොහෙන්ද ලැබෙන්නේ, ඒවා කොහොමද වියදම් කරන්නේ කියලා මේ වනතුරු හෙළිදරව් කරලා නැහැ. පක්ෂ අරමුදල්වලටත් audit එකක් ගෙනැත් ඒවා හෙළිදරව් කළා නම්, "The New York Times" පුවත් පතේ මරියා අබි හබීබ් කියන මාධ්‍යවේදිනිය කියපු දේවල් සියයට සියයක් ඇත්ත බවත්, ඒ පුවත් පතේ ජාත්‍යන්තර කර්තෘ මයිකල් මහත්මයා කියපු කථාව ඇත්ත බවත් අනිවාර්යයෙන්ම හෙළි වෙනවා. අද මගේ මිත්‍ර පාර්ලිමේන්තු මන්ත්‍රීවරු -

**ගරු එඩ්වඩ් ගුණසේකර මහතා**
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, පක්ෂයට නොවෙයි, පෞද්ගලිකව නේ දීලා තිබෙන්නේ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ඔව්, පෞද්ගලිකව. නමුත් මැතිවරණයට වියදම් කරන්න දුන්නා කියලා නේ කියන්නේ. පක්ෂයට එවලා තිබෙනවා කියලානේ කියන්නේ. ඒක නේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා කියන්නේ මේ ගැන කියන්න පක්ෂයෙනුත් නීතිඥයන් එවනවා කියලා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා මේ චෝදනාවට, මේ විෂයයට අදාළව හරියට උත්තර දෙන්නේ නැහැ. ඒ චෝදනාවට උත්තර දෙන්නේ නැතිව "කොහේද යන්නේ මල්ලේ පොල්" වාගේ වෙන වෙන අන්තවලට, වෙන වෙන සීමාවලට යනවා. එතුමා කියනවා, "මම ඇමෙරිකාවෙන් ඡන්දය ඉල්ලන්නේ නැති නිසා මේකට උත්තරයක් දිය යුතු නැත" කියලා.

ඊළඟට එතුමා කියනවා, "මම ඇමරිකන් පුරවැසියෙකුත් නොවන නිසා මේකට උත්තර දිය යුතු නැහැ" කියලා. එවැනි දේවල් නොවෙයි අපි බලාපොරොත්තු වෙන්නේ. මා මේ අවස්ථාවේ මගේ විශේෂ ගෞරව ස්තුතිය පුද කරනවා "දිවුරුම් පෙත්සම් සංස්කෘතියේ පියා" කියන අන්වර්ථ නාමයෙන් හඳුන්වන අපේ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමාට. එතුමා තමයි, "දිවුරුම් පෙත්සම්" කියන සංස්කෘතිය ලංකාවේ දේශපාලනයට ගෙනාවේ. ඇත්තෙන්ම එය ඉතාම හොඳ සංස්කෘතියක්. මොකද, නඩු අහලා තීන්දුව දෙන්න කාලයක් ගත වනවා. නඩු නිමිත්තටම නීතිඥයන් විසින් සහ අධිකරණ නීතිය විසින් තමුන්ගේ වාසියට හොඳ උපහැරණයක් හදලා තිබෙනවා. ඒ තමයි, "නීතියෙන් ඔප්පු වන තුරු චූදිතයා හොඳ පුද්ගලයෙක්" කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

අධිකරණයෙන් ඔප්පු වන තුරු.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

අධිකරණයෙන් ඔප්පු වන තුරු චූදිතයා නිර්දෝෂී පුද්ගලයෙක් කියලා කියනවා. ඒ කියන්නේ, ඕනෑම හොරෙක්. බින් ලාඩන්, වීරප්පන්, ඉඩිඅමීන්, ප්‍රභාකරන්, මේ ඕනෑම කෙනෙක් නිර්දෝෂී පුද්ගලයකු වෙන්න පුළුවන්. මම පසුගිය දවසක මාධ්‍යයෙන් දැක්කා, ප්‍රභාකරන්ට විරුද්ධව කිසිම තැනක නඩුවක් පවරා නැති නිසා, නඩු නිමිත්තක් නැති නිසා ඔහු නිර්දෝෂී පුද්ගලයෙක් කියලා කියනවා. එවැනි ආකාරයට යම් චෝදනාවකින් බේරෙන්න ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා ගෙනාපු දේශපාලන සංස්කෘතිය ඉතාම කාලෝචිතයි කියලා මා හිතනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව තිබෙන්නේ මිනිත්තු දෙකක් වැනි කෙටි කාලයක්.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මිනිත්තු කීයක්ද තිබෙන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Deputy Minister, you have only two more minutes.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මට තව කාලය හම්බ වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මගේ මිනිත්තු තුන හා ඒ ලැබුණු සියලු කාලයත් එක්ක.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
විනාඩි පහක් හම්බ වුණා, අපේ-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථාව කරගෙන යන්න. ඔබතුමාගේ කාලය ගත වනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවුරුම් පෙත්සම් සංස්කෘතිය ගෙනාපු ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමාට මා නැවත නැවතත් ස්තුති කරනවා. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයාට මා කියනවා, චීන ආණ්ඩුවෙන් මේ වාගේ කොමිස් මුදලක් ගත්තේ නැහැ කියලා දිවුරුම් පෙත්සමක් දෙන්න කියලා. මා එතුමාට කියනවා, "ඔබතුමා වටේ යන්නේ නැතුව දෙවියන්ගේ නාමයෙන් කරුණාකරලා දිවුරුම් පෙත්සමක් දෙන්න" කියලා. එතුමා බෙල්ල කපා ගන්නවාට කවදාවත් මා කැමැති නැහැ. එතුමා අපේ රටේ ජනප්‍රියම නායකයෙක්. මේ රටට විශාල සේවයක් කළ පුද්ගලයෙක්. අපේ බෞද්ධ ධර්මයට අනුවත්, ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයට අනුවත්, නීතිරීති අනුවත් පිහියක් අරගෙන ප්‍රසිද්ධියේ බෙල්ල කපා ගන්නට බැහැ. එවැනි බෙලි කපා ගන්න සංස්කෘතිය තිබෙන්නේ, "ෂරිආ" නීතිය ක්‍රියාත්මක වන මැද පෙරදිග රටවල්වලයි. එම නිසා මා නැවත නැවතත් ඉල්ලා සිටිනවා, මේ කරන චෝදනාවලට නිවැරදිකරු බවට දිවුරුම් පෙත්සමක් ලබා දෙන්න කියලා. අධිකරණ තීන්දුව ලැබෙන්න ඉස්සෙල්ලා තමන් ජනතාව ඉස්සරහා නිදොස් කොට නිදහස් වෙන්න දිවුරුම් පෙත්සමක් දෙන්න ඕනෑම කෙනෙකුට පුළුවන්. මොකද, ඒ දිවුරුම් පෙත්සම සාමවිනිසුරු කෙනෙක් අත්සන් කරලා දුන්නාම බොරුවක් නම් අවුරුදු දෙකක් හිරේ යවන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ සිදු වූ සිල් රෙදි වංචාව නිසා රුපියල් කෝටි 60ක් ලංකාවේ ජනතාවට අහිමි වුණා. රාජ්‍ය සේවකයන්ට මෙවැනි දේවල් කරන්න දේශපාලනඥයන්ගේ කීම අහන්න සිද්ධ වුණේ, දේශපාලනඥයන්ගේ කීමට නතු වෙන්න සිද්ධ වුණේ, ඒ අයට බලයක් තිබුණේ නැති නිසා. ඒ අය තනිකරම වහල්ලු වාගේ ඒ දේවල් කරලා, අද සිරගත වෙලා ඉන්නවා. අද ඇප පිට ඉන්න ඒ අයට සිදු වෙලා තිබෙනවා. ඒ නිසා මා නැවත නැවතත් කියන්නේ, ජාතික විගණන පනත් කෙටුම්පත ඉතාම කාලෝචිත බවයි. එය ගෙන ඒම ඉතාම හොඳ දෙයක්. සියලුදෙනාගේ ආශිර්වාදය හා ශක්තිය එයට ලැබිය යුතුයි. කෙන්යාවේ තිබෙන නීතිය අනුව එහි විගණකාධිපතිට මහා වංචනිකයෙක්, මහ හොරකමක් අහු වුණු අවස්ථාවක FCID, CID, The Commission to Investigate Allegations of Bribery or Corruption and Financial Intelligence Unit යන ස්ථානවලට කථා කරන්න පෙර කෙළින්ම පොලිස්පතිට සහ පොලිසියට කථා කරලා ඒ දේවල්වලට විරුද්ධව ක්‍රියා කරන්න බලයක් තිබෙන බව ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා සඳහන් කළා. එය පෙන්වා දීම ගැන මා අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා. කෙන්යාවේ විගණකාධිපතිවරයාට තිබෙන බලය ලංකාවේ විගණන දෙපාර්තමේන්තුවට වාගේම, විගණකාධිපතිතුමාටත් ලබා දීලා එම සංස්කෘතිය ලංකාවෙත් දියත් කරන්න කියලා මා යෝජනා කරනවා. ඒ එක්කම ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ ඇමතිතුමාට මා නැවත නැවතත් කියනවා, 2004 සිට මේ පනත් කෙටුම්පත් ගෙනෙන්න හදද්දි එතුමාගේ කකුලෙන් ඇද්ද, එතුමාට විරුද්ධ වුණු දේශපාලනඥයන්ගේ නම් එතුමා අද ගරු සභාවෙන් පිට වෙන්න ඉස්සෙල්ලා අනාවරණය කරන්න කියලා. එම බලාපොරොත්තුව ඇතිව මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Tharaka Balasuriya. You have 12 minutes.

[3.42p.m.]

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
Hon. Presiding Member, I thank you for allocating me 12 minutes of this House to express my views on the much anticipated National Audit Bill taken up for Debate today.

The National Audit Bill had been withheld since 2003 and deferred 24 times by successive governments, perhaps due to a combination of two reasons - lack of political will, and at least I would like to think, more so to do with the political technicality of a too much unchecked power being given to the Auditor General and his Department. The Yahapalana Government did however made it a point in their election manifesto to introduce the National Audit Bill, and as far as introducing it today, even in this much watered-down version, I must congratulate them. But, a closer examination of the contents of the Bill, which I will touch later on, makes me wonder whether this Bill too is a sham just as much as this Government has been for the last three years. This Bill is just for window dressing, so that the Government can now mumble on what glorious legislation they have brought before us, but in actuality might not serve the intended purpose and actually can hinder the general public administration.

There are also political technicalities that need to be addressed as prerequisites when introducing Bills such as this or for that matter strengthening any other independent commission. Independent commissions stem

from defects of democracy, where mainly people involved in the role of Executive takes decisions on self-interest rather than the interest of the nation. So, it is hoped that the independent commissions somewhat put a check and a balance to it. However, we also must be careful as there is a transition of power from the Executive to the commissions that the commissions themselves remain independent. Furthermore, I also feel that the Government's intention should not be to make more and more independent commissions, but independent institutions. It must be noted that governments can get voted out of power, but commissions can create a long-lasting fraternity of like-minded people, including the retired and the working, where the intention can lead to well-being of the sector and about the power they can exercise rather than the mandate given and the general good of the public.

Sir, in order to stress my point, if we take the case of the National Audit Bill, such a Bill can prove to be harmful for general public administration such as ours where the country is riddled with systematic corruption, at all levels. In such countries, it is easy to pick a side and victimize your opponents. Some fear that the public sector will render further inefficient if independent commissions do not function independently and strive fear in the public sector. Therefore, that is why it is important, Hon. Presiding Member, that certain prerequisite legislature be introduced, such as a garden period, which the Government has failed to do. A garden period will essentially prevent the heads and members of independent commissions and not only them, but also high-ranking members of the armed forces and even the police, whereby high-ranking officers cannot engage in political activity or seek public office even after retirement for a given period of time. This will essentially prevent high-ranking officers, who have fiduciary rights from exercising their influence whilst in office for personal gain after retirement.

Furthermore, other legislations, such as set of prearranged dates for independent commissions for announcements and proclamations need to be incorporated so that independent commissions do not go over and beyond the mandate that they are given. Now, take the case of the present Auditor General, who went on air just before a crucial election which had been postponed by two-and-a- half years and decided to give his opinion about bookkeeping during the last Government. My contention is not the validity of the statement, irrespective of the validity what needs to be assessed is whether the Auditor General's statement has an influence or not on the general public, and if there is an influence then such statement at such times should be forbidden by law.

Sir, we in the Joint Opposition believe in the principles of true good governance which are workable, but not this charade the government is acting out. And, having elections on time is one of the key principles of good governance. The manner in which the Prime Minister answered the question regarding the postponement of Provincial Council elections yesterday, makes us believe that the Prime Minister thinks people of this country will just watch and wait whilst he acts the goat and clown about whilst taking their franchise away. Let me assure you that the Prime Minister will get a fitting reply worse than the beating he got at the last elections next time around when the provincial elections are held.

Hon. Presiding Member, if we look at international indices such as the Transparency International's Corruption Perceptions Index, we would see a deterioration in the rankings from 83rd place in 2015 to 91st place in 2017 since the inception of this Government. We also see, Sir, through these rankings that the most developed countries tend to be the least corrupt and the most corrupt countries tend to be the least developed. So, Hon. Presiding Member, the developed countries have strong institutions and they function usually independent of the government. Now, I dare not say that this is the sole reason why some countries have succeeded in developing whereas others have failed. Of course, historical reasons are just as important. But in general, Sir, we see in those countries that an independent supreme audit authority has been a frontrunner in eradicating corruption and bringing those countries towards development.

If we take a closer look at the newly developed countries such as Singapore and South Korea, we could see that they had given the key most emphasis on economic development and acknowledged what works and disregarded what does not. There was no blind pursuit of good governance and with more and more economic development, more and more emphasis was given on good governance. Proper independent institutions and political will was enforced in eradicating corruption.

Hon. Presiding Member, I think the whole role of the Auditor-General and his Department has to be relooked altogether. Although the Auditor-General plays perhaps the most critical role in public sector accountability, its dependency on the two Parliamentary Subcommittees for the release of its findings, I think, should be changed. What good would the findings of these reports do, especially if the Members of the Subcommittees to which these reports are presented themselves deliberate with the accused over the phone as it happened during the infamous Bond case? What good would it be to present a report to a Parliament which has turned a blind eye to the conduct of its Members and continue to solicit them in the COPE even after the Members have been exposed? We have also seen how some Members hurled insults at the Auditor-General in order to suppress evidence and support Mr. Arjun Aloysius. So, if the Members of Parliament in the COPE and COPA are corrupt and contagious, I think this system completely breaks down and it is better off for the Auditor-General to directly publicize the findings.

We also know that there are largely three models of supreme audit institutions namely, the Westminster Model, the Judicial Model and the Collegiate Model. I think, the time has come for the policymakers to have a public debate on whether we have indeed incorporated

[ගරු තාරක බාලසූරිය මහතා]

the best model or whether we can incorporate different aspects of other models such as the Judicial Model where the Supreme Audit Institution is an integral part of the judicial system operating independently of the Executive and the Legislative branches.

As for the merits of the Bill, there are many contentions. I understand the provision for surcharge which provides for a recovery of an amount overpaid to a Public Servant or recoupment of any loss caused to the Government for which he is held responsible has been diluted under this Bill.

In Clause 19, a lengthy process has been incorporated where the Chief Accounting Officer of the auditee entity imposes a fine with provisions for an appeal against the decision. Now I find that this is a horrendous juxtaposition of checks and balances and a major conflict of interest, as the Chief Accounting Officer of the auditee entity is a colleague of the accused. There can be a possibility of collusion or even an affinity to prolong the process as long as possible as a favour for a colleague. Further complicating the process is the lack of provision for the Chief Accounting Officer to specify any deviations of the surcharge as specified by the Audit Service Commission taking away the transparency and making the whole process meaningless. So, that is why I feel that we need Legislature to change the format so that such a case can be referred to the judicial process directly. If needed, we can even have special courts for this purpose. Sir, if this Government can make special courts to catch politically motivated so-called financial crimes of the previous Government, could we not make fair conclusion by the same logic that more importance has to be given to this Bill which deals with current and future corruptions?

The success of any supreme audit institution depends in a large part on the independence of that institution. It is not just the functional independence of the department which already has the safety of constitutional safeguards, but also the financial independence for the proper operation and administration of the department. We have seen many a time that the Auditor General pleading his case for more manpower, which comes under the Ministry of Public Administration, to no avail. So, in this regard, this Bill falls well short of the actual intention of making the Auditor General's Department more independent as the Bill has failed to provide financial independence from the General Treasury and independence from the Ministry of Public Administration for manpower requirements.

Sir, I would also like to see Clause 7(1)*(b),* which provides provision for a person to send a representative to the Auditor General if called upon by the Auditor General be changed. Such provision will no doubt hinder the investigative capacity of the Auditor General as guilty can keep sending representatives to delay the investigation. I would also like to see provisions, which will enable not only Government subsidiaries with 50 per cent shareholding being audited, but also associate companies with at least 20 per cent holdings or for that matter, any institution with Government holdings where financial abuse seems to take place, be included in this Bill.

There should also be feasibility audits for long-term infrastructure projects, so that we get the best value for rupee spent. Finally, I of course believe that there should be financial independence where a Parliamentary Select Committee oversees and directly debits the Consolidated Fund for the financial requirements of the Audit Commission.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. (Dr.) Harsha De Silva, please.

[3.54p.m.]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)

Hon. Presiding Member, I would first like to take a moment to appreciate the good words of Hon. Tharaka Balasuriya that the Government has had finally the political will, the courage to introduce the National Audit Bill. Did he go? Ah, there you are!

Then, I would like to reply to some of the issues you raised, Hon. Member. You asked, "Is this Bill a sham, are we trying to window-dress it and are we trying to hinder the progress?" Actually, it is not; because while both you and I know that it took a while to bring this Bill to Parliament, we have brought it in. As you said, it has been watered-down to some extent; I also agree with you that it has been watered-down to some extent, but it is nevertheless a beginning. Therefore, on behalf of the Government and the Ministry that is introducing this Bill to Parliament, I would like to appeal to you to view this Bill not with a glass half empty attitude, but rather with a glass half full attitude.

Sir, the Hon. Member said the Independent Commissions need checks and balances. - [*Interruption.*] I will let you speak after me, Hon. Member. You talked about transition of power and the Executive to give that authority to the Independent Commissions. I am sure you are aware that that is certainly happening. I mean, it is not any longer possible for the Executive to direct the various officials or individuals within specified ministries either to do or not to do certain things or to act or not to act on certain issues. Therefore, I think we can see that transition taking place.

For instance, let me give you a classic example. I sit in the COPE. I used to sit in the COPA when I was a Member of the Opposition. Hon. Balasuriya, those days what happened was the COPE and the COPA were chaired by the Executive: the Ministers of the then

Government. Really I recall very well how I tried desperately to bring up issues in terms of financial mismanagement, but it was always and every time vetoed or thrown into the garbage bin by the Executive who was chairing the Committee on Public Accounts at that time. That is not good governance.

You said earlier that in countries that are well governed the separation of powers has already happened. That has happened here in our good governance Government because when this Government came into office, we said, "No, we do not want the Executive to chair the COPE. Let the Members of the Committee decide on who should chair the COPE."

Hon. Sunil Handunnetti is seated in front of me. Our Members elected him as the Chairman of the COPE. He is certainly not a Member of the Executive; he is certainly not a Member of our Government. In fact, he is a vociferous Member of the Opposition.

When the new Parliament Sessions began about two months ago, once again what happened? Unanimously the Members of the Committee reappointed Hon. Handunnetti as the Chairman of the COPE. I think, you must appreciate the transition that is taking place. And I hope some day, Hon. Balasuriya, when the Party that you belong to establishes a Government that you would follow the same principles of good governance and if I am a Member of the Opposition at that time I would put my hand up and say, "I would like to be the Chairman of that Committee."

Thirdly, you mentioned a good point. I did not catch the word that you used. I think you referred to some sort of "cooling off period" where persons of high office leave Government and engage in politics. You said that there must be some sort of cooling off period before such happens and I agree with you. This revolving door policy is not good and that corrupts. It does not necessarily have to be politics. Suppose you are a Member of a regulatory body and as soon as you leave the job as a member of the regulatory body, you become the Chairman or Managing Director of a regulated company. That is completely bad governance but that continues in this country. Perhaps, we can, as a measure of good governance, have some legislation in this House where you say that for three years or for 18 months that you cannot engage either in politics or you cannot move from a regulatory body to a regulated company.

Then, you said that we need strong institutions. Absolutely! Unconditionally I agree with you that we need strong institutions. That is certainly why we are creating the new office of the Auditor-General via the National Audit Bill.

I think, I need to make a correction and this, Hon. Presiding Member, is an important one. I think, I am right in saying this. You said that the Auditor-General's Office must have financial independence and I believe that that is given in this Bill. If I am wrong, perhaps somebody can correct me, but as far as I know the funds will be allocated via the Consolidated Fund to all Independent Commissions, not only to this Commission but to the Police Commission, the Elections Commission and so on and so forth. Unfortunately it was the then President, your Leader of the current "flower bud group", who got rid of the Independent Commissions and via the Eighteenth Amendment relegated those Commissions and the legislation thereof to the dustbin and took under his control the financial authority of those previous Commissions.

Now I am not going to talk too much about the National Audit Bill because my Colleagues in this House have for the last several hours raised these issues. But I want to certainly raise one issue. You spoke about Transparency International and so on. Transparency International has provided us with a legislative brief on the National Audit Bill and I agree to one of those recommendations. As a matter of fact, I was speaking to the Auditor-General just a while ago and said, I am going to raise this issue. The issue is the right to information. In the Bill, we say the Auditor-General should not be compelled by any person to disclose any information except on a request of Parliament or by an Order of court or subject to paragraph (b) to give effect to the provisions of any written law and paragraph (b) says that you cannot disclose information unless, otherwise, the audit report has been presented to Parliament.

In fairness to the Auditor-General, his view is, "It is still information that is being gathered. So, how is it possible for me to release that information to the public?" But in this day and age where again, the Hon. Balasuriya, we had the guts, we had the courage to bring in the Right to Information Bill to Parliament and create the Right to Information Act which has made a paradigm shift - I stress "a paradigm shift" - in the way governance is carried out in this country. In the old days, before the Right to Information Act, it was under the Secrecy Ordinance that officials worked. There was no way in which a person either in Kotte or in Jaffna could ask the government or the local authority or the provincial council for information on his tax that he pays or she pays. Today that has changed. Today you send a request to the authority whichever the authority it maybe and by mandate it is compulsory that the information is released to the persons seeking such information by that authority and by any chance if it is not possible to do so, explanations have to be given as to why it is not possible and thereafter, he should get that information in a given period of time.

Now what happens here is, that this Bill in my view, Hon. Presiding Member, goes beyond the Constitutional rights given by the Right to Information Act by restricting the citizen to be able to obtain the information that he or she is entitled to under the Constitution. Therefore, I am not saying that the Auditor-General should willy- nilly give out the information as and when requested by person "X" or "Y". But I think there needs to be some discussion between the Auditor-General and the Legislature to figure out how best we can compromise on this, because something that we fought for, something that we stand for is the right to information. Hon. Balasuriya, you talked about

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

corruption and I agree with you completely and in my view, the way to fight corruption is the tool of information. Now look at what is happening today. Sometimes information becomes a complicated problem because people create information out of thin air. News becomes fake news and these pieces of fake news are distributed via electronic media, telephones, Facebook and so on and gullible people sometimes believe it. There is no fact-checking. So I think the Auditor-General must also think about these issues whether it is something that is true that is being distributed or whether it is something that is completely untrue that is being distributed.

I do not know how to deal with this question, because it is a question faced not only by us in this country, but a question faced by nations across the world. Therefore, in that sense, we need to take cognizance of that fact. I personally believe that Clause 9(*a*) of this Bill should undergo some sort amendment either now or at a future point in time.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, you have two more minutes left.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Okay, Sir.

So, Hon. Member, I think we must look at what we have started today as a glass half full and we must work together to complete it.

Independence must be given to the Auditor-General and if what I said a little while ago is correct, that the Auditor-General's finances come directly from the Consolidated Fund - there is no boss over the Auditor-General, in that sense and that is why, I believe, it is called a supreme institution - then, the person has the right, the responsibility to undertake the work. But, I must also caution that when such power is in one's hand, one must use that power with a sense of responsibility and that is essential.

The Hon. Tharaka Balasuriya also talked about checks and balances. There have to be checks and balances. An arm of this scale cannot go above another. So, the scale must always be balanced. It might depend on the person. Hon. Tharaka Balasuriya, you asked whether the Auditor-General was right in making a statement on national accounts before the recent Local Government Election. You had your view; I also had my view and I think what the Auditor-General said was accurate. It was just an interpretation issue that had taken place. As a matter of fact, the Auditor-General asked whether all the money that we have spent on loans has been listed as assets.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. State Minister, do you need more time?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I am finishing up.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
I can give you a minute or two, if you want.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, give me one more minute.

Those monies are not in the Asset Registry; those cannot be in the Asset Registry, Hon. Balasuriya, because a whole lot of the loans that we take are to pay back old loans. We are fully cognizance of that fact. So, I do not know whether the timing of his raising that issue was right, but certainly the issue he raised was correct.

So, once again, I want to reiterate the fact that this effort of ours is not a sham; this is done with all good intention. We have shown to this country, not once, not twice, but over and over again, that we mean what we say. Earlier, I gave two specific examples - one was, the appointment of Chairpersons to the Parliamentary Committees and the second was the Right to Information Act - and here, certainly, is the third.

Sir, thank you very much.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Ajith P. Perera, what is your point of Order?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හර්ෂ ද සිල්වා මැතිතුමා සඳහන් කරන ආකාරයට විගණකාධිපතිවරයා ශක්තිමත් කරලා, විගණකාධිපතිවරයාගෙන් වාර්තාවක් ලබා ගැනීමට අවශ්‍යයි කියන කාරණය දැන් අපි කවුරුත් පිළිගන්නවා. නමුත් ප්‍රශ්නය මේකයි. විගණකාධිපතිවරයාගේ නිගමනයන් පරම සත්‍යයන්, එය පමණයි සත්‍යය කියන කාරණය අපි පිළිගත්තොත් එමඟින් රාජ්‍ය සේවය තුළ ඉන්න නිලධාරින් විශාල සංඛ්‍යාවකට වාගේම පුරවැසියන්ටත් අගතියක් වන්න පුළුවන්. මෙන්න මේ අනතුරුදායක තත්ත්වය තුළ රාජ්‍ය සේවය අකර්මණ්‍ය වෙන්න පුළුවන්, එහෙම නැත්නම් රාජ්‍ය සේවය තුළ ගැටලු මතු වෙන්න පුළුවන්. මෙන්න මේ තලයෙන් -මේ ආකාරයෙන්,- මේ ප්‍රශ්නය දිහා බලලා කිසිම විසඳුමක් ලබා දෙන්න බැහැ. ඒ කියන්නේ, විගණකාධිපතිවරයාගේ නිගමනයන් ශක්තිමත් කරන්න අවශ්‍ය කරන පසු බිම සකස් කරලාත් නැහැ; විශේෂඥ සහාය ලබා ගන්න විෂයය සම්බන්ධ විශේෂඥයන්ට අවශ්‍ය කරන පහසුකම් සපයලාත් නැහැ; ඒ වාගේම මේ නිගමනවල තිබෙන නිරවද්‍යතාව

ඉක්මනින් පරීක්ෂා කිරීමට හැකියාවකුත් නැහැ. මෙතැනදී තමයි තොරතුරු ඉක්මනින් දැනගන්න අවශ්‍ය වන්නේ. එහෙම නැතිව නිගමනයක් ආවාට පස්සේ රාජ්‍ය සේවකයාගේ වෘත්තීය ජීවිතය සම්පූර්ණයෙන්ම විනාශ වනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු ඇමතිතුමා කියපු කාරණයට මම පිළිතුරක් ලබා දීලා මගේ කථාව අවසන් කරන්නම්. මේ පනත් කෙටුම්පත මඟින් විගණකාධිපතිවරයා විසින් ඉටු කළ යුතු බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් දක්වනවා. සුදුසුකම් ලත් විගණකවරයෙකු හෝ තාක්ෂණික, වෘත්තීය හෝ විද්‍යාත්මක විශේෂඥ ඥානය සහිත ආයතන පත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) අනු ව්‍යවස්ථාව යටතේ තම කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳ වාර්තාවක් මුදල් වර්ෂය අවසානයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම, විගණන අරමුදල පරිපාලනය ඔහු විසින්ම ඉටු කළ යුතු කාර්යයන් බව පනතේ දක්වනවා. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂාවට අගතිගාමී වන තොරතුරු හෙළිදරව් වන අවස්ථාවකදී ආරක්ෂක අමාත්‍යාංශයේ එකඟතාව මත පුද්ගලිකව විගණකාධිපති විසින් ඒ සම්බන්ධයෙන් විගණන කළ යුතු බවත් පනතේ දක්වනවා.

ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා කියන කථාව සත්‍යයයි. මොකද, සමහර අවස්ථාවලදී අපි කොමිටියේ වාඩිවෙලා ඉන්නවා. නමුත් ඒ කථා කරන විෂයය පිළිබඳව විශේෂඥ දැනුමක් අපට නැහැ. විශේෂඥ දැනුම නැති වුණාම එතැන ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලා නොයෙකුත් වැරැදි තීරණවලට එන්න අවකාශය තිබෙනවා. නිදහසත් එක්කම වගකීමක් තිබෙනවාය කියා මම කලිනුත් කිව්වානේ. ඒ වගකීම තමයි, සියයට 100ක් නිවැරැදි තොරතුරු ඉදිරිපත් කිරීම. ඒ අවස්ථාවේදී තාක්ෂණික සහාය ලබා ගත යුතු නම් අපි පාර්ලිමේන්තු කොමිටිය හරහා ඒ තාක්ෂණික සහාය ලබා ගත යුතුයි කියන එකයි මගේ ස්ථාවරය වන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විවාදයකට යනවා නොවෙයි, මට තව විනාඩියක් ලබා දෙන්න. උදාහරණයක් විධියට සුප්‍රකට බැඳුම්කර ගනුදෙනුව හා සම්බන්ධ කාරණයේදී විගණකාධිපතිතුමා විසින් අලාභ ගණනය කිරීම පිළිබඳව කරන ලද නිගමනයන් දෝෂ සහගත බවත්, ඊට අදාළ ආර්ථික විද්‍යා මූලධර්ම වැරැදි බවත්, ඒ කරපු උපකල්පන වැරැදි බවත් බැඳුම්කර කොමිසම විසින් නිශ්චිතව තීරණය කරලා තිබෙනවා. ඒ කාරණා අපි තේරුම් ගන්න ඕනෑ. විගණකාධිපතිතුමා සාමාන්‍යයෙන් නිවැරැදි බව අපි පිළිගන්නවා. ඒ නිරවද්‍යතාව වැඩි කර ගන්නත්, අගතියට පත් වන පාර්ශ්වයන්ට අභියෝග කරන්න තිබෙන අවස්ථාවත් ලබා දෙන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත ඇතුළේ තවමත් පුරවැසියාටත්, රජයේ නිලධාරියාටත් ආරක්ෂාව තිබෙනවා කියලා මට නම් පෙනෙන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මට ලැබී ඇති කාලය අවසන් වෙලා තිබෙන්නේ. නමුත් මට තව තත්පර 30ක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක තමයි මම කිව්වේත්. පොදුවේ අපිට ඒ තාක්ෂණය අවශ්‍යයි. සමහර වෙලාවට මූල්‍යමය කටයුත්තක් ගැන වෙන්න පුළුවන්; සෞඛ්‍ය පිළිබඳ ගැටලුවක් වෙන්න පුළුවන්; ජලය පිළිබඳ ප්‍රශ්නයක් වෙන්න පුළුවන්; ඉංජිනේරු ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. අපිට ඒ විශේෂඥ දැනුම නැහැ. ඒ නිසා පාර්ලිමේන්තු කාරක සභාවලදී ඒ අවශ්‍ය තාක්ෂණික සහාය සියලු දෙනාටම ලැබිය යුතුයි කියලා නැවතත් මතක් කරමින් මට වැඩිපුර කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට, ගරු එස්. ප්‍රේමරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.15]

**ගරු එස්. ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. අද දින ඉතාමත් වැදගත් පනත් කෙටුම්පතක් ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී ඒ සම්බන්ධව කථා කරන්න ලැබීම මම ඉතාමත් අගය කොට සලකනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කථා කරන්නේ දූෂණ, වංචාවලින් තොර රටක් බිහි කර ගැනීම සඳහා කළ යුතු කාර්යයන් පිළිබඳවයි. මේ සාකච්ඡාව, මේ විවාදය පැවැත්වෙන අතරතුරත් අපට අහන්න ලැබෙන ප්‍රවෘත්තිය තමයි, ඇලෝසියස් මහත්තයා සිටි සිරමැදිරිය තුළදී දුරකථන තුනක් සහ SIM cards 5ක් හසුවුණා කියලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට වාර්තා කර තිබෙන බව. මම දැන ගන්න කැමතියි පරණ දුරකථන ඇමතුම්වලට අමතරව මෙම SIM cards පහ පාවිච්චි කරලා දුරකථන ඇමතුම් ලබා දුන්නේ කාටද කියලා. ඒ ගැනත් ඉදිරියේදී මේ පාර්ලිමේන්තුව හමුවේ කරුණු ඉදිරිපත් වෙනවා නම් සිරමැදිරිය ඇතුළේ සිට සොරකම වහගන්න කටයුතු කළ ආකාරය අපට නිරවුල්ව විග්‍රහ කර ගන්න ලැබේවි. ඒ එක්කම අද අධිකරණයට ඉදිරිපත් කරපු තොරතුරක් තමයි පසුගිය කාලයේ මුදල් ඇමතිවරයා විධියට රවි කරුණානායක මහත්මයා විගණකාධිපතිතුමාත් එක්ක මුහුණට මුහුණ ද්වන්ධ සටනක නිරත වුණාය කියන කාරණය. රවි කරුණානායක මහත්තයාගේ පවුලේ සමාගමකටත්, ඇලෝසියස් මහත්තයාගේ අරක්කු සමාගමෙන් රුපියල් මිලියන 5ක චෙක් පතක් 2017 වසරේදී නිකුත් කර තිබෙනවා කියන ප්‍රවෘත්තියත් අපට මේ වන විට ආරංචි වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ලැබෙන තොරතුරුත් එක්ක, ඇලෝසියස් මහත්තයා හිර ගෙදර ඉඳගෙන කාටද දුරකථන ඇමතුම් ලබා දුන්නේ, තව කාටද හිර ගෙදර ඉඳගෙන චෙක්පත් යැව්වේ, හිර ගෙදර ඉඳගෙන අලුතෙන් කරපු හොරකම් මොනවාද කියලා මේ පාර්ලිමේන්තුවට කියනවා නම් ඒ ගැන දැනගන්න අපි කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම පනත් කෙටුම්පත් රට වෙනුවෙන් ගෙනෙන පනත් බවට පත් වෙන්නේ රටේ සංවර්ධනයටත්, රටේ මිනිසුන්ගේ සංවර්ධනයටත් දායක වනවා නම් විතරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලසීමාව තුළ අවංකව වැඩ කරපු විගණකාධිපතිවරුන් හිටපු බව අපට මතකයි. අතිරේක විගණකාධිපතිව සිටි ලලිත් අඹන්වල මහත්මයා අවංකව වැඩ කරන්න ගිහිල්ලා, කෝටි 5ක වංචාවක් ගැන හොයන්න ගිහිල්ලා ඇසිඩ් ප්‍රහාරයකට ලක් වුණා. අවංකව වැඩ කළ එතුමාට, විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරපු එතුමාට අවසානයේදී සිද්ධ වුණේ ශාරීරිකව විකෘතිභාවයට පත්වීමටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත් ගෙනෙන්නේ වෙන කිසිම හේතුවකට නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ පෘථග්ජන මිනිස්සු. නිලධාරින්

[ගරු එස්. ප්‍රේමරත්න මහතා]

වෙන්නෙත් පෘතග්ජන මිනිස්සු. ඒ මිනිසුන්ගේ හොරකම, වංචාව, දූෂණය, කපටිකම, බොරුව යනාදී මේ සියල්ලම ගැබ් වෙලා තිබෙනවා. යම් යම් පුද්ගලයන් සතුව යම් යම් ප්‍රමාණවලින් තිබෙන දූෂණ, වංචා අවම කර ගැනීමට නම් විගණකාධිපතිවරයාට ස්වාධීනව වැඩ කළ හැකි, ස්වාධීනව කටයුතු කළ හැකි නිදහසක් ලබා දිය යුතුයි; ඒ වාගේම වගකීම් සමුදායක් ලබා දිය යුතුයි. අපට විගණකාධිපතිවරයාගේ සාර්ථකත්වය, අසාර්ථකත්වය තීරණය කරන්න වෙන්නේ ඔහුට ලැබෙන නිදහස සහ ඔහුට ලැබෙන වගකීම ඇතුළේ පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා කථා කළා. තවත් ඇමතිවරු කිහිප දෙනෙක් කථා කළා. එතුමන්ලා සඳහන් කළා පසුගිය කාලයේ වුණු හොරකම් ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1948දී අපේ රට නිදහස ලබා ගන්න විට අපේ භාණ්ඩාගාරයේ තැන්පත් ධනය විධියට රන් පවුම් කෝටි 120ක් තිබුණා. අපි මූල්‍යමය අතින් ආසියාවේ දෙවැනි තැනට පත් වෙලා තිබුණේ ජපානයට විතරයි. අපේ රට තිබුණේ රන් පවුම් කෝටි 120ක් සපිරි රටක් විධියටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්පසු ලෝකයේ සමහර රටවල් අපේ රට අනුගමනය කරන්න හුරු වුණා. සිංගප්පූරුව වාගේ රටවල් කිව්වා, "ලංකාව වාගේ රටක් වෙන්න ඕනෑ" කියලා. ඒ කාලයේ -1948- ඩොලරය සඳහා ගෙව්වේ, රුපියල් 3.50යි. අද ගෙවන ගණන රුපියල් 160යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආපු ක්‍රමය මෙහෙම හැදුණේ 1948දී අපි නිදහස ලබාගන්නා විට විගණකාධිපතිවරයා සතුව ඉතාමත් පුළුල් සහ වගකීම් සහගත බලතල ප්‍රමාණයක් පැවති නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1978දී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනාවා. හොරුන් බිහි කරන, මංකොල්ලකාරයන් ඇති කරන, වංචා දූෂණ අලුතින් නිෂ්පාදනය කරන ව්‍යවස්ථාවක් බවට 1978 ව්‍යවස්ථාව පත් වුණා. ඒ කාලයේ -ජේ.ආර්.ජයවර්ධන මහත්තයාගේ ආණ්ඩුව කාලයේ- අපට අහන්න ලැබුණේ මහා පරිමාණ දූෂණ ගැන. අපට ඒ කාලයේ මොනවාද කිව්වේ? මහවැලිය හදනකොට වුණු දූෂණ ගැන; වංචා ගැන.

අපිට මතකයි, ඒ කාලයේ ලෝක බැංකුවෙන් ඩේවිඩ් හෝප්ස් කියලා මහත්මයෙක් ලංකාවට එව්වා. ලෝක බැංකුවෙන් ඩේවිඩ් හෝප්ස් මහත්මයා ලංකාවට එවන්නේ වෙන මොකකටවත් නොවෙයි, මහවැලියේ සිද්ධ වෙච්ච දූෂණ-වංචා හොයන්නයි. ඔහු ඒ සම්බන්ධයෙන් සොයා බලා වාර්තාව යවනවා. වාර්තාවට අනුව ඔහු කියන්නේ, "මහවැලිය සඳහා අපි ලබා දුන් රුපියල් බිලියන ගණන් මුදල්වලින් සියයට 35ක් මහවැලිය සඳහා වියදම් කරලා තිබෙනවා. අනෙක් සියයට 65ම ඇමතිවරුන්ගේ සහ රාජ්‍ය නිලධාරින්ගේ සාක්කුවලට ගිහිල්ලා තිබෙනවා." කියලායි. මේක තමයි ඩේවිඩ් හෝප්ස් යවන වාර්තාව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා නේද, කවුද මූලාසනයේ ඉන්නේ කියලා?

**ගරු එස්. ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
ඔව්. ඒක දැනගෙන තමයි, මම ඒ ගැන කිව්වේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා මහින්ද රාජපක්ෂ මහත්මයාට "හොරා" කියන කොටත්, අනෙක් ඇමතිවරුන් මහින්ද මහත්මයා ඇතුළු හිටපු ඇමතිවරුන්ට "හොරු" කියන කොටත්, මම කිව්වේ මහවැලියේ වෙච්ච දූෂණ-වංචා පිළිබඳවයි. එම වාර්තාවට අනුව, ලෝක බැංකුවෙන් ලබා දුන් මුදල්වලින් සියයට 35ක් යොදවා තමයි මහවැලිය හදා තිබුණේ; සියයට 65ක් හොරකම් කරලා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හොරුන්ට පැන යන්න සීමා මායිම් හදපු නිසා තමයි මේ රටේ ඒ විධියට හොරකම් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පසුව අපේ රටේ විවිධ ආකාරයේ ආණ්ඩු බිහි වුණා; විවිධ ආකාරයේ අමාත්‍යවරුන් බිහි වුණා; රටේ සංවර්ධනය විවිධ දිශාවලට පෙන්වූවා. නමුත් වංචාව-දූෂණය නවත්වා ගන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒවා නවත්වන්න බැරි වුණා. හැබැයි, අපිට වුවමනාවක් තිබුණා නම්, පසුගිය කාලසීමාව තුළම මේවා නවත්වන්න තිබුණා. එසේ නවත්වන්න බැරි වුණු ප්‍රධාන හේතුව මොකක්ද? ආණ්ඩුව හැම තිස්සේම කිව්වේ, "දූෂකයන්ට දඬුවම් දෙන්න ඕනෑ; දූෂකයන්ට දඬුවම් දෙන්න ඕනෑ" කියලා විතරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දූෂිතයන්ට දඬුවම් කළ පමණින් දූෂණ නතර වෙනවා කියලා මගේ ජීවිතයේ මම කවදාවත් අහලා නැහැ. දූෂිතයන්ට දඬුවම් දුන් පමණින් දූෂණ නතර වෙන්නේ නැහැ. දූෂණ නතර වෙන්න නම්, පරිපාලන ව්‍යුහය වෙනස් කරන්න ඕනෑ; නීතිමය ව්‍යුහය වෙනස් කරන්න ඕනෑ. පරිපාලන ව්‍යුහයයි, නීතිමය ව්‍යුහයයි වෙනස් කළොත් විතරයි, දූෂණවලින් තොර සමාජයක් මේ රට තුළ බිහි කරන්න පුළුවන්කම ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විගණකාධිපතිතුමාගේ බලතල එක්ක, විගණකාධිපතිතුමා විසින් කළ යුතු කාර්ය භාරය එක්ක මේ රට නිවැරදි දිශාවට අරගෙන යන්න පුළුවන් කියන කාරණය මම මේ වේලාවේ මතක් කරන්න කැමැතියි. එසේ මේ රට නිවැරදි දිශාවට අරගෙන යන්න නම්, ඒ සීමාසහිත බලතල වෙනුවට, තටු කැපූ -තටු සිඳපු- විගණකාධිපතිවරයෙක් වෙනුවට, නිදහසේ වැඩ කරන්න පුළුවන් විගණකාධිපතිවරයෙක් බිහි කළ යුතුයි. එසේ බිහි කළොත් විතරයි මේ රට දූෂණවලින් වළක්වා ගන්න පුළුවන්කම ලැබෙන්නේ. මේ රට දූෂිතයන්ගෙන් ආරක්ෂා කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ විගණකාධිපතිවරයාට නිසි බලතල පැවරුවොත් විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත අනුව විගණකාධිපතිවරයා පත් කිරීමේ බලතල ජනාධිපතිවරයාට තිබෙනවා. හැබැයි, විගණකාධිපතිවරයා ඉවත් කිරීම පිළිබඳව මෙහි මොකුත් සඳහන් වෙන්නේ නැහැ. නමුත් ජනාධිපතිවරයා ඉවත් කිරීමේ බලතල පාර්ලිමේන්තුවට තිබෙන්නේ කොහොමද? පාර්ලිමේන්තුව තුළ තුනෙන් දෙකේ බලයක් ඇති කළොත් විතරයි, ජනාධිපතිවරයා ඉවත් කරන්න පුළුවන්කම ලැබෙන්නේ. හැබැයි, සාමාන්‍ය යෝජනාවක් සම්මත කිරීමෙන් විගණකාධිපතිවරයා ඉවත් කිරීමට පුළුවන්කමක් මේ පනත් කෙටුම්පත ඇතුළේ සුරක්ෂිත කරලා තිබෙනවා. එතකොට අපිට අහන්න තිබෙන්නේ මෙයයි. සාමාන්‍ය දූෂණයන්ට, වංචාවලට විරුද්ධ මිනිහෙකුට එල්ලෙන්න තිබෙන එකම තුන්තිරි ගහ, එකම පිදුරු ගහ විගණකාධිපති විතරයි. සාමාන්‍ය දූෂණයකට, වංචාවකට එරෙහි, රට ගැන හැඟීමක් තිබෙන මිනිහෙකුට එල්ලෙන්න තිබෙන එකම තනතුර, විගණකාධිපති තනතුරයි. හැබැයි, විගණකාධිපති තනතුර එහෙන්-මෙහෙන් ඕනෑ කෙනෙකුට අයින් කරන්න පුළුවන් තනතුරක් බවට පත් කර ගත්තොත්, සාධාරණත්වය හා යුක්තිය ආරක්ෂා කරන, එය අපේක්ෂා කරන මිනිහෙකුට සාධාරණයක් ඇති වෙනවාද කියන ප්‍රශ්නය අපි ඉස්සරහා මතු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ඉස්සරහා ඒ ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා පාලකයන් විධියට, පනත් කෙටුම්පත් සම්මත කරන, ව්‍යවස්ථා හදන මිනිසුන් විධියට අපට කරන්න තිබෙන්නේ එකම එක දෙයයි. විගණකාධිපතිවරයාගේ බලතල, විගණකාධිපතිවරයා සතුව තිබිය යුතු බලතල

පාර්ලිමේන්තුව තුළින් විගණකාධිපතිවරයා සතු කිරීම තමයි අප කළ යුතුව තිබෙන්නේ. එහෙම නැති වුණොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරකමින් තොර, වංචාවෙන් තොර දේශපාලනඥයෙක් මේ රටේ හැදෙන්නේත් නැහැ; නිලධාරියෙක් මේ රටේ හැදෙන්නේත් නැහැ. දේශපාලනඥයාට රිංගන්න පුළුවන් තැන් ටිකක් පනත් ඇතුළේ හදා තිබෙනවා නම්, රිංගන්න පුළුවන් තැන් ටිකකින් හොරකම් කරගෙන එන්න පුළුවන්කමක් හදා තිබෙනවා නම්, අඩුම තරමේ නීතිමය ප්‍රතිපාදනවත් හදලා, නීතිමය නවෝත්පාදන හෝ හදලා නීතිය පැත්තෙන් හෝ ඔහු හිර කරන්න පුළුවන් තැනක් හදන්න ඕනෑ. මෙහි එවැනි දෙයක් අපිට පෙනෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලයක් තිස්සේ කථා කරපු පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ගෙනෙනවා. ඒකත් නිකම්ම නිකම් පනත් කෙටුම්පතක් විනා, පූර්ණ බලතල සහිත එකක් නොවෙයි. පූර්ණ බලතල සහිත පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ගෙනැවිත් සම්මත කරන්න මේ ආණ්ඩුවට බැරි වෙනවා. ඒක තමයි සත්‍යය. ඒක තමයි නිවැරදිම ඉදිරිපත් කිරීම. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යහපත් දේශපාලන වාතාවරණයක් ඇතුළේ, නිවැරදි දේශපාලන වටපිටාවක් ඇතුළේ හිඳිමින් අපි මේ රට ඉදිරියට ගෙන යන්න ඕනෑය කියලා මා විශ්වාස කරනවා. ඒ මූලාරම්භයේදී -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක පමණ කාලයක් තිබෙනවා.

**ගරු එස්. ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)

පසුගිය ආණ්ඩුව බලයට ආපු වේලාවේ, ඒ ආණ්ඩුව හදන්න ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු විවිධ කණ්ඩායම් එකතු වුණා. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කටයුතු කළ නිලධාරියෙක් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පැමිණියා. හැබැයි, එතුමා ගෙදර යවා, ඔහු වෙනුවට තව කෙනෙක් පාර්ලිමේන්තුවට ආවා.

ජනතා විමුක්ති පෙරමුණට මා කියන්න කැමැතියි, රට බෙදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පාර්ලිමේන්තුවට ගෙනෙන්න කලින්, දැනට තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ විගණකාධිපතිවරයා සතු බලතල වැඩි කරලා, විගණකාධිපතිවරයා ආරක්ෂා කරලා රට නිවැරැදි තැනට ගෙන යන්න කටයුතු කරන්නය කියලා. රට බෙදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනෙනවාට වඩා ඒක රටේ මිනිසුන්ට වැදගත් වෙයි කියන විශ්වාසය මට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත අපේ රටේ යහපත වෙනුවෙන්, අපේ රටේ මිනිසුන්ගේ යහපත වෙනුවෙන්, දූෂණයට එරෙහි මිනිසුන්ගේ යහපත වෙනුවෙන් විගණකාධිපතිවරයාට ඉදිරියටත් නිසි අයුරින් කටයුතු කරන්නට ශක්තියක් දෙන පනතක් බවට පත් කරන්නට, ඉදිරියේදී හෝ යම් යම් සංශෝධන හරහා එතුමන් සතු බලතල වැඩි කරන්නට මේ පාර්ලිමේන්තුවේ අපි සියලුදෙනාටම හැකියාව ඇත්නම් පමණයි, අපේ රටට සුදුසු, සුරක්ෂිත සහ නිසි විධියේ අනාගතයක් අපට දකින්න පුළුවන්කම ලැබෙන්නේ. අවංක, කාර්යශූර, දක්ෂ විගණකාධිපතිතුමන්ට ඒ අනාගතය හදන්න හැකියාව ලැබේවා, ශක්තිය ලැබේවා, දූෂිතයන්ගෙන්, දූෂණවලින් තොර ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත් කරන්න හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දැන ගැනීම සඳහායි මා මේ කාරණය කියන්නේ. ඩේවිඩ් හොපර් තමයි ඒ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඔබතුමා කැමැති නම් ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා.

[අ.භා.4.27]

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික වැදගත්කමක් තිබෙන ජාතික විගණන පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේදී ඒ පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු මේ පනත් කෙටුම්පත පිළිබඳව ප්‍රශංසා මුඛයෙන් කථා කරනවා අපි දැක්කා. ඒ අතරම, මේ පනත් කෙටුම්පත ගෙනෙන්න පරක්කු වුණා වැඩියි, අවුරුදු 3ක් පරක්කු වුණා කියලා කථා කළා. හැබැයි එතුමන්ලාට මතක නැහැ, අවුරුදු 20ක් මේ රටේ ආණ්ඩු කළත් මෙවැනි යෝජනාවක් ගෙනෙන්නවත් එතුමන්ලාට අදහසක්වත් තිබුණේ නැහැයි කියලා. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා කිව්වා, 2007 වසරේදී මේ ගැන යෝජනාවක් ඉදිරිපත් වුණත්, ඉන් පසුව ඒ ගැන වචනයක්වත් කථා කළේ නැහැයි කියලා. 2015දී මෙය යෝජනාවක් විධියට ඉදිරිපත් කරලා, අද වනකොට එය යථාර්ථයක් බවට පත් කරන්න පුළුවන්වෙලා තිබෙනවා.

ජාතික විගණන පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ක්‍රියා කරපු අපේ ආණ්ඩුව, මේ අවුරුදු තුන තුළ මේ රටේ ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදි අයිතීන් කොපමණ දීලා තිබෙනවාද? අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන, පාරමිතා පුරන මේ උදවිය පසුගිය කාලයේ මෙවැනි පනත් කෙටුම්පත් ගෙනෙනවා තියා, මිනිසුන්ට තිබුණු සාමාන්‍ය ප්‍රජාතාන්ත්‍රිය නිදහස පවා අහිමි කළා. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත ගෙනෙන වෙලාවේ එක එක විකාර කියලා, ඒ පනත් කෙටුම්පත සමච්චලයට ලක් කළා. "මේවා කරන්න බැහැ" කියලා ඒ පනත් කෙටුම්පතේ දෝෂ පෙන්නුවා. හැබැයි, අද වනකොට ආණ්ඩු පක්ෂය විධියට අපි අපේ පාලන කාල සීමාව තුළ මේ රටේ ජනතාවට විනිවිදභාවයකින් යුතුව ඕනෑම තොරතුරක් දැනගැනීමේ අවස්ථාව සලසා දීලා තිබෙනවා. ඉතිහාසය පුරා මේ රටේ ජනතාවට මෙවැනි අවස්ථාවක් ලැබුණේ නැහැ.

ඒ විතරක් නොවෙයි. කොමිෂන් සභා පත් කිරීමත් හීනයක් වෙලායි තිබුණේ. "අපි කොමිෂන් සභා ගෙනෙනවා. රාජ්‍ය යාන්ත්‍රණය ක්‍රියාත්මක වීමේදී විනිවිදභාවයක් ඇති කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය සුරකිනවා"යි කියලා තමයි පසුගිය කාලයේ ජනාධිපතිවරණ පොරොන්දු පත්‍රිකාවල තිබුණේ. ඒ මොකක්වත් සිද්ධ වුණේ නැහැ. නමුත් අද අපි ඒවා යථාර්ථයක් බවට පත් කරලා තිබෙනවා. අද ජාතික පොලිස් කොමිෂන් සභාව ඉතාම ක්‍රියාකාරියි. එදා එහෙම නොවෙයි. එදා අපේ දිස්ත්‍රික්කවල හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හිතවත් අය පොලීසියේ ස්ථානාධිපති පුටුවේ වාඩි කරවනවා විතරක් නොවෙයි, තමන්ට හිතුණු වෙලාවට ස්ථානාධිපතිවරයාගේ පුටුවේ වාඩිවෙලා, ඔහුගේ බෙල්ලෙන් අල්ලා පැමිණිලි විභාග කරපු සිද්ධි ඕනෑ තරම් තිබෙනවා. අපට ඒ ගැන පැහැදිලි කරන්න පුළුවන්.

මේ විගණන පනත් කෙටුම්පත මේ රටේ සමාජගත වෙන කොට දැන් කියනවා, මේ පනත් කෙටුම්පතේ තවු කපලාලු.

[ගරු හේෂාන් විතානගේ මහතා]

මහත්තයෝ, තටු කපලා නොවෙයි, මේ පනත් කෙටුම්පත මේ විධියටවත් මෙච්චර ඉක්මනින් අරගෙන එන්න කටයුතු කිරීම ගැන ඔබතුමන්ලා සතුටු වෙන්න ඕනෑ. අපි මේ හැම එකකින්ම රටේ ප්‍රජාතන්ත්‍රීය අයිතියයි තහවුරු කරන්නේ. පසු ගිය දවස්වල කියපු හිට්ලර් පන්නයේ ආණ්ඩුවක් බිහි වෙනවා නම් මෙවැනි පනත් වැඩක් නැහැ. ඒ වාගේ පන්නයේ ආණ්ඩුවක් තිබෙන යුගයකට මෙවැනි පනත් වැඩක් නැහැ. එතකොට විගණකාධිපතිගේ බලතල ඒ ඔක්කෝම ටික බිඳිලා යනවා. එතකොට හිට්ලර්ගේ විධියට ඒ ඔක්කෝම වැඩ කරගෙන යනවා. එතකොට ප්‍රජාතන්ත්‍රීය අයිතිය නැති වෙනවා; මේ පනත් හමස් පෙට්ටියට යනවා. මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන, ඒ වෙනස් දේශපාලන අත්දැකීම අද රටේ ජනතාවට දැක ගන්න පුළුවන් විධියට මේ ආණ්ඩුව ක්‍රියාත්මක වන බව මම කියනවා. මම දැක්කා, ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා හරිම වේදනාවෙන් කථා කළා, මේවා මේ මේ විධියට වෙන්න ඕනෑ කියලා. හැබැයි, ජයන්ත සමරවීර මන්ත්‍රීතුමාට මතක නැහැ, එතුමාගේ හිටපු අමාත්‍යවරයාගේ අක්කාගේ දුවගේ මඟුල කෑවේ අමාත්‍යාංශයේ සල්ලිවලින් කියලා. අපි කියනවා, ඒවා විගණනය කරන්න කියලා.

අපේ දිනේෂ් ගුණවර්ධන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමා කිව්වා බැඳුම්කරය ගැන විගණනය කරන්න කියලා. අනිවාර්යයෙන්ම ඒක විගණනය කරන්න, ඒ වුදිතයන්ට දඬුවම් දෙන්න. ඒ අය එල්ලුම් ගහේ එල්ලන්න පුළුවන් තැනට අරගෙන යන්න. හැබැයි, එදා අහිංසක මිනිසුන්ගේ බදු මුදලින් තමන්ගේ අක්කාගේ දුවගේ මඟුල කෑවා. මේක විලිලජ්ජා නැති කථාවක්. මේ පාර්ලිමේන්තුවේ කියන්නත් ලජ්ජයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තමන්ගේ අක්කාගේ දුවගේ විවාහ මංගල්‍ය උත්සවය -මඟුල- ගන්න මේ රටේ මුදල් පාවිච්චි කරපු උදවිය අද සුදු වරිත වෙලා මෙතැනට ඇවිල්ලා කියනවා, "මේ පනත් කෙටුම්පතේ මේ වෙනස්කම් ටික ඇති කරලා රාජ්‍ය නිලධාරින්ට හොඳ ශක්තියක් වන විධියට කටයුතු කරන්න" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ රට හරි තැනට අරගෙන යනවා. ඒක තමයි, මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන වෙනස. රටේ ජනතාව බලාපොරොත්තු වෙච්ච ඒ නිදහස, රටේ ජනතාව බලාපොරොත්තු වෙච්ච ඒ ප්‍රජාතාන්ත්‍රීය අයිතිය තහවුරු කරන්න අපි කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විගණකාධිපතිතුමාත් ඉන්න වෙලාවේ මම මේ කාරණය කියනවා. මේ රටේ රාජ්‍ය මුදල් භාවිතය පිළිබඳව, මූල්‍ය විනය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු විධියට අපි දන්නවා, රජයේ මුදල් ටිකවත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ විමධ්‍යගත මුදල් ටිකවත් නිවැරැදිව ජනතාවාදී විධියට පරිහරණය කිරීමට ක්‍රමවේදයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සකස් වෙලා නැති බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනක සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා විධියට ඒ කාරණය දන්නවා. මා උදාහරණයක් කියන්නම්. එකම භාණ්ඩය ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනකින් මිලදී ගන්නේ මිල ගණන් තුනකට. එකම භාණ්ඩයේ මිල ඒ විධියට වෙනස්වීමට හේතුව කුමක්ද? ඒ භාණ්ඩයේ ප්‍රමිතිය පිළිබඳ පාලනයක් නැහැ. අපි ඒ භාණ්ඩ ජනතාවට දෙනවා. නමුත් ජනතාව -ඒ ප්‍රතිලාභියා- ඒ ගැන හොයන්නේ නැහැ. නිකම් හම්බ වෙන නිසා අරගන්නවා. හැබැයි, අපි හිතන හැටියට මේ හරහා සමහර දූෂිත නිලධාරින් තමන්ගේ අරමුණු කරා යනවා. ඒ නිසා ටෙන්ඩර් පටිපාටිය තුළ නිසි ක්‍රමවේදයක් ඇති කරන්න කටයුතු කළ යුතුයි. ඒ කටයුතු සිද්ධ වුණාට පස්සේ මේ ගනුදෙනුවලදී වැරැදි සිද්ධ වෙලා තිබෙනවා කියලා විගණන කරලා ඒ විගණන විමසීම් තුළින් උත්තර හොයනවාට වඩා රාජ්‍ය මුදල් නිවැරැදිව පාවිච්චි කරන්න අවශ්‍ය නීති සකස් කළ යුතුයි කියලා මම හිතනවා. අඩුම තරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් නිවැරැදි ක්‍රමවේදයක් තුළ මේ කටයුතු කළ යුතුමයි. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවක හිටපු සභාපතිවරයෙක් විධියට මා දන්නවා, ප්‍රාදේශීය සභාවල භාණ්ඩ මිලදී ගැනීමේ ක්‍රියාදාමය කොහොමද කියලා. භාණ්ඩ මිලදී ගැනීමේ ඒ ක්‍රියාදාමය තුළ කිසි විනිවිදභාවයක් නැහැ. සභාපතිට නිදහස දීලා තිබෙනවා ඕනෑ විධියට ඒ කටයුතු කරන්න. ඒ සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට - සභිකයන්ට- මේ පිළිබඳ අවබෝධයක් නැති වෙන්න පුළුවන්. මේ වාගේ තැන්වලින්ම මේ අකටයුතුකම් නතර වෙන්න ඕනෑ. මහා ලොකු, කෝටි ගණන් මුදල් වංචා කරන චරිත බිහි වෙලා එන්නේ මේ වාගේ තැන්වලින් තමයි. අද සමහර අය කියනවා, 78 විවෘත ආර්ථිකය ගෙනාවාට පස්සේ 'මහවැලිය' වාගේ මහා ව්‍යාපෘති තුළින් තමයි හොරු බිහි වුණේ කියලා. හැබැයි, ඒක පිළිගන්න එක ගැන මම සතුටු වෙනවා. මොකද, "අපි හොරු වුණේ 77 ගෙනා ක්‍රමවේදය තුළ" කියන එක ඒ අය පිළිගැනීම ගැන අපි සතුටු වෙනවා. මේ රටේ පුංචි අහිංසක මිනිහාගේ රුපියල් 500 ගැන හොයන්න, මේ රටේ ගමේ පුංචි ව්‍යාපාරයක් කරන අහිංසක මිනිහාගේ බදු ආදායම ගැන හොයන්න කටයුතු කරනවා වාගේම විශාල වශයෙන් බදු පැහැර හැරලා ඉන්න මේ රටේ සමාගම් පිළිබඳවත් හොයන්න පුළුවන් ක්‍රමවේදයක් ඇති වෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක කාලයක් තිබෙනවා.

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කවුරුත් දන්නා කාරණයක් තමයි, ලක්ෂ ගණන්, කෝටි ගණන්, මිලියන ගණන් ආදායම් බදු ගෙවන්න තිබෙන මනුස්සයාට මේ ප්‍රශ්නය විසඳාගන්න පුළුවන් ක්‍රමයක් අද නිර්මාණය වෙලා තිබෙනවා. කොමසාරිස්තුමා හෝ කොමසාරිස්තුමිය හෝ හම්බවෙලා අත යට ගණනක් දීලා ඒක විසඳාගන්න පුළුවන්. එම සුප්‍රකට ක්‍රමය අද මේ රටින් තුරන් වෙන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Sri Lanka Customs එක ගත්තොත්, Sri Lanka Customs එකේ හයිය තිබෙන කෙනාට හය නැතුව එළියට එන්න පුළුවන් කියලා අපි දන්නවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න අමාත්‍යවරු, මන්ත්‍රීවරුත් ඒක දන්නවා. එම ක්‍රමවේද ටික වහන්න ඕනෑ. අල්ලසක් නැතුව වැඩක් කරගන්න බැරි රාජ්‍ය ආයතන කොපමණ තිබෙනවාද? විගණකාධිපතිතුමනි, ඒ නිසා මේ මඟින් ඔබතුමාටත් ශක්තියක් නිර්මාණය වෙනවා. එසේ නිර්මාණය වීම තුළ අඩුම තරමින් මේ රටේ දේශපාලනඥයන්ගේ අවශ්‍යතා නිසා, මේ රටේ අහිංසක මිනිසුන්ගේ බදු මුදල් ටික විනාශ වීමේ පාපකර්මය නැති කරන්න ඔබතුමා කටයුතු කරන්න. ඒ සඳහා ශක්ති දෙන්න. මේ යහපාලන ආණ්ඩුවේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට එල්ලගෙන ගහන උදවියට අපි කියනවා, මේවා හය නැතුව අරගෙන මේ රටේ මිනිසුන්ට අනාගතය උදා කර දෙන්න කියලා. පසු ගිය කාලයේ වගේ හොර, තක්කඩි රැළක් නැවතත් මේ රට තුළ බිහි නොවෙන්න වග බලාගන්න කියන එක මතක් කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුතියි. මීළඟට, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 4.37]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාපති නාමාවලියට අලුතින් පත්වී ඔබතුමා ප්‍රථමයෙන් මූලාසනයට පැමිණ සිටින අද දිනයේ මා ඔබතුමාට සුබ පතන්නට මේ අවස්ථාව යොදා ගන්නවා. ඔබතුමා මූලාසනයේ සිටින වෙලාවක මට කථා කරන්නට ලැබීම ඉතාමත්ම සතුටට කරුණක්. මොකද, අද අපි සාකච්ඡාවට භාජනය කරන මාතෘකාව වන ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කලින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ දී දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ බව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙකු වන ඔබතුමා දන්නවා ඇති. මෙම ජාතික විගණන පනත් කෙටුම්පත පිළිබඳව අපි මාස ගණනක් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී - Public Finance Committee එකේදී - වාද විවාද කළා. ඒ හරහා මෙම ජාතික විගණන පනත් කෙටුම්පතේ ඇති අවශ්‍යතාව අපි ඉතාමත් හොඳින් දැක්කා. මෙම ජාතික විගණන පනත් කෙටුම්පත ගැන කථා කරන කොට කියන්නට ඕනෑ, ජාතික විගණන පනත් කෙටුම්පත පිළිබඳව මුලින්ම සාකච්ඡා වෙන්නේ 2000 වර්ෂයේ දීයි. ඒ වාගේම ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ජනාධිපතිවරයා වශයෙන් ඉදිරිපත් වුණු වෙලාවේ එතුමාගේ මැතිවරණ ප්‍රකාශයේත් රාජ්‍ය විගණනය පාලනය කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා නීතියක් පැනවීම කඩිනම් කිරීම සම්බන්ධයෙන් පොරොන්දු වුණා. ඒ පොරොන්දුව ඉටු කිරීමත් එක්කම 2015 වර්ෂයේ මැයි මාසයේදී දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් විගණකාධිපතිවරයාගේ බලතල පුළුල් කරනු ලැබුවා. ඉන් පසුව පරිපූරක ව්‍යවස්ථාදායක රාමුවක් මඟින් එය තහවුරු කරන්න අවශ්‍ය බලතල ලබා දීම සඳහා වන ජාතික විගණන පනත් කෙටුම්පතක් හැටියට අපට මෙය හඳුන්වා දෙන්නට පුළුවන්. රටේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ, ප්‍රජාතන්ත්‍රවාදය අගයන ජනතාවට ඉතාමත් සතුටු විය හැකි පනත් කෙටුම්පතක් හැටියටයි අපි දකින්නේ.

විගණකාධිපතිවරයා සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්ම මහත්මීන් පසු ගිය කාලයේ මේ ගැන විශාල සාකච්ඡාවක් කරනවා අපි දැක්කා. සමහර වෙලාවට සටනක් වුණා, සමහර වෙලාවට චෝදනා කළා. සමහර අය කිව්වා, ආණ්ඩුව මේක කරන්න දෙන්නේ නැහැ, ආණ්ඩුව මේකට විරුද්ධයි කියලා. නමුත් ඒ සියලුම චෝදනා, යෝජනා සියල්ල මල් පොකුරු හැටියට අරගෙන අද අපට සතුටු වෙන්න පුළුවන්. මේ ආණ්ඩුව ජනතාවට අවශ්‍ය ජාතික විගණන පනත් කෙටුම්පතක් හැටියට මෙය ඉදිරිපත් කරලා තිබෙනවා.

විගණකාධිපතිවරයා සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයන් පිළිබඳව විශේෂයෙන් රජයේ මුදල් සම්බන්ධයෙන් කටයුතු කරන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ දී -Public Finance Committee එකේ දී - අපි සමාලෝචනයට ලක් කළා. ඉදිරියේ දී Public Finance Committee එක හරහා අපි Budget Office එකක් ඇති කරනවා. මෙම ජාතික විගණන පනත් කෙටුම්පත හරහා පාර්ලිමේන්තුවට වගකීම් පැවරෙන්නේ කොතැනද කියන කාරණයත් එක්ක බද්ධ කරලා අනාගතයේ දී Budget Office එක හරහා මේ ගැන තව තවත් සමාලෝචනය කරන්න, මේ කාර්යන් විශ්ලේෂණය කරන්න අපට හැකියාව ලැබෙනවා. මම හිතන විධියට අවසානයේ දී එහි බලතල පැවරෙන්නේ පාර්ලිමේන්තුවටයි.

මේ පාර්ලිමේන්තුවට බලතල පැවරෙන විගණන පනත හරහා Budget Office එක ඇති කිරීම තුළින් එය ක්‍රමානුකූල කරගෙන මෙහි කාර්යභාරය තව තවත් ශක්තිමත් කරන්න අපට හැකියාව ලැබෙනවා. කලින් කථා කරපු ගරු හර්ෂ ද සිල්වා අපේ රාජ්‍ය ඇමතිතුමා, ඒ වාගේම ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමාත් මේ ගැන සාකච්ඡා කළා. විශේෂයෙන් තාක්ෂණික විගණනයන් ගැන සාකච්ඡා කළා. Public Finance Committee එකේදීත් අපි ඒ ගැන සාකච්ඡා කළා. ප්‍රධාන වශයෙන්ම අපි point out කළේ තාක්ෂණික විගණනයන් හරියාකාරව සිදු නොවුණොත් වියහැකි අක්‍රමිකතා ගැනයි. ඒ නිසා විශේෂයෙන් රාජ්‍ය සේවකයා, තීරණ ගන්න නිලධාරින් වාගේම දේශපාලන අධිකාරියත් පාඩු ලබන්න පුළුවන්. මේක සංවේදී කාරණයක්. විශේෂයෙන් තාක්ෂණික සහ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ විගණනය. එම කාරණය පිළිබඳ විගණකාධිපතිවරයාගේ අවධානය අපි යොමු කරවනවා. මොකද, ගල් අඟුරු සම්බන්ධයෙන් වූ ප්‍රශ්නයකදී වරෙක අපි මේ බව දැක්කා. අපි බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ දී ගල් අඟුරු සම්බන්ධයෙන් වූ වාර්තාවේ තිබූ අඩුපාඩු ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. අපි මේ විවේචන කරන්නේ බොහොම සුබවාදී විධියට. ඒවා positive විධියට ගන්න කියා අපේ විගණකාධිපතිවරයාගෙන් සහ එම කණ්ඩායමෙන් ඉල්ලා සිටිනවා. අපි එතැනදී දැක්කා, තාක්ෂණික ගැටලු තිබෙන බව.

අපට සන්තෝෂ වෙන්න පුළුවන් කාරණයක් තිබෙනවා. වත්මන් පාර්ලිමේන්තුවේ, අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා වාගේම තවත් මන්ත්‍රීවරු රාශියක් තාක්ෂණික දැනුමෙන් සන්නද්ධව සිටිනවා. ඒ නිසා Oversight Committees වල නැත්නම්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අපි සාකච්ඡා කරනකොටත් දැනුම ඇති මන්ත්‍රීවරු හැටියටයි සාකච්ඡා කරන්නේ. එතුමන්ලා දැනුම ඇති මන්ත්‍රීවරු හැටියට සාකච්ඡා කරනවා. නමුත් සමහර වෙලාවට විගණකාධිපතිවරයාගේ වාර්තාව අරගෙන එන විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් සාකච්ඡා කරන්නේ සියල්ල දත් අය වාගේයි. ඇත්තටම අපි මේ ගැන දැඩි වේදනාවෙන් කථා කරන්නේ. සමහර වෙලාවට ඔවුන් අපට ඇහුම්කන් දෙන්නේ නැහැ. "නැහැ, නැහැ. අපි කියන වාර්තාව හරි; අපි කියන එක තමයි හරි" කියලා කියනවා. නමුත් එය නොවෙයි විය යුත්තේ. මේක සාකච්ඡාවට භාජනය වෙන්න ඕනෑ. Positive thinkersලා විධියට කටයුතු කරන්න ඕනෑ. තාක්ෂණික ප්‍රශ්නයක් -ගැටලුවක්- තිබෙනවා නම් ඒ පිළිබඳ සාකච්ඡා කළ යුතුයි. මොකද, පාර්ලිමේන්තුවේ තාක්ෂණික දැනුමින් සන්නද්ධ වෙච්ච, දැනුම තිබෙන වෘත්තිකයන් ඉන්න පුළුවන්. එම වෘත්තිකයන් කියන දෙයට ඇහුම්කන් දිය යුතුයි කියා අපි යෝජනා කරනවා.

විශේෂයෙන් මේ කාරණය විගණන පනත හරහා සාකච්ඡාවට භාජනය විය යුතුයි. එහෙම වුණොත් විතරයි මේ විගණන පනතේ කාර්ය භාරය යථානුරූපීව සිදුකරගත හැකි වන්නේ. එහෙම නැති වුණොත් ගැටලු මතු වනවා. ගල් අඟුරු ගණනය කිරීම්වල තිබුණු වැරදි මට මතකයි. මොකද, තාක්ෂණික දැනුමක් නැතුව ගණනය කරලා තිබීමෙන් පාඩු සිදුවෙලා තිබෙන බව; සමහර වෙලාවට වාසියක් සිදුවෙලා තිබෙන බව අපි දැක්කා. සමහර වෙලාවට තාක්ෂණික ගැටලුත් එක්ක පාඩුව, වාසිය දෙකම positive, negative විධියට කොයි පැත්තට යයිද කියන බරපතළ ගැටලුවක් ඇති වෙනවා. මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙලා තිබෙනවා, තාක්ෂණික කාරණාවලදී විගණකාධිපතිවරයා එම තාක්ෂණික ගැටලු සම්බන්ධයෙන් උපදෙස් ගත යුතු ආයතනවලින් උපදෙස් ගත යුතුය කියන කාරණය. නමුත් ඒ සඳහා වගකීම තිබෙන තැන් මොනවාද කියන එක ගැන සාකච්ඡාවට භාජනය කරන්න පුළුවන් නම් හොඳයි කියලා මා හිතනවා. එය සාකච්ඡාවට භාජනය විය යුත්තේ කොහොමද කියන එක සංශෝධන හැටියට ඉදිරිපත් කරන්න පුළුවන්කමක් ලැබුණොත් හොඳයි. ඒ පිළිබඳව අපට සාකච්ඡාවට භාජනය කරන්න ලැබුණොත් හොඳයි. උදාහරණයක් වශයෙන් ඉංජිනේරුමය කාර්යයන් හැටියට ගත්තොත් අපට

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

පුළුවන් අදාළ Oversight Committee එකට අරගෙන එතැනදී තාක්ෂණික දැනුම සම්බන්ධයෙන් කථා කරලා, විශේෂයෙන් තාක්ෂණික දැනුම සම්බන්ධයෙන් expertsලා ගෙනැල්ලා third eye එකකිනුත් බලලා මේකේ comment එක ගන්න. එහෙම නැති වුණොත් වෙන්න පුළුවන් අගතිය තමයි වැරදි තීරණයකින් වැරදිම වැරදි චිත්‍රයක් මැවෙන්න පුළුවන්වීම.

ඊළඟ කාරණය තමයි විගණකාධිපතිවරයා ඇතුළු විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සේවක මහත්වරුන්ගේ political biasness එක. ඒ කියන්නේ politically එක පක්ෂයකට සම්බන්ධ විය හැකි පුද්ගලයන් සිටිය හැකි වෙනවා. එතකොට සමහර වෙලාවට ඒ ගොල්ලන් ඒ යාළු මිත්‍ර දේශපාලනඥයන් විසින් මෙහෙයවන්න පුළුවන්කම ලැබෙනවා. මේ වාගේ වෙලාවට ස්වාධීනව කටයුතු කරන්නේ කොහොමද කියා මේ ජාතික විගණන පනත් කෙටුම්පතේ සඳහන් වෙන තැන අඩුපාඩු තිබෙනවා කියලා මා දකිනවා. එහෙම නම්, ස්වාධීනත්වය ආරක්ෂා කරන්නේ කොහොමද? වර්තමාන විගණකාධිපතිවරයා දේශපාලනීකරණය නූනත්, දේශපාලනීකරණය වෙච්ච විගණකාධිපතිවරයෙක් ඒ තැනට පත් වුණා කියා අපි හිතමු. ඒ පත්වූ කෙනාගේ කාර්යයන් විමර්ශනය කරන්නේ කොහොමද? ඒ සම්බන්ධයෙන් බලය පැවරෙන්නේ කොතැනටද කියන එක ගැන සාකච්ඡා කළ යුතුයි. ඒක අපි Budget Office එක ඇතුළේද, නැත්නම් Public Finance Committee එක ඇතුළේද සාකච්ඡා කළ යුත්තේ කියන කාරණය අපි Budget Office එක හරහා සමාලෝචනය කරගත යුතු වෙනවා.

මෙම විගණන පනත ඉතාම හොඳයි. නමුත් එය තවත් පොලිස්කාරයෙක් නොවිය යුතුයි. ඒ කියන්නේ, මේ රටට බලපාන අනාගත තීරණවලදී තවත් පොලිස් පොල්ලක් වෙලා මේ කරන ක්‍රියාදාමයන් නවත්වන තැනට එය නොයා යුතුය කියා අපි දැඩි සේ විශ්වාස කරනවා. විශේෂයෙන්ම ඉංජිනේරු කාර්යයන්, තාක්ෂණික කාර්යයන් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුමෙන් සන්නද්ධ වෘත්තිකයන්ගේ දැනුම හරියාකාරව ලබා ගත්තේ නැති වුණොත් අගතිගාමී තත්ත්වයන් ඇති වෙන්න පුළුවන්. ඒක බොහොම බරපතළ කාරණයක්. එම නිසා ජාතික විගණන පනත සම්බන්ධයෙන් මේ කාරණාව සාකච්ඡාවට භාජන විය යුතුයි කියන යෝජනාව මම කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේත් අපි මේ කාරණය ගැන කථා කළා. එහිදී අපට තේරුණා, TRC එකේ illegal cable TV operatorsලා ලංකාව පුරාම සිටින බව. නමුත්, ඒ අය සම්බන්ධයෙන් TRC එක ඇතුළේ තාක්ෂණික විගණනයක් වෙන්නේ කොහොමද කියා අපට පැහැදිලි කර ගත හැකි වුණේ නැහැ. ඒ වාගේ වෙලාවක මේ කාරණා සම්බන්ධව තාක්ෂණික විගණනයක් කරගෙන, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඒ නියාමනය කරන්නේ කොහොමද? ඒ වාගේම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවත් නියාමනය කළ යුතු වෙනවා. එම නිසා මෙම විගණන පනත හරහා හෝ මේ කොමිෂන් සභාවත් නියාමනය කරන්න අවස්ථාවක් ලැබෙන්න ඕනෑ. ඒ ලැබෙන අවස්ථාව තාක්ෂණික දැනුමෙන් සන්නද්ධ වුණු පිරිසක් හරහා කර ගත්තේ නැත්නම් -විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හරහා හෝ- මේ රටට අය කර ගත හැකි මුදල් විශාල ප්‍රමාණයක් අපට නොලැබී යනවා. ඒ වාගේම තමයි, අත්තනෝමතිකභාවය. ඒ කියන්නේ, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මේ මොහොතේ ක්‍රියා කරන්නේ සම්පූර්ණයෙන්ම ඒකාධිපතියෙක් විධියටයි. ඒකාධිපතියකුගේ ස්වරූපය අරගෙන -රජ වාසල වඩුරාගේ ස්වරූපයෙන්- මේ ආයතනය ක්‍රියාත්මක නොවිය යුතුයි. රජ වාසල වඩුරා කඩුව ගත්තාම මොකද කරන්නේ කියා අපි කවුරුත් දන්නවා; සාමාන්‍ය කථා බහේදී අපි ඒ ගැන කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා; you have only one more minute.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එවැනි දේවල් සමඟ බලන විට මෙවැනි කාරණා සම්බන්ධයෙන් විශේෂ විමර්ශන සිදු කළ යුතු වෙනවා. මෙවැනි ආයතන විමර්ශනය කරන විට තාක්ෂණික දැනුම උපයෝගී කරගෙන හරියාකාරව කළොත් විතරයි රටට ආදායම ලබාගත හැකි වන්නේ. ඒ සඳහා මම උදාහරණයක් කියන්නම්. පසුගිය කාලයේ සිද්ධ වුණු වංචා, දූෂණ ගැන අපි සාකච්ඡා කරනවා. මේ වංචා දූෂණ, අයථා ලෙස උපයා ගත් දේපොළ ගැන කථා කරන විට ඒ සම්බන්ධයෙන් විශාල වශයෙන් චෝදනා තිබෙන මන්ත්‍රීවරුත් මේ ගරු සභාවේ ඉන්නවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
කවුද, කවුද?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මන්ත්‍රීවරයාගේ නම පස්සේ කියන්නම්. මට තව කාලය දුන්නොත්, ඒ ගැන තව පොඩ්ඩක් කථා කරන්නම්.

ඒ මන්ත්‍රීවරයාට තිබෙන චෝදනා මෙවායි. රුපියල් ලක්ෂ 87.75කට මිලට ගත් නිවසක් නාවල කොස්වත්තේ පැවතීම; බොරැල්ල කුරුප්පු පාරේ, අංක 66 දරන ස්ථානයේ පර්චස් 20.85ක ඉඩමක් පැවතීම; කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පිටවීමේ පර්යන්තයේ, "චේම්බර් ඔෆ් ගිෆ්ට්ස්" සහ "ඩී-ෆ්‍රී ශ්‍රී ලංකා" නමැති තීරු බදු සාප්පු දෙක පවත්වාගෙන යාම.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
කවුද, කවුද ඒ මන්ත්‍රීවරයා?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
පොඩ්ඩක් ඉන්න ගරු මන්ත්‍රීතුමනි. අවසානයේදී කියන්නම්.

මහනුවර ජෝර්ජ් ආර්. ද සිල්වා මාවතේ පර්චස් 12, පර්චස් 13.5 සහ පර්චස් 18.3ක ඉඩම් කැබලි තිබීම; රුපියල් ලක්ෂ 285කට ඇල්විටිගල මාවතේ, ට්‍රිලියම් රෙසිඩන්සීස් නිවාස සංකීර්ණයේ අංක 153/9/2 දරන නිවස බිරිඳගේ නමට මිලට ගැනීම; කොළඹ 07, කින්සි පාරේ අංක 70/3/1 හි නිවස පැවතීම; පවුම් 320,000ක් ගෙවා එංගලන්තයෙන් නිවසක් මිලට ගැනීම; අංක 15/1, චන්ද්‍රා වෙත්තසිංහ මාවත, කොස්වත්ත -නාවල පර්චස් 15.58ක ඉඩම සහ උපයා ගත් ආකාරය හෙළි කිරීමට නොහැකි රුපියල් මිලියන 27ක් යොදා කොළඹ ප්‍රදේශයේ දේපළක් මිලදී ගැනීම. මේ සියලු වත්කම් තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරයකුටයි. තමන් සුද්දනෙක් වාගෙයි කියා හිතාගෙන කථා

කරන, අභූත චෝදනා ඉදිරිපත් කරන මන්ත්‍රීවරයෙක් මේ. [බාධා කිරීමක්]

පොඩ්ඩක් ඉන්න, මුදල් අවභාවිතාව සම්බන්ධයෙනුත් එතුමාට චෝදනා තිබෙනවා. 2015 ජනාධිපතිවරණයේ ප්‍රචාරක කටයුතු සඳහා ලක් සතොස ආයතනයේ රුපියල් ලක්ෂ 390ක් වටිනා කැරම් බෝඩ්- [බාධා කිරීමක්] කවුද කියා දැන් දන්නවා නේ. ඒ වාගේම, 2014දී පැවති ඌව පළාත් සභා මැතිවරණයේදී හා 2015දී පැවති ජනාධිපතිවරණයේදී වරාය සේවකයන් 573ක් ඔවුන්ගේ සම්පූර්ණ පඩිය සහ අතිකාල සමඟ මැතිවරණ ක්‍රියාකාරකම් සඳහා යොදා ගනිමින් රජයේ මුදල් අවභාවිත කර තිබෙනවා.

එතුමාට විරුද්ධව තවත් චෝදනාවක් තිබෙනවා. ඒක තමයි බරපතළම චෝදනාව. නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව භාර චීන සමාගමකින් ඇමෙරිකානු ඩොලර් මිලියන 25.4ක කොමිස් මුදලක් ගැනීම සම්බන්ධයෙන් එතුමාට නඩුවක් තිබෙනවා. මේ ආදී වශයෙන් චෝදනා රාශියක් තිබෙන මන්ත්‍රීවරුත් මේ සභාවේ ඉන්නවා. මේ වාගේ නිවැරදි විගණන පනතක් ආපු දාට මෙවැනි මන්ත්‍රීවරුන් සම්බන්ධ සියලුම කාරණා ගැන නිතට; අකුරටම ක්‍රියා කරන්න හැකියාවක් ලැබෙනවා. ඒ නිසා වීදුරු ගෙවල් ඇතුළේ ඉඳගෙන ගල් ගහන <u>මහින්දානන්ද අලුත්ගමගේ</u> වැනි මන්ත්‍රීවරුන්ට අපි මෙන්න මේ කාරණය කියනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ආ, එතුමාද?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
එතුමා තමයි. එතුමාට අපි එළිපිටම පාර්ලිමේන්තුව ඇතුළෙත් කියනවා; එළියෙත් කියනවා. අපි පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට යට වෙලා අභූත චෝදනා නඟන්නේ නැහැ. අපි එළියේදීත් මේවා කථා කරනවා. එවැනි මන්ත්‍රීවරුන්ට අපි කියනවා, මෙවැනි විගණන පනතක් ආවාම මේ ගැන අපට තවත් හරියට විගණනය කරගන්න පුළුවන් බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.51]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesi
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඓතිහාසික දිනයක්. මෙවැනි ඓතිහාසික මොහොතක් නිර්මාණය කර දීලා, ඒ වෙනුවෙන් පවත්වන විවාදයට එක්වීමට අවස්ථාව ලබාදීම පිළිබඳව මා ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම හොරකමට, වංචාවට, දූෂණයට විරුද්ධව හැම දාම පෙනී සිටින, ඒ වෙනුවෙන් සටන් කරන මන්ත්‍රීවරයකු මූලාසනයේ ඉඳිද්දී කථා කරන්න ලැබීම පිළිබඳවත් මම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේදී අපි විවිධ අණපනත් සම්මත කරලා, මේ රටේ අහිංසක ජනතාවට ලැබෙන්න තිබෙන මුදල් මේ රටේ රාජ්‍ය ආයතනවල, දෙපාර්තමේන්තුවල අවශ්‍යතා වෙනුවෙන් යොදවනවා. මේ රටේ පිළිගත් නීතිය අනුව, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිත් එක්ක කටයුතු කරමින් අපි ඒ මුදල් රාජ්‍ය ආයතන වෙනුවෙන් යොදවනකොට, ඒ සියලු දේවල් ඉක්මවා රාජ්‍ය නිලධාරින් හෝ දේශපාලන නායකයන් තමන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා, තමන්ගේ සුඛවිහරණය සඳහා එම මුදල් පාවිච්චි කිරීම වළැක්වීම සඳහා කටයුතු කරන්න තමයි මේ විගණන පනත ගෙනෙන්නේ. විශේෂයෙන්ම මෙම ජාතික විගණන පනත තුළින් අලුත් නීති පද්ධතියක් ගොඩ නඟලා, මා කලින් සඳහන් කළ ආකාරයට මේ රටේ ධනය ආරක්ෂා කරන වැඩ පිළිවෙළ නිර්මාණය කරන්න අපි කටයුතු කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක හොඳයි. හැබැයි, මේවාට නතු වන, මේවාට අත් උදව් දෙන, මේ හොරකමට වංචාවට, දූෂණයට එකතු වන ඒ නිලධාරින්ට, දේශපාලන නායකයන්ට ලබාදෙන දඬුවම් පිළිබඳව නම් මා සතුටු වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරකම, වංචාව, දූෂණය නිට්ටාවටම මේ රටින් තුරන් කරන්න නම් මේ විගණන පනතේ තිබෙන දඬුවම් තවත් තද කළ යුතුයි කියා මා විශ්වාස කරනවා. පසුපෙළ මන්ත්‍රීවරයෙක් හැටියට මම මේ ගැන අත් දැකීමෙන් කියන්නම්. අපි ද්වේෂ සහගතව කථා කරනවාය කියා සමහර වෙලාවට හැමෝම හිතනවා ඇති. පසුගිය කාල වකවානුව තුළ අපේ ඌව පළාතේ සිදුවුණු සිදුවීම් පිළිබඳව නිරන්තරයෙන් අපි කථා කරනවා. හැබැයි, ඇමතිවරයා එන්නේ නැහැ. ඇමතිවරයා උත්තර දෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ලද හොඳ අත් දැකීමක් මම කියන්නම්. එක්තරා අවස්ථාවක, අටවැනි පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මේ නිලධාරින් කැඳවනවා. විගණන විමසුමක් එනවා. මොකක්ද එන්නේ? ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ අවශ්‍යතාව අනුව පෙර පාසල් දරුවන්ට පොත් බෑග් ලබා දෙන්න කටයුතු කර තිබෙනවාය කියා මේ විගණන විමසුම තුළ තිබෙනවා. ඒ පොත් බෑග් ලබා දෙන්න පළාත් සභා අරමුදලෙනුත්, මහජන බැංකුව, ලංකා බැංකුව යන රාජ්‍ය බැංකුවලිනුත් තවත් මුදල් ප්‍රමාණයක් ලැබී තිබෙනවා. එම මුදල් සෘජුවම ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික ගිණුමකට දමා තිබෙනවා. ඒක අද ඔප්පු වෙලා තිබෙනවා. විගණනයෙන් අද ඒක පැහැදිලි කර දීලා තිබෙනවා. විගණනයෙන් විතරක් නොවෙයි, පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ ප්‍රධාන ලේකම්වරයා කියනවා, "මේ ගිණුම ප්‍රධාන ඇමතිවරයාගේ පෞද්ගලික ලේකම්ගේ" කියා. ඒ වෙනුවෙන් දීලා තිබෙන දඬුවම් මොනවාද? ලැබිලා තිබෙන දඬුවම් මොනවාද? ලැබුණු දඬුවමක් නැහැ. නමුත් ඒ පළාතේ උගත්, බුද්ධිමත් විදුහල්පතිතුමියක් දණ ගැස්සුවා. ඒ වෙන කවුරුවත් නොවෙයි, ඒ හොරකම, ඒ වංචාව කළ දේශපාලන නායකයා තමයි විදුහල්පතිතුමිය දණ ගැස්සුවේ. ඒ දේශපාලන නායකයා විතරක් නොවෙයි, ඒකට අත් උදව් දීලා තිබෙන ඒ නිලධාරි කණ්ඩායමත් අද ඒ පළාත තුළ ඒ කාර්යය ඒ විධියටම කරන්න පුළුවන් තත්ත්වයක් නිර්මාණය කර තිබෙනවා. පොඩි දඩයක් ගහලා, පොඩි අධිභාරයකට ලක් කරලා එවැනි කටයුතු නතර කරන්න පුළුවන් කියා මම හිතන්නේ නැහැ. ඒ නිසා මම විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා, මේවාට තව දඬුවම් දෙන්න කියා. හොරකමට, වංචාවට අපි නිත තැබිය යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආණ්ඩුවක් හැටියට අපි යම් ප්‍රමාණයක හෝ වැඩ පිළිවෙළක් නිර්මාණය කර තිබෙනවාය කියා මම විශ්වාස කරනවා. ඒක හොඳයි. මේ ජාතික විගණන පනත ගෙනෙන්නේ නැහැය කිව්වා; ඒක ගේන්න ප්‍රමාද කරනවාය කිව්වා; එම පනත ගේන්න අපට හයියක් නැහැය කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම කථා කළ හොරු රැළේ කිසිම කෙනෙක් අද මේ උත්තරීතර සභාව තුළ නැහැ, "මේක හොඳයි, මේ වැඩ පිළිවෙළ සාර්ථකයි" කියන්න.

ඔවුන් දැන් වෙවුලනවා ඇති. ආණ්ඩු පක්ෂයේ හෝ වේවා විපක්ෂයේ හෝ වේවා කිසිම දේශපාලන කණ්ඩායමකට මේ රටේ

[ගරු චමින්ද විජේසිරි මහතා]

සිටින අහිංසක ජනතාවත් එක්ක සෙල්ලම් කරන්න බැහැ. මේ තත්ත්වය මේ රටෙන් තුරන් වෙන්න ඕනෑ. අප නියෝජනය කරන්නේ දුක් විඳින ජනතාවක් ජීවත් වන ප්‍රදේශ. අපි ඒ ජනතාවගේ දුක දන්නවා. එහෙම නම්, මේ ජනතාවට ලැබෙන්න යන දේවල්වලින් සුඛෝපභෝගී ජීවිත ගත කරන කණ්ඩායම් නතර කිරීම සඳහා ගන්නා වූ මේ උත්සාහයට -වැයමට- එක පැත්තකින් අපි ගරු කරනවා. හැබැයි, මේ තුළත් යම් රිංගීම් තිබෙනවා නම්, මේ හදන පනත් තුළත් යම් අඩු පාඩු තිබෙනවා නම්, ඒවාත් මග හරවා ගත හැකි වැඩ පිළිවෙළක් අපි යෝජනා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමහර කණ්ඩායම් කියන්න උත්සාහ කරනවා, මේ රටට ගැළපෙන්නේ, එහෙම නැත්නම් අවශ්‍ය කරන්නේ එක්තරා වූ පාලනයක්ය -හිට්ලර් පාලනයක්- කියන කාරණය. පසුගිය දිනක විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු සභා ගර්භය තුළට බැහැලා සෙංකෝලය පැහැරගන්න උත්සාහ කළ ආකාරය මම දැක්කා. අද මේ ගරු සභාව තුළ සිටින අපේ සහකාර මහලේකම්තුමිය ඉදිරිපිට එදා පරුෂ වචනයෙන් කථා කරලා කථානායකවරයාට ඇඟිල්ල දිගු කරමින් හැසිරුණු කණ්ඩායම්වලට අද යම් කිසි බලයක් තිබුණා නම්, ඔවුන් කොහොම හැසිරෙයිද කියන කාරණය උගත් වූ බුද්ධිමත් වූ මේ නිලධාරි මණ්ඩලයට පමණක් නොවෙයි, මේ රටේ සිටින සාමාන්‍ය පුරවැසියන්ටත් කල්පනා කරන්න කියලා මා ඉල්ලීමක් කරනවා. අපි අද මේ වැඩ පිළිවෙළ සාර්ථකව නිර්මාණය කරලා තිබෙනවා. මේවා ටිකෙන් ටික මේ රටේ ජනතාව ඇඳ ගන්න ඕනෑ. මේ රටේ ජනතාව හැම දාම ළිඳට වැටුණු ගෙම්බා වාගේ ළිඳේ තිබෙන වපසරිය දැකලා, ඒ ප්‍රමාණය පමණයි ලෝකය කියලා හිතනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාට අපි හැම දාම ගරු කරනවා. විශේෂයෙන්ම මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපේ මන්ත්‍රීතුමන්ලා කථා කරපු දේවල් බොහොමයක් තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ කථා කරන බොහෝ දේවල් තුළින් අපට හැඟෙනවා, සමාජය තුළ සිටින සමහර කණ්ඩායම් හිතන්නේ අමුතු විධියට කියලා. අපි ගරු කරන, රටට වග කියන ඇමතිවරයෙකු විධියට එදා සිටි අපේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මේ පනත් කෙටුම්පත සම්මත කරන්න එකඟ වෙයි කියලා අපි විශ්වාස කරනවා. පසුගිය ආණ්ඩු කාලය තුළ දක්නට ලැබුණු, සමහර විට මේ ආණ්ඩු කාලය තුළත් දක්නට ලැබෙන අහිංසක ජනතාවගේ මුදල් හොරා කන වැඩ පිළිවෙළ අපි නැති කරන්න ඕනෑ. එම නිසා ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පතේ අඩු පාඩු පෙන්වන්න, එතකොට ඒවා අපි හදා ගන්නම්. මේ රටේ ජනතාවට කථා කරන මන්ත්‍රීවරයෙකු විධියට ඔබතුමා මේ පනත් කෙටුම්පත හොඳයි කියන්න, මේකට එකඟ වෙලා මේක අනුමත කරන්න. ඒ සඳහා තමුන්නාන්සේගේ අත ඉහළට එසවෙයි කියන බලාපොරොත්තුවෙන්, මා හට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬවනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

[අ.භා. 4.58]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි. විශේෂයෙන්ම අද ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා විගණකාධිපතිවරයාට දැනට තිබෙනවාට වඩා ශක්තිමත් බලතල ලබා දීලා අපි කාලයක් තිස්සේ කථා කරපු විධියට මේ රටෙන් දූෂණය, වංචාව තුරන් කරන්න අපි බලාපොරොත්තු වනවා. 2015දී අපි ලබා දුන් පොරොන්දුවක් ඉෂ්ට කිරීම සඳහා අද අපි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි 2015දී යහ පාලන ආණ්ඩුව ගෙනෙනකොට අපට තිබුණු ලොකු අභියෝගයක්, ඒ වාගේම අපි කථා කරපු දෙයක් තමයි, ජාතික විගණන පනත මඟින් විගණකාධිපතිවරයාට අවශ්‍ය බලතල ලබා දීම. ඒ සඳහා අලුත් පනතක් ගෙනැල්ලා අලුත් අදහස් හා යෝජනා ඉදිරිපත් කරලා මේ රටේ තිබෙන වංචා, දූෂණ අවම කර ගන්නේ කොහොමද කියන ගැටලුව අප ඉදිරිපිට තිබුණා. 2003 වසරේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබුණු කාලයේ තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න ඕනෑය කියලා පළමු වතාවට යෝජනාව ගෙනාවේ. ඒ අනුව මේ කටයුත්ත 2003දී පටන් ගත් එකක්. නමුත්, ඊට පස්සේ බලයට පැමිණි ආණ්ඩු, එහෙම නැත්නම් 2005 වසරේ සිට 2015 වසර වන තෙක් මේ රටේ බලයේ සිටි මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුවට එය කරන්න වුවමනාවක් තිබුණේ නැති බව අපි දැක්කා. ඊ ළඟට, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගත්තත්, ඒ ආයතන ස්වාධීන කරලා; ඒ ආයතනවලට අවශ්‍ය බලතල දීලා; ඒ ආයතන ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවක් පසුගිය කාලයේ පැවැති ආණ්ඩුවට තිබුණේ නැහැ. අපි 2015 වසරේ බලයට පැමිණියාට පස්සේ මේ රටේ පැවැති දූෂණය හා වංචාව අවම කර ගන්න අවශ්‍ය යම් යම් දේශපාලන තීන්දු ගන්න අපට පුළුවන් වුණා. ඒ තුළින් අපට මේ රටේ සිදු වූ වංචා හා දූෂණ අවම කර ගන්න පුළුවන් වුණා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, මෙතුමාගේ කතාවෙන් පසුව මම ඔබතුමාට වේලාවක් දෙන්නම්. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කතාව කරගෙන යන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව ශක්තිමත් කරලා ස්වාධීනව වැඩ කරන්න පුළුවන් ආයතනයක් බවට එය පත් කළා. ඒ වාගේම, අපි ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් පත් කළා; FCID එක ආදි ආයතන ඇති කළා. වංචා දූෂණ, මූල්‍යමය අවභාවිත කිරීම්, මූල්‍යමය වංචා කටයුතු පරීක්ෂා කරන්න ඒ ආකාරයට අලුත් ආයතනයක් පිහිටුවන්න අපට පුළුවන් වුණා. පසු ගිය කාලයත් එක්ක සසඳා බලනකොට, 2015 වර්ෂයෙන් පසුව රජයක් හැටියට අපට පුළුවන් වෙලා තිබෙනවා මේ රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්න, වංචා දූෂණ අවම කරන්න, යම් යම් දේවල් කරලා, යම් යම් අලුත් නීති රීති ගෙනැල්ලා, අලුත් ආයතන හදලා වංචා දූෂණවලට වැට බඳින්න පුළුවන් ආකාරයේ පරිසරයක් නිර්මාණය කරන්න. පසු ගිය දශක කීපය දෙස බැලුවාම අපි හිතනවා ඒ දශක කීපය තුළ අපට කරන්න බැරි වූ දේවල් 2015 වර්ෂයෙන් පසුව -මේ අවුරුදු දෙකහමාර, තුනහමාර වාගේ කෙටි කාලය තුළදී- කරන්න, මේ රට තුළ දේශපාලන වශයෙන් පරිවර්තනයක් ඇති කරන්න අපට හැකියාව ලැබුණා කියා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අප සියලුදෙනා ඒ ගැන සන්තෝෂ වන්න ඕනෑ. අප අවුරුදු 70ක නිදහස සමරනකොට, ඒ

අවුරුදු 70 ඉතිහාසය තුළ කරන්න බැරි වූ දේවල් මේ පාර්ලිමේන්තුව තුළ ප්‍රජාතන්ත්‍රවාදීව කරන්න මේ ඉතා කෙටි කාලය තුළදී -අවුරුදු තුනක් වාගේ කෙටි කාලය තුළදී- අපට පුළුවන් වුණා. විශේෂයෙන්ම කියන්න ඕනෑ, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ගැන. වත්මන් ගරු කථානායකතුමා විපක්ෂයේ සිටි කාලයේ ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනකොට එදා හිටපු ජනාධිපතිතුමා කිව්වේ මොකක්ද කියා අපි දන්නවා. එතුමා කිව්වා, "තොරතුරු දැනගන්න පනතක් ඕනෑ නැහැ. ඕනෑ තොරතුරක් මගෙන් අහන්න. මා කියන්නම්." කියා. ප්‍රජාතන්ත්‍රවාදීව මේ රටේ තොරතුරු දැනගැනීමේ අයිතිය වෙනුවෙන් පනත් කෙටුම්පත් ගෙනෙනකොට එදා පැවැති ආණ්ඩුව සැලකුවේ, ඒ ගැන කතා කළේ එහෙම තමයි. නමුත් අද අපට පුළුවන් වුණා අපේ රජයක් යටතේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පත ගෙනැල්ලා එය සම්මත කරන්න. අද මේ රටේ ජනතාවට ඒ හරහා තමන්ට ඕනෑ දෙයක් දැන ගන්න පුළුවන්. අපි අද ඒ අයිතිය ලබා දී තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් අපට කරන්න පුළුවන් ඒ වාගේ හුඟක් දේවල් අපි කළා. ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ රාශියක් මේ අවුරුදු දෙකහමාර, තුන තුළදී කරන්න අපට පුළුවන් වුණා. ඒ වාගේ ජයග්‍රහණවලින් තවත් එකක් ලෙස තමයි අප ජාතික විගණන පනත් කෙටුම්පත ගෙනැවිත් තිබෙන්නේ. ඒ ජයග්‍රහණත් එක්ක තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වන්නේ. කාලයක් තිස්සේ අපට විශාල චෝදනාවක් තිබුණා, අප මෙය පමා කරනවා කියා; අප මෙය පරක්කු කරනවා කියා. පසු ගිය කාලය තුළ අපි දැක්කා, රජය ඕනෑකමින්ම මෙය ගෙනෙන්නේ නැහැ කියන කාරණය කෙරේ මාධ්‍ය තුළ විශාල අවධානයක් යොමු කරනවා. එය විශාල වශයෙන් මාධ්‍ය තුළ සාකච්ඡාවට බඳුන් වූ කරුණක් වනවා අපි දැක්කා. නමුත් අපි දන්නවා මෙය ප්‍රමාද වීමට බලපෑ යම් යම් කරුණු කාරණා තිබෙන බව. මෙය ප්‍රමාද වෙන්න හේතු මොනවාද? යම් යම් යෝජනා, අලුත් අදහස් මෙයට අවශ්‍ය වුණා. මොකද, රජයක් හැටියට සහ මන්ත්‍රීවරුන් හැටියට අප බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා. අප පනත් කෙටුම්පතක් ගෙනෙනවා නම් ඒ පනත් කෙටුම්පත ප්‍රජාතන්ත්‍රවාදී වෙන්න ඕනෑ, ඒ පනත තුළ ලබා දෙන බලතල ක්‍රියාත්මක කරන්න පුළුවන් වන්න ඕනෑ, නමුත් ඒ හරහා ගිහින් මේ රට තුළ නිලධාරිවාදයක්, මේ රට තුළ නිලධාරීන්ගේ ආධිපත්‍යයක් හදන්න ඉඩ දෙන්න බැහැ කියන කාරණය නිසා පසු ගිය කාලයේ අප අතර යම් යම් අදහස් පළවනවා, ලොකු ගැටුමක් ඇති වනවා මම දැක්කා. එක් පැත්තකින් රජයේ නිලධාරීන් මෙය තවත් ශක්තිමත් කරන්න, මෙහි නීතිමය තත්ත්වය තවත් වැඩි කරගන්න, තමන්ගේ අතට නීතිය ගන්න යම් යම් උත්සාහයන්, යම් යම් යෝජනා ගෙනෙනකොට ඇමතිවරු, මන්ත්‍රීවරු එදා එයට විරුද්ධව යම් යම් අදහස් ඉදිරිපත් කරනවා අපි දැක්කා. මා හිතන්නේ හැම තිස්සේම මෙහි සමතුලිතභාවයක් අනිවාර්යයෙන්ම අවශ්‍ය වනවා කියායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ආයතන හැදුවාට ඒ ආයතන නීතිය පැත්තෙන් ක්‍රියාත්මක වන්නේ නැත්නම් වැඩක් නැහැ. නීතිය ක්‍රියාත්මක කරන්න බැරි ආයතන හැදුවාට, ඒ සඳහා අණ පනත් පාර්ලිමේන්තුව තුළ සම්මත කළාට වැඩක් නැහැ. ඒ ආයතනවල වැඩ කරන නිලධාරීන්ට නීතිය ක්‍රියාත්මක කිරීමේදී යම්කිසි නෛතික බලයක් ලැබෙන්නේ නැත්නම් ඒ ආයතනත් ඔවුන්ට ප්‍රයෝජනවත් වන්නේ නැහැ.

පාර්ලිමේන්තුව තුළ තිබෙන රාජ්‍ය ගිණුම් කාරක සභාව ගැන අපි දන්නවා. රාජ්‍ය ගිණුම් කාරක සභාව තුළින් හැම රාජ්‍ය ආයතනයක්ම විමර්ශනයට ලක් කරනවා. රජයේ ආයතනවල ඉන්න නිලධාරීන් ඒ රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවට ගෙනැල්ලා ප්‍රශ්න කරනවා. අවසානයේ රාජ්‍ය ගිණුම් කාරක සභාවට කරන්න දෙයක් නැහැ. ඒ නිසා අපට ඒක හඳුන්වන්න පුළුවන්, "දත් නැති කටක් වාගේ" කියලා. හැපුවාට හැපෙන්නේ නැහැ. මොකද, ඒකෙන් ඊට එහා නීතිමය ක්‍රියා මාර්ගවලට යන්න බැහැ; නිර්දේශ දෙන්න පුළුවන්. නමුත් ඒ නිර්දේශවලට එහා නෛතික පැත්තෙන් ඉස්සරහට යන්න පුළුවන් යම් නීතිමය තත්ත්වයක් තිබෙන කාරක සභාවක් හැටියට ආයතනයක් හැටියට ඒක ඉස්සරහට යන්නේ නැහැ. යම් තැනක හිරවීමක් තමයි අපට ඒ තුළ දකින්න ලැබෙන්නේ. මේ වාගේ ආයතන තිබුණාට, පසුගිය කාලයේ නිලධාරීන් හා දේශපාලනඥයන් අතර සාකච්ඡා, යම් වාද විවාද ඇති වුණේ මේ තත්ත්වය මත තමයි කියලා අපට හිතාගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඒ තිබුණු තත්ත්වයට එහා යන තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. ළඟදී දවසක විගණකාධිපතිතුමාගේ ප්‍රකාශයක් අපි දැක්කා. හම්බන්තොට වරාය පිළිබඳව මාධ්‍යවේදීන් එතුමාගෙන් ප්‍රශ්න කළාම එතුමා කිව්වා, "හම්බන්තොට වරාය ව්‍යාපෘතිය විගණනය කරන්න එතුමාට බලයක් නැහැ, නමුත් පාර්ලිමේන්තුව එතුමාට බලය පවරනවා නම් ඒක කරන්න කැමැතියි" කියලා. අපට දැන ගන්න ලැබී තිබෙනවා, දැනට විගණකාධිපතිවරයාට විගණනය කරන්න බැරි ව්‍යාපෘති රාශියක් මේ රට තුළ ක්‍රියාත්මක වන බව. අපේ ආණ්ඩුව තුළ වෙන්න පුළුවන්, පසුගිය ආණ්ඩුව ගෙනා ඒවා වෙන්න පුළුවන්, එවැනි ව්‍යාපෘති රාශියක් අද වන විටත් ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම අපි විදේශීය ණය මත ව්‍යාපෘති පටන් ගන්නකොට "මේක රජයේ විගණකාධිපතිවරයා යටතේ විගණනය කළ යුතුය" කියන කොන්දේසිය අපි ඒ ගිවිසුම්වලට ඇතුළත් කරන්නේ නැහැ. එසේ ඇතුළත් නොකිරීම තුළම අද රජයේ විගණනයට ඒවා යටත් වන්නේ නැහැ. එහෙම නම් එවැනි ව්‍යාපෘති ආරම්භ කරන කොට මේ පටන් ගන්නා වූ ව්‍යාපෘතිත් අනිවාර්යයෙන්ම රජයේ විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් කළ යුතුය කියලා යම් ප්‍රතිපත්තිමය තීන්දුවක් රජයක් හැටියට අපි ගත යුතුයි. මොකද, අද අපට තේරිලා තිබෙනවා, විදේශීය ණය මත පටන් ගන්නා ව්‍යාපෘති පිළිබඳව. හොඳම උදාහරණයක් තමයි හම්බන්තොට වරාය ව්‍යාපෘතිය. අපි ඒකට විශාල ධනස්කන්ධයක් යොදා තිබෙනවා. ඒවා විගණනය නොවීම මත අද නොයෙකුත් දේවල් එළියට එන්න පටන් ගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රජයක් හැටියට ණය අරගෙන පටන් ගන්නා ව්‍යාපෘති වෙන්න පුළුවන්, එහෙම නැත්නම් සමාගම් පනත යටතේ ලියාපදිංචිවෙලා පටන් ගන්නා පෞද්ගලික ව්‍යාපාර වෙන්න පුළුවන්, ආයතන වෙන්න පුළුවන්, ඒ ආයතන පවා අනිවාර්යයෙන්ම විගණකාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ විගණනයට යටත් කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට මෙසේ කියන්න කැමැතියි. අද ඓතිහාසික දිනයක්. අපි යහ පාලන ආණ්ඩුව හැටියට පසුගිය අවුරුදු තුන තුළ යම් යම් ප්‍රතිසංස්කරණ ගෙනැල්ලා මේ රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න පුළුවන් වුණා. අද සිට අපි අලුත් අවධියකට නැවත පියමං කරනවා. මේ පනත් කෙටුම්පත තුළ යම් අඩුපාඩු තියෙන්න පුළුවන්. මෙම පනත් කෙටුම්පතේ අඩුපාඩු තිබෙනවා නම් ඒවා සකස් කරලා, ඉදිරියේදී එය තවත් ශක්තිමත් කරලා, ජනතාවගේ මුදල්, ජනතාවගේ ධනය, ජනතාවගේ සම්පත් ආරක්ෂා කිරීම වෙනුවෙන් අවශ්‍ය තීන්දු තීරණ ගත යුතුය කියමින් මට කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 5.09]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ මම කථා කරන්න බලාපොරොත්තුව හිටියේ නැහැ. නමුත් ආශු බෝධි

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

මාරසිංහ - ආශු මෝඩ මාරසිංහද, මෝඩු මාරසිංහද දන්නේ නැහැ,- මන්ත්‍රීතුමා මගේ දේපොළ ලැයිස්තුවක් පිළිබඳව ඊයේ ප්‍රකාශ කර තිබුණා. ඒ නිසා මම ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කළේ නැත්නම් හොඳ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට කලින් මම මේක කියන්න ඕනෑ. පසුගිය කාලය පුරා වෘත්තීය සමිති විසින් විශාල කැප කිරීමක් කරලා ඇඩි උත්සාහයක යෙදිලා කළ සටනක ප්‍රතිඵලයක් තමයි මේ ජාතික විගණන පනත් කෙටුම්පත. මොනවා වුණත් මේ වැඩ පිළිවෙළ පිළිබඳව රජයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් වෙන්න ඕනෑ. විගණකාධිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් නොවීම නිසා තමයි මේ රටේ දූෂණ කටයුතු බොහොමයක් සිද්ධ වන්නේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති බලාපොරොත්තු වුණු දේ ඉෂ්ට නොවුණත්, මේ තාක්දුරට හෝ මෙය අරගෙන ඒම පිළිබඳව අපි රජයට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් ආශු මාරසිංහ මන්ත්‍රීතුමා, මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ දේපොළ ලැයිස්තුවක් කියාගෙන ගියා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට අපි වත්කම් බැරකම් ප්‍රකාශයක් ලබා දෙන බව මම මුලින්ම කියන්නට ඕනෑ. 2002 ඉඳලා නියෝජ්‍ය ඇමතිවරයෙක්, ඇමතිවරයෙක් හැටියට මගේ වත්කම් බැරකම් ප්‍රකාශ මම මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. මේ වත්කම් බැරකම් ප්‍රකාශ සියල්ලේම මට අයිති දේපොළ සියල්ල පිළිබඳව මම සඳහන් කර තිබෙනවා. ඒ වාගේම මම 2000 අවුරුද්දේ ඉඳලා ආදායම් බදු ගෙවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ පාර්ලිමේන්තු වැටුපට වැඩි මුදලක් ආදායම් බදු විධියට අවුරුද්දකට ගෙවනවා. මම මේ ආණ්ඩුවට ආදායම් බදු ගෙවනවා. මම ව්‍යාපාරිකයෙක්. මම ඉඩම් හිමි දේපොළ හිමි අයෙක්. මම කැමැති නැහැ, පාර්ලිමේන්තුවේදී මගේ දේපොළ ගැන කියන්න. නමුත්, මේ ගැන කිව්ව නිසායි මම මේ දේවල් කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වත්කම් බැරකම් ප්‍රකාශවල සඳහන් කර තිබෙන සියල්ල උපයාගත් ආකාරය පිළිබඳ ආදායම් බදු දෙපාර්තමේන්තුවට විස්තර ලබා දී තිබෙනවා. ඒ අනුව ආදායම් බදු ගෙවලා තිබෙනවා. ඒක හංගන්න දෙයක් නොවෙයි.

පසුගිය සතියේ අනුර දිසානායක ජනතා විමුක්ති පෙරමුණේ නායකතුමාත් මට කිව්වා, "ඔබතුමාගේ වත්කම් බැරකම් ප්‍රකාශය මම ළඟ තිබෙනවා. ඒකේ ඔබතුමාගේ සියලු වත්කම් ටික මම කියෙව්වා" කියලා. ඒක ප්‍රසිද්ධ දෙයක්. ඒ නිසා එතුමා සඳහන් කළ කරුණු දෙක, තුනක් හැර අනෙක් සියල්ල මා සතුව තිබෙන වත්කම්. ඒ පිළිබඳව කිසිම ප්‍රශ්නයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මගේ දෙමව්පියන්ට තිබුණු දේපොළ ගැන මම කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, මගේ අම්මාගේ තාත්තා "කොත්මලේ මානිස් මුදලාලි" ගැන. ඔබතුමා දන්නවා, මානිස් මුදලාලිට තිබුණු දේපොළ මොනවාද කියලා. ඔබතුමා දන්නවා, මානිස් මුදලාලි තමයි ඒ කාලයේ ලක්ෂෙට කොඩි දැම්මේ කියලා. එතුමාට කොත්මලේ විතරක් අක්කර 150ක් තිබෙනවා. මගේ අම්මාගේ තාත්තාට අක්කර 150ක් ඉඩම් තිබෙනවා. රත්නපුරේ අක්කර 100ක් තිබුණා. ඒ අනුව මගේ සීයාට විතරක් ඉඩම් අක්කර 250ක් තිබෙනවා.

මගේ පියා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වෙන්න කලින් තේ කර්මාන්තශාලා දෙකක් එතුමාට තිබුණා. එතුමාට තේ තිබුණා; පොල් තිබුණා; කුඹුරු තිබුණා; අක්කර සිය ගණන් තිබුණා. 2015 වර්ෂයේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේදී මේ සියල්ලේ ඔප්පු මම පෙන්නුවා. අක්කර තුන්සිය ගණනක දේපොළ අපේ පවුලේ මගේ පියාට, මටට තිබුණාය කියන කාරණය මම පෙන්නුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 20න් මම රැකියාවට ආවේ. දැන් මගේ වයස අවුරුදු 52යි. ව්‍යාපාරිකයෙක් හැටියට අවුරුදු 32ක් මම ඉපැයූ දේපොළ තිබෙනවා. ඒ දේපොළ සියල්ල ගැන ආදායම් බදු දෙපාර්තමේන්තුවට මම දැනුම් දී තිබෙනවා. මම එක දෙයක්වත් හොරෙන් හම්බ කරලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මේ සියලු දේපොළ පිළිබඳ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට, FCID එකට, CID එකට දැනුම් දුන් පසුව එහි සියලුදෙනා ඒවා පරීක්ෂා කළා. එහෙම පරීක්ෂා කරලා අන්තිමට මට රුපියල් ලක්ෂ 14කට නඩුවක් දැම්මා. මහාධිකරණයේ මොකක් සම්බන්ධයෙන්ද නඩුව තිබෙන්නේ? රුපියල් ලක්ෂ 14යි! මහින්දානන්ද අලුත්ගමගේ අයථා විධියට හම්බ කළා නම්, මහින්දානන්ද අලුත්ගමගේ හොරකම් කළා නම්, මහින්දානන්ද අලුත්ගමගේට අයත් දේවල් නම්, ඇයි මාව හිරේ දමන්නේ නැත්තේ? දැන් මේ ආණ්ඩුව විශේෂ අධිකරණයක් පිහිටුවලා මාව හිරේ දමන්න යන්නේ මොකටද? කැරම් බෝඩ් නඩුවට. ඇයි, මගේ වත්කම්, දේපොළවලට හිරේ දමන්නේ නැත්තේ?

නොරොච්චෝලේ කොමිස් මුදල් කියලා මොකක්ද එකක් කියනවා මම අහගෙන හිටියා. අන්තිම මොහොතේ මට අහගන්න බැරිවුණා මොකක්ද කියලා. මේ ආණ්ඩුව මේවා හොයන්නේ නැත්තේ ඇයි කියලායි මම අහන්නේ. මේ ආණ්ඩුව නපුංසක ආණ්ඩුවක්ද?

ඒ නිසා ආශු මාරසිංහ මහත්තයාට මම මේ කාරණය කියනවා. ඊයේ මේ සභාවේ මම කථා කරන වෙලාවේ මම එතුමාගේ නම සඳහන් කළේත් නැතිව මගේ කථාවට එතුමා බාධා කළාම අපි දෙන්නා අතර පොඩි argument එකක් ගියා. ඒ වෙලාවේ එතුමා කිව්වා, "මම ගහනවා" කියලා. එතුමා ගැහුවා. හැබැයි, මහත්තයෝ මතක තියා ගන්න! මීනුවන්ගොඩ ඉන්න ඔබතුමාගේ අහිංසක අම්මාට අද කන්න නැහැ. තමන්ගේ මවට කන්න නැහැ; තමන්ගේ අම්මාට කන්න නැහැ. තාත්තාට කන්න දෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, ජපානයේ වාහන එකලස් කරලා, ගලවලා විකුණලා, ජපානයේ නඩුවක් තිබෙනවා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණක් පැහැදිලි කරන්න මට අවසර දෙන්න.

මෙය වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ දයාබර මැණියන් මේ වෙලාවේ බොහොම ගෞරවයෙන් මම සිහිපත් කරනවා. මේ අවුරුද්දේ ජනවාරි මාසයේ මගේ මැණියන් නැසී ගියා. එවැනි මැණි කෙනෙක් වෙනුවෙන් මෙතුමා මෙවැනි ප්‍රචාරයන් කරන එක ගැන මම කනගාටු වනවා. මගේ මැණියන්ට මම ඉතා හොඳින් සැලකුවා. ඒක හැමෝම දන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මැණියෝ දැන් නැහැ. මෙන්න මේ බොරුව තමයි මේ ගොල්ලෝ හැමදාම කරන්නේ. ජනතාව දැනගන්න ඕනෑ මේ අසත්‍ය. මට ජපානයේ නඩු තිබෙනවා නම් කියන්න. [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාට කථාවක් දෙන්න බැහැ නේ.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මට ජපානයේ නඩු තිබෙනවා නම් මම ඉදිරිපත් වෙන්න ලැහැස්තියි. මේ කියන්නේ පට්ටපල් අසත්‍යය.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාගේ මව මිය ගියා. ඒ බව මා දන්නවා. හැබැයි, ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමාගෙන් අහන්න, ලිපිනයත් දෙන්නම්. මම වැරදි නම්, ඔබතුමා සැලකුවා නම්, ඒවායේ ප්‍රතිඵල ඔබතුමාට ලැබෙයි. හැබැයි ජපානයේ වාහන කෑලිවලට කඩලා විකුණලා, මෙහාට එව්වා කියලා නඩු තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මේක මඩ ගහන විවාදයකට පත්කර ගන්න එපා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හරි, ඉවරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අද ඉතා වැදගත් දිනයක්. ඒ නිසා විෂයයට අදාළව කථා කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ වැදගත් දිනය විනාශ කළේ කවුද? [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. විමල් වීරවංශ හිටපු ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ හිටපු සභාපතිවරයා කවුද? සමාවෙන්න, ඒ ආයතනයේ හිටපු සභාපතිවරයා සෑම කොන්ත්‍රාත්කාරයෙකුගෙන්ම සියයට තුන ගණනේ කොමිස් ගත්තා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
පුළුවන් නම් ඔය කියන ඒවා එළියේදී කියන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මාධ්‍ය හමුවක් තියලා, දිවුරුම් ප්‍රකාශත් එක්ක ඒවා ගැන අපි කියන්නම්. [බාධා කිරීමක්] නිකම් අනුන්ට මඩ ගහන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාද වන විෂයයට අදාළව කථා කරන්න. වැදගත් විවාදයක් අද දින පවත්වන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් ජපානයෙන් කොම්පැනි වගයක් ගෙන්වලා බිස්නස් කරන්න හදනවා. ජපන්නු ගෙන්වලා, දැන් ඒ කොම්පැනිවලට වෙනම frequencies දෙන්න හදනවා. දැන් ඒවා ගෙනෙන්න කථා කරන්න හදනවා. දැන් ඒ බිස්නස් සියල්ල කරගෙන යනවා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කියන ඒවා නිවැරදි කරන්න අවස්ථාව ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපි හෙට අනිද්දා වන විට-

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
නැහැ. මේ කියන චෝදනා සියල්ල වැරදියි. මට ඒ බව ඔප්පු කරන්න පුළුවන්, මෙතුමා මේවා පාර්ලිමේන්තුවෙන් පිටතදී කියනවා නම්. [බාධා කිරීමක්] එළියේදී කියන්න. මේ අභියෝගය එළියේදී කරන්න, වරප්‍රසාදවලට යට වෙලා, හැංගිලා කියන්නේ නැතුව. මට නඩු තිබෙනවා නම්, මම සියයට තුනක් කොමිස් ගත්තා නම්, ඒවා ගැන එළියේදී කියන්න. මම ඔප්පු කරන්න ලැහැස්තියි. මේ සභාව ඇතුළේදී කියන්නේ නැතුව එළියේදී කියන්න. මම ඒ දේවල් සියල්ල එළියේදී කියන්න ලැහැස්තියි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඇයි, ඔච්චර කලබල වෙන්නේ? මම කලබල වුණේ නැහැ නේ. [බාධා කිරීමක්] මේ පිළිබඳව මාධ්‍ය හමුවක් තියලා, සියයට තුනක් කොමිස් ගත්ත කොන්ත්‍රාත්කරුවන්ගේ දිවුරුම් ප්‍රකාශත් එක්ක මාධ්‍ය හමුවේදී අපි ඔබතුමාට ඉදිරිපත් කරන්නම්.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
එළියට එන්න. එළියට එන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කරුණාකරලා බොරුවට මඩ ගහන්න හදන්න එපා. [බාධා කිරීමක්] කරපු වැරදි ගැන තමුන්නාන්සේ ඕනෑ දෙයක් කියන්න. තමුන්නාන්සේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා දැන් මේ වනකොට ජපන් කොම්පැනි කීයක් ගෙන්වලා ඇමතිවරු එක්ක සාකච්ඡා කළාද? තමුන්නාන්සේ කොන්ත්‍රාත් කීයක් ගෙනාවාද? ඒ නිසා අනුන්ට මඩ ගහන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ හිටපු ඇමතිතුමනි, කරුණාකරලා විෂයයට අදාළව කථා කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
සමාවෙන්න. මම කනගාටු වෙනවා, මේ වෙලාවේ මේ පිළිබඳව කථා කරන්නට වීම පිළිබඳව. ගරු මන්ත්‍රීතුමනි, හැබැයි ඔබතුමන්ලා අවුරුදු හතරක් තිස්සේ මහින්දානන්ද අලුත්ගමගේගේ සියලු දේපළ පිළිබඳව ආයතන තුනකින් පරීක්ෂා කළා. ඒක හොඳට මතක තියා ගන්න. ආයතන තුනකින් පරීක්ෂා කළා. අන්තිමට නඩු දමන්න පුළුවන් වුණේ, රුපියල් ලක්ෂ දහහතරකටයි. තමුන්නාන්සේලා අධිකරණ හදනවා. හැබැයි හොඳට මතක තියා ගන්න, ඒ අධිකරණ හැදෙන්නේත් තමුන්නාන්සේලාටමයි බව. ඒක හොඳට මතක තියා ගන්න. ලබන අවුරුද්දෙන් පස්සේ මේ අධිකරණ හැදෙන්නේ තමුන්නාන්සේලාටමයි. [බාධා කිරීමක්] ඒ නිසා නිකම් බොරුවට මිනිසුන්ට පෞද්ගලිකව මඩ ගහන්න එපා. [බාධා කිරීමක්] පෞද්ගලිකව මඩ ගහන්න එපා. අයථා ලෙස හම්බ කරපු ඕනෑ දෙයක් ගැන ඔබතුමා කියන්න. හැබැයි ටයි එකක් දමාගෙන ගෞරවනීය විධියට ඉන්නවා වාගේම ඔක්කෝටම කලින් තමන්ගේ අම්මාට, තාත්තාට සලකන්න. මැරුණු අම්මාට අපහාස කරන්න එපා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඒ කියපු ඒවාට උත්තර දෙන්න අවස්ථාවක් දෙන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම නම් මටත් අවස්ථාවක් දෙන්න. ආයෙත් මටත් අවස්ථාව දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මඩ ප්‍රචාර එල්ල කරනකොට, අභූත චෝදනා එල්ල කරනකොට මේ ගොල්ලන්ට කියන්න තිබෙන්නේ, පුළුවන් නම් එළියට ඇවිල්ලා මේ දේවල් කියන්න කියලායි. මම එළියේදී උත්තර දෙන්න ලෑහැස්තියි. එළියට එන්න. පාර්ලිමේන්තු වරප්‍රසාදවලට යට වෙලා බොරු කියන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

ඊළඟට, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මැතිතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.18]

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ සම්මත කෙරෙන අණ පනත්වලින් ඉතාම සුවිශේෂී, වැදගත්, මුළු රටම ඉල්ලපු මෙබඳු පනත් කෙටුම්පතක් පිළිබඳ විවාද වන අද දවසේ ඔබතුමා වැනි දක්ෂ, තරුණ මන්ත්‍රීවරයෙක් මූලාසනයේ සිටින අවස්ථාවේ අදහස් දක්වන්න ලැබීම ගැන මා අතිශයින්ම සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විගණන පනතක අවශ්‍යතාව ගැන බොහෝ කාලයක සිට මේ රටේ කථා බහට ලක් වුණු බව අපට මතකයි. පසුගිය කාලයේ මේ රටේ හුඟක් මාධ්‍ය ප්‍රශ්න කළා, විවිධ සිවිල් සංවිධාන ප්‍රශ්න කළා, බොහෝ දෙනෙකුගේ විමසුමට ලක් වුණා, ජාතික විගණන පනත ප්‍රමාද වෙන්නේ ඇයි කියලා. ජාතික විගණන පනත පාර්ලිමේන්තුවට ගෙනැත් සම්මත කරන බවට අපේ වත්මන් රජය පසුගිය මහ මැතිවරණයේදී ජනතාවට පොරොන්දුවක් දුන්නා. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2001 වසරේදී එක්සත් ජාතික පක්ෂය බලයට පත් වුණාම ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න අපි සූදානම් වුණා. ඊට පසුව විවිධ අංශවලින්, විවිධ අවස්ථාවලදී කවර ඉල්ලීම් ආවත් විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න පසුගිය පාලකයන්ට පුළුවන්කමක් තිබුණේ නැහැ; එහෙම හැකියාවක් තිබුණේ නැහැ. ඒ නිසා ප්‍රථම වරට පාර්ලිමේන්තුවට තේරී පත් වුණු මන්ත්‍රීවරු හැටියට අද අපි අතිශය සතුටට පත් වෙනවා, ජාතික වැදගත්කමකින් යුත් මෙවැනි පනත් කෙටුම්පතකට අපේ සහයෝගය ලබා දෙන්න හැකි වීම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සමහර මන්ත්‍රීවරු මේ ගරු සභාව කොයි තරම් පහත් තැනකට ඇද දමන්න ක්‍රියා කරනවාද කියලා බලන්න. උත්තරීතර පාර්ලිමේන්තුවේ වටිනා කාලය ප්‍රයෝජනයට අරගෙන කරන කථා ඒ උත්තරීතරත්වයට ගැළපෙනවාද කියන ප්‍රශ්නය මට තිබෙනවා. ඒකට හොඳම නිදසුන තමයි මීට කලින් කථා කරපු අපේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ කථාව. එතුමා වාගේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්, මේ පාර්ලිමේන්තුව දීර්ඝ කාලයක් නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් තමන්ට යම් කිසි චෝදනාවක් එල්ල වන විට එය වසා ගැනීමට, එයින් ගැලවීමට එක් එක් මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලිකත්වයට ඇඟිල්ල දිගු කිරීම ගැන මම කනගාටු වෙනවා. දෙමවුපියන්ට සැලකීම, වැඩිහිටියන්ට ගරු කිරීම, හාමුදුරුවරුන්ට ගරු කිරීම ඒ ඒ මන්ත්‍රීවරයාගේ චර්යාධර්ම අනුව එතුමාට අයිති දෙයක්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම සඳහන් කරපු නිසායි මම පැහැදිලි කිරීමක් කරන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මට පෞද්ගලිකව මඩ ගහන්න අවශ්‍යතාවක් නැහැ. නමුත් එතුමා මට නැති දේපළ සම්බන්ධ ලේඛනයක් මේ සභාවට ඉදිරිපත් කළා. මට එය නිවැරදි කිරීමේ අයිතිය තිබෙන අතර, එහෙම කියපු මන්ත්‍රීතුමා පිළිබඳව -මම කවදාවත් එහෙම කියලා නැහැ. ඒක වැරදියි කියලා මම පිළිගන්නවා. නමුත් මට බොරු හදලා කියපු නිසා- මට මේ පාර්ලිමේන්තුවේ ඇත්ත කියන්න සිද්ධ වුණා.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
තමන්ට යම් කිසි චෝදනාවක් එල්ල වූ විට ඒ චෝදනාවට පිළිතුරු දෙනවා විනා, එහි සත්‍ය අසත්‍යතාව ප්‍රකාශ කරනවා විනා මඩ ගැසීම නොකළ යුතුයි. මඩ කුට්ටිය අනනකොට තමන්ගේ අතේ තමයි මුලින්ම මඩ ගෑවෙන්නේ කියන එක අපි කවුරුත් මතක තියා ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දීර්ඝ කාලයක් පළාත් සභාව නියෝජනය කර මේ පාර්ලිමේන්තුවට ආපු කෙනෙක්. පාර්ලිමේන්තුවේ තරම් ශක්තිමත්, ප්‍රබල විගණන වැඩ පිළිවෙළක් අදටත් පළාත් සභාවේ නැහැ. අපේ පළාත් සභාවල දැනටත් ගිණුම් කාරක සභාවක් තිබෙනවා. මේ ගිණුම් කාරක සභාවලට විගණන විමසුම් එන්නේ, විගණන විමසුම් පිළිබඳ ගිණුම් කාරක සභාවේ අවධානය යොමු වෙන්නේ අවුරුදු 10ක්, 15ක් නැත්නම් ඊටත් වඩා වැඩි කාලයක් ගත වුණාට පසුවයි. සමහර කාරණා පිළිබඳ සාකච්ඡා කරනකොට එම සිද්ධියට අදාළ දේශපාලනඥයනුත් නැහැ; නිලධාරිනුත් නැහැ; බොහෝ දෙනෙක් මිය ගිහින්; එහෙම නැත්නම් සේවයෙන් විශ්‍රාම ගිහින්. පසුගිය කාලයේ අපේ සමහර රාජ්‍ය ආයතනවලට එවැනි තත්ත්වයකට මුහුණ දීමට සිද්ධ වුණා. ඒ නිසා "විගණනය" කියන එක, මේ රටේ මහජනතාවගේ මුදල්, පොදු දේපළ ආරක්ෂා කර ගැනීමට ශක්තියක් වීම අනිවාර්ය දෙයක් හැටියට අපි සලකනවා. තොරතුරු දැන ගැනීමේ පනත සම්මත කර ගැනීමට හැකි වුණා වාගේම, මේ රජයට කෙටි කාලයක් ඇතුළත මේ වටිනා පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අවකාශය ලැබීම ගැන මම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මේ ප්‍රකාශයත් එක්ක මේ රටේ වැදගත්, තමන්ගේ තනතුරේ වගකීම හරි හැටි දන්න, රටට ආදරය කරන දේශපාලනඥයන්, නිලධාරින් කිසිසේත්ම අමනාප විය යුතු නැහැ. මේ රටේ යම් කිසි විධියක මූල්‍ය විනය පිරිහීමක් දකින්න ලැබුණා නම්, මහජනයාගේ පොදු දේපළ අවභාවිතයට ලක් වුණා නම්, පසුගිය කාලයේ රජයේ මුදල් විනාශ වුණා නම් ඒකට වග කිව යුත්තේ දේශපාලනඥයන් පමණක්ද කියන ප්‍රශ්නය අපට අහන්න සිදු වෙනවා.

අපි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාඩි වී සිටින විට හුඟක් කාරණාවලට ඇතැම් නිලධාරින් වග කිව යුතුයි කියා පැහැදිලිව පෙනෙනවා. හැමදෙනාම නොවෙයි. ඉතාම හොඳින් වැඩ කරන, පිරිසිදු, වග කිව යුතු නිලධාරින් සිටින අතරේ ඇතැම් වෙලාවට නිලධාරින්ගේ පැත්තෙන් සිදු වුණු යම් යම් අඩු පාඩුකම් අපට දකින්න ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපේ රටේ පාඩු ලබන රාජ්‍ය ආයතන තිබෙනවා. මේ රාජ්‍ය ආයතන දිගින් දිගටම පාඩු ලබනවා. කවර රජයක් බලයට පත් වුණත් මේ රාජ්‍ය ආයතන ලාභ ලබන තැනකට ගෙන ඒම ඉතාම අපහසු දෙයක්. හැබැයි, මේවායේ ගැඹුරට ගිහින් සොයා බැලුවොත්, මේවාට නායකත්වය දුන් දේශපාලන අධිකාරිය වාගේම ඊටත් වඩා එහාට ගිහින් ක්‍රියා කරපු සමහර නිලධාරින් වග කිව යුතුයි කියලා අපට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. හැබැයි, ඒ නිලධාරින්ට ඒවා පිළිබඳ චෝදනා එල්ල වෙලා, නඩු පැවරිලා, අධිකාරයකට යටත් වුණා නම් ඉතිහාසයේ සිදුවීම් එක්ක සාපේක්ෂව බැලුවොත් ඉතාම අතලොස්සක් විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ප්‍රමාද වුණේ, මෙය ගෙන ඒමේදී යම්කිසි පසු බෑමකට අපට මුහුණ දෙන්න වුණේ, මේ සම්බන්ධයෙන් යම් යම් විරෝධතා එල්ල වුණ නිසාය කියන එක මට මේ අවස්ථාවේ කියන්න සිද්ධ වනවා. මාධ්‍ය සාකච්ඡාවලට ගියාම අවස්ථා ගණනාවකදී බරපතළ විධියට අපට ඇඟිල්ල දික් කළා, "ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනාවේ නැත්තේ ඇයි, ගෙන එන්න ඇයි ප්‍රමාද?" කියලා. මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන එන්න මේ තාක් කල් ප්‍රමාද වුණේ, දේශපාලන අධිකාරියේ තිබුණ ප්‍රශ්නයකට වඩා ඇතැම් නිලධාරින් මේ සම්බන්ධයෙන් දක්වපු මැළිකම නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය යුගවල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගේ ඉඳලා මේ රටේ ඉහළම දේශපාලන නායකත්වය දරපු සමහර අයට මේ වනකොට බරපතළ චෝදනා එල්ල වෙමින් පවතිනවා. සිල්ලර කථා කියලා ඒ චෝදනාවලින් ගැලවෙන්න පුළුවන් කමක් නැහැ; සරල කථා කියලා ගැලවෙන්න පුළුවන්කමක් නැහැ. සමහර දේශපාලනඥයන් කුට්ටි පිටින් කොමිස් ගත්ත විධිය අද එළියට එනවා. ඒ තොරතුරු එළියට ආවාම කවුරු හෝ කියපු තවත් කථාවක් පාවිච්චි කරලා, මයින හමට තඩිබානවා වාගේ ඒ කථාව ඉස්සරහට දානවා. අද විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමියගේ ඒ ප්‍රකාශය මයින හමක් කරගෙන, ඒ ප්‍රකාශය ප්‍රයෝජනයට ගනිමින් අද තමන්ට එල්ල වෙච්ච චෝදනාවලින් සැඟවෙන්න, ඒවා යටපත් කරන්න හදනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මහ ජනයාගේ විනාශ වෙච්ච ධනය සියයට 60ක් ඉතුරු කර ගන්න අපට පුළුවන්කම ලැබුණා නම්, අපේ ගමේ වචනයෙන් සරලව කිව්වොත් ඒ ගසා කාපු සල්ලි සියයට 60ක් ඉතුරු කර ගන්න අපට පුළුවන්කම ලැබුණා නම්, මේ රටට ණය ගන්න වුවමනා නැහැ. එහෙම නම් මේ තරම් අපහසු තැනකට, අමාරු තැනකට මේ රට වැටෙන්නේ නැහැ; අපේ ජාතිය වැටෙන්නේ නැහැ.

පසුගිය කාලයේ මහා පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කරන බව පෙන්වා පෙන්වා පිට රටවලින් ණය ගත්තා. එම ව්‍යාපෘතිවලට තමන්ගේ නම් දමාගෙන, ඒවා වෙළෙඳ භාණ්ඩ කරගෙන ප්‍රචාරණය සඳහා පාවිච්චි කළා. මේ රටේ ජාතික ධනය පිට රටවලට ඇදිලා යන විධියට මහා පරිමාණයෙන් ඒ ණය ගන්න ගමන් අත යටින් කොමිස් කුට්ටි අරගෙන මේ රටට කරපු විනාශය පිළිබඳව සොයා බලන්න තිබුණා, මෙවැනි පනතක් එදා සම්මත කර තිබුණා නම්.

මට මතකයි අපේ විගණකාධිපතිතුමා පසුගිය කාලයේ කිව්වා, "වරාය සංවර්ධන ව්‍යාපෘතිය විගණනය කරන්නත් අවස්ථාව නැහැ, ඒක විගණනය කරන්න බැහැ" කියලා. නමුත් මගේ අදහස අනුව, මුදල් අවභාවිතය ඇතුළු ඉදිරිපත් වෙලා තිබෙන චෝදනා පිළිබඳව සොයා බලන්න පුළුවන් කුමන හෝ ආයතනයකට - FCID වෙන්න පුළුවන්, CID වෙන්න පුළුවන්- පැමිණිලි කළාම ඒ ගැන ගැඹුරින් සොයා බලා විමර්ශනය කළ හැකියි. මා පළාත්

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

සභා මන්ත්‍රීවරයකු හැටියට හිටපු යුගයේ අපේ දකුණු පළාත් සභාවේ යෝජනාවක් සම්මත වුණා, ටෙන්ඩර් පටිපාටියෙන් පරිබාහිරව රුපියල් ලක්ෂ 20 දක්වා කොන්ත්‍රාත් දෙන්න පුළුවන් කියලා. කලින් ඒ සීමාව තිබුණේ, රුපියල් ලක්ෂ 5යි. රුපියල් කෝටියක් වැනි මුදලක් එක ව්‍යාපෘතියකට වෙන් වුණාම ඒ මුදල කඩනවා කොටස් පහකට. කොටස් පහකට කඩලා, රුපියල් ලක්ෂ 20 බැගින් කොටස් පහක් හදනවා. "ගම නැඟුම", "එක ගමට එක වැඩක්" වාගේ විවිධ පුවරු ගහගෙන ඒ මුදල්වලින් ව්‍යාපෘති කළා. කෝටි ගණනින් මහජන මුදල් වැය කර, ටෙන්ඩර් පටිපාටියෙන් තොරව දුන්න ඒ සමහර ව්‍යාපෘතිවලින් සියයට 99ක් අද වනකොට අසාර්ථකයි. ඒ හදපු සමහර පාරවල්වල යන්න බැහැ. ඒ පාරවල් විනාශ වෙලා ඉවරයි. හැබැයි, මහ ජනයා අදටත් ඒවාට වන්දි ගෙවනවා; පොලියත් එක්ක ණය ගෙවනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට නියමිත කාලය නම් අවසානයි.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මා කියන්න ඕනෑ, පසුගිය කාලයේ මේ විධියට ප්‍රාදේශීය සභා මට්ටමේ ඉඳලා ඉහළ මට්ටමේ දේශපාලනඥයන්ට සල්ලි සාක්කුවේ දා ගන්න පාර හදා දුන්නා; මාර්ගය විවෘත කර දුන්නා. මේවා පිළිබඳව විගණනය එන කොට ඒවා කරපු මිනිස්සුත් නැහැ, ඒවාට සම්බන්ධ නිලධාරිනුත් නැහැ, හදපු පාරකුත් නැහැ, සංවර්ධන ව්‍යාපෘතියත් නැහැ. මේක තමයි ඇත්ත කථාව.

අපි 2015 ජනවාරි 08වැනි දා පැවැති ජනාධිපතිවරණයේදීත්, ඊට පසුව අගෝස්තු 17වැනි දා පැවැති මහ මැතිවරණයේදීත් මේ රටේ ජනතාවට පොරොන්දුවක් දුන්නා. ඒ තමයි, රටේ යහ පාලනය ඇති කර, රට හරි මඟක ගෙන යමින්, මේ රටේ සුපිරිසිදු පාලනයක් ස්ථාපිත කරන බව. ජනතාවට ඒ දුන්නු පොරොන්දුව ඉෂ්ට කරන්න මේ ඉදිරිපත් කර තිබෙන ජාතික විගණන පනත් කෙටුම්පත ලොකු ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමින්, එයට ඔබ සියලුදෙනාගේ ශක්තිය හා ධෛර්ය ලබා දෙන්න කියා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.30]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබාදීම ගැන. මුදල් සම්බන්ධව කටයුතු කිරීමට අදාළ ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් වන ජාතික විගණන පනත් කෙටුම්පත පිළිබඳ දෙවැනිවර කියැවීමේ විවාදය අද දවසේ සිදු කරනවා. මෙම පනත් කෙටුම්පත සම්මත කිරීමෙන් පසුව ඉදිරි අනාගතයේදී රටේ බොහෝ දේවල් වෙනස් වෙයි කියලා මා හිතනවා. ඒ නිසා මෙම පනත් කෙටුම්පත ගැන මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී කථා කරන්න ලැබීම නවක මන්ත්‍රීවරයකු හැටියට මට ලැබුණු භාග්‍යයක් හැටියට සලකනවා.

මා විශේෂයෙන්ම එක කාරණයක් මතක් කරනවා. අලුතින් පාර්ලිමේන්තුවට පැමිණි මම, මේ අවුරුදු තුනක කාලය තුළදී බොහෝ දේවල් ඉගෙන ගත්තා; පාඩම් හැටියට බොහෝ දේවල් ඉගෙන ගත්තා. එසේ අධ්‍යයනය කළ කාරණා අතර "විගණනය" කියන විෂයයට විශේෂ ස්ථානයක් දීලා කථා කරන්න මට පුළුවන් කියලා මා හිතනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව ගරු මයන්ත දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* **නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා]** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. MAYANTHA DISSANAYAKE *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *took the Chair.*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියමින් සිටියේ, අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා කළ යුතු දේවල් මොනවාද, අපි ඉගෙන ගත්ත දේවල් මොනවාද සහ ඉගෙන ගනිමින් සිටින දේවල් මොනවාද කියන කාරණයයි. මා අද ඉතාම කනගාටු වෙනවා. මොකද, මේ ජාතික විගණන පනත් කෙටුම්පත ගැන මේ රටේ අවුරුදු ගණනාවක් තිස්සේ සාකච්ඡා කරමින්, ඒක යට ගසමින්, කුණු කූඩයට දමමින් මේ රටේ දේශපාලනය කරපු සමහර කණ්ඩායම් අද මේ පාර්ලිමේන්තුවේදී කිඹුල් කඳුළු හෙළමින් අපට ඇඟිල්ල දිගු කරලා, 'මේ පනත් කෙටුම්පත ඒ අය සකස් කරලා අද සම්මත කරන්න කටයුතු කරනවා' වැනි කථාවක් ජනතාවට ඒත්තු ගන්වන්න උත්සාහ කරන නිසා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දකින විධියට මේ රටේ පැහැදිලි ලෙසම සිද්ධ වෙන්නේ මේක තමයි. අද මේ රටේ පැහැදිලි ලෙසම සිද්ධ වෙන්නේ, ඇත්ත වසන් කරලා, ඇත්ත වෙනුවට බොරුව රජ කරවීමයි. බොරුව රජ වන රටක් හැටියට අද මේ රටේ කටයුතු සිද්ධ වීගෙන යනවා.

විශේෂයෙන්ම ජාතික විගණන පනත් කෙටුම්පත ගැන කථා කරද්දී, විගණනය සම්බන්ධයෙන් කථා කරද්දී අපට කාරණා කිහිපයක් කථා කරන්න තිබෙනවා. ප්‍රධාන වශයෙන් මා විශ්වාස කරන දේ තමයි, විශේෂයෙන්ම මේ රටේ තිබෙන රාජ්‍ය ආයතන එහෙම නැත්නම් පොදු ව්‍යාපාර කියන මේ සියල්ලම විගණනය කරන්න පෙර ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් කළ යුතුයි කියන කාරණය. ඒකට හේතුව මොකක්ද? මම ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා හැටියට කාලයක් සිටියා. ඒ කාලයේ එක ආයතනයකට ගිය වේලාවක එක නිලධාරියෙක් එකවරම කිව්වා, "අද ඔන්න Audit එකෙන් පැන්නා" කියලා. Audit එකෙන් පැන්නා කියලා නිලධාරින් ඒ අත-මේ අත දුවනවා. "අර file එකමයි සොයාගෙන ආවේ" කියලා කියනවා. ඒ කියන්නේ මොකක්ද? ඔවුන් කියන ඒ file එක ගැන තොරතුරු තමයි විගණන අංශයට දීලා තිබෙන්නේ. ඒ ගොල්ලන් ඒ file එක බලන්නේ ඊට පසුවයි. ඒ නිලධාරියා ඒ file එක අරගෙන ඒ අත-මේ අත බලනවා. මොකද, ඒ නිලධාරියා අතින් වෙන්න තිබුණු රාජකාරිය හරියට සිද්ධ වෙලා නොතිබුණු නිසා තමයි Audit එකට බය වෙලා තිබෙන්නේ. හේතුව ඒකයි.

මම හිතන විධියට අද විගණනයක් ගැන කථා කරන්නේ හොරු අල්ලන්න නොවෙයි. මම දකින විධියට විගණනය තිබෙන්නේ කාටවත් දඬුවම් දෙන්න නොවෙයි. විගණනය තිබෙන්නේ නිවැරදි කරන්නයි. මා කියන කථාව නිවැරදියි කියලා මා හිතනවා. විගණනය තිබෙන්නේ මේ රට නිවැරදි කරන්නයි. හැබැයි, ඒ නිවැරදි කරන ආකාරය රාජ්‍ය ආයතනත්, පොදු ව්‍යාපාරත් හරියාකාරව හඳුනා ගත යුතුයි. අපි යම් ආයතනයක විගණනය ගැන කථා කරන්නේ කොයි වේලාවේද? අපි විගණනය ගැන අපේ කාරක සභාවල කථා කරන්නේ කොයි වේලාවේද? අවුරුදු හතරක්-පහක් ගියාට පස්සේ එවැනි වාර්තාවක් ගෙනාවාට පසුවයි අපි ඒ ගැන කථා කරන්නේ. එතකොට ඒ ක්‍රියාවට සම්බන්ධ වුණු, අද විගණනයට භාජන වුණු නිලධාරින් සමහර වේලාවට අද ජීවතුන් අතර නැහැ. එහෙම නැත්නම් ඒ අය අබල දුබල වෙලා ප්‍රශ්නයකට උත්තර දෙන්න බැරි තත්ත්වයක ඉන්නේ. එහෙම වුණොත් ඒ විගණනයට උත්තර දෙන්න වෙන්නේ අලුතින් එතැන සිටින නිලධාරියාටයි. සමහර වේලාවට ඒ නිලධාරියාට ඒ උත්තරය නිවැරදි ආකාරයෙන් දෙන්නත් බැහැ; ඒ සිද්ධ වූ ක්‍රියාව ආවරණය කරන්නත් බැහැ. එවැනි හේතු නිසා මේ රටට විශාල පාඩුවක් සිද්ධ වුණාය කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා මම විගණකාධිපතිතුමා ප්‍රමුඛ ඒ සියලු විගණන අංශවලින් ඉල්ලීමක් කරනවා. එතැනදී සමහර වේලාවට ඔබතුමන්ලාට අයිති නැති කාර්යයක් කරන්න සිද්ධ වෙයි. ජාතික විගණන පනත් කෙටුම්පත සම්මත වුණාට පසු, රාජ්‍ය ආයතනත්, දේශපාලනයත් කියන මේ සියල්ල එකට එකතු කරගෙන -යම්කිසි අවැඩක් වෙන්න පෙර, එහෙම නැත්නම් හානියක් වෙන්න පෙර, එහෙමත් නැත්නම් දූෂණයක්-වංචාවක් වෙන්න පෙර- මේ අය නිවැරදි කරන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. එහෙම කරන්න පුළුවන් නම්, ඒක මේ රටට කරන විශාල සේවයක් හැටියට මා දකිනවා.

ජාතික විගණන පනත් කෙටුම්පත ගැන අවුරුදු ගණනාවක් තිස්සේ කථා කරලා, මඩ යට පල් කරලා තිබුණේ. අද දින එය සම්මත කිරීම සඳහා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට බඳුන් කරන්නට අවස්ථාව සලසා දීම සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අපි ආපසු හැරිලා බලන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මන්ත්‍රීවරුන් හැටියට අපි පාර්ලිමේන්තුවට පත් වෙන්නේ මහජන ඡන්දයෙනුයි. මහජන ඡන්දයෙන් පාර්ලිමේන්තුවට පත්වෙලා ඇවිල්ලා, මේ එක රැස්වීමකට පාර්ලිමේන්තුව රුපියල් ලක්ෂ ගණනක් වියදම් කරනවා. එහෙමත් නැත්නම් අපේ වැඩ මුළුවකට රුපියල් ලක්ෂ ගණනක් වියදම් කරනවා. ඒ විතරක් නොවෙයි, අපි ජනතාවට සේවය කරන කාල සීමාව තුළදී, පෞද්ගලිකව අපේ ගම්වල වැඩ කටයුතු කරද්දී අපට යම්කිසි මුදලක් ගෙවනවා. ඒවා ජනතාවගේ මුදල්. එහෙම නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපි දවස පුරා මොනවාද කරන්නේ, පාර්ලිමේන්තුවට ඇවිල්ලා මොනවාද කරන්නේ කියලා අපි, අපි ගැන ස්වයං විගණනයක් කර ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් පොඩ්ඩකට ඉස්සෙල්ලාත් මා කිව්වා, මා ඉතා කලකිරීමෙන් ඉන්නවාය කියලා. මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න හොඳ විෂයයන් ලැබෙනවා. හැබැයි ඒ විෂයයන් ගැන නොවෙයි පාර්ලිමේන්තුවේ දී කථා කරන්නේ. එහෙම නම් මොනවා ගැනද කථා කරන්නේ? එකිනෙකාට හොරා කියා ගනිමින්, එකිනෙකාට ඇඟිල්ල දිගු කර ගනිමින්, මේ රටේ කථා කරන්න හොඳ නැති ඉතාමත් පහත් අන්දමේ කථා කියනවා. ඒ විතරක් නොවෙයි, ඕපදූප තමයි මේ පාර්ලිමේන්තුවේ වැඩිපුර කථා කරන්නේ. මේ රටේ ජනතාවගේ මුදල් කොතරම් කාබාසිනියා කරනවාද කියන එක තමුන්නාන්සේලා හැම දාම දකිනවා ඇති. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ඉඳගෙන, කාලය ලබාගෙන කාගේවත් ඕපදූප තමයි කථා කරන්නේ. මෙන්න මේ ක්‍රමවේදය නැති කරන්න ඕනෑ. අපි ජනතාවගේ මුදල් කොපමණ නාස්ති කරනවාද කියලා අපි ගැන ස්වයං විගණනයක් කිරීමේ වග කීමක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට, අමාත්‍යවරුන් හැටියට අපි සියලුදෙනාටම තිබෙනවා. අපේ වගකීම හරිහැටි ඉෂ්ට කළාද කියා අපි ආපසු හැරිලා බලන්න ඕනෑ. මොකද, අපි මේ පාවිච්චි කරන්නේ, ජනතාවගේ සල්ලි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හැම මොහොතකම දකිනවා, ඉතාමත් හොඳ, මේ රටට ප්‍රයෝජනවත් වන, සැලසුම් සහගත, නිර්මාණශීලී වැඩසටහන් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කරන යෝජනා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන බව. හැබැයි එවැනි යෝජනාවක් ඉදිරිපත් වුණු ගමන් කොහේවත් තිබෙන එකක් අරගෙන ඉස්සරහට දමනවා. ඊට පස්සේ අර යෝජනාව පැත්තකින් තබා දෙපැත්තම ගහගන්නවා; කියවා ගන්නවා; ඒ සඳහා කාලය ගන්නවා; මඩ ගහගන්නවා. තමන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා කොයි ආකාරයෙන්ද පාර්ලිමේන්තුවේ හැසිරිය යුත්තේ කියන කාරණය පසෙක තබා, රටේ නීති සම්පාදනය කරන, මේ රට හදන තැන වන පාර්ලිමේන්තුවේ පෞද්ගලිකව එකිනෙකාගේ දෙමවුපියන්ගේ වගතුග ගැනත් කථා කරන්න තරම් පහත් තත්ත්වයට අපි වැටිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථානායකතුමා සහ ඔබතුමා තමයි මේ පාර්ලිමේන්තුවේ ඉහළින්ම සිටින්නේ. ඔබතුමන්ලාට පුළුවන් නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මහජන මුදල් පාවිච්චි කරන ආකාරය සම්බන්ධව ප්‍රගති සමාලෝචනයක් කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ජනතා හිතවාදීව මේ රට හදන්න, ආර්ථිකය හදන්න, සමාජය හදන්න, සංස්කෘතිය හදන්න, ආගම ධර්මය ඉදිරියට ගෙන යන්න, දරුවන් වෙනුවෙන් මේ රට නැවත නිර්මාණය කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළට කොතරම් කාලයක් වැය කරලා තිබෙනවාද, ඒ කාලය සඳහා වැය වූ මුදල කොපමණද කියා ගණනය කරලා, නැවත ඒ දිහා හැරිලා බලලා, ඒ කාලයේ තමන් ඇඳුම් ඇඳගෙනද සිටියේ, නිරුවත්වද සිටියේ කියලා හඳුනා ගන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අවස්ථාව දෙන්න. ඒක තමයි වැදගත් වෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේක අපි කළ යුතුමයි. මොකද, රස්තියාදු කථා කියමින්, එහෙම නැත්නම් නොසංඩාල කථා කියමින්, මාධ්‍යවල පෙනී සිටීමේ වැඩසටහන පමණයි මේ පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක වෙන්නේ. එය මේ රටට කරන හානියක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාමත් වැදගත් පනත් කෙටුම්පතක් පිළිබඳවයි අද කථා කරන්නේ. රටේ පරිහරණය වන මුදල් ආරක්ෂාකාරී විධියට රටේ ආර්ථිකය සහ රටේ ඉදිරි අනාගතය ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් සඳහා යෙදවීමට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්නයි මේ ජාතික විගණන පනත් කෙටුම්පත සම්මත කරන්නේ. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් කොපමණ දුරට මහජන මුදල් නාස්ති කරනවාද; අපතේ යවනවාද, ඒ සම්බන්ධයෙන් සකස් කරන වැඩ පිළිවෙළ කොපමණ හරිද,

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

වැරැදිද කියලා පෙන්වා දීලා, හෙට දිනයේ දී මේ උත්තරීතර පාර්ලිමේන්තුව මේ රටේ ජනතාවගේ යහපත්ම ස්ථානය හැටියට නිර්මාණය කරන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් ලබා දෙන්න කියලා යෝජනා කරමින්, මට මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිය පළ කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. මීළඟට ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි අටක් තිබෙනවා.

**[අ.භා.5.40]**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් වන ජාතික විගණන පනත් කෙටුම්පත අද දින මේ ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ කරුණු කීපයකට අවධානය යොමු කරන්න ඔබතුමා මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාල පරිච්ඡේදය තුළ අපේ ආණ්ඩුවට එරෙහිව දිගින් දිගටම එල්ල වුණු චෝදනා අතරේ තිබුණු එක් චෝදනාවක් තමයි, මේ ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ කවදාද කියන කාරණය. 2015 ජනවාරි 08 වැනිදා මේ රටේ අලුත් සංස්කෘතියක් නිර්මාණය කරලා, අපි යහ පාලන ආණ්ඩුවක් හැදුවා. ඒ අනුව අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළින් ඉතාම පැහැදිලිව කියපු කාරණා ගණනාවක් අපි ඉෂ්ට කළා. අද බොහෝ දෙනෙකු මේවා පැත්තකට දාලා, අමතක කරලා තමයි කථා කරන්නේ. කොමිෂන් සභා ස්ථාපිත කළා වාගේම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත වාගේ පනත් ගෙනැල්ලා ඉතිහාසයේ පළමුවැනි වතාවට ස්වාධීනව කටයුතු කරන්න පුළුවන් අවස්ථාව යහ පාලන ආණ්ඩුව තුළින් අපි උදා කරලා දුන්නා. සමහර අය ඒ අතරේ ඇහුවා, "බලයට ඇවිල්ලා දැන් වසර තුන හමාරක් විතර වනවා. ජාතික විගණන පනත කෝ?" කියලා. නමුත් ප්‍රමාද වෙලා හෝ විගණකාධිපතිවරයාට ඉතාම ශක්තිමත්ව, ස්වාධීනව, කොන්ද කෙළින් තියාගෙන කටයුතු කරන්න අවශ්‍ය වටපිටාව මේ පනත් කෙටුම්පත තුළින් හදලා තිබෙනවා. ඒ වෙනුවෙන් අපි සංශෝධන කීපයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ජාතික විගණන පනත් කෙටුම්පත අද සම්මත කිරීම තුළින් එතුමාගේ ස්වාධීන බලය ස්ථාපිත කරන්නට අවශ්‍ය කටයුතු සිදු වනවා වාගේම, එමඟින් සමස්ත රටේ ජනතාවට සැනසුම් සුසුම් හෙළන්නට පුළුවන්කමක් ලැබෙනවාය කියා මා හිතනවා. රාජ්‍ය සේවය තුළ කටයුතු කරන රජයේ නිලධාරින්ට, මැති- ඇමතිවරුන් හැටියට අපි සියලු දෙනාට, ආණ්ඩු පක්ෂයට, විරුද්ධ පක්ෂයට ඕනෑ විධියට විගණකාධිපතිවරයා නටවන්න මින් ඉදිරියට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. පසු ගිය කාල පරිච්ඡේදයේ -මහින්ද රාජපක්ෂ පාලන කාලය තුළ- ජාතික විගණන පනත් කෙටුම්පත ගෙනැල්ලා සම්මත කරලා තිබුණා නම්, ජනාධිපති ලේකම්වරයාට -ලලිත් වීරතුංග මහත්මයාට- මහ උළු ගෙදරට ගිහිල්ලා තපින්න සිදු වෙන්නේ නැහැ කියා මා හිතනවා. ජනාධිපතිවරයා වෙන්න පුළුවන්; අගමැති වෙන්න පුළුවන්; වෙනත් මැති-ඇමතිවරු වෙන්න පුළුවන්; තමන්ට ඕනෑ විධියට හිතු මතයට නියෝග දීලා, මූල්‍ය පාලනය පිළිබඳව විනිවිදභාවයකින් තොරව කටයුතු කරන්න ඔවුන්ට තිබුණු අවස්ථාව මේ පනත් කෙටුම්පත සම්මත වීම තුළින් අහිමි වනවාය කියා මා හිතනවා.

අපි පාර්ලිමේන්තුව තුළින් අණ පනත් සම්මත කරනවා. බදු ගෙවන ජනතාවගේ සල්ලි මේ රටේ සංවර්ධන ක්‍රියාදාමයට කොයි ආකාරයට යොදවනවාද කියන කාරණය පිළිබඳවත් මේ තුළින් සොයා බලන්න පුළුවන්කම ලැබෙනවා. රාජ්‍ය අංශයට විතරක් නොවෙයි භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දෙන්නේ. විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත තුළින් සියයට 51ක් තිබෙන රජය සතු ආයතන පිළිබඳව වාගේම 200කට වැඩි ප්‍රමාණයක් තිබෙන අර්ධ රාජ්‍ය ආයතන වන සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල වාගේ ආයතනවලත් විගණන කටයුතු කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත සම්මත කිරීම තුළින් ලැබෙන වාසිය මොකක්ද? මෙතෙක් කාලයක් මේ රටේ සිදු වෙච්ච යම් යම් වංචා, දූෂණ පිළිබඳව කථා කරනවා නම්, පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවලදී වාගේම පාර්ලිමේන්තුවේ පවත්වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තුළදී ලබා දෙන ඇතැම් නිර්දේශ, නියෝගයන් එම ආයතනවල නිලධාරින් ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ තත්ත්වය ඉතාම කනගාටුදායකයි. පළාත් සභාවේ, රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට මා අවුරුදු පහක් කටයුතු කර තිබෙනවා. අවුරුදු 16ක් එහි සාමාජිකයෙකු හැටියට කටයුතු කර තිබෙනවා. ඒ දවස්වල අපි ඉතාම පැහැදිලිව යම් යම් නිර්දේශයන් ඉදිරිපත් කරලා, මේ කටයුතු මේ විධියට සිදු වෙන්න ඕනෑ කියලා කියා තිබෙනවා. නමුත් බොහෝ අවස්ථාවලදී ඒ අදාළ නිලධාරින්ට නිවැරදි තීන්දු ගන්න පුළුවන් විධියේ කොන්දක් තිබුණේ නැහැ. නමුත් මේ තුළින් එය පැහැදිලිව ක්‍රියාත්මක වනවා. හැබැයි, මේ තුළින් බරපතළ වැරදි සිදු වන බවත් අපි දන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජාතික විගණන පනත් කෙටුම්පත ගෙනැල්ලා, විගණකාධිපතිවරයාගේ බලතල ගැන කියලා, රජය මඟින් ක්‍රියාත්මක වන ඇතැම් ව්‍යාපෘති කල් දමන්න -කල් මරන්න- පුළුවන්, ඒ වෙනුවෙන් ක්ෂණිකව ක්‍රියා කරන්න බැහැයි කියලා බොහෝ දෙනෙකු කියනවා.

ඒ ප්‍රශ්නයත් එනවා. රාජ්‍ය නිලධාරින්ගේ මැදිරියේ ඉඳගෙන විගණකාධිපතිතුමාත් මේවා අහගෙන ඇති. ඇතැම් විගණකාධිපතිවරු, සහකාර විගණකාධිපතිවරු ඉතාම හොඳින් මේ කටයුතු කරනවා. හැබැයි, සමහර අවස්ථාවලදී ඇතැම් නිලධාරින් විසින් යම් යම් නිලධාරින් බිය ගන්වන තත්ත්වයක් තිබෙනවා. ඒ අයුරින් බිය ගන්වලා, ද්වේෂ සහගතව මේ කටයුතු ගෙන ගිය අවස්ථාත් තිබෙනවා. මේ ජාතික විගණන පනත තුළින් තමුන්නාන්සේලාට බලතල දෙනවා වාගේම, ස්වාධීනව තීන්දු ගන්නත් හැකියාව ලැබෙනවා. ඒ වාගේම තමයි, යම් යම් දුර්වලතාවලින් පෙළෙන රාජ්‍ය නිලධාරින්ව අපි ආරක්ෂා කරගන්නත් ඕනෑ. අද සමහර ආයතනවලට මේ අය පොලීසිය වාගේ කඩා පනින තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ අහන ප්‍රශ්නවලදී එම ආයතනවල නිලධාරින් දැඩි ලෙස අසීරුතාවලට ලක් වෙනවා. හැබැයි, රටට ඉතාම ආදරය කරන, රාජ්‍ය මුදල්වලට ආදරය කරන නිලධාරින් පිරිසකුත් ඉන්නවා. ඒ අය රජය මඟින් කරන සියලු කටයුතුවලදී බොහොම ආදරයෙන් කටයුතු කරනවා. කවුරු මොනවා කිව්වත්, ඒ අය වැරැද්ද වැරැද්ද විධියට දකිනවා. අපි දන්නවා, සමහර වෙලාවට ඇතැම් ස්ථානවලදී නිලධාරින්ට යම් යම් බලපෑම් ඇති වෙලා තිබෙන බව. තම රාජකාරි කටයුතු කරනකොට ඒ කටයුතුවල යම් යම් ප්‍රමාදයන් කරන්න කියූ අවස්ථා තිබුණා. විගණකාධිපතිතුමනි, මේ ජාතික විගණන පනත් කෙටුම්පත සම්මත කරලා, එම පනතින් ඔබතුමාට බලතල පැවරෙනකොට ඔබතුමා ඉතාම සාධාරණ සහ යුක්තිසහගත ලෙස මේ කටයුතු විමර්ශනය කරයි කියා අප විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඕනෑම ආයතනයක් ගත්තාම, එම ආයතනයේ දැක්ම, ආයතනයේ අතීතය, අනාගතය

පිළිබඳව අපට යම්කිසි චිත්‍රයක් ලැබෙන්නේ විගණන වාර්තා තුළිනුයි. අපි දන්නවා, ඇමතිවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක් හෝ ආයතන ප්‍රධානියෙක් ඕනෑම රාජ්‍ය ආයතනයකට පළමුවෙන්ම පැමිණියාම එම ආයතනයේ විගණන වාර්තාව තමන්ගේ මේසය මත තිබෙන්න ඕනෑ බව. පළමුවෙන්ම කරන්න ඕනෑ වන්නේ, විගණනය තුළින් දැකපු, ඒ ආයතනයේ තිබුණු යම් යම් දුර්වලතා මඟහරවන්නේ කොහොමද, ඒවාට විගණකාධිපතිවරයා ලබාදුන් නිර්දේශ මොනවාද, ඒවායින් කීයක් ඉෂ්ට කර තිබෙනවාද කියා බලලා, ඒ පිළිබඳව පැහැදිලිව තීන්දු ගැනීමයි. ඒ කටයුතුවලින් අපට ආයතනය ගැන පැහැදිලිව වැටහෙනවා.

රජයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනකොට ඇතැම් අවස්ථාවලදී විගණනය බාධාවක් වන බව අප දන්නවා. වර්තමානයේ -මේ ළඟදි - වුණු සිදුවීමක් ගැන මා දැන් කියන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගංවතුරෙන් සිදුවුණු හානියට සහන සලසන්න දකුණු පළාතට -ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලට- විශාල මුදල් ප්‍රමාණයක් ලැබුණා. දෙසැම්බර් 31වන දාට කලින් මේ කටයුතු කරන්න කියා රජය නියම කර තිබුණා. ඒ මුදල් ආයෙත් අවිච්ඡේද්‍ය වෙන්නෙත් නැහැ. මේ තුළින් මාර්ග සංවර්ධනයට විශාල මුදලක් ලැබුණා. නමුත්, මේ මාර්ග සංවර්ධන කටයුතු කඩිනමින් කරන්න ගිහින් ඇතැම් තැන්වල ඒ වැඩ නතර වෙලා තිබෙනවා; අද මාතර දිස්ත්‍රික්කයේ මාර්ග කිහිපයක ඒ වැඩකටයුතු නතර වෙලා තිබෙනවා. සමහර වෙලාවට ඒ මාර්ගවල ගල් දමලා, අනික් වැඩකටයුතු අතරමඟ නතර වෙලා තිබෙනවා. මේ පාරවල් හදන්න ලැබෙන්නේ නැහැ. ඒකට හේතුව හැටියට කියන්නේ මොකක්ද? "මේ සම්බන්ධයෙන් විගණන අංශය මඟින් විමර්ශනයක් කර තිබෙනවා; ඒ අනුව මේ වැඩකටයුතු නතර කර තිබෙනවා" කියායි කියන්නේ. හැබැයි, මම එක දෙයක් කිව යුතුයි. ඒ කටයුතු විගණනයෙන් පසු නතර කළා වාගේම, විගණන අංශයෙන් කළ එම පරීක්ෂණවල නිගමන, නිර්දේශ ඉක්මනින්ම ලබා දීලා එම කටයුතු යථා තත්ත්වයට පත් කිරීමත් විගණකාධිපතිවරයාගේ කාර්ය භාරයක් කියා මම හිතනවා. විගණකාධිපතිතුමනි, ඔබතුමා ඉතාම ස්වාධීනව කටයුතු කළා. බැඳුම්කර සිද්ධියේදී ඔබතුමන්ලා ඒ වෙනුවෙන් විශාල කැප කිරීම් කරලා කටයුතු කළ ආකාරය අපි දැක්කා. ඉතිහාසයේ මේ රටේ බොහෝ දේවල් සිද්ධ වෙලා තිබෙනවා. පසුගිය කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය ආයතන 18ක බරපතළ වංචා හා දූෂණ සිදු වෙලා තිබෙනවා. මේ අවස්ථාවේදී ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මෙම ගරු සභාවේ හිටියා නම් හොඳයි. ආණ්ඩුවට බොහෝ විට අලාභ හානි සිදු වෙලා තිබෙනවා. නමුත් ඒවා පිළිබඳව කළ විගණන තුළින් දුන් නිර්දේශ ක්‍රියාත්මක කරන්න පසුගිය රජය කාලයේ කටයුතු කර තිබුණේ නැහැ. වංචා, දූෂණ සිදු වූ ආයතන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. අපි දන්නවා, බොහෝ ආයතනවල - විශේෂයෙන්ම ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, වතු සමාගම් සහ තවත් විවිධ ආයතනවල- සිදු වුණු බරපතළ පාඩු විගණනය මඟින් පෙන්වා දී තිබෙන බව. ඒ කරුණු "කෝප්" වාර්තාවට පවා ගිහින් තිබෙනවා. නමුත් ඒ ගැන අබ මල් රේණුවක් තරම්වත් සිතා කටයුතු කර තිබුණේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අතිගරු ජනාධිපතිතුමාගේත්, ගරු අග්‍රාමාත්‍යතුමාගේත් මඟ පෙන්වීම යටතේ වර්තමාන රජය කටයුතු කරන ආකාරය ගැන අප සතුටු වනවා. ගරු අග්‍රාමාත්‍යතුමා අද උදෑසන කථා කළා. මෙම ජාතික විගණන පනත් කෙටුම්පත අද දෙවැනි වර, තුන්වන වර කියවා සම්මත කරනවා. මේ රටේ ජනතාවට දුන් පොරොන්දු එකින් එක අපි ඉෂ්ට කර තිබෙනවා. අපේ ආණ්ඩුවට තව අවුරුදු දෙකක් තිබෙනවා. ඔබතුමන්ලා මතක තියා ගන්න, අපි කියූ බොහෝ දේවල් 2020 වසරේ අගෝස්තු මාසය වන විට සම්පූර්ණ කරන්න පුළුවන් ශක්තිය අපට තිබෙනවා. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ගෙන එන්න පුළුවන් වුණේ කාටද? ඒ කාලයේ ඒවා ප්‍රතික්ෂේප කළා. ඒවා ගැන කථා කළේ නැහැ. විගණන පනත ගෙනෙන්න පුළුවන් වුණේ කාටද? මේවා වසර ගණනාවක් තිස්සේ ඇදී ඇදී තිබුණා. මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ එවැනි අවස්ථා නිර්මාණය කරන්න අද අපිට පුළුවන්කමක් ලැබී තිබෙනවා.

ඒ දේවල් කරද්දී තමයි අපට මේ චෝදනා කරන්නේ; අපේ ආණ්ඩුවට නොයෙක් දේවල් කියන්නේ. ඒවා කරන්න බැරි වුණු අය ඒ තුළින් අගාධයට වැටිලා, මේ රටේ මූල්‍ය විනිවිදභාවය සම්පූර්ණයෙන්ම කාබාසිනියා කළා. මේ රටේ අහිංසක ජනතාවගේ මුදල් නියමානුකූලව පරිපාලනය කරන්නේ කොහොමද කියන එක ගැන ප්‍රශ්නයක් තිබුණා. ඒක නිසා තමයි අපට විගණන පනතක් ගෙනෙන්න ඕනෑකමක් තිබුණේ. මේ දේවල් නිසා මේ ආණ්ඩුවේ ඉදිරි කටයුතු පිළිබඳව අපට ලොකු විශ්වාසයක් ඇති වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විගණකාධිපතිවරයා වාගේම ඉතාම සම්භාවනීය, සමාජයේ ගරුත්වයක් තිබෙන, මේ රටට ආදරය කරන කණ්ඩායමක් මේ සඳහා පත් වෙන්න ඕනෑය කියා මම ඉතාම ගෞරවයෙන් කියනවා. ඒ සියලුදෙනාම සාමූහිකව මේ පිළිබඳව තීන්දු ගන්න ඕනෑ. සාධාරණව හා යුක්ති සහගතව දෙන තීරණ, නිර්දේශ අපේ ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු අමාත්‍යවරුන් විසින් ක්‍රියාත්මක කළොත්, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මූල්‍ය විනිවිදභාවයෙන් යුතු ඉතාම වාසනාවන්ත රටක් හැටියට ඉදිරියට යන්න පුළුවන් ශක්තියක් මේ රටට ලැබෙනවා. ඒ ශක්තිය ගරු අගමැතිතුමාගේ නායකත්වයෙන් යුතුව මේ රටේ ස්ථාපිත කරන්න අපි නිරන්තරයෙන් කටයුතු කරනවාය කියන කාරණය මතක් කරමින්, මේ රටේ බදු ගෙවන, දුක් විඳින අහිංසක ජනතාවට, රටට ආදරය කරන ජනතාවට මේ පනත තුළින් ශාන්තියක්ම වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. Hon. Mylvaganam Thilakarajah. You have eight minutes.

[අ.භා.5.51]

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටට ඉතාම වැදගත් වන ජාතික විගණන පනත් කෙටුම්පත විවාදයට ගන්නා මේ අවස්ථාවේදී, ඒ පිළිබඳව කථා කරන්න අවස්ථාවක් ලබාදීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ වාගේ ජාතික වැදගත්කමක් තිබෙන තවත් වැඩසටහනක් ඔබතුමාගේ නායකත්වයෙන් අපි දැනටමත් කරගෙන යන බව මම මතක්

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

කරන්න කැමැතියි. ජාතික විගණන පනත් කෙටුම්පත වාගේම, ඇගයීම් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් මේ පාර්ලිමේන්තුවට ගෙන්වා ගන්නට ඔබතුමාගේ හා අපේ ගරු කබීර් හාෂිම් ඇමතිතුමාගේ නායකත්වයෙන් දැනටමත් අපි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යන බවත්, ඒ වැඩ පිළිවෙළට කැබිනට් අනුමැතිය ලබා ගත් බවත් මේ උත්තරීතර සභාවට දැනුම් දෙන්න මා කැමැතියි. ඒකත් මේ වාගේම වැදගත් වැඩ පිළිවෙළක් බව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංචිතයේ සාමාජිකයකු ලෙස මා විශ්වාස කරනවා.

මෙම පනත ගැන බොහෝ සාකච්ඡා තිබුණා. Committee on Public Finance එකේ Member කෙනෙක් හැටියට මම පසුගිය කාලයේදී මේ ගැන ගොඩක් උනන්දුවෙන් වැඩ කළා. අද මේ සභාවට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට දායකවීමට හැකිවීම සහ මේ විවාදයට සහභාගී වීමට ලැබීම මගේ භාග්‍යයක් ලෙසයි මම සලකන්නේ.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தேசிய முக்கியத்துவம் வாய்ந்த தேசியக் கணக்காய்வுச் சட்டமூலம் சம்பந்தப்பட்ட இந்த விவாதத்தில் உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்காக உங்களுக்கு எனது நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். கடந்த காலங்களில் இந்தக் கணக்காய்வு சம்பந்தமாக இந்த நாட்டில் பல்வேறு குறைபாடுகள் காணப்பட்டன. பல்வேறு பொதுமுயற்சிகள் சம்பந்தமாக உரிய கணக்காய்வினை மேற்கொள்ள முடியாத நிலைமை நிலவியமை தொடர்பாக பல தடவைகள் நாங்கள் இந்தச் சபையிலே பிரஸ்தாபித்திருந்தோம். அதற்குச் சட்டத்திலுள்ள ஏற்பாடுகள் குறைவாக இருந்த நிலையிலேயே இந்தச் சட்டமூலம் கொண்டுவரப்பட்டுள்ளது. அதாவது பொதுவாக நாட்டிலே பல்வேறு பொதுமுயற்சிகள் தொடர்பாக உரிய கணக்காய்வுகளை மேற்கொள்வதற்கு இடமளிக்கும் வகையில் இந்தச் சட்டமூலம் இன்று பாராளுமன்றத்திலே சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது. குறிப்பாக, நாட்டின் பிரதமர் என்கின்ற வகையில் மிகுந்த பொறுப்புடன் இத்தகைய ஒரு கணக்காய்வுச் சட்டமூலத்தைக் கொண்டுவந்தமைக்காக எங்களது கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களுக்கு நாங்கள் நன்றி தெரிவிக்கக் கடமைப்பட்டிருக்கின்றோம். பொறுப்புவாய்ந்தவர் என்கின்ற வகையிலே இந்த வேலைத்திட்டத்தை அவர் முன்னெடுத்திருக்கின்றார்.

அதேநேரம், குறித்த கணக்காய்வறிக்கைகள் எத்தகைய விடயங்களை இதற்கு முன்னர் வெளிக் கொண்டுவந் திருக்கின்றன என்பது தொடர்பாக விளக்குவதற்காக கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களத்தினால் வெளியிடப்பட்டிருக்கின்ற கணக்காய்வறிக்கை ஒன்றை நான் இந்தச் சபையிலே சமர்ப்பித்து எனது வாதத்தை முன்வைக்க விரும்புகின்றேன்.*

2018ஆம் ஆண்டு பெப்ரவரி மாதம் 19ஆம் திகதி கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களத்தினால் வெளியிடப்பட்ட ஓர் ஆவணமொன்று என்னிடமிருக்கின்றது. சௌமியமூர்த்தி தொண்டமான் ஞாபகார்த்த மன்றத்தின் 2015 டிசம்பர் 31இல் முடிவுற்ற ஆண்டிற்கான நிதிக் கூற்றுக்கள் மீது 1971ஆம் அண்டின் 38ஆம் இலக்க நிதி அதிகாரச் சட்டத்தின் கீழ் 14(2)(சீ) பிரிவின் பிரகாரம் கணக்காய்வாளர் தலைமை அதிபதியின் அறிக்கை என்கின்ற இந்த அறிக்கையிலே, 14ஆம் பக்கத்தில் குறிப்பிட்டிருக்கின்ற சில விடயங்களை நான் இங்கே எடுத்துச் சொல்ல விரும்புகின்றேன். அதாவது "2009 யூன் 09ஆந் திகதிய மற்றும் 2011 டிசம்பர் 23ஆந் திகதிய முறையே DMA/2009 (1) மற்றும் DMA/ ADM/2011/1/26 ஆம் இலக்க முகாமைத்துவக் கணக்காய்வுச் சுற்றறிக்கைகளின்மீது கவனம் செலுத்தப்பட்டு வினைத்திறனுடனான உள்ளகக் கட்டுப்பாட்டு வியூகத்தை ஏற்படுத்துவதற்கு உள்ளகக் கணக்காய்வுப் பதவியணியைப் பயன்படுத்த வேண்டியபோதும், வெற்றிடமாக இருந்த கணக்காளரது பதவிக்குரிய சேவைகளை உள்ளகக் கணக்காய்வாளர் மேற்கொண்டமையால் மீளாய்வாண்டின்போது, உள்ளகக் கணக்காய்வு நடைபெறவில்லை." என்று கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களமே கூறுகின்றது. அதாவது, உள்ளகக் கணக்காய்வொன்று குறித்த மன்றத்தில் இடம்பெறவில்லை என்பதைக் கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களமே சொல்கின்றது.

அத்துடன் அந்த அறிக்கையின் 5.3 என்கின்ற குறிப்பில் பாதீட்டுக் கட்டுப்பாடு என்ற தலைப்பின் கீழ் "மீளாய்வாண்டின் பொருட்டு மன்றம் தயாரித்த பாதீட்டுக்குப் பணிப்பாளர் சபையின் அங்கீகாரம் பெறப்பட்டிருக்கவில்லை." என்று கூறப்பட்டுள்ளது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 5.5 மிக முக்கியமானதும் பாராளுமன்றம் கவனத்திற்கொள்ள வேண்டிய ஒரு விடயமுமாகும். அதில், "2003ஆம் ஆண்டு யூலை 2ம் திகதி பீஈடீ/12ஆம் இலக்கப் பொதுமுயற்சிகள் சுற்றறிக்கையின் 6.5.3ஆம் பந்தியின் பிரகாரம் ஆண்டறிக்கை பாராளுமன்றத்தில் முன்வைக்கப்பட வேண்டுமாயினும், மன்றம் தொடங்கிய 2005ஆம் ஆண்டு முதல் மீளாய்வாண்டு முடிவுவரை அவ்வாறு செய்யப்பட்டிருக்கவில்லை." என்று குறிப்பிடப்படுகின்றது. அதாவது சௌமியமூர்த்தி தொண்டமான் ஞாபகார்த்த மன்றம் 2005ஆம் ஆண்டு தொடங்கப்பட்டிருக்கின்றது. அது தொடங்கப்பட்ட ஆண்டு முதல் இந்த அறிக்கை வெளியிடப்பட்ட 2018 பெப்ரவரி, 19ஆம் திகதி வரை அந்த மன்றத்தின் கணக்கீட்டு செயற்பாட்டு அறிக்கைகள் இந்த உயரிய சபையான பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்படவில்லை என்பது கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களத்தின் அறிக்கையில் சுட்டிக்காட்டப்பட்டுள்ளது.

எனவே, "பொறுப்புக்கூற வேண்டிய உயரிய பாராளுமன்றத்தினால் ஒதுக்கப்படுகின்ற நிதியைப் பயன்படுத்தி நடாத்தப்பட்டு வந்த மன்றம் தொடர்பான நிதி அறிக்கைகள் இந்தப் பாராளுமன்றத்துக்கு உரிய முறையில் சமர்ப்பிக்கப்படவில்லை." என்று சொல்லுகின்ற கணக்காய் வாளர் தலைமை அதிபதி திணைக்களம் அது தொடர்பாக நடவடிக்கையெடுக்க முடியாத நிலையில்தான் தேசிய கணக்காய்வு பற்றிய சட்டம் இருந்திருக்கின்றது. இன்று நாங்கள் அதனைத்தான் திருத்தியிருக்கின்றோம். எனவே கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம் செயற்பாட்டில் இருந்தபோதும் அதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்வதற்கான வாய்ப்புகள் காணப்பட்டிருக்கவில்லை. கணக்காய்வின்போது அவதானிக்கப்பட்ட முறைமைகள் மற்றும் கட்டுப்பாட்டுக் குறைபாடுகள் அவ்வப்போது மன்றத்தின் தலைவரின் கவனத்திற்குக் கொண்டு வரப்பட்டன.

பின்வரும் கட்டுப்பாட்டுத் துறைகளில் விசேட கவனம் தேவைப்படுகின்றது. அதாவது குறித்தபடி ඔப்பந்த நிர்வாகம்

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

நிறைவேறாமை, பதவியணி நிர்வாகம் மேற்கொள்ளப்படாமை என்பனவாகும். இதுபோன்ற பல்வேறு குறைபாடுகள் அந்த அறிக்கையில் சுட்டிக்காட்டப்பட்டுள்ளதோடு, பொதுக் கணக்குகளை மேற்கொள்வதற்குரிய கணக்குப் புத்தகங்களை சமர்ப்பிக்க வேண்டும், பராமரிக்க வேண்டும் என்பது சம்பந்தமாகச் சுற்றறிக்கைகளில் சுட்டிக்காட்டப்பட்டுள் ளபோதும், கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களத்தினால் அறிவிக்கப்பட்ட அறிக்கையிலே வெறும் CR books களிலே கணக்குகள் பேணப்பட்டிருக்கின்றன என்று சொல்லப்பட்டிருக்கின்றது. இத்தகைய குறைபாடுகளைக் கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம் கண்டுபிடித் தபோதும்கூட, 2005ஆம் ஆண்டிலிருந்து 2018ஆம் ஆண்டுவரையான 13 ஆண்டுகள் சௌமியமூர்த்தி தொண்டமான் ஞாபகார்த்த மன்றத்தில் இடம்பெற்றிருக் கக்கூடிய பல்வேறு கணக்கீடுகள் தொடர்பான முறைகேடான விடயங்கள் பற்றிய அறிக்கையைத் தயாரிப்பதற்கோ அல்லது விசாரணைகளை நடத்துவதற்கோ கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களத்தினால் முடியாமல் போயிருக்கின்றது. எனவே, இத்தகைய குறைபாடுகளைச் சரி செய்வதற்காகவே இந்தச் சட்டத்தின் ஊடாக நாங்கள் பல்வேறு நிவாரணங்களை எதிர்பார்க்கின்றோம்.

இப்பொழுது இந்தச் சபையில் இருக்கின்ற COPE குழுவின் தலைவர் கௌரவ சுனில் ஹெந்துன்னெத்தி அவர்களுக்கு நாங்கள் நன்றி தெரிவிக்க வேண்டும். ஏனென்றால் தொடர்ச்சியாக இந்தப் பாராளுமன்றத்தில் நாங்கள் வலியுறுத்தி வந்ததன் அடிப்படையில் - எங்களது தொடர்ச்சியான அழுத்தங்களின் ஊடாக - அவர் இப்பொழுது குறித்த மன்றத்தை COPE குழுவுக்கு அழைத்துள்ளார். கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம் குறித்த விசாரணைகளை உரிய முறையில் மேற்கொள்வதற்குப் பல்வேறு தடங்கல்கள் இருந்த நிலையில்தான் அவர் COPE குழுவின் தலைவர் என்கின்ற முறையிலே அந்தக் குழுவின் முன்னிலையில் குறித்த மன்றத்தினரை தற்போது அழைத்திருக்கின்றார்.

I want to thank the Chairman of the Committee on Public Enterprises, the Hon. Sunil Handunnetti. You have directed the Chairman of Savumiamoorthy Thondaman Memorial Foundation to submit a report signed by him on or before 04th August, 2018 to the Secretariat through the Secretary to the Ministry with regard to the matters referred to in the Auditor General's Report for the year 2015 and a Report on the Performance and the Current Affairs of the institution indicating the audit paragraph numbers referred to in the AG's report.

සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමා වැදගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. විගණකාධිපති දෙපාර්තමේන්තුවට කලින් පනතෙන් කරන්න බැරි වෙච්ච දේවල් කෝප් එකට වාර්තා කරන්න කියලා ඔබතුමාගේ ලිපියේ සඳහන් කරලා තිබෙනවා. ඒ ගැන ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා. අද අපි මේ සම්මත කරන්න යන පනත් කෙටුම්පත එන තුරු ඉන්නේ නැතුව අපේ ඉල්ලීම පරිදි ඔබතුමා සභාපතිතුමා විධියට ඉදිරිපත් වෙලා මේ වැඩ කටයුතු කරන්න පටන් ගත්තාට බොහොම ස්තුතිවන්ත වෙනවා. මේ වාගේ -

இதுபோன்ற முறைகேடான பல நிறுவனங்கள் இருக்கின்றன. ஆனால், உதாரணத்திற்காக குறித்த மன்றம் சம்பந்தமான அறிக்கையை நான் இங்கு முன்வைக்கின்றேன். இதுபோன்ற பல பொறுப்புமுயற்சிகளில் முறையாகக் கணக்குகள் பேணப்படாமை பற்றி நாங்கள் இந்த உயரிய சபையிலே தெரிவித்திருக்கின்றோம். எனவே, கணக்காய்வுத் திணைக்களமாக இருக்கட்டும், COPE குழுவாக இருக்கட்டும் அல்லது COPA குழுவாக இருக்கட்டும் இது எல்லாமே கணக்கு நடவடிக்கைகள் முடிவுற்ற பின்னரே அவதானிப்புகளைச் செய்திருக்கின்றன. எனவேதான் நான் உட்பட 16 பாராளுமன்ற உறுப்பினர்கள் ஒன்று சேர்ந்து இந்தப் பாராளுமன்றத்திலே மதிப்பாய்வுக்கான குழுவொன்றை கோரி நிற்கின்றோம்.

අපට ඕනෑ, ඇගයීම් පිළිබඳව කමිටුවක්. ඕනෑම ව්‍යාපෘතියක් පටන් ගන්නට කලින් අපි ඒ ගැන අධ්‍යයනය කරලා බලන්න ඕනෑ මේක වැදගත්ද- whether it is viable to this country- කියලා. ඒ වාගේ දෙයක් අපට අනිවාර්යයෙන්ම ඕනෑ. ඒ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරගෙන යනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා ඉදිරිපත් කරන්නේ වැදගත් යෝජනාවක්. දැනටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ හදපු ජාතික ප්‍රසම්පාදන කොමිසමත් - National Procurement Commission එකත්- මේ වාගේම බලාත්මක කළෝතින් ඒ ක්‍රියාවලිය ආරම්භ කරන්න පුළුවන්.

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

අනිවාර්යයෙන්ම. අපි දැනටමත් කැබිනට් අනුමැතිය ලබා ගෙන තිබෙනවා, ඇගයීම් පිළිබඳව ප්‍රතිපත්තියක් මේ රටට යෝජනා කරන්නට. සංවර්ධන ව්‍යාපෘති සඳහා ඒ වාගේ වාර්තාවක් ලබා ගන්න ඕනෑ. ඒකට අමතරව ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, අපේ අගමැතිතුමා, ජනාධිපතිතුමා හා කථානායකතුමා ඉදිරියේදී මගේ පෞද්ගලික යෝජනාවක් හැටියට පාර්ලිමේන්තු කමිටු meeting එකේදී මම යෝජනා කරලා තිබෙනවා, COPE, COPA වාගේම ඇගයීම් පිළිබඳව කමිටුවක් පත් කරන්න කියලා. We must have a committee on evaluation in Parliament before we start any development project. පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව ඕනෑම මන්ත්‍රී කණ්ඩායමකට ඒකට සහභාගී වෙන්න පුළුවන්. එතකොට ඒ කමිටුව ඇතුළේදී ඒ වාගේ දේවල් හදන්න අපට තීරණ ගන්න පුළුවන්.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இதுவரை காலமும் இதுபோன்ற மன்றங்களினூடாகத்தான் மலைநாட்டு அபிவிருத்தி தொடர்பான விடயங்கள் முன்னெடுக்கப்பட்டு வந்தன. தனிப்பட்ட கட்சிகளின் அல்லது குடும்பங்களின் செல்வாக்கினூடான இத்தகைய மன்றங்களின்மூலம் மக்கள் சார்பான அபிவிருத்தித் திட்டங்களை முன்னெடுக்க முடியாது என்ற அடிப்படையிலே, பெருந்தோட்டப் பகுதிகளில் புதிய கிராமங்களை அமைப்பதற்கான அதிகாரசபையொன்றை நிறுவுவதற்குக் கடந்த மூன்றாண்டு காலமாக நாங்கள் கடினமாக உழைத்தோம். அதேநேரம் அது சம்பந்தமான குறித்த சட்டமூலமொன்றை அமைச்சரவையின் அனுமதியைப் பெற்றுக்கொண்டு, அடுத்த மாதமளவில் இந்த உயரிய சபையிலே சமர்ப்பிக்கவிருக்கின்றோம். மலைநாடு சார்ந்த அபிவிருத்தித் திட்டங்களை முறைகேடான கணக்கீடுகளின் ஊடாக மேற்கொள்கின்ற நிலைமையை மாற்றியமைக்கும் முகமாக பாராளுமன்றத்துக்குப் பொறுப்புக்கூறக்கூடிய, கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களத்துக்குப் பொறுப்புக்கூறக்கூடிய வகையிலான பொதுமக்களின்

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

நிதியைச் சரியாகப் பயன்படுத்தக்கூடிய அதிகாரசபையை அமைப்பது தொடர்பிலான சட்டமூலம் இந்தச் சபையில் விவாதத்துக்கு வரும்பொழுது அனைத்துப் பாராளுமன்ற உறுப்பினர்களும் அதனை ஆதரிக்க வேண்டும் என்று கோரி, வாய்ப்புக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Thank you. Next, the Hon. Risad Badhiutheen.

[பி.ப. 6.04]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ சபைக்குத் தலைமைதாங்குகின்ற பிரதிச் சபாநாயகர் அவர்களே, வரலாற்று முக்கியத்துவம் வாய்ந்த தேசிய கணக்காய்வுச் சட்டமூலம் தொடர்பான விவாதத்திலே பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக உங்களுக்கு நன்றி கூறிக் கொள்கின்றேன். தேசியக் கணக்காய்வுச் சட்டமூலம் நிறைவேற்றப்படுமா? இல்லையா? என்பது குறித்துப் பல ஊடகங்கள் தொடர்ந்தேர்ச்சியாக எழுதிக் கொண்டிருந் ததையும், சில அதிகாரிகள் இந்தச் சட்டமூலம் தொடர்பாக அச்சப்பட்டதையும் நாங்கள் பார்த்தோம். ஆனால், மக்கள் தந்த ஆணைக்கு மதிப்பளித்து, இந்த நல்லாட்சியிலே இந்தச் சட்டமூலம் நிறைவேற்றப்பட இருப்பதையிட்டு நான் மிகவும் சந்தோசப்படுகின்றேன். நமது நாட்டில் சில அதிகாரிகள் மற்றும் அரசியல்வாதிகள் பல தவறுகளைச் செய்திருக்கிறார்கள்; செய்து கொண்டிருக்கிறார்கள். ஆனால், சிலநேரங்களில் தவறு செய்யாத அதிகாரிகளும் அரசியல் வாதிகளும் தண்டிக்கப்படுகின்றார்கள். எவ்வாறாயினும் இன்று குறித்த சில அதிகாரங்களைக் கொண்ட இந்தச் சட்டமூலமானது நிறைவேற்றப்படுகின்றபோது, நிச்சயமாக ஒரு சுபீட்சமிக்க எதிர்காலம் நமது நாட்டுக்குக் கிடைக்குமென்ற பெரிய நம்பிக்கை எனக்கு இருக்கின்றது. எனவே, கணக்காய்வாளர் நாயகம் அவர்களும் மற்றும் அதிகாரிகளும் தங்களுடைய கடமையை மதத்துக்கு அப்பால், அரசியலுக்கு அப்பால், சுயநலன்களுக்கு அப்பால், ஒரு புண்ணிய பணியாகக் கருதிக் கண்ணியமாக, நேர்மையாகச் செய்வதற்குப் பழகிக்கொள்ள வேண்டும்.

இன்று ஒரு சில தேரர்மார் வில்பத்து சம்பந்தமான கணக்காய்வாளர் நாயகத்தின் அறிக்கையின் ஒரு துண்டைப் பிடித்துக் கொண்டு, 1990ஆம் ஆண்டு பிரபாகரன் காலத்தில் வடக்கிலிருந்து வெளியேற்றப்பட்ட முஸ்லிம் மக்களுடைய மீள்குடியேற்றத்தை என்னுடன் சம்பந்தப்படுத்தி, சிறிது காலமாக இந்த நாட்டிலே மிக மோசமான முறையில் பெரிய ஒரு நாடகத்தை அரங்கேற்றி வந்தார்கள். ஆனால், அண்மையிலே பீல்ட் மார்ஷல் சரத் பொன்சேகா அவர்கள் வன வளத்துக்குப் பொறுப்பான அமைச்சராக நியமிக்கப்பட்ட பின்னர், அந்தப் பிரதேசத்துக்கு விஜயம் செய்து, குறித்த அதிகாரிகளோடு கலந்துரையாடி, அந்தப் பகுதி முழுவதையும் பார்வையிட்ட பிறகு "வில்பத்து வனப் பிரதேசத்துக்குள் எந்தவோர் அத்துமீறிய குடியேற்றமும் இடம்பெறவில்லை" என்று சொல்லியுள்ளார். அதற்காக அவருக்கு நான் நன்றி கூறுகின்றேன்.

ஆனால், இந்த ஆட்சி மாற்றத்துக்குப் பங்காளியாக என்னுடைய கட்சியோடு நான் சென்றேன் என்ற காரணத்தினால் என்னைப் பழிவாங்க வேண்டும் என்பதற்காக, அரசியலுக்காக, சுயநலத்துக்காக, 'கொமிஷன்'க்காக, பணத்துக்காக, NGO களின் தேவைக்காக ஒரு சில தேரர்களும் ஒரு சில வெளிநாட்டு diaspora களுடைய agent களும் இவ்வாறான ஓர் அபத்தமான - உண்மைக்குப் புறப்பான குற்றச்சாட்டை என்மீதும் என்னுடைய சமுதாயத்தின் மீதும் - ஓர் இலட்சம் அகதிகள் மீதும் சுமத்தி வந்தனர். அதேநேரம் Auditor-General's Department இனுடைய குறித்த அறிக்கை பிழையாக அதாவது தெளிவில்லாமல் வெளியிடப்பட்டதனூடாக இன்று எங்களுடைய முழுச் சமூகமும் வேதனைப்படுகின்றது. குறித்த கூட்டத்தினர் அந்த அளவுக்குத் தங்களுடைய செயல்பாட்டை முன்னெடுத்திருக்கின்றார்கள்.

எனவே, இவ்வாறான அறிக்கைகளை வெளியிடுகின் றபொழுது நேர்மைத் தன்மையோடும் புனிதத் தன்மையோடும் செயற்பட வேண்டுமென்பதைச் சம்பந்தப்பட்ட திணைக்கள அதிகாரிகள் அத்தனை பேரும் புரிந்துகொள்ள வேண்டும்.

எமது நாடு சுபீட்சமானதொரு நாடாக மலருவதற்குப் பணம் மாத்திரமல்ல, அரச திணைக்களங்களிலுள்ள அதிகாரிகள் மற்றும் உத்தியோகத்தர்கள்கூட காரணமாக அமையலாம். அதேநேரம் இன்று தனியார் நிறுவனங்களிலே வேலை செய்வதற்கு ஆட்கள் இல்லாத ஒரு நிர்ப்பந்த சூழல் கைத்தொழிற்பேட்டைகளிலே ஏற்பட்டிருப்பதை நான் பார்க்கின்றேன். காரணம், அரச தொழிலினூடாகத் தங்களுடைய pension இனை உறுதிப்படுத்திக் கொள்ளலாமென்ற எண்ணத்தில் இன்று மக்கள் அரச தொழில்வாய்ப்புக்களைத் தேடிச் செல்கின்றார்கள். தாங்கள் எந்தவொரு productivity இல்லாதவர்களாக இருந்தாலும் தங்களால் எந்தவொரு பிரயோசனமான வேலைத்திட்டம் மேற்கொள்ளப்படாவிட்டாலும், காலை 8.30 மணியிலிருந்து மாலை 4.15 மணிவரை காரியாலயத்தில் இருந்துவிட்டு, 60 வயது வரை எந்தப் பிரச்சினையும் இல்லாமல் அரச தொழிலினூடாகச் சம்பளத்தைப் பெற்றுக் கொண்டு வாழலாமென்ற ஒரு நம்பிக்கையிலேயே சம்பந்தப்பட்டவர்கள் அரச தொழில் வேண்டிப் போராட்டம் நடாத்துகின்றார்கள். தனியாக நின்று முன்னேறலாமென்ற நம்பிக்கை இல்லாததால்தான் இவ்வாறு இவர்கள் போராடுகின்றார்கள்.

சில வெளிநாடுகளோடு ஒப்பிடுகின்றபொழுது நமது நாடு கல்வி ரீதியாக உச்சத்தில் இருக்கின்றது. அதேநேரம் நம்மிடத்திலே மனித வலு இருக்கின்றது. ஆனால், நம்பிக்கை இல்லை. அதேநேரம் எந்தவிதமான நல்ல சிந்தனையுமில் லாமல் அரசியலை மாத்திரம் மையமாகக் கொண்டு ஒவ்வோர் அரசாங்கமும் தன்னுடைய ஆட்சியைத் தக்கவைத்துக்கொள்ள வேண்டுமென்பதற்காகப் பல்வேறு வகையான நியமனங்களை வழங்குகின்றபொழுது அதிக பணம் செலவாகின்றது. ஆனால், அந்தப் பணத்தைச் செலவழிப்பதன்மூலம் எந்தப் பிரயோசனமுமில்லாது போவதையும், பல்வேறு வகையான ஊழல்களும் சிக்கல்களும் ஏற்படுவதையும் நாங்கள் பார்க்கின்றோம்.

இன்று அரசியல்வாதிகளுடைய தொல்லையினால் சில நல்ல அதிகாரிகள்கூட தண்டிக்கப்பட்டிருக்கிறார்கள். அதனால் இன்று சில அதிகாரிகள் குறித்த பணிப்பாளர் சபையிலே அமர்வதற்குப் பயப்படுகின்றார்கள். அதேநேரம் அத்தகைய அதிகாரிகள் அரசியல்வாதிகளின் அழுத்தங்களினால் சில முடிவுகளை எடுக்க வேண்டிய

நிர்ப்பந்தம் ஏற்படுகிறது. ஆனால், சிலவேளைகளிலே அந்த முடிவுகளின் தாக்கம் அந்த அதிகாரிகளைப் பாதிக்கின்றது. அதாவது, பணிப்பாளர் சபையிலே இருந்த ஒரே காரணத்திற்காக அவர்கள் நீதிமன்றம் ஏறியிறங்க வேண்டியவர்களாக, சிறையிலே வாட வேண்டியவர்களாக இருக்கின்றார்கள். இன்று சட்டத் தரணிகளுக்குக் கட்டணம் கொடுக்க முடியாத அளவுக்குக்கூடச் சில அதிகாரிகள் கஷ்டப்படுவதையும் நாங்கள் பார்க்கின்றோம். இந்த நிலை மாறி, நல்லதொரு நிலைமை ஏற்படுத்துவதற்கு நிச்சயமாக இந்த Bill பிரயோசமுள்ளதாக அமையும். ஆகவே, இந்தச் சட்டமூலத்தைச் செயற்படுத்த வேண்டிய பாரிய பொறுப்பு கணக்காய்வாளர் நாயகம் அவர்களுக்கும் மற்றும் அதிகாரிகளுக்கும் இருக்கின்றது. அதனை அவர்கள் உணர்ந்து செயற்பட வேண்டுமென்று இந்த இடத்திலே கேட்டு, சந்தர்ப்பத்திற்கு நன்றி கூறி, விடை பெறுகின்றேன்.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***

***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු නිරෝෂන් පෙරේරා මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" - [மாண்புமிகு நிரோஷன் பெரேரா]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Niroshan Perera.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 සහ 2 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம், 2ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 and 2 ordered to stand part of the Bill.*

## 3 වන වගන්තිය.- (විගණනය කරනු ලබන ආස්ථිතයන්ට අදාළ විගණනයේ විෂය පථය.)
## வாசகம் 3.- (கணக்காய்வுக்குட்படு உருவகங்கள் தொடர்பாகக் கணக்காய்வின் நோக்கெல்லை.)

CLAUSE 3.- (*Scope of audit in relation to auditee entities.*)

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 18 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) ඒකාබද්ධ අරමුදල වෙත ලැබෙන සියලු ආදායම් සහ ඒකාබද්ධ අරමුදලෙන් වන සියලු වියදම් විගණනය කරනු' ";

(2) "2 වන පිටුවේ, 3 වන සහ 4 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ඇ) එක් එක් විගණනයේ දී, ආදායම්, වියදම්, ගනුදෙනු හා සිද්ධීන් පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය යුතු ය.' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, ඔබතුමාගේ සංශෝධනය ඉදිරිපත් කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු සභාපතිතුමනි, මගේ සංශෝධනයත් මේ ඉදිරිපත් කළ සංශෝධනයෙන් ආවරණය වෙලා තිබෙන නිසා එය අවශ්‍ය වෙන්නේ නැහැ.

***3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

*Clause 3, as amended, ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

4 වන වගන්තිය, සංශෝධන ඉදිරිපත් කිරීමට, ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

## 4 වන වගන්තිය.- (මහජනයා විසින් විගණකාධිපතිවරයාට දැනුම් දෙනු ලැබීම.)
## வாசகம் 4.- (கணக்காய்வாளார் தலைமையதிபதிக்குப் பொதுமக்கள் அறிவித்தல்.)

CLAUSE 4.- (*Public to notify Auditor General.*)

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"6 වන පිටුවේ, (4) (1) වගන්තියේ 22 වන පේළියේ 'පෙනී සිටීම සඳහා' කොටස ඉවත් කොට පහත සඳහන් වචන ඇතුළත් කළ යුතුය:

'විගණකාධිපතිවරයාගේ අනුමැතිය මත' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මෙම සංශෝධනයට ඔබතුමා එකඟද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
එම සංශෝධනයට එකඟ නැහැ, ගරු සභාපතිතුමනි.

***4 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*4 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 4 ordered to stand part of the Bill.*

***5 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*5ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 5 ordered to stand part of the Bill.*

## 6 වන වගන්තිය.- (විගණකාධිපතිවරයාගේ කාර්ය සහ කර්තව්‍ය.)
## வாசகம் 6.- (கணக்காய்வாளர் தலைமையதிபதியின் கடமைகளும் பணிகளும்.)
CLAUSE 6.- (*Duties and functions of the Auditor General.*)

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "3 වන පිටුවේ, 24 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
'(i) අදාළ වන මූල්‍ය තත්ත්වය වාර්තා කිරීමේ ප්‍රමිතීන්ට' ";

(2) "4 වන පිටුවේ, 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
'කිරීම සඳහා සහාය විය යුතු ය. පාර්ලිමේන්තුවේ අනෙකුත් සියලු කාරක' ";

(3) "4 වන පිටුවේ, 16 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
'කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් සෘජුව හෝ වක්‍රව රජය හෝ' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 6, as amended, ordered to stand part of the Bill.*

## 7 වන වගන්තිය.- (විගණනයක් සිදු කිරීමේදී විගණකාධිපතිවරයාගේ බලතල.)
## வாசகம் 7.- (கணக்காய்வொன்றை நிறைவேற்றுவதில் கணக்காய்வாளர் தலைமையதிபதியின் தத்துவங்கள்.)
CLAUSE 7.- (*Powers of the Auditor General in carrying out an audit.*)

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"6 වන පිටුවේ, 22 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
'වෙනත් යම් තැනැත්තකු ඉදිරියේ පෙනී සිටීම සඳහා, විගණකාධිපතිවරයාගේ අනුමැතිය ඇතිව එම විෂය' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා, ඔබතුමාගේ සංශෝධනය ඉදිරිපත් කරන්න.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ඒ සංශෝධනය තමයි දැන් රාජ්‍ය ඇමතිතුමා ඉදිරිපත් කළේ.

***7 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*7ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 7, as amended, ordered to stand part of the Bill.*

***8 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*8ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 8 ordered to stand part of the Bill.*

## 9 වන වගන්තිය.- (තොරතුරු හෙළිදරව් නොකළ යුතු බව.)
## வாசகம் 9.- (தகவல்களை வெளிவிடாமை.)
CLAUSE 9.- (*Non-disclosure of information.*)

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
( மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"7 වන පිටුවේ, 9 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
'9. (1) විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්, මේ පනත' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

**ගරු සභාපතිතුමා**
( மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
9 වන වගන්තිය සඳහා සංශෝධන ඉදිරිපත් කිරීමට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාගේ සංශෝධනය ඉදිරිපත් කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "7 වන පිටුවේ, 9 (අ) වගන්තියේ 17 වන පේළියේ 'හෝ (ආ) ඡේදයට යටත්ව' කොටස ඉවත් කරන්න" ;

(2) "7 වන පිටුවේ, 9 (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> '9. (ආ) රාජ්‍ය මුල්‍ය අවභාවිතා කිරීම, වංචා කිරීම හෝ දූෂණය සම්බන්ධයෙන් යම් පුද්ගලයකු වගකිව යුතු බව අනාවරණය වන්නේ නම්, ඔවුන් සම්බන්ධ ක්‍රියා කිරීමට හැකි නියාමන රාජ්‍ය ආයතනයට වාර්තා කිරීමේ හැකියාව විගණකාධිපතිවරයා සතු වන්නේය.' "

**ගරු සභාපතිතුමා**
( மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මෙම සංශෝධනවලට ඔබතුමා එකඟද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

එම සංශෝධනවලට එකඟ නැහැ, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

9 වන වගන්තිය සඳහා සංශෝධන ඉදිරිපත් කිරීමට, ගරු තිලංග සුමතිපාල මහතා.

**ගරු තිලංග සුමතිපාල මහතා**
( மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"9. (ආ) වගන්තිය ඉවත් කරන්න."

ආදේශයන් පිළිබඳව ඔබතුමා දැනුවත් කර තිබෙනවා. ඔබතුමාගේ එකඟතාව තිබෙනවා නම් මට ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
( மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, එම සංශෝධනයට ඔබතුමා එකඟද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
( மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

එම සංශෝධනයට එකඟ නැහැ, ගරු සභාපතිතුමනි.

***9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*9ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 9, as amended, ordered to stand part of the Bill.*

## 10 වන වගන්තිය.- (විගණකාධිපතිවරයා විසින් වාර්ෂිකව පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව.)

### வாசகம் 10.- (கணக்காய்வாளர் தலைமையதிபதி ஆண்டுதோறும் ஓர் அறிக்கையைப் பாராளுமன்றத்துக்குச் சமர்ப்பித்தல்.)

CLAUSE 10.- (*Auditor General to submit a Report to Parliament annually.*)

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
( மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "8 වන පිටුවේ, 15 වන සහ 16 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> "10.(1) විගණකාධිපතිවරයා විසින්, එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුව, ලිඛිත නීතිය යටතේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාවන් තුළ දී, ඔහු විසින් එම වර්ෂය තුළ දී' ",

(2) "25 වන සහ 26 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> "(3) (1) වන උපවගන්තිය යටතේ වූ වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව, විගණකාධිපතිවරයා විසින් ජාතික විගණන'";

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*10ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 10, as amended, ordered to stand part of the Bill.*

## 11 වන වගන්තිය.- (සම්පිණ්ඩන වාර්තාව සහ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තා.)

### வாசகம் 11.- (சுருக்கமான அறிக்கையும் வருடாந்த விபரமான முகாமைக் கணக்காய்வறிக்கையும்.)

CLAUSE 11.- (*Summary Report and Annual Detailed Management Audit Report.*)

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

" 8 වන පිටුවේ, 29 වන සහ 30 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

> '11. (1) 12 වන වගන්තියේ සඳහන් කරන ලද ආස්ථිතයක් හැර යම් විගණනය කරනු ලබන ආස්ථිතයක් විසින් ඉදිරිපත්' ";

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

***11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 11, as amended, ordered to stand part of the Bill.*

***12 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*12ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 12 ordered to stand part of the Bill.*

## 13 වන වගන්තිය.- (විශේෂ වාර්තා.)

### வாசகம் 13.- (விசேட அறிக்கைகள்.)

CLAUSE 13. - (*Special Reports*)

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"11 වන පිටුවේ, 13 වන ඡේදයේ, පළමු පේළියේ පහත කොටස් ඉවත් කරන්න:

'තවද යම් වාර්තාවක්, තොරතුරක්, ලේඛනයක්, පොතක්, ගොනුවක් හෝ පරිගණක ආශ්‍රයෙන් ලබා ගන්නා පිටපතක් ඔහු විසින් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත ලබා දෙනු ඇත්නම් හෝ එසේ ලබා දීමට අදහස් කරනු ලබන්නේ නම් එම වාර්තාව ප්‍රකාශයට පත් නොකළ යුතුය' ";

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු රාජ්‍ය ඇමතිතුමා, සංශෝධනයට එකඟද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
13වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීමට ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා.

**ගරු තිලංග සුමතිපාල මහතා**
( மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

13වන වගන්තියේ කොටසක් ඉවත් කර ආදේශ කරන්න තමයි ඉල්ලීම කරන්නේ. රාජ්‍ය ඇමතිතුමා ඒකට එකඟ වෙන්නේ නැත්නම්,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු රාජ්‍ය ඇමතිතුමා, සංශෝධනයට එකඟද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
( மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
එකඟ නැහැ.

***13වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*13ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 13 ordered to stand part of the Bill.*

***14 සිට 17 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*14ஆம் வாசகத்திலிருந்து 17ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 14 to 17 ordered to stand part of the Bill.*

## 18 වන වගන්තිය.- (විගණන ගාස්තු.)

### வாசகம் 18.- (கணக்காய்வுக் கட்டணங்கள்.)

CLAUSE 18.- (*Audit fees.*)

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
( மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

" 14 වන පිටුවේ, 15 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(6) භාණ්ඩාගාර ලේකම්වරයා හෝ අදාළ' ";

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***18 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*18ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 18, as amended, ordered to stand part of the Bill.*

## 19 වන වගන්තිය.- (විගණන කොමිෂන් සභාව විසින් අධිභාරයක් පැනවිය යුතු බව.)

### வாசகம் 19.- (கணக்காய்வுச் சேவை ஆணைக்குழு மிகைக் கட்டணமொன்றை விதித்தல்.)

CLAUSE 19.- (*Audit Service Commission to impose a surcharge.*)

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
( மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"15 වන පිටුවේ, 30 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යුතු ය. ප්‍රධාන ගණන්දීමේ නිලධරයා විසින් ඒ පිළිබඳව විගණන සේවා කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතු ය' ";.

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
( மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"15 වන පිටුවේ, 19.(2) ඡේදය - " 12 සිට 17 පේළි" ඉවත් කරන්න.

ගරු රාජ්‍ය ඇමතිතුමා, මා ඉදිරිපත් කරන දෙවන කොටසේ සංශෝධනය ඔබතුමා පිළිගන්නවාද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
( மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

එකඟ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
( மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"15 වන පිටුවේ, 19 (3) අ. ඡේදය අගට පහත කොටස් එකතු කරන්න.

'ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මඟින් එම නියෝජන විගණන කොමිසම වෙත වාර්තා කළ යුතුයි' "

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
( மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

එකඟ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
( மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු සභාපතිතුමා, පොඩ්ඩක් පැහැදිලි කරගන්න අවශ්‍යයි. මොකද, අපට ලබාදී ඇති සංශෝධන කොළයේ ඔබතුමාගේ සංශෝධනයක් නැහැ. ඔබතුමා එක්කෝ මම ඉදිරිපත් කරන සංශෝධනය පිළිගෙන සංශෝධනයක් ඉදිරිපත් කරන්න ඕනෑ. එහෙම නැත්නම් ඔබතුමා අලුතෙන්ම මෙතැන සංශෝධනයක් කියවනවා. දැන් ඔබතුමා ඉදිරිපත් කරන ලද 19 වන වගන්තියට අදාළව කියවන සංශෝධනය ඔබතුමාගේ සංශෝධන පිටපතේ නැහැ.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

මා ළඟ පිටපතේ තිබෙනවා. 19වන වගන්තියට සංශෝධනයක් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

18වන වගන්තියට තිබෙනවා; 23 වන වගන්තියට තිබෙනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු මන්ත්‍රීතුමා, 19වන වගන්තියට සංශෝධනයක් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු සභාපතිතුමනි, අපට ලබාදීපු පිටපතේ නැහැ. මම බලාගෙන කියවන්නේ,-

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

අපට ලබාදීපු පිටපතේ තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

14වන පිටුවේ, 18වන වගන්තිය තිබෙනවා. මම කියවන්නේ ඔබතුමන්ලා සභාවට ඉදිරිපත් කරන ලද සංශෝධන කොළය. මම වෙන එකක් ගැන දන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු රාජ්‍ය ඇමතිතුමා, ඔබතුමා ඒ සංශෝධනය පිළිගෙන තිබෙනවාද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

කොහොමත් එකඟ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මම ඉදිරිපත් කරන සංශෝධනයට එතුමා එකඟ නැති එක හරි. උදේ පාර්ලිමේන්තුවේ ඔබතුමන්ලා ඉදිරිපත් කරපු සංශෝධන පිටපත තමයි මේ තිබෙන්නේ. ඒ දිහා බලාගෙන තමයි මම මේ කියවන්නේ. එහි කොතැනකවත් නැහැ -අවශ්‍ය නම් වෙනත් මන්ත්‍රීවරයකුගේ පිටපතක් අරගෙන බලන්න- 19වෙනි වගන්තියට සංශෝධනයක් ඉදිරිපත් කරලා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

19වෙනි වගන්තියට අදාළ සංශෝධනය ඉංග්‍රීසි පිටපතේ තිබෙනවා; සිංහල පිටපතේ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

අපේ මේසය උඩ තිබෙන පිටපතේ නැහැ. සහකාර මහ ලේකම්තුමියට ආව ෆැක්ස් එකක් අර තිබෙන්නේ. [බාධා කිරීමක්] මේසය මත තබන දේවල් තමයි සංශෝධන වෙන්නට ඕනෑ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

යුතුකම වන්නේ, ලේකම්තුමියට භාරදීමයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒක තමයි, සහකාර මහ ලේකම්තුමියට එකක් භාර දීලා, අපට එකක් භාර දීලා හරියන්නේ නැහැනේ. මේසය මත තබන-

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඉංග්‍රීසි පිටපතේ තිබෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මේවා ගැන සාකච්ඡා කරන විට මෙවැනි දේවල් සාමාන්‍යයෙන් සිද්ධ වෙනවා. ඔබතුමන්ලා සංශෝධන වගයක් එව්වා. ඒ සමහර සංශෝධන අපි පිළිගත්තා. සමහර සංශෝධන නැවත සංශෝධනය කරලා දෙපැත්තම පිළිගත්තා; සමහර ඒවා පිළිගත්තේ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු අගමැතිතුමනි, මම ඒ කාරණය නොවෙයි මතු කළේ. අපි ඉදිරිපත් කළ සංශෝධන ඔබතුමන්ලා තවම පිළිගත්තේ නැති එක හරි. ඒක ඔබතුමන්ලාගේ අයිතිය. නමුත් ඔබතුමන්ලා මේසය මත තැබූ සංශෝධනවල 19වෙනි වගන්තිය සඳහා සංශෝධනයක් නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, දැන් මේ ඉදිරිපත් කරන සංශෝධනවල උදේ නොතිබුණු සංශෝධන තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

එහෙම වෙන්න බැහැනේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

එහෙම වෙනවා. ඔබතුමා ඉදිරිපත් කළ යෝජනා කිහිපයක් අපි පිළිගත්තා. ඒ පිළිගත්ත ඒවා ඔය කඩදාසියේ නැහැ. නමුත් ඒ යෝජනා ටික සංශෝධන විධියට දැන් ඉදිරිපත් කළා. ඒ නිසා මේ කඩදාසියට සීමා වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමා ඔබතුමාගේ සමහර සංශෝධන පිළිඅරගෙන තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔබතුමන්ලා කියනවා නම් අපි ඉදිරිපත් කළ සංශෝධනයම තමයි ඒක කියලා අපට ඉල්ලන්න පුළුවන්.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, සංශෝධන විධියට අද පිළිගන්නට ඕනෑ උදේ print කරලා ඉදිරිපත් කළ එකම නම්, මෙතුමන්ලා දවල් අපට දීපු ඒවා පිළිගන්නත් බැහැනේ. ඔබතුමන්ලා දවල් දුන්නු ඒවා අපි පිළිගත්තා. ඒවා උදේ ඉදිරිපත් කළ printed කඩදාසියේ නැහැ. ඒ වාගේ අපි දැන් මේ සංශෝධන ඉදිරිපත් කරනවා. සමහර විට වැරැද්දක් වෙන්න ඇති. ඉංග්‍රීසි පිටපතේ ඒක තිබෙනවා. සිංහල පිටපතට ඒක ඇවිල්ලා නැහැ. ඒක තමයි වෙලා තිබෙන්නේ. නමුත් අපට සංශෝධන ඉදිරිපත් කිරීමේ අයිතිය තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු සභාපතිතුමනි, මම ඉදිරිපත් කළ සංශෝධනය තමයි, "ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මඟින් එම නියෝජන විගණන කොමිසම වෙත වාර්තා කළ යුතුයි" කියන එක. ගරු රාජ්‍ය ඇමතිතුමා කිව්වා ඒක පිළිගන්නේ නැහැයි කියලා. දැන් එතුමා අතින් එහෙම කියැවුණා. නමුත් එතුමාගේ සංශෝධනය වශයෙන් ඉදිරිපත් කළෙත් ඒකමයි. එතුමා ඒකම ඉදිරිපත් කරලා, මම ඉදිරිපත් කළ එක පිළිගන්නේ නැහැ කිව්වා. මම අහන ප්‍රශ්නය ඒකයි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, ඒ contentsවල ඒ අදහස තිබෙනවා. නමුත් ඒ ආකාරයෙන් නොවෙයි අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ අදහස තිබුණාට ඒ වචනවල වෙනසක් තිබෙනවා. ඒකයි අපි කියන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

බොහොම ස්තුතියි. ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"19 (3) (ඉ) (ii )වගන්තියට පහත සඳහන් කොටස එකතු කරන්න:

> 'ගනුදෙනු හේතුවෙන් සිදු වූ ඌනතාවය හෝ පාඩුව, ඒ මත නිශ්චය කරනු ලැබූ අධිභාරය සහ එම මුදල ගෙවීමට නිශ්චිතව දක්වා ඇති දිනය ඉක්ම වී මාස දෙකක් ප්‍රමාද වීම හේතුවෙන්, තීරණය කරනු ලැබිය හැකි යම් පොලී ප්‍රතිශතය ද ඇතුළත් වූ අය කර ගනු ලැබිය යුතු මුදල.' "

**ගරු සභාපතිතුමා**
( மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, එයට එකඟද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
( மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
එකඟ නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"15 වන පිටුවේ, 13 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-
'ක්‍රියා මාර්ගයකින් හෝ අධිකරණ ක්‍රියාවලියකින් පෙරාතුව විගණනය' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***19 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*19ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 19, as amended, ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
( மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
20වෙනි වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීමට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
( மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මට 19වෙනි වගන්තියට ඉදිරිපත් කළ යුතු තව සංශෝධන කොටස් කිහිපයක් තිබුණා.

**ගරු සභාපතිතුමා**
( மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඒවා ඉදිරිපත් කිරීමට පළමුවෙනි අවස්ථාවේ අවසර දුන්නා, ඔබතුමාගේ සංශෝධනය කියන්නට තිබුණා. දැන් 20වෙනි වගන්තියට සංශෝධන ඉදිරිපත් කරන්න.

## 20 වන වගන්තිය. - (අධිභාර අභියාචනා කමිටුව වෙත අභියාචනය කිරීම.)

වාசகம் 20.- (மிகைக்கட்டண மேன்முறையீட்டுக் குழுவுக்குச் செய்யப்பட வேண்டிய மேன்முறையீடுகள்.)

CLAUSE 20.- (*Appeals to be made to the Surcharge Appeal Committee.*)

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
( மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාපතිතුමනි, 17 පිටුවේ, 20වෙනි වගන්තියේ, 10වෙනි පේළියේ "තීරණයකින්" ළඟට "හා පනතේ 23(10) යටතේ" කොටස එකතු කරන්න.

එම පේළියේම, යම් තැනැත්තකු ළඟට, "හෝ විගණකාධිපතිවරයා" යන්න එකතු කරන්න.

17 පිටුවේ, 20වෙනි වගන්තියේ, 11වෙනි පේළියේ "ලැබුණු" වචනය ඉවත් කර "නිකුත් කළ" වචනය ඇතුල් කරන්න.

17 පිටුවේ, 20වෙනි වගන්තියේ, (2) කොටස අගට පහත කොටස් එකතු කරන්න.

"මෙම තීරණයන් එළඹුණු විට එයට හේතු සහ පදනම අධිභාර අභියාචනා කොමිසම විසින් වාර්තා ගත කළ යුතු අතර, එම තීරණයන් අදාළ පාර්ශ්වයන්ට ලිඛිතව දැනුම් දිය යුතුය."

ගරු සභාපතිතුමනි, මට මොහොතක් දෙන්න ඒ පිළිබඳව යම් අදහසක් කියන්නට. මොකද, මේ ක්‍රියාවලියේදී තීරණයන්ට එළැඹුණාට අභියාචන කමිටුව ඒවා නැවත විගණන කොමිසමට වාර්තාවෙන ක්‍රමවේදයක් නැහැ.

ඒ නිසා වාර්තාගත කිරීම සහ විගණන කොමිසමට දැනුම් දෙන එකත්, විගණන කොමිසම අදාළ පාර්ශ්වයන්ට නැවත දැනුම් දෙන එකත් සිදු වුණොත් විතරයි මේ ක්‍රියාවලිය සාර්ථක වෙන්නේ. ඒ නිසා මා රජයෙන් ඉල්ලා සිටිනවා, මේ ගැන සැලකිලිමත් වෙන්න කියලා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු රාජ්‍ය ඇමතිතුමා එයට එකඟ ද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
20වෙනි වගන්තියට සංශෝධනය ඉදිරිපත් කිරීමට, ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"20. (2) වගන්තියට පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරන්න:

'මෙම වගන්තිය යටතේ තීරණයකට එළැඹුණු විට එයට හේතු සහ පදනම අධිභාර අභියාචනා කමිටුව විසින් වාර්තාගත කළ යුතුය.' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු රාජ්‍ය ඇමතිතුමා එයට එකඟ ද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
එකඟ නැහැ.

***20 වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*20 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 20 ordered to stand part of the Bill.*

***21 සහ 22 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*21 ஆம் 22ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 21 to 22 ordered to stand part of the Bill.*

## 23 වන වගන්තිය.- (අය කර ගැනීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍ය.)
## வாசகம் 23.- (நீதிவான் முன்னர் அறவிடுவதற்கான வழக்கு நடவடிக்கைகள்.)
CLAUSE 23.- (*Proceedings for recovery before Megistrate.*)

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "19 වන පිටුවේ, 4 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක දී, 20(1) වගන්තිය' ";

(2) "19 වන පිටුවේ, 30 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'විගණන සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද සහතිකය' ";

(3) "20 වන පිටුවේ, 14 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> '(6) (2) වන උපවගන්තියේ, සඳහන් කරන ලද යම් අවස්ථාවක දී, දඩය නොගෙවා පැහැර ' ";

(4) "21 වන පිටුවේ, 13 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'විසින්, 19 වන වගන්තියේ (3)(ඉ)(ii) උපවගන්තියේ දක්වා ඇති ' ";

(5) "21 වන පිටුවේ, 12 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'කොමිෂන් සභාව විසින් හඳුනාගත් අවස්ථාවක දී, භාණ්ඩාගාර ලේකම්වරයා ' ";

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
23 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීමට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> " 21 වන පිටුවේ, (10) ඡේදයේ, 12 වන පේළිය, "ජනාධිපතිවරයා" වෙනුවට "විගණන කොමිසම" වචනය යෙදීම. එම ඡේදයේ අගට "එම කාර්යය සඳහා විගණකාධිපතිවරයාගේ කිසිදු මැදිහත්වීමක් සිදු නොවිය යුතුයි" යෙදීම:

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ඒ වෙනුවට අපි භාණ්ඩාගාර ලේකම්තුමා ආදේශ කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
23 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීමට, ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
එම සංශෝධනයම තමයි, ගරු සභාපතිතුමනි. "භාණ්ඩාගාර ලේකම්තුමා" කියන කොටස ඇතුළත් කරන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු රාජ්‍ය ඇමතිතුමා එම සංශෝධනය පිළිගන්නවා ද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
පිළිගන්නේ නැහැ. ඒ කරුණ අපේ සංශෝධනයෙන් ආවරණය වෙලා තිබෙන්නේ.

***23 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*23ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 23, as amended, ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මෙම පනත් කෙටුම්පතට ඉදිරිපත් කිරීමට නියමිත තවත් සංශෝධන ඇති බැවින්, පස්වරු 6.30න් පසුව සභාවේ කටයුතු පවත්වා ගෙන යෑම සඳහා අනුමැතිය ලබා ගැනීමට නැවතත් පාර්ලිමේන්තුව රැස් වෙනවා.

***ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.***
*அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.*
*Accordingly, Parliament resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාවේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කිරීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී - [ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பட்டது. - [மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee. -*
[THE HON. DEPUTY SPEAKER *in the Chair.*]

***24* වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

*24ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 24 ordered to stand part of the Bill.*

## 25 වන වගන්තිය.- (කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍යයන්.)

### வாசகம் 25.- (ஆணைக்குழுவின் தத்துவங்களும் கடமைகளும் பணிகளும்.)

CLAUSE 25.- (*Powers, duties and functions of the Commission.*)

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "22 වන පිටුවේ, 1 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ආ) 29 වන වගන්තියේ සඳහන් ජාතික විගණන කාර්යාලයේ' ";

(2) "22 වන පිටුවේ, 5 සිට 8 දක්වා පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න."

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

25 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීමට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"22 වන පිටුවේ, (ඉ) ඡේදයට පසුව, පහත කොටස ඇතුළත් කරන්න:

'(ඊ) ඌනතාවය හෝ පාඩුවට අදාළ වටිනාකම පිළිබඳ වාර්තාව අදාළ නිලධාරියා සේවය කරන රාජ්‍ය ආයතනයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත වාර්තා කිරීම' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු ඇමතිතුමා, ඒ සංශෝධනයට එකඟද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"25 වන වගන්තියට පහත සඳහන් වචන එකතු කරන්න:

'(උ) 23(10) වගන්තිය යටතේ ඌනතාවයට හෝ පාඩුවට වගකිවයුතු ප්‍රධාන ගණන් දීමේ නිලධරයාගෙන් එක්ව හෝ වෙන්වෙන්ව අධිභාරය අයකර ගැනීම.' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු රාජ්‍ය ඇමතිතුමා, ඒ සංශෝධනයට එකඟද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

එකඟ නැහැ.

***25* වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*25ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 25, as amended, ordered to stand part of the Bill.*

## 26 වන වගන්තිය.- (කොමිෂන් සභාවේ රැස්වීම්.)

### வாசகம் 26. - (ஆணைக்குழுவின் கூட்டங்கள்.)

CLAUSE 26.- (*Meetings of the Commission.*)

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"26. (1) වන වගන්තියේ "කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු අතර, ඔහු පැමිණ නොමැති විට යන වචනවලට පසුව හෝ 23 (10) (ii) වගන්තිය යටතේ කාර්යයට සහභාගී නොවී නිදහස් වූ විට, පැමිණ සිටින සාමාජිකයන් අතරින් තෝරාගනු ලබන සාමාජිකයකු විසින් රැස්වීමේ මුලසුන දැරිය යුතු ය." යන වචන ඇතුළත් කරන්න."

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු ඇමතිතුමා, ඒ සංශෝධනයට එකඟද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

එකඟ නැහැ.

***26* වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**
*26ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 26 ordered to stand part of the Bill.*

*27 සිට 36 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*
*26ஆம் வாசகத்திலிருந்து 36ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 27 to 36 ordered to stand part of the Bill.*

## 37 වන වගන්තිය.- (විගණන අරමුදල.)
### வாசகம் 37.- (கணக்காய்வு நிதியம்.)
### CLAUSE 37.- (*Audit Fund.*)

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> "27 වන පිටුවේ, 26 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
>
> 'අනුව ප්‍රසාද දීමනා හෝ දිරි දීමනා වශයෙන් ලබා දෙන ලද.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***37 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*37ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 37, as amended, ordered to stand part of the Bill.*

***38 සහ 39 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*38ஆம் 39ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 38 and 39 ordered to stand part of the Bill.*

## 40 වන වගන්තිය.- (අභ්‍යන්තර විගණනය.)
### வாசகம் 40. - (உள்ளகக் கணக்காய்வு.)
### CLAUSE 40.- (*Internal audit.*)

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

> (1) "30 වන පිටුවේ, 19 වන සහ 20 වන පේළි ඉවත් කරන්න;"
>
> (2) "30 වන පිටුවේ, 21 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
>
> '(4) මේ පනතේ කාර්ය සඳහා, (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන අභ්‍යන්තර' ";
>
> (3) "30 වන පිටුවේ, 24 සිට 26 දක්වා පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
>
> '(5) (4) වන උපවගන්තිය යටතේ අභ්‍යන්තර විගණකවරු විසින් ඉදිරිපත් කරනු ලැබූ සියලු වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.'."

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***40 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*40ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 40, as amended, ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු රාජ්‍ය ඇමතිතුමා, 41වන වගන්තිය.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු සභාපතිතුමනි, 41 වන වගන්තියට රජයේ සංශෝධන නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, 41 වන වගන්තියට ඔබතුමන්ලා සංශෝධන ඉදිරිපත් කරලා තිබුණා, "8 වන හා 9 වන පේළි ඉවත් කරන්න" කියලා. ඔබතුමන්ලා ඒ සංශෝධනය ඉවත් කර ගන්නවාද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

අපි ඒ සංශෝධනය ඉදිරිපත් කරන්නේ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

බොහොම ස්තුතියි.

***41 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*41ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 41 ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

මීළඟට 42වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

## 42 වන වගන්තිය.- (විගණකාධිපතිවරයාට සහාය දැක්වීම පැහැර හැරීම වරදක් බව.)
### வாசகம் 42.- (கணக்காய்வாளர் தலைமையதிபதிக்கு உதவத் தவறுதல் தவறொன்றாதல்.)
### CLAUSE 42.- (*Failure to assist the Auditor General to be an offence.*)

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"32 වන පිටුව, 42වන වගන්තිය (ආ) ඡේදයේ 24වන පේළියේ "සිටීම" ඉවත් කර "සිටීමට අපොහොසත් හෝ" ආදේශ කිරීම."

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අප යෝජනා කරන්නේ 33වන පිටුවේ 6වන පේළිය ඉවත් කර ඒ වෙනුවට "රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයක්" යන්න ඇතුළත් කරන්න කියලා. මම දන්නේ නැහැ බන්ධනාගාරගත කරන්නත් වුවමනාද කියලා. මෙතෙක් කල් බන්ධනාගාරවලට යවලා නැහැ. මේක අලුත් එකක්. අනෙක, මේවාට අහු වන්නේ පොඩි මිනිස්සු, ලොකු මිනිස්සු නොවෙයි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ අයගේ රැකියාවත් අහිමි වෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඔව්, රැකියාවත් අහිමි වෙනවා. මා නම් කියන්නේ ඒකත් හොඳ නැහැ කියලායි. දැනට ඒවා එකක්වත් සිදු වන්නේ නැහැ. අපි සභාවක් හැටියට බලන්න ඕනෑ මෙහෙම අලුත් දඬුවමක් දෙනවාද, නැද්ද කියලා. මෙතැන සාමාන්‍ය සේවකයන් තමයි ඉන්නේ. [බාධා කිරීමක්]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාපතිතුමනි, කී වන වගන්තිය ගැනද අපි දැන් සාකච්ඡා කරන්නේ?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
42වන වගන්තිය.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - புத்தசாசன அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of of Buddhasasana)
රජයේ සේවකයෝ වැඩ නොකර ඉඳීවි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Only a fine is enough. Put Rs. 25,000 or even Rs. 50,000, and take everything else off. බන්ධනාගාරගත කිරීම් මොකවත් නැහැ. අපි ඒ අයගේ රැකියාවත් ආරක්ෂා කරමු. අපි ඒ ආකාරයට සංශෝධනය කරමු. එහෙම නම්, "රැකියාව කිරීමට නුසුදුස්සකු වීම" කියන කාරණය අපි ඉවත් කරමු, ඇමතිතුමා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අමාත්‍යතුමා, ඒ සංශෝධනය ඉදිරිපත් කරනවාද? ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කරපු කාරණය ගැන ගරු අමාත්‍යතුමාගේ සංශෝධනයක් තිබෙනවාද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මා කියන්නම්. ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කරපු කාරණය මේකයි. 42වන වගන්තියට අදාළව, 33 වන පිටුවේ 6වන පේළිය "ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත්" කියන පේළි ඉවත් කර "රුපියල් විසිපන්දහසක දඩයකට යටත් විය යුතු ය." යන්න ඇතුළත් කරන්න කියායි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාපතිතුමනි, මට මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් තිබෙනවා. 33වන පිටුවේ 5වන පේළියේ "ලැබීමේදී" යන වචනයට පසුව "රුපියල් පන්දහසේ සිට" යන්න එකතු කරන්න කියන එකයි මා කියන්නේ.

එතකොට කියැවෙන්නේ මේ ආකාරයට.

"යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසේ සිට ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස 6කට නොවැඩි කාලයක්" යනුවෙන්

මෙතැන රුපියල් ලක්ෂයක් කියා සඳහන් වන්නේ මේ විධියටනේ. දණ්ඩනය නියම කරලා, ඔහුට අභියාචනය කරන්න අවස්ථාව දීලා ඒ සියලු කටයුතු කළාට පසුව තමයි උපරිම දඩය රුපියල් ලක්ෂය වන්නේ. ඔබතුමන්ලා ඒ මුදල රුපියල් පන්දහසකට අඩු කරන්න යෝජනා කරලා, දැන් තමයි රුපියල් විසිපන්දහසක් කරන්න කියලා යෝජනා කරන්නේ. මා කියන්නේ අවම ගණනකුත් තිබෙන්නත් ඕනෑ බවයි. අඩු තරමින් ඔබතුමන්ලා මෙසේ පිළිගන්න. උපරිම දඩය රුපියල් විසිපන්දහසක් කියමු. ඒක හරි. අඩු තරමින් අවම ගණනකුත් තිබෙන්න එපායැ, බින්දුව නොවී.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මා දැන් මේ විධියට යෝජනා කරනවා, ගරු සභාපතිතුමනි.

"42 වගන්තිය, 33වන පිටුවේ 6, 7, 8 සහ 9වන පේළි ඉවත් කොට, 'රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය' යන්න ආදේශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා".

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
42 වගන්තියට ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාගේ සංශෝධනයක් තිබෙනවා නේද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා ඉහතදී මතු කළා,

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

"එම ධුරය දැරීමට හෝ සේවයේ නියුක්තව සිටීමට නුසුදුසු වන්නේය" කියන කාරණය. එනම්, "රැකියාව අහිමි විය යුත්තේය" කියන කාරණය සම්බන්ධයෙන්. අපි ඒ තරම් බරපතළ දඬුවමක් නියම කරනවාද නැද්ද කියලා මේ සභාවේ මතය අනුව තීරණයක් ගත යුතුව තිබෙනවා. [බාධා කිරීමක්] දඬයක් තිබෙනවා. මේ වගන්තිය මේ විධියට තිබුණොත් සුළු වරදකටත් රැකියාව අහිමි වෙනවා. ඉතින් ඒ කොටස ඉවත් කරන්න ගරු මන්ත්‍රීතුමන්ලා එකඟ වනවා නම්-

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු අමාත්‍යතුමා, මගේ යෝජනාව නම් මේකයි. දැන් මේ පනත ගෙනෙන්නේ සමාජයේ හොඳ පරිසරයකට නොවෙයිනේ. හොරකම්වලට, දූෂණවලට හොඳටම පුරුදු වූ, කුණු වූ සමාජයකට තමයි මේ පනත ගෙනෙන්නේ. ඒ නිසා අපි මේ පනත අවුරුද්දක් විතර ක්‍රියාත්මක වන කල් ඉඳිමු. ඊට පස්සේ ඔබතුමා කියන සංශෝධනය ගැන බලමු. මේ පනත් කෙටුම්පත ගෙනෙන අවස්ථාවේ තිබෙන රටේ පරිසරයත් එක්ක තමයි හිතන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ රට හොඳ තැනක තිබෙන අවස්ථාවක නොවෙයි නේ. මා මේ ඉල්ලීම කරන්නේ ඒකයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු මන්ත්‍රීතුමා, හුඟක් දුරට මේ අධිභාරය දමන්නේ පොඩි පොඩි ගණන්වලට. ඇයි අපි ඒ මිනිස්සු ගෙදර යවන්නේ? අපට ඕනෑ නම් වගකිය යුතු ලොකු එක්කෙනා අයින් කරන්න පුළුවන්. එහි කිසිම ප්‍රශ්නයක් නැහැ.

අපරාධ නීතිය යටතේ රුපියල් ලක්ෂ 10ක් 15ක් වංචා කළ කෙනාව ගෙදර යවන්න පුළුවන්. [බාධා කිරීමක්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධනය මා ඉදිරිපත් කරනවා:

"33 පිටුවේ, 10 වන පේළියේ සිට 21 දක්වා පේළි ඉවත් කළ යුතුය."

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමනි, එම වගන්තියට ඔබතුමාගේත් සංශෝධනයක් තිබෙනවාද?

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

42 (1)(ආ) වගන්තියට පහත දැක්වෙන සංශෝධනය ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

"විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන යම් තැනැත්තකු ඉදිරියේ පෙනී සිටීමට අපොහොසත් හෝ ප්‍රතික්ෂේප කිරීම'.

[හෝ විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තකු ඉදිරියේ පෙනී සිටින ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට මෙහි නිර්දේශිත 7(4) වගන්තියට අනුකූලව එම විෂය පිළිබඳව මනා අවබෝධයක් ඇති පුද්ගලයකු නම් කිරීමට අපොහොසත් වන හෝ ප්‍රතික්ෂේප කිරීම.]"

යන වචන දෙක ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිනවා. ඉහත කොටු වරහන තුළ දක්වා ඇති කොටස, 7(4) වගන්තිය පවත්වාගෙන යනවාද ඉවත් කරනවාද යන්න මත එකතු කිරීම සිදු කළ යුතුය.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු රාජ්‍ය ඇමතිතුමා, ඒ සංශෝධනයට එකඟද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

පිළිගන්නේ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා විසින් සංශෝධනයක් ඉදිරිපත් කළා "සේවයේ නියුක්ත වීමට නුසුදුස්සෙක් වන්නේය" කියලා. නමුත් එසේ සේවයේ නියුක්ත වීමට නුසුදුස්සකු වන්නේ නියමිත අධිකරණ බලය සහිත අධිකරණයක් වෙත අභියාචනයකුත් ඉදිරිපත් කරලා අභියාචනයෙනුත් වැරදිකාරයෙක් වුණාට පසුවයි. නියමිත අධිකරණයකට ඉදිරිපත් කරන අභියාචන කාලසීමාවත් ඉක්ම ගියාට පස්සේ. අධිකරණයට ඉදිරිපත් කරලා අධිකරණයෙන් අභියාචනයත් ප්‍රතික්ෂේප වුණාට පස්සේ එවැනි පුද්ගලයෙක් තවදුරටත් සේවයට සුදුසුයි කියලා වගන්තියක් දමා ගන්න එක ගැලපෙනවා කියලා මම හිතන්නේ නැහැ. ඔබතුමන්ලා එහෙම කරනවා නම්, ඒකෙන් වෙන්නේ මේ පනතට ලොකු අගතියක් කියන එක මම සඳහන් කරන්න ඕනෑ. ඔබතුමන්ලාට ඒ අයිතිය තිබුණාට-

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Hon.Prime Minister, the Hon. Member is questioning as to whether removal from service needs to be retained.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඇත්ත වශයෙන්ම සේවයෙන් අයින් කරනවාද, නැද්ද කියන එක අපට තීරණය කරන්න පුළුවන්. සමහර අධිභාර දමන්නේ ඉතා කුඩා දෙයකට. අපි දැන් ඒක නීතියෙන් අනිවාර්ය කරනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු අගමැතිතුමනි, ප්‍රමාණය කුඩාද කියන එක නොවෙයි

ප්‍රශ්නය. ඔහු අදාළ අධිකරණයකට ගිහිල්ලා අභියාචනා කටයුතු ඔක්කොම පසු කරලා අභියාචනාවත් අධිකරණයෙන් ප්‍රතික්ෂේප වුණාට පස්සේ, ඒ කියන්නේ අධිකරණ ක්‍රියාවලියෙන් අභියාචනාවත් ප්‍රතික්ෂේප වුණාට පස්සේ ඔහු තවදුරටත් සේවයේ තබා ගන්න ඕනෑ කියා පිළිගන්නවා නම්, මේ පනත් කෙටුම්පත සාධාරණයි කියලා, මම හිතන්නේ නැහැ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අභියාචනාව ප්‍රතික්ෂේප වුණාට පස්සේ ඔහු අයින් කරනවාද? සමහර අය රුපියල් 5,000කට විරුද්ධවත් ගිහිල්ලා රුපියල් ලක්ෂයක් වියදම් කරාවි, තමන්ගේ නම රැක ගන්න. ගණන රුපියල් 5,000 නම් අපි එයාව ඉවත් කරන්නේ ඇයි? ඒකයි මම අහන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අධිකරණයෙන් නිවැරදිකරුවෙක් වුණාට පස්සේ එයාට සහනය දෙන එක හරි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මම ඒක පොඩ්ඩක් පැහැදිලි කරන්නම්. ගරු සභාපතිතුමනි, ඕනෑම රජයේ සේවකයෙක් වංචාවක්, දූෂණයක් සම්බන්ධයෙන් වැරදිකාරයෙක් කියලා අධිකරණයෙන් තීරණය වුණොත් Establishments Code එක; ආයතන සංග්‍රහය අනුව ඔහුට රැකියාව අහිමි වෙනවා. මේක ඉදිරිපත් වුණොත් මෙතැනදී ඇති වන වෙනස තමයි සමහර වෙලාවට ඉතා සුළු වරදකට, සමහර වෙලාවට නොසැලකිල්ල නිසා, සමහර වෙලාවට වෙනත් සේවකයෙක් කළ වරදකට තවත් සේවකයෙක් පැටලෙන අවස්ථා තමයි අපේ අත්දැකීම අනුව රජයේ සේවයේ වැඩියෙන් සිද්ධ වන්නේ. එතැන ඉන්න assistant accountant ගෙනැල්ලා දෙන එක විශ්වාසය උඩ accountant අත්සන් කරනවා. නමුත් පසුව වගකීම පැවරෙන්නේ accountantටයි. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාත් පිළිගන්නවා ඇති, මේ වාගේ සුළු දෙයක් සම්බන්ධයෙන් රැකියාවෙන් නෙරපීමේ සාධාරණතාවයක් තිබෙනවාද කියලා මා දන්නේ නැහැ. මොකද, සමගාමී නීතියක් තිබෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ජ්‍යෙෂ්ඨ නිලධාරියා, කණිෂ්ඨ නිලධාරියා කියන දේ අහලා අත්සන් කරනවා. පස්සේ වැරදුනාම ජ්‍යෙෂ්ඨ නිලධාරියා අයින් කරන්න අවශ්‍ය නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒකෙන් දඬුවම් ලැබෙන්නේ දේශපාලනඥයන්ට නොවෙයි, අහිංසක රජයේ සේවකයන්ටයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මේ විගණන කොමිසම. විගණන කොමිසම විගණනයක් කරලා දෙන තීරණයක් තමයි අපි මේ අභියෝගයට ලක් කරමින් යන්නේ. මේක ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ හෝ කණිෂ්ඨ නිලධාරියාගේ ප්‍රශ්නයක් නොවෙයි. එතකොට විගණන කොමිසම සම්පූර්ණයෙන්ම සැක කරනවා; අවිශ්වාසකරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order please! ගරු අගමැතිතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඒ වාගේ දේවල් ගණනාවක් සිදු වෙනවා. මම කියන්නේ ඒක හිරේ දමන්න දෙයක් නොවෙයි කියන එකයි. අයින් කරන්න ඕනෑ නැහැ. ඉවත් කරනවා නම් අපට කරන්න පුළුවන්. අපට බලතල තිබෙනවා.

***42 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*42ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 42, as amended, ordered to stand part of the Bill.*

## 43 වන වගන්තිය.- (කොමිෂන් සභාවේ හෝ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ආදියේ යම් නිලධරයකුගේ තීරණයකට බලපෑම් කිරීම හෝ බලපෑම් කිරීමට තැත් කිරීම වරදක් බව.)

வாசகம் 43. - (ஆணைக்குழுவினது அல்லது இலங்கை அரச கணக்காய்வுச் சேவை முதலியவற்றின் எவரேனும் அலுவலரினது முடிபொன்றின்மீது செல்வாக்குச் செலுத்துதல் அல்லது செலுத்த எத்தனித்தல் தவறொன்றாதல்.)

CLAUSE 43.- *(Influencing or attempting to influence a decision of the Commission or any officer of the Sri Lanka State Audit Service & C. to be an offence.)*

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධනය මා ඉදිරිපත් කරනවා:

"34 වන පිටුවේ, 1 වන පේළියේ සිට 4 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු, රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***43 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*43ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 43, as amended, ordered to stand part of the Bill.*

***44 සිට 49 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*44ஆம் வாசகத்திலிருந்து 49ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 44 to 49 ordered to stand part of the Bill.*

## 50 වන වගන්තිය.- (නඩුවලින් ආරක්ෂාව.)

## வாசகம் 50. - (சட்டத் துடர்ச்சிகளுக்கெதிரான பாதுகாப்பு.)

CLAUSE 50.- (*Protection from law suits.*)

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**

(மாண்புமிகு நிரோஷன் பெரேரா)

(The Hon. Niroshan Perera)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"36 වන පිටුවේ, 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-
'කාර්යාලයේ යම් නිලධරයකු හෝ 9 (1) (අ) වගන්තියේ සඳහන් කරන' ".

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

Amendment put, and agreed to.

***50 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*50ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 50, as amended, ordered to stand part of the Bill.*

***51 සිට 54 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*51ஆம் வாசகத்திலிருந்து 54ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 51 to 54 ordered to stand part of the Bill.*

## 55 වන වගන්තිය.- (අර්ථ නිරූපණය.)

## வாசகம் 55. - (பொருள் கோடல்.)

CLAUSE 55.- (*Interpretation.*)

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**

(மாண்புமிகு நிரோஷன் பெரேரா)

(The Hon. Niroshan Perera)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"43 වන පිටුවේ, 19 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-
'(ඊ) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත්' ".

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***55 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*55ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 55, as amended, ordered to stand part of the Bill.*

***56 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*56ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 56 ordered to stand part of the Bill.*

***උප ලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*அட்டவணை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Schedule ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**

(மாண்புமிகு நிரோஷன் பெரேரா)

(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

# කල්තැබීම

# ஒத்திவைப்பு

# ADJOURNMENT

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**

(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Hon. Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු කනක හේරත් මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. WIJEPALA HETTIARACHCHI *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කනක හේරත් මන්ත්‍රීතුමා, කථා කරන්න.

## මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ කළමනාකරණය සඳහා විධිමත් යන්ත්‍රණයක්
## மத்தள சர்வதேச விமான நிலையத்தை நடத்துவதற்கான ஒழுங்கான வேலைத்திட்டம்
## PROPER MECHANISM FOR MANAGEMENT OF MATTALA INTERNATIONAL AIRPORT

[අ.භා. 6.49]

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ අසාර්ථක ව්‍යාපෘතියක් බව ප්‍රකාශ කරමින් එම ගුවන් තොටුපොළ ආරම්භයේ සිට මේ දක්වා ක්‍රියාත්විතව තිබුණු එකම ගුවන් සමාගම වන ෆ්ලයිඩුබායි ගුවන් සමාගම සමඟ ඇති කරගෙන ඇති ගිවිසුමද නොසලකා හරිමින් ඉන්දියානු සමාගමකට විකිණීමට
>
> වර්තමාන රජය කටයුතු කරයි. ශ්‍රී ලංකාවට වටිනා සම්පතක් වන මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ රැක ගනිමින් එහි උපරිම ඵල නෙළා ගැනීමට හැකි ආකාරයේ විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයයි මෙම ගරු සභාවට මම යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම යෝජනාව පිළිබඳව කරුණු කීපයක් ඉදිරිපත් කිරීමටත් මා බලාපොරොත්තු වනවා. ඔබ අප සියලුදෙනාම දන්නා මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යුගයේදී ආරම්භ වුවත්, 1994 වසරේදීත් ඒ පිළිබඳව යෝජනා ඉදිරිපත් වී තිබෙනවා. දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ, එවකට නාගරික සංවර්ධන අමාත්‍යවරයා ලෙස කටයුතු කළ වර්තමාන මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි ඒ යෝජනාව පළමුවෙන්ම ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මෙය ඊටත් කලින් කිහිප වතාවක්ම ඉදිරිපත් වුණු යෝජනාවක්. වර්තමාන අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍යවරයා ලෙස කටයුතු කළ 2004 වසරේදීත් වැල්ලවාය, කුඩාඔය කියන ප්‍රදේශයේ -මත්තලට කිලෝමීටර දෙකක් පමණ ඈතින්- එතුමා පළමු වතාවට මේ සඳහා මුල්ගල තැබුවා. නමුත් මේ සඳහා මුදල් හොයාගෙන, ඒ මුදල් වෙන් කරගෙන මත්තල ගුවන් තොටුපොළේ වැඩ කටයුතු ආරම්භ කරන්න පසුගිය රජය සමයේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට හැකියාව ලැබුණා. ඒ අනුව, පළමුවන අදියරට ඩොලර් මිලියන 209ක් පමණ වියදම් කරලා මත්තල ගුවන් තොටුපොළ හදා අවසන් කළා. ඒ තුළින් අපට තේරුම් යන්නේ, මොන රජය වුණත් එදා එවැනි ගුවන් තොටුපොළක අවශ්‍යතාව හඳුනාගෙන තිබුණාය කියන එකයි. අවශ්‍යතාව හඳුනාගෙන තිබුණාට, එය ක්‍රියාත්මක කරන්න කිසිම කෙනෙකුට හැකියාවක් ලැබුණේ නැහැ; හරි ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. එදා රනිල් වික්‍රමසිංහ මහත්මයා ඡන්ද දායකයන්ට පොරොන්දු වුණා, 2004 වසරේදී මුල්ගල තැබූ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවාය කියා. නමුත් ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණේ නැහැ. කෙසේ වෙතත්, 2015දී මේ යහපාලන රජය බලයට පත් වෙලා පළමුවෙන්ම කළේ මොකක්ද? මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ඉතිරි වැඩකටයුතු අවසන් කරලා එය සංවර්ධනය කරනවා වෙනුවට එතුමන්ලා එහි වී ගබඩා කළා. මේ වී ගබඩා කිරීම තුළින් ජාත්‍යන්තර වශයෙන් එම ගුවන් තොටුපොළට තිබෙන පිළිගැනීම නැති කරන්න මේ රජය කටයුතු කළා. එපමණක් නොවෙයි, එම ගුවන් තොටුපොළට ලැබෙන මිලියන ගණනක මුදලක් අහිමි කළා. එදා එහි වී ගබඩා කළ නිසා මිලියන ගණනාවක අලාභයක් සිදු වුණා.

ඊළඟට, මේ රජය මොකක්ද කළේ? ශ්‍රීලන්කන් ගුවන් සමාගමෙන් මත්තල ගුවන් තොටුපොළට ගොඩ බස්වන සියලුම ගුවන් යානා ගොඩ බැස්වීම නතර කළා. තමන්ට හදා ගන්න බැරි වුණු මත්තල ගුවන් තොටුපොළ විකිණීමට අද කටයුතු කිරීමෙන් මේ රජය බලාපොරොත්තු වන්නේ මොකක්ද? මත්තල ගුවන් තොටුපොළට ගුවන් යානා ගොඩ බස්වපු එකම ගුවන් සමාගම වූ ෆ්ලයිඩුබායි ගුවන් සමාගමේ ගුවන් යානා ගොඩ බස්වන එකත් නවත්වන්න, අත් හිටුවන්න තමයි මේ කටයුතු කරන්නේ. "පාඩු ලබන ආයතනයක් නිසා, මත්තල ගුවන් තොටුපොළේ කටයුතු තාවකාලිකව නවත්වනවා" කියා අපේ නියෝජ්‍ය අමාත්‍යතුමා ප්‍රකාශ කර තිබෙනවා අප රූපවාහිනියෙන් දැක්කා. නමුත් අපි කියන්න ඕනෑ, ෆ්ලයිඩුබායි ගුවන් සමාගම කියන්නේ, මත්තල ගුවන් තොටුපොළ ආරම්භ කරනවාත් සමඟම ගුවන් ගමන් ආරම්භ කළ ගුවන් සමාගමක් බව. මා හිතන විධියට එදා සිවිල් ගුවන් සේවා අධිකාරිය සමඟ ඔවුන් ගිවිසුම්ගත වෙලා තිබුණා, ලංකාවට -කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළට- ගුවන් ගමන් වාර දෙකකදී ගොඩ බැස්සවීම් කරනවා නම්, අඩුම තරමේ එයින් එකක් මත්තල ගුවන් තොටුපොළට ගොඩබස්සන්න ඕනෑය කියා.

2013 වසර වන විට ෆ්ලයිඩුබායි කියන ගුවන් සමාගම තුන් වතාවක් ගුවන් යානා ගොඩ බස්සනවා. 2016 වෙද්දී එය හතරවතාවක් වෙනවා. 2017 වෙද්දී ඒක පස් වතාවක් වෙනවා. ෆ්ලයිඩුබායි ගුවන් සමාගම, එමිරේට්ස් ගුවන් සමාගම සමඟ ගිවිසුමක් ඇති කරගෙන 2017දී වාර ප්‍රමාණය ඒ අය අතර බෙදා ගන්නවා. මේකම තමයි එදාත් කළේ. එදා ශ්‍රීලන්කන් ගුවන්

[ගරු කනක හේරත් මහතා]

සමාගමට තිබුණු slots ටික ලබා ගැනීමට එමිරේට්ස් ගුවන් සමාගම කටයුතු කළා වාගේ, නැවතත් එමිරේට්ස් ගුවන් සමාගම මෙය ලබාගැනීමට කටයුතු කර තිබෙනවා.

අපේ නියෝජ්‍ය අමාත්‍යතුමා කියූ ආකාරයට, මෙය අලාභ ලබන සමාගමක් නොවෙයි. 2017දී සමාගමේ මුළු ලාභය ඇමෙරිකානු ඩොලර් බිලියන 10.1යි. ඒ කියන්නේ, ලංකාවට එන එක පාඩුවක් නොවෙයි. ඊට අමතරව, අපේ රටේ cargo ප්‍රමාණය ඉහළම ප්‍රතිශතයකින් වැඩි වෙලා තිබෙන්නේ මත්තල ගුවන් තොටුපොළ මඟින්නුයි. දකුණු පළාතේ පමණක් නොවෙයි, ඌව පළාතේ තිබෙන පලතුරු සහ එළවළු මාලදිවයිනට, සවුදි අරාබියට, ඩුබායිවලට යැවීමටත් මේ තුළින් හැකියාව ලැබී තිබෙනවා. එම නිසා මෙයින් කිසිම පාඩුවක් සිදු වෙලා නැහැ. අපේ කෘෂි කර්මාන්තය ඉහළ නැංවීමට හැකි ආකාරයට තමයි මේ ගුවන් තොටුපොළ නිර්මාණය කර තිබෙන්නේ.

"ගුවන් තොටුපළේ වැඩකටයුතු තාවකාලිකව නවත්වලා ඔක්තෝබර් මාසයේ නැවත ආරම්භ කරනවා" කියා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කියා තිබෙනවා. ලබන වර්ෂයේ මාර්තු මාසය වන තෙක් ෆ්ලයිඩුබායි ගුවන් සමාගමේ ගමනාන්ත සියල්ල cancel කර තිබෙන බව පසුගිය දවසක සිදු කළ විපරමකින් පසු මට සොයා ගැනීමට හැකි වුණා. මත්තල ගුවන් තොටුපොළ විකිණීමට පිඹුරු පත් සකස් කිරීමේ අරමුණින් තමයි ෆ්ලයිඩුබායි ගුවන් සේවය නැවැත්වීමට කටයුතු කර තිබෙන්නේ. ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා මේ ගරු සභාවේ දැන් ඉන්නවා. ගරු ඇමතිතුමනි, මේ සම්පත විකිණීමට කටයුතු කිරීම සිවිල් ගුවන් සේවා පනතට පටහැනියි. එම නිසා ඒ පනත වෙනස් කරනවාද, නැද්ද කියාත් දැන ගැනීමට මම කැමතියි. විශේෂයෙන්ම මේ ගුවන් තොටුපොළ විකුණන්න නම් සිවිල් ගුවන් සේවා පනත වෙනස් කිරීමට සිදු වෙනවා. එතකොට රටේ ආරක්ෂාවටත් ලොකු බලපෑමක් ඇති වෙනවා. ඒ පිළිබඳව තමුන්නාන්සේලා දන්නවා. ඉන්දියාවට හෝ වෙනත් රටකට හෝ මේ ගුවන් තොටුපොළ ලබා දුන්නාට පසුව රටේ ආරක්ෂාවට විශාල බලපෑමක් ඇති වෙනවාය කියන කාරණයත් මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. මෙම ගුවන් තොටුපළ විකිණීමට හේතු වශයෙන් නොයෙකුත් කරුණු කියනවා. ලාභ ලබන්නේ නැහැය කියනවා; කුරුල්ලන්ගෙන් ප්‍රශ්න තිබෙනවාය කියනවා; bird strikes තිබෙනවාය කියනවා. සෑම ගුවන් තොටුපොළකම ඒ ආකාරයේ ප්‍රශ්න තිබෙනවා, ගරු ඇමතිතුමනි. නමුත් මෙම ගුවන් තොටුපොළ අපේ ඉදිරි අනාගතයට තිබෙන සම්පතක් බව මම මේ අවස්ථාවේ කියනවා.

මෙම ගුවන් තොටුපොළ අලාභ ලබනවාය කිව්වාට, මෙහි තිබෙන ණය ගෙවා ගැනීමට බැරිව කවදාවත් අපට ප්‍රශ්නයක් ඇති වෙලා නැහැ. වරාය සමාගමෙන් හම්බන්තොට වරායේ ණය ගෙව්වා වාගේ, අපේ ගුවන් තොටුපොළ සමාගම අද ලාභ ලබලා ඒ ලාභයෙන් මේ ණය ප්‍රමාණය ගෙවා තිබෙනවා. ඒ වාගේම ඉදිරියටත් එය ගෙවීමේ හැකියාව තිබෙනවා. එපමණක් නොවෙයි, මෙම ගුවන් තොටුපොළේ ගුවන් සීමාවේ පියාසර කිරීම - overfly - තුළින් පමණක් එක් දිනකට ඇමෙරිකානු ඩොලර් 15,000ක් අපට නිකම් ඉදලාත් ලැබෙනවා. මේ ගුවන් තොටුපළට එක ගුවන් යානයක්වත් ආවේ නැතත්, ඒ මුදල් ප්‍රමාණය අපට ලැබෙනවා. මේ කාරණය වැරදියි නම් නිවැරදි කරන්න. අපට දිනකට ඇමෙරිකානු ඩොලර් 15,000ක් ලැබෙනවා. ඒ ඩොලර් 15,000 ලැබුණා නම් අපට ඇති. මේ ආණ්ඩුව සැලැස්මක් ඇතිව ක්‍රියා කළා නම්, සැලැස්මක් ඇතිව මේ ගුවන් තොටුපොළ හරියට අළෙවිකරණය කළා නම්, අපට අද වන විට මේ ගුවන් තොටුපොළ වහන්න වන්නේ නැහැ; විකුණන්න වන්නේ නැහැ. එසේ වුණා නම් අද වන විට අපේ රටට තව තවත් ගුවන් සමාගම් ගෙන ඒමට හැකියාව ලැබෙනවා. මේ ගුවන් තොටුපොළ තමුන්නාන්සේලාට, අපට පමණක් නොවෙයි, ඉදිරි අනාගතයේ අපේ දරුවන්ගේත් සම්පතක්. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට අපි ගරු කරනවා. එම නිසා ඔබතුමා අමාත්‍ය ධුරය දරන කාල වකවානුවේදී මෙම සම්පත විනාශ කරන්න දෙන්න එපාය කියා අපි ඉල්ලා සිටිනවා. එහෙම කළොත්, එය ඔබතුමාට දේශපාලන වශයෙන් ලොකු කැලලක්ය කියන එකත් අපි මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මෙම යෝජනාව ගෙන එන්නේත් අපි ආදරය කරන, අපේ රටේ තිබෙන මේ සම්පත ආරක්ෂා කර ගැනීම සඳහායි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න. උදේ වරුවේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා ප්‍රකාශ කර තිබුණා, සියයට 30ක් ශ්‍රී ලංකාවටත්, සියයට 70ක් ඉන්දියානු සමාගමකටත් ලබා දෙනවා කියලා. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විදෙස් සමාගම්වලට විකුණන්න එපා; එය රැක ගන්න කටයුතු කරන්න; දේශපාලන වශයෙන් කුහක හැඟීමෙන් බලා කටයුතු කරන්න ඉඩ දෙන්න එපාය කියන ඉල්ලීම කරමින් මා නවතිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. යෝජනාව ස්ථිර කිරීම, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා.

[අ.භා. 6.59]

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන්, ඒ වාගේම මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විදේශීයකරණයට විරුද්ධ මන්ත්‍රීවරයෙක් වශයෙන් ගරු කනක හේරත් මන්ත්‍රීතුමා ගෙනා ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

මිහිඳු හාමුදුරුවන්ගේ දේශනයකින් මගේ කථාව මා ආරම්භ කරන්නම්. එදා මිහිඳු හාමුදුරුවෝ දේවානම්පිය තිස්ස රජතුමාට දේශනා කර තිබෙනවා, "රටක සම්පත්වල අයිතිය තිබෙන්නේ අනාගතයට. ඔබතුමා මෙහි භාරකරුවා මිසක්, අයිතිකරුවා නොවෙයි." කියලා. මෙය එදාටත් වැඩිය අදට තමයි වලංගු වන්නේ. අපේ රටේ ජනාධිපතිතුමාට, අගමැතිතුමාට අපි අද මතක් කර දෙන්න කැමැතියි, මේ රටේ සම්පත් තමන්ට ඕනෑ විධියට විකුණා දමන්න ඔබතුමන්ලා අයිතිකරුවන් නොවෙයි. ඔබතුමන්ලා මේ රටේ සම්පත්වල භාරකරුවෝ මිසක්, අයිතිකරුවෝ නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ-පෙරේදා "The New York Times" පුවත් පත පළ කරපු වාර්තාවක් පදනම් කරගෙන රටේ අවධානය හා මතය වෙන පැත්තකට ගෙන යන්න උත්සාහයක් දරන බව අපි දැක්කා. එක පැත්තකින් මහ බැංකු බැඳුම්කර සිද්ධියත්, අනෙක් පැත්තෙන් මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විකිණීමත්, එහෙම නැත්නම් විදේශීයකරණය රට තුළට ගෙන ඒම ගැන එල්ල වන ජනතා විරෝධය යට ගහන ගමන් ජනතාවගේ අවධානය වෙන පැත්තකට ගෙන යන්න එතුමන්ලා උත්සාහයක් දරන බව අපි

දැක්කා. විශේෂයෙන් අද ඉන්දියාවෙන් ගෙනෙන ආයෝජනය කොච්චර දුරට වාණිජ්‍යමය ආයෝජනයක්ද, රට වෙනුවෙන් ගෙනෙන ආයෝජනයක්ද කියලා අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඉන්දියාවේ ප්‍රධාන ජාතික පුවත් පතක් වන "The Hindu" පුවත් පත අද සඳහන් කරන ආකාරයට, ඉන්දියාව මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ආයෝජනය කිරීමට ප්‍රධානම හේතුව, උපාය මාර්ගික අවශ්‍යතාවක්. මේක උපාය මාර්ගික අවශ්‍යතාවක් වශයෙන් තමයි ඉන්දියාව දකින්නේ. මන්දයත්, අතිශය තීරණාත්මක ජාත්‍යන්තර වරායක් වන හම්බන්තොට වරාය චීනය විසින් 99 අවුරුද්දකට බදු ගැනීමත් සමඟ ඉන්දියානු සාගර කලාපයේ චීන ආධිපත්‍යයෙන් ඉන්දියාවට බලපෑමක් ඇති විය හැකියි. තවද, හම්බන්තොටින් අක්කර 15,000ක භූමියක් චීනයට කර්මාන්ත කලාපයක් වෙනුවෙන් බදු දීමට සූදානමක් පවතී. මේ නිසා හම්බන්තොට ආශ්‍රිත කලාපය, කලාපීය බලවතා වන ඉන්දියාවට අතිශය වැදගත් භූමි භාගයක් බවට පෙරළී හමාරය. ඉන්දියාවේ ප්‍රධාන පුවත් පතක් වන "The Hindu" පුවත් පත වාර්තා කරන ආකාරයට අපට පැහැදිලිව පෙනෙනවා, ඉන්දියාවෙන් ආයෝජනය ගෙනෙන්නේ මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ දියුණු කරන්නවත්, අපේ රටට සුවිශාල ආයෝජනයක් ගෙනෙන්නවත් නොවෙයි, එතුමන්ලාට තිබෙන අභියෝගය නිසා බව. හම්බන්තොට වරාය චීනයට දීමට විරුද්ධව මතයක් ගොඩ නැඟෙනකොට ලංකාවේ රජය විසින් ඒක මැඩ පවත්වන්න දෙන ලද තෑග්ගක් විධියට තමයි අපි මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විදේශීයකරණය, එහෙම නැත්නම් ඉන්දියාවට ලබා දීම දකින්නේ.

මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ කියන්නේ, හුදෙකලා ව්‍යාපෘතියක් නොවෙයි. මෙම ගුවන් තොටුපොළ හදන්න ඕනෑ කියලා අපට කලින් උත්සාහයන් දරා තිබෙනවා. 1994දී චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුව කාලයේදී උත්සාහයක් දරා තිබෙනවා. 2003දී රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා මුල් ගලකුත් තබා තිබෙනවා. හැබැයි, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා අනුගමනය කළ අසාර්ථක ආර්ථික ප්‍රතිපත්ති නිසාත්, එතුමාට ආයෝජන ගෙනෙන්න හැකියාව නැති නිසාත්, එතුමාට ඒ මුදල් ටික ගෙනෙන්න බැරි වූ නිසාත්, මත්තල ගුවන් තොටුපොළ හදා ගන්න එතුමාට බැරි වනවා. හැබැයි, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දක්ෂතාවත් එක්ක, හිටපු අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ සහ තාරුණ්‍යයට හෙටක් සංවිධානයේ සභාපති නාමල් රාජපක්ෂ මැතිතුමාගේ මැදිහත් වීමෙන් එතුමන්ලාට පුළුවන්කම ලැබුණා, චීන ආයෝජන ලංකාව තුළට ගෙනෙන්න.

ලංකාවට ආයෝජන ගෙනැල්ලා මේ ඉතාම සුවිශාල මත්තල ගුවන් තොටුපොළ හදා ගන්න අපට පුළුවන්කමක් ලැබුණා. හැබැයි, මෙය ගුවන් තොටුපොළක් වශයෙන් විතරක් නොවෙයි හැදුවේ. එක පැත්තකින් වරායක් ගොඩනැඟුවා. අනෙක් පැත්තෙන් ගුවන් තොටුපොළ ගොඩනැඟුවා. අනෙක් පැත්තෙන් highway ආවා. මේ සියලුම දේවල් එක ව්‍යාපෘතියක් වශයෙන් ගොඩනඟා මේ රට සංවර්ධනය කරන්න තමයි අපි එම කටයුතු සූදානම් කළේ. හැබැයි, අද වනවිට මොකක්ද, වෙලා තිබෙන්නේ? අද වනවිට ආයෝජන ඔක්කෝම ටික එකින් එක කඩලා විකුණන්න කටයුතු ආරම්භ කරලා තිබෙනවා. රටේ අපනයනය වැඩි කරන්න ඕනෑ, රටේ කෘෂි කර්මාන්තය දියුණු කරලා කෘෂි අපනයනය එන්න-එන්නම දියුණු කරන්න ඕනෑ කියලා ජනාධිපතිතුමා කියන ආකාරය අපි දකිනවා. හැබැයි, රටේ ජනාධිපතිතුමාට අපි මතක් කරන්න කැමැතියි, දිනෙන්-දින, මාසයෙන්-මාසය, අවුරුද්දෙන්-අවුරුද්ද හම්බන්තොට ගුවන් තොටුපොළ හරහා පිටරට යන බහලු ප්‍රමාණය වැඩි වුණා කියන කාරණය. ඒ වාගේම ඌව වෙල්ලස්සෙන්, රත්නපුරයෙන්, ඇඹිලිපිටියෙන් අපේ එළවළු ටික මැද පෙරදිග රටවලට -ඩුබායි- යන්න පටන් ගත්තා. පළමුවැනි ගුවන් යානයේ සිට අන්තිම ගුවන් යානය දක්වා එම කටයුතු ක්‍රමානුකූලව එන්න-එන්නම වැඩි වුණා. හැබැයි, මේ ආණ්ඩුව බලයට ආවේම මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විකුණන්න ඕනෑය කියාගෙනයි. "මේක අසාර්ථක ව්‍යාපෘතියක්." කියා ගෙන තමයි මේ ආණ්ඩුව බලයට පත් වුණේ. ඒ නිසා මෙතුමන්ලා මේවා ක්‍රමානුකූලව නැවැත්වූවා. පත් වෙන ඕනෑම රජයක්, ඒ වෙනකොට එම රටේ තිබුණු ප්‍රතිපත්ති ඒ විධියටම ඉදිරියට ගෙන යා යුතුයි. පැවති රජය රටක ගුවන් තොටුපොළක් හැදුවාම, ඒකට ගුවන් යානා ගෙන්වා ගැනීමේ වගකීම අලුතින් පත් වන රජය සතු වෙනවා. මේ රටේ අගමැතිතුමා 2016 අය වැය යෝජනා තුළින් කියනවා, "තව ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් හදන්න ඕනෑ." කියලා. හැබැයි, එහෙම කියන අගමැතිතුමාම 2015දී මත්තල ගුවන් තොටුපොළ වී ගබඩාවක් කළා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගුවන් යානා එන එක නැවතුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලෝකය තුළ මේ airport එකට තිබුණු ratings වැටුණා. ඒවායේ ප්‍රතිඵල වශයෙන් තමයි අන්තිමට අද මත්තල ගුවන් තොටුපොළ ඉන්දියාවට දෙන්න වුණේ. හැබැයි, මේක දෙන්න වුණා නොවෙයි, මේක දෙන්න ඉඩ සැලසුවේ අගමැතිතුමා ඇතුළු මේ ආණ්ඩුව කියලා අපි වගකීමෙන් කියන්න කැමැතියි.

අපි දන්නවා, නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අමාත්‍යවරයෙක්, බණ්ඩාරනායක ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු අමාත්‍යවරයෙක් බව. රටේ සම්පත් විදේශීයකරණය කරන්න කියලා බණ්ඩාරනායක ප්‍රතිපත්තිවල කොහේවත් සඳහන් වෙලා නැහැ. අඩුම ගණනේ පිට රටකට දෙන්න ඕනෑය කියලාවත් එදා ඒ ප්‍රතිපත්තිවල තිබුණේ නැහැ. හැබැයි, අද අපිට ලොකු දුකක් සහ ලජ්ජාවක් තිබෙනවා. රටේ ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති වශයෙන් සිටියදී, රටේ ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා වශයෙන් සිටියදී අපේ රටේ සම්පත් මෙහෙම කෑලි කෑලිවලට කඩා විකුණන්නේ කොහොමද, කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. මේ ආණ්ඩුව ගැන අපි දන්නවා. මේ ආණ්ඩුව එදා ඉඳලා ගෙනා එක විදේශීය ආයෝජනයක් සම්බන්ධයෙන්වත් අපි සෑහීමට පත් වෙන්නේ නැහැ. මේ කියපු එක ගිවිසුමක් ගැනවත් අපි සෑහීමට පත් වෙන්නේ නැහැ. අපි දැක්කා, හම්බන්තොට වරායේ ගිවිසුම. හම්බන්තොට වරායේ ගිවිසුම, පළමුවෙන්ම කැබිනට් එකට ඉදිරිපත් කළ ගිවිසුම නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක පමණ කාලයක් තිබෙන්නේ.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

පළමුවෙන්ම කැබිනට් එකට ඉදිරිපත් කරපු ගිවිසුම නොවෙයි, පාර්ලිමේන්තුවට ආවේ. පාර්ලිමේන්තුවට ආ ගිවිසුම නොවෙයි, අන්තිමට අත්සන් කළේ. ඒ දෙයම තමයි මත්තල ගුවන් තොටුපොළට කරන්න යන්නේත්. හම්බන්තොට වරායේ ඩොලර් මිලියන 200ක් වටිනා දූපත නොමිලයේ ලබා දුන් බව අපි දන්නවා. ඒකම තමයි මත්තල ගුවන් තොටුපොළට කරන්නේත්.

අද මේ ලෝකයේ තිබෙන ප්‍රශ්න ඇතුළට අපව ඇද දමන්න එපා, අපේ රටේ සම්පත් විකුණන්න එපා කියලා අපි මේ ආණ්ඩුවට කියන්න කැමැතියි. මේ රජය යටතේ කටයුතු කරන කැබිනට් අමාත්‍යවරුන් දෙදෙනෙක් අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරනවා. අද අපේ ජාතික සම්පත් විකුණද්දී එතුමන්ලා

දෙදෙනාගේම කට වැසී තිබෙනවා. මහින්ද අමරවීර ඇමතිතුමා, සජිත් ප්‍රේමදාස ඇමතිතුමා ඇයි, මේ ගොළු වෙලා ඉන්නේ? එසේ ගොළු වෙලා ඉන්නේ කටට ඩොලර් වැටිලාද, කියලා අපි එතුමන්ලාගෙන් අහන්න කැමැතියි.

අපේ රටේ සම්පත් විකුණනවාට අපි විරුද්ධයි කියන එක මම අවසාන වශයෙන් කියනවා. මත්තල ගුවන් තොටුපොළ විකුණනවාට විරුද්ධව හිරේ ගිය මන්ත්‍රීවරයෙක් වශයෙන්, එක වතාවක් හිරේ ගිය මන්ත්‍රීවරයෙක් වශයෙන් මා කියන්නේ, දෙවතාවක්, තුන්වතාවක් නොවෙයි, සියවතාවක් හිරේ දැම්මත් මේ ගිවිසුම්වලට විරුද්ධව, අපේ රටේ සම්පත් විජාතිකකරණය කරනවාට විරුද්ධව අපි සටන් කරනවා කියන එකයි. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඊළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබෙන්නේ විනාඩි හතක කාලයක් පමණයි.

[අ.භා.7.07]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
**(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)**
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ අසාර්ථක ව්‍යාපෘතියක් හැටියට සලකා ඉන්දියානු සමාගමකට පැවරීමට විරුද්ධව තමයි අපේ කනක හේරත් මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ මෙම යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ.

මෙතැනදී මූලික වශයෙන් අදහස් දැක්විය යුතු කරුණු කිහිපයක් තිබෙනවා. මත්තල ගුවන් තොටුපොළ, ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් හැටියට නම් කළත්, ජාත්‍යන්තර ගුවන් තොටුපොළකට අවශ්‍ය කරන ශක්‍යතා අධ්‍යයනයක් කරලා නිසි හඳුනා ගැනීමක් එක්කද, මේක ස්ථානගත කළේ කියන ගැටලුව මුලින්ම තිබෙනවා.

මොකද, හේතුව මේ ගුවන් තොටුපොළ මුලින්ම වීරවිලට යෝජනා වෙලා, වීරවිලෙන් මත්තලට මාරුවෙලා, විශාල ක්‍රියාවලියක් සමඟ, මෙතුමාම කිව්ව විධියට ඒ කාලයේදී එය පොදු ව්‍යාපෘතියේ කොටසක් වුණාට යම් කාලයක එය දේශපාලන ව්‍යාපෘතියක් හැටියට තමයි තිබුණේ කියලා අපි දන්නවා. මොකද, ගුවන් තොටුපොළක් ස්ථානගත කර ගැනීමේදී ඒ ස්ථානගත කිරීම ගුවන් ගමන් වෙළෙඳ පොළක් සමඟින් සම්බන්ධ වෙන්න ඕනෑ. කොහේ හෝ රටක නිකම් ගුවන් තොටුපොළක් දමා ගත්ත පළියට ගුවන් යානා යන එන එක තීරණය වෙන්නේ නැහැ. ඒක ගුවන් ගමන් බෙදා ගන්න වෙළඳ පොළක් එක්ක සම්බන්ධ වෙන්න ඕනෑ. ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා දන්නවා, ඒ කාලයේ එහෙම තීන්දු තීරණ ගත්තේ එවැනි විශාල ජාත්‍යන්තර ගුවන් පථයකට අවශ්‍ය කරන ශක්‍යතා අධ්‍යයනයක් එක්ක නොවෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට වරාය හම්බන්තොට ස්ථානගත වෙන්න ඕනෑය කියන කාරණය විශේෂයෙන් අපි දැකපු දෙයක්. ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් හැටියට මෙය නිවැරදි විධියට ස්ථානගත වුණා නම්, ඒකට අවශ්‍ය කරන ගුවන් ගමන් වෙළෙඳ පොළකුත් තිබෙන්න ඕනෑකම තිබුණා. ගුවන් තොටුපොළ ඉදි කරලා, සියලු කටයුතු කරලා, ගුවන් ගමන් සොයන්නේ ඊට පසුවයි. එහෙම වුණාම තමයි ෆ්ලයිඩුබායි සමාගමත් සමඟ ගිවිසුමකට එන්න සිද්ධ වෙන්නේ. ඇත්තටම ෆ්ලයිඩුබායි සමාගමත් එක්ක ගිවිසුමකට එන්නේ, මුලින්ම කොළඹට ගුවන් යානා ගෙන්වා ගන්නයි; එහෙම නැතුව මත්තලට ගුවන් යානා ගෙන්වා ගන්න නොවෙයි. ඊට පස්සේ ඔවුන්ගේ පැත්තෙන් නැවත දෙවන ගුවන් යානයක් යෝජනා කරන කොට රජය යෝජනා කරනවා, එහෙම නම් මත්තලට එන්න කියලා. එහෙම තමයි මත්තලට මේ ගුවන් යානා ගෙනෙන්නේ. මේ කාලය තුළ ෆ්ලයිඩුබායි සමාගම හැර වෙන මොනවාද මත්තලට ආවේ? එය සෙල්ලම් බඩුවක් හදලා විකුණනවා වාගේ නොවෙයි. මත්තල ගුවන් තොටුපොළ ජාත්‍යන්තර ගුවන් වෙළෙඳ පොළේ තරගකාරි ගුවන් තොටුපොළක් බවට පත් වුණා නම්, ලංකාවේ කේන්ද්‍රීය ස්ථානගත වීම අනුව අපට මෙය සංවර්ධනය කළ හැකිව තිබුණා. හැබැයි එයට අවශ්‍ය කරන ශක්‍යතා අධ්‍යයනයක්, marketing plan එකක් රටක් හැටියට අපට තිබුණේ නැහැ. ඒ නිසා තමයි බොහෝ විට එක ගුවන් සමාගමක් මත යැපෙන්න අපට සිද්ධවෙලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, එහි ඊළඟ අදියර තමයි ඔබතුමන්ලා දැන් ක්‍රියාත්මක කරන්නේ. මත්තල ගුවන් තොටුපොළේ අසාර්ථකත්වය පෙන්වන්න ඔබතුමන්ලා වී වෙළඳන්න පටන් ගත්තා. එවැනි දේශපාලන ක්‍රියාවලියක් ගෙන ගියා. අපි කියන්නේ ඒක නොවෙයි. ශ්‍රීලන්කන් ගුවන් සමාගමෙන් මෙය ගැලෙව්වා. මා දන්නා තරමට ඊට පස්සේ මත්තල වෙනම management එකක් හැටියට ස්ථානගත කරලා තිබෙනවා. දැන් ඔබතුමන්ලාට තිබෙන සැලැස්ම මොකක්ද? අටුව කඩා පුටුව හදනවා වාගේ ඊළඟට මත්තල ගුවන් තොටුපොළ ඉන්දියානු සමාගමකට දෙනවාද කියලා තමයි මෙතුමන්ලා අහන්නේ. ඒ සම්බන්ධයෙන් මෙතුමන්ලාට තිබෙන දේශපාලන විවේචනය අඩුවක් නැතුව අපටත් තිබෙනවා. ඒ කාරණය මම කියන්න ඕනෑ. මත්තල ජාත්‍යන්තර ගුවන් වෙළෙඳ පොළ ආක්‍රමණය කරලා අත් පත් කර ගන්න පුළුවන් වපසරියක් අත් පත් කර ගැනීමේ පදනමකින් නොවෙයි ස්ථානගත කළේ. හැබැයි දැන් ඇත්තටම ඉන්දියානු ගුවන් සමාගමකට හෝ ඉන්දියාව සම්බන්ධ ගුවන් සමාගමකට මත්තල ගුවන් තොටුපොළ විකුණන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද? මොකද, චීනයට හම්බන්තොට වරාය දෙනකොට, චීනයට හම්බන්තොට වරාය දීම සම්බන්ධයෙන් දේශපාලන වශයෙන් ඉන්දියාවේ තිබෙන විරෝධය පාන්න - මාධ්‍යවල පළ වුණු ආකාරයට, - ඉන්දියාව ඉල්ලුම් කළේ, මත්තල ගුවන් තොටුපොළ අවශ්‍ය බවයි. මත්තල ගුවන් තොටුපොළ ඉන්දියාවට දීමේ එකඟතාව තිබෙන්නේ චීනයට හම්බන්තොට වරාය දුන්නු නිසාද? එහෙම එකඟතාවක් තිබෙනවාද? ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා වහන්නේ නැතුව, හංගන්නේ නැතුව නිශ්චිත වශයෙන් කියන්න ඕනෑ. මොකද, මෙහි තිබෙන ප්‍රධාන කාරණය තමයි ඒක. මේ යෝජනාවේ මුඛ්‍ය හරය වන්නේ, හම්බන්තොට ගුවන් තොටුපොළ ඉන්දියානු ගුවන් සමාගමකට විකිණීමට කටයුතු කරනවාද, නැද්ද කියන එකයි. එතුමාගේ කථාවෙන් හරිහැටි සාක්ෂි ඉදිරිපත් වුණේ නැති නිසා තමයි මම ගරු ඇමතිතුමාගෙන් ඒ ගැන අහන්නේ. රජය හැටියට එයට වහාම උත්තරයක් දෙන්න, එසේ විකිණීමට කටයුතු කරනවාද, නැද්ද, එහෙම කරන්නේ මොන පදනමින්ද කියලා. කථාවක් පැතිර ගියා, ඉන්දියාවේ ගුවන් හමුදාවේ පිරිස් ඇවිල්ලා ගුවන් පුහුණුව සඳහා මත්තල ගුවන් තොටුපොළ ලබා ගන්න කටයුතු කරනවාය කියලා. ඒක බරපතළයි. මොකද, චීනයට හම්බන්තොට වරාය දීලා, මත්තල ගුවන් තොටුපොළ trainingවලට ඉන්දියාවට දුන්නොත්, කොහේ හෝ යුද්ධයක් ඇවිළුණු වෙලාවකට ලංකාවේ මිනිසුන් දෙපැත්තෙන්ම පරිප්පු කන්න ඕනෑ. ඒක ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳවත්, ස්වෛරීත්වය පිළිබඳවත් ලංකාවට

බරපතළ ප්‍රශ්නයක් වෙනවා. මම මේකෙන් අදහස් කරන්නේ නැහැ, හම්බන්තොට වරාය චීනයට දුන්නා නම්, මත්තල ගුවන් තොටුපොළත් චීනයටම දුන්නොත් හරියි කියලා.

දැන් මෙතුමා ඉතා වැදගත් ප්‍රශ්නයක් ඇහුවා, "කාගේ කටේද, ඩොලර් තිබෙන්නේ?" කියලා. ඒක දැන් ටිකක් විවාදාත්මක සාකච්ඡාවක්.

දැන් ඩොලර් කාගෙ කාගේත් කටවල්වල තිබෙනවා වාගේ තමයි පෙනෙන්නේ. මත්තල ගුවන් තොටුපොළ ඉන්දියාවට දීමේ ගිවිසුමක් තිබෙනවාද, එහෙම ගිවිසුමක් තිබෙනවා නම් ඒකේ පදනම මොකක්ද කියලා නිශ්චිත වශයෙන් ඔබතුමන්ලා කියන්න ඕනෑ. ඒක තමයි අපට මෙතැනදී මූලික වශයෙන් පැහැදිලි කර ගන්න තිබෙන්නේ. එහෙම තත්ත්වයක් නම් තිබෙන්නේ ඒක ඉතා බරපතළයි. ඒ වෙනුවට ශ්‍රී ලංකා රජය යටතේ මත්තල ගුවන් තොටුපොළ සංවර්ධනය කරන්න ශක්‍යතා අධ්‍යයනයක් - feasibility study එකක් - අලුත් තත්ත්වය යටතේ ඔබතුමා ඉදිරිපත් කරනවාද?

ඉන්දියාවට නොදෙනවා නම් ශ්‍රී ලංකා රජය යටතේ මත්තල ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීමට සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියන එකත් පැහැදිලි කර ගන්න ඕනෑකම තිබෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට, ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා.7.14]

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මට කථා කරන්න කාලය ලබා දීම සම්බන්ධයෙන් මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද දවසේ කනක හේරත් මන්ත්‍රීතුමා විසින් මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විදේශීකරණයට විරුද්ධව ගෙන එනු ලබන යෝජනාව අනුමත කරමින් මම ඒ සම්බන්ධයෙන් කරුණු කීපයක් පමණක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම රටක ව්‍යාපෘතියක් හෝ ව්‍යාපාරයක් ආරම්භ කළ පමණින් එය ලාභදායී ව්‍යාපෘතියක් බවට පත් වෙන්නේ නැහැ. ඒ සඳහා ටික කාලයක් ගත වන බව අපි දන්නවා. ලාභදායී ව්‍යාපෘති බවට පවත්වාගෙන යන්න බැරි වුණත් සමහර ව්‍යාපෘති ආරම්භ කරනවා. ඒ, එම ව්‍යාපෘතිය හරහා රීට වක්‍රව දායකත්වය දක්වන වරාය වෙන්න පුළුවන්; නිෂ්පාදන ආර්ථිකය වෙන්න පුළුවන්; කලාපයේ තිබෙන අනිකුත් අංශ දියුණු කරන්න වෙන්න පුළුවන්. ඒ තුළින් රටට යම්කිසි ආදායමක් ගෙන ඒමේ ව්‍යාපෘති හැටියට ක්‍රියාත්මක වන ව්‍යාපෘති තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වානක මන්ත්‍රීතුමා කිව්වා වාගේ මත්තල ගුවන් තොටුපොළ ආරම්භ කිරීම මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් ගත් තනි තීන්දුවක් නොවෙයි. රජයන් කීපයක් අවස්ථා ගණනාවකදී මේ වෙනුවෙන් උත්සාහ කළා. නමුත් එය යථාර්ථයක් බවට පත් වුණේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේයි. මේ ස්ථානය තෝරා ගැනීම, ශක්‍යතා වාර්තා ඉදිරිපත් කිරීම කියන මේ කරුණු කාරණා වසර ගණනාවක් මුළුල්ලේ කරපු දේවල් බවත්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා එදා දවසේ මේ සඳහා මුල් ගලක් තබද්දීත් ශක්‍යතා වාර්තාවක් ලබාගෙන ඒ කටයුත්ත කළ බවත් මම මේ ගරු සභාවට මේ අවස්ථාවේදී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ෆ්ලයිඩුබායි ගුවන් යානය පමණයි මත්තල ගුවන් තොටුපොළ පාවිච්චි කරපු එකම ගුවන් යානය බවට පත් වුණේ කියලා අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා. මම දන්නේ නැහැ, එතුමා හිටියේ ලංකාවේද කොහේද කියලා. එයාර් ඇරබියා ගුවන් යානයත්, ලුෆ්තාන්සා ගුවන් යානයත් ගිවිසුම්ගත වෙලා හිටියා, මත්තල ගුවන් තොටුපොළත් එක්ක. ශ්‍රීලන්කන් ගුවන් සේවයටත්, මිහින් ලංකා ගුවන් සේවයටත් අයිති එවැනි ගුවන් යානා ගණනාවක් මේ මත්තල ගුවන් තොටුපොළ ආශ්‍රිත ඉදිරි වැඩ පිළිවෙළක් වෙනුවෙන් ගිවිසුම්ගත වෙලා කටයුතු කරමින් හිටපු අවධියක් තිබුණා. මේ ගුවන් තොටුපොළේ පළමුවැනි අදියර පමණයි අවසන් වෙලා තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හෝටල් සංකීර්ණය වාගේම මේ ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීමේ අනිකුත් අංග ඉදි වෙමින් පවතින අවස්ථාවක තමයි 2015 අවුරුද්දේ ජනාධිපතිවරණය පැවැත්වුණේ. එම ජනාධිපතිවරණ පරාජයෙන් පසුව තමයි වර්තමාන රජය මත්තල ගුවන් තොටුපොළ විකිණීමට තීන්දු කළේ. වානක මන්ත්‍රීතුමා කිව්වා වාගේ එක රැයින් මත්තල ගුවන් තොටුපොළ වී ගබඩාවක් බවට පත් කරලා, මත්තල ගුවන් තොටුපොළේ තිබුණු සියලු භාණ්ඩ - පුටුවේ ඉඳලා ගෘහ භාණ්ඩ - ඉවත් කරලා, ක්‍රමානුකූලව තමයි මත්තල ගුවන් තොටුපොළ විකිණීමේ කටයුත්තට මේ රජය සැලසුම් සූදානම් කළේ. හම්බන්තොට වරාය විකිණීම තුළින් අපේ රටට සිදුවෙලා තිබෙන පාඩුව අද අපි දකිනවා. මේ රජය බලයට පත් වෙද්දී ජනතාවට කිව්වේ මොකක්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ආර්ථික ඔස්තාර්ලා ඉන්නේ එක්සත් ජාතික පක්ෂයේය කිව්වා. ආර්ථික ඔස්තාර්ලා ඉන්නේ එක්සත් ජාතික පක්ෂයේ නම් අපි අහනවා, රටක පාලනය බාර අරගෙන, ඒ රටේ සම්පත් විකිණීමද ආර්ථික ඔස්තාර්ලාගේ හැකියාව කියලා. එවැනි දෙයක් කරන්න නම් ඔස්තාර්ලා රටේ බලයට පත් විය යුතු නැහැ. අද වනකොට මේ රටේ තිබෙන ජාතික සම්පත් ටික එකින් එක විවිධ රටවලට විකුණමින් තිබෙනවා. එක පැත්තකින් හම්බන්තොට වරාය චීනයට ලබා දීලා තිබෙනවා. ඉන්දියාවට ගනුදෙනුවක් සඳහා මත්තල ගුවන් තොටුපොළ ලබා දෙන්න දැන් සාකච්ඡා කරමින් යනවා. ඉදිරියේදී අපිට මෙහි භයානක දෙයක් පෙනෙන්න තිබෙනවා. ලංකාව ලෝක බලවතුන්ගේ පොර පිටියක් බවට පත් වෙයිද කියන සැකය අපට තිබෙනවා. විශේෂයෙන්ම අද නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා නියෝජනය කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්තිය නොවෙයි කියලා වානක මන්ත්‍රීතුමා කිව්වා. අපි දැක්කා, අර්ජුන රණතුංග ඇමතිතුමා හම්බන්තොට වරායේ කටයුතුවලට විරුද්ධව කටයුතු කරද්දී, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, මහින්ද සමරසිංහ මැතිතුමාත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජිතයෙකු දාලා තමයි හම්බන්තොට වරායේ ඉදිරි කටයුතු කරගෙන ගියේ කියලා.

අද තත්ත්වය ගැන අපි කනගාටු වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයෙක් හැටියට නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ නායකත්වයෙන් ඒ කටයුතු ඉදිරියට ගෙන යාම ක්‍රියාත්මක කරනවා නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, මත්තල ගුවන් තොටුපොළත් එක්කම බිමටම සමතලා වෙයි කියලා මම හිතනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි දෙකක් දෙන්න. අද මේ ක්‍රමානුකූල වැඩ පිළිවෙළ තුළ අපට සැකයක් තිබෙනවා. මත්තල ගුවන් තොටුපොළ ලබා දීම එක අරමුණක් පමණයි. හම්බන්තොට වරාය අද ලබා දීලා ඉවරයි. රජය එක පැත්තකින් කියනවා, මුදල් කළමනාකරණය කර ගන්න හැකියාවක් නැහැ කියලා. සෑම සියලු දෙයකටම පසුගිය රජයට චෝදනා කරනවා. මතක තියා ගන්න, මහින්ද රාජපක්ෂ මැතිතුමා ජාතික සම්පත් එකින් එක, එකින් එක රටට එකතු කළේ විකිණීමේ අරමුණින් නොවෙයි; විජාතිකකරණය කිරීමේ අරමුණින් නොවෙයි කියන එක. රාජ්‍ය සම්පත් විකුණලා තිබෙන අවස්ථාවක "එමිරේට්ස්" ගුවන් සේවය, රාජ්‍ය ආයතන, රාජ්‍ය සම්පත්, පෞද්ගලික ආයතන විකුණලා තිබෙන වෙලාවක, ආයතන 46ක් මේ රටේ ජාතික සම්පත් හැටියට නැවත එකතු කරපු ආණ්ඩුවක් තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව. ඒ නිසා අපි මතක් කරනවා, මේ වෙනුවෙන් අත තියන්න සූදානම් වෙන්න එපා කියලා. මේ වෙනුවෙන් උද්ඝෝෂණය කරන්න ගිහිල්ලා ඩී.වී. චානක මන්ත්‍රීතුමා, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා, ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා ඇතුළු හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාව 37 දෙනෙක් මාසයක කාලයක් සිරගත කරලා තිබුණා. නමුත්, එදා දවසේ ඒ කරපු ක්‍රියාදාමයෙන් අපව නවත්වන්න හම්බ වන්නේ නැහැ. මේක ඉන්දියානු විරෝධය නොවෙයි. සමහරු කියනවා, මේක චීන විරෝධය, ඉන්දියානු විරෝධය කියලා. චීනයට කැමති අපි ඉන්දියාවට විරුද්ධයි කියලා කියනවා. එහෙම එකක් නොවෙයි මෙතැන තිබෙන්නේ. චීනයට හෝ ඉන්දියාවට හෝ වෙනත් ඕනෑම රාජ්‍යයකට අපේ රටේ සම්පත් ලබා දෙනවා නම් ඒ වෙනුවෙන් අපේ විරෝධතාව ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගත්ත තීන්දුව පිළිබඳ නැවතත් කල්පනා කර බලන්න කියලා විෂය භාර ඇමතිවරයාගෙන් අවසාන වශයෙන් ඉල්ලීමක් කරන්න කැමතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
70: 30 අනුපාතයට කොටස් අයිතිය දුන්නා කියලා මේ රටට ලැබෙන සම්පත මොකක්ද කියලා ඔබතුමා කල්පනා කරලා බලන්න. මත්තල ගුවන් තොටුපොළ ලබා දීමෙන් -අපේ හම්බන්තොට වරාය දැන් ලබා දීලා ඉවරයි. හම්බන්තොට-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි. ගරු අමාත්‍යතුමාටත් පිළිතුරු කථාව කරන්න තිබෙනවා.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විජයකලා යනකොට විජේපාල ඇමතිකමට යනවා. ඇමතිතුමා මට විනාඩියක කාලයක් ලබා දෙන්න. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ පිළිබඳ නැවත අධ්‍යයනයක් කරලා, නවීකරණය කරලා රටේ සම්පතක් හැටියට -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා වෙලාව නැහැ. මීළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා.7.20]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 8වෙනි දා වත්මන් යහපාලන ආණ්ඩුව බලයට පත් වෙනකොට රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත්, ඒ වාගේම අනෙකුත් මැති ඇමතිවරුත්, සජිත් ප්‍රේමදාස මහත්මයාත් මේ හැම කෙනාම කිව්වේ, "රාජපක්ෂලා හදාපු ගුවන් තොටුපොළට අද ගුවන් යානා එන්නේ නැහැ. ඒ වාගේම රාජපක්ෂලා හදාපු වරායට නැව් එන්නේ නැහැ. ඒ නිසා අපි වරායට දෛනිකව නැව් ගෙනැල්ලා වරාය පුරවනවා. මත්තල ගුවන් තොටුපොළට ගුවන් යානා ගෙනැල්ලා ඒක ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් බවට පත් කරනවා" කියලායි. එහෙම කියලා තමයි පටන් ගත්තේ. නමුත් තමුන්නාන්සේලාගේ ක්‍රියාකාරිත්වයෙන් මොකක්ද වුණේ කියලා අපි දන්නවා. පසුගිය දවස්වල නියෝජ්‍ය අමාත්‍ය අශෝක් අබේසිංහ මහත්මයා ප්‍රසිද්ධියේම මාධ්‍යවලට ප්‍රකාශ කළා, "මත්තල ගුවන් තොටුපොළට ගොඩබසින 'ෆ්ලයිඩුබායි' සමාගමට අයත් ගුවන් යානා නැවැත්තුවේ මත්තලට ගොඩබසින එක එම ගුවන් සමාගමට දිගින් දිගටම පාඩු නිසායි" කියලා. මම ඒ වෙලාවේ කිව්වා, "ඇමතිතුමා ඔබතුමා ඒ කරපු ප්‍රකාශය සම්පූර්ණ සාවද්‍යයි. එහෙම තත්ත්වයක් නැහැ" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මොකද, තමුන්නාන්සේලා මේ ගුවන් සමාගමත් එක්ක ගිවිසුම් ගහනකොට පළමුවෙනි ගුවන් යානය ගියේ, කොළඹ-ඩුබායි. ඒ ගොල්ලන් දෙවැනි ගුවන් යානය ඉල්ලුවා, ලංකාවට එන්න අපට දෙන්න කියලා. එතැනදී ඔබතුමන්ලා ගුවන් යානය දුන්නා, ඩුබායි -කොළඹ-මත්තල. දවස් 4ක්, 5ක් ගියා. නැවත වතාවක් ආපහු ගුවන් යානය මත්තලට ගොඩබැස්සුවේ නැහැ. තුන්වෙනි එකත් ඉල්ලුවා. තුන්වෙනි එකත් දුන්නා, ඩුබායි-කොළඹ. දෙවැනි එක දුන්නේ මත්තලට ගොඩබස්සන පදනම මත. නමුත්, ඒ ගොල්ලන් ඒක කළේ නැහැ. හතරවෙනි එකත් දුන්නා.

ඒ ගොල්ලන් හතරවැනි එකත් අවේ, ඩුබායි - කොළඹ. පස්වැනි එකත් දුන්නා. ඒකත්, ඩුබායි - කොළඹ. තමුන්නාන්සේලා දිගින් දිගටම ඒ ගුවන් සමාගමේ ආධිපත්‍යයට යට වෙලා, යම් ප්‍රමාණයකට ආදායම් ලැබෙමින් තිබුණු මත්තල ගුවන් තොටුපොළට ඒ ගුවන් සමාගමේ ගුවන් යානා එන එක නතර කරන්න උත්සාහ ගත්තා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
තමුන්නාන්සේලා දෙගොල්ලන්ම එකතු වෙලා අපේ ස්වාධීනත්වය මුළුමනින්ම පාවා දීලා, අපේ ආර්ථිකයට යම් ආකාරයකින් සහනයක් ලබන්නට තිබුණු අවස්ථාව නැති කරලා තිබෙනවා. තමුන්නාන්සේලා දෙගොල්ලන්ම "වත්ත බද්දට දීලා ඇස්සට දත නියවනවා" වාගේ තත්ත්වයකුයි ඇති කරලා තිබෙන්නේ. ඒක නිසා ඒක වහාම නවත්වන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 7.23]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කනක හේරත් මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා. එතුමාගේ යෝජනාව ආරම්භ කරලා තිබෙන්නේ, ෆ්ලයිඩුබායි සමාගම සමඟ ඇති කරගත් ගිවිසුම නොසලකා හරිමින් ඉන්දියානු සමාගමකට විකුණන්න යනවා කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, flights හතරක් ඩුබායිවල ඉඳන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළට ඇවිල්ලා, එතැනින් මත්තලට ඇවිල්ලා එතැනින් යන්න තමයි අපි මේ ෆ්ලයිඩුබායි සමාගමට අවසර දීලා තිබුණේ. නමුත් මේ කාල සීමාව තුළදී මත්තලට යන එක නතර කළේ, කුරුල්ලන්ගේ ප්‍රශ්නය නිසා ෆ්ලයිඩුබායි සමාගමට විශාල අර්බුදයක් පැන නැඟුණු නිසායි. කුරුල්ලෝ හැප්පිලා විශාල වශයෙන් එන්ජින්වලට අලාභහානි වෙලා ඔවුන් ඉල්ලීමක් කළා, මේ කාලය තුළදී -

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
**(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)**
(The Hon. Nimal Siripala De Silva)
ඔබතුමා කථා කළා නේ. දැන් මගේ කථාව අහගන්න කෝ. ඒ අනුව අපි තාවකාලිකව කුරුල්ලන් ගහනය වැඩි මේ කාලය තුළදී නැවිත් ඉන්න ඔවුන්ට ඒ සහනය ලබා දුන්නා. ඒ මිසක් ඉන්දියාවට විකුණන්න ඕනෑ හින්දා එහෙම කළා නොවෙයි. ෆ්ලයිඩුබායි සමාගම මොකකද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? Flights හතරයි එන්නේ. තුන්දෙනායි, හතර දෙනායි ඒ ගුවන් තොටුපොළෙන් ගුවන් යානාවට නඟින්නේ. මේක නාමිකව එනවා මිසක් passengersලා විශාල සංඛ්‍යාවක් ගෙන එන එකක් නොවෙයි. මම පළමුවෙන්ම ඒ කාරණය නිවැරදි කරන්න ඕනෑ.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු ඇමතිතුමනි, bird strikes යටතේ, incidents එහෙම නැත්නම් accidents වෙන්න ඕනෑ. මෙතැන මේ දක්වා ෆ්ලයිඩුබායි සමාගමට major incidents වෙලා නැහැ. ෆ්ලයිඩුබායිවලට "ඇස්මාරා" කියන ගුවන් තොටුපොළේ මීට වඩා incidents වෙලා තිබෙනවා. ඒ නිසා මේක හේතුවක් නොවෙයි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
Major incidents සිද්ධවෙලා තිබෙනවා කියලා මට වාර්තා වෙලා තිබෙනවා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
Major incidents සිද්ධවෙලා නැහැ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
**(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)**
(The Hon. Nimal Siripala De Silva)
ඔබතුමා නැහැ කියලා කිව්වාට එහෙම වෙලා තිබෙනවා කියලා මට වාර්තා වෙලා තිබෙනවා. අපට ඒවා බලෙන් ගෙන්වා ගන්න පුළුවන්කමක් නැහැ නේ. ෆ්ලයිඩුබායි ගුවන් යානා නතර කළේ මත්තල ගුවන් තොටුපොළ ඉන්දියාවට විකුණන්න ඕනෑ නිසා නොවෙයි. ඒ ඇරෙන්න සමහර charter flights කිහිපයක් ආවා. ඒ මිසක් විශාල වශයෙන් ගුවන් යානා මෙතැනට පැමිණියේ නැහැ. SriLankan Airlines එකත් එන්න බැහැ කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා මේ කියන පදනම සම්පූර්ණයෙන් වැරදියි. එපමණක් නොවෙයි. මේ ගුවන් තොටුපොළ පිළිබඳව අපි කථා කළොත්, මේක විශාල වශයෙන්ම අලාභයට පත් වෙච්ච ගුවන් තොටුපොළක්. දැන් බලන්න, 2018දී total revenue එක කීයද කියලා. ආදායම මිලියන 14යි. ණය වාරිකත් එක්ක වියදම මිලියන 1,910යි. 2017දී ආදායම මිලියන 78යි; වියදම මිලියන 3,468යි. 2016දී ආදායම මිලියන 49යි; වියදම මිලියන 3,947යි. 2015දී ආදායම මිලියන 72යි; වියදම මිලියන 5,947යි. 2014දී ආදායම මිලියන 136යි; වියදම මිලියන 3,235යි. 2013දී ආදායම මිලියන 48යි; වියදම මිලියන 2,828යි. මේ වෙන කොට accumulated loss එක බිලියන 20ක් වෙලා තිබෙනවා. අපට ඕනෑ, මේක විනාශ කරන්න නොවෙයි; මේ ගුවන් තොටුපොළ හදලා ගන්නයි. එහෙම නම් මේකට නව ආයෝජන ගෙන්වා ගන්න ඕනෑ. මේ සඳහා ගුවන් යානා ගෙන්වා ගන්න ඕනෑ.

අපි මේ ගුවන් තොටුපොළ ඉන්දියාවට දෙන්න නොවෙයි හදන්නේ. මුලින්ම මේ තත්ත්වය සඳහන් කරලා මා කැබිනට් සංදේශයක් ඉදිරිපත් කළා, 2016 දෙසැම්බර් මාසයේ 1වැනි ආ. ඊට පස්සේ, මෙම ගුවන් තොටුපොළ ක්‍රියාකාරී තත්ත්වයට ගෙනඑන්න පුළුවන් partner කෙනෙක් ඇවිල්ලා, අපිත් එක්ක එකතු වෙලා, මෙම ගුවන් තොටුපළ හදන්න යෝජනා දෙන්න කියලා පත්තරේ දැන්වීම් දැම්මා; විදේශ පුවත් පත්වලත් දැම්මා. ඒ

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

අනුව යෝජනා 6ක් ආවා. ඒවා TEC එකෙනුයි, Cabinet Appointed Tender Board එකෙනුයි විශ්ලේෂණය කළා. නමුත්, ඒ එකක්වත් සුදුසු යෝජනා හැටියට ගණන් ගැනුණේ නැහැ. "අපට solar power හදන්න ඉඩ දෙන්න" වාගේ වෙන වෙන දේවල් තමයි ඒ අය ඉල්ලුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේවා කරන්නේ මේ ගුවන් තොටුපොළට බෝම්බ දාලා විනාශ කරන්න නොවෙයි. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා වාගේ, වැරදි ස්ථානයක, වැරදි සහිතව හදන ලද ගුවන් තොටුපොළ නිසි ආකාරයට ක්‍රියා කරවීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සොයාගෙන, ඒ සඳහා අවශ්‍ය ජාත්‍යන්තර සහයෝගය ලබාගෙන, ගුවන් යානා සහ ගුවන් යානා අංශයට සම්බන්ධ කර්මාන්ත ගෙන එන්න පුළුවන් partner කෙනෙක් ලබාගන්නයි අපි උත්සාහ කරන්නේ. අපි පුවත් පත්වල දැන්වීම් දාලා මුළු ලෝකයෙන්ම ඒකට යෝජනා ඉල්ලුවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි,-

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ඔබතුමා ඉන්නකෝ. මුළු ලෝකයෙන්ම ඉල්ලුවා. නමුත්, ආවේ නැහැ. ඒ අවස්ථාවේ තමයි ඉන්දියාව joint venture වැඩ පිළිවෙළක් සඳහා අපට යෝජනාවක් ඉදිරිපත් කළේ. මේ ගුවන් තොටුපොළ කාටවත් විකුණලා නැහැ. AASL සමාගමයි, Indian Airport Authority එකයි ඒකාබද්ධ සමාගමක් හදලා,-

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
Sir, I rise to a point of Order.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ඔබතුමා කථා කරන කොට මම බාධා කළේ නැහැනේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද point of Order එක ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා?

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ගරු ඇමතිතුමනි, මේ ගුවන් තොටුපළ විවෘත කිරීමේ අවස්ථාවට ඔබතුමායි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි සහභාගි වුණා. දෙදෙනාම එක ළඟ seats දෙකක සිටියේ. ඔබතුමා දැන් කියනවා, මෙම ව්‍යාපෘතිය කිසිම ඵලදායී ව්‍යාපෘතියක් නොවෙයි කියලා. ඔබතුමන්ලා දෙදෙනා ඒ රජයේ හිටපු ප්‍රධාන ඇමතිවරු දෙදෙනෙක්.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
නැහැ, නැහැ. ඒක ඵලදායී ව්‍යාපෘතියක් නොවෙයි කියලා අපි කිව්වේ නැහැ.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ඔබතුමන්ලා ජ්‍යෙෂ්ඨ ඇමතිවරු හැටියට එදා එම අවස්ථාවට සහභාගි වුණා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
එම ව්‍යාපෘතිය කරගෙන යනකොට අඩු පාඩු පෙනුණා. එම අඩු පාඩු මකලා හොඳ ව්‍යාපෘතියක් බවට පත් කරගන්න තමයි මේ රජය කටයුතු කරන්නේ. ඒ නිසා, ඒකට අවශ්‍ය සහායකයෙක් ලබා ගන්නයි, ඒ ආයෝජනය ලබාගන්නයි අපි කටයුතු කරන්නේ. එහෙම නැතුව මේ ගුවන් තොටුපොළ විනාශ කරලා දමන්න නොවෙයිනේ අපි මේ හදන්නේ.

ඒ වාගේම කිව්වා, අපි එතැන තිබුණු පුටු, බඩු මුට්ටු ආදිය අරගෙන ගියා කියලා. නමුත් ඒ කිසි දෙයක් අරගෙන ගියේ නැහැ. අගමැතිතුමා ගිහිල්ලා එතැන වී ගබඩා කරනකොට, ඒකට මාත් එකඟ වුණේ නැහැ. ඒක වෙනම ප්‍රශ්නයක්. එම ගුවන් තොටුපොළ ආරක්ෂා කර ගන්නයි මට ඕනෑ වුණේ. එය ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළ ගැන තමයි මා කියන්නේ. එතකොට ඔබතුමන්ලා කියනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප සභාපති හැටියට මම මේක විකුණන්න යනවා කියලා. එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා Port City එකේ අක්කර 200ක් අනූනම අවුරුදු බද්දකට දෙනකොට අපි විරුද්ධ වුණාද? ෂැංග්‍රිලා එකට ඉඩම් දෙනකොට අපි විරුද්ධ වුණාද? එහෙම නම් අපි එතුමාටත් දොස් කියන්න එපායැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මෙවැනි දේශපාලන සටන් පාඨ නොවෙයි අපට අවශ්‍ය. අපට ඕනෑ මේ airport හදලා ගන්නයි.

දැන් කියනවා ඉන්දියාවේ ගුවන් හමුදාව එනවා කියලා. අමූලික බොරුනේ. අපි විශේෂයෙන්ම මේක commercial airport එකක් විතරයි කියලා කිව්වා. මේක වෙළෙඳ airport එකක් විතරයි. Perimeter security එක පවා අපේ Air Force එකෙන් කරන්න ඕනෑ. එහි security එකට සම්බන්ධ වෙන්න කිසිම ඉන්දියානුවෙකුට පුළුවන්කමක් නැහැ කියන මූලික කොන්දේසිය අපි දාලා තිබෙනවා. ඔබතුමන්ලාට වාගේම අපටත් මේ රට පිළිබඳව ආදරයක් තිබෙනවා. [බාධා කිරීමක්] එහෙම හිතන්න එපා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
Sir, I rise to a point of Order.
ගරු ඇමතිතුමනි, පැහැදිලි කර ගැනීමක් පමණයි මට අවශ්‍ය. එතකොට මේ පනත වෙනස් කරන්න වෙනවාද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
මම එතැනට එන්නම්කෝ. මම කියනකල් ඉන්න. ඔබතුමා හදිසි වෙන්න එපා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ඔබතුමා ඒ ගැන පැහැදිලි කරපු නැති නිසායි මම අහන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
පනත වෙනස් කරන්න අවශ්‍ය නම් වෙනස් කරනවා. ඒක ප්‍රශ්නයක් නැහැ. අපි මේ ආයෝජනය ලබා ගැනීම සඳහා කටයුතු

කරලා, මේ airport එක හොඳ airport එකක් බවට පත් කරනවා. ඒක විකුණන්නේ නැහැ. කාටද විකුණන්නේ? අපේ රටට ඒකාබද්ධ ව්‍යාපෘති -joint ventures- කොච්චර එනවාද? ඇයි, අපේ ආණ්ඩුව කාලයේ ඒකාබද්ධ ව්‍යාපෘති තිබුණේ නැද්ද? ඒ නිසා "මේක විකුණනවා, මේක විකුණනවා" කියලා බොරුවට සටන් පාඨ කියන්න එපා. ඒක සම්පූර්ණයෙන්ම වැරැදියි. අපේ අවශ්‍යතාව තිබෙන්නේ, මේක හොඳ airport එකක් බවට, ගුවන් යානා එන airport එකක් බවට පත් කරන්නයි.

මාතර සිට බෙලිඅත්ත දක්වා යන දුම්රිය මාර්ගය ඒ airport එක දක්වා දීර්ඝ කරන්න දැනටමත් ශක්‍යතා අධ්‍යයනය පටන් ගෙන තිබෙනවා. ඒ වාගේම අපි highway එකත් ඒ දක්වා ගෙන ගියාට පස්සේ මේ airport එක වඩාත් ක්‍රියාත්මක airport එකක් බවට පත්වෙනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ කරපු ව්‍යාපෘතිවලට අපිත් සම්බන්ධයි. ඒ නිසා අපට ඒවා විනාශ කරන්න වුවමනාවක් නැහැ. අපට ඕනෑ මේ airport එක ශක්තිමත් කරලා viable airport එකක් බවට, මඟීන් එන airport එකක් බවට, අහස් යාත්‍රා එන airport එකක් බවට පත් කිරීමටයි. ඒක තමයි අපේ අරමුණ. අපි මේ joint venture එකට එන්නේ මොන කොන්දේසි මතද කියන කාරණා සාකච්ඡා කරනවා. ඒ විතරක් නොවෙයි, මා අමාත්‍යවරයා වශයෙන් පොරොන්දු වෙනවා, ඒ joint venture එකට ඇතුළත් වෙන්න ඉස්සර වෙලා, ඒ පිළිබඳ පූර්ණ දැනුවත් කිරීමක් මේ පාර්ලිමේන්තුවට කරනවා කියලා. එහි ඇතුළත් වන කොන්දේසි මොනවාද, ඒ ඉන්න සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නේ කොහොමද, මේ ව්‍යාපෘතියට අනාගත ආයෝජන ලබා ගන්නේ කොහොමද, ඒවා බෙදා ගන්නේ කොහොමද -සියයට 70 -30 අනුපාතයටද- අපි ව්‍යාපෘතිය දෙන්නේ මොන මිල ගණනකටද කියන කාරණා පිළිබඳව රජයේ තක්සේරුකරුගේ තක්සේරුව ලබාගෙන ඉතාම පාරදෘශ්‍යභාවයකින් යුතුව මේ කටයුත්ත කිරීමට මාත් මගේ අමාත්‍යාංශයේ සෑම දෙනාත් කටයුතු කරනවා. මේක මගේ තනි තීරණයක් නොවෙයි. අමාත්‍යවරයා වශයෙන් මට තනි තීරණයක් ගන්න බැහැ. කැබිනට් මණ්ඩලය මේ කාරණය පිළිබඳව මූලික ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන තිබෙනවා. මේ රජයේ ඉන්න කවුරුත් ඒකට වගකියන්න ඕනෑ. එහෙම තමයි රජයකට බැඳුනාම වෙන්න ඕනෑ. රජය කරන කටයුතුවලට අපි වගකියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ කාරණය ඉතා පැහැදිලිවම කියන්න ඕනෑ. විදේශ ආයෝජන ලබා ගැනීම අපරාධයක් නොවෙයි. විදේශ ආයෝජන ලබා ගැනීමේදී අපේ රට ආරක්ෂා වන ආකාරයෙන් අපි ඒ ආයෝජන ලබාගත යුතුයි. ඒ කටයුත්ත කිරීමට අපි බැඳිලා ඉන්න බව මා ප්‍රකාශ කරන්න කැමතියි. මේ පිළිබඳව මගේ නිලධාරීන් සමඟ සාකච්ඡා කරන්න ඊයේත් ඉන්දියානු කණ්ඩායමක් ආවා. මේ වෙනකොට සාකච්ඡා වට තුනක් පැවැත්වුවා. අපි සෑම කාරණයක් පිළිබඳවම දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා, මේ රටේ ආරක්ෂාවට කිසිම තර්ජනයක් වෙන්න ඉඩ දෙන්නේ නැහැ. ඉන්දියානු ආරක්ෂක අංශ හෝ වෙනත් කිසිවෙක් තියා Air Traffic Controllersලා වත් ඒ අයට ගෙනෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒ කටයුතු කරන්නේත් අප විසින්මයි. මේ විධියට අපි ඉතා ගැඹුරින් කල්පනා කරලා කටයුතු කරනවා. මේ රටේ ආරක්ෂාව පිළිබඳව තමුන්නාන්සේලාට විතරක් නොවෙයි, අපටත් වගකීමක් තිබෙනවා. අපිත් මේ රට වෙනුවෙන් වැඩකටයුතු කරපු අය. ඔබතුමන්ලා හිතන්න එපා ඉන්දියාවට ඕනෑ ඕනෑ විධියට අපි මේ ව්‍යාපෘති ලබා දෙනවා කියලා. එහෙම කියන්න එපා. ඒ කථා දේශපාලන සටන් පාඨ වශයෙන් හොඳයි; ඒවා කරන්න. අපිත් විපක්ෂයේ හිටියා නම්, කරන්නේ ඒක තමයි. අපි ඒක දන්නවා. නමුත් යථාර්ථවාදී ලෙස මේ රට යන ඉදිරි ගමනට ඇයි මෙච්චර බාධා කරන්නේ? මම කිව්වා, මේ වෙනකොට බිලියන 20ක් අපි මේ ව්‍යාපෘතියෙන් පාඩු ලබලා තිබෙන බව. මේ පාඩුව අපි අවම කර ගන්න ඕනෑ. ඉන්දියානු සමාගම සමඟ අපි joint venture එකක් හැදුවාට පස්සේ, ලැබ ලබනතුරු අනිවාර්යයෙන්ම මේ පාඩුවෙන් සියයට 70ක් ඒ ගොල්ලන් දරන්න ඕනෑ. ඉතින් බලන්න, මොනතරම් සූක්ෂම විධියටද අපි මේ පාඩුව ඒ අය උඩට දමන්නේ කියලා. මේ විධියේ හොඳ business deal එකක් දැම්මාම ඒකටත් දේශපාලන මඩ ගහනවා. ඒකට කමක් නැහැ. ඒක මේ රටේ දේශපාලනයේ ස්වභාවය නේ. නමුත් මා කියන්න කැමැතියි, මේ රටේ ගුවන් ගමන් කර්මාන්තය දියුණු කරලා, මේ රට ඉදිරියට ගෙන යෑමේ බලාපොරොත්තුව ඇතිව ඉතාම සද්භාවයෙන් මේ කටයුත්ත කරන බව. ඒ නිසා මේ කටයුතු ගැන අනිසි බියක් ඇති කර ගන්නට එපා. මා පොරොන්දු වුණු පරිදිම මේ පිළිබඳව ඇති කර ගනු ලබන ගිවිසුම අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තමයි ඒ කටයුතු කරන්නේ කියන පොරොන්දුව ලබාදෙමින් මගේ කථාව අවසන් කරනවා.

මීළඟට, මගේ Deputy Minister අදහස් ප්‍රකාශ කරයි. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කනක හේරත් මන්ත්‍රීතුමා, ඔබතුමා මොන කාරණයක් ගැනද කථා කරන්නේ? [බාධා කිරීමක්]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

දැනට අපේ මතය තිබෙන්නේ අවුරුදු 40ක කාල සීමාවක් කියලා. ෂැන්ග්‍රි - ලා එක වාගේ අවුරුදු 99කට නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා. ගරු අශෝක අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා..7.38]

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කනක හේරත් මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද යෝජනාවම වැරදියි. මොකද, එතුමා කියලා තිබෙන්නේ මත්තල ගුවන් තොටුපොළ විකිණීමක් පිළිබඳව. එහෙම විකිණීමක් කවදාවත් කරන්නේ නැහැ. එතුමාගේ යෝජනාවම වැරදි බව මම විශේෂයෙන් ප්‍රකාශ කරනවා. මම කනගාටු වෙනවා, එතුමන්ලා නවක මන්ත්‍රීවරුන් නිසා එතුමන්ලාට මතක නැතිව ඇති, කලින් පැවැති එතුමන්ලාගේ ආණ්ඩුව තමයි ෂැන්ග්‍රි - ලා හෝටලයට ඉඩමක් සින්නක්කර විකිණුවේ. ඒ විධියට සින්නක්කරයට ඉඩමක් විකුණපු ආණ්ඩුවක වර්තමාන මන්ත්‍රීවරුන් විධියට මෙවැනි යෝජනාවක් ගෙන ඒම පිළිබඳව මම කනගාටු වෙනවා. ඒ වාගේම Colombo Port City එකේ අක්කර 500ක් සින්නක්කර දෙන්න නියමිතව තිබුණා. අපි කවදාවත් එහෙම කරන්නේ නැහැ. විකිණීමක් නොවෙයි, මේක හවුල් ව්‍යාපාරයක්.

2009දී මේක ආරම්භ කරලා, 2010 මාර්තු මාසයේ දී Exim Bank එකෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 190ක් ණය අරගෙන

[ගරු අශෝක් අබේසිංහ මහතා]

තිබෙනවා. පසුගිය 2007 වසරේ මත්තල ගුවන් තොටුපොළේ මාසයක ආදායම රුපියල් ලක්ෂ 65යි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මාසික වියදම රුපියල් ලක්ෂ 2,900යි. මාසික අදායම රුපියල් ලක්ෂ 65යි; මාසික වියදම රුපියල් ලක්ෂ 2,900යි. ඒ අනුව අපි වසරකට රුපියල් ලක්ෂ 17,000ක් ණය ගෙවන්නට ඕනෑ, රුපියල් කෝටි 170ක්. ඉතින් කොහොමද මේක කරන්නේ? අපි දැන් කටුනායක ගුවන් තොටුපොළෙන් එන ආදායමෙන් තමයි මේක ගෙවන්නේ. 2015 ඉඳන් 2030 වෙනකම් අවුරුදු 15ක් මේක ගෙවන්නට ඕනෑ, රුපියල් ලක්ෂ 17,000 ගණනේ. ඉතින් රජයකට මේක කරන්න පුළුවන්ද? අපි හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන්න යද්දී, දැන් මේ පිළිබඳව කෑ ගහනවා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
මේ ණය ගෙවලා ඔබතුමන්ලා කටුනායක ගුවන් සමාගමෙන් අලාභයක් ලබනවාද?

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඒක වෙනම කථාවක්.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ඒක තමයි. ඕකම තමයි වරායටත් වුණේ.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඒක වෙනම කථාවක්. කටුනායක ගුවන් තොටුපොළින් අපි රජයටත් මුදල් දෙනවා. අපි ඒක ලාභ ලබන ආයතනයක් බවට පත් කරලා තිබෙනවා. පසුගිය වසර 30 තිස්සේම කටුනායක ගුවන් තොටුපොළේ ධාවන පථය අලුත්වැඩියා කරලා තිබුණේ නැහැ, අපේ ආණ්ඩුව ආවාට පසුව, අපේ ගරු ඇමතිතුමා මූලික වෙලා ඒ කටයුත්ත අවසන් කළා. පසුගිය රජය ඇමෙරිකානු ඩොලර් මිලියන 80කින් කරන්නට නියමිතව තිබුණු එක අපි ඇමෙරිකානු ඩොලර් මිලියන 49කින් කළා. එම ගුවන් තොටුපොළ ලාභ ලබන නිසා තමයි අපට මේක ගෙවන්නට පුළුවන් වෙලා තිබෙන්නේ. එම නිසා අපි කිසිසේත්ම මත්තතල ගුවන් තොටුපොළ විකුණන්නේ නැහැ, අපි ඒ හරහා හවුල් ව්‍යාපාරයක් කරනවා. ගරු ඇමතිතුමා කිව්වා වාගේ අපි මේක පත්තරවල දැම්මා; website එකේ දැම්මා. අපිට මේ සඳහා ඉල්ලුම්කරුවන් 06 දෙනෙකු ඉදිරිපත් වුණා. අපේ තක්සේරුවෙන් පිට සතයක්වත් අපි අඩු කරන්නේ නැහැ. රජයට තක්සේරුවක් තිබෙනවා, ඒ තක්සේරුවෙන් සියයට 70ක් සහ සියයට 30ක් වශයෙන් ලැබෙනවා. ගරු ඇමතිතුමා කිව්වා වාගේ මේක පාඩු ලැබුවත් එම පාඩුව ඒගොල්ලන් දරනවා. මේක අපට කරන්න පුළුවන්ද? මාසයකට රුපියල් ලක්ෂ 65ක ආදායමක් හම්බ වෙලා, මාසයකට රුපියල් ලක්ෂ 2,900ක් වියදම් කරලා, අවුරුද්දකට රුපියල් ලක්ෂ 17,000ක් ණය ගෙවන්නේ කොහොමද? මේක තව තවත් මේ විධියට යන්න ගියාම කොපමණ පාඩුවක් සිද්ධ වෙනවාද? එම නිසා මේක ලාභ ලබන ගුවන් තොටුපොළක් බවට පත් කරන්නට ඕනෑ. එහෙම කළොත් පමණයි මේ රටේ ආර්ථිකයට යම්කිසි ආදායමක් ලැබෙන්නේ; ආර්ථිකය ඉහළට යන්නේ. මම ගරු ඇමතිතුමා සමඟ විශේෂයෙන්ම සාකච්ඡා කරමින් සිටිනවා, ඒ ප්‍රදේශයෙන් විදේශවලට යන අපේ ශ්‍රී ලාංකිකයන් එම ගුවන් තොටුපොළ හරහා විදේශවලට යැවීමේ වැඩ පිළිවෙළක් ගැන.

දැන් මේ සභාවේදී ඔබතුමා කිව්වා, වෙනත් රටවල ගුවන් යානා අපේ ගුවන් සීමාව හරහා පියාසර කිරීම නිසා එම ගුවන් තොටුපොළට ආදායමක් ලැබෙනවා කියලා. එම නිසා ඒ, ගුවන් තොටුපොළට ආදායමක් ලැබෙන්නේ නැහැ. අපේ රටේ භූමි ප්‍රමාණය වාගේ විසි ගුණයක් තිබෙනවා අපට අයත් ගුවන් සීමාව. මේ ගුවන් සීමාව තුළ පියාසර කරන ගුවන් යානාවලින් සිවිල් ගුවන් සේවා අධිකාරියට ආදායමක් ලැබෙනවා. ගුවන් තොටුපොළට ලැබෙන්නේ නැහැ. සිවිල් ගුවන් සේවා අධිකාරියට මේ ගුවන් සීමාව තුළ, වර්ග කිලෝමීටර් 65,000 ඒවා 20ක් තුළ පියාසර කරන ගුවන් යානාවලින් ආදායමක් ලැබෙනවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. සියයට 70 සහ සියයට 30 ඒකට බලපාන්නේ නැහැ. සිවිල් ගුවන් සේවා අධිකාරියට ලැබෙන්නේ. මේකත් සමඟ ඒකට සම්බන්ධයක් නැහැ. ඒ යන ගුවන් යානාවකින් දැනට ගෙවන්නේ ඇමෙරිකානු ඩොලර් 250යි. දවසකට ගුවන් යානා 200ක් පමණ යනවා. අපි දැන් වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා, එම ගුවන් යානයක් අපේ ගුවන් සීමාවට ඇතුළු වුණාම ඒක එළියට යන කාලය, ගුවන් යානයේ බර සහ මගීන් ප්‍රමාණය අනුව මුදල් අය කරන්නට. එවැනි වැඩ පිළිවෙළක් අපි සකස් කරමින් යනවා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
සිවිල් ගුවන් සේවා අධිකාරියට තමයි ඒ මුදල ලැබෙන්නේ.

නමුත් අපි කියන කාරණය වන්නේ, මේ ගුවන් තොටුපොළ මෙතැන තිබුණු නිසා නේ ඒක ලැබෙන්නේ.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
නැහැ, නැහැ. ගුවන් තොටුපොළ එතැන තිබෙන නිසා නොවෙයි.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
නැති වෙන්නේ කොහොමද?

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඔය ගුවන් තොටුපොළට ඒක සම්බන්ධයක් නැහැ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
මොකද, දැන් කටුනායක ගුවන් තොටුපොළට A380 ගුවන් යානා බස්සන්න පුළුවන්. ඒ නිසා ඒකෙන් බලපෑමක් වෙන්නේ නැහැ.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා වැරදි අර්ථකථනයක් දෙන්නේ. ඒ ගුවන් තොටුපොළ තිබුණත් නැතත්, අපේ ගුවන් සීමාවෙන් යන ගුවන් යානාවලින් අපට මුදල් ලැබෙනවා. ඒ, ගුවන් තොටුපොළට කියලා එකක් නැහැ. ඒ, ගුවන් තොටුපොළට වැඩියෙන් ගුවන් යානා ආවොත්, අපට ඒ එන ගුවන් යානාවලින් මුදල් ලැබෙනවා නේ. එතකොට ආදායම වැඩි වෙනවා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

මත්තල ගුවන් තොටුපොළ විකල්ප ගුවන් තොටුපොළක් හැටියට භාවිතා කරනවා. කටුනායක ගුවන් තොටුපොළක් තිබෙන එක වෙනම දෙයක්. කටුනායකට විකල්පය තමයි මත්තල ගුවන් තොටුපොළ. එහෙම නැත්නම් ගුවන් යානා යන්නේ දිල්ලිවලට, එහෙමත් නැත්නම් කරච්චිවලට. ඒක නිසා මේ ගුවන් තොටුපොළ විකල්ප ගුවන් තොටුපොළක් හැටියට භාවිත කිරීම වෙනුවෙන් මුදලක් ලැබෙනවා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

මේ ගුවන් තොටුපොළ ජනාකීර්ණ ගුවන් තොටුපොළක් බවට පත් වුණාම ගුවන් යානා එද්දී අපට ලැබෙන ආදායම් වැඩි වෙනවා. මොකද, ගුවන් යානා එද්දී අපේ ගුවන් සීමාවේ නේ එන්නේ. ඒ නිසා ආදායම් වැඩි වෙනවා. අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ ආයෝජකයෙක් සමඟ එකතු වෙලා හවුල් ව්‍යාපාරයක් තුළින්, පාඩු ලබන ගුවන් ආයතනය ලාභ ලබන ගුවන් ආයතනයක් බවට පත් කර, ඒ ආයතනයෙන් මේ රටට ප්‍රතිලාභ ලබා දෙන්නයි. එහෙම නැතිව කිසිසේත්ම විකිණීමක් නොවෙයි කරන්නේ. ඒ බව මම වගකීමෙන් කියනවා. ඒ වාගේම, මේ සම්බන්ධයෙන් ඊයේ සාකච්ඡාවක් තිබුණා. ඒ සාකච්ඡාවලින් යම් යම් තීන්දුවලට ඇවිල්ලා තිබෙනවා. ගරු ඇමතිතුමා කිව්වා වාගේ ඉදිරියේ දීත් මේ සම්බන්ධව සාකච්ඡා පවත්වා කැබිනට් මණ්ඩලයට යෝජනා ඉදිරිපත් කර අනුමැතිය ලැබුණාට පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. පාර්ලිමේන්තුවත් දැනුවත් කරලා මේ ගිවිසුම් අත්සන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි කිසිම විධියකට මෙය විකිණීමක් කරන්නේ නැහැ. -[බාධා කිරීමක්]- කියන්න, මන්ත්‍රීතුමා.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ඉන්දියානු සමාගමකට,-[බාධා කිරීමක්]-

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු ඇමතිතුමා කිව්වා වාගේ අපි ඒ සම්බන්ධයෙන් පත්තරවල දැන්වීම් දැම්මා. ඉන්දියාවේ යෝජනාවක් විතරයි අපට ගන්න පුළුවන් වුණේ. අනෙක් සෑම යෝජනාවක්ම අපි බලාපොරොත්තු වෙච්ච තත්ත්වයට ඇවිල්ලා තිබුණේ නැහැ. වෙන වෙන රටවල්වලිනුත් යෝජනා ආවා. නමුත්, ඉන්දියාවේ යෝජනාව විතරයි සාකච්ඡා කරන්න පුළුවන් යෝජනාවකට හරි තිබුණේ. ඒ නිසා තමයි අපි ඉන්දියාවත් එක්ක සාකච්ඡා කළේ. -[බාධා කිරීමක්]- චීන රජයෙනුත් ඇවිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම ඉන්දියාවේ යෝජනා විතරයි අපට සාකච්ඡා කරන්න පුළුවන් වුණේ.-[බාධා කිරීමක්]-

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා වෙනත් රටවල්වලටත් යෝජනා ඉදිරිපත් කරන්න අවස්ථාව දුන්නාද?

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ඔව්. පත්තරේට දැම්මා, website එකට දැම්මා. දැන් ඒ කාලසීමාව ඉවරයි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

කැබිනට් තීන්දුව අනුව අපි Expression of Interest මුළු ලෝකෙන්ම කැඳෙව්වා. එතැනදී මුළු ලෝකයෙන්ම parties 6ක් Expressions of Interest එව්වා. ඒ අය කිව්වේ, MRO එකක් හදන්න; flying school එකක් දාන්න වාගේ පොඩි පොඩි යෝජනා විතරයි. මේ වාගේ විශාල යෝජනාවක් ආවේ නැහැ. ඒ නිසයි අපි මේ යෝජනාව පිළිගත්තේ.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු ඇමතිතුමනි, දේශීය ව්‍යවසායකයන් කවුරුවත් මේකට ඉදිරිපත් වුණේ නැද්ද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

දේශීය ව්‍යවසායකයන් ඉදිරිපත් වුණා, flying school වගේ එකක් හදන්න.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු ඇමතිතුමනි, ඔවුන්ට ඒ අවස්ථාව දෙන්නේ නැත්තේ ඇයි?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

ඒ අය ඔක්කෝටම පොඩි පොඩි වැඩවලට අවස්ථාව ලැබෙනවා.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

දේශීය ව්‍යවසායකයන් කීප දෙනෙක් එකතු කරගෙන මේ දේ කරන්න බැරි ද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

එහෙම නම්, ඔබතුමාට ව්‍යවසායකයන් කීප දෙනෙක් එකතු කරගෙන proposal එකක් දෙන්න තිබුණා නේ.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඒ යෝජනාවල flying school දාන්න වාගේ පොඩි පොඩි යෝජනා ආවා මිසක්, මේක සංවර්ධනය කරන්න මේ වාගේ දැවැන්ත යෝජනා ආවේ නැහැ. අපි ඒකයි කිව්වේ. මේ ගුවන් තොටුපොළ හදන්න ගිය මුදලටත් වඩා වැඩි මුදලක් මේකෙන් ලැබෙන සියයට 70න් ලැබෙනවා. විශේෂයෙන්ම මේ රටට අහිතකර යෝජනා අපි කරන්නේ නැහැ. අපි මේ පිළිබඳව

[ගරු අශෝක් අබේසිංහ මහතා]

කැබිනට් මණ්ඩලය දැනුවත් කරනවා; රටේ ජනතාව දැනුවත් කරනවා. ඔබතුමන්ලා වගේ අපි අපේ රටේ ඉඩම් සින්නක්කරව විකුණන්නේ නැහැ. අපේ රටේ ඉඩම් සින්නක්කරව විකුණපු ආණ්ඩුවක සාමාජිකයන් මේ ගැන කීම පිළිබඳව මම ඉතා කනගාටු වෙනවා. -[බාධා කිරීමක්]- ගරු ඇමතිතුමා ඒ වෙලාවේ එම සිද්ධිය ගැන කිව්වා නේ. අපේ රජය කිසිසේත්ම විකිණීමක් කරන්නේ නැහැ. අපි කරන්නේ මේක හවුල් ව්‍යාපාරයක්. අලාභ ලබන මත්තල ගුවන් තොටුපොළ ලාභ ලබන තත්ත්වයක් බවට පත් කරලා, මේ රටේ ආර්ථිකය ඉහළ නැංවීමේ වැඩ පිළිවෙළක් තමයි අපි කරන්නේ. ඒ නිසා ඔබතුමා මෙවැනි යෝජනාවක් ගෙන ඒම පිළිබඳව විශේෂයෙන්ම මම කනගාටු වෙනවා. බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 7.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 7.47ට 2018 ජුලි මස 06 වන සිකුරාදා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 7.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 7.47க்கு பாராளுமன்றம், 2018 யூலை 06, வெள்ளிக்கிழமை மு.ப. 10.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being past 7.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 7.47 p.m. until 10.00 a.m. on Friday, 6th July, 2018.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.